වාර්ෂික වාර්තාව

2022

නොසැලෙන ශක්තියෙන් අධිෂ්ඨානශීලීව ඉදිරියටම

ලංකා බැංකුව

BOC

ජාතියේ මහා පහන් ටැඹ

නොසැලෙන ශක්තියෙන් අධිෂ්ඨානශීලීව ඉදිරියටම

දශක ගනණාවක් පුරා රටේ ප්‍රමුඛතම බැංකුවක් වශයෙන් අප ලබා ඇති පන්නරය ඕනෑම අභියෝගාත්මක පරිසරයක් තුළ නොසැලෙන ශක්තියෙන් අධිෂ්ඨානශීලීව අප රටට සහ ජනතාවට සේවය කිරීමට අප වෙත අවැසි ජවය ලබා දී ඇත. මේ අවස්ථාවේ අවැසි වන්නේ තිරසාර ආර්ථික නැගීසිටීම සහ ජනතාවගේ ජීවන තත්ත්වයේ පිබිදීම වන අතර ලංකා බැංකුව මෙම ඉලක්ක වෙත ලඟාවීමට රටට අවශ්‍ය ශක්තිය සැපයීමට නිබඳව නැගී සිටී.

රටේ ආර්ථිකය යලි පනගැන්වීමට අවශ්‍ය සියළු අංශ වල වර්ධනය උදෙසා අවශ්‍ය සියළු පාර්ශ්ව වෙත හුදු ලාභ අපේක්ෂාවෙන් ඔබ්බට ගිය උපායමාර්ගික සැලසුම් හරහා අවශ්‍ය සහාය සැපයීමට බැංකුව කටයුතු කර ඇත. ලංකා බැංකුව සිය ඉදිරි ගමන්මඟ සැලසුම් කර ඇත්තේ වෙන කවරදාකටත් වඩා රටේ අනාගත සංවර්ධනයේ පාර්ශ්වකරුවකු ලෙස තම වගකීම් පෙරදැරිවය.

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

පටුන

1 දළ විශ්ලේෂණය — පිටුව 4

මෙම වාර්තාව පිළිබඳව 4
සමෝධානික චින්තනය සඳහා අපගේ ප්‍රවේශය 6
බැංකුව පිළිබඳව කෙටියෙන් 7
මූල්‍ය කාර්යසාධන විශේෂාංග 11
මූල්‍ය නොවන කාර්යසාධන විශේෂාංග 12

2 නායකත්ව දර්ශනය — පිටුව 14

සභාපතිතුමාගේ පණිවිඩය 14
මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය 18
නව සභාපති සහ මහා කළමනාකාරතුමන්ගේ ඉදිරි දැක්ම 22
අධ්‍යක්ෂ මණ්ඩලය 26
ආයතනික කළමනාකාරිත්වය 30
විධායක කළමනාකාරිත්වය 36

3 අපේ බැංකුව — පිටුව 40

අගය නිර්මාණය කිරීමේ ආකෘතිය 40
චිකතු කළ අගය මත වාර්තාව 42
මෙහෙයුම් සන්දර්භය 43
PESTEL විශ්ලේෂණය 47
ප්‍රමාණාත්මකව වැදගත් කරුණු 49

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය — 4 5 6

4 අපගේ උපායමාර්ග — පිටුව 52

පරිවර්තන උපායමාර්ගය 52
සම්පත් වෙන්කිරීම සහ ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන් 53
තිරසාර බවට අනුගතව 55

5 අපගේ කාර්යසාධනය — පිටුව 60

මූල්‍ය සමාලෝචනය 60
ව්‍යාපාරික අංශ සමාලෝචනය
ශාඛා බැංකුකරණය 65
ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය 70
ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම් 74

6 පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ — පිටුව 78

ගනුදෙනුකරුවන් 78
සේවකයින් 89
කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන් 100
ප්‍රජාව සහ පරිසරය 103
ව්‍යාපාරික හවුල්කරුවන් 114
නියාමකයින් 117
සම්මාන 119

7 වගවීම — පිටුව 120

ආයතනික යහපාලනය 120
අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා
විගණන කමිටු වාර්තාව 130
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව 132
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව 134
නාමයෝජනා සහ ආයතනික යහපාලනය
පිළිබඳ කමිටු වාර්තාව 136
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව 138
අවදානම් කළමනාකරණය 140

8 මූල්‍ය වාර්තා — පිටුව 157

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය
ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව 158
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම 163
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය
පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 165
ස්වාධීන සහතිකවීමේ වාර්තාව 167
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 168
විගණකාධිපතිතුමාගේ වාර්තාව 169
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 174
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 175
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 176
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 178
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 182
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 184

9 අනුකූලතා ඇමුණුම් පිටුව 360

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා 361
2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා 366
කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා 385
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා 387
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය 392

10 අතිරේක තොරතුරු පිටුව 403

GRI දර්ශකය 404
ස්වාධීන සහතිකවීමේ වාර්තාව - තිරසාරකත්වය 407
ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ඇ.ඩො.) 409
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (ඇ.ඩො.) 410
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ඇ.ඩො.) 411
කාර්තුමය විශ්ලේෂණය 412
කොටස් හා ණයකර තොරතුරු 415
දස වර්ෂ සංඛ්‍යාන සාරාංශය – බැංකුව 416
පරිපාලිතයන් හා ආශ්‍රිතයන් 418
විදේශ රටවල නියෝජිත බැංකු – රටවල් පදනම මත 420
විනිමය හුවමාරු සමාගම් – රටවල් පදනම මත 425
මූල්‍ය සහ බැංකුකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහය 426
ආයතනික සහ විදේශීය කාර්යාල 430
සංස්ථාපිත තොරතුරු 432

දැක්ම, මෙහෙවර, ආයතනික වටිනාකම් ප්‍රකාශය

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

"ජාතියේ මහා පහන් ටැඹ"

දැක්ම

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකික සලකුණ බවට පත්වෙමින් ගනුදෙනුකාර කේන්ද්‍රීය නව්‍ය මූල්‍ය පහසුකම් පිරිනමන ජාතියේ බැංකුකරුවා වීම.

මෙහෙවර

ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් අප ගනුදෙනුකාර ප්‍රජාව වෙත ළඟා කරලමින් සේවක පරිපූර්ණත්වය මත ගොඩ නැංවූ වඩාත් කාර්යක්ෂමවූත්, නවීන තාක්ෂණවේදයන් මුසුවූත් මූල්‍ය සේවාවන් හරහා සියළු පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් උත්පාදනය කරලීම.

ආයතනික වටිනාකම් ප්‍රකාශය

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකීය සලකුණ බවට පත්වීමේ අපගේ දැක්ම කරා යන ගමනේදී පහත දැක්වෙන පංචවිධ වූ මූලික හරයන් මත බැංකුව ක්‍රියාත්මක වෙයි.

- ✓ ගනුදෙනුකාර කේන්ද්‍රීය වීම
- ✓ අප ආයතනය හා බැඳුනු විවිධ ජන කණ්ඩායම්හි විවිධත්වයට ගරු කිරීම
- ✓ ඉතා උසස් තත්ත්වයේ ආචාරධර්ම පිළිපැදීම සහ වෘත්තීමය පරිසරයක ස්ථාපනය සඳහා කැපවීම
- ✓ නම්‍යශීලි සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම
- ✓ අපගේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම වගවීම

ඔබගේ ස්මාර්ට් ජංගම දුරකථනය හරහා QR කේතය පරිලෝකනය කරන්න හෝ පහත වෙබ් අඩවියට පිවිසෙන්න.
https://www.boc.lk/

අනුගමනය කරන්න



2022 වර්ෂය දක්වා සහ සමාලෝචිත වර්ෂය තුළදී මෙහෙයුම් පරිසරයේ සිදු වූ පෙර නොවූ විරූ වෙනස්කම් මත බැංකුවට සහ එහි පාර්ශ්වකරුවන්ට ඇති වූ සෘජු හා වක්‍ර බලපෑම් මෙම වාර්තාවේ සවිස්තරාත්මකව දක්වා ඇත. මෙය පිටු අංක 43 සිට 46 දක්වා ඇති පුළුල් කරන ලද මෙහෙයුම් සන්දර්භය තුළ, ව්‍යාපාරික අංශ සමාලෝචනය සහ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ වැනි වාර්තාවේ ප්‍රධාන අංශ පුරා විස්තර කෙරේ.



ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව අපගේ පාර්ශ්වකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් ප්‍රවේශවීමේ පහසුව සඳහා විවිධ නාලිකා හරහා පරිශීලනය කළ හැක.

වෙබ් අඩවිය හරහා ප්‍රවේශ විය හැකි ඩිජිටල් වාර්ෂික වාර්තාවක් සහ එහි සාරාංශයක් සපයන සංක්ෂිප්ත වීඩියෝවක් මෙම නාලිකා තුළ ඇතුළත් වේ.

ලංකා බැංකුවේ දසවන ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම, එය බැංකුවේ අනාගත දිශානතිය සකසන අතරම වසර තුළ කාර්යසාධනය ආවරණය කරයි. සංක්ෂිප්ත නමුත් විස්තීර්ණ ආකාරයෙන් ප්‍රමාණාත්මක තොරතුරු සන්නිවේදනය කිරීමෙන් බැංකුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සමබර සමාලෝචනයක් සැපයීම වාර්තාවේ අරමුණයි. වාර්තාව බැංකුවේ කාර්යසාධනය විස්තර කිරීමේදී පාර්ශ්වකරුවන්ගේ ඉදිරි දර්ශනයක් ගනු ලබන අතර, බැංකුව එහි අගය නිර්මාණය කරන ආකාරය සහ පාර්ශ්වකරුවන්ට වටිනාකම ලබා දෙන ආකාරය කෙරෙහි ද අවධානය යොමු කරයි.

වාර්තා කිරීමේ විෂය පථය සහ සීමාව

මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මාස 12 ක කාලය තුළ ලංකා බැංකුවේ ("BOC" හෝ "බැංකුව" ලෙසද හැඳින්වේ) දේශීය හා විදේශීය මෙහෙයුම් සහ එහි පරිපාලිත සමාගම් වල (සාමූහිකව " සමූහය" ලෙසින්) මෙහෙයුම් කටයුතු පිළිබඳව ආවරණය කරයි.

මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු ඒකාබද්ධ තොරතුරු වන අතර මූල්‍ය නොවන තොරතුරු සමූහය තුළ ඇති ප්‍රමුඛතාවය අනුව බැංකුවට පමණක් සීමා වේ. වාර්තාකරණ සීමාවන් පෙර වසරට වඩා නොවෙනස්ව පවතින අතර ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමෙන් ඉවත් කර ගැනීම හැර සමූහයේ විශාලත්වය, ව්‍යුහය හෝ සැපයුම් දාමයේ සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැත.

මෙම වාර්තාව අත්සන් කිරීමේ දිනයට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මහා කළමනාකාරවරයාගේ තනතුරු වල සිටු වූ වෙනස්කම් අනුව, බැංකුවේ අලුතින් පත් කළ සභාපතිවරයාගේ සහ කළමනාකාරතුමාගේ පණිවිඩයක් මෙම වාර්තාවට ඇතුළත් වේ.

තොරතුරුවල අඛණ්ඩතාව

බාහිර වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා බැංකුව ඒකාබද්ධ සහතික කිරීමේ ආකෘතියක් අනුගමනය කරනු ලබයි. විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන කාර්යයන් සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන් සහ අදාළ අභ්‍යන්තර පාලනයන්හි සඵලතාවය සහතික කිරීම සඳහා වගකිව යුතු අතර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බාහිර සහතිකය ජාතික විගණන කාර්යාලය විසින් ලබා දී ඇත. වාර්තාව සකස් කිරීම සඳහා බැංකුවේ ආයතනික කළමනාකරණ කණ්ඩායම අධ්‍යක්ෂ මණ්ඩලයට වගකියනු ලබයි. වාර්තාව සකස් කර ඇත්තේ නායකත්ව කණ්ඩායමේ උපදෙස්, අභ්‍යන්තර සහ වෙනත් අදාළ බාහිර තොරතුරු සමඟිනි.

වාර්තාවේ ප්‍රකාශිත තිරසාර තොරතුරු KPMG (වරලත් ගණකාධිකාරිවරුන්) ආයතනය විසින් බාහිරව සහතික කර ඇත. පසුගිය වසරේ ප්‍රකාශයට පත් කරන ලද කිසිදු ප්‍රධාන මූල්‍ය නොවන තොරතුරුවල නැවත ප්‍රකාශයන් නොමැත.

පූර්ව ආරක්ෂණ මූලධර්මය

බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර මෙහෙයුම්වල තිරසාර බව ප්‍රධාන ප්‍රවාහය සඳහා වන ප්‍රවේශය පූර්ව ආරක්ෂණ මූලධර්මය සඳහා මූලික සැලකිල්ලක් දක්වයි. 107 පිටුවේ දක්වා ඇති තිරසාර මූල්‍යකරණය සඳහා බැංකුව දරන ප්‍රයත්නයන්, මෙහෙයුම්වල ඇති විය හැකි ඍණාත්මක බලපෑම් අවම කිරීමට පමණක් නොව, පරිසරයට සහ පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාවට වැල්ල වන දේශීය හා ගෝලීය අභියෝගවලට කල්තියා ආමන්ත්‍රණය කිරීමට සවිස්තරාත්මක ක්‍රියාමාර්ග ගෙන ඇත.

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

ප්‍රතිචාර

කරුණාකර මෙම වාර්තාව පිළිබඳ යෝජනා සහ අදහස් dgmfp@boc.lk වෙත යොමු කරන්න.

ප්‍රකාශිත වෙබ් අඩවිය වෙත යොමු වීමට සහ HTML අනුවාදය වෙත යොමු වීමට පරිලෝකනය කරන්න.

සකස් කිරීමේ පදනම

මෙම වාර්තාව ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුවේ මාර්ගෝපදේශවලට අනුකූල ව්‍යුහයක් අනුගමනය කරයි. හෙළිදරව් කිරීම් හඳුනාගත් ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා මත පදනම් වේ. ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා තීරණය කිරීම සඳහා බැංකුවේ ක්‍රියාවලිය සහ වාර්තාකරණ ප්‍රමිතික සමඟ ඒවා පෙළගැස්වීම පිටු අංක 49 සිට 51 තුළ දක්වා ඇත.

ගෝලීය වාර්තාකරණ ප්‍රමිති වල මූලික නිර්ණායක වලට අනුව ප්‍රධාන පාර්සරික, සමාජීය සහ පාලන හෙළිදරව් කිරීම් පහසුවෙන් හඳුනා ගැනීම සඳහා අදාළ අංශ පුරා සංඥා සහ පරිශීලන සලකුණු ලකුණු කර ඇත. බැංකුවේ තිරසාර ආචාරධර්ම වලට අනුකූලව එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය; සහ ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ රාමුව මඟින් නියම කර ඇති ප්‍රාග්ධන සඳහා යොමු ද ඇතුළත් වේ.

වාර්තාකරණයේ වැඩිදියුණු කිරීම්

- බැංකුවේ පාර්ශ්වකරුවන්ට මෙහෙයුම් පරිසරයේ බලපෑම විස්තර කරන අදාළත්වය වැඩි කිරීම.
- මෙහෙයුම් පරිසරය සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සඳහා බැංකුවේ ප්‍රතිචාරය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
- බැංකුවේ උපායමාර්ගික රාමුවට අනුව සම්බන්ධතා සහ වාර්තාකරණය වැඩි කිරීම.
- ප්‍රාග්ධන අතර අනෙක්‍යන්‍ය සම්බන්ධතා ඉස්මතු කිරීම සඳහා සංඥා භාවිතය මඟින් වාර්තාව හරහා සම්බන්ධතාව වැඩිදියුණු කිරීම; ගෝලීය ඉලක්ක සඳහා දායකත්වය; සහ ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ ප්‍රමිතිවලට අනුකූලව අදාළ පාර්සරික, සමාජීය සහ යහපාලන ප්‍රමිති.
- පාර්ශ්වකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්තාව බහු-නාලිකා (මුද්‍රණය, ඩිජිටල්: HTML, වීඩියෝ) හරහා ඉදිරිපත් කිරීම හා බෙදා හැරීම.

පහත සඳහන් අදාළ වාර්තාකරණ රාමු සලකා බලන ලදී

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (CA Sri Lanka)

<IR> මේ වන විට ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පදනමේ කොටසක් වන ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ වාර්තාකරණ රාමුව

දැන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පදනමේ කොටසක් වන අගය වාර්තා කිරීමේ පදනම විසින් සකස් කරන ලද සමෝධානික චින්තන මූලධර්ම.

ගෝලීය වාර්තාකරණ මූලපිරීම (GRI) තිරසාර වාර්තාකරණ මාර්ගෝපදේශ (GRI ප්‍රමිති).

තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද වාණිජ බැංකු සඳහා වන ප්‍රමිති මණ්ඩලය (SASB)

තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ගෝලීය දර්ශක රාමුව (A/RES/68/261).

කොළඹ කොටස් වෙළඳපළ පාරිසරික, සමාජීය සහ ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාකරණ රාමුව

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මූලික කොටගත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ වාර්තාකරණ රාමුව

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහය (2017)

කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ රීතීන්

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත සහ එහි සංශෝධන

1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන

ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොළඹ කොටස් වෙළඳපළ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අනාවරණ ප්‍රකාශයට පත් කිරීමේ මඟ පෙන්වීම

පරිශීලන සලකුණු මගපෙන්වීම

පාර්ශ්වකරුවන්



ප්‍රාග්ධනය



උපායමාර්ගික ප්‍රමුඛතා



1 සමෝධානික චින්තනය සඳහා අපගේ ප්‍රවේශය

ලංකා බැංකුව තම ව්‍යාපාරයේ සෑම අංශයකටම, පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීමේ සහ ප්‍රමාණාත්මක ගැටළු හඳුනාගැනීමේ සිට උපායමාර්ග සැකසීම, අවදානම් කළමනාකරණය සහ ආයතනික යහපාලන ක්‍රියාවලීන්, ව්‍යාපාරික අංශ වල මෙහෙයුම් පැතිකඩ සහ බැංකුවේ වාර්තාකරණය සහ ආයතනික අනාවරණය කිරීම දක්වා ඒකාබද්ධ ප්‍රවේශයක් ගනී.

ප්‍රමාණාත්මක ගැටළු තීරණය කිරීම

බැංකුවේ ප්‍රමාණාත්මකභාවය සඳහා ලංකා බැංකුවේ ප්‍රවේශය ගතික මෙහෙයුම් පරිසරයක බලපෑම් සහ අපගේ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ බැංකුවට ඇති විය හැකි අවස්ථා සහ තර්ජන සලකා බලයි.

බැංකුවේ මෙහෙයුම් සන්දර්භය පිළිබඳ ඒකාබද්ධ දළ විශ්ලේෂණයක්, බැංකුවට සහ පාර්ශ්වකරුවන්ට එහි ඇඟවුම් පිළිබඳ විශ්ලේෂණාත්මක තක්සේරුවක් සහ අවස්ථාවන් අත්පත් කර ගැනීම, තර්ජන අවම කිරීම සහ වටිනාකම් ලබා දීම සඳහා බැංකුව දක්වන ප්‍රතිචාරය, පිටු අංක 43 සිට 51 තෙක් දක්වා ඇත.

බැංකුවේ ප්‍රමාණාත්මකව වැදගත් කරුණු පිළිබඳ විශ්ලේෂණය පිටු අංක 49 හි දැක්වේ.

උපායමාර්ග සැකසීම සහ සම්පත් වෙන් කිරීම

බැංකුවේ පරිවර්තනීය අනාගත කේන්ද්‍රීය උපායමාර්ගය, ප්‍රමුඛත්වය සහ සම්පත් වෙන් කිරීම සඳහා දරන උත්සාහයන් සහ අපගේ උපායමාර්ගයට අනුව ප්‍රගතිය මැන බැලීම පිටු අංක 52 සිට 54 දක්වා විස්තර කර ඇත.

අපගේ වර්තමාන තත්ත්වය

ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය — පිටුව 52

අප ළඟා විය යුතු ස්ථානය

උපායමාර්ගික ප්‍රමුඛතා — පිටුව 52

අප ඒ සඳහා ළඟා වීමට සැලසුම් කරන ආකාරය

උපායමාර්ග සක්‍රීයක — පිටුව 52

සම්පත් වෙන් කිරීම

- මූල්‍ය ප්‍රාග්ධනය
- සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය

පිටු අංක 53 සිට 54 දක්වා

ව්‍යාපාර අංශ හරහා උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම

බැංකුවේ ව්‍යාපාරික අංශ අපගේ උපායමාර්ග බෙදා හැරීමේ මූලික නියෝජිතයන් වේ. පිටු අංක 65 සිට 77 දක්වා ව්‍යාපාරික අංශ සමාලෝචනය, මෙහෙයුම් පරිසරයට ප්‍රතිචාර දැක්වීම, පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ උපායමාර්ගයට එරෙහිව ප්‍රගතිය ඇතුළුව ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මකව දක්වා ඇත.

ශාඛා බැංකුකරණය
පිටු අංක 65 සිට 69 දක්වා

ආයතනික සහ අන්තර්ජාල බැංකුකරණය
පිටු අංක 70 සිට 73 දක්වා

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්
පිටු අංක 74 සිට 77 දක්වා

අවදානම් කළමනාකරණය, නිසි ආයතනික යහපාලනය සහතික කිරීම සහ තිරසාර බවට අනුගත වීම

ලංකා බැංකුව අවදානම් කළමනාකරණය සඳහා ක්‍රමානුකූල සහ ක්‍රියාශීලී ප්‍රවේශයක් යොදාගෙන ඇති අතර එමඟින් බැංකුවේ ස්ථාවරත්වය සහ රඳා පැවතීමේ හැකියාව ප්‍රවර්ධනය කරන අතරම පාර්ශ්වකරුවන්ට නිරතුරුවම අගය එක් කිරීමක් ලබා දීමට බැංකුවට හැකියාව ලැබේ.

අවදානම් කළමනාකරණ වාර්තාව පිටු අංක 140 සිට 156 දක්වා ඇත.

ශක්තිමත් ආයතනික පාලන රාමුවක් බැංකුවේ සියලුම ක්‍රියාවන් අධීක්ෂණය කරයි. එය බැංකුවේ මෙහෙයුම් හරහා සදාචාරාත්මක සහ වගකීම් සහගතව කටයුතු කිරීම සහතික කරන අතර බැංකුවේ මූලික වටිනාකම් සහ මූලධර්මවලට අනුකූල වේ.

ආයතනික යහපාලන වාර්තාව පිටු අංක 120 සිට 139 දක්වා ඇත.

මූල්‍ය හා සමාජීය අරමුණු දෙකම ඇති සංවිධානයක් ලෙස, අපි අපගේ මෙහෙයුම්වල සියලු අංශවලට තිරසාර බව සංස්ථාගත කර ඇත.

තිරසාර පැතිකඩ පිටු අංක 55 සිට 59 දක්වා සහ 103 සිට 113 දක්වා ඇත.

අපගේ පාර්ශ්වකරුවන්ට අගය බෙදා දීම

පාර්ශ්වකරුවන් සඳහා අගය නිර්මාණය කිරීමේ ලංකා බැංකුවේ සමස්ත අරමුණ පිටු අංක 78 සිට 139 දක්වා වූ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ පරිච්ඡේදයේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම කොටස බැංකුවේ ප්‍රධාන පාර්ශ්වකරුවන් දෙස බලන අතර ඔවුන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම, අගය ලබා දීම සහ ධනාත්මක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා බැංකුවේ කාර්යභාරය ගෙනහැර දක්වයි.

ජාතියේ මහා පහන් ටැඹ

ලංකා බැංකුව සම්පූර්ණයෙන්ම රජය සතු බැංකුවක් වන අතර, 2022 දී ක්ෂේත්‍රයේ ණය සහ අත්තිකාරම් වලින් 23% ක් සහ තැන්පතු වලින් 23% ක් සමන්විත රටේ ප්‍රමුඛතම බලපත්‍රලාභී වාණිජ බැංකුව වේ. දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් ලෙස ලංකා බැංකුව, (D-SIB) ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික භූ දර්ශනය තුළ ගැඹුරින් මුල් බැස ඇති අතර වසර 80 කට වැඩි කාලයක් රටේ මූල්‍ය සවිබල ගැන්වීම සහ ආර්ථික වර්ධනය සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත.

ලංකා බැංකුව සතුව ශ්‍රී ලංකාව පුරා පුළුල්ව විහිදුන සේවා ජාලයක් ඇති අතර, ඉන්දියාව, මාලදිවයින සහ සීෂෙල්ස් යන රටවල ශාඛා තුනක් ද, හුලුමාලේ සීමිත සේවා ශාඛාවක් ද, එක්සත් රාජධානියේ ලන්ඩන් හි පූර්ණ හිමිකාරීත්වය දරණ අනුබද්ධිත ආයතනයක් ද ඇත.

බැංකුව පිළිබඳව කෙටියෙන්

ව්‍යාපාර අංශ

ශාඛා බැංකුකරණය

ලංකා බැංකුවේ ශාඛා බැංකුකරණ අංශය පුද්ගලයන්, ව්‍යවසායකයින් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කර ගනිමින් ණය දීම, තැන්පතු, ගෙවීම් සේවා සහ ගනුදෙනු බැංකු විසඳුම් මාලාවකින් සමන්විත වේ.

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය

බැංකුවේ ආයතනික සහ අක්වෙරළ බැංකුකරණ අංශය මගින් ආර්ථිකයේ විශාල කොටස් වන පුද්ගලික අංශය, රාජ්‍ය අංශය සහ අක්වෙරළ මෙහෙයුම් කටයුතු සඳහා ආයතනික අරමුදල් සහ තැන්පතු, ව්‍යාපෘති මූල්‍යකරණය, වෙළඳ සේවා සහ අක්වෙරළ බැංකු පහසුකම් ඇතුළු විවිධ මූල්‍ය සේවා සපයයි.

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්

බැංකුවේ මෙම අංශය ජාත්‍යන්තර මෙහෙයුම් වලින් සමන්විත වේ. විදේශ මුදල් සම්බන්ධ ගනුදෙනු, ද්‍රවශීලතා කළමනාකරණය සහ අරමුදල් කළමනාකරණය, බැංකුවේ ආයෝජනය කටයුතු සහ භාණ්ඩාගාර මෙහෙයුම් සඳහා පහසුකම් සැපයීම යනාදිය සිදුකෙරෙන අතර විදේශීය මෙහෙයුම් අංශය විසින් විදේශීය ශාඛා වල මෙහෙයුම් කටයුතු හසුරවනු ලබයි.

මුළු වත්කම්
රු. ට්‍රිලියන 4.3 කි

මුළු අත්තිකාරම්
රු. ට්‍රිලියන 2.6 කි

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය
15.4%

සේවකයන්
8,209 කි

විදේශීය නියෝජිත බැංකු සමඟ සම්බන්ධතා
784


මුළු තැන්පතු
රු. ට්‍රිලියන 3.3 කි

වර්ෂය සඳහා බදු පෙර ලාභය
රු. බිලියන 31.0 කි

ස්කන්ධය
රු. බිලියන 254.2 කි

ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන
2,166 කි

අපගේ වෙළඳපළ තත්ත්වය



22%
බැංකු ක්ෂේත්‍රයේ වත්කම් කොටස

67%
ඉලක්ක වෙළඳපළ ප්‍රතිශතය

23%
ක්ෂේත්‍රයේ ණය සහ අත්තිකාරම් කොටස

23%
ක්ෂේත්‍රයේ තැන්පතු කොටස

ලංකා බැංකුවෙහි තරඟකාරී වාසිය

- වත්කම්, තැන්පතු, ණය සහ අත්තිකාරම් අනුව වෙළඳපළේ ප්‍රමුඛත්වය දැරීම
- සමාජීය සහ පාරිසරික තිරසාරකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කැපවීම
- ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සේවා සන්නාමය
- 67% ට වැඩි අසමසම ඉලක්ක වෙළඳපළ අනුපාතය
- දිවයින පුරා විහිදුනු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,100 කට අධික ජාලයක් හරහා අසමසම භූගෝලීය ආවරණයක්
- පූර්ණ රාජ්‍ය බැංකුවක් වීම තුළින් ගොඩනැගුනු විශ්වාසය
- අභ්‍යන්තර ප්‍රේෂණ වල වෙළඳපළ ප්‍රමුඛයා
- විශාල ණය දීම, තැන්පතු සහ අනෙකුත් මූල්‍ය සේවා පරාසය
- විශාල තනි ණය ගැති සීමාව

අපගේ සේවා ජාලය

ලංකා බැංකුව එහි වත්කම්, තැන්පතු සහ ණය සහ අත්තිකාරම් අනුව තීරණය වන ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව ලෙස අඛණ්ඩව එහි ස්ථානය පවත්වාගෙන ඇත. මූල්‍ය ඇතුළත් කිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සලසමින් ආර්ථික වශයෙන් අවාසි සහගත ප්‍රදේශවල ජීවත් වන සහ අව්‍යධිමත් මූල්‍ය වෙළඳපළ සමඟ ගනුදෙනු කරන ජනතාවට පවා ගනුදෙනු කිරීම පහසු කිරීම උදෙසා පළාත් නවය පුරා බෙදා හරින ලද පූර්ණ පහසුකම් සහිත, සීමිත සේවා සහ ජංගම ශාඛා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර සහ මුදල් චක්‍රීකරණ යන්ත්‍ර ඇතුළු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,100 කට වැඩි ජාලයකින් බැංකුවේ පුළුල් ගනුදෙනුකාර ප්‍රවේශය සඳහා පහසුකම් සලසා ඇත.

ශ්‍රී ලංකාවෙන් ඔබ්බට, ලංකා බැංකුව මාලදිවයින, සීෂෙල්ස් සහ ඉන්දියාව යන රටවල ද ශාඛා පවත්වාගෙන යන අතර චික්සත් රාජධානිය දක්වා ද සේවා ජාලය පුළුල් කර ඇත.

බැංකුව වෙබ්, ජංගම දුරකථන සහ සමාජ මාධ්‍ය ඇතුළු ඩිජිටල් නාලිකා මාලාවක් හරහා ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වේ. වැඩි විස්තර සඳහා 81 පිටුව බලන්න.



විදේශීය මෙහෙයුම්


3 1 6

විදේශ රටවල නියෝජිත බැංකු

784

විදේශ විනිමය හුවමාරු ආයතන

91



උතුරු පළාත

63 6 1 107 1 5

උතුරු මැද පළාත

50 3 1 120 1 4

වයඹ පළාත

57 4 1 142 2 1

බස්නාහිර පළාත

131 36 2 423 1 5

සබරගමුව පළාත

49 2 1 131 2 4

නැගෙනහිර පළාත

55 3 1 95 1 5

මධ්‍යම පළාත

65 7 1 153 2 3

ඌව පළාත

43 4 1 107 2 4

දකුණු පළාත


65 3 1 173 3 3

ශාඛා | සීමිත සේවා ශාඛා | ජංගම ශාඛා | ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර/මුදල් චක්‍රීකරණ යන්ත්‍ර/මුදල් තැන්පතු යන්ත්‍ර | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන | BOC Connect

බැංකුව පිළිබඳව කෙටියෙන්

සමූහයේ ව්‍යුහය

බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරයට සෘජුවම සම්බන්ධ හෝ බැංකුවේ මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් සඳහා සහය වන අනුබද්ධ සේවා සපයන, පහත විස්තර කර ඇති පරිදි පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් වලින් සමූහය සමන්විත වේ.



මූල්‍ය කාර්යසාධන විශ්ලේෂාංග

1

	බැංකුව			සමූහය		
	2022	2021	වෙනස %	2022	2021	වෙනස %
මෙහෙයුම් ප්‍රතිඵල (රු. මිලියන)						
මුළු ආදායම	513,149	290,362	76.7	520,891	297,621	75.0
ශුද්ධ පොළී ආදායම	126,346	111,252	13.6	129,769	114,990	12.9
මූල්‍ය සේවා සඳහා බදු ගෙවීමට පෙර ලාභය	42,290	52,217	(19.0)	42,372	53,843	(21.3)
බදු පෙර ලාභය	30,977	43,190	(28.3)	31,053	44,637	(30.4)
බදු පසු ලාභය	31,972	37,590	(14.9)	31,849	38,683	(17.7)
රජයට දායකත්වය	31,949	20,710	54.3	32,606	21.433	52.1
මූල්‍ය තත්ත්වය (රු. මිලියන)						
මුළු වත්කම්	4,336,460	3,803,284	14.0	4,390,769	3,847,950	14.1
දළ ණය සහ අත්තිකාරම්	2,584,779	2,576,668	0.3	2,617,905	2,612,567	0.2
ණය සහ අත්තිකාරම් හානිකරන සඳහා ප්‍රතිපාදන	2,325,594	2,413,762	(3.7)	2,355,978	2,446,330	(3.7)
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	3,334,774	2,866,894	16.3	3,358,198	2,886,237	16.4
මුළු වගකීම්	4,082,276	3,602,524	13.3	4,118,238	3,632,553	13.4
මුළු ස්කන්ධය	254,184	200,760	26.6	272,531	215,397	26.5
කොටස් පිළිබඳ දත්තයන් (රු.)						
කොටසක ඉපැයුම	1,279	1,504	(14.9)	1,280	1,540	(16.9)
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම	10,167	8,030	26.6	10,859	8,552	27.0
කාර්යසාධන අනුපාත (%)						
වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය	0.8	1.3	(0.5)	0.8	1.3	(0.5)
ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය	14.1	21.0	(6.9)	13.1	20.1	(7.0)
පොළී ආන්තිකය	3.1	3.3	(0.2)	3.2	3.4	(0.2)
ආදායමට පිරිවැය	29.4	32.0	(2.6)	30.8	33.2	(2.4)
තැන්පතු වලට ණය අනුපාතය	77.5	89.9	(12.4)	78.0	90.5	(12.5)
ස්කන්ධය මත ණය	43.9	51.0	(7.1)	–	–	–
හානිකරණ ප්‍රතිපාදන, දළ ණය සහ අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස	10.0	6.3	3.7	10.0	6.4	3.6
හානිකරණ ණය (අදියර 3)	5.3	5.1	0.2			
හානිකරණ ණය (අදියර 3) සඳහා ණය හානිකරණ ප්‍රතිපාදන වෙන් කිරීම්	59.7	49.1	10.6			
ව්‍යවස්ථාපිත අනුපාත (%)						
ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය) (අවම අවශ්‍යතාව 20%)	21.22	24.97	(3.75)	–	–	
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (රු.) (අවම අවශ්‍යතාව 2022 - 90%, 2021 - 100%)	169.0	169.0	–	–	–	
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලු මුදල්) (අවම අවශ්‍යතාව 2022 - 90%, 2021 - 100%)	122.8	111.5	11.3	–	–	
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (අවම අවශ්‍යතාව 2022 - 90%, 2021 - 100%)	139.0	125.0	12.0	–	–	
තෝලන අනුපාතය (අවම අවශ්‍යතාව - 3%)	4.6	4.7	(0.1)	4.7	4.8	(0.1)
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත (%)						
පොදු ස්කන්ධය ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 8.50%)	11.3	12.9	(1.6)	11.3	12.8	(1.5)
ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 10.00%)	12.4	14.3	(1.9)	12.4	14.1	(1.7)
මුළු ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව - 14.00%)	15.4	17.8	(2.4)	15.3	17.6	(2.3)

සමාජ කාර්යසාධනය

සේවක වටිනාකම්

57
නව සේවකයින් බඳවා ගැනීම්

රු. මිලියන 73.9
සේවකයින් පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය

129,493
සම්පූර්ණ මිනිස් පැය පුහුණුව

රු. බිලියන 29.0
සේවකයින් මත ආයෝජනය

588
කුසලතා මත පදනම් වූ උසස්වීම් ප්‍රදානය

ගනුදෙනුකාර වටිනාකම්

19
ගනුදෙනුකාර පහසුව වැඩි දියුණු කිරීම සඳහා ශාඛා නැවත ස්ථානගත කිරීම

61
ශාඛා සහ සියලුම පිටස්තර ස්මාර්ට් කලාප වැඩිදියුණු කිරීම

75
නව මුදල් චක්‍රීකරණ යන්ත්‍ර ස්ථාපනය

2,166
ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන

43%
BOC POS ඒකකවල වැඩි වීම

652,961 ක්
නව ගනුදෙනුකරුවන් වසර තුළ එක්විය

1,019
අධ්‍යාපනය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ගනුදෙනුකරුවන් වෙත ළඟා විය

10
ජංගම ශාඛා ඉන්ධන අර්බුදය තුළ ක්‍රියාත්මක විය

40
ව්‍යාපාර පුනර්ජීවනය සඳහා ගනුදෙනුකරුවන්ට සහාය වේ





ආර්ථික කාර්යසාධනය

ආර්ථික වටිනාකම්

ඇ. ඩො. මිලියන 3,159.3
විදේශ ප්‍රේෂණ හරහා විදේශ විනිමය

ඇ. ඩො. බිලියන 1.9
අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය (ඉන්ධන සහ ගෑස්) ආනයනය සඳහා මූල්‍ය පහසුකම් සපයා ඇත

රු. බිලියන 31.9
රජය සඳහා වටිනාකම් නිර්මාණය කරන ලදී

රු. බිලියන 52.6
ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ණය ලබා දී ඇත

රු. බිලියන 74.4
ණය සහන යටතේ පහසුකම් සැලසීම

ඇ. ඩො. මිලියන 70.0
ඖෂධ ආනයනය සඳහා ණයවර ලිපි පහසුකම් සලසා ඇත

මූල්‍ය ඇතුළත් කිරීම

රු. බිලියන 5.4
ක්ෂුද්‍ර මූල්‍යකරණය හරහා බෙදා හැරීම

21,495
ක්ෂුද්‍ර මූල්‍ය අංශයට නව ණය

31%
කාන්තාවන් සතු/කාන්තා මූලික කරගත් ව්‍යාපාර සඳහා ක්ෂුද්‍ර මූල්‍යකරණය

1,540
බස්නාහිර පළාතෙන් පිටත පිහිටි ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන

34
නියෝජිත බැංකු ජාලය සඳහා ලියාපදිංචි නියෝජිතයන්

පාරිසරික කාර්යසාධනය

පාරිසරික වටිනාකම්

රු. බිලියන 4.7
පරිසරය සහ සමාජ කළමනාකරණ පද්ධතියට අනුකූල වීමෙන් පසු මූල්‍යකරණ බෙදා හැරීම්

841
පාරිසරික හා සමාජීය සලකා බැලීම් සඳහා ණය තක්සේරු කර ඇත

රු. මිලියන 711.6
හරිත මූල්‍ය සඳහා ණය දීම

මෙට්‍රික් ටොන් 21.9
කඩදාසි ප්‍රතිචක්‍රීකරණය

ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි හරහා ඉතුරුම්

සම්පූර්ණයෙන්ම වැඩුණු **ගස් 373**

තෙල් ලීටර **38,477**

කිලෝවොට් පැය **87,696 විදුලිය**

ජලය ලීටර් **696,745**

ඝණ මීටර් **66 බිම් කොටස්**

මෙගා වොට් පැය 3,219.3
ඵලදායී හිරු එළිය පැය මත පදනම්ව ඇස්තමේන්තු කරන ලද
සූර්ය බලශක්තිය ජනනය

13%
පුනර්ජනනීය බලශක්තියෙන් මෙහෙයුම් සඳහා බලශක්ති අවශ්‍යතාව



2 සභාපතිතුමාගේ පණිවිඩය

ආර්ථික පුනර්ජීවනය වෙත යන ගමන්මගේ මූලිකත්වය දරමින්, නව්‍ය තාක්ෂණය, හරිත ව්‍යාපාරයන් වැනි හරිත සහ කාළගුණිකමය විපර්යාසයන් යන අංශ වෙත අවධානය යොමුවන නැඟීඒන සහ නව්‍ය ව්‍යාපාරයන් වල ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට බැංකුව නොමඳව කැපවී සිටී.



කාංචන රත්වත්තේ
සභාපති

අතිශය අභ්‍යන්තර හා බාහිර අභියෝගවලින් පිරුණු වසරක් තුළ රට මුහුණ දුන් පෙර නොවූ විරූ අභියෝගවල බලපෑම මනාව කළමනාකරණය කර ගැනීමට දිවයිනේ ප්‍රමුඛතම බැංකුව ලෙස ලංකා බැංකුව සමත් වූ බව සඳහන් කිරීම ඇත්තෙන්ම සතුටට කරුණකි. ලංකා බැංකුව මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදයට සාර්ථකව මුහුණ දී ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බලපත්‍රලාභී වාණිජ බැංකුව ලෙස, මෙම කැලඹිලි සහිත වසර තුළ අපි රට සහ ජනතාව කෙරෙහි අපගේ සුවිශේෂී කාර්යභාරය සහ වගකීම තහවුරු කිරීමට කැපවී සිටියෙමු. 2022 දී අපගේ පාර්ශ්වකරුවන් සමඟ වටිනාකම් නිර්මාණය කර බෙදාහදා ගන්නා අතරම, අපගේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා බැංකුව විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යභාරය පිළිබඳව මම මහත් ආඩම්බරයට පත් වෙමි.

සාර්ව ආර්ථික පීඩනය මඟින් බැංකුව කෙරෙහි ඇති වූ බලපෑම

ගෝලීය කොවිඩ්-19 වසංගතය සහ භූ දේශපාලනික පෙරළියේ ප්‍රතිඵලයක් ලෙස වසර දෙකක පීඩනයෙන් පසුව, 2022 වසර ශ්‍රී ලංකාවේ ආර්ථිකයට නව අභියෝග රැසක් ගෙන ආවේ, අස්ථායී සහ පීඩාකාරී මෙහෙයුම් පරිසරයක් මතය. ශ්‍රී ලංකාවේ ෆිස්කල්, බාහිර අංශය සහ මූල්‍ය අංශයේ අසමතුලිතතාවයන් වසර තුළදී සමතයකට පත් වුවද ඉහළ යන උද්ධමනය, දුර්වල වන රුපියල සහ ක්ෂය වූ විදේශ සංචිත නිසා බලශක්ති අර්බුදයකට සහ දැඩි දුෂ්කරතාවලට මුහුණ දීමට ජනතාවට සිදු වූ අතර දිවයින පුරා විසිරී සිටින අප ගනුදෙනුකාරභවතුන්ට ද දැඩි දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ-දේශපාලන අර්බුදයක් ඇති විය. මෙම අභියෝග හමුවේ, ලංකා බැංකුව, රටේ මූල්‍ය අංශයේ විශාලතම බැංකුව සහ ප්‍රමුඛතම රාජ්‍ය බැංකුව ලෙස, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහතික කිරීමට සහ අපගේ ගනුදෙනුකරුවන්ට සහාය දැක්වීමට ප්‍රමුඛත්වය ලබා දුන්නේය.

ආර්ථිකය ශක්තිමත් කිරීමට ප්‍රමුඛත්වය දීම

ආර්ථිකයට සහය දැක්වීමේ වගකීම පැවරී ඇති රාජ්‍ය බැංකුවක් ලෙස, 2022 වසරේ දී බැංකුවේ අවධානය යොමු වූයේ ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපනය කිරීම කෙරෙහි ය. ණය සහන ලබාදීම සහ පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිනිර්මාණය කිරීම හරහා ගනුදෙනුකරුවන්ට උපායමාර්ගික සහය ලබා දීමට බැංකුව ගත් තීරණය, බලපෑමට ලක් වූ කර්මාන්ත සහ විවිධ ක්ෂේත්‍රවල බහුවිධ අර්බුදවලට මුහුණ දුන් ව්‍යාපාරයන්හි ව්‍යාපාර ආකෘතීන් ප්‍රතිව්‍යුහගත කිරීමට සහ පුනර්ජීවනය සඳහා මාවතක් සැකසීමට රුකුලක් විය. 2022 අවසානය වන විට බැංකුව විසින් දුෂ්කරතාවයන්ට මුහුණදුන් ගනුදෙනුකරුවන් වෙනුවෙන් රු. බිලියන 74.4 ක ණය සහ අත්තිකාරම් උදෙසා ණය කාල පමා සහන ලබා දී ඇත.

මිලියන සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයින්ගේ අවශ්‍යතා සපුරාලමින් සහ දිවයින සිසාරා ව්‍යාපාරයන්හි අඛණ්ඩ පැවැත්මට දායක වෙමින් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට බැංකුව මූලික විය. වසර තුළදී, දැඩි ලෙස පීඩාවට පත් වූ නමුත් බොහෝ විට ප්‍රතිපත්තිමය මගින් නොසලකා හරින ලද ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ගෙන එන ද්විපාර්ශ්වික සහ සහනදායී අරමුදල් මාර්ග ගවේෂණය කිරීමට අපට හැකි විය. අපගේ විස්තීර්ණ ප්‍රවේශය සහ විවිධ ගනුදෙනුකාර පදනම මත, 2022 වසර තුළදී රු. බිලියන 52.6 කට වඩා වැඩි ණය සහ අත්තිකාරම් ප්‍රමාණයක් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ අංශය වෙත සැපයීමට හැකිවීම පිළිබඳව අපි ආඩම්බර වෙමු.

ආර්ථික පුනර්ජීවනය වෙත යන ගමන් මගේ මූලිකත්වය දරමින්, නව්‍ය තාක්ෂණය, හරිත ව්‍යාපාරයන් වැනි හරිත සහ කාළගුණිකමය විපර්යාසයන් යන අංශ වෙත අවධානය යොමුවන නැඟීවන සහ නව්‍ය ව්‍යාපාරයන් වල ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට බැංකුව නොමඳව කැපවී සිටී. ශ්‍රී ලංකාවේ අපනයන තරඟකාරිත්වය ඉහළ නැංවීමේ සහ දිගුකාලීන බාහිර අංශයේ අසමතුලිතතාවයන් අඩු කිරීමේ පෙරටුගාමීන් වන අපනයන ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ සමාගම් සඳහා බැංකුව අඛණ්ඩ සහාය ලබා දුන්නේය.

ස්ථාවරත්වය සහතික කිරීම සහ වේගවත් වර්ධනය

අපගේ මූල්‍ය තත්ත්වය සුරක්ෂිත කිරීමට, අපගේ ශ්‍රේෂ්ඨ පත්‍රය ශක්තිමත් කිරීමට සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ, ව්‍යාපාරික හවුල්කරුවන්ගේ සහ මූලික වශයෙන් කොටස් හිමියාගේ විශ්වාසය රඳවා ගැනීමට උපකාර වන අධීක්ෂණ සහ අභ්‍යන්තර පාලනයන් වසර පුරාවට ක්‍රියාවට නංවන ලද අතර, දූරදර්ශී ලෙස අවශ්‍ය හානිකරණ ප්‍රතිපාදන වෙන් කිරීම් සිදු කරන ලදී. ලංකා බැංකුවේ ඵලදායී ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි අතිශය අභියෝගාත්මක වසරක් තුළ අපගේ සාර්ථකත්වයේ ප්‍රබල සාධකයන් වී ඇත. අපගේ ක්‍රියාවලීන් සහ ව්‍යාපාර ආකෘතිය වසර තුළ ආතතියට පත් වූ ආර්ථික තත්ත්වය තුළ සාර්ථකව මෙහෙයුම් කටයුතු කරගෙන යාමට අවශ්‍ය පරිදි අඛණ්ඩව අධීක්ෂණයට ලක්කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය තීරණාත්මක කරුණු කිහිපයක් පිළිබඳව සමීපව අධීක්ෂණය කළ අතර මෙහෙයුම් පරිසරයේ වෙනස්වීම් වලට අනුවර්තනය වීමේ බැංකුවේ ප්‍රගතිය කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා නව ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. මෙහෙයුම් විමර්ශනය කිරීම සඳහා විශේෂ අධීක්ෂණ කමිටු පිහිටුවන ලද අතර, බැංකුවේ අවදානම් කමිටුව, අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) සහ ප්‍රාග්ධනය යලිගොඩනැගීමේ සැලැස්ම (RCP) මෙහෙයුම් කමිටුව, වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) වෙතින් අධීක්ෂණය කරන ලදී.

ගතික මෙහෙයුම් පරිසරයට ප්‍රතිචාර වශයෙන්, අපි බැංකුවේ සියලුම ප්‍රතිපත්ති සමාලෝචනය කර යාවත්කාලීන කළෙමු; අපගේ අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම සහ අධීක්ෂණ අවදානම් විෂය පථය පුළුල් කිරීම; ප්‍රතිපාර්ශ්ව සහ රටවල් වශයෙන් පනවා ඇති සීමාවන් සංශෝධනය සහ විමර්ශණය; නව අධීක්ෂණ කමිටු ස්ථාපිත කිරීම; වැඩිදියුණු කළ සම්බන්ධීකරණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්; බැංකුවේ තත්ත්වය සහ තීරණාත්මක අනුපාත පිළිබඳ දෛනික අධීක්ෂණය ස්ථාපිත කිරීම සහ අඛණ්ඩ අභියෝග වලට මුහුණ දීම සඳහා අපගේ කණ්ඩායම්වල ධාරිතාව වර්ධනය කිරීම සඳහා ආයෝජනය කර ඇත. මෙම පියවර මඟින් බැංකුවේ අධීක්ෂණ දර්ශක නියාමන අනුපාතයන්ට වඩා වැඩි අගයක පවත්වා ගෙන යාම සහතික විය. එමෙන්ම, බැංකුව 2022 වසර අවසන් වන විට නියාමන අනුපාතයන් නියමිත අගයන් අභිබවා පවත්වා ගත් අතර ප්‍රාග්ධන අනුපාතයන්ට අදාලව ස්වාරක්ෂක අගයන් සම්බන්ධව ලබා දුන් සහනයන් භාවිතා නොකරන ලදී.

ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටීමට අනුකූලව බැංකුවේ ශ්‍රේණිගත කිරීම පහත හෙළීමක් සිදු වුවද, ලංකා බැංකුව සියලු නියාමන අවශ්‍යතාවලට අනුකූල වූ අතර සහකාර පාර්ශ්වයන් සහ අනෙකුත් ප්‍රධාන ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ශක්තිමත් සහ විනිවිද පෙනෙන සබඳතාවයන් තහවුරු කර ගනු ලැබීය.

බැංකුවේ ස්ථාවරත්වය කෙරෙහි අවධානය යොමු කරමින්, ඉතිහාසයේ විශාලතම හානිකරණ ප්‍රතිපාදනයන් වෙන් කරමින් මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමට අපි පියවර ගත්තෙමු. ඉදිරි වසර වලදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘතිමත් වීමත් සමඟ අපගේ ගනුදෙනුකරුවන්ගේ සහ රටේ අනාගත වර්ධනය සඳහා ලංකා බැංකුව මනාව ස්ථානගත වී ඇති බව මෙම ක්‍රියාමාර්ග සහතික කළේය.

2022 වසරේ දී සැලකිය යුතු හානිකරණ ණය ප්‍රතිපාදන මත, බැංකුවේ බදු පසු ලාභය රු. බිලියන 32.0 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 15% කින් පහත වැටුණි. නමුත්, වසර තුළ මූල්‍ය අංශයට සහ රටේ ආර්ථිකයට විල්ල වූ බලපෑම්වල විශාලත්වය අනුව, මෙය සැලකිය යුතු කාර්යසාධනයකි. මේ සඳහා, අප කණ්ඩායම මඟින් ඉතා සාර්ථක ලෙස සේවාවේ හෝ ව්‍යාපාරික ක්‍රියාවලියන් හි ගුණාත්මකභාවයට හානියක් නොවන ලෙස වියදම් කළමනාකරණය සහ අධීක්ෂණය කිරීමද ඉතා වැදගත් විය.

තිරසාර සංවර්ධනය සඳහා කැපවී සිටීම

ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව ලෙස, අපගේ ස්වභාවික සම්පත් පිළිබඳ දැනුවත් භාරකාරත්වය සහ පරිසර හිතකාමී භාවිතයන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව අපි විශ්වාස කරමු. හොඳම භාවිතයන් ප්‍රචාරණය කිරීමේදී සහ ගෝලීය අභියෝගවලට මුහුණ දීමේදී බැංකුවට ඇති කළ හැකි බලපෑම අපි මනාව හඳුනා ගෙන ඇත්තෙමු. එනිසා, අපගේ ප්‍රධාන ව්‍යාපාරය සමඟින් ගෝලීය තිරසාරකත්ව ඉලක්කයන් අනුගත කිරීමට බැංකුව ප්‍රමුඛත්වය දෙයි.

සභාපතිතුමාගේ පණිවිඩය

ආර්ථිකයේ අඩු පහසුකම් සහිත ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ අංශ කෙරෙහි අවශ්‍ය සංවර්ධන ණය පහසුකම් සපයමින්, මූල්‍ය ඇතුළත්කරණය ඉහළ නංවමින් බැංකුවේ සමාජ- ආර්ථික වගකීම සපුරා ලනු ලබයි. 2022 දී අපගේ සංවර්ධන ණය දීම් මහින් පීඩනයට පත් වූ සැපයුම් දාමයන් වෙත සහය දැක්වීම, ස්ථාවර රැකියා නිර්මාණය කිරීම සහ තිරසාර කිරීම, ව්‍යවසායකයින් දිරිමත් කිරීම සහ රට පුරා ග්‍රාමීය හා කාර්මික සංවර්ධනයට දායක විය. 2022 දී, අපි ක්ෂුද්‍ර මූල්‍යකරණය සහ අනෙකුත් නිෂ්පාදන හරහා මෙම අංශයට ඉලක්කගත ණය ලබා දීම සඳහා බැංකුවේ අරමුදල් වෙන් කළ අතර, වසර අවසාන වන විට ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත අපගේ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය රු. බිලියන 13.1 කි. මීට අමතරව, "BOC ගම්මාන" යන අපගේ අද්විතීය ග්‍රාමීය සංවර්ධන වැඩසටහන හරහා ප්‍රජාවන් ගණනාවකට සහයෝගය දැක්වීමට අවස්ථාව ලැබීම අපට භාග්‍යයකි. මෙම නව්‍ය මූලපිරීම් ලංකා බැංකුවේ දිගුකාලීන තිරසාර න්‍යාය පත්‍රය, මෙහෙවර සහ ආයතනික වටිනාකම්වලට අනුකූල වන අතර රටේ සහ ප්‍රජාවගේ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා අපගේ කැපවීමේ කොටසකි.

2022 දී අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් කළමනාකරණය කරන අතරම, බැංකුව මෙම තිරසාර න්‍යාය පත්‍රයේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමට අඛණ්ඩව කටයුතු කළේය. අපි අපගේ පාරිසරික සහ සමාජීය කළමනාකරණ පද්ධති (ESMS) ප්‍රතිපත්තියට අනුකූලව වර්ෂය තුළ සියලුම ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා පාරිසරික සහ සමාජීය (E&S) පරීක්ෂාව දීර්ඝ කළෙමු. මෙයට ප්‍රධාන කාර්ය මණ්ඩලය සහ ණය නිලධාරීන් පුහුණු කිරීම සහ 2022 දී පාරිසරික සහ සමාජීය නිර්ණායක සඳහා ණය 841 ක් පිරික්සීම ඇතුළත් විය. ඊට අමතරව, අපගේ හරිත මූල්‍යකරණ මූලපිරීම්වල කොටසක් ලෙස, අපි හරිත තාක්ෂණයන් අනුගමනය කිරීම, සංවර්ධනය කිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා සහාය වන ණය ලබා දීම සඳහා ප්‍රමුඛත්වය ලබා දුන් අතර නියමිත අරමුදල් වෙන් කිරීම ද සිදු කරන ලදී.


හරිත තාක්ෂණය සඳහා රු. මිලියන 711.6 ක් වටිනා නව පහසුකම් වසර තුළ ප්‍රදානය කරන ලද අතර 2022 වසර අවසානයේදී පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සඳහා රු. බිලියන 1.0 ක ප්‍රතිපාදන සපයා ඇත. ශ්‍රී ලංකාව තුළ හරිත සංකල්පය සහ හරිත බලශක්ති ප්‍රවර්ධනය කිරීම සහ සහාය වීම සඳහා ප්‍රබල බලපෑමක් අපට සිදු කිරීමට හැකි බව අප මනාව හඳුනා ගෙන ඇත.

ප්‍රණාමය

අභියෝගාත්මක වසරක් තුළ බැංකුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දක්වන ලද මඟ පෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු මුදල් අමාත්‍යතුමාට මාගේ ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි. ඒ වගේම ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා ඇතුළු නිලධාරීන්ටත්, ජනාධිපති ලේකම්තුමාටත්, භාණ්ඩාගාර ලේකම්තුමාටත් ඔවුන්ගේ අගනා උපදේශනය පිළිබඳව ස්තූතිය පුද කරනු කැමැත්තෙමි.

2022 වසරේ පැවති අභියෝග හමුවේ ලබා ගත් කාර්යසාධනයන් අපගේ සේවක මණ්ඩලයේ කැපවීම මත වන අතර, විවිධ අර්බුද හමුවේ ඔවුන්ගේ කැපවීම මත අපගේ රටට සහ ප්‍රජාවන්ට අඛණ්ඩව සේවය කිරීමට අපට හැකි විය. අභියෝගාත්මක වසරක් හමුවේ බැංකුව පිළිබඳ දැක්ම සහ ක්‍රියාශීලී තීරණ ගැනීමට මඟ පෙන්වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ විශේෂඥතාවට ද මම ස්තූතිවන්ත වෙමි. දශක තුනකට වැඩි කාලයක් කැපවී සේවය කර, බැංකුවේ මහා කළමනාකරු/ප්‍රධාන විධායක නිලධාරී ලෙස විශ්‍රාම යන කේ ඊ ඩී සුමනසිරි මහතාට මාගේ කෘතඥතාව පළකරමි.

අනාගතය දෙස විමර්ෂණය කරන විට, බැංකුවේ සේවක මණ්ඩලයේ වෘත්තීමයභාවය සහ පලපුරුද්ද පිළිඹිබු කරන්නේ ඉදිරි වසර වලදීත් අපගේ රටට සහ ප්‍රජාවන්ට අඛණ්ඩව සහයෝගය දැක්වීමට ලංකා බැංකුව හොඳින් ස්ථානගත වී ඇති බවයි. 2023 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධුරයට පත්වන රොනල්ඩ් සී පෙරේරා මහතාට සහ බැංකුවේ නව මහා කළමනාකරු/ප්‍රධාන විධායක නිලධාරී රසල් ෆොන්සේකා මහතාට මාගේ සුබ පැතුම් පිරිනමමි. ඔවුන්ගේ දැක්ම, ප්‍රවීණත්වය සහ අත්දැකීම් වල ගැඹුර ලංකා බැංකුව ශක්තියෙන් ශක්තිය දක්වා මෙහෙයවනු ඇතැයි මම විශ්වාස කරමි.



කාංචන රත්වත්තේ
සභාපති
2023 ජනවාරි 01
කොළඹ දීය

ලංකා බැංකුවේ නායකත්වය උපායමාර්ගිකව සිය මෙහෙයුම් කටයුතු බැංකුවේ හර පද්ධතිය සමඟ දිශාගත කරනුයේ වගවීම, විනිවිදභාවය සහ අඛණ්ඩත්වය තහවුරු කරමින්ය. ශක්තිමත් ආයතනික යහපාලනය බැංකුවේ නායකත්ව භූමිකාවේ මුඛ්‍ය අංගයකි. බැංකුවේ ඇති පුළුල් සහ ප්‍රශස්ත ක්‍රියාපටිපාටි, පද්ධති, අවශ්‍ය අනුකූලතාවයන් සහ බැංකුවේ තිරසාරකත්වය තහවුරු කරන්නේ එහි සියළු පාර්ශ්වකරුවන්ට වටිනාකම් නිර්මාණය කරමින්ය.

2 මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

ලංකා බැංකුවේ මූලෝපායික නායකත්වය එහි මූලික වටිනාකම්වලට අනුකූලව බැංකුවේ මෙහෙයුම් සඳහා ක්‍රියාකාරී ප්‍රවේශයක් සකස් කරන අතරම වගවීම, විනිවිදභාවය සහ අඛණ්ඩතාව සහතික කරයි. ශක්තිමත් ආයතනික පාලනය යනු බැංකුවේ නායකත්ව කාර්යයේ මූලික අංගයක් වන අතර, පාර්ශ්වකරුවන් සඳහා දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමට හැකිවන අතරම බැංකුවේ අනුකූලතාව සහ තිරසාරභාවය සහතික කරන ශක්තිමත් පද්ධති සහ ක්‍රියාවලීන්ගෙන් සමන්විත වේ.



2019 දී ආරම්භ වූ වසර ගණනාවක අභියෝගාත්මක තත්ත්වයන් මත, සමාලෝචිත වර්ෂය රටට සහ සමස්ත බැංකු පද්ධතියට අසාමාන්‍ය අත්හදා බැලීම් ගෙන ආවේය. කෙසේ වෙතත්, 2022 දී ලංකා බැංකුව රට වෙනුවෙන් කළ යුතු යුතුකමෙහි නොසැලී සිටිමින් ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කළ බව වාර්තා කිරීමට මම සතුටු වෙමි. වේගයෙන් වෙනස් වන මෙහෙයුම් පරිසරයක විල්ල වූ සියළු අභියෝග වලට අධිෂ්ඨානශීලීව හා කාලානුරූපීව ප්‍රතිචාර දැක්වූ ලංකා බැංකුවහි සේවක මණ්ඩලයේ කැපවීම පිළිබඳව මම ආඩම්බර වෙමි.

අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම

රටේ වර්ධනය වන ආර්ථික අර්බුදය මධ්‍යයේ, 2022 වසර තුළ පොළී අනුපාතවල ස්ථාවර වැඩිවීමකට තුඩු දුන් අතර, එය රටේ සහ මූල්‍ය අංශයේ දිශානතිය සම්පූර්ණයෙන්ම වෙනස් කළේය. පළමු කාර්තුව අවසානයේ සිදු වූ විනිමය අනුපාතිකයේ පාවීම සහ දෙවන කාර්තුව ආරම්භයේ දී ස්වෛරී පැහැර හැරීම නිවේදනය කිරීම මගින් ආර්ථිකයට විශාල ආර්ථික කම්පනයක් ඇති කළ අතර එමඟින් සියලු කර්මාන්ත මත විවිධ බලපෑම් ඇති විය. අධික උද්ධමනකාරී පීඩනය සහ විදේශ විනිමය ක්ෂය වීම සහ ශ්‍රී ලංකාවේ බාහිර අංශයේ දුර්වලතා මත බලශක්ති අර්බුදයකටද මුහුණ දීමට සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ දේශපාලන අර්බුදයක් ඇති විය.

කේ ඊ ඩී සුමනසිරි
මහා කළමනාකරු

මෙම තත්ත්වය තුළ, බැංකුව ආර්ථිකය ස්ථාවර කිරීමට සහ අර්බුදකාරී ව්‍යාපාරවලට සහ ප්‍රජාවන්ට සහාය වීමට කටයුතු කරන අතරම ව්‍යාපාරයන්හි අඛණ්ඩ පැවැත්මට ප්‍රමුඛත්වය දුන්නේය. දුෂ්කර වසරක් තුළ, අපගේ ක්‍රියාකාරකම් පාර්ශ්වකරුවන්ගේ හදිසි සහ දිගුකාලීන අවශ්‍යතා සමඟ සමපාත කිරීමට අප සෑම උත්සාහයක්ම ගත්තෙමු. මූල්‍ය සේවා අංශයේ වෙළෙඳපළ ප්‍රමුඛයා ලෙස, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම කෙරෙහි අපගේ ප්‍රධාන වගකීම ද අපි මනාව වටහා ගෙන ඇත්තෙමු. මේ සම්බන්ධයෙන්, අපි බැංකුවේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා අපගේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම, දැඩි පාලනයන් ඇති කිරීම, අධීක්ෂණය වැඩි කිරීම සහ අවදානම් කළමනාකරණය සහ අවම කිරීම සඳහා අපගේ නායකත්වය වැඩිදියුණු කිරීම ආදී ක්‍රියාශීලී සහ විචක්ෂණශීලී පියවර ගත්තෙමු.

අපගේ පාර්ශ්වකරුවන් වෙත යුතුකමක් ඉටු කිරීම

සම්පූර්ණයෙන්ම රජය සතු බැංකුවක් ලෙස, ලංකා බැංකුව රට සහ ආර්ථිකය තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. රටේ ව්‍යාපාරික කාර්යයන්හි මනා ක්‍රියාකාරිත්වය තහවුරු කරන සමාජ-දේශපාලන ස්ථාවරත්වය පවත්වා ගැනීම තහවුරු කරමින් ලංකා බැංකුව විසින් ප්‍රධාන රාජ්‍ය ආනයනකරුවන් සඳහා අත්‍යවශ්‍ය මූල්‍ය පහසුකම් සපයන ලද අතර එමඟින් ඉන්ධන, ගෑස් සහ ඖෂධ වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වල අඛණ්ඩ සැපයුමට දායකත්වය ලබා දෙන ලදී.

අපි ව්‍යාපාරයන්හි අඛණ්ඩ පැවැත්මට ප්‍රමුඛත්වය ලබා දෙමින්, බලශක්ති අර්බුදය හමුවේ උවද අපගේ පුළුල් ශාඛා ජාලය සහ ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,100 කට අධික ප්‍රමාණයක් විවෘතව සහ ක්‍රියාත්මකව පැවතීම සහතික කළෙමු. එමඟින් රටේ සමහර දුරස්ථ ස්ථාන සඳහා මූල්‍ය සේවා සඳහා අත්‍යවශ්‍ය ප්‍රවේශයක් ලබා දීමට අපට හැකි විය. වර්ෂය තුළ අපි විදේශ ප්‍රේෂණ ගලා ඒම සහ අපනයන ඉපැයීම් සඳහා පහසුකම් සැලසෙන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළෙමු. ප්‍රමුඛතා පදනම මත විදේශ මුදල් කළමනාකරණය කිරීම සහ වෙන් කිරීම සඳහා අපි ඉහළ මට්ටමේ කමිටුවක් පත් කළ අතර එමඟින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා විදේශ විනිමය සැපයීමට බැංකුවට හැකි විය.

ආර්ථික අර්බුදයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ ආර්ථිකයේ අංශ කෙරෙහි ද ලංකා බැංකුව සිය අවධානය යොමු කළේය. වසර ගණනාවක් පුරා පසුබෑමකට මුහුණ දුන් සංචාරක හා ආගන්තුක සත්කාර අංශයේ නියැලි ව්‍යාපාර ද ඇතුළුව රු. බිලියන 74.4 ක් වටිනාකම්න් යුත් ණය සහ අත්තිකාරම් සඳහා ණය පියවීම සඳහා සහන කාල ලබා දී ඇත.

අපගේ ගනුදෙනුකරුවන් සමඟ සහයෝගය දැක්වීම සහ සම්බන්ධව කටයුතු කිරීම පිළිබඳ දිගුකාලීන දැක්මකට අනුකූලව, ලංකා බැංකුව නඩු පැවරීම හෝ නැවත අත්පත් කර ගැනීම් වැනි දැඩි ණය අයකර ගැනීමේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අත්හිටුවීමට තීරණය කළේය. ඒ වෙනුවට, බැංකුව ප්‍රමුඛත්වය දුන්නේ ගනුදෙනුකරුවන් සමඟ වටිනාකම් සහ ප්‍රතිලාභ බෙදාහදා ගැනීම: ඉහළ යන උද්ධමන පීඩනයෙන් සහ ආර්ථික පසුබෑමෙන් දෙයාකාරව පීඩාවට පත් වූ සිල්ලර ණය ගැනුම්කරුවන්ට ණය සහන සහ පොළී අනුපාත උච්චාවචනයන්ගේ බලපෑමෙන් ආරක්ෂා කිරීමයි. මේ සම්බන්ධයෙන් ශාඛා ගනුදෙනුකරුවන් 35,291 දෙනෙකුට බැංකුව සහාය විය. ඒ හා සමානව, රට පුරා ව්‍යාපාරවල අවශ්‍යතා සපුරාලීම සඳහා අපි පළාත් මට්ටමින් ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකක (BRRUs) ස්ථාපිත කිරීමත් සමඟ ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ස්වරූපයෙන් ගනුදෙනුකරුවන්ට අපගේ කැපවූ සහ අඛණ්ඩ සහයෝගය ද පුළුල් විය. ආනයන සීමා කිරීම්, තරඟකාරිත්වය ගිලිහීම, වැඩි පිරිවැය ප්‍රාග්ධනය, සහ කාරක ප්‍රාග්ධනය සහ මුදල් ප්‍රවාහ ගැටළු යන විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දුන් ගනුදෙනුකරුවන් වෙත සහය දැක්වීම සඳහා මෙම ඒකකයේ විශේෂයෙන්ම කැපවූ සහ පුහුණුව ලත් සේවක මඩුල්ලක් නිරතුරුව කැපවී සිටී. වසර තුළදී, ලංකා බැංකුව විසින් ව්‍යාපාර 30 කට අධික සංඛ්‍යාවක් යළි නඟාසිටුවීමට දායකත්වය දැක්වූයේ සෘජු හා වක්‍ර රැකියා 2,500 කට අධික සංඛ්‍යාවක රැකියා සුරක්ෂිතතාවය තහවුරු කිරීමට දායක වෙමින් විය.

මූල්‍ය ඇතුළත් කිරීම් සහ ආර්ථිකයේ අඩු පහසුකම් සහිත අංශ සඳහා සහය වන අපගේ ප්‍රයත්නයේ කොටසක් ලෙස, ලංකා බැංකුව විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා රු. බිලියන 52.6 ක පහසුකම් සැපයූවේ කාන්තා ව්‍යවසාය මූලික කොටගත් ව්‍යාපාර සඳහා රු. බිලියන 4.3 ක මූල්‍ය පහසුකම් ද සමගින්ය.

අපගේ උපායමාර්ගික ප්‍රවේශය සහ එහි සාර්ථකත්වය

ඉතා අවිනිශ්චිත සහ අස්ථාවර මෙහෙයුම් පරිසරයකට ප්‍රතිචාර දක්වමින්, වසර තුළ වර්ධනයට වඩා ශේෂ පත්‍රයේ ශක්තියට ප්‍රමුඛත්වය දීමට බැංකුව සිය කෙටි කාලීන උපායමාර්ගයන් යළි දිශාගත කළේය. දිගු කාලීන වශයෙන්, බැංකුවේ පරිවර්තනීය සහ ඉදිරි දැක්ම සහිත උපායමාර්ගය අපට තරඟකාරී වාසියක් ලබා දෙයි. බැංකුවේ උපායමාර්ගික සැලැස්මේ ප්‍රගතිය සහ පෙළගැස්ම කළමනාකරණ මට්ටමේ කමිටු පහක් මඟින් අධීක්ෂණය කරනු ලැබේ.

වසර තුළ ශීෂ්‍රයෙන් වෙනස් වන මෙහෙයුම් පරිසරයක් තිබියදීත්, අනාගතයේදී ද පැනනැඟිය හැකි ආර්ථික අභියෝගයන්ට ශක්තිමත්ව මුහුණ දීම උදෙසා අවශ්‍ය ප්‍රධාන ක්ෂේත්‍රවල ආයෝජනය කරමින් ලංකා බැංකුවේ හි ආවේනික ශක්තීන් උපරිම කිරීමට අපට හැකි විය.

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

මිලියන 14 කට අධික විවිධ වූ ගනුදෙනුකරුවන්ගෙන් සමන්විත පුළුල් පදනමකින් බැංකුව ශක්තිමත් වේ. වසර තුළදී අර්බුදකාරී තත්ත්වය තුළ ගනුදෙනුකරුවන්ට ගැලපෙන විවිධ වූ විසඳුම් සමඟින් අවශ්‍ය සහයෝගයන් ලබා දීම තුළින් ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය බැංකුවේ සියළු ව්‍යාපාරික අංශ හරහා පැහැදිලිව දක්නට ලැබුණි. ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකයේ කටයුතු පුළුල් කිරීම; අර්බුදකාරී ව්‍යාපාර සඳහා සහන ලබාදීම; ශාඛා ගනුදෙනුකරුවන්ට අවශ්‍ය සහයෝගය දැක්වීම; ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සහ අඩු පහසුකම් සහිත කණ්ඩායම් සඳහා සහනදායී සංවර්ධන ණය ලබා දීම; BOC අපනයන කවය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කවය, සහ විදේශ කවය හරහා අපනයන-අභිමුඛ ව්‍යාපාර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා අඛණ්ඩව සහයෝගය; නව සහ නව්‍ය සේවාවන්හි පුරෝගාමිත්වය දරමින් කේන්ද්‍රගත නියෝජිත බැංකු ජාලය - BOC Connect පුළුල් කිරීම ආදීය අපගේ ගනුදෙනුකරුවන්ට වඩා හොඳ සේවාවක් ලබා දීම සඳහා වූ උත්සාහයගෙන් කිහිපයකි. 2022 වසර තුළදී, විවිධ පුහුණුවීම් තුළින් අපගේ

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

කණ්ඩායමේ සේවා කුසලතා වැඩිදියුණු කිරීම සඳහා අපි දිගටම ආයෝජනය කළ අතර, ගනුදෙනුකාර අත්දැකීම් ඒකකය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පියවර ගත්තෙමු. දැනට ක්‍රියාත්මක ශාඛා ප්‍රතිස්ථාපන වැඩසටහන යටතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ ආන්දවුල්පොත හි නව ශාඛාවක් විවෘත කිරීම; ගනුදෙනුකාර පහසුව වැඩිදියුණු කිරීම සඳහා ශාඛා 19 ක් නැවත ස්ථානගත කිරීම සහ වසර තුළ දී ශාඛා 61 ක් සහ ස්මාර්ට් කලාප වැඩිදියුණු කිරීම.

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

බැංකුවේ සේවාවන්, පද්ධති, ක්‍රියාවලි සහ ගනුදෙනුකාර සේවාවන් ඩිජිටල්කරණය කිරීම, ඩිජිටල් හැකියාව තුළින් අනාගතය තහවුරු කිරීම අරමුණු කරගත් ලංකා බැංකුවේ හි පරිවර්තන උපායමාර්ගයේ කොටසකි. 2022 දී, අපි ලංකා බැංකුවේ හි ඩිජිටල් සහ සබැඳි බැංකු සේවාවන් ගණනාවක උපාංග සහ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කර එකතු කළෙමු. ඊට අමතරව, අපි බැංකුවේ පසුපෙළ දෘඩාංග ශක්තිමත් කරමින් ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම අඛණ්ඩව කරගෙන ගියෙමු; ගනුදෙනුකරුවන් විසින් ඩිජිටල් නාලිකා වැඩි වශයෙන් භාවිතා කිරීම සමඟ සමපාතව සයිබර් ආරක්ෂණ පියවර සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම; අභ්‍යන්තර සහ බාහිර ආධාරක සහ සේවා පද්ධති වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී. 2022 වසරේ දී සියලුම ගනුදෙනුවලින් 48% ක් ඩිජිටල් හෝ ඉලෙක්ට්‍රොනික බැංකු නාලිකා හරහා සිදු විය.

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම

අපගේ සේවකයින් අපගේ ව්‍යාපාර ආකෘතියේ හරය වන අතර අපගේ සේවාවන් සැපයීම් ක්‍රියාවලියේ අනිවාර්ය කොටසකි. මෙහෙයුම් පරිසරයේ වෙනස්කම් වලට අනුකූලව තරඟකාරිත්වය සහතික කිරීම සඳහා බැංකුව විසින් වසර තුළ සේවක වැටුප් සහ ප්‍රතිලාභ වැඩසටහන පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු කරන ලදී. මානව සම්පත් කළමනාකරණය සම්බන්ධව බැංකුවේ ප්‍රතිපත්ති ද එලෙසම සමාලෝචනය කර සංශෝධනය කරන ලදී. මානව සම්පත් ක්‍රියාකාරිත්වයට එහි සේවක නියැලීම සහ සේවක රඳවා ගැනීමේ ප්‍රයත්නයන් වඩා හොඳින් අවධානය යොමු කිරීම සඳහා නව ප්‍රතිපත්ති ද වර්ෂය තුළ හඳුන්වා දෙන ලදී. වසර තුළදී ඇති වූ ඉන්ධන අර්බුදයට සාර්ථකව මුහුණදීම සඳහා ලංකා බැංකුව සිය කණ්ඩායම්වලට කැපවූ ප්‍රවාහන සේවා, සහ නිවසේ සිට වැඩ කිරීම සහ දුරස්ථ වැඩ කිරීම ආදී ක්‍රියාමාර්ග ඔස්සේ සහාය වීමට පියවර ගත් අතර, ඒ සමඟම තාවකාලික ස්ථාන මාරුවීම්, නම්‍යශීලී වේලාවන් සක්‍රීය කිරීම සහ වෙනත් ක්‍රියාමාර්ග රාශියක් සමඟින් අපගේ කණ්ඩායම් වලට ආරක්ෂිතව, ඵලදායීව සේවාව සැපයීමට අවශ්‍ය පරිසරය සකස් කර දෙන ලදී. අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහ නායකත්ව සංවර්ධනය සමඟින් ව්‍යාපාර පුනර්ජීවනය සහ ගනුදෙනුකාර සේවය වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල කුසලතා සහ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා සැලසුම් කර ඇති පුහුණු කිරීම් සමඟින් 2022 දී අපගේ සේවකයින්ගේ කුසලතා සංවර්ධනය වෙත තවදුරටත් අවධානය යොමු කරන ලදී. බැංකුව විසින් පුහුණු වැඩසටහන් 663 ක් ක්‍රියාත්මක කර ඇති අතර වසර තුළ සේවක පුහුණුව හා සංවර්ධනය සඳහා රු. මිලියන 73.9 ක් ආයෝජනය කර ඇත.

ණය සංස්කෘතිය සහ ගුණාත්මකභාවය

වසර තුළ බැංකුව සිය ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට නිබඳව කැපවූ අතර ඔවුන්ගේ හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාලමින් ව්‍යාපාර පැවැත්මට සහාය වීම සඳහා ණය පහසුකම් නැවත සැලසුම් කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කරලන ලදී. එමෙන්ම අර්බුදයෙන් පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන් සමඟ අපගේ කාර්ය මණ්ඩලය කඩිසරව සහ ක්‍රියාශීලීව කටයුතු කරමින් ඔවුන්ගේ ගැටළු නිරාකරණයට උපකාර විය. බැංකුව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කල අතර ශීඝ්‍රයෙන් වෙනස් වන මෙහෙයුම් පරිසරයක් තුළ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. ලංකා බැංකුවේ හි ප්‍රතිලාභදායක ණය සංස්කෘතිය ආරක්ෂා කිරීමේ මෙම සාමූහික ප්‍රයත්නවල ප්‍රතිඵලයක් ලෙස, බැංකුවට තම ණය කළඹෙහි ගුණාත්මක භාවය ආරක්ෂා කර ගැනීමට හැකි විය.

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

ලංකා බැංකුවේ හි ආයතනික පාලන රාමුවේ සහ භාවිතයන්හි ගුණාත්මකභාවය 2022 දී අප විසින් ලබා දුන් කාර්යසාධනය සඳහා ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය. ඉතා අභියෝගාත්මක වසරක පීඩනයට ඔරොත්තු දීම සඳහා බැංකුව ශේෂ පත්‍රයේ සහ ව්‍යාපාර ආකෘතියේ ස්ථායීතාවයට ප්‍රමුඛත්වය දී ඇති අතර, එසේම පාර්ශ්වකරුවන්ට නිර්මාණික අගය අඛණ්ඩව ලබා දීමටද කටයුතු කළේය. ජාතික අරමුණ සමඟ බැංකුව අනුගතව කටයුතු කිරීම ඉදිරි වසර වලදී ශ්‍රී ලංකාවේ ප්‍රකෘතිමත් වීමත් සමඟම බැංකුව වර්ධනය වීමට ස්ථානගත කරන අතරම අපගේ රටේ සහ ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලීම සහතික කළේය.

ශක්තිමත් කාර්යසාධනයක්

අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තිබියදීත් ලංකා බැංකුව 2022 දී කැපී පෙනෙන කාර්යසාධනයක් පළ කළේය. ප්‍රධාන අත්‍යාවශ්‍යයන් මෙහෙයවීම, තීරණ ගැනීමේ කඩිසර බව සහ අදාළ සහ කාලෝචිත උපායමාර්ගයක් අනුගමනය කිරීම කෙරෙහි බැංකුවේ නොසැලෙන අවධානයට මෙය සාක්ෂියකි. ව්‍යාපාර පුනර්ජීවනය කිරීමට, බලපෑමට ලක් වූ අංශවලට සහය දැක්වීමට සහ නව්‍ය නිෂ්පාදන නියමු කිරීමට බැංකුව දරන උත්සාහය වසර තුළ පැවති ඉහළ පොළී අනුපාතයන්හි අහිතකර බලපෑම් අවම කළේය. වසර තුළ රජයට සෘජු ණය දීම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීම හේතුවෙන් මුළු දළ ණය සහ අත්තිකාරම් රු. මිලියන 8,110.8 ක සුළු වර්ධනයක් පමණක් පෙන්නුම් කළේය. ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමේ සහ අනාගත කම්පනවලින් ආරක්ෂා වීමේ විචක්ෂණ ප්‍රවේශයක් ලෙස සිදුවිය හැකි ණය පාඩු සඳහා ප්‍රතිපාදන සැලසීමේ බැංකුවේ ප්‍රවේශය පිළිබිඹු කරමින් ශුද්ධ ණය සහ අත්තිකාරම් 4% ක අඩුවීමක් පෙන්නුම් කළේය. බැංකුවේ මුළු අරමුදල් වලින් 84% ක් වූ තැන්පතු ප්‍රමාණය 16% ක වර්ධනයක් පෙන් වූ අතර, ලංකා බැංකුවේ ස්ථාවරත්වය කෙරෙහි මහජනතාවගේ අඛණ්ඩ විශ්වාසය පෙන්නුම් කරයි.

බැංකුව වසර තුළ ශුද්ධ පොළී ආදායමේ 14% ක වර්ධනයක් වාර්තා කළ අතර ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම ද 15% කින් වර්ධනය විය. කෙසේ වෙතත්, අවපාත ආර්ථික තත්ත්වයන් සහ ඉහළ පොළී අනුපාත තන්ත්‍රයක් පිළිබිඹු කරමින්, පොළී වියදම් 121% කින් වර්ධනය විය. ඒ හා සමානව, ණය සහ ආයෝජන වෙනුවෙන් වන හානිකරණ වෙන්කිරීම් 99% කින් ඉහළ ගියේ රටේ පැවති ආර්ථික අවපාතය මූලික කොටගෙන ගනුදෙනුකරුවන් මුහුණ පෑ දුෂ්කරතා මත විල්ල විය හැකි අපේක්ෂිත අලාභ සැලකිල්ලට ගනිමින් බැංකුවේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම උදෙසා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම මතය. බැංකුවේ

හානිකරණ ණය අදියර 3 අනුපාතය 5.3%, කර්මාන්තයේ තරඟකරුවන් සමඟ අනුකූලව පැවතුනි.

> මිලියන 14 කට අධික විවිධ වූ ගනුදෙනුකරුවන්ගෙන් සමන්විත පුළුල් පදනමකින් බැංකුව ශක්තිමත් වේ. වසර තුළදී අර්බුදකාරී තත්ත්වය තුළ ගනුදෙනුකරුවන්ට ගැලපෙන විවිධ වූ විසඳුම් සමඟින් අවශ්‍ය සහයෝගයන් ලබා දීම තුළින් ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය බැංකුවේ සියළු ව්‍යාපාරික අංශ හරහා පැහැදිලිව දක්නට ලැබුණි.

2022 වසරේ දී බැංකුවේ මෙහෙයුම් වියදම් 14% කින් ඉහළ ගොස් ඇති අතර, මූලික වශයෙන් ඉහළ ගිය පිරිස් වියදම් මඟින් දුෂ්කර අවස්ථාවන්හිදී අපගේ විශ්වාසවන්ත සේවකයන්ට සහයෝගය දැක්වීම සඳහා අපගේ කැපවීම පිළිබිඹු කරයි.

2021 වසර හා සසඳන විට, බැංකුවේ මූල්‍ය සේවා මත බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය රු. බිලියන 42.3 දක්වා 19% කින් අඩු වී ඇති අතර බදු ගෙවීමට පෙර ලාභය සහ බදු ගෙවීමෙන් පසු ලාභය පිළිවෙලින් 28% සහ 15% කින් පහත වැටුණි.

ජාතික අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දීම, අපගේ විශ්වාසවන්ත ගනුදෙනුකරුවන්ට සහන සහ සහාය ලබාදීම සහ බැංකුවේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින් සැලකිය යුතු ප්‍රතිපාදන සැලසීම යන කරුණු ලාභ ඉපයීමේ අරමුණට පෙරටුව සලකන ලදී.


ණය වර්ධනය අඩු වුවද 2022 දී බැංකුවේ මුළු වත්කම් 14% කින් රු. ට්‍රිලියන 4.3 දක්වා වැඩි විය. ඊට ප්‍රතිචාර වශයෙන් බැංකුව අභ්‍යන්තරව ජනනය කරන ලද ප්‍රාග්ධනය සහ ණයකර වැඩිකර ගනිමින් සිය ප්‍රාග්ධන තත්ත්වය ශක්තිමත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළේය. රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් අවදානම මත බර තැබූ වත්කම්වල වැඩිවීම, රු. බිලියන 6.7 ක අධිභාර බද්ද ගෙවීම යන අභියෝග හමුවේ උවද බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයට අහිතකර ලෙස බලපාන ඉපයීම් සහ 3 වන අදියර ණය ඉහළ යාම 2022 දෙසැම්බර් අවසානය වන විට එහි පළමු ස්ථරයේ ප්‍රාග්ධන හා මුළු ප්‍රාග්ධන අනුපාතය පිළිවෙළින් 12.4% සහ 15.4% ලෙස පවත්වා ගැනීමට බැංකුවට හැකි විය. .

ස්තුතිය

විශේෂයෙන්ම මෙම අභියෝගාත්මක වසර අවසානයේදී, බැංකුව තවදුරටත් ශක්තිමත් භාවයක් ලබා ඇත. කෙසේ වෙතත්, ඉදිරි අභියෝග සඳහා මුහුණදීමට සැලසුම් සකස් කිරීමේදී බොහෝ දේ පිළිබඳව අවධානය යොමු කළ යුතුව ඇත. මේ සම්බන්ධයෙන්, මෙම තීරණාත්මක අවස්ථාවේදී බැංකුවේ පාලනය භාර ගන්නා නව මහා කළමනාකරු රසල් ෆොන්සේකා මහතාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නව සභාපති රොනල්ඩ් සී පෙරේරා මහතාට මගේ සුබ පැතුම් පිරිනමනු කැමැත්තෙමි. ඉදිරි වසර තුළ බැංකුවේ සැලසුම් සහ ප්‍රමුඛතා දැක්වෙන ඔවුන්ගේ පණිවිඩය ඉදිරියට මම බලාපොරොත්තු වෙමි. ඔවුන්ගේ නායකත්වය ඉදිරි වසර වලදී ලංකා බැංකුව ශක්තියෙන් ශක්තියට ගෙන යනු ඇතැයි මට විශ්වාසයි.

අතිවිශාල අභියෝගාත්මක වසරක් තුළ ලංකා බැංකුවේ නොසැලෙන සහයෝගය වෙනුවෙන් ලංකා බැංකුවේ සියලුම පාර්ශ්වකරුවන්ට මගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. ආයතනික කළමනාකාරිත්වය සහ විධායක කළමනාකරණය ඇතුළු අපගේ සේවකයින්ගේ කැපවීම, අපගේ ගනුදෙනුකරුවන්ගේ පක්ෂපාතිත්වය සහ අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ගේ සහ වෘත්තීය සමිතිවල විශ්වාසය මත වසර තුළදී ලංකා බැංකුවේ හි උපායමාර්ගික ඉලක්ක කරා ළඟා වීමට සහ ශක්තිමත් ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය.

වසර තුළ අපගේ ප්‍රයත්නයන් පෝෂණය කිරීම සඳහා ඉතා අගනා දායකත්වයක් ලබා දුන් ඔවුන්ගේ නායකත්වය පිළිබඳව අපගේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ අවංක ප්‍රශංසාව පිරිනමමි. වසර තුළ දැක්වූ මගපෙන්වීම සහ අධීක්ෂණය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමාටත්, ගරු මුදල් අමාත්‍යතුමාටත්, ඔවුන්ගේ නිලධාරීන්ට සහ කාර්ය මණ්ඩලයටත් මම ස්තුතිවන්ත වෙමි. විමෙන්ම නියමිත වේලාවට විගණනය අවසන් කිරීම, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සහ එමඟින් මෙම වාර්ෂික වාර්තාව කාලෝචිත ලෙස ප්‍රකාශයට පත් කිරීම සහතික කළ විගණකාධිපතිවරයාගේ සහ ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සහයෝගය ද අගය කිරීමට කැමැත්තෙමි.



කේ ඊ ඩී සුමනසිරි
මහා කළමනාකරු
2023 ජනවාරි 13
කොළඹ දීය

2 නව සභාපති සහ මහා කළමනාකාරතුමන්ගේ ඉදිරි දැක්ම



"ලංකා බැංකුව මූල්‍ය ක්ෂේත්‍රයේ දැවැන්තයෙකු වන අතර එහි තරඟකරුවන් හා සමගාමීව ශක්තිමත් තරඟකාරී බලවේගයකි. අපි විශාලතම සංස්ථා, කර්මාන්ත සහ ව්‍යාපෘති සමඟ ගනුදෙනු කරන අතරම සමාජයේ සෑම ස්ථරයකටම සේවා සපයන බැවින් අපි සැබවින්ම අද්විතීය ආයතනයකි."

ඉතා අභියෝගාත්මක පරිසරයක් තුළ ලඟා කරගත් සාර්ථක ප්‍රතිඵල සමඟ 2022 වසර නිමා කරන විට ශ්‍රී ලංකාවේ ආර්ථික පුනරුදයට සහාය වීම උදෙසාය ලංකා බැංකුව මනාව ස්ථානගත වී ඇත. වසර ගණනාවක ප්‍රවීණතාවයේ ශක්තිය, අඛණ්ඩ වර්ධනය සඳහා කැපවීම ඉදිරි දැක්මකින් යුතු උපායමාර්ගික ප්‍රවේශය යන කරුණු මත ගොඩනැගුණු හැකියාවක් බැංකුව ලබා ඇත. ගනුදෙනුකරුවන්ගේ, රටෙහි සහ වෙනස්වන මෙහෙයුම් පරිසරයක අවශ්‍යතා සපුරාලීම සඳහා අඛණ්ඩව විකාශනය වන මෙම ඉහළ වෘත්තීය, කාර්යක්ෂම, ගතික සහ කැපවූ ආයතනය උදෙසා නායකත්වය දීමට අපි භාග්‍යවන්ත වෙමු.

අපගේ පෙළපත මත ගොඩනැගීම

ලංකා බැංකුව මූල්‍ය ක්ෂේත්‍රයේ දැවැන්තයෙකු වන අතර එහි තරඟකරුවන් හා සමගාමීව ශක්තිමත් තරඟකාරී බලවේගයකි. අපි විශාලතම සංස්ථා, කර්මාන්ත සහ ව්‍යාපෘති සමඟ ගනුදෙනු කරන අතරම සමාජයේ සෑම ස්ථරයකටම සේවා සපයන බැවින් අපි සැබවින්ම අද්විතීය ආයතනයකි.

"අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් බැංකුවේ විශාලතම වත්කමයි. අටදහසකට අධික කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් සිටීමත්, බැංකුවේ යහපත මූලික කොට සලකන සේවක වෘත්තීය සමිතිවල සහයෝගය ලැබීමත් අපි භාග්‍යයක් කොට සලකන්නෙමු. අභියෝග මධ්‍යයේ වුවද බැංකුවේ අංක එකේ ස්ථානය රැක ගැනීමට අපගේ සේවක කණ්ඩායමේ කැපවීම ඉවහල් විය."



සුපරීක්ෂාකාරී ක්‍රියාවලියක් හරහා පත් කරන ලද වෘත්තීය සහ ඉහළ සුදුසුකම් ලත් අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් බැංකුවේ පාලන කටයුතු සිදු කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුවිධ විශේෂඥතාව අනාගත ඉල්ලීම් සපුරාලීම සඳහා බැංකුව හොඳින් ස්ථානගත කර ඇති බව සහතික කරයි. රාජ්‍ය බැංකුවකට අවශ්‍ය කාර්යපටිපාටි අනුගමනය කරමින්, ගතික ව්‍යාපාරික පරිසරයක් තුළ ක්‍රියා කිරීමේ ස්වාධීනත්වය සහ කාර්යක්ෂමතාවය රඳවා ගනිමින් මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අපි ශක්තිමත් වෙමු.

නව සභාපති සහ මහා කළමනාකාරතුමන්ගේ ඉදිරි දැක්ම

තත්ත්වය

වත්කම් (වෙළඳපළ කොටස)	තැන්පතු (වෙළඳපළ කොටස)	2,166 ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන
22%	23%	

ස්ථාවරත්වය

වත්කම් වර්ධනය	තැන්පතු වර්ධනය	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය
14%	16%	15.4%

සන්නාම වටිනාකම රු. බිලියන 53.9

ලාභදායීත්වය

ශුද්ධ පොළී ආදායමේ වර්ධනය	පොළී ආන්තිකය	බදු පසු ලාභය
14%	3.1%	රු. බිලියන 32.0

වත්කම් හි සාමාන්‍ය මත ප්‍රතිලාභය	ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය
0.8%	14.1%

කාර්යක්ෂමතාව

සේවකයෙකු සඳහා ලාභය	සේවකයෙකු සඳහා ව්‍යාපාරය
රු. මිලියන 3.8	රු. මිලියන 721.1

වර්තමාන අභියෝග වලට මුහුණ දෙමින්

ඉදිරි වසර වලදී ඉදිරිපත් වන අභියෝග පසුගිය වසරවල මූල්‍ය ක්ෂේත්‍රය තුළ අත්විඳි අභියෝගවලට වඩා බෙහෙවින් වෙනස් වන බවට අපි විශ්වාස කරමු. ගෝලීය ආර්ථිකයෙන් තුනෙන් එකක් 2023 දී අවපාතයක් අත්විඳිනු ඇතැයි අපේක්ෂා කරන අතර ශ්‍රී ලංකාව මෙම පීඩනයෙන් ගැලවී නැත; රජය විසින් විදේශ ණය ගෙවීම් පැහැර හැරීමෙන් පසුව, විදේශ වගකීම් පියවීම සඳහා ක්‍රියා මාර්ගය සැකසෙමින් පවතින අතර ඊට අනුකූලව විභව දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බලපෑම සහ ප්‍රමාණය අවිනිශ්චිතය වෙමෙන්ම අපගේ ගනුදෙනුකරුවන්ට සහ ව්‍යාපාරයන්ට රටේ ආර්ථික අර්බුදයේ සම්පූර්ණ බලපෑම තවමත් විල්ලවෙමින් පවතී.

ඉදිරි අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, ඉදිරි වසර කිහිපය තුළ බැංකුව උපායශීලීව සහ විවික්ෂණශීලීව මෙහෙයවීම අතිශයින් වැදගත් වේ. තිරසාර වර්ධනයක් සඳහා ක්‍රියාමාර්ගයන් සකස් කරන අතරම, සියලු පාර්ශ්වකරුවන් සමඟ නිර්මිත වටිනාකම් බෙදාහදා ගැනීම, අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම, පාර්ශ්වකරුවන් සමඟ සබඳතා ශක්තිමත් කිරීම, ණය අවදානම පාලනය කිරීම සහ සීමා කිරීම සහ දිගුකාලීන අභියෝගවලට මුහුණ දීම යන කරුණු කෙරෙහි දැඩි අවධානය යොමු කර ඇත.

රජය සතු ව්‍යවසායන් ඇතුළුව සියලුම ණය සඳහා වෘත්තීය ප්‍රවේශයක් රඳවා ගැනීමට අපි අදහස් කරමු. රජය සතු ව්‍යවසායන් වෙත ණය දීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා බැංකුව විශේෂිත ඒකකයක් ආරම්භ කර ඇත. රාජ්‍ය ආයතන විසින් ජාතිය වෙනුවෙන් ඉටු කරන දැවැන්ත සේවය වෙත ශක්තියක් වීමට අපි කැපවී සිටින අතර, අවශ්‍ය තාක්ෂණික සහ ව්‍යුහාත්මක සහයෝගය වඩාත් සමීපව සපයමින් අවශ්‍ය පහසුකම් සැලසීම කෙරෙහි අපගේ අවධානය යොමු කරන්නෙමු.

ඉහළ පොළී අනුපාත සහිත අධි උද්ධමනකාරී පරිසරයක් තුළ, නිසි පරිදි වියදම් කළමනාකරණය කිරීමට බැංකුව සුවිශේෂී පියවර ගනු ඇත. බැංකුවේ ශ්‍රේණිගත කිරීම් ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට විදේශ පාර්ශ්වයන් සමඟ සිදු කරන ගනුදෙනු කාර්යක්ෂමව සහ පහසුවෙන් මෙහෙයවීමට සහ වීම අදාල විදේශ වගකීම් සඳහා නියමිත ගෙවීම් කලට වේලාවට සිදු කිරීමට හැකි වන පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සඳහා බැංකුව සිය ප්‍රතිපාර්ශ්වයන්, අරමුදල් සපයන්නන්, ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන සහ අනෙකුත් ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සමීපව කටයුතු කරනු ඇත.

අහිතකර ආර්ථික තත්ත්වයන් සහ බහු අර්බුද හේතුවෙන් වසරින් වසර පිරිහෙන වත්කම්වල ගුණාත්මක භාවයට ප්‍රතිචාර දැක්වීම පිණිස අපගේ ගනුදෙනුකරුවන් සමඟ ඔවුන්ගේ ව්‍යාපාර පුනර්ජීවනය සඳහා වැඩ කිරීමට අපි කැපවී සිටිමු. අපි බැංකුවෙහි ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකය ශක්තිමත් කිරීම සඳහා ආයෝජනය කර ඇති අතර හදිසි අවශ්‍යතා සඳහා අරමුදල් සැපයීම, මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම සහ අවශ්‍ය උපදේශන සහ සහාය සැපයීම ඇතුළු විවිධ ක්‍රම මඟින් අපගේ ගනුදෙනුකරුවන්ට සහාය ලබා දෙන්නෙමු.

රට වෙනුවෙන් අපේ කැපවීම

බැංකුවට වර්ධනය විය හැක්කේ අපගේ පාර්ශ්වකරුවන් අප සමඟ එක්ව වර්ධනය වුවහොත් පමණක් බව අපි විශ්වාස කරමු. ලංකා බැංකුව සැමවිටම අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් ඇති කිරීමට කැපවී සිටින අතර, ඉදිරි වසර වලදී ද අපි මෙය මූලික කොට කටයුතු කරන්නෙමු.

සෑම මට්ටමකින්ම අපගේ ක්‍රියාවන් මඟින් රට කෙරෙහි බැංකුවේ කැපවීම ශක්තිමත් වනු ඇත: කුඩා ව්‍යාපාර හිමියන්ගේ කණ්ඩායම් සහ ව්‍යවසායකයින් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය දීමේ සිට; සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ප්‍රතිලාභ ලැබෙන සහනදායී සහ සංවර්ධන ණය දීම; අපනයනය ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ සමාගම් සඳහා ඒකාබද්ධ සහයෝගය සහ ණය ලබා දීම; අභ්‍යන්තර ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීමට; ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සහ කාර්මික ව්‍යාපාර සඳහා අරමුදල් සැපයීම; සහ මූල්‍ය පද්ධතියේ සහ ආර්ථිකයේ ස්ථාවරත්වයට අවශ්‍ය සහයෝගය සැපයීම මේ අතර වේ. විදේශ විනිමය අපේ රටට අත්‍යවශ්‍ය සම්පතක් වන මොහොතක, විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීමට සහ දිරිගැන්වීමට සහ ජාතික ප්‍රමුඛතා සඳහා අවශ්‍ය විදේශ විනිමය සැපයීමට බැංකුව සිය පුරෝගාමීත්වය ඉදිරියටත් කරගෙන යනු ඇත.

අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් බැංකුවේ විශාලතම වත්කමයි. අටදහසකට අධික කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් සිටීමත්, බැංකුවේ යහපත මූලික කොට සලකන සේවක වෘත්තීය සමිතිවල සහයෝගය ලැබීමත් අපි භාග්‍යයක් කොට සලකන්නෙමු. අභියෝග මධ්‍යයේ වුවද බැංකුවේ අංක එකේ ස්ථානය රැක ගැනීමට අපගේ සේවක කණ්ඩායමේ කැපවීම ඉවහල් විය. අපේ සේවක කණ්ඩායම ද රටේ ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් වී සිටින බව අපි හඳුනාගෙන ඇති අතර සුදුසු අවස්ථාවලදී ඔවුන්ට සහය දැක්වීමට සහ සහන සැලසීමට කැපවී සිටිමු. පුහුණුව, ධාරිතා සංවර්ධනය සහ වෘත්තීය ප්‍රගතිය සඳහා වන ක්‍රියාමාර්ග සහ සාධාරණ හා තරඟකාරී වේතනයක් හරහා අපි අපගේ සේවකයින් සඳහා ආයෝජනය කිරීම දිගටම කරගෙන යන්නෙමු;

ගනුදෙනුකරුවන්හට අප කරන සියළු කටයුතු වලදී මූලිකත්වය හිමිවේ. අභියෝගාත්මක තත්ත්වයන් වෙත මුහුණදෙමින් නැඟී සිටීමට ගනුදෙනුකරුවන්ට සහයෝගය දැක්වීම අපි පෙළඹී සිටින අතර ණය අයකර ගැනීමේ දැඩි පියවර වෙනුවට ව්‍යාපාර ප්‍රතිස්ථාපනය සහ

පුනර්ජීවනය සඳහා අවස්ථා හඹා යාමට ඔවුන් වෙත සහය වීමට කැපවී සිටිමු. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ව්‍යවසායක ව්‍යාපාර අපගේ ආර්ථිකයට සහ ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපගේ ජීවන රටාවට අත්‍යවශ්‍ය බව ද අපි දැඩි විශ්වාසයක් දරයි. අපනයන සහ වෙළඳපළ ප්‍රවේශය සඳහා පහසුකම්, ව්‍යාපාරික උපදේශන සේවා සහය ආදී වශයෙන් දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අපි දිගටම සහාය දෙන්නෙමු.

හරිත තාක්ෂණය සහ හරිත ආර්ථිකය මතින් ශ්‍රී ලංකාව සඳහා උදාවන අවස්ථා පිළිබඳව මෙන්ම ස්වභාවික පරිසරය කෙරෙහි අපගේ කාර්යභාරය පිළිබඳව ද අපි දැනුවත් වෙමු. මේ සම්බන්ධයෙන්, බැංකුව තිරසාරත්වය සඳහා වන කැපවීම ඉතා බැරෑරුම් ලෙස අවබෝධ කරගෙන සිටියි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ බැංකුවේ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය අපගේ පාරිසරික පියසටහන අඩුකිරීමට කැපවී සිටින අතර, 2028 වසර වන විට කාබන් ශූන්‍ය බැංකුවක් බවට පත්වීමට අපි අපේක්ෂා කරමු. අපගේ ණය දීමේ සහ ආයෝජන තීරණවලදී පාරිසරික හා සමාජීය කරුණු සැලකිල්ලට ගැනීමේ අපගේ උත්සාහයට සමගාමීව, පුනර්ජනනීය සහ පිරිසිදු බලශක්තිය භාවිතා කිරීම සඳහා මූල්‍යකරණය, ප්‍රවර්ධනය සහ දිරිගැන්වීම සඳහා බැංකුව සතුව ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි පැහැදිලිව දැක්වෙන පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධතියක් - (ESMS) ක්‍රියාවට නංවා ඇත.

ස්ථාවර වර්ධනයක් සඳහා අපගේ දිගුකාලීන උපායමාර්ගය සහ ගමන්මඟ

ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම දේශීය වාණිජ බැංකුව වන අතර අපගේ දිගුකාලීන උපායමාර්ගය එහි පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීමේදී බැංකුවේ කාර්යභාරය සලකා බලයි. මධ්‍ය කාලීන වශයෙන් සීඝ්‍ර වර්ධනයක් අප අපේක්ෂා නොකරන අතර, රටේ ආර්ථිකය යළි ප්‍රකෘතිමත්වී සංවර්ධනය කටයුතු දියත්වීමත් සමඟ පැනනඟින ආර්ථික වර්ධන වේගයට සමපාතව අනාගතයේදී බැංකුවේ වර්ධනයද සැලසුම් කෙරෙනු ඇත. ශේෂ පත්‍රයේ වර්ධනය සලකා බැලීමේදී අපි වඩාත් විමසිලිමත් වන අතර කෙටි හා මධ්‍ය කාලීනව බැංකුවේ තත්ත්වය ශක්තිමත් කිරීමට ප්‍රමුඛත්වය දෙන්නෙමු. ඉදිරි වර්ෂයේදී බැංකුවේ කාර්යසාධනය තුළ තීරණාත්මකභාවය සැලකිල්ලට ගනිමින් වත්කම්වල ගුණාත්මකභාවය, ශුද්ධ පොළී ආදායම, ගාස්තු ආදායම, ආයෝජනය සහ පිරිවැය කළමනාකරණය සම්පව අධීක්ෂණය කිරීම සඳහා විශේෂ අධීක්ෂණ කමිටු පහක් පිහිටුවා ඇත. වසරින් වසර අපගේ පාර්ශ්වකරුවන් උදෙසා අගය නිර්මාණය කිරීම සහ බෙදාගැනීම කෙරෙහි අවධානය යොමු කරන අතරම, අපගේ ප්‍රධාන අභිප්‍රාය වන්නේ 2024 වන විට රු. ට්‍රිලියන 5 ක වත්කම් පදනමක් කරා ළඟා වීමයි.

බැංකුවේ පරිවර්තනීය උපායමාර්ගය අපගේ වර්ධන ගමන් පථය සඳහා විශිෂ්ට සැලැස්මක් සපයන අතර, උපායමාර්ගයට විරෙහිව කාර්යසාධනය ඉහළ නැංවීමේ උත්සාහයන් අපි දෙගුණ කරන්නෙමු. උපායමාර්ගික සැලැස්ම තුළ එක් එක් උපායමාර්ගික ක්‍රියාවට නැංවීමට බැංකුව විසින් එක් එක් සක්‍රීයක සඳහා ප්‍රධානීන් පත් කර ඇති අතර, ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

ගනුදෙනුකාර සේවයේ විශිෂ්ටත්වය, ව්‍යාපාර ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම තුළින් කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා කැපවීම සහ ඩිජිටල්කරණය සහ ඩිජිටල් නිෂ්පාදන වෙත අඛණ්ඩව සංක්‍රමණය වීම, ඉදිරියේදීත් අපගේ මූඛ්‍ය අවධානයට යොමු වනු ඇත. අපි අපගේ ව්‍යාපාරික ඒකක මෙහෙයවීමේදී මෙම අංග සඳහා ප්‍රමුඛතාවය දී ඇති අතර ලංකා බැංකුවෙහි සමස්ථ සේවක කණ්ඩායමම ඒ සඳහා කැපවන බව සහතික කිරීම සඳහා අපගේ තක්සේරු කිරීම්වලට උපායමාර්ගික කාර්යසාධක දර්ශක ඇතුළත් කර ඇත. මීට අමතරව, ගතික මෙහෙයුම් පරිසරයක් මධ්‍යයේ අපගේ ගනුදෙනුකරුවන්ගේ විවිධ සහ නව අවශ්‍යතා සැපයීම සඳහා අපගේ කාර්ය මණ්ඩලයේ කුසලතා වැඩි දියුණු කිරීමට අපි කටයුතු කර ඇත.

ලංකා බැංකුව ඩිජිටල්කරණය, මෙහෙයුම් කාර්යක්ෂමතාවයන් හඹා යෑම සහ අපගේ සේවක මණ්ඩලයේ විශේෂඥ ධාරිතාව ඉහළ නැංවීම තුළින් වර්ධනය වන වෙළඳපළ කොටස සහ වැඩිවන වත්කම් පදනම සමඟ ස්ථාවර වර්ධනයක් කරා ගමන් කරමින් සිටී. පසුගිය වසර පහළොව තුළ අපි අපගේ ශේෂ පත්‍රය 2008 දී රු. බිලියන 475 සිට 2022 දී රු. ට්‍රිලියන 4 දක්වා වර්ධනය කර ඇත්තෙමු.

පසුගිය වසර තුන තුළ බැංකුවේ ඩිජිටල් භාවිතය සඳහා සැලකිය යුතු ලෙස ආයෝජනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අපට හැකි විය. අපගේ අනාගත ඉලක්කගත ඩිජිටල්කරණය මූලික කරගත් ව්‍යාපාර ආකෘතිය මඟින් බැංකුවට තම ගනුදෙනුකරුවන්ට සහයෝගීතාවයෙන් සහ දැනට පවතින ධාරිතාවෙන් වැඩි සේවාවක් ලබා දෙමින් තාක්ෂණික දියුණුවේ ප්‍රතිලාභ ඔස්සේ තරඟකාරී මිල ගණන් මත සේවා සැපයීමටත් හැකියාව ලැබෙනු ඇත. වෙළඳපළේ සම්පූර්ණ පරිමාවට සරිලන විවිධාංගීත වූ නිෂ්පාදන පරාසයක් සමඟින්, ඉදිරි වසරවලදී වැඩි ගනුදෙනුකාර පිරිසක් සඳහා වැඩි වටිනාකමක් නිර්මාණය කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

අපි ඩිජිටල් නාලිකා සඳහා ආයෝජනය කරමින්, සම්ප්‍රදායික ව්‍යාපාර ආකෘතියෙන් ඉවත් වන විට, අපගේ ගනුදෙනුකරුවන්ට උසස් වටිනාකමක් සහ හොඳම අත්දැකීමක් ලබා දීම අපේ ප්‍රමුඛ අභිලාෂය වේ.

සමූහයේ කාර්යයන්

2023 දී, අපි බැංකු සේවා හා නොබැඳි ව්‍යාපාර වලින් ඉවත්වීම ඇතුළුව සමූහය තාර්කිකකරණය සඳහා සැලසුම් ඉදිරියට ගෙන යන්නෙමු; සහයෝගීතා ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා සමාන ව්‍යාපාරවල යෙදෙන සමාගම් ඒකාබද්ධ කිරීම සහ පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන් හරහා නව ආශ්‍රිත ව්‍යාපාරික ක්ෂේත්‍ර ගවේෂණය කිරීම; වැඩිදියුණු කළ පාලනය සහ කාර්යසාධනය සඳහා පරිපාලිත ආයතන සහ ආශ්‍රිතයන් වෙත අධීක්ෂණය සහ සහාය වැඩි කිරීම; සහ ප්‍රධාන අනුබද්ධිත ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සහ නැවත අවධානය යොමු කිරීම මඟින් සමූහයට වැඩි දියුණු කළ දායකත්වයක් ලබා ගැනීම.

අප ස්ථාවර ගමන් පථයක ඉදිරියට යන විට, අපගේ පාර්ශ්වකරුවන්ට දීර්ඝකාලීන වටිනාකමක් ලබා දීම සඳහා අභියෝග හමුවේ අප ඔරොත්තු දෙන බව සහතික කිරීම සඳහා බැංකුවේ ආයතනික පාලන පද්ධති සහ ක්‍රියාවලීන් ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම ප්‍රධාන වේ.

ස්තුතිය

නික්ම යන සභාපති කාංචන රත්වත්තේ මහතාට සහ සේවයෙන් විශ්‍රාමගන්නා මහා කළමනාකරුකේ ඊ ඩී සුමනසිරි මහතාට අපගේ ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමු. ඔවුන්ගේ නොපසුබස්නා කැපවීම සහ දූරදර්ශී නායකත්වය සුවිශේෂී අභියෝගාත්මක වසරක් තුළ බහුවිධ අර්බුද මඟහරවා ගැනීමට බැංකුවට හැකියාව ලබා දීමට උපකාරී වී ඇත.

අසීරු වසරක් තුළ ඔවුන්ගේ මඟපෙන්වීම පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ට අපි ස්තුතිවන්ත වන අතර ඉදිරි වසර වලදී ද ඔවුන්ගේ සමීප සහයෝගය බලාපොරොත්තු වෙමු.

රොනල්ඩ් සී පෙරේරා, ජනාධිපති නීතීඥ
සභාපති

ඩබ්ලිව් පී රසල් ෆොන්සේකා
මහා කළමනාකරු/ප්‍රධාන විධායක නිලධාරී

2023 පෙබරවාරි 24
කොළඹ දීය

2 අධ්‍යක්ෂ මණ්ඩලය



කාංචන රත්වත්තේ මහතා
සභාපති,
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය
ලේකම්, ලංකා බැංකුව/
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
නිල බලයෙන් පත්වූ,
විධායක නොවන අධ්‍යක්ෂ



මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වි.එස්.වි.
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

ජී හර්ෂ විජේවර්ධන මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය



කාංචන රත්වත්තේ මහතා

සභාපති,
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය

2020 ජනවාරි 02
(2023 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සභාපති/අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.)

නිපුණතා හා පළපුරුද්ද

- කොළඹ විශ්වවිද්‍යාලයෙන් හීතිවේදී උපාධිය හිමිකරගත් නීතිඥවරයෙකි.
- රාජ්‍ය අංශයේ පිළිවෙත් හා රෙගුලාසි පිළිබඳව රාජ්‍ය ආයතනයන්හි නායකත්ව තනතුරු ඔස්සේ ලබාගත් විස්තීර්ණ පළපුරුද්ද සහිතය.
- තොරතුරු තාක්ෂණය, සුරක්ෂිත දත්ත මුද්‍රණය, මෘදුකාංග සංවර්ධනය, ව්‍යාපාර සඳහා බාහිරින් සේවා සපයන ආයතන, රක්ෂණ තැරැව්කාර කටයුතු හා සුරුකුම් යන ක්ෂේත්‍රයන්හි පුද්ගලික අංශයේ පරිපාලන හා නායකත්ව හැකියාව.

සෙසු නිල තල

- 2022 වසර තුළදී සභාපති තනතුරු:
  - ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම
  - මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
  - සීමාසහිත හොටෙල්ස් කලම්බු (1963) සමාගම
  - බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම
  - ලංකා බැංකුව (යූ.කේ.) සමාගම
- පෞද්ගලික අංශයේ කොටස් තැරැව්කාර සමාගමක සහ රක්ෂණ තැරැව්කාර සමාගමක අධ්‍යක්ෂ ධූරයන් දරයි.

කලින් දැරූ තනතුරු

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරය
- ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයේ හා ලංකා නැව් සංස්ථාවේ සභාපති ධූරයන්
- ලංකා කෝල් කෝ (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ
- EW ඉන්ෆෝමේෂන් සිස්ටම්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ
- ටොපෑන් ෆෝම්ස් (කලම්බු) ලිමිටඩ් හි අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය



ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා

නිල බලයෙන් පත්වූ, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය

2020 අප්‍රේල් 28

නිපුණතා හා පළපුරුද්ද

- වසර 25 කට වඩා පළපුරුද්ද සහිත ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හා නෝර්වේහි කෘෂිකාර්මික විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය පිළිබඳ විද්‍යාපති උපාධියක් හිමිකර ගෙන ඇත.
- බහු පාර්ශ්වික සංවර්ධන බැංකුකරණය තුළ විස්තීර්ණ අත්දැකීම් සහිතය.
- ද්වි පාර්ශ්වික සාකච්ඡා, සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමඟ සම්බන්ධීකරණය ඇතුළුව සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශීය අරමුදල් ඒකරාශී කිරීමෙහි ලා සහභාගිත්වය සපයා ඇත.

සෙසු නිල තල

- මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්
- ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ
- කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (පෞද්ගලික) සමාගමේ වැඩ බලන සභාපති
- කාම්බෝජය, ඉන්දුනීසියාව, ලාඕ ම.ප්‍ර.ජ., ශ්‍රී ලංකාව සහ ටිමෝ-ලෙස්ටේ නියෝජනය කරමින් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ.

කලින් දැරූ තනතුරු

- ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති
- ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සාමාජික
- චීන මහජන සමූහාණ්ඩුවේ බීජිං හි ආසියානු අපර ව්‍යුහ ආයෝජන බැංකුවේ විකල්ප විධායක අධ්‍යක්ෂ
- මහජන බැංකුවේ අධ්‍යක්ෂ
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ
- සී/ස මූල්‍ය අධ්‍යයන ඇකඩමියේ (ගැරන්ටි) අධ්‍යක්ෂ
- වෘත්තීය පුහුණු විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සාමාජික
- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ
- ශ්‍රී ලංකා ජාතික ජලජීවී සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලයේ සාමාජික
- ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) අධ්‍යක්ෂ
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ
- ජාතික විද්‍යා පදනමේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශයේ උපදේශක මණ්ඩලයේ සාමාජික
- ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ සාමාජික
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජික



ජී හර්ෂ විජේවර්ධන මහතා

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය

2020 ජනවාරි 14
(2023 ජනවාරි 13 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.)

නිපුණතා හා පළපුරුද්ද

- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 20කට වැඩි පුළුල් පළපුරුද්ද සහිත තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙකි.
- රාජ්‍ය අංශයේ පරිගණක ජාලයන් ඇතුළුව, රජයේ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සඳහා දායකත්වය දක්වා ඇත.
- කොළඹ විශ්වවිද්‍යාලයේ මෘදුකාංග සංවර්ධන අංශය ස්ථාපිත කළේය.
- ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ස්වයංකෘත ඇඟිලි සළකුණු හඳුනා ගැනීමේ පද්ධතිය බදු ජාතික මට්ටමේ ප්‍රධානතම මෘදුකාංග ව්‍යාපෘතීන්හි මූලිකත්වය දරා ඇති අතර, මුදල් අමාත්‍යංශය සමඟ රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය නිර්මාණය කිරීමේ නියුක්තව සිටී.
- පෙව රසායනය හා රසායන විද්‍යාව ප්‍රධාන විෂය ලෙස ද ගණිතය අනුවිෂය වන ලෙස ද ඇතුළත් වන පරිදි ඇමෙරිකා එක්සත් ජනපදයේ මියාමි විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත.
- බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ වරලත් සාමාජිකයෙකි.
- විද්‍යාත්මක පත්‍රිකා හා පොත් කිහිපයක් පළකොට ඇති අතර ICTA, LK Domain Registry සහ ISOC Sri Lanka Chapter මඟින් ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ පුරෝගාමියෙකු ලෙස ගෞරවයට පාත්‍ර විය.

සෙසු නිල තල

- සීමාසහිත ඇම්සොෆ්ට් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
- තීක්ෂණ හි (කොළඹ විශ්වවිද්‍යාලයෙහි පරිගණක විද්‍යා පාසලට අනුබද්ධ සමාගමකි) ප්‍රධාන මෙහෙයුම් නිලධාරී හා ප්‍රධාන තාක්ෂණ නිලධාරී
- ලංකා ඩොමේන් රෙජිස්ට්ර් ආයතනයේ මුල්ම අධ්‍යක්ෂ
- සිංහල ශබ්දකෝෂ සම්පාදන ආයතනයේ උපදේශක කමිටු සාමාජික
- ICTA යටතේ අළුතින් චිකතු කරන ලද දේශීය භාෂා ක්‍රියාකාරී කණ්ඩායමේ සභාපති

කලින් දැරූ තනතුරු

- ලංකා රාජ්‍ය තොරතුරු යටිතළ පහසුකම් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ උපදේශකයකු ලෙස කටයුතු කර ඇත.
- කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා පාසලේ මෘදුකාංග අංශයෙහි ප්‍රධානියා/උපදේශකයෙකු ලෙස සේවය කර ඇත.
- ජනාධිපති ලේකම් කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපදේශකයෙකු ලෙස සේවය කර ඇත.



ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය

2020 අප්‍රේල් 21
(2023 අප්‍රේල් 21 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.)

නිපුණතා හා පළපුරුද්ද

- ශ්‍රී ලංකාවේ හා විතෙර ආයතනයන්හි, බැංකුකරණ, උපායමාර්ග සැලසුම්, ගණකාධිකරණ හා මූල්‍ය වෘත්තිකයකු ලෙස වසර 40 කට වැඩි පළපුරුද්ද.

- වාණිජ බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන ඇතුළු ආයතන පරාසයක උපායමාර්ගික සැලසුම් සම්පාදනය, ප්‍රතිව්‍යුහගත කිරීම් හා ආයතන සංවර්ධන ව්‍යාපෘති සඳහා උපදේශන/මඟ පෙන්වීම් සේවා සපයා ඇත.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික.
- හාර්වඩ් විශ්වවිද්‍යාලයේ හා INSEAD හි විශේෂිත පුහුණුව නිමකර ඇත.
- ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජියා විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය හිමිකරගෙන ඇත.

සෙසු නිල තල

- සොෆ්ට්ලොජික් ෆිනැන්ස් පී එල් සී හි විධායක නොවන අධ්‍යක්ෂ.

කලින් දැරූ තනතුරු

- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායිහි මෂ්රික් බැංකුව, සිටි බැංකුව, එන් ඩී බී බැංකුව හා සවුදි අරාබියේ ඊයාද්හි අල් රාජි බැංකුව යන මූල්‍ය සේවා ආයතන වල ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරු දරා ඇත.
- පෞද්ගලික අංශයේ තවත් සමාගම් කිහිපයක අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ඇත.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය ඇතුළු ආයතනයන් හි බාහිර කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කර ඇත.



මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.එස්.වී.

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය

2021 ජනවාරි 08

නිපුණතා හා පළපුරුද්ද

- රාජ්‍ය අංශයේ නායකත්ව තනතුරු දරා ලද රාජ්‍ය සේවා පිළිවෙත් හා රෙගුලාසි පිළිබඳ පළපුරුද්ද.
- ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ හා බංගලාදේශයේ ආරක්ෂක සේවා අණ දීම් හා නිලධාරී විද්‍යාලයේ උපාධිධාරියෙකි.
- රණ වික්‍රම පදක්කම, විශිෂ්ට සේවා විභූෂණ, උත්තම සේවා පදක්කම ඇතුළු විශේෂිත ඇගැයීම් දිනාගෙන ඇත.

සෙසු නිල තල

- ශ්‍රී ලංකා ගුවන් තොටුපොල හා ගුවන් සේවා (පුද්ගලික) සමාගමේ සභාපති.

කලින් දැරූ තනතුරු

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පහත දැක්වෙන ප්‍රධාන අණදීම් හා මාණ්ඩලික තනතුරු රැසක් සමඟින් වසර 35 ක කීර්තිමත් හමුදා පළපුරුද්ද.
  - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී තනතුර (යුධ හමුදාවේ 2 වැනි අණදෙන නිලධාරී)
  - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මේජර් ජෙනරාල් තනතුර
  - ඒකාබද්ධ මෙහෙයුම් ආඥා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකායේ රෙජිමේන්තු අණ දෙන නිලධාරී
  - යාපනය ආරක්ෂක සේවා මූලස්ථානයේ අණදෙන නිලධාරී
  - අතිගරු ජනාධිපතිතුමාගේ හමුදා ආරක්ෂක සම්බන්ධීකාරක
  - යුද්ධයට පසු උතුරු පළාතේ අභ්‍යන්තරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම සඳහා නිසි බලධාරී
- උතුරු පළාතේ ආණ්ඩුකාර ධූරය



මහාචාර්ය කිත්සිරි ලියනගේ

ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

පත්වීම ලද දිනය

2023 මාර්තු 31

නිපුණතා හා පළපුරුද්ද

- ශ්‍රී ලංකාවේ, ජපානයේ සහ එක්සත් ජනපදයේ - වසර 25කට වැඩි අධ්‍යාපනික සේවයක් සහිත ඉහළ පළපුරුදු ඉංජිනේරුවරයෙකි.
- ටෝකියෝ විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු උපාධියක් ද එම විශ්වවිද්‍යාලයේම විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් ද ලබා ඇත.
- ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) අධි සාමාජිකයෙකු වන අතර, ඇමරිකා එක්සත් ජනපදයේ, විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ (IEEE) ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් සහ වරලත් ඉංජිනේරුවෙකි.
- රජයේ ප්‍රධාන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සහ උපදේශක ආයතන සහ කමිටු සමඟ ජාතික මට්ටමේ භූමිකාවන් කිහිපයකට සම්බන්ධ වී ඇත.

සෙසු නිල තල

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

පෙර පත්වීම්

- ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, ළමා, යෞවන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
- සභාපති, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL)
- සභාපති, ඉංජිනේරු සේවා මණ්ඩලය
- ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ (NSCC) සාමාජික
- පීඨාධිපති, ඉංජිනේරු පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය.
- පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT).
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සහ පරිගණක මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ,
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශ ප්‍රධානී
- මිලාදෝ මූල්‍ය අධ්‍යයන අංශයේ අධ්‍යක්ෂ.
- ටෝකියෝ විශ්වවිද්‍යාලයේ, වොෂින්ටන් විශ්වවිද්‍යාලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ සාමාජික.
- ටෝකියෝ විශ්වවිද්‍යාලයේ, Oulu විශ්ව විද්‍යාලයේ සහ Meijo විශ්වවිද්‍යාලයේ ආරාධිත පීඨ සාමාජික.



ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විස්තර, පිටු අංක 32 හි දැක්වේ.

2 ආයතනික කළමනාකාරීත්වය



ආයතනික කළමනාකාරීත්වය



ආයතනික කළමනාකාරීත්වය



කේ ඊ ඩී සුමනසිරි මහතා

ඉවත්ව යන මහා කළමනාකරු
(2021 අගෝස්තු මාසයේ දී මහා කළමනාකරු ලෙස පත් කරන ලදී)

නිපුණතා සහ පළපුරුද්ද

ණය සහ පුද්ගල කළමනාකරණය පිළිබඳ විශේෂඥතාව සමඟ බැංකුව තුළ වසර 32 කට වැඩි විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් සමූහයක් සහිත වේ. ඔහුගේ බැංකු වෘත්තීය ජීවිතය තුළ ඔහු ශාඛා බැංකුකරණය, ක්ෂුද්‍ර මූල්‍ය, ආයතනික මූල්‍ය, අයකර ගැනීම්, ඉගෙනුම් සහ සංවර්ධන සහ මානව සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවල සේවය කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනය විසින් පවත්වන ව්‍යාපාර නායකයන් සඳහා වූ උසස් කළමනාකරණ සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විශේෂ කළමනාකරණ පාඨමාලාව ද, ඉහළ කළමනාකාරීත්වය සඳහා වන කළමනාකරණ සංවර්ධන පාඨමාලාව ද, ඇමෙරිකා එක්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසල විසින් පවත්වන ලද නායකත්ව පාඨමාලාව ද සම්පූර්ණ කර ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා වරලත් පිරිස් කළමනාකරණ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය ද උසුලයි.



ඩබ්ලිව් පී රසල් ෆොන්සේකා මහතා

නව මහා කළමනාකරු
(2023 ජනවාරි මාසයේ දී මහා කළමනාකරු ලෙස පත් කරන ලදී)

නිපුණතා සහ පළපුරුද්ද

මූල්‍ය කළමනාකරණය, අවදානම් සහ උපායමාර්ගික සැලසුම්කරණය පිළිබඳ වෘත්තීය අත්දැකීම් සහිතව බැංකුවේ දේශීය හා විදේශීය මෙහෙයුම් කටයුතු සම්බන්ධව වසර 32 කට අධික සේවා කාලයක් සහිත වේ. ශාඛා බැංකුකරණය, ජාත්‍යන්තර මෙහෙයුම්, භාණ්ඩාගාර සහ ආයෝජන සහ ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය වැනි ක්ෂේත්‍රයන්හි අත්දැකීම් ඇතුළත් වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ද, ඇමෙරිකා එක්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසලේ උසස් කළමනාකරණ වැඩසටහන ද නිමකොට ඇති අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය මෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ජ්‍යේෂ්ඨ අධි සාමාජිකත්වය ද ලබා ඇත.



ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

ලේකම්, ලංකා බැංකුව/
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
(2010 ඔක්තෝබර් මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් කරන ලදී)

නිපුණතා සහ පළපුරුද්ද

සමාගම් ලේකම් සහ ආයතනික පාලනය පිළිබඳ බැංකුවේ වසර 26 කට වැඩි පළපුරුද්ද

නීතිවේදී උපාධියක් සහිත වෘත්තියෙන් නීතීඥවරියකි

කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය විශිෂ්ට සාමාර්ථයක් සහිතව හිමිකරගෙන ඇත.



ඩී එස් මුතුකුඩආරච්චි මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම් ආයතනික)
(2020 පෙබරවාරි මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

බැංකු මෙහෙයුම් හා සබැඳි විවිධ වූ අංශ පිළිබඳ වසර 32 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ණය කළමනාකරණය, ණය අවදානම් සහ විදේශීය ශාඛා මෙහෙයුම් පිළිබඳ විශේෂිතව, ශාඛා සහ ආයතනික බැංකුකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් සහිත වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දේපළ කළමනාකරණය සහ තක්සේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ගෙන ඇත.



වයි ඒ ජයතිලක මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(සංවර්ධන බැංකුකරණ, ශාඛා ණය මෙහෙයුම් - කලාප II)
(2020 පෙබරවාරි මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා මෙහෙයුම්, භාණ්ඩාගාර සහ විදේශීය මෙහෙයුම්, ව්‍යාපෘති කළමනාකරණය, ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය, ණය මෙහෙයුම් සහ අයකරගැනීම් ආදී විවිධ වූ භූමිකාවන්හි වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇත.

ලංකා බැංකුව (යූ.කේ) සමාගමේ මූලික බැංකු පද්ධතිය සහ වෙළඳ මූල්‍ය පද්ධති වැනි බැංකුවේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මූලික බැංකුකරණ සහ ටෙලර් පද්ධතිය වැඩිදියුණු කිරීම, ලේඛන කළමනාකරණ පද්ධතිය, කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණ පද්ධතිය සහ ගනුදෙනුකරුවන් වෙත පිරිනැමෙන ඩිජිටල් සේවාවන් කිහිපයක් ද බැංකුවේ ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වී ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියකු වන අතර කැළණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර මූල්‍යනය පිළිබඳ පශ්චාත් උපාධියද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සහ බැංකු සහ මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ උපායමාර්ගික කළමනාකරණය පිළිබඳ උසස් පාඨමාලාව ද ලබාගෙන ඇත.



එච් ප්‍රියාල් සිල්වා මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා මෙහෙයුම්)
(2020 පෙබරවාරි මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

මූල්‍ය, ආයතනික, ශාඛා හා සංවර්ධන බැංකුකරණය, ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර මෙහෙයුම් සහ විකුණුම් සහ අලෙවිකරණය ඇතුළු ශාඛා මෙහෙයුම් පිළිබඳ විශේෂිත වූ බැංකුකරණයේ විවිධ අංශවල වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇත.

රුහුණු විශ්වවිද්‍යාලයේ අළෙවිකරණය පිළිබඳව විශේෂිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දෙවන පන්තියේ (ඉහළ අංශය) උපාධියද කැළණිය විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියද ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ එක්සත් රාජධානියේ වරලත් අළෙවිකරණ ආයතනයේ වෘත්තීය අළෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද සහිතව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද උසුලයි.



පී ඒ ජයශාන්ත මහතා

ප්‍රධාන අවදානම් නිලධාරී
(2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා ණය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, භාණ්ඩාගාර මෙහෙයුම්, වත්කම් සහ වගකීම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය සහ ආයතනික ණය හා අක්වෙරළ මෙහෙයුම් වැනි බැංකුවේ විවිධ අංශවල වසර 25 කට වඩා වැඩි විශේෂිත අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියෙකු වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ණය කළමනාකරණය සම්බන්ධව ඩිප්ලෝමාවක් ද, ලබා ගෙන ඇති අතර එහි ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.



ඩබ්ලිව් බී පී රත්නායක මහත්මිය

නියෝජ්‍ය මහා කළමනාකාරිණී (අනුකූලතා)
(2020 සැප්තැම්බර් මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

සිය වෘත්තිය කාල පරාසය තුළ දේශීය හා විදේශීය වාණිජ බැංකුකරණයේ සියලු අංශවල වසර 25 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ආයතනික හා ශාඛා ණය පිළිබඳ පළපුරුද්ද මෙන්ම අවදානම් කළමනාකරණය, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ බැංකුව සඳහා අවදානම් කළමනාකරණ ක්‍රමවේද සංවර්ධනය කිරීමේහි ලා ප්‍රවීණයෙකු වේ.

රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරිනියකද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරිනියක ද වන අතර ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් විධායක උපාධි ඩිප්ලෝමාවද එක්සත් රාජධානියේ ජාත්‍යන්තර අනුකූලතා සංගමයේ යහපාලනය, අවදානම් සහ අනුකූලතා පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමාධාරිනියක මෙන්ම ශ්‍රී ලංකා බැංකකුරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් ද වේ.



ආර් එම් එන් ජීවන්ත මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන)
(2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

භාණ්ඩාගාර කළමනාකරණ, ආයෝජන බැංකුකරණය මූල්‍ය කළමනාකරණය, ණය කළමනාකරණය සහ ශාඛා බැංකුකරණය වැනි ක්ෂේත්‍රවල වසර 20 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියද ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද හොබවයි.



එම් පී රුවන් කුමාර මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(මූල්‍ය හා සැලසුම්)
(2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

මූල්‍ය කළමනාකරණය, උපායමාර්ගික සැලසුම්කරණය, ආයෝජන බැංකුකරණය, වාණිජ බැංකුකරණය සහ විදේශීය බැංකු කටයුතු පිළිබඳ වසර 20 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පොදුරාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ද හිමි ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරණ අතර ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු ද වේ. තවද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය ද උසුලයි.



එස් සිවන්ජන් මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(උපකාරක සේවා)
(2020 සැප්තැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා බැංකු මෙහෙයුම්, ණය අයකර ගැනීම්, සංවර්ධන බැංකු කටයුතු, ක්ෂුද්‍ර මූල්‍ය හා විදේශීය මෙහෙයුම් සම්බන්ධව වසර 20 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

යාපනය විශ්වවිද්‍යාලයේ පළමු පන්තියේ (ගෞරව) විද්‍යාවේදී උපාධියක් හිමි වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ අළෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ද හිමිය.

ආයතනික කළමනාකාරීත්වය



බී කේ ගුරුසිංහ මහතා

ප්‍රධාන නීති නිලධාරී
(2020 සැප්තැම්බර් මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතීඥයෙකි.

බැංකු වෘත්තිකයෙකු ලෙස ආයතනික බැංකු කටයුතු, ශාඛා බැංකු කටයුතු සහ ආයතනික පරිවර්තනමය ව්‍යාපෘති පිළිබඳ වසර 25 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පොදුරාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු ද වන අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය හා ශ්‍රී ලංකා නීතිඥවරුන්ගේ සංගමය වැනි සංවිධාන කිහිපයක සාමාජිකත්වය දරනු ලබයි.



එම් ආර් එන් රෝහණ කුමාර මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම් පළාත්, ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපනය)
(2021 ජනවාරි මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

අයකර ගැනීම්, ශාඛා ණය සහ ව්‍යාපෘති මූල්‍යකරණය සම්බන්ධයෙන් විධායක නායකත්ව භූමිකාවන් ඇතුළුව බැංකුවේ වසර 20 කට වැඩි පළපුරුද්දක් ඇත.

බැංකුවේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ සම්පත් දායකයකු ලෙස ඔහුගේ භූමිකාව තුළින් සේවක මණ්ඩලයේ ණය කුසලතා වැඩි දියුණු කිරීමට දායක විය.

කැළණිය විශ්වවිද්‍යාලයෙන් ගණිතය පිළිබඳ විද්‍යාවේදී පළමු පන්තියේ උපාධිය, ඇමරිකා එක්සත් ජනපදයේ උතුරු ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ නායකත්වය පිළිබඳ ඩිප්ලෝමාව සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයද දරයි.



ඒ ආර් එෆ් ජෝන් පුල්ලේ මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා ණය මෙහෙයුම් කලාප I)
(2021 ජූලි මාසයේදී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

භාණ්ඩාගාර කළමනාකරණය, ශාඛා බැංකුකරණය, අවදානම් කළමනාකරණය සහ විදේශීය බැංකු මෙහෙයුම් පිළිබඳ විශේෂඥතාව ඇති වාණිජ බැංකුකරණයේ සෑම අංශයකම වසර 31 කට වැඩි පළපුරුද්දක් ඇත. චෙන්නායි හි ලංකා බැංකුවේ භාණ්ඩාගාර අංශයේ ප්‍රධානියා ලෙස ද ලන්ඩනයේ ලංකා බැංකුව (යූ.කේ) සමාගමේ හි ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස ද සේවය කර ඇත.

ඉතාලියේ "Universita' Pontificia Salesiana" වෙතින් දර්ශනවේදය පිළිබඳ දර්ශනවේදී පළමු පන්තියේ උපාධිය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයද උසුලනු ලැබේ.



නිලන්ත මෙනේරිපිටියගේ මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ආයතනික සහ අක්‍රෙළ බැංකුකරණය)
(2021 ජූලි මාසයේ දී ආයතනික කළමනාකාරීත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

ආයතනික බැංකුකරණය, ශාඛා බැංකුකරණය, අවදානම් කළමනාකරණය, ණය කාඩ්පත් මෙහෙයුම්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ තොරතුරු තාක්ෂණය වැනි ක්ෂේත්‍රවල දේශීය සහ විදේශීය මෙහෙයුම් පිළිබඳ වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇති වෘත්තීය බැංකුකරුවෙකු වේ.

ලංකා බැංකුව (යූ.කේ) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/විධායක අධ්‍යක්ෂ සහ සහකාර මහා කළමනාකරු (අවදානම් කළමණාකරණ) ආදී තනතුරු ඔහු හොබවා ඇත. මහා පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය අංශයේ යටිතල පහසුකම් ව්‍යාපෘති හැසිරවීම ඔහුගේ අත්දැකීම් වලට ඇතුළත් වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (කළමනාකරණ) ගෞරව (විශේෂ) උපාධිය සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ බැංකු හා මූල්‍ය ඩිප්ලෝමාවක්ද හිමි ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරයි.

මොරටුව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන අංශයට, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයට, අපනයන සංවර්ධන මණ්ඩලයට සහ ලංකා බැංකුවේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයට අනුබද්ධව බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කර ඇත.



කේ ඒ ඩී විජයවර්ධන මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්)
(2021 ඔක්තෝබර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා බැංකුකරණය හා මානව සම්පත් මෙහෙයුම් යන අංශවල විධායක නායකත්ව තනතුරුද ඇතුළුව ණය සහ ශාඛා බැංකුකරණය ආදී ක්ෂේත්‍ර වල බැංකුවේ වසර 20 කට වඩා වැඩි පළපුරුද්දක් ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (සාමාන්‍ය) දෙවන පන්තිය (ඉහළ අංශය) ගෞරව උපාධිය ද, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ගෙන ඇති අතර ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.



කේ ඒ අජිත් කරුණාරත්න මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන)
(2021 දෙසැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

ශාඛා බැංකුකරණය, වෙළඳ මූල්‍ය, ආයතනික සහ ප්‍රිමියර් බැංකු මෙහෙයුම් යන ක්ෂේත්‍රවලට විශේෂිතව බැංකුවේ වසර 20 කට වැඩි පළපුරුද්දක් සහිත වේ.

ශාඛා බැංකුකරණයේ විවිධ වූ පැතිකඩයන්හි අත්දැකීම් සහ ව්‍යාපාර ප්‍රවර්ධනය, පරිපාලනය සහ මානව සම්පත් සඳහා වගකීම් සහිතව පළාත් කිහිපයක විධායක නායකයෙකු ලෙස අත්දැකීම් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ද, වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද ලබා ඇත.



පී මදුවන්ත ලියනගේ මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක
(2014 දෙසැම්බර් මාසයේ දී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

මූල්‍ය වෘත්තිකයෙකු ලෙස බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 23 කට වඩා වැඩි අත්දැකීම් ලබා ඇත.

ලංකා බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත් වීමට ප්‍රථම ඔහු සී/ස කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී සහ පෑන් ඒෂියා බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇති ඒ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ ISACA හි සහතිකලත් තොරතුරු පද්ධති විගණකවරුන්ගේ සංගමයේ (CISA) සාමාජිකත්වය ද දරනු ලැබේ.



සමීර ඩී ලියනගේ මහතා

ප්‍රධාන අළෙවිකරණ නිලධාරී
(2020 අගෝස්තු මාසයේදී ආයතනික කළමනාකාරිත්වයට පත් විය)

නිපුණතා සහ පළපුරුද්ද

බැංකුකරණය සහ අළෙවිකරණය පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල වසර 24 කට වඩා වැඩි වෘත්තීය විශේෂඥතාවයකින් යුක්තය.

2015 වර්ෂයේ දී එක්සත් රාජධානියේ වරලත් අළෙවිකරණ ආයතනය විසින් ප්‍රදානය කරනු ලබන වරලත් අළෙවිකරු සම්මානයෙන් පිදුම් ලැබීය.

එක්සත් රාජධානියේ වරලත් අළෙවිකරණ ආයතනයෙන් පශ්චාත් උපාධි අළෙවිකරණ ඩිප්ලෝමාව ලද ඔහු එක්සත් රාජධානියේ අළෙවිකරණ ආයතනයේ, ශ්‍රී ලංකා අළෙවිකරණ ආයතනයේ සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය යන ආයතන වල සාමාජිකත්වය දරනු ලබයි.

2 විධායක කළමනාකාරීත්වය



පී පී එම් විජේසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ණය විගණනය)



ඒ එම් ආර් ඩී සුබසිංහ මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ආපසු අයකර ගැනීම් - පළාත්)



ටී පෙරේරා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(පුහුණු හා සංවර්ධන)



කේ ජී සී දිපාල් මහතා
සහකාර මහා කළමනාකරු
(තොරතුරු පද්ධති විගණන)



ජේ ඥානසම්බන්ධන් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය)



ආර් එම් එම් විරසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ශාඛා ණය - කලාප I)



එම් එම් ආර් පී ප්‍රනාන්දු මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(වෙළඳ සේවා)



කේ පී මල්ලිකා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(විමර්ශන)



අයි එස් එන් පෙරේරා මහතා
සහකාර මහා කළමනාකරු
(ගිණුම්කරණ හා බදු)



එස් පී සී කේ ප්‍රනාන්දු මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ආයතනික ණය)



සීනා රුවයිස් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(අයවැය, ක්‍රමෝපායික සැලසුම් හා කළමනාකරණ තොරතුරු පද්ධති)



ජී කේ ජී මහින්ද බණ්ඩාර මහතා
සහකාර මහා කළමනාකරු
(උතුරු මැද පළාත)



ඩී ආර් සී එස් උදයකුමාරි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ශාඛා මෙහෙයුම්)



ඩබ්ලිව් එම් ඒ වනිගසේකර මහතා
සහකාර මහා කළමනාකරු
(විශ්‍රාම නඩත්තු අංශය)



පී එම් විතාන ආරච්චි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(මධ්‍යගත මෙහෙයුම්)



එච් එම් එම් ඩී හේරත් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(විදේශීය ශාඛා)

විධායක කළමනාකාරීත්වය



එස් එච් එම් එම් පී හේරත් මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී
(අක්වෙරළ බැංකුකරණය)



කේ කේ අයි සී කේ කන්නංගර මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී
(ආපසු අයකර ගැනීම් - ආයතනික)



එස් අරුණ කුමාර මහතා
ප්‍රධාන විධායක නිලධාරී
(ලංකා බැංකුව (යූ කේ) සමාගම)



එම් ටී එස් ඒ පෙරේරා මහතා
සහකාර මහා කළමනාකරු
(නිමැවුම් සංවර්ධන කටයුතු හා
ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ)



එස් පිරපාහරන් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(මධ්‍යම ණය මෙහෙයුම්)



එස් කේ චිත්‍රමසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
(පිටකොටුව ශාඛාව)



ඩී ඒ එස් එස් විමලසිරි මහතා
සහකාර මහා කළමනාකරු
(පාරිභෝගික හා සංවර්ධන බැංකුකරණ)



කේ ජේ යෝගරත්නම් මහත්මිය
නේවාසික කළමනාකාරිණී
(චෙන්නායි ශාඛාව)



සී පී සී අබේරත්න මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී -
තොරතුරු තාක්ෂණ
(මෙහෙයුම්/තාක්ෂණික සහාය)



එන් ඩබ්ලිව් ජේ එස් පී නානායක්කාර මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී
(ආපසු අයකර ගැනීම්)



ජේ එම් පී ඩබ්ලිව් තිලකරත්න මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී
(ජාත්‍යන්තර කටයුතු, මානව සම්පත්
සහ මෙහෙයුම්)



එන් එන් නිශානදි මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී
(ණය)



එස් බී ඒ එම් පී එස් අරම්පත් මහතා
නේවාසික කළමනාකරු
(මාලේ ශාඛාව)



එම් එම් ඊ අයි බණ්ඩාර මහතා
සහකාර මහා කළමනාකරු
(විද්‍යුත් බැංකුකරණ මධ්‍යස්ථානය)



ඩබ්ලිව් එම් එන් ඩී දායාවංස මහතා
සහකාර මහා කළමනාකරු
(සබරගමුව පළාත)



ජේ කේ ඩී ධර්මපාල මහතා
සහකාර මහා කළමනාකරු
(අනුකූලතා)

විධායක කළමනාකාරීත්වය



කේ දිපා කුමාරි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ණය අවදානම්)



එස් පී කේ ලියනගේ මහතා
සහකාර මහා කළමනාකරු
(බස්නාහිර පළාත - උතුර)



ඩී එම් ඒ මාධව මහතා
සහකාර මහා කළමනාකරු
(ආයතනික සබඳතා)



ඒ ආර් මල්ලිකාරච්චි මහතා
සහකාර මහා කළමනාකරු
(පරිපාලන සේවා)



ඩබ්ලිව්ඩී කේ එල් බී එන් සමන්ති මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(බස්නාහිර පළාත - දකුණ)



ආර් එම් සමරක්කොඩි මහතා
සහකාර මහා කළමනාකරු
(වෙළඳපළ අවදානම් සහ මෙහෙයුම් අවදානම්)



වී සිවානන්දන් මහතා
සහකාර මහා කළමනාකරු
(උතුරු පළාත)



ඒ ඩබ්ලිව් ආර් තුෂාන්ත මහතා
සහකාර මහා කළමනාකරු
(භාණ්ඩාගාර)



එස් ඩබ්ලිව් එම් එස් විජේසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
(මධ්‍යම පළාත)



ඒ ටී හෙට්ටිආරච්චි මහතා
සහකාර මහා කළමනාකරු
(අලෙවිකරණ)



එස් එස් ටී කුළසේකර මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ව්‍යාපෘති මූල්‍යහන)



පී චන්ද්‍රදේව මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
තොරතුරු තාක්ෂණ
(ආරක්ෂණ සහ අනුකූලතා)



එච් කේ රාජපක්ෂ මහතා
සහකාර මහා කළමනාකරු -
තොරතුරු තාක්ෂණ (සැපයුම් හැසිරවීම්)



ඩබ්ලිව් ඒ ජී එල් විරක්කොඩි මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(ශාඛා ණය - කලාප II)



එම් ඒ ඩී පී ඛයස් මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(මානව සම්පත් මෙහෙයුම්)



එන් ක්‍රිෂ්ණකුමාර් මහතා
සහකාර මහා කළමනාකරු
(ව්‍යාපාර පුනර්ජීවන සහ
ප්‍රතිස්ථාපන - ආයතනික)

විධායක කළමනාකාරීත්වය



අයි කේ නවරත්න මහතා
සහකාර මහා කළමනාකරු
(උඩව පළාත)



එන් ආර් ඩී එන් පෙරේරා මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(බස්නාහිර පළාත - මධ්‍යම)



ආර් පී ඩී ආර් ආර් රුවන්පතිරණ මහතා
සහකාර මහා කළමනාකරු
(ජාත්‍යන්තර)



ටී එස් සේනානායක මහත්මිය
සහකාර මහා කළමනාකාරිණී
(මෙහෙයුම් විගණන)



අයි යූ කේ ඩී විජේගුණවර්ධන මහතා
තේවාසික කළමනාකරු
(සීෂේල්ස් ශාඛාව)



ඕ ජී සී ජී බණ්ඩාර මහතා
සහකාර මහා කළමනාකරු
(පර්යේෂණ සහ සංවර්ධන)



ඩී කේ ආර් දෙල්ගොඩ මහතා
සහකාර මහා කළමනාකරු
(වියඹ පළාත)



එස් කේ ගජනායක මහතා
සහකාර මහා කළමනාකරු (ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන - පළාත්)



බී සී මාවින් මෙනෙවිය
සහකාර මහා කළමනාකාරිණී
(නැගෙනහිර පළාත)



එස් ඒ එන් සී පියුමාල් මහතා
සහකාර මහා කළමනාකරු
(ඩිජිටල් බැංකු සේවා ප්‍රවර්ධන)



කේ ඩබ්ලිව් වයි බී ප්‍රේමරත්න මහතා
සහකාර මහා කළමනාකරු
(දකුණු පළාත)



බී වී සී ජී පී රණසිංහ මහතා
සහකාර මහා කළමනාකරු
(මෙට්‍රොපොලිටන් ශාඛාව)



එස් සබේසන් මහතා
සහකාර මහා කළමනාකරු
(තිරසාර බැංකුකරණය)



එම් ආර් ඒ ශකූර් මහතා
සහකාර මහා කළමනාකරු
(ආයෝජන)



කේ එම් සී එන් කොඩිතුවක්කු මහතා
සහකාර මහා කළමනාකරු -
තොරතුරු තාක්ෂණ (යෙදවුම් පද්ධති)

3 අගය නිර්මාණය කිරීමේ ආකෘතිය

යෙදවුම්

ප්‍රාග්ධන

මූල්‍ය ප්‍රාග්ධනය

රු. බිලියන 254.1
කොටස් හිමියාගේ අරමුදල්

රු. ට්‍රිලියන 3.3
තැන්පතු

රු. බිලියන 646.0
ණය ගැනීම්

නිෂ්පාදිත ප්‍රාග්ධනය

2,166 ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන

රු. බිලියන 34.8 ස්ථාවර වත්කම්වල වටිනාකම

මානව ප්‍රාග්ධනය

8,209 සේවකයින්

59% කාන්තා නියෝජනය

වසර 11 වැඩි
සේවා පළපුරුද්දේ සාමාන්‍යය

රු. මිලියන 73.9
පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

මිලියන 14.9 ගනුදෙනුකරුවන්

784
විදේශ රටවල නියෝජිත බැංකු

602
ලියාපදිංචි සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්

බුද්ධිමය ප්‍රාග්ධනය

රු. බිලියන 53.9
සන්නාම වටිනාකම

ස්වාභාවික ප්‍රාග්ධනය

25,301.4 මෙගා වොට් පැය
බලශක්ති පරිභෝජනය

283,463 ඝන මීටර ජල පරිභෝජනය

47 අක්කර බැංකුව විසින් භාවිතා කරන ලද භූමි ප්‍රමාණය

2 හරිත තාක්ෂණය සඳහා හඳුන්වා දුන් ණය යෝජනා ක්‍රම

වටිනාකම් පරිවර්තනය

ව්‍යාපාර අංශ

ශාඛා බැංකුකරණය
(පිටු 65 සිට 69)

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය
(පිටු 70 සිට 73)

ජාත්‍යන්තර භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්
(පිටු 74 සිට 77)

ක්‍රියාකාරකම්

- ණය දීම්
- ප්‍රතිමූල්‍යකරණය
- ගනුදෙනුකාර බැංකු සේවා සහ ගෙවීම් සේවා
- තැන්පතු භාරගැනීම්
- අරමුදල් කළමනාකරණය
- භාරකරු ආයෝජන කළඹ කළමනාකරණ සහ භාරකරු සේවා
- ආයෝජන බැංකුකරණය
- විදේශ විනිමය සහ සුරැකුම් කළමනාකරණය
- උපදේශන සේවා
- වෙළඳ සේවා

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

මූලික කරුණු

යහපත් ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණය
(පිටු අංක 120 සිට 156)

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ
(පිටු අංක 78 සිට 118)

සම්පත් විභාජනය සහ ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන්
(පිටු අංක 53 සිට 54)

තිරසාර බවට අනුගතව
(පිටු අංක 55 සිට 59)

ප්‍රතිඵල

ප්‍රාග්ධන ප්‍රවේශය

රු. ට්‍රිලියන 2.6 (+0.3%)
දළ ණය සහ අත්තිකාරම් කළඹ

මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය

මිලියන 620.5 (+21%)
සිදුකරන ලද ගනුදෙනු ප්‍රමාණය

නවීන ඩිජිටල් බැංකුකරණය

රු. බිලියන 1.8
ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය

48%
ඩිජිටල් හෝ ඉලෙක්ට්‍රොනික බැංකු නාලිකා හරහා සිදුවන ගනුදෙනු

614,401
ඩිජිටල් බැංකු නිෂ්පාදන හා යෙදුම් සඳහා ලියාපදිංචිය

ශක්තිමත් ආයෝජන කළඹ

රු. ට්‍රිලියන 1.6 (+44%)
අරමුදල් කළමනාකරණ කළඹ

රු. බිලියන 146.0 (+117%)
ආයෝජන වලින් ලද පොළී ආදායම

සේවක වැටුප්, පුහුණුව සහ සංවර්ධනය

මිනිස් පැය 16
සාමාන්‍ය වශයෙන් එක් සේවකයකු සඳහා ලබාදුන් පුහුණුව

රු. බිලියන 29.0 (+16%)
සේවක වැටුප්, වේතන සහ දිරි දීමනා

ප්‍රතිලාභ

සාර්ව ආර්ථික ස්ථාවරත්වය

2,500
සෘජු සහ වක්‍ර රැකියා බිහිකිරීම

ඇ.ඩො. බිලියන 3.2
ආමුඛ ප්‍රේෂණ

රු. බිලියන 31.9
රජයට දායකත්වය

ජාතික සංවර්ධනය

ඇ.ඩො. බිලියන 1.9
ඉන්ධන සහ ගෑස් අනායනය සඳහා පහසුකම් සැලසීම

රු. බිලියන 52.6
වසර තුළදී ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සහනදායී ණය පහසුකම්

මූල්‍ය ඇතුළත්කරණය

රු. මිලියන 570.0
BOC Connect හරහා සිදුකරන ලද ගනුදෙනු

රු. බිලියන 13.1
ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා ලබාදී ඇති ණය

31%
ක්ෂුද්‍ර මූල්‍යකරණයෙන්, කාන්තාවන් සතු/කාන්තාවන් මූලික කර ගත් ව්‍යාපාර සඳහා

ව්‍යාපාර නඟා සිටුවීම

රු. බිලියන 74.4
ණය ගෙවීමේ සහන කාලයන් ලබා දී ඇති ණය

33
සාර්ථකව ප්‍රතිස්ථාපනය කරන ලද ව්‍යාපාර

22
පුනර්ජීවන සහය යටතේ ඇති ව්‍යාපාර

තෘප්තිමත් ගනුදෙනුකරුවන්

35
ශුද්ධ ප්‍රවර්ධක ලකුණු

78%
ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ අනුපාතය

ඉහළ කාර්යසාධන කණ්ඩායමක්

588
කුසලතා මත පදනම් වූ උසස්වීම් ප්‍රධානයන්

රු. මිලියන 3.5
සේවකයෙකු සඳහා වටිනාකම් එකතු කිරීම

රු. මිලියන 3.8
සේවකයෙකු සඳහා ලාභය

ස්ථාවර සහ තිරසාර බැංකුවක්

77%
මුළු ආදායමේ වර්ධනයක්

14%
වත්කම් වල වර්ධනයක්

රු. බිලියන 53.9
සන්නාම වටිනාකම

ගෝලීය සහ දේශීය අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම

රු. බිලියන 4.7
පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධතියට අනුකූලව ණය දීම්

රු. මිලියන 711.6
හරිත මූල්‍යකරණය යටතේ නව ණය දීම්

3,219.3 මෙගා වොට් පැය
සූර්ය බලශක්තියක් නිපදවීම

3 එකතු කළ අගය මත වාර්තාව

බැංකුවේ අගය එක් කිරීම සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා එම අගය විසර්ජනය වන ආකාරය පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ

	2022 රු. මිලියන	2021 රු. මිලියන	වෙනස %
එකතු කළ අගය			
බැංකු සේවා කටයුතු සැපයීමෙන් ලද ආදායම	494,578	284,832	74
සේවා සැපයීමේ පිරිවැය	(252,715)	(140,946)	79
බැංකු සේවා තුළින් එකතු කළ අගය	241,863	143,886	68
බැංකු සේවා නොවන ආදායම	18,571	5,531	236
ණය හා අනෙකුත් අලාභ සඳහා හානිකරණ වෙන් කිරීම්	(87,156)	(43,734)	99
අගය එකතු කිරීම	173,278	105,683	64
අගය විසර්ජනය			
සේවකයන්ට			
වැටුප්, වේතන හා අනෙකුත් ප්‍රතිලාභ	28,991	24,982	16
රජයට			
ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ	346	1,846	(81)
ආදායම් බදු	13,550	9,836	38
අධිභාර බද්ද	6,739	–	100
මූල්‍ය සේවා සඳහා බදු	11,313	9,027	25
	31,948	20,710	54
ප්‍රජාව වෙත			
සමාජ වගකීම් ව්‍යාපෘති	60	80	(24)
බාහිර අරමුදල් සපයන්නන්ට			
සෙසු ණය ගැනීම් උදෙසා පොළිය	89,293	16,944	427
නිකුත් කළ ණයකර සඳහා පොළිය	8,358	7,314	14
	97,651	24,259	302.54
ව්‍යාප්තිය හා වර්ධනය උදෙසා			
රඳවා ගත් ලාභය	31,626	35,744	(12)
අධිභාර බද්ද	(6,739)	–	100
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	4,287	4,146	3
විලම්බිත බදු	(14,546)	(4,237)	243
	14,628	35,653	(59)
	173,278	105,683	64

එකතු කළ ආර්ථික අගය (EVA) මඟින් ආයතනයක සත්‍ය ආර්ථික ලාභය පෙන්නුම් කරයි. සංසන්දනාත්මක අවදානමේදී කොටස්හිමියාගේ අවම ප්‍රතිලාභය ඉක්ම වූ හෝ අඩු වූ ඉපැයුම් අගය සඳහා ඇස්තමේන්තුවක් මෙමඟින් ලබා දේ.

	2022 රු. මිලියන	2021 රු. මිලියන
ආයෝජිත ප්‍රාග්ධනය		
කොටස්හිමියන්ගේ අරමුදලේ සාමාන්‍ය	213,042	177,090
එකතු කළා: ණය අලාභයන් සහ හානිකරණයන් සඳහා ප්‍රතිපාදනයන්හි එකතුව	244,864	162,906
	457,906	339,996
ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ		
බදු පසු ලාභය	31,972	37,590
එකතු කළා: ණය අලාභයන් සඳහා ප්‍රතිපාදන සහ අනෙකුත් අලාභයන්	87,156	43,734
අඩු කළා: ණය කපාහැරීම්	(19)	(77)
ආයෝජිත ප්‍රාග්ධනය මත මුළු ප්‍රතිලාභය	119,110	81,247
ආයෝජිත ප්‍රාග්ධනයෙහි ආවස්ථික පිරිවැය*	(104,265)	(19,210)
එකතු කළ ආර්ථික අගය	14,844	62,037
	22.77%	5.65%

* බර තැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් (මාස 12) අනුපාතය මත පදනම්ව ගණනය කරයි 2022 - 22.77% (2021 - 5.65%)


ගෝලීය ආර්ථිකය

පෙර වසරවල කොවිඩ්-19 වසංගතයෙන් දැඩි ලෙස බාධාවට පත් වූ ආර්ථික ක්‍රියාකාරකම් කොවිඩ්-19 පීඩනය අඛණ්ඩව පැවතීම හේතුවෙන් 2022 වසර තුළදී ද දිගු කාලීන වසා දැමීම් සහ දේශසීමා නැවත විවෘත කිරීම් ප්‍රමාද කිරීමට හේතු විය. මීට අමතරව, රුසියාව සහ යුක්‍රේනය අතර ගැටුම භූ දේශපාලනික කැළඹීමක් දක්වා වර්ධනය වීම, ගෝලීය බලශක්ති වෙළඳපළට තවදුරටත් බාධා ඇති වීම සහ දැනටමත් බණ්ඩනය වී ඇති සැපයුම් දාමයන් මත පීඩනය තීව්‍ර විය. යුරෝපයේ ගැටුම ගෝලීය ආර්ථිකය නැවතත් අර්බුදකාරී තත්ත්වයකට ඇද දැමූ අතර ගෝලීය වර්ධන අපේක්ෂාවන්ටද විය බලපෑවේය. කෙසේ වෙතත්, 2022 දී සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2.9% සහ 3.4% අතර ලෙස ඇස්තමේන්තු කර ඇති බැවින්, විශේෂයෙන් චීනයේ ආර්ථිකයන් නැවත විවෘත කිරීම හේතුවෙන් එය වසර අවසානය වන විට ඉහළ යා හැකි බව උපකල්පනය කල හැක.

2022 දී යුක්‍රේනයේ පවතින ගැටුම ප්‍රධාන ගෝලීය භාණ්ඩවල මිල කෙරෙහි අඛණ්ඩව බලපෑ අතර තෙල්, ගෑස්, වානේ සහ ධාන්‍ය මිල කැළඹිලි සහිත භූ දේශපාලනික දේශගුණය පිළිබිඹු කරන බැවින් රුසියාවට එරෙහි ආර්ථික සම්බාධක පවා මෙම වෙළඳපළ බලපෑමට එකතු විය. වසර අවසානය වන විට භාණ්ඩ මිල ක්‍රමයෙන් පහත වැටීමක් දක්නට ලැබුණද, විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින සහ නැගී එන ආර්ථිකයන්හි මුදල් අවප්‍රමාණය වීම දේශීය මුදල් වීකකවල ඉහළ පිරිවැය අඛණ්ඩව පැවතීමට හේතු වී ඇත.


උද්ධමනය ඉහළම මට්ටමට ළඟා වීම බොහෝ රටවල් සඳහා සැලකිය යුතු ගැටළු තත්ත්වයන් මතු කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස ජීවන වියදම සීඝ්‍රයෙන් ඉහළ යාම සහ ක්‍රය ශක්තිය අඩු වීම සිදුවූ අතරම කුටුම්භ අයවැය කෙරෙහි බලපෑම් ඇති වීම නිසා ප්‍රජාවන්ට සංකේන්ද්‍රිත බලපෑමක් ද ඇති විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් දැඩි කිරීම වැනි සාමූහික ප්‍රයත්නයන් හේතුවෙන් ඒ සමගම ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ 2022 අවසානය වන විට උද්ධමන පීඩනය තරමක් අඩු විය. කෙසේ වෙතත්, ඉහළ මූලික උද්ධමනය බොහෝ රටවල එලෙසම පවතින අතර, ඉදිරි වර්ෂයේදී ලොව පුරා අඛණ්ඩ උද්ධමන පීඩනයක් ඇති වීමට අවකාශය සකසයි. මහ බැංකුවල අඛණ්ඩ මැදිහත්වීම පොළී අනුපාත ඉහළ නැංවීමේ ස්වරූපයෙන් දැනටමත් ඉහළ භාණ්ඩ හා සේවා පිරිවැය සමඟ පොරබදමින් සිටින ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාර සඳහා ණය ගැනීමේ පිරිවැය වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

සැබෑ දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගය





ශ්‍රී ලංකාවේ සන්දර්භය



පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් සහ කොවිඩ්-19 වසංගතයෙන් පසු වසර දෙකක ආර්ථික අභියෝගවල පසුබිම මත, දිගුකාලීන ව්‍යුහාත්මක ගැටළු සහ මූල්‍ය, බාහිර අංශය සහ මූල්‍ය අංශයේ අසමතුලිතතාවයන්හි බලපෑම් ප්‍රකාශ කළ බහුවිධ ආර්ථික කම්පනවල වැටීම ශ්‍රී ලංකාව අත්විඳින ලදී. නිදහස ලබා ගැනීමෙන් පසු රට මුහුණ දුන් වඩාත්ම අභියෝගාත්මක වසර 2022 වර්ෂය බව ඔප්පු විය. 2022 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 9.2% කින් හැකිලී යා හැකි බවට ඇස්තමේන්තු කර ඇති පරිදි, මෙම කැපී පෙනෙන පෙරළිය 2021 ජයග්‍රහණ ආපසු හැරවූ අතර, ආර්ථිකය මන්දගාමී ප්‍රකෘතියක් සහ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 3.3% ක් පෙන්නුම් කළේය.

රාජ්‍ය ආදායම අඩුවීම සහ වියදම් වැඩිවීම මධ්‍යයේ පසුගිය වසර දෙක තුළ පිරිහෙමින් තිබූ රටේ මූල්‍ය තත්ත්වය වසර තුළ සැලකිය යුතු ලෙස නරක අතට හැරුණි. 2022 වර්ෂයේදී සේවා වගකීම් සහ වර්ධනය වන ආනයන බිල්පත් නිසා දැනටමත් මුදල් හිඟ තත්ත්වයකට පීඩනයක් එල්ල වීම නිසා රජයේ විදේශ සංචිත අවිනිශ්චිත ලෙස පහළ මට්ටමක් කරා ළඟා විය.


පෙර වසරවල පහත වැටීම 2022 දක්වා බලපැවත්වීම හේතුවෙන් සංචාරක ඉපැයීම්වල මන්දගාමී ප්‍රකෘතිමත් වීමත් සමඟ පෙන්නුම් කළ අභ්‍යන්තර ප්‍රේෂණ වල අඩුවීම රටට බලපෑවේය. 2022 මාර්තු මාසයේදී විනිමය අනුපාතිකය පා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ගත් තීරණයෙන් පසුව, ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය විය. ශ්‍රී ලංකාවේ ආනයන වියදම් ගෝලීය ප්‍රවණතාවලට අනුකූලව බලශක්ති මිල ඉහළ යාමේ බර දරා සිටි අතර

ii ලෝක බැංකුව. ගෝලීය ආර්ථික අපේක්ෂාවන් ජනවාරි 2023. වොෂින්ටන් ඩීසී: ලෝක බැංකුව

මෙහෙයුම් සන්දර්භය

රුපියල අවප්‍රමාණය වීම නිසා ඊටත් වඩා බලපෑමක් ඇති විය. ඒ අතරම, රජය විසින් දෙවන කාර්තුව ආරම්භයේදී විදේශ ණය බැඳීම් පැහැර හැරීම නිවේදනය කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම පහත වැටුණි.

ඇ. ඩො. සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල (2021 ජනවාරි සිට 2023 ජනවාරි)




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

මෙම කාල පරිච්ඡේදය තුළ, ඉන්ධන, ගෑස් සහ ඖෂධ වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීමේ හිඟය සාමාන්‍ය දෙයක් වූ අතර එය ව්‍යාපාර සහ ප්‍රවාහනයට බාධා කිරීම්, සමාජයට ඇති වූ පීඩා, මහජන විරෝධතා සහ තුන්වන කාර්තුව ආරම්භයේදී ආණ්ඩු වෙනස් වීමට පවා හේතු විය.

මේ අතර, ශ්‍රී ලංකාවේ උද්ධමනය අසාමාන්‍ය මට්ටම් කරා ළඟා වූ අතර, 2022 වර්ෂයේ අවසන් කාර්තුවේදී 70% කට ආසන්න අගයක් දක්වා ඉහළ ගියේය. අධිඋද්ධමන පීඩනවලට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට සහ පොළී අනුපාත සැලකිය යුතු ආන්තිකයකින් ඉහළ නැංවීමට පියවර ගත්තේය.


උද්ධමනය: කොළඹ පාරිභෝගික මිල දර්ශකය සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහළ පොළී අනුපාත තන්ත්‍රයකට මාරුවීම, අවපාත ආර්ථික පරිසරයක් සහ ශ්‍රේණිගත කිරීම් පහත වැටීම් වැනි කරුණු රටේ මූල්‍ය අංශයට දැඩි පීඩනයක් ඇති කළේය.

ආර්ථික ආතතිය



විනිමය අනුපාතයේ පාවීම

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්



විනිමය අනුපාතිකයේ පාවීම සීමා-වෙළඳපලේ බලපෑම පටු කල අතර විධිමත් මාර්ග හරහා අභ්‍යන්තර ප්‍රේෂණ දිරිමත් කරන ලදී. 2023 දී විදේශ විනිමය හා සම්බන්ධ සීමාවන් තවදුරටත් ලිහිල් කිරීම වෙළඳපල මත පදනම් වූ විනිමය අනුපාතිකයක් කරා අඛණ්ඩව ගමන් කිරීම පෙන්නුම් කරයි.

අපනයන ගනුදෙනුකරුවන් ආන්තිකවල වැඩි වීමක් හඳුනා ගත් අතර රටේ සංචාරක අංශය මෙන් වැඩි මිල-තරඟකාරිත්වයේ ප්‍රතිලාභ භුක්ති විඳින ලදී.

කෙසේ වෙතත්, ආනයන මත යැපෙන ගනුදෙනුකරුවන් ආන්තිකය බාදනය කරන ලද වියදම් සහ ඉල්ලුම පහත වැටීම හඳුනාගෙන ඇත. ආනයන සීමා කිරීම් ද ව්‍යාපාරවලට බාධාවක් විය. ආනයනික යෙදවුම් මත දැඩි ලෙස රඳා පැවතීම දේශීය කර්මාන්තවල පුළුල් පරාසයකට ද බලපෑ අතර උද්ධමන පීඩනය පිරිවැය තල්ලු කිරීමට දායක විය. ආනයන උපපොළ මඟින් දේශීය කර්මාන්ත නියෝජනය කරන ගනුදෙනුකරුවන්ට නව වර්ධන අවස්ථා දැකගත හැකි විය.

ශාඛා ගනුදෙනුකරුවන් ආනයනික භාණ්ඩ හා සේවාවල මිල වැඩිවීමක් අත්විඳින අතර, ඉහළ යන ප්‍රවාහන වියදම් හේතුවෙන් ද මිල වැඩි වේ. ආහාර සුරක්ෂිතතාව මත පීඩනයක් ඇති කළ භාණ්ඩ හිඟය සහ මිල ඉහළ යාම ප්‍රජාවන් දුටුවේය. සැලකිය යුතු ආනයනික භාණ්ඩ වන පරිප්පු, සහල් සහ කරවල වැනි මූලික ආහාර ලෙස සැලකූ ආහාරවල පවා මිල ඉහළ යන ලදී.



අධිඋද්ධමනකාරී පරිසරය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්

ගනුදෙනුකරුවන් | ව්‍යාපාරික හවුල්කරුවන් | සේවකයන් | ප්‍රජාව සහ පරිසරය

අසාමාන්‍ය උද්ධමන පීඩනය හේතුවෙන් රටේ සියලුම පුරවැසියන්ට දැනෙන ජීවන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. සේවා සහ උපයෝගිතා පිරිවැය තියුනු ලෙස වැඩි වීම නිසා ආයතනික ගනුදෙනුකරුවන් ද උද්ධමන පීඩනය හේතුවෙන් පීඩාවට පත් විය.



විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුදය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්

ගනුදෙනුකරුවන් | ව්‍යාපාරික හවුල්කරුවන් | කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන් | ප්‍රජාව සහ පරිසරය

2022 වසර තුළ රටේ වඩාත්ම තීරණාත්මක සහ සීමිත සම්පත් වලින් එකක් බවට විදේශ විනිමය පත් විය.

විදේශ විනිමය ද්‍රවශීලතාවය නොමැතිකම අත්‍යාවශ්‍ය භාණ්ඩ හිඟයට හේතු විය. ප්‍රවාහනය, බලය සහ බලශක්තිය, ආහාර සහ සෞඛ්‍ය සේවා ඇතුළුව එහි බලපෑම පුළුල් ලෙස දැනෙන්නට විය. ප්‍රවාහනයට සහ විදුලියට ඇති බාධා රට පුරා සිටින ජනතාවට බාධා ඇති කළ අතර එමගින් ගනුදෙනුකරුවන්ට ව්‍යාපාර අබණ්ඩව පවත්වාගෙන යාමට දැඩි පීඩනයක් එල්ල විය.

විදේශ විනිමය අර්බුදය සේවා වගකීම් සහ අත්‍යවශ්‍ය ගෙවීම් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන්ට පීඩන ඇති කළේය.




ස්වෛරී පැහර හැරීම සහ ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්

ගනුදෙනුකරුවන් | කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්

2022 දී ස්වෛරී ණය බැඳීම් පැහැර හැරීම ශ්‍රී ලංකාවේ ස්වෛරී ශ්‍රේණිගත කිරීම පහත හෙළීමට හේතු වූ අතර, මූල්‍ය ආයතන සහ ගනුදෙනු කළඹේ සිටින බොහෝ ආයතනික ගනුදෙනුකරුවන්ගේ ශ්‍රේණිගත කිරීම් ද පහත හෙළීමට හේතු විය.



ඉහළ පොළී පාලන තන්ත්‍රය

බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන්

ගනුදෙනුකරුවන් | සේවකයන් | ව්‍යාපාරික හවුල්කරුවන් | ප්‍රජාව සහ පරිසරය

ශ්‍රී ලංකා මහ බැංකුව 2022 අප්‍රේල් මාසයේ දී ප්‍රතිපත්ති අනුපාත 7% කින් වැඩි කළ නිසා, ශ්‍රී ලංකාව එක රැයකින් අඩු පොළියක සිට ඉහළ පොළී සහිත පාලන තන්ත්‍රයක් දක්වා සංක්‍රමණය විය. ප්‍රතිපත්ති අනුපාත වසර තුළ උද්ධමනය කළමනාකරණය කිරීමේදී මහ බැංකුව විසින් භාවිතා කරන ලද මූලික මෙවලමක් විය. 2023 දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ඉහළ නැංවීම සඳහා නියාමකයා විසින් ගනු ලබන වැඩිදුර ක්‍රියාමාර්ග, උද්ධමනය මැඩපැවැත්වීම සඳහා අබණ්ඩ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අනුකූල වේ.

ආයතනික ගනුදෙනුකරුවන් සඳහා සාමාන්‍ය බර තැබීමේ මූලික ණය අනුපාතිකය තුන් ගුණයක වැඩිවීමක් - පුද්ගලික අංශයට ණය වර්ධනය සඳහා බාධාවක් ලෙස සේවය කළ අතර, අනෙකුත් බාහිර ආර්ථික ආතතීන් හේතුවෙන් ඉල්ලුම අඩු විය. ආයතනික ගනුදෙනුකරුවන් මූල්‍ය පිරිවැය සහ ආන්තික අවශ්‍යතා දැඩි ලෙස ඉහළ යාමකට මුහුණ දී ඇති අතර, ඉහළම තෝලිත ව්‍යාපාරවලට විශාලතම බලපෑම දැනේ.

ජීවන වියදම ඉහළ යාම සහ ණය ආපසු ගෙවීමේ අනුපාත වැඩි වීම නිසා සිල්ලර ණය ගැතියන් පීඩාවට පත් විය. විචල්‍ය පොළී අනුපාත (VIR) මත ණය ගැණුම්කරුවන් දැඩි ලෙස පීඩාවට පත් වූ නමුත්, පහසුකම් ප්‍රතිනිර්මාණය කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම සහ සහනදායී අනුපාත ගැලපීම් වැනි නියාමකයා විසින් මෙහෙයවනු ලබන සහන මඟින් සහාය විය.

මේ අතර, තැන්පතුකරුවන් ඉහළ පොළී අනුපාත වලින් ලාභ ලැබූ අතර වෙළඳපලේ ස්ථාවර තැන්පතු සඳහා පොළිය වැඩි විය.

මෙහෙයුම් සන්දර්භය

බැංකු අංශය

ඉහළ පොළී අනුපාත මගින් තවදුරටත් උග්‍ර වූ රටේ ආර්ථික අර්බුදයෙන් ණය ගැනියන් දැඩි ලෙස පීඩාවට පත් වීම නිසා ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මක භාවය පිරිහීමට ලක් විය. වසර තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ඉහළ ප්‍රතිපාදන, වියදම් සහ බදු වැඩි වීමත් ලාභයට බලපෑවේය. වියදම් කළ හැකි ආදායම අඩු වීම, ආර්ථික මූලධර්ම බිඳවැටීම, ඉන්ධන සහ බලශක්ති අර්බුද, සමාජ අසහනය සහ දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් ව්‍යාපාරික අපේක්ෂාවන් පිරිහීම ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලට දැඩි ලෙස බලපෑවේය. පුද්ගලික අංශයේ ණය වර්ධනය සීමා කිරීමට අමතරව, මෙම ආර්ථික පීඩනය හේතුවෙන් ණය සහ අත්තිකාරම් ඉහළ ප්‍රතිපාදන ද ඇති විය. මෙම වෙනස්කම් සහ අබණ්ඩ අවිනිශ්චිතතාවයන් හේතුවෙන්, අදියර 3 ණය අනුපාතය සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වෙතත්, වැඩිවන පොළී අනුපාතවලට අනුකූලව වසර තුළදී බැංකු විසින් ශුද්ධ පොළී ආදායමේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණි. ඒ අතරම, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම බැංකුවේ ආදායම් ප්‍රකාශනවලට ධනාත්මකව බලපෑවේ ප්‍රති ඇගයීම් ප්‍රතිලාභ මගිනි.

ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය පිළිබඳ පීඩනය මධ්‍යයේ, ප්‍රාග්ධන ස්වාරක්ෂක ඉවත් කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නියාමකයා අවසර දුන් බැවින් එය බැංකු අංශයට ලබා දෙන ලද සහනයක් විය.

බැංකු ක්ෂේත්‍රය මුහුණ දුන් අභියෝග

- ස්වෛරීත්වය පහත හෙළීම හේතුවෙන් විදේශ මුදල් අරමුදල් මූලාශ්‍ර වෙත ප්‍රවේශය සීමා වී ඇත
- ජංගම සහ ඉතුරුම් ගිණුම් අනුපාතය අඩුවීම නිසා අරමුදල්වල පිරිවැය ඉහළ යයි
- ඉහළ පොළී අනුපාත හේතුවෙන් පටු ආන්තිකය
- මෙහෙයුම් පිරිවැය ඉහළ යාමට ඉහළ උද්ධමනය තුඩු දෙයි
- ගනුදෙනුකාර මුදල් ප්‍රවාහයේ පීඩනය වත්කම්වල ගුණාත්මක භාවය පිරිහීමට හේතු විය
- ණය සඳහා අඩු ඉල්ලුම සහ ඉහළ පොළී අනුපාත හේතුවෙන් ණය වර්ධනයට සීමාවන්
- කොවිඩ්-19, ඉන්ධන අර්බුදය සහ දේශපාලන සහ සමාජ නොසන්සුන්තාව හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලට අබණ්ඩ බාධා සිදුවීම
- ප්‍රාග්ධන ආයෝජන සහ ව්‍යාප්තියේ මන්දගාමී වර්ධනය
- ආනයන අපනයන සීමා කිරීම් හේතුවෙන් ගාස්තු ආදායමට බලපෑම් එල්ල වීම

අපගේ ප්‍රතිචාරය

- මුදල් ප්‍රේෂණ රට තුළට ගලා ඒමට සහයෝගය ලබා දීම
- රටේ විදේශ මුදල් ගලායාම කළමනාකරණය කිරීමට පහසුකම් සැලසීම
- උදවු අවශ්‍ය ගනුදෙනුකරුවන්ට අවශ්‍ය සහන ලබා දීම
- ප්‍රතිසාධනය වෙනුවට පුනර්ජීවන යාන්ත්‍රණයක් හඳුන්වා දීම
- සමාජ-ආර්ථික අර්බුද මධ්‍යයේ අබණ්ඩ බැංකු සේවා සහතික කිරීම
- ජීවන වියදම වැඩිවීම නිසා සේවකයින්ට අවශ්‍ය සහන සැපයීම
- ද්‍රවශීලතා ආතතිය උපායශීලීව කළමනාකරණය කිරීම
- විචක්ෂණශීලී ප්‍රතිපාදන හරහා ශේෂ පත්‍රය ශක්තිමත් කරන ලදී

2023 වසර සහ ඉන් ඔබ්බට ආර්ථිකයේ ඉදිරි දැක්ම

ගෝලීය ආර්ථිකය 2023 වර්ෂයේදී වර්ධනයේ පහත වැටීමක් අත්විඳිනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, වර්ධන වේගය 2.9% දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. උද්ධමන පීඩනයන්ට මහ බැංකුවල අබණ්ඩ ප්‍රතිචාරය, විශේෂයෙන්ම මූල්‍ය බලධාරීන් ආර්ථික කළමනාකරණය තුලනය කිරීමට උත්සාහ කරන දියුණු ආර්ථිකයන්හි, ගෝලීය ආර්ථික අපේක්ෂාවන් සඳහා තීරනාත්මක වනු ඇත. යුක්රේනයේ ගැටුම් අබණ්ඩව පැවතීම 2023 වසර සහ ඉන් ඔබ්බට ලොව පුරා ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කරන තවත් සාධකයකි.

ගෝලීය උද්ධමනය 2023 වසරේ දී 6.6% දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එය පූර්ව වසංගත මට්ටම්වලට වඩා ඉහළින් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අතරම, සමහර නැඟී එන වෙළඳපළවල් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් අසාමාන්‍ය ලෙස ඉහළ උද්ධමන මට්ටම් අත්විඳිනු ඇත. මෙම තත්ත්වය තුළ, ඉහළ යන පිරිවැයෙන් ප්‍රජාවන් ආරක්ෂා කිරීම ලොව පුරා රජයන් අවධානය යොමු කළ යුතු කරුණක් වනු ඇත.

i ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2023. ලෝක ආර්ථික දැක්ම ජනවාරි 2023

PESTEL විශ්ලේෂණය

3

කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වටිනාකම් උත්පාදනය කිරීමේ හැකියාව කෙරෙහි බලපාන ද්‍රව්‍යමය අවදානම් සහ අවස්ථා හඳුනා ගැනීම සඳහා ලංකා බැංකුව PESTEL රාමුවක් භාවිතයෙන් මෙහෙයුම් පරිසරය අඛණ්ඩව අධීක්ෂණය කරයි. වසර තුළ බැංකුවේ කාර්යසාධනය සහ උපායමාර්ගය කෙරෙහි බලපෑ තීරණාත්මක සාධක පහත දැක්වේ.

දේශපාලන

- වසර තුළ දේශපාලන අස්ථාවරත්වය සහ ආණ්ඩුවේ වෙනස් වීම

ආර්ථික

- 2022 වසරේ දී ආර්ථික අර්බුද හේතුවෙන් ඇති වූ බාධක සහ ආර්ථිකය හැකිලීම.
- විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුදය, ස්වෛරී ණය වගකීම් පැහැර හැරීම සහ ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම මධ්‍යයේ විදේශ අංශයේ අසමතුලිතතාවය දිගටම පැවතීම. කෙසේ වෙතත්, නියාමන සීමා කිරීම් සහ අපනයනවල මිල-තරගකාරිත්වය ඉහළ යාම මධ්‍යයේ වසර අවසානය වන විට වෙළඳ හිඟය අඩු විය.
- 2021 හා සසඳන විට සැලකිය යුතු ලෙස වර්ධනයක් පෙන්වුවද, ගෝලීය සහ දේශීය සාධක හේතුවෙන් සංචාරක අංශය අඛණ්ඩව සිව්වන වරටත් අවම කාර්යසාධනයක් පෙන්විය.
- මුදල් ප්‍රතිපත්තිය මඟින් උද්ධමනය මැඩපැවැත්වීම මෙහෙයවනු ලබන අතර, 2021 අවසානයේ දී ක්‍රමානුකූලව වැඩි වීමෙන් පසු 2022 දී පොළී අනුපාත ඉහළ ගියේය.
- ගෝලීය බලපෑම් සහ රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 නොවැම්බර් මාසයේ උද්ධමන මට්ටම් උච්චතම අගයට පැමිණියේය.
- ස්වෛරී ශ්‍රේණිගත කිරීම් පහත හෙලීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාපිත සඳහා ශ්‍රේණිගත කිරීම් සහ ආයෝජක විශ්වාසය අඩු වීම.
- බහුවිධ ආර්ථික කම්පන සහ දීර්ඝ වුණු ආර්ථික ආතතිය හේතුවෙන් වත්කම් වල ගුණාත්මක භාවය පිරිහීම මධ්‍යයේ ඉහළ යන ණය අවදානම.
- සේවක ප්‍රේෂණ අඩු වීම.
- බාහිර හා දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ අඛණ්ඩ සාකච්ඡා පැවැත්වීම.

සමාජීය

- බාහිර සංක්‍රමණය පෙර නොවූ විරූ මට්ටම් කරා වර්ධනය වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස නිපුණ පුද්ගලයින්ගේ විගමනය සහ ආයතන සහ කුටුම්භයන් මත පීඩනය.
- සමාජ නොසන්සුන්තාව සහ විනිවිදභාවය සහ ආර්ථික ස්ථාවරත්වය සඳහා වඩාත් ඉල්ලුම.
- ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් සහ අපේක්ෂාවන් වෙනස් කිරීම.
- බලපෑමට ලක් වූ ජීවනෝපායන්, ආදායම් අඩුවීම, මිලදී ගැනීමේ හැකියාව අඩුවීම, ජීවන වියදම ඉහළ යාම හේතුවෙන් ගෘහස්ථ ආතතිය සහ ආහාර අනාරක්ෂිත භාවය.
- ශිෂ්‍ය ගාස්තු වැනි අත්‍යවශ්‍ය විදේශ විනිමය ගෙවීම් කිරීමේදී මහජනතාව දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ.

තාක්ෂණය

- පසු වසංගත තත්වයක් තුළ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන්, පුරුදු සහ අන්තර්ක්‍රියා වල වෙනස්වීම් (සාමාන්‍යයෙන් සහස්‍ර සහ Z පරම්පරාවේ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව වැඩි වීමත් සමඟ) වැඩි ඩිජිටල්කරණයට සහ ඩිජිටල් වේදිකා සහ ක්‍රියාවලීන් අනුගමනය කිරීමට හේතු වේ.
- රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (RPA) සහ කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණයෙන් කාර්යක්ෂමතාව සහ පරිමාණ ප්‍රතිලාභ.
- පුද්ගලික අන්තර්ක්‍රියා ඇතුළුව සියලුම අංශ හරහා යන්ත්‍ර ඉගෙනීමේ (ML) සහ කෘතිම බුද්ධියේ (AI) ප්‍රායෝගික භාවිතයේ වේගවත් වර්ධනය.
- සියලුම අංශ හරහා වැඩි ඩිජිටල්කරණයක් සමඟ සයිබර් ආරක්ෂණ අවදානම වැඩි කිරීම

පාරිසරික

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ හරිත මූල්‍ය දිශානතිය ප්‍රකාශයට පත් කිරීම, රටේ තිරසාර මූල්‍යකරණ ප්‍රයත්නයන් සඳහා මඟ පෙන්වීමක් සකසන ලදී.
- ලොව පුරා දේශගුණික විපර්යාසවල ප්‍රගතිය මධ්‍යයේ පාරිසරික අවදානම් අඛණ්ඩව වැදගත්කමකින් වර්ධනය වීම.
- සමාජ සහ පාරිසරික සලකා බැලීම් ඇතුළත් වගකීම් සහිත ණය දීමේ තීරණ සඳහා බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ණය දෙන්නන්ගෙන් වැඩි අපේක්ෂාවක් ඇති වීම.
- පාරිසරික බලපෑම් පිළිබඳ ගනුදෙනුකරුවන්ගේ දැනුවත්භාවය අඛණ්ඩව වර්ධනය වීම.

නීතිය

- බැංකු පද්ධතියෙන් විදේශ මුදල් පිටතට ගලා යාමේ නියාමන සීමා කිරීම්.
- ඇතැම් භාණ්ඩ වර්ග ආනයනය සීමා කිරීම්.
- නව රෙගුලාසි සහ අනුකූලතා අවශ්‍යතා
- වසර තුළ අර්බුදකාරී බලපෑමට ලක් වූ ණය ගැණුම්කරුවන්ට ණය සහන දීර්ඝ කිරීම සහ නව වසර සඳහා ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂිත නව සහන.
- යලි අයකර ගැනීම් කල් දැමීම.
- ආයතනික සහ පුද්ගලයන්ට බලපාන බදු තන්ත්‍රයේ වෙනස්කම්.



PESTEL විශ්ලේෂණය

ලංකා බැංකුවේ උපායමාර්ග සහ කාර්යසාධනය කෙරෙහි ඇති විය හැකි බලපෑම

මෙහෙයුම් පරිසරයේ ප්‍රවණතා බැංකුවේ මූලෝපාය සහ කාර්යසාධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ අතර, වටිනාකම් නිර්මාණය කිරීමට බැංකුවේ ඇති හැකියාව කෙරෙහි බලපෑ අවස්ථා සහ අවදානම් යන දෙකම ඉදිරිපත් කර ඇත.

බලපෑම්

- විදේශ මුදල් හිඟය දේශසීමා ගනුදෙනු සඳහා අරමුදල් සැපයීමේ බැංකුවේ හැකියාවට බලපෑ අතර ආනයනය සම්බන්ධ ගාස්තු සහ කොමිස් ආදායම අඩුවීමට හේතු වී ඇත.
- පවතින සීමිත විදේශ මුදල් සම්පත් සමඟ, ජාතික වැදගත්කමක් ඇති (උදා: අත්‍යවශ්‍ය ආනයන) සමහර අංශවලට වෙනත්, සමහර විට වඩා ලාභදායී අවස්ථා අහිමි කර සේවා සැපයීමට සිදු විය.
- ඉහළ පොළී අනුපාත පාලන තන්ත්‍රය සහ ප්‍රාග්ධනය මත පීඩනය ණය පොතේ වර්ධනය සඳහා සීමා කිරීමේ අවස්ථා.
- හානිකරණ ප්‍රතිපාදන වැඩි වීම හේතුවෙන් ඉපැයීම් වලට සිදුවන පාඩුව සහ ලාභ ආන්තිකය මත බලපෑම.
- ස්වෛර්ී සහ ආයතනික ශ්‍රේණිගත කිරීම් පහත වැටීම මධ්‍යයේ විදේශ අරමුදල් ලබා ගැනීමේ සීමාව.
- අන්තර් බැංකු වෙළඳපළේ අරමුදල් ප්‍රමාණවත් නොවීම අන්තර් බැංකු ණය ගැනීම්වලට බාධාවක් විය.
- නියාමක අධීක්ෂණය සහ වාර්තා කිරීමේ බර වැඩි කිරීම.
- සැපයුම් දාමයේ සහ ප්‍රවාහන දුෂ්කරතා.

අවස්ථාවන්

- අර්බුදයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාරවල අවශ්‍යතා සපුරාලීම සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සැපයීම.
- ඉහළ පොළී තන්ත්‍රය හේතුවෙන් දළ පොළී ආදායමේ වර්ධනය.
- අර්බුද වලදී ගනුදෙනුකරුවන්ගේ ප්‍රමුඛතා සහ ජාතික අවශ්‍යතා සඳහා සහාය වීමෙන් කීර්තිනාම ප්‍රතිලාභ සහ ගනුදෙනුකාර පක්ෂපාතිත්වය.
- විදේශ විනිමය පිළිබඳ අභියෝග මධ්‍යයේ වුවද විදේශ මෙහෙයුම්, අභ්‍යන්තර ප්‍රේෂණ වෙළඳපළ-කොටස් සහ දේශසීමා සබඳතාවල ශක්තිය බැංකුව හොඳ ස්ථාවරයක තබන ලදී.
- ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිය සමඟ පෙලගැසී, සහභාගීත්ව මූල්‍ය ආයතනයක් (PFI) ලෙස බැංකුවේ භූමිකාවේ වර්ධනය සඳහා අවකාශය.
- ගනුදෙනුකාර පදනම රඳවා තබා ගැනීම, රටේ ආර්ථික ප්‍රකෘතිය සමඟ සමපාත වන ශක්තිමත් ප්‍රබෝධයක් සහ වර්ධනයක් සඳහා බලාපොරොත්තුවක් දරයි.
- මිල තරඟකාරිත්වය සහ ජාතික වශයෙන් සහාය දක්වන වර්ධන අවස්ථා වලින් ප්‍රතිලාභ ලබන අපනයන අංශයෙන් වැඩි අවස්ථා.
- ගනුදෙනුකාර පදනමේ ඩිජිටල් විනිවිද යාම සහ ඩිජිටල් සාක්ෂරතාව වැඩිදියුණු කිරීම.
- වැඩිවන ක්‍රියාවලි කාර්යක්ෂමතාව සහ පිරිවැය ඉතුරුම් සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීම.
- බැංකුවේ තරඟකාරිත්ව ප්‍රතිලාභ වර්ධනය කරන ගනුදෙනුකරුවන් වෙත පිරිනැමෙන ඩිජිටල් සේවා

අවදානම්

- බහුවිධ ආර්ථික අර්බුද හමුවේ ණය ගැතියන්ගේ ආපසු ගෙවීමේ හැකියාව අඩු වීම හේතුවෙන් ණය අවදානම වැඩි වීම, ණය කළඹේ ගුණාත්මක භාවයට අහිතකර බලපෑම් ඇති කරයි.
- ස්වෛර්ී පැහැර හැරීම සහ මූල්‍ය හිඟය සැලකිල්ලට ගනිමින් රජය සහ රජය සතු ව්‍යවසායයන්ගෙන් ණය අවදානම වැඩි වීම.
- නියාමන අවශ්‍යතා, කළඹේ ගුණාත්මක භාවයට අහිතකර බලපෑම් සහ විදේශ මුදල් හිඟය මධ්‍යයේ වසර පුරා ද්‍රවශීලතා අවදානම වැඩි වීම.
- ඩිජිටල් දියුණුවේ වේගය තාක්ෂණික යල්පැන යාමේ තර්ජනයක් මතු කරයි.
- වර්ධනය වන බාහිර සංක්‍රමණය සහ පිරිවැටුම මධ්‍යයේ, විශේෂයෙන්ම තරුණ ජනගහනය අතර වැඩිවන පුද්ගලයින් හා සම්බන්ධ අවදානම්.
- ඩිජිටල්කරණයේ වර්ධනයට සමගාමීව වැඩි වූ තොරතුරු ආරක්ෂාව/තොරතුරු තාක්ෂණ අවදානම.
- ආහාර සුරක්ෂිතතාව, ග්‍රාමීය සංවර්ධනය සහ අපනයන ඉපැයීම් සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන දේශගුණික සංවේදී කර්මාන්ත කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම.
- ආර්ථිකයේ ප්‍රකෘතිමත් වීම ප්‍රමුඛතාවයක් ගැනීම සමඟින්, පාරිසරික ගැටලුවලට ඇති ප්‍රමුඛත්වය අහිමි වී යාම හෝ පහත හෙළීම සිදුවිය හැකිය.
- ශුද්ධ පොළී ආන්තිකය මත පීඩනය සහ ලාභදායීත්වය මත බලපෑම.

ප්‍රමාණාත්මකව වැදගත් කරුණු 3

ප්‍රමාණාත්මකව වැදගත් කරුණු යනු වටිනාකම් නිර්මාණය කිරීමට සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට බැංකුවට ඇති හැකියාව කෙරෙහි බලපෑම් කළ හැකි සැලකිය යුතු අභ්‍යන්තර සහ බාහිර උත්සුකයන් වේ. බැංකුව පහත දක්වා ඇති පරිදි එහි උපායමාර්ග සහ මෙහෙයුම් කෙරෙහි බලපාන ප්‍රමාණාත්මක කරුණු හඳුනා ගැනීම සඳහා ව්‍යුහගත ක්‍රියාවලියක් අනුගමනය කරයි.

1 ප්‍රමාණාත්මකව වැදගත් කරුණු හඳුනා ගැනීම

මෙහෙයුම් භූ දර්ශනයේ ගතිකත්වය, පාර්ශ්වකරුවන්ගේ උත්සුකයන් සහ ලංකා බැංකුවේ ව්‍යාපාර ආකෘතිය

2 සාපේක්ෂ වැදගත්කම තක්සේරු කිරීම

බැංකුවේ උපායමාර්ග කෙරෙහි ඇති බලපෑම සහ පාර්ශ්වකරුවන්ගේ තීරණ කෙරෙහි ඇති බලපෑම ඇගයීම.

3 ප්‍රමාණාත්මකව වැදගත් කරුණු වලට ප්‍රමුඛත්වය ලබා දීම

සම්භාවිතාව සහ බලපෑම මත ප්‍රමාණාත්මකව වැදගත් කරුණු ශ්‍රේණිගත කිරීම


4 උපායමාර්ග, අවදානම් කළමනාකරණය සහ වාර්තා කිරීම

මූලෝපාය හැඩගැස්වීම, අවදානම් කළමනාකරණය සහ වාර්තා කිරීමේ උත්සාහයන් සඳහා ප්‍රමාණාත්මකව වැදගත් කරුණු තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි

2022 සඳහා ප්‍රමාණාත්මක තක්සේරුව පෙර වසරේ හඳුනාගත් ප්‍රමාණාත්මක මාතෘකා මත ගොඩනගා ඇත. බැංකුව සිය මෙහෙයුම්වල වෙනස්කම් වලට අනුකූලව එහි ප්‍රමාණාත්මක මාතෘකා විෂය පථය සමාලෝචනය කළ අතර එහි වාර්තාකරණ සීමාවන්හි සැලකිය යුතු වෙනස්කම් නොමැති බව තීරණය කළේය. විශ්ලේෂණයේ දී, ලංකා බැංකුව විසින් 2021 ප්‍රමාණාත්මක මාතෘකා බැංකුවට සහ මෙහෙයුම් තත්ත්වයන්ට අදාළ බව තහවුරු කිරීම සඳහා නැවත බැලීමක් සිදු කරන ලදී.

2020 දී චිකතු කරන ලද නව මාතෘකා දෙකෙන් චිකක් වන ගනුදෙනුකාර සහාය සහ ව්‍යාපාර පුනර්ජීවනය, ආර්ථික අර්බුදයේ පවතින තත්ත්වය හේතුවෙන් ප්‍රමාණාත්මක වශයෙන් දිගටම පවතී. මේ අතර, සාර්ව ආර්ථික වර්ධනයන් සහ ප්‍රතිපත්තිමය වෙනස්කම්, ප්‍රමාණාත්මක වශයෙන් තවදුරටත් ඉහළ නංවා ඇති අතර, රටේ පවතින ආර්ථික සංකීර්ණතා සහ අවිනිශ්චිතතාවයන් හේතුවෙන් 2022 වසරේ වැදගත්ම කරුණු අතර පවතී.

ප්‍රමාණාත්මක ආකෘතිය



ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා

පාර්ශ්වකරුවන්	අදාළ ප්‍රමාණාත්මක මාතෘකාව	එය ලංකා බැංකුවට ප්‍රමාණාත්මක වන්නේ කෙසේද	වසර තුළ අදාළ ප්‍රමාණාත්මක මාතෘකාව සඳහා අපගේ ප්‍රතිචාරය	ප්‍රමාණාත්මක වෙනස්කම්	අනුරූප වාර්තාකරණය ප්‍රමිති (ගෝලීය වාර්තාකරණ මූලපිරිම, කොළඹ කොටස් හුවමාරුව - පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන මාර්ගෝපදේශය, වාණිජ බැංකු සඳහා තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලයේ නිර්දේශ)	එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය
ගනුදෙනුකරුවන්	(1) ගනුදෙනුකාර සහය සහ ව්‍යාපාර පුනර්ජීවනය	නැවත සැලසුම් කිරීම/ප්‍රතිව්‍යුහගත කිරීමේ පහසුකම්, මුදල් ප්‍රවාහ අධීක්ෂණය සහ මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශය සකසා දීම හරහා ව්‍යාපාර පුනර්ජීවනයට සහාය වෙමින් බැංකුව රටේ ආර්ථික ප්‍රකෘතිය සඳහා අඛණ්ඩව නායකත්වය දී ඇත.	යොමු වන්න: ව්‍යාපාරික අංශ සමාලෝචනය පිටු අංක 65-77. පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ ගනුදෙනුකරුවන් පිටු අංක 78- 88	−	SASB FN-CB-240a.1 මූල්‍ය ඇතුළත් කිරීම් සහ හැකියාවන් ගොඩනැඟීම SASB FN-CB-240a.2: මූල්‍ය ඇතුළත් කිරීම් සහ හැකියාව වර්ධනය	9 10


ප්‍රමාණාත්මකව වැදගත් කරුණු

පාර්ශ්වකරුවන්	අදාළ ප්‍රමාණාත්මක මාතෘකාව	එය ලංකා බැංකුවට ප්‍රමාණාත්මක වන්නේ කෙසේද	වසර තුළ අදාළ ප්‍රමාණාත්මක මාතෘකාව සඳහා අපගේ ප්‍රතිචාරය	ප්‍රමාණාත්මක වෙනස්කම්	අනුරූප වාර්තාකරණය ප්‍රමිති (ගෝලීය වාර්තාකරණ මූලපිරිම, කොළඹ කොවිස් හූවමාරුව - පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන මාර්ගෝපදේශය, වාණිජ බැංකු සඳහා තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලයේ නිර්දේශ)	එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය
	(2) ගනුදෙනුකාර අත්දැකීම්	ශ්‍රී ලංකාවේ දැඩි තරඟකාරී බැංකු ක්ෂේත්‍රයේ ප්‍රධාන අවකලනය ලෙස ගනුදෙනුකාර සේවය ඉස්මතු වී ඇත.	යොමු වන්න: ව්‍යාපාරික අංශ සමාලෝචනය පිටු අංක 65- 77. පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ගනුදෙනුකරුවන් පිටු අංක 78-88.	−		
	(3) ගනුදෙනුකාර රහස්‍යතාවය සහ දත්ත සුරක්ෂිතභාවය	ඩිජිටල්කරණය කෙරෙහි ඇති වැඩි තෙරපුම ගනුදෙනුකාර රහස්‍යතා සහ ආරක්ෂක ගැටලුවලට ඇති අවදානම ඉහළ නංවා ඇති අතර එමඟින් තොරතුරු තාක්ෂණ ආරක්ෂණ රාමු ශක්තිමත් කිරීමට සංවිධානවලට අවශ්‍ය වේ.	යොමු වන්න: ව්‍යාපාරික අංශ සමාලෝචනය 65-77. පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ගනුදෙනුකරුවන් පිටු අංක 78-88	−	GRI 418: ගනුදෙනුකාර රහස්‍යතාවය SASB FN-CB-230a.2: දත්ත සුරක්ෂිතභාවය	
	(4) වගකිවයුතු බැංකුකරණය	වගකීම් සහගත ණය දීමේ පිළිවෙත් මත බලපෑමෙන් යුත් සමාජ-ආර්ථික වෙනසක් ඇති කිරීමට ලංකා බැංකුවට ලැබේ.	යොමු වන්න: ව්‍යාපාරික අංශ සමාලෝචනය පිටු අංක 65-77. පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ගනුදෙනුකරුවන් පිටු අංක 78-88. පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ප්‍රජාව සහ පරිසරය පිටු අංක 103-113	−		
	(5) ඩිජිටල්කරණය සහ තාක්ෂණය	ඩිජිටල් විශිෂ්ටත්වය කරා ලඟාවීම බැංකුවේ ප්‍රධාන උපායමාර්ගික අපේක්ෂාවකි.	යොමු වන්න: ව්‍යාපාරික අංශ සමාලෝචනය පිටු අංක 65- 77. පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ගනුදෙනුකරුවන් පිටු අංක 78-88.	−		
සේවකයින්	(6) සේවකයින්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව	2022 මුල් භාගයේ එනම් වසංගතයේ අවසාන භාගයේදී සෞඛ්‍යය සහ ආරක්ෂාව සැලකිලිමත් විය යුතු අංශයක් විය. ඉහළ උද්ධමන පරිසරයක් තුළ සේවක යහපැවැත්ම සහතික කිරීම තවත් සැලකිලිමත් විය යුතු කරුණක් විය.	යොමු වන්න: පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: සේවකයින් පිටු අංක 89-99	−	GRI 403: වැඩ පරිසරය තුළ සෞඛ්‍යය සහ ආරක්ෂාව	
	(7) කුසලතා කළමනාකරණය සහ කම්කරු සබඳතා	ආයතනික උපක්‍රම මෙහෙයවීමේදී සේවකයන් අත්‍යවශ්‍ය වන අතර බැංකුවේ වටිනාම වත්කම්වලින් එකක් වන අතර සේවක සම්බන්ධ ගැටලු ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම අවධාරනය කරයි.	යොමු වන්න: පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: සේවකයින් පිටු අංක 89-99	↑	GRI 401: සේවා නියුක්තිය GRI 402: කම්කරු/කළමනාකරණ සබඳතා GRI 404: පුහුණුව සහ අධ්‍යාපනය GRI 407: ඇසුරුරු කිරීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීම	
	(8) විවිධත්වය හා සමාන අවස්ථා	සේවකයින්ට දියුණු විය හැකි විවිධාකාර සහ වටිනාකම් සහිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට ලංකා බැංකුව කැපවී සිටී.	යොමු වන්න: පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: සේවකයින් පිටු අංක 89- 99	−	GRI 405: විවිධත්වය හා සමාන අවස්ථා	
	(9) කම්කරු අයිතිවාසිකම් (බාහිරින් ලබාගත්/කොන්ත්‍රාත්තු)	සේවයේ නියැලී සිටින බැංකුවට බාහිරින් ලබා ගන්නා සහ කොන්ත්‍රාත් සියලුම සේවකයින් සඳහා ආරක්ෂිත සහ හිතකර සේවා පරිසරයක් සැපයීමට ලංකා බැංකුව කැපවී සිටී.	යොමු වන්න: පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: සේවකයින් පිටු අංක 89-99	−	GRI 408: ළමා ශ්‍රමය GRI 409: බලහත්කාරයෙන් හෝ අනිවාර්ය ශ්‍රමය	
ප්‍රජාව සහ පරිසරය	(10) සාර්ව ආර්ථික හා ප්‍රතිපත්තිමය ප්‍රවණතා	ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බලපාන බහුවිධ අභියෝග සහ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති වර්ධනයන් මූල්‍ය අංශයේ මෙහෙයුම්, කාර්යසාධනය සහ තිරසාරභාවය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි.	යොමු වන්න: මෙහෙයුම් සන්දර්භය පිටු අංක 43-46 PESTEL විශ්ලේෂණය පිටු අංක 47-48 පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ප්‍රජාව සහ පරිසරය පිටු අංක 103-113	−		
	(11) දේශගුණික විපර්යාස සහ පාරිසරික පියසටහන්	හරිත ණය දීම තුළින් තිරසාර භාවිතයන් ප්‍රවලිත කරමින් සිය මෙහෙයුම්වල පාරිසරික ක්‍රියාකාරකම් පියසටහන් අඩු කිරීමට ලංකා බැංකුව කැපවී සිටී.	යොමු වන්න: පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ප්‍රජාව සහ පරිසරය පිටු අංක 103-113	−	GRI 302: බලශක්තිය GRI 305: විමෝචනය SASB FN-CB-410a.2: ණය විශ්ලේෂණය සඳහා පාරිසරික සමාජ සහ යහපාලන සාධක ඇතුළත් කිරීම	

පාර්ශ්වකරුවන්	අදාළ ප්‍රමාණාත්මක මාතෘකාව	එය ලංකා බැංකුවට ප්‍රමාණාත්මක වන්නේ කෙසේද	වසර තුළ අදාළ ප්‍රමාණාත්මක මාතෘකාව සඳහා අපගේ ප්‍රතිචාරය	ප්‍රමාණාත්මක වෙනස්කම්	අනුරූප වාර්තාකරණය ප්‍රමිති (ගෝලීය වාර්තාකරණ මූලපිරිම, කොළඹ කොටස් හුවමාරුව - පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන මාර්ගෝපදේශය, වාණිජ බැංකු සඳහා තිරසාර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලයේ නිර්දේශ)	එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය
	(12) සන්නාමයේ කීර්තිය	ශ්‍රී ලංකාවේ අංක 1 බැංකු සන්නාමය ලෙස අඛණ්ඩව ශ්‍රේණිගත කර ඇති ලංකා බැංකුවේ සන්නාමය එහි ශක්තිමත් වෙළඳපළ තත්ත්වයට යටින් පවතින තරඟකාරී වාසියේ ප්‍රධාන මූලාශ්‍රයකි.	යොමු වන්න: ව්‍යාපාරික අංශ සමාලෝචනය පිටු අංක 65-77. පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ගනුදෙනුකරුවන් පිටු අංක 78-88	-		6
කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්	(13) මූල්‍ය කාර්යසාධනය	පාර්ශ්වකරුවන්ට වාණිජ තිරසාරභාවය සහ අඛණ්ඩ වටිනාකම් උත්පාදනය සහතික කිරීමේදී බැංකුව තීරණාත්මක ලෙස කටයුතු කරයි.	යොමු වන්න: මූල්‍ය සමාලෝචනය පිටු අංක 60-64 ව්‍යාපාරික අංශ සමාලෝචනය පිටු අංක 65- 77 පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන් පිටු අංක 100-102	-		12, 16, 17
නියාමකයින්	(14) සමාජ ආර්ථික දායකත්වය සහ මූල්‍ය ඇතුළත් කිරීම	රාජ්‍ය බැංකුවක් ලෙස, ලංකා බැංකුවේ කාර්යභාරය සම්ප්‍රදායික බැංකුකරණයෙන් ඔබ්බට ගොස් දිවයින පුරා මූල්‍ය ඇතුළත් කිරීම් සහ සමාජ-ආර්ථික සවිබල ගැන්වීම් සිදු කරයි.	යොමු වන්න: පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ප්‍රජාව සහ පරිසරය පිටු අංක 103-113	-	GRI 201: ආර්ථික කාර්යසාධනය GRI 202: වෙළඳපළ පැවැත්ම GRI 413: දේශීය ප්‍රජාවන් GRI 203: වක්‍ර ආර්ථික බලපෑම් SASB N-CB-240a.3: මූල්‍ය ඇතුළත් කිරීම් සහ හැකියා වර්ධනය SASB FN-CB-240a.4: මූල්‍ය ඇතුළත් කිරීම් සහ හැකියා වර්ධනය	1, 11, 16
	(15) නියාමන පරිසරය, පාලනය සහ අනුකූලතාවය	ශක්තිමත් අනුකූලතා සංස්කෘතියක් සහ ශක්තිමත් ආයතනික පාලන භාවිතයන් ලංකා බැංකුවේ වටිනාකම් උත්පාදනය කිරීමේ ක්‍රියාවලියට පාදක වේ.	යොමු වන්න: මෙහෙයුම් සන්දර්භය 43 - 46 මූල්‍ය සමාලෝචනය පිටු අංක 47-48 ආයතනික යහපාලනය වාර්තාව පිටු අංක 120-129 අවදානම් කළමනාකරණ වාර්තාව පිටු අංක 140-156 පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: නියාමකයින් පිටු අංක 117-118	-	GRI 207: බදු GRI 419: සමාජ ආර්ථික අනුකූලතාව GRI 307: පාරිසරික අනුකූලතාවය	
ව්‍යාපාරික හවුල්කරුවන්	(16) වගකිවයුතු ප්‍රසම්පාදනය	ලංකා බැංකුව විශාල සැපයුම්කරුවන් පිරිසක් සමඟ සම්බන්ධ වන අතර තිරසාර භාවිතයන් ප්‍රවලිත කිරීම තුළින් ප්‍රසම්පාදනයේදී වගකීම් සහගත පරිචයන් සහතික කරයි.	යොමු වන්න: පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ව්‍යාපාරික හවුල්කරුවන් පිටු අංක 114-116	-	GRI 204: ප්‍රසම්පාදන පිළිවෙත්	11, 16
	(17) අල්ලස් හා දූෂණ විරෝධී	රජය සතු ආයතනයක් ලෙස, හවුල් වටිනාකමක් වගකීමෙන් නිර්මාණය කිරීමේදී අල්ලස හා දූෂණ විරෝධී සංස්කෘතියක් පෝෂණය කිරීම ඉතා වැදගත් වේ.	යොමු වන්න: පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ: ව්‍යාපාරික හවුල්කරුවන් පිටු අංක 114-116 ආයතනික යහපාලනය වාර්තාව පිටු අංක 120-129 තිරසාර බවට අනුගතවීම පිටු අංක 55-59	-	GRI 205: දූෂණ විරෝධී GRI 406: වෙනස්කම් නොකිරීම SASB FN-CB-510a.2: ව්‍යාපාරික ආචාරධර්ම	

4 අපගේ උපායමාර්ගය

පරිවර්තන උපායමාර්ගය



බැංකුව සිය ආයතනික උපායමාර්ගය තීරණය කිරීම සඳහා පුළුල් ප්‍රවේශයක් භාවිතා කරයි, එහි ප්‍රතිඵලයක් ලෙස තෙවසරක ආයතනික සැලැස්මක් සංවර්ධනය කෙරේ. මෙහෙයුම් භූ දර්ශනයේ වෙනස් වන ගතිකතාවයන් සමඟ සමීපව සිටීමට, සැලැස්ම වාර්ෂික සමාලෝචනයට සහ ශෝධනය කිරීමකට ලක් කරයි.

ලංකා බැංකුවේ උපායමාර්ගයේ අරමුණ වන්නේ එහි ප්‍රමුඛ වෙළඳපළ තත්ත්වය ඇතුළුව එහි මූලික ශක්තීන් ප්‍රයෝජනයට ගනිමින්, විකාශනය වන මෙහෙයුම් පරිසරයකට ප්‍රතිචාර දැක්වීමට සහ අනුවර්තනය වීමට හැකි තරඟකාරී අනාගතයට සූදානම් සංවිධානයක් බවට පත්වීමටය. මෙම පරිවර්තනීය උපායමාර්ගය 2018 වසරේ දී ආරම්භ කරන ලද අතර බැංකුවේ උපායමාර්ගික චක්‍රයේ කොටසක් ලෙස වාර්ෂික සමාලෝචනයට සහ සංශෝධනයට භාජනය වේ.

අපගේ වර්තමාන තත්ත්වය

ශක්තීන්

- වත්කම්, තැන්පතු, ණය, ආමුක ප්‍රේෂණ සහ ගනුදෙනුකාර විනිවිද යාමේ වෙළඳපළ ප්‍රමුඛයා
- අසමසම ශාඛා ජාලය
- රටේ ප්‍රමුඛතම බැංකු සන්නාමය
- මහජනතාව අතර විශ්වාසය හා පැහැදීම
- පුළුල් ආවරණයක් සහිත විදේශීය නියෝජිත බැංකු සමඟ ඇති සබඳතා
- පුළුල් පාර්ශ්වකරුවන්ගේ හවුල්කාරිත්වය

දුර්වලතා

- සහස්‍ර සහ තරුණ කණ්ඩායම් සඳහා සීමිත අවධානය
- මෙහෙයුම්වල විශාලත්වය හේතුවෙන් තාක්ෂණය සහ නවෝත්පාදනය ඉදිරියට ගෙන යාමේ අභියෝග
- උරුම පද්ධති සහ ඒකාබද්ධතාවයේ අභියෝග
- පුළුල් ජාලයක් හේතුවෙන් සියලුම ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන හරහා සේවා ගුණාත්මක භාවය සහ ගනුදෙනුකාර අත්දැකීම්වල අනුකූලතාව පවත්වා ගැනීමේ අභියෝග
- අදියර 3 ණය ඉහළයාම නිරාවරණය වීමේ අවදානම

අවස්ථාවන්

- ගනුදෙනුකරුවන් විසින් ඩිජිටල් මාධ්‍ය සඳහා හුරු වීමේ වැඩි පෙළඹීමක් දැක්වීම
- අපනයන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශ වෙත රජයේ ඇති අනුග්‍රහය
- රට තුළ ඩිජිටල් සාක්ෂරතාව ඉහළ යාම
- හරිත මූල්‍ය ක්‍රම අනුගමනය කිරීමේ අවස්ථා
- ජනගහනයේ ජීවන රටාව වෙනස් වීම
- පශ්චාත් වසංගත පරිසරය සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා සමඟ අපේක්ෂිත ආර්ථික ප්‍රබෝධය
- රජය සතු ව්‍යවසාය අංශය ප්‍රතිසංස්කරණය කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම.

තර්ජන

- දුර්වල වූ සාර්ව ආර්ථික පරිසරය සහ බලපෑමට ලක් වූ බාහිර අංශය
- ශ්‍රී ලංකාවේ ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම පහත හෙලීම
- නව, වඩාත් කඩිසර බැංකු වලින් ඇති තරඟය වැඩි වීම
- ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම්වල නවීනත්වය වැඩි වීම
- දේශගුණික විපර්යාසවල ඇඟවුම් තීව්‍ර කිරීම
- සයිබර් ආරක්ෂණ අවදානම්
- විදේශීය දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බලපෑම

අප ළඟා විය යුතු ස්ථානය

ගනුදෙනුකාර සේවාවේ විශිෂ්ටත්වය

සියලුම භෞතික සේවා මධ්‍යස්ථාන සහ අතථ්‍ය වේදිකා හරහා ස්ථාවර සහ උසස් ගනුදෙනුකාර අත්දැකීමක් සහතික කිරීම.

වෙළඳපළ නායකත්වය රඳවා තබා ගැනීම

බැංකුවේ සන්නාම ශක්තිය සහ අසමසම ගනුදෙනුකාර විනිවිද යාම, අදාළ නිෂ්පාදන සහ උසස් ගනුදෙනුකාර අත්දැකීම් ලබා දීම තුලින් වෙළඳපළ නායකත්වය පවත්වා ගැනීම.

ඩිජිටල් අනුගත වීම සඳහා නායකත්වය ගැනීම

අති නවීන තාක්ෂණය භාවිතා කිරීමෙන් අභ්‍යන්තර සහ බාහිර ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් නව මානයකට පරිවර්තනය කිරීම.

තිරසාර බැංකුකරණයේ විශිෂ්ටත්වය

ක්‍රියාශීලී සහ අර්ථවත් විසඳුම් යෙදවීමෙන් ආර්ථික, සමාජීය සහ පාරිසරික ක්ෂේත්‍රවල පවතින අභියෝග ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීම.

අප ඒ සඳහා ළඟා වීමට සැලසුම් කරන ආකාරය සහ සාර්ථකත්වය මනින ආකාරය

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

- ශුද්ධ ප්‍රවර්ධක ලකුණු
- ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය මනින ලකුණු
- ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම
- ගනුදෙනුකාර විනිවිද යාම
- ගනුදෙනුකාර සබඳතා මධ්‍යස්ථාන
- සන්නාම ශක්තිය

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- ඩිජිටල් ගනුදෙනුවල වර්ධනය
- අතථ්‍ය වේදිකාවලට සම්බන්ධ වූ ගනුදෙනුකරුවන් ගණන
- ඩිජිටල් ලෙස සක්‍රීය ගනුදෙනුකරුවන්
- අතථ්‍ය ලෙස සක්‍රීය ගනුදෙනුකරුවන්

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

- ණය කළඹේ වර්ධනයක් පෙන්වීම
- අදියර 3 ණය අනුපාතය අඩු කිරීම
- පහසුකම් නැවත කාලසටහන්ගත කර/ප්‍රතිව්‍යුහගත කිරීම
- ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

- සේවකයන් රැකියාවේ රඳවා ගැනීමේ අනුපාතය
- සේවකයෙකු සඳහා පුහුණු වේලාවන්
- සේවකයෙකු සඳහා ශුද්ධ ලාභය
- සේවකයෙකු සඳහා එකතු කළ අගය
- කාන්තා නියෝජනය

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- ආර්ථික වටිනාකමක් ඇති කිරීම
- ප්‍රජා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම
- කාබන් පියසටහන
- පුනර්ජනනීය බලශක්ති උත්පාදනය කිරීම

සම්පත් වෙන් කිරීම සහ ප්‍රාග්ධන අතර අන්තර් සම්බන්ධතා

4

පහත දැක්වෙන්නේ බැංකුවේ පරිවර්තන උපාය මාර්ගයට එරෙහිව ලබා ඇති ප්‍රගතිය පිළිබඳ සාරාංශයකි. වර්ෂය තුළ සම්පත් වෙන්කළ ආකාරය, 2022 වර්ෂයේදී බැංකුව වටිනාකම් නිර්මාණය කළ ආකාරය කෙරෙහි බලපෑ ප්‍රාග්ධන අතර අන්තර් සම්බන්ධතා සහ කාර්යසාධනය විස්තර කරයි.

	ගනුදෙනුකාර කේන්ද්‍රීය බව	ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය	ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය	කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම	ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය
මූල්‍ය ප්‍රාග්ධනය	රු. බිලියන 67.9 ක ණය ප්‍රමාණයක් ආවරණය වන පරිදි "පුද්ගලික සහ විශ්‍රාමිකයින්ගේ ණය යෝජනා ක්‍රම" සඳහා පොළී අනුපාත තාර්කිකකරණය දේපළ, පිරියත සහ උපකරණ සඳහා රු. බිලියන 2.2 ක ආයෝජනයක්	ඩිජිටල් යටිතල පහසුකම් සඳහා රු. බිලියන 1.8 ක ආයෝජනයක්	රු. බිලියන 74.4 ක ණය සහන කාලයක් රු. බිලියන 259.2 ක හානිකරණ ප්‍රතිපාදන සංචිතය	සේවක ප්‍රතිලාභ සඳහා රු. බිලියන 27.5 ක ආයෝජනයක් පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 73.9 ක ආයෝජනයක් අර්බුද වලදී කාර්ය මණ්ඩල ආරක්ෂාව සහ බැංකුව සඳහා ප්‍රවේශය පහසු කිරීම සඳහා රු. මිලියන 28.9 ක ආයෝජනයක්	ප්‍රජා සංවර්ධනය සඳහා රු. මිලියන 60.1 ක ආයෝජනයක් අත්‍යාවශ්‍ය ආනයන (ඉන්ධන සහ ගෑස්) මූල්‍යකරණයට ඇ. ඩො. බිලියන 1.9 ක් වෙන් කිරීමක් බැංකුව විසින් අරමුදල් සපයන හරිත තාක්ෂණයන් සඳහා රු. මිලියන 711.6 ක නව පහසුකම් 2022 අවසන් වන විට කොවිඩ්-19 බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන්ට සහනදායී මිලකට ඇ. ඩො. මිලියන 90 ක ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ ණය පහසුකම සම්පූර්ණයෙන්ම ලබා දී ඇත.
නිෂ්පාදිත ප්‍රාග්ධනය	ශාඛා 19 ක් වෙනත් ස්ථානයකට ගෙන යන ලදී. නව ශාඛාවක් සහ සීමිත සේවා ශාඛා තුනක් විවෘත කරන ලදී. ශාඛා 61 ක් සහ ශාඛා වලින් පිටත සේවා කලාප වැඩි දියුණු කරන ලදී.	මුදල් චක්‍රීකරණ යන්ත්‍ර 75 ක් ස්ථාපනය කරන ලදී.			2022 අවසන් වන විට සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා 51 ක් ඇත.
මානව ප්‍රාග්ධනය	ගනුදෙනුකාර සේවා සම්බන්ධයෙන් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් 288 ක්	තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් සේවා සඳහා නව බඳවා ගැනීම් වලින් 66% ක්	පළාත් මට්ටමින් නව ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකක අටක් ස්ථාපිත කර ඇත. ණය දීම සම්බන්ධ පුහුණු වැඩසටහන් 163 ක් පවත්වන ලදී.	කුසලතා පාදක උසස්වීම් 588 ක් ප්‍රදානය කරන ලදී ලංකා බැංකුවේ ස්පිරිට් සම්මාන යටතේ ශාඛා 46 ක් සම්මානයට පාත්‍ර කරන ලදී. නව බඳවාගැනීම් 57 ක්	නිලධාරීන් 259 ක් පාරිසරික හා සමාජීය පරීක්ෂාව සඳහා පුහුණු කරන ලදී.
සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය	ගනුදෙනුකරුවන් සඳහා වැඩමුළු 244 ක් පවත්වන ලදී. අධ්‍යාපනය සහ දැනුවත් කිරීම තුළින් ගනුදෙනුකරුවන් 1,019 කට ප්‍රතිලාභ ලබා දී ඇත. නව බඳවාගැනීම් 57 ක්	නව PoS යන්ත්‍ර 2,706 ක් නව IPG වෙළඳසැල් 24 ක්	ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකය විසින් රු. බිලියන 20.3ක ගනුදෙනුකාර මුදල් ප්‍රවාහයන් කළමනාකරණය කරන ලදී.	කාර්යසාධන අභියෝග තත්‍යාග යෝජනා ක්‍රමය මත ශාඛා 168 කට දිරි දීමනා	

සම්පත් වෙන් කිරීම සහ ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන්

	 ගනුදෙනුකාර කේන්ද්‍රීය බව	 ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය	 ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය	 කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම	 ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය
ප්‍රාග්ධන අතර අන්තර් සමතුලිතයන්	**බැංකුව සිදු කළේ කුමක්ද?** සහන සහ ප්‍රතිපාදන සක්‍රීය කර ඇත. **බැංකුව එය සිදු කළේ කෙසේද?** මූල්‍ය ප්‍රාග්ධනය වෙන් කිරීමෙන්, බැංකුවේ ක්‍රියාකාරිත්වයට වියදමක්. මෙම තීරණ ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීමට, ගනුදෙනුකාර තෘප්තිය, පක්ෂපාතිත්වය සහ සන්නාම ශක්තියට දායක විය. **ප්‍රතිඵලය** බැංකුවේ සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනයට සහ බුද්ධිමය ප්‍රාග්ධනයට ලාභයක් සහ බැංකුවේ භෞතික සේවා ස්ථාන වල ව්‍යාප්තිය රට පුරා තීව්‍ර කරයි. (-) මූල්‍ය ප්‍රාග්ධනය (+) නිෂ්පාදන ප්‍රාග්ධනය (+) සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය (+) බුද්ධිමය ප්‍රාග්ධනය	**බැංකුව සිදු කළේ කුමක්ද?** ඩිජිටල් යටිතල පහසුකම් (සයිබර් ආරක්ෂණ යටිතල පහසුකම් ඇතුළුව) සහ ඩිජිටල් නිෂ්පාදන සහ සේවා සඳහා බැංකුවේ අබණ්ඩ ආයෝජනය සිදු විය. **බැංකුව එය සිදු කළේ කෙසේද?** මූල්‍ය ප්‍රාග්ධනය වෙන් කිරීමෙනි. මෙම ආයෝජන බැංකුවේ ව්‍යාපාර ආකෘතියේ අනාගතය තහවුරු කිරීමට, ගනුදෙනුකාර අත්දැකීම් සහ ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීමට සහාය වීම, සැලකිය යුතු ක්‍රියාවලි කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් විවෘත කිරීම සහ පිරිවැය ඉතිරිකිරීම් සහ ආදායම් මාර්ග වැඩි කිරීම සඳහා දායක වේ. **ප්‍රතිඵලය** බැංකුවේ සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය සහ මූල්‍ය ප්‍රාග්ධනය සඳහා මධ්‍ය කාලීන සිට දිගු කාලීන දක්වා ලාභයක්. (-/+) මූල්‍ය ප්‍රාග්ධනය (+) සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය (+) බුද්ධිමය ප්‍රාග්ධනය	**බැංකුව සිදු කළේ කුමක්ද?** බැංකුව සිය ගනුදෙනුකාර කේන්ද්‍රීය උපායමාර්ගයේ කොටසක් ලෙස ව්‍යාපාරයේ පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපනය සඳහා ප්‍රමුඛත්වය දුන්නේය. ඉහළ යන පොළී අනුපාතවලට එරෙහිව අවශ්‍ය සහන ලබාදීමට ඉඩකඩ සලසා ඇත. **බැංකුව එය සිදු කළේ කෙසේද?** මූල්‍ය ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය වෙන් කිරීම මගින්. දිගු කාලීනව, ගනුදෙනුකරුවන්ට ලබා දෙන සහාය සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම අනාගත ව්‍යාපාර සඳහා ණය ලැබිය හැකි ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට දායක වේ, කාර්ය මණ්ඩලයේ ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ණය ගැන දැනුවත් සංස්කෘතියක් ඇති කිරීම. **ප්‍රතිඵලය** කෙටි කාලීන හා මධ්‍ය කාලීන වශයෙන් බුද්ධිමය හා මානව ප්‍රාග්ධනයට ලැබෙන ප්‍රතිලාභ සහ දිගු කාලීනව මූල්‍ය ප්‍රාග්ධනයට විභව ලාභ ලැබේ. (-/+) මූල්‍ය ප්‍රාග්ධනය (+) මානව ප්‍රාග්ධනය (+) බුද්ධිමය ප්‍රාග්ධනය	**බැංකුව සිදු කළේ කුමක්ද?** බැංකුව සිය ශ්‍රම බලකායේ ආයෝජනය කිරීමට කැපවී සිටින අතර, විශිෂ්ටත්වයේ සහ කාර්යසාධනය පදනම් කරගත් වෘත්තීය සංවර්ධනයේ ආචාරධර්ම තහවුරු කරයි. බාධා කිරීම් හරහා සහ අධිඋද්ධමනකාරී පරිසරයක් තුළ කාර්ය මණ්ඩලයට සහාය වීම අවශ්‍ය වේ. **බැංකුව එය සිදු කළේ කෙසේද?** උද්ධමන සම්බන්ධිත දර්ශකයට අනුව වැටුප් ගැලපීම මගින් මූල්‍ය ප්‍රාග්ධනය වෙන් කිරීම. මෙම ආයෝජන කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වාසි රාශියකට හේතු වේ. **ප්‍රතිඵලය** දක්ෂතා ආකර්ෂණය කර ගැනීමේ සහ රඳවා ගැනීමේ තරඟකාරිත්වය, හොඳින් සන්නද්ධ ශ්‍රම බලකායක්, වැඩි දියුණු කළ සේවක නියැලීම සහ පක්ෂපාතිත්වය, වැඩි ගනුදෙනුකාර සේවාවක්/ පළපුරුද්ද, සහ වැඩි ඵලදායිතාවයක් සහ කාර්යක්ෂමතාවයක් ඇති කරයි. (-/+) මූල්‍ය ප්‍රාග්ධනය (+) මානව ප්‍රාග්ධනය (+) බුද්ධිමය ප්‍රාග්ධනය	**බැංකුව සිදු කළේ කුමක්ද?** හරිත මූල්‍යකරණය, පාරිසරික සහ සමාජීය අවදානම් පිරික්සීම, මූල්‍ය ඇතුළත් කිරීම්, සංවර්ධන ණය දීම සහ බැංකුවේ පාරිසරික පියසටහන් අඩු කිරීම හරහා බැංකුව තිරසාරභාවය ප්‍රධාන ධාරාවට ගෙන යන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍ය මාර්ග සිතියම සමඟ පෙළ ගැසෙයි. **බැංකුව එය සිදු කළේ කෙසේද?** මේවාට මූල්‍ය ප්‍රාග්ධනය, නිෂ්පාදිත ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය වෙන් කිරීම අවශ්‍ය වේ. **ප්‍රතිඵලය** මෙම ආයෝජනයට සහභාගී වන මූල්‍ය ආයතනයක් ලෙස ක්‍රියා කිරීමට වැඩි අවස්ථාවක් විවෘත කරයි; වැඩිදියුණු කළ සන්නාම පැවැත්ම සහ සාධාරණත්වය; වඩා හොඳ සන්නද්ධ ශ්‍රම බලකායක්; ව්‍යාපාරික හවුල්කරුවන්, නියාමකයින් සහ ප්‍රජාවන් සමඟ සබඳතා වැඩිදියුණු කිරීම; සහ අඩු කරන ලද පාරිසරික බලපෑම සමඟ පරිසරය වැඩිදියුණු කිරීම. (-/+) මූල්‍ය ප්‍රාග්ධනය (+) නිෂ්පාදන ප්‍රාග්ධනය (+) මානව ප්‍රාග්ධනය (+) බුද්ධිමය ප්‍රාග්ධනය (+) සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය (+) ස්වභාවික ප්‍රාග්ධනය
අපගේ උපායමාර්ගයට හා සැසඳූ විට ප්‍රගතිය	ශුද්ධ ප්‍රවර්ධක ලකුණු: 35%* ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය මනින ලකුණු: 78%* අත්පත් කරගත් නව ගනුදෙනුකරුවන් (4%) (652,961) ඉලක්ක වෙළඳපළ අනුපාතය 67% ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන (61)	ඩිජිටල් ගනුදෙනු පරිමාවේ වර්ධනය 24% (2021 - 43%) ගනුදෙනුකරුවන්ගේ අතථ්‍ය වේදිකා සඳහා ප්‍රවේශය (2021 - 610,083) ඩිජිටල් සක්‍රීය ගනුදෙනුකරුවන් 30% (2021 - 31%) අතථ්‍යව සක්‍රීය ගනුදෙනුකරුවන් % (2021 - 11%)	ණය පොතේ වර්ධනය 0.3% (2021 - 22%) අදියර 3 ණය අනුපාතය 5.3% (2021 - 5.1%) පුනර්ජීවනය වූ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව 40 (2021 - 16) 1,019 (2021 - 58) පවත්වන ලද ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්	රඳවා ගැනීමේ අනුපාතය (98%) සේවකයෙකු සඳහා සාමාන්‍ය මිනිස් පැය 16 ක පුහුණුව (2021 - මිනිස් පැය 21.2) සේවකයකු සඳහා ශුද්ධ ලාභය රු. මිලියන 3.8 කි එක් සේවකයෙකු සඳහා එකතු කළ අගය රු. මිලියන 3.5 කි 59% කාන්තා නියෝජනය (2021 - 60%%)	ආර්ථික විවිනාකම නිර්මාණය රු. බිලියන 173.3 කි ප්‍රජා සංවර්ධනය සඳහා ආයෝජනය රු. මිලියන 60 කි කාබන් පියසටහන $tCO_2eqv.$ 27,332.6 පුනර්ජනනීය බලශක්තිය මෙගා වොට් පැය 3,246.3 ක් ජනනය විය නැණෝජය ප්‍රතිලාභීන්ට ශිෂ්‍යත්ව 233 ක් රන් කැකුළු ගිණුම් හිමියන් සඳහා 2,111 ක් හපනා 5 වසර ශිෂ්‍යත්ව

තිරසාර ඔවට අනුගත වීම

වගකිවයුතු ආයතනික පුරවැසියෙක් ලෙස, තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDGs) මත බැංකුවෙහි බලපෑම පෙළගැස්වීමට සහ ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා පරිපූර්ණ ක්‍රියාමාර්ග ගැනීමට ලංකා බැංකුව කැපවී සිටී.

මේ සම්බන්ධයෙන් බැංකුවේ කාර්යසාධනය මෙම වාර්තාවේ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභහි 78 සිට 119 පිටු දක්වා විස්තරාත්මකව ප්‍රකාශ කර ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා වන දායකත්වය ඉස්මතු කිරීම සඳහා පැහැදිලි සංඥා පුවරු සහ යොමු කිරීම් මෙම කොටසට ඇතුළත් වේ.

තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුව කාර්යසාධනය තක්සේරු කිරීමේදී, බැංකුව විසින් එක් එක් ඉලක්කයේ පුළුල් මූලධර්මය සඳහා වන දායකත්වය ඇගයීමට ලක් කරන අතර තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ අන්තර් නියෝජිතායතන විශේෂඥ කණ්ඩායමක් විසින් 2017 ජූලි 6 දින (A/RES/71/313) එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සංවර්ධනය කර සම්මත කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ගෝලීයව පිළිගත් දර්ශක රාමුව හරහා කාර්යසාධනය මැනීමට උත්සාහ කරයි.

වසර තුළ BOC මිතුරු ක්ෂුද්‍ර මූල්‍ය කණ්ඩායම් වෙත

රු. මිලියන 59.4 ක්

ලබා දීම

වසර තුළ BOC මිතුරු කණ්ඩායම් **130 ක්** පිහිටුවන ලදී

රු. බිලියන 4.3 ක්

කාන්තා මූලික/කාන්තාවන් සතු ව්‍යාපාර සඳහා ලබා දී ඇත

කාන්තා මූලික/කාන්තාවන් සතු ව්‍යාපාර සඳහා ණය දීම් **8%** (මුළු ණය දීමෙන් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ලබා දුන් ප්‍රමාණය)

තිරසාර සංවර්ධන ඉලක්ක 1 - දරිද්‍රතාවයෙන් තොර වීම

ඉලක්කය 1.4

අවදානමට ලක්විය හැකි සහ අඩු පහසුකම් සහිත ප්‍රජාවන් මූල්‍ය ඇතුළත් කිරීම සඳහා බැංකුව දරන උත්සාහයන් ඉලක්ක 1.4 සහ දර්ශක 1.4.1 වෙත සෘජුවම දායක වේ. - පිරිමින්, කාන්තාවන්, අඩු ආදායම් ලාභීන්ට සහ අවදානමට ලක්වූවන්ට ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළු මූල්‍ය සේවා සඳහා සමාන අයිතිවාසිකම් ඇති බව සහතික කිරීම.

ලංකා බැංකු ශාඛා ජාලය ජංගම සහ ව්‍යාප්ති සේවා සමඟින්, මිලියන සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන් සඳහා මූල්‍ය සේවා සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම. මීට අමතරව, ක්ෂුද්‍ර මූල්‍යකරණ මූලපිරීම් සහ ඉලක්කගත සංවර්ධන ණය දීම මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කරන අතර ආර්ථික සංවර්ධනයට සහ දරිද්‍රතාවය පිටුදැකීමට දායක වේ.

තිරසාර සංවර්ධන ඉලක්ක 2 - කුසගින්න තුරන් කිරීම

ඉලක්කය 2.3 | ඉලක්කය 2.අ

විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් කෙරෙහි අවධානය යොමු කරන සංවර්ධන ණය දීම සහ උපදේශන සේවා හරහා කෘෂිකාර්මික අංශයට බැංකුවේ මූල්‍ය සහ සහයෝගය පුළුල් කිරීම, දැරිය හැකි ප්‍රාග්ධනයට ප්‍රවේශය ඇති කිරීම සහ කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කළ හැකි දැනුම ඉහළ නැංවීම මගින් තිරසාර සංවර්ධන ඉලක්කය 2 සහ ඉලක්කය 2.3 සඳහා සෘජුවම දායක වේ. සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ ආදායම්, සහ වෙළඳපළ වෙත වැඩි ප්‍රවේශයක් සහ අගය එකතු කිරීම සඳහා අවස්ථා නිර්මාණය කිරීම. සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙස ඉලක්ක 2.අ සඳහා බැංකුවේ කාර්යභාරය විශේෂයෙන් වැඩි දියුණු කළ ජාත්‍යන්තර සහයෝගීතාවය හරහා ග්‍රාමීය යටිතල පහසුකම් සහ කෘෂිකාර්මික අංශය සඳහා ආයෝජන වැඩි කිරීම සඳහා තවදුරටත් දායක වේ.

2022 දී, කෘෂිකාර්මික අංශයට (පශු සම්පත්, කිරි නිෂ්පාදන, ජලජීවී වගාව, ධීවර, ආහාර සැකසුම් සහ ඇතුළුව තවත් දේ) සංවර්ධන ණය වශයෙන් බැංකුව විසින් රු. බිලියන 12.5 කට වැඩි මුදලක් ලබා දී ඇත. වසර අවසානයේ දී රු. බිලියන 9.1 ක ණය පහසුකම් වී අලෙවි මණ්ඩලයට (PMB) බැංකුව විසින් අරමුදල් සපයන ලදී. වී අලෙවි මණ්ඩලය යනු ආහාර සුරක්ෂිතතාව, කුඩා වතු හිමියන්ගේ කෘෂිකර්මාන්තය සහ මිලියන සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන්ගේ ජීවනෝපාය සඳහා ආධාර කරන රටේ ප්‍රමුඛ ආයතනයකි.

මීට අමතරව, බැංකුව සිය ශාඛා ජාලය හරහා ආයතනික හා ගෘහ මට්ටමින් ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීමට පියවර ගත්තේය. ශාඛා 328 ක් සහ පුද්ගලයින් 148 ක් 2022 දී "සශ්‍රීක ගෙවත්ත" ගෙවතු වගා වැඩසටහනේ නිරත විය.

තිරසාර සංවර්ධන ඉලක්ක 3 - නිරෝගී බව සහ යහපැවැත්ම

ඉලක්කය 3.8 | ඉලක්කය 3.ඇ

සෞඛ්‍ය සේවා අංශයට බැංකු පහසුකම් ලබා දීම වැඩි කිරීම හා දේශීය හා ජාතික සෞඛ්‍ය සේවා ආයතන සඳහා ආධාර සහය සමඟින් සෞඛ්‍ය සේවා අංශයේ මූල්‍යකරණයට දායක වීමෙන් SDG 3 සහ ඉලක්කය 3.ඇ වෙත සෘජුවම දායක වේ. තවද, රටේ විදේශ විනිමය අර්බුදය තුළ අත්‍යවශ්‍ය ඖෂධ ආනයනය සඳහා බැංකුවේ සහාය, ආරක්ෂිත, ඵලදායී, ගුණාත්මක, දැරිය හැකි සහ අත්‍යවශ්‍ය ඖෂධ සහ එන්නත් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම මගින් ඉලක්කය 3.8 සඳහා දායක විය.

2022 දී, රට තුළ පැවති විදේශ මුදල් ද්‍රවශීලතා අර්බුදය නොතකා, අත්‍යවශ්‍ය ඖෂධ රාජ්‍ය ආනයනකරුවන් සඳහා බැංකුව විසින් ඇ.ඩො. මිලියන 65.1 ක පහසුකම් ලබා දෙන ලදී.

සෞඛ්‍ය, සමාජ සහ සහාය සේවා සඳහා

රු. මිලියන 430.0 ක

ශාඛා ණය ලබා දී ඇත.

තිරසාර බවට අනුගත වීම

තිරසාර සංවර්ධන ඉලක්ක 4 - ගුණාත්මක අධ්‍යාපනය

ඉලක්කය 4.1 | ඉලක්කය 4.4 | ඉලක්කය 4.අ

අධ්‍යාපනයට සහාය වීම බැංකුවේ තිරසාර න්‍යාය පත්‍රයේ ප්‍රධාන අංගයකි. තරුණයින් බැංකු ක්ෂේත්‍රයට ඇතුළු වීමට බැංකුව සහාය වන අතර ඔවුන්ට අඛණ්ඩ හා විස්තීර්ණ පුහුණුවක් සහ සංවර්ධනයක් ලබා දෙන අතර එය ඉලක්ක 4.4 සඳහා සෘජුවම දායක වේ - මූල්‍ය අංශයේ රැකියා සඳහා කුසලතා ඇති තරුණයින් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා 2022 දී බැංකුව විසින් විශ්වවිද්‍යාල සිසුන් 521 දෙනෙකු සහ විගණන අභ්‍යාසලාභීන් 85 දෙනෙකු සඳහා පුහුණුව ලබා දුන් අතර, ඊට අමතරව පාසල් අධ්‍යාපනය අවසන් කළ තරුණ පිරිස් 1,559 දෙනෙකු පුහුණු කරන ලදී.

ලංකා බැංකුවෙහි අධ්‍යාපනික ශිෂ්‍යත්ව සහ අධ්‍යාපන වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා සහය ලබා දීම, ඉලක්කය 4.1 වෙත සෘජුවම දායක වේ - සිසුන්ට පාසලේ රැඳී සිටීමට අවස්ථාව ලබා දීම සහ රාජ්‍ය අධ්‍යාපනයට මූල්‍ය ආධාර සහ/හෝ වඩා හොඳ ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගත හැකි නව්‍ය ඉගෙනුම් අවස්ථා සම්පූර්ණ කිරීම. වර්ෂය තුළදී, බැංකුව නැණ-ජය වැඩසටහන හරහා රු. මිලියන 30 ක ශිෂ්‍යත්ව ලබා දුන්නේය. නැණ මිහිර වැඩසටහන හරහා සිසුන් 21,000 ක් වෙත ළඟා වූ ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ 19 ක් පවත්වා ඇත. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය (රූපවාහිනී, ගුවන්විදුලිය සහ මුද්‍රිත මාධ්‍ය) හරහා අධ්‍යාපනික වැඩසටහන් විකාශනය කරන ලදී; බැංකුවේ tvBOC කණ්ඩායම හරහා විශේෂිත අධ්‍යාපන වැඩසටහන් සංවර්ධනය කරන ලදී; උසස් පෙළ (උ/පෙළ) සිසුන් සඳහා සංවිධානය කරන ලද ඉලක්ක ගත අතථ්‍ය සම්මන්ත්‍රණ; පාසල් ළමුන් සඳහා කෞතුකාගාර සහ වෙනත් ස්ථානවලට අනුග්‍රහය දක්වන ක්ෂේත්‍ර චාරිකා; සහ මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ හැඳින්වීමක් ලෙස ක්‍රියා කරන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මීට අමතරව, ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයට සහාය වන බැංකුවේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන BOC ගම්මාන හරහා ප්‍රජා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම, සිසුන් සඳහා වඩාත් ආරක්ෂිත, වඩාත් ඇතුළත්, ඵලදායී ඉගෙනුම් පරිසරයන් සැපයීම සඳහා අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීමට සහාය වීම මගින් ඉලක්ක 4.අ වෙත සෘජුවම දායක වේ.

e-Learning, tvBOC සහ Ms Teams හරහා පවත්වනු ලබන කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්

49 ක්

වර්ෂය තුළ පවත්වන ලද මුළු පුහුණු වැඩසටහන්

663 කි.

GRI 405-1

431

වසර තුළ මාතෘ නිවාඩු ලබා ගත් කාන්තා සේවක මහත්මීන්

වසර තුළ කාන්තා සේවකයන් සඳහා උසස්වීම්

324 ක්

තිරසාර සංවර්ධන ඉලක්ක 5 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

ඉලක්කය 5.5 | ඉලක්කය 5.අ

බැංකුව තුළ සහ පුළුල් සමාජය තුළ කාන්තාවන් සඳහා අවස්ථා නිර්මාණය කරමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වැඩිදියුණු කිරීමට බැංකුව කැපවී සිටී. අභ්‍යන්තරව, බැංකුවේ කාන්තා නියෝජනය වැඩි දියුණු කිරීම හරහා ඉලක්කය 5.5 සඳහා දායක වේ. 2022 දී, අලුතින් බඳවා ගත් අයගෙන් 62% ක් කාන්තාවන් වූ අතර බැංකුවේ මුළු ශ්‍රම බලකායෙන් 51% ක් කාන්තාවන් වේ. "සේවා වනිතා ඒකකය" මගින් කාන්තා කාර්ය මණ්ඩලය කේන්ද්‍ර කර ගනිමින් බැංකුව කටයුතු සිදු කරයි.

මීට අමතරව, කාන්තාවන් සහ කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාර සවිබල ගැන්වීම කෙරෙහි අවධානය යොමු කිරීම, ආර්ථික සම්පත් සහ මූල්‍ය සේවා සඳහා කාන්තාවන්ගේ ප්‍රවේශය වැඩිදියුණු කිරීම මගින් ඉලක්ක 5.අ වෙත දායක වීම බැංකුවේ ණය දීමේ ප්‍රයත්නවල කොටසකි. 2022 වසර තුළදී බැංකුව විසින් කාන්තා ව්‍යවසායකයින් සහ කාන්තාවන් සතු හෝ කාන්තා මූලික ව්‍යාපාර සඳහා ක්ෂුද්‍ර මූල්‍යකරණය හරහා රු. බිලියන 1.7 ක් ලබා දෙන ලදී. තවද විවිධ අංශ හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාර සඳහා සංවර්ධන ණය වශයෙන් රු. බිලියන 2.6 ක් ලබා දෙන ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක 6 - පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

ඉලක්කය 6.1 | ඉලක්කය 6.2 | ඉලක්කය 6.6

ජල සම්පාදන හා වාරිමාර්ග අංශයේ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලංකා බැංකුවෙහි අරමුදල් ලබා දීම, රාජ්‍ය ජල සම්පාදන හා සනීපාරක්ෂක ආයතනවලට ණය දීම සමඟින්, ආරක්ෂිත සහ පහසුවෙන් ලබා ගත හැකි පානීය ජලය සඳහා විශ්වීය හා සාධාරණ ප්‍රවේශය සාක්ෂාත් කර ගැනීමට සහාය වීමෙන් ඉලක්කය 6.1 වෙත සෘජුවම දායක වේ. 2022 දී රාජ්‍ය ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශයට ලබා දුන් ණය මුදල රු. මිලියන 362.5 කි.

BOC ගම්මාන හරහා ආදර්ශ ගම්මාන සංවර්ධනය ඇතුළු බැංකුවේ ප්‍රජා අභිවෘද්ධි ප්‍රයත්නයන් ග්‍රාමීය සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවන් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම මගින් ඉලක්ක 6.2 සඳහා දායක වේ. තවද, BOC හරිත අරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස හුරුළු වන රක්ෂිතයේ කොටසක් නැවත වන වගා කිරීම සහ සංරක්ෂණය කිරීම ඇතුළුව බැංකුවේ පාරිසරික සංරක්ෂණ ප්‍රයත්නයන්, ශ්‍රී ලංකාවේ වටිනා ජලය ආශ්‍රිත පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම මගින් ඉලක්කය 6.6 සඳහා දායක වේ.

තිරසාර සංවර්ධන ඉලක්ක 7 - දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය

ඉලක්කය 7.2 | ඉලක්කය 7.අ

ලංකා බැංකුවේ තිරසාර මූල්‍යකරණ මූලපිරීමේ කොටසක් ලෙස, සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙස ප්‍රතිමූල්‍යකරණ මූලපිරීම්වලට සහභාගී වීම ඇතුළුව, හරිත මූල්‍යකරණයේ බැංකුව නිරත වේ. මෙම ප්‍රයත්නයන් ඉලක්ක 7.අ සහ 7.අ.1 දර්ශකය සමඟ සෘජුවම සම්පාත වේ - ජාත්‍යන්තර මූල්‍ය ප්‍රවාහයන් වෙත ප්‍රවේශ වීමෙන් සහ කාර්මික සහ නේවාසික අංශ හරහා පිරිසිදු තාක්ෂණයන්, පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති කාර්යක්ෂමතාව සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම. හරිත මූල්‍යකරණ ප්‍රයත්නවල කොටසක් ලෙස, හරිත තාක්ෂණය සඳහා නව පහසුකම් සඳහා බැංකුව රු. මිලියන 711.6 ක් වැය කළේය.

ශාඛා අතර සූර්ය බලශක්තිය භාවිතා කිරීම සහ බැංකුවේ පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහළ නැංවීම මඟින් මෙහෙයුම්වල පාරිසරික අඩිපාර අඩු කිරීමට බැංකුව සිය දිගුකාලීන කැපවීම තහවුරු කරයි. බලශක්ති පරිභෝජනයේ පුනර්ජනනීය බලශක්තියේ කොටස වැඩි කිරීම සඳහා මෙම ක්‍රියාවන් ඉලක්ක 7.2 සහ 7.2.1 දර්ශකය සමඟ අනුකූල වේ.

GRI 302-2

ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් පැය **3,219.3 ක** විදුලිය ලබාදී ඇත

සූර්ය බලශක්ති පද්ධතිය, විදුලි බයිසිකල මිලදී ගැනීම සහ ජීව වායු බලාගාර සවි කිරීම සඳහා **රු. මිලියන 14.0 ක** මුදලක් ලබා දී ඇත.

සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශාඛා **51 ක්**

තිරසාර සංවර්ධන ඉලක්ක 8 - සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය

ඉලක්කය 8.5 | ඉලක්කය 8.7 | ඉලක්කය 8.8 | ඉලක්කය 8.10


ලංකා බැංකුවේ වගකීම් සහිත බැංකුකරණය සහ ප්‍රසම්පාදන ආචාරධර්ම සමඟින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය සඳහා වූ කැපවීම සහ සේවකයින් සඳහා අඛණ්ඩ කැපවීම හේතුවෙන් බැංකුවේ බොහෝ ක්‍රියාමාර්ග තිරසාර සංවර්ධන ඉලක්ක 8 සමඟ සම්පාත වේ.

ඉලක්ක 8.5 සඳහා දායක වීම - බැංකුව දළ වශයෙන් සේවකයින් 8,209 ක් සේවයේ යෙදවීම, හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීම සහ සේවක සහභාගීත්වය සහතික කිරීම සඳහා ආයෝජනය කරන අතර සමාන සැලකීම සහ සාධාරණ වේතනය සහතික කරයි. මේ සියල්ල පූර්ණ හා ඵලදායී රැකියා පරිසරයක් සහ සාධාරණ වැටුපක් සඳහා සුදුසු රැකියා සහතික කිරීම සඳහා වූ දායකයන් වේ.

ඉලක්ක 8.8 සමඟ සමගාමීව, වෛද්‍ය ප්‍රතිපූරණය සහ සහාය, සාමාන්‍ය දැනුවත් කිරීම් සහ පුහුණු කිරීම් සහ අනෙකුත් ඒකාබද්ධ සහයෝගයන් තුළින් බැංකුව සිය සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සඳහා ආයෝජනය කිරීමෙන් සුරක්ෂිත සේවා පරිසරයක් සහතික කරයි. තවද, බැංකුවේ සේවකයන්ගෙන් 100% ක් සාමූහික කේවල් කිරීමේ ගිවිසුම්වලට ඇතුළත් කර ඇති අතර, බැංකුව කම්කරු අයිතිවාසිකම් තහවුරු කරන අතර ඉලක්ක 8.8 සහ 8.8.2 දර්ශකය අනුව සමගාමීත්වය සහ සාමූහික කේවල් කිරීමේ නිදහසට අනුකූල වීම සහතික කරයි.

GRI 405-2

සේවකයින් සඳහා ගෙවීම්



ඉලක්කය 8.7 සමඟ පෙළගැස්වීම - ළමා ශ්‍රමය සහ බලහත්කාරයෙන් හෝ අනිවාර්ය ශ්‍රමයේ යොදවා ගැනීමේ අවදානම තුරන් කිරීම සඳහා සැපයුම්කරුවන් පරීක්ෂා කිරීම, තක්සේරු කිරීම සහ ස්ථාන-විගණනය කිරීම හරහා බැංකුවේ වගකීම් පරිචයන් එහි සැපයුම් දාමය දක්වා විහිදේ.

වසර තුළ රැකියා **2,500 ක්** නිර්මාණය කරන ලදී

වසර තුළ ව්‍යාපාර **40 ක්** පුනර්ජීවනය විය

වර්ෂය තුළ වැටුප් හා විශ්‍රාම වැටුප් වශයෙන් **රු. බිලියන 29.0 ක්** ලබා දී ඇත

දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් (D-SIB) වීම, ලංකා බැංකුවේ පුළුල් පරාසය, ගනුදෙනුකාර සබඳතා මධ්‍යස්ථාන පුළුල් ජාලය, ඉතුරුම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ උත්සාහයන් සහ මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කිරීම; ඉලක්ක 8.10 සහ 8.10.1 සහ 8.10.2 යන දර්ශක වෙත මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය පුළුල් කිරීමෙන් සහ බැංකු සේවා භාවිතා කරන ජනගහනයේ අනුපාතය වැඩි කිරීමෙන්. සෘජුවම දායක වේ.

තිරසාර සංවර්ධන ඉලක්ක 9 - කර්මාන්ත නවෝත්පාදන සහ යටිතල පහසුකම්

ඉලක්කය 9.1 | ඉලක්කය 9.3

බැංකුවේ ව්‍යාපෘති මූල්‍යකරණය මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් යොමු කරයි. ඉලක්ක 9.1 ට අනුකූලව මෙම ව්‍යාපෘති ගුණාත්මක, විශ්වාසනීය, තිරසාර සහ ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට උපකාරී වේ.

තිරසාර බවට අනුගත වීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අනෙකුත් සුළු පරිමාණ කාර්මික ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය වැඩි කිරීම, දැරිය හැකි ණය සඳහා ප්‍රවේශය ලබා දීම සහ ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම මඟින් බැංකුවේ සංවර්ධන ණය දීම සහ සහනදායී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කවයේ සහ අපනයන කවයේ ප්‍රයත්නයන් සමඟින් වටිනාකම් දාමයන් සහ වෙළඳපළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම මඟින් ඉලක්ක 9.3 වෙත සෘජුවම දායක වේ.

තොරතුරු තාක්ෂණ පද්ධති සහ මෘදුකාංග සඳහා
රු. බිලියන 1.8 ක
ආයෝජනයක්.

තිරසාර සංවර්ධන ඉලක්ක 10 - අව අසමානතා

ඉලක්කය 10.2 | ඉලක්කය 10.3 | ඉලක්කය 10.ආ | ඉලක්කය 10.ඇ

බැංකුවේ මෙහෙයුම් හරහා අසමානතාවය අඩු කරන අතරම සැමට සමාන අවස්ථා ලබා දීම සහතික කිරීම සඳහා ද ක්‍රියා කරන දැඩි ක්‍රියාවලීන් බැංකුව විසින් ක්‍රමානුකූලව සංස්ථාගත කර ඇත.

ඉලක්ක 10.2 ට අනුකූලව බැංකුවේ පුළුල් ජාලයේ ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය, ආගම, මූල්‍ය තත්ත්වය හෝ වෙනත් සාධක නොසලකා ප්‍රජාවන් බඳවා ගැනීම ප්‍රවර්ධනය කරයි. ලංකා බැංකුවේ සේවකයින් සම්බන්ධයෙන් ඉලක්ක 10.3 ට අනුකූලව අවස්ථාව සහ ප්‍රතිඵලවල සමානාත්මතාවය සහතික කිරීම සඳහා බැංකුව සුදුසු අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් ප්‍රවර්ධනය කරයි.

බැංකුවේ සංවර්ධන ණය දීම සහ සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙස භූමිකාව, විශේෂයෙන්ම බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික අරමුදල් සපයන්නන්ගේ ණය මාර්ග සම්බන්ධයෙන්, නිල සංවර්ධන ආධාර සහ මූල්‍ය ප්‍රවාහයන්ට සහාය වීම මඟින් ඉලක්ක 10.ආ සාක්ෂාත් කර ගැනීමට දායක වේ.

ගනුදෙනු කාලය සහ පිරිවැය අවම කරමින් සංක්‍රමණික ප්‍රේෂණවල පහසුව සහ සුරක්ෂිතභාවය දිරිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම මඟින් ඉලක්ක 10.ඇ සඳහා ප්‍රමුඛත්වය දීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුවේ අඛණ්ඩ උත්සාහයන් ද සහාය වේ.

වසර තුළ සංවර්ධන ණය වශයෙන්
රු. බිලියන 52.6 ක්
ලබා දී ඇත

ආර්ථිකමය වශයෙන් අවාසි සහගත ප්‍රදේශවල (උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්) ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන
504 ක්

තිරසාර සංවර්ධන ඉලක්ක 11 - තිරසාර නගර සහ ප්‍රජාවන්

ඉලක්කය 11.1 | ඉලක්කය 11.2 | ඉලක්කය 11.4

නේවාසික නිවාස සඳහා ණය ලබා දීම බැංකුවේ ණය කළඹෙහි සැලකිය යුතු අංශයක් වන අතර, සහනදායී පොළී අනුපාත යටතේ ණය යෝජනා ක්‍රම කිහිපයක් සපයනු ලබන අතර, එමඟින් ශ්‍රී ලාංකිකයන් දහස් ගණනකට ප්‍රමාණවත් සහ දැරිය හැකි නිවාස පහසුකම් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කරයි. මෙය ඉලක්ක 11.1 ට අනුකූල වේ. 2022 අවසන් වන විට බැංකුවේ නිවාස ණය කළඹ රු. බිලියන 78.2 ක් විය.

ප්‍රවාහන අංශයට සහ ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා බැංකුවේ ණය දීම පොදු ප්‍රවාහනය ඇතුළුව ආරක්ෂිත, දැරිය හැකි සහ ප්‍රවේශ විය හැකි ප්‍රවාහන පද්ධති සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම මඟින් ඉලක්ක 11.2 සඳහා දායක වේ. 2022 අවසානය වන විට ලංකා බැංකුව විසින් ප්‍රවාහන හා සැපයුම් අංශයට ලබා දී ඇති ණය ප්‍රමාණය රු. බිලියන 95.8 කි.

පොදු ප්‍රවාහන සේවා සපයන්නන් **207 ක්** වෙත ලීසිං පහසුකම් හරහා සහාය දක්වයි

වර්ෂය තුළ විදුලි වාහන සහ/හෝ බයිසිකල් සඳහා
රු. මිලියන 10.0 ක ණය

තවද, ඉලක්ක 11.4 ට අනුකූලව ස්වභාවික උරුමයන් ආරක්ෂා කිරීම ඇතුළු ශ්‍රී ලංකාවේ සංස්කෘතික සංවර්ධනය සඳහා ලංකා බැංකුව දිගුකාලීන සහයෝගයක් ලබා දී ඇත. වර්ෂය තුළදී, බැංකුව ආගමික හා සංස්කෘතික සංවර්ධනය සඳහා පැවරී ඇති ප්‍රධාන ආයතන සහ සංගම්වලට සහාය ලබා දුන්නේය.

සූර්ය බලශක්තිය සවිකිරීමේ ශාඛා **5 ක්** ක්‍රියාත්මක වෙමින් පවතී

ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලයේ (GBCSL) ප්‍රමිතීන්ට අනුව ඉදිවෙමින් පවතින ශාඛා
7 ක්

හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව ශාඛා **9 ක්** නිම කර ඇත

තිරසාර සංවර්ධන ඉලක්ක 12 - වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය


ඉලක්කය 12.2 | ඉලක්කය 12.5 | ඉලක්කය 12.6 | ඉලක්කය 12.7

ඩිජිටල්කරණය සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය ඉහළ නැංවීමට බැංකුව දරන ප්‍රයත්නයන් සහ මෙහෙයුම්වල පාරිසරික පියසටහන් අඩු කිරීමට කැපවීම, ලංකා බැංකුව සිය මෙහෙයුම්වල වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය ඇතුළත් කිරීම සහතික කරයි.

ඉලක්ක 12.2 ට අනුකූලව, ද්‍රව්‍යමය පරිභෝජනය අඩු කිරීමට සහ ස්වාභාවික සම්පත් තිරසාර හා කාර්යක්ෂම භාවිතය සාක්ෂාත් කර ගැනීමට බැංකුව කටයුතු කරයි. 2022 දී, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය හරහා බැංකුව රු. මිලියන 56.7 ක් වටිනා කඩදාසි සහ ටෝනර් ඉතිරි කර ගත්තේය. ඉලක්ක 12.5 ට අනුකූලව, බැංකුව අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීමට සහ ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියා කරයි. 2022 දී කඩදාසි මෙට්‍රික් ටොන් 21.9 ක් ප්‍රතිචක්‍රීකරණය කරන ලදී.

ලංකා බැංකුවේ තිරසාර රාමුව ක්‍රියාත්මක වන අතර, බැංකුව විසින් ආයතනික වාර්තාකරණයේදී පාරිසරික, සමාජීය සහ යහපාලනය තොරතුරු ඇතුළත් කිරීම ඉලක්ක 12.6 ට අනුකූල වේ. තවද, වගකිවයුතු රාජ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත් බැංකුව විසින් තහවුරු කිරීම එහි සැපයුම් දාමය පුරාවටම ප්‍රසම්පාදන පිළිවෙත් සහ වගකීම් පරිචයන් ගෙනයාමට දරන උත්සාහයන් ඉලක්ක 12.7 සමඟ සමපාත වේ.

සූර්ය බලශක්තිය නිපදවීම



තිරසාර සංවර්ධන ඉලක්ක 13 - දේශගුණික ක්‍රියාකාරකම්

ඉලක්කය 13.2 | ඉලක්කය 13.3

බැංකුව සිය කාබන් පියසටහන් පිළිබඳ සවිස්තරාත්මක තක්සේරුවක් සිදු කරන අතර දේශගුණික විපර්යාස නිසා ඇති වන අවදානම් වඩාත් හොඳින් හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ආයතනික ධාරිතාව සහ දැනුවත්භාවය වැඩිදියුණු කිරීමට සාමූහික ප්‍රයත්නයන් ගෙන යයි. මෙය ඉලක්ක 13.2 සහ ඉලක්ක 13.3 සමඟ අනුකූල වේ.

කඩදාසි ප්‍රතිචක්‍රීකරණය මගින් 2022 වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම වැඩුණු ගස් **373 ක්** ඉතිරි කර ඇත

තිරසාර සංවර්ධන ඉලක්ක 15 - ගොඩබිම මත ජීවය

ඉලක්කය 15.1 | ඉලක්කය 15.2

හරිත අරණ ව්‍යාපෘතිය වැනි බැංකුවේ පාරිසරික මූලාරම්භයන් නැවත වන වගාව සහ තිරසාර කළමනාකරණයට සහාය වන අතරම අත්‍යවශ්‍ය මිරිදිය පරිසර පද්ධතියක් සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය කිරීමට දායක වේ. මෙය ඉලක්ක 15.1 සහ 15.2 සමඟ අනුකූල වේ. 2022 දී හරිත අරණ ව්‍යාපෘතිය සඳහා බැංකුව රු. මිලියන 3.3 ක් ආයෝජනය කළේය.

තිරසාර සංවර්ධන ඉලක්ක 16 - සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

ඉලක්කය 16.5 | ඉලක්කය 16.10 | ඉලක්කය 16.ආ

බැංකුව සිය සියලු ගනුදෙනු වලදී ඉහළම මට්ටමේ විනිවිදභාවය, වගවීම සහ අඛණ්ඩතාව ආරක්ෂා කරයි. බැංකුවේ ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවට දූෂණ විරෝධී සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි (AML) ප්‍රතිපත්ති ඇතුළත් වේ, මේවා ඉලක්ක 16.5 ට අනුකූල වේ. රාජ්‍ය ආයතනයක් ලෙස, ඉලක්ක 16.10 ට අනුකූලව - තොරතුරු සඳහා මහජන ප්‍රවේශය සහතික කිරීමේදී බැංකුව තොරතුරු දැනගැනීමේ පනතට අනුකූල වේ.

තවද, වෙනස් කොට සැලකීම වැළැක්වීම සඳහා බැංකුවේ අභ්‍යන්තර ක්‍රියාවලි සහ ප්‍රතිපත්ති, ආයතනික පසුබිමක් තුළ ඉලක්ක 16.ආ සාක්ෂාත් කර ගැනීමට දායක වේ.

GRI 205-2

	2022	2021	2020	2019	2018
විසිල් බ්ලෝවින් යටතේ ලැබූ ලිපි ගණන	34	40	39	99	101

GRI 205-2

තොරතුරු හෙළි කිරීමේ සිද්ධීන් **34 ක්** වාර්තා වී ඇත

වසර තුළ ගනුදෙනුකාර පැමිණිලි **3,069 ක්** යොමු කර ඇත

පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීමේ කාලය වැඩ කරන දින **7 කට** වඩා අඩු වේ

තිරසාර සංවර්ධන ඉලක්ක 17 - තිරසාර සංවර්ධනය සඳහා පාර්ශ්වකරණයන්

ඉලක්කය 17.3 | ඉලක්කය 17.17

ඉලක්ක 17.17 ට අනුකූලව හවුල් වටිනාකම් නිර්මානය කිරීම සඳහා බැංකුව සිය පරිසර පද්ධතිය හරහා හවුල්කාරිත්වය උත්තේජනය කරයි. බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික අරමුදල් ප්‍රවාහයන් සම්පාදනය කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙස බැංකුවේ කාර්යභාරය ද ඉලක්ක 17.3 සඳහා දායක වේ.

GRI 405-1

ආයතන **9 ක්** සඳහා සාමාජිකත්ව ගාස්තු ගෙවා ඇත

මූල්‍ය සමාලෝචනය

2022 වසර තුළදී, කිසිදා අත්නොවිඳි තත්ත්වය කළමනාකරණය කිරීම සහ බැංකුවේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා උපායමාර්ග කෙරෙහි සුවිශේෂී ඉහළ අවධානයක් යොමු කළ යුතු දැඩි අර්බුදයන්ට සහ අවිනිශ්චිතතාවන්ට රට සහ බැංකුව මුහුණ දුන්නේය. මෙම සන්දර්භය යටතේ, මෙහෙයුම් පරිසරයේ පෙර නොවූ විරූ වෙනස්කම් මධ්‍යයේ වුවද, ව්‍යාපාරික අඛණ්ඩතාව සහ ගනුදෙනුකරුවන්ගේ සහ ශ්‍රී ලංකා ආර්ථිකයේ දිගුකාලීන තිරසාරභාවයට ප්‍රමුඛත්වය දෙමින් බැංකුව අභියෝගවලට මුහුණ දුන්නේය.

2021 වර්ෂය තුළ පැවති ආර්ථික පරිසරය සමාලෝචිත වර්ෂය තුළ අප අත්දුටු දේට වඩා බෙහෙවින් වෙනස් විය. 2021 වසර තුළදී, 11% සිට 12% දක්වා ණය අනුපාතිකයක් සහ 8% ක පමණ තැන්පතු අනුපාත සහිත අඩු පොළී අනුපාත පරිසරයක් පැවතුනි. ශ්‍රී ලංකා රජය ස්වෛරී වගකීම් පැහැර හැරීමේ කිසිදු ඇඟවීමකින් දක්නට නොතිබුන අතර සාමාන්‍ය උද්ධමන අනුපාතයක් පැවති අතර ශ්‍රී ලංකා රුපියල විනිමය අනුපාතිකය මගින් ඉහළ නැංවීය. ඒ අතරම, සංචාරකයින්ගේ පැමිණීම් ඉහළ යාමත් සමඟ කොවිඩ්-19 හි බලපෑමට ලක් වූ ව්‍යාපාර වසංගතයේ දරුණුතම කාලයෙන් පසු ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරන බැවින් රට යථා තත්ත්වයට පත්වෙමින් තිබිණි.


මෙම තත්ත්වයන් මත පදනම්ව 2022 සඳහා දිශානතියක් සකස් කර තිබියදීත්, පසුව සිදු වූයේ මෙහෙයුම් පරිසරයේ තියුණු පෙරළියකි. ශ්‍රී ලංකාවේ පෙර නොවූ විරූ පරිදි අඩු පොළී අනුපාතයක සිට ඉහළ පොළී පාලන තන්ත්‍රයකට මාරු විය; පාවෙන විනිමය අනුපාතිකයෙන් පසුව රුපියල විශාල වශයෙන් අවප්‍රමාණය විය; පිරිවැයෙන් තල්ලු වුන උද්ධමනය හේතුවෙන් වියදම් තියුණු ලෙස ඉහළ ගියේය; තවද, ස්වෛරී ගෙවීම් පැහැරහැරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රේණිගත කිරීම පහත හෙලන ලදී. ප්‍රවාහනයට සහ බලශක්තියට ඇති වූ දිගුකාලීන බාධා හා ශ්‍රී ලංකාවේ අගනුවර සහ දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල ඇතිවූ සමාජ නොසන්සුන්තාව හේතුවෙන් ව්‍යාපාරික පරිසරය තවදුරටත් අඩාල විය.

ශීඝ්‍රයෙන් වෙනස් වන මෙම තත්ත්වයන්ට ඉක්මනින් ප්‍රතිචාර දැක්වීමේ බැංකුවේ හැකියාව ප්‍රශංසනීයයි. අපි නව ක්‍රියාදාමයන් අනුගමනය කර බැංකුවේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා දැඩි ක්‍රියාමාර්ග ගත් අතර එමඟින් අපගේ පාර්ශ්වකරුවන්ට ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල අවම කර ගත්තෙමු.

එබැවින්, 2022 වසර අපගේ වගකීම් සහිත පාලනය සහ ගනුදෙනුකරුවන්ට සහ ප්‍රජාවන්ට උපකාර කිරීමේ අනාගත කේන්ද්‍රීය දිගුකාලීන උපායමාර්ගය ලෙස ලංකා බැංකුවට ඔරොත්තු දීමේ සහ අධිෂ්ඨානශීලී වසරක් ලෙස නම් කළ හැකිය. බැංකුව බදු ගෙවීමට පෙර ලාභය රු. බිලියන 31.0 ක් වාර්තා කර ඇති අතර, දැඩි අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තිබියදීත් සිය ක්ෂේත්‍රයේ නායකත්වය රැක ගනිමින් මූල්‍ය තත්ත්වය 14% කින් වර්ධනය කර ගැනීමට හැකි විය. පොළී පාලන තන්ත්‍රයක් සඳහා සැලසුම් සකස් කරන ලද තත්ත්වයක් යටතේ හා විශාල වශයෙන් වෙනස්කම් සිදුවන ආර්ථික පසුබිමකට විරෙහිව මෙය බැංකුවේ කැපීපෙනෙන කාර්යසාධනයක් විය.

වැඩිවීමක් පිළිබිඹු කරයි. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ රටෙහි පැවතුණු අස්ථාවරත්වය හේතුවෙන් කෙටිකාලීන තැන්පතු සඳහා වැඩි නැඹුරුවක් ඇතිවීමය.

ආදායමේ උපනතීන්



මූල්‍ය කාර්යසාධනය

මුළු ආදායම

පොළී වියදම් රු. බිලියන 329.9 දක්වා 121% කින් වර්ධනය වුවද, වසර අවසන් වන විට බැංකුවේ මුළු ආදායම රු. බිලියන 513.1 දක්වා 77% කින් වර්ධනය විය. තැන්පතු මිශ්‍රණයේ වෙනස්කම් වලට අනුකූලව පොළී වියදම්වල සැලකිය යුතු

අරමුදල් මත පදනම් වූ ආදායම


බැංකුවේ අරමුදල් පදනම් කරගත් ආදායමෙන් 68% ක් ණය සහ අත්තිකාරම් වලින් ලැබෙන පොළී ආදායමෙන් ලැබී ඇත. 2022 වසරේ පැවති ඉහළ පොළී අනුපාත තත්ත්වය හේතුවෙන් ණය සහ අත්තිකාරම් වලින් ලැබෙන පොළී ආදායම රු. බිලියන 117.1 කින් ඉහළ ගිය අතර, පෙර වසර හා සසඳන විට 61% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

රජයේ සුරැකුම් කළඹවල ආයෝජන ඉහළ යාමත් සමඟ ආයෝජනය මත පොළී ආදායම වසරින් වසර 117% කින් වර්ධනය විය.

කෙසේ වෙතත්, ගනුදෙනුකරුවන්ට සහය දැක්වීමේ සහ පොළී අනුපාත ඉහළ යාමේ අහිතකර බලපෑම් වැළැක්වීමේ සාමූහික ප්‍රයත්න මාලාවක කොටසක් ලෙස, ස්ථාවර පොළී අනුපාත විවිධ්‍යවලට වෙනස් නොකිරීමට බැංකුව සහතික වූ අතර, විවිධ්‍ය සම්බන්ධිත පුද්ගලික ණය සඳහා තත්ත්වයන් සහ ඉල්ලීම් මත පොළී අනුපාත ලබා දීම සහ දැඩි ලෙස පීඩාවට පත් වූ ආර්ථිකයේ විශේෂ කොටස් වෙත ණය සහන පමා කාල ලබා දීම දීර්ඝ කරන ලදී. ආර්ථික අර්බුදය හේතුවෙන් දැඩි දුෂ්කර තත්ත්වයන්ට මුහුණ දුන් ව්‍යාපාර සහ කුටුම්භ සඳහා සැලකිය යුතු ඉතුරුම් සඳහා දායක වෙමින් බැංකුව පොළී අනුපාත තාර්කිකකරණයේ ප්‍රතිලාභ ගනුදෙනුකරුවන් වෙත දීර්ඝ කළේය. ගනුදෙනුකරුවන් වෙත ලබා දී ඇති සහන සහ ප්‍රතිලාභ වාර්ෂික වාර්තාවේ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ අංශයේ විස්තර කර ඇත.

ණය අයකර ගැනීමෙන් ඔබ්බට ගිය ව්‍යාපාර ප්‍රතිස්ථාපනය කිරීම කෙරෙහි බැංකුවේ අවධානය වසර තුළ පුළුල් විය. ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිර්දේශ කරන ලද සියලුම සහනවලට අවනත වෙමින් අර්බුදකාරී ණය ගැනියන් සඳහා තාවකාලික ණය සහන පමා කාල දීර්ඝ කළෙමු. මීට අමතරව, ආනයන සීමාවන් පවතින විට ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු සහ නිෂ්පාදන සංක්‍රමණය කිරීමට සහ දේශීය වෙළඳපලේ පැවැත්මට සහාය වූ SME කවය වැනි මූලපිරිම් සමඟ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) අංශයට සහාය වීමට අපි පුරෝගාමී විය. බැංකුවේ අපනයන කවය අපනයන ඉලක්ක කරගත් ව්‍යාපාරවලට සහ ශ්‍රී ලාංකේය ව්‍යාපාරවල අපනයන තරඟකාරිත්වය ඉහළ නැංවීමට සහ රටේ බාහිර අංශයේ කාර්යසාධනය ශක්තිමත් කිරීමට තවදුරටත් සහාය විය.

ගාස්තු සහ කොමිස් ආදායම



2022 වසරේදී අපි ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායමේ 15% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර එය රු. බිලියන 16.4 දක්වා ළඟා විය.

මෙම ජයග්‍රහණය අත් කරගනු ලැබුවේ අවපාත ආර්ථික තත්ත්වයන් තිබියදී සහ අර්බුදයෙන් හා පොළී අනුපාත උච්චාවචනයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන්ට සහන සැලසීමට බැංකුව විසින් දරන ලද සාමූහික උත්සහයන් මධ්‍යයේය.

ඩිජිටල්කරණය සඳහා බැංකුව සහ රටේ අඛණ්ඩ ප්‍රයත්නයට අනුකූලව, අපි ණය සහ හර කාඩ්පත් ගාස්තු ආදායම රු. බිලියන 8.9 දක්වා 65% කින් ඉහළ නැංවූ අතර මුළු ගාස්තු ආදායමෙන් 48% ක් එය නියෝජනය කළේය. 2022 ලංකා පේ ටෙක්නොවේශන් සම්මාන උළෙලේදී ලංකා බැංකුව හට "සිල්ලර ගෙවීම් සඳහා හොඳම බැංකුව" ලෙසින් සම්මානය පිරිනැමීමෙන් බැංකුවේ ඩිජිටල්කරණ ප්‍රයත්නවල සාර්ථකත්වය පිළිබිඹු කරයි. ගනුදෙනුකාර සේවා ඩිජිටල්කරණය කිරීමේදී බැංකුවේ සාර්ථකත්වය පිළිබඳ වැඩිදුර තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 85 පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ අංශය යටතේ අනාවරණය කර ඇත.

තවද, විශේෂයෙන්ම වසරේ අග භාගයේදී විදේශ ප්‍රේෂණ සහ සංචාරක ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධනය හේතුවෙන් සංචාරක සහ ප්‍රේෂණ වලින් ලැබෙන ගාස්තු ආදායම වසර තුළදී රු. බිලියන 3.7 දක්වා රු. බිලියන 1.7 කින් ඉහළ ගියේය.


වෙනත් ආදායම්

බැංකුව වසර තුළ ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කරමින් අනෙකුත් ආදායම රු. බිලියන 34.0 ලෙස දැක්වුණි; මූලික වශයෙන් බැංකුවේ ශේෂ පත්‍රයෙන් 30% ක් විදේශ මුදල් වත්කම් වලින් සමන්විත වූ බැවින්, පාවෙන විනිමය අනුපාතිකය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ධනාත්මක බලපෑමක් ඇති කළේය .

වසර තුළදී ශ්‍රී ලංකා රුපියල 81% කින් පමණ ක්ෂය වීම වෙළඳ ක්‍රියාකාරකම් සහ මුදල් පරිවර්තනයෙන් ලබාගත් ශුද්ධ විනිමය ලාභයට හේතු විය, එය බැංකුවේ අරමුදල් නොවන ආදායමෙන් සැලකිය යුතු කොටසක් නියෝජනය කරන අතර, වසර සඳහා එය රු. බිලියන 32.9 ක් විය.

පවතින ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ස්කන්ධ සහ කොටස් වෙළඳපලේ උච්චාවචන මත කොටස් සහ ඒකක භාර කළඹ නිසා ඇති වූ රු. මිලියන 804.4 ක වෙළඳපළ පාඩු බැංකුවට අහිතකර ලෙස බලපෑවේය. කෙසේ වෙතත්, ක්‍රියාශීලී නියැලීම තුළින් බැංකුවට කොටස් සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳාමෙන් රු. මිලියන 861.3 ක් ලබා ගැනීමට හැකි විය.

හානිකරණ ප්‍රතිපාදන



2022 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 7.8% කින් හැකිලීමත් සමඟ, අවපාත ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ විවිධ පසුබෑම්වලට බැංකුවේ ආයතනික ගනුදෙනුකරුවන් මුහුණ දුන්හ. රටේ පවතින ආර්ථික අර්බුදය වසර දෙකක් මුළුල්ලේ පැවතෙන වසංගතයේ බලපෑම් මත නව අභියෝග ගෙන ආවේය. මෙම සාධක මූල්‍ය අංශය පුරා වත්කම්වල ගුණාත්මක භාවය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. මෙම තත්ත්වය තුළ, වසර තුළ බැංකුවේ ප්‍රමුඛතාවය වූයේ අභියෝග හරහා ගනුදෙනුකරුවන්ට සහාය වීමයි. ගනුදෙනුකරුවන්ගේ, ව්‍යාපාරවල සහ ආර්ථිකයේ දිගු කාලීන තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපනය කිරීම බැංකුව අඛණ්ඩව අවධානය යොමු කළ ප්‍රධාන අංශයක් විය.

ශාඛා ගනුදෙනුකරුවන්ට ද මේ හා සමාන බලපෑමක් ඇති විය; පොළී අනුපාතවල තියුණු වැඩිවීමක් සමඟ ජීවන වියදම වැඩිවීමට මුහුණ දීමට සිදුවිය. ඊට ප්‍රතිචාර වශයෙන්, ලංකා බැංකුව පොළී අනුපාත උච්චාවචනයෙන් ආරක්ෂාව සැපයීම, අමතර වියදම් බැංකුව විසින් උකහා ගැනීම සහ හැකි සෑම විටම ප්‍රතිලාභ බෙදාගැනීම මගින් ගනුදෙනුකරුවන්ට අත්‍යවශ්‍ය සහන සලසා දුන්නේය.

ගනුදෙනුකරුවන්ට, වටිනාකම් දාමයන්ට සහ ප්‍රජාවන්ට සහාය වෙමින් ව්‍යාපාර පුනර්ජීවනය කිරීමට ලංකා බැංකුව දරන උත්සාහයන් වාර්ෂික වාර්තාවේ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ අංශයෙන් විස්තරාත්මකව අනාවරණය කර ඇත.

2022 වසර සහ ඉන් ඔබ්බට සැලකිය යුතු අභියෝග අපේක්ෂා කරන අතර, ලංකා බැංකුවේ දැඩි සහ විචක්ෂණශීලී ප්‍රතිපාදන ප්‍රතිපත්තිවලට අනුකූලව, අවදානම් අවම කිරීම හා බැංකුවේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම සඳහා ණය සහ අත්තිකාරම් සහ ආයෝජන සඳහා දළ වශයෙන් රු. බිලියන 87.2 ක සැලකිය යුතු ප්‍රතිපාදන සමඟ විභව කම්පන සඳහා සූදානම් වීමට අපි පියවර ගත්තෙමු.

2022 වර්ෂයේ ජනවාරි මාසයේ සිට, ණය පහසුකම් සහ මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම පිළිබඳ 2021 අංක 13 සහ අංක 14 ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්ට අනුකූලව ණය හා අත්තිකාරම් සහ ආයෝජන සඳහා හානිකරණය සඳහා වන ප්‍රතිපාදන සපයන ලදී. මේ අනුව, ණය සහ අත්තිකාරම් සහ මූල්‍ය ආයෝජන සඳහා හානිකරණය සඳහා වන ප්‍රතිපාදන ගණනය කරනු ලැබුවේ වර්තමාන ආර්ථික තත්ත්වයන් තුළ ඇති විය හැකි ප්‍රතිවිපාක, ක්ෂේත්‍ර විශේෂිත අවදානම් සාධක, නව ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ රජය විසින් විදේශීය සහ දේශීය ණය පියවීම් සඳහා වන වර්තමාන සාකච්ඡා මත පදනම්ව ණය සහ අත්තිකාරම් හෝ ආයෝජන උපකරණ සම්බන්ධ අපේක්ෂිත පාඩු ග්‍රහණය කර ගැනීම් සඳහා ය.

මූල්‍ය සමාලෝචනය

විදේශීය සහ දේශීය ස්වෛරී ණය පියවීම සඳහා සිදුවෙමින් පවතින සාකච්ඡා සලකා බලමින්, බැංකුව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සඳහා සැලකිය යුතු මට්ටමේ හානිකරණය සඳහා වන ප්‍රතිපාදන වෙන් කළේය.

- ණය සහ අත්තිකාරම් මත වර්ෂය සඳහා හානිකරණය ප්‍රතිපාදන: රු. බිලියන 70.8 (සමුච්චිත හානිකරණය ප්‍රතිපාදන රු. බිලියන 259.2)
- අදියර 3 අනුපාතය: 5.3% (2021 - 5.1%)
- අදියර 3 ණය අනුපාතයට අදියර 3 හානිකරණය සඳහා වන ප්‍රතිපාදන: 59.7% (2021 - 49.1%)
- ස්වෛරී උපකරණවල ආයෝජන වෙනුවෙන් වර්ෂය සඳහා හානිකරණය ප්‍රතිපාදන: රු. බිලියන 16.1 (සමුච්චිත හානිකරණය ප්‍රතිපාදන රු. බිලියන 53.5)
- ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් ඇති කරන අවදානම්-ඉහළ කර්මාන්ත හඳුනා ගැනීම සඳහා කළමනාකරණ ආවරණ යොදන ලදී. රට තුළ පවතින ආර්ථික කැළඹිලිවල පිටාර ගැලීමේ බලපෑම් සහ අඩු කාර්යසාධනයක් ලෙස තක්සේරු කරන ලද අවදානම් සහිත ඉහළ කර්මාන්තවලට නිරාවරණය වීම දූරදර්ශී පදනමක් මත පූර්ණ වශයෙන් ණය අහිමිවීම් සඳහා සැලකිල්ලට ගන්නා ලදී.
- සාමූහිකව තක්සේරු කරන ලද ණය කළඹ සඳහා අපේක්ෂිත පාඩු ගණනය කිරීමේදී භාවිතා කරන ලද ආර්ථික සාධක ගැලපීම (EFA) ආතතියට පත් වූ ආර්ථික තත්ත්වයන් ග්‍රහණය කර ගනිමින් වැඩිදියුණු කරන ලදී.
- කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් ගනුදෙනුකරුවන් (ISL ගනුදෙනුකරුවන්) ද දැඩිව තක්සේරු කරන ලද අතර ව්‍යාපාරවලට අබණ්ඩ බාධා කිරීම් හේතුවෙන් කෙටි හා මධ්‍ය කාලීනව ඇති වූ ඉහළ අවිනිශ්චිතතාවයන් සහ අසාමාන්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් ගනුදෙනුකරුවන් සඳහා හානිකරණය ප්‍රතිපාදන පිළිබඳ විචක්ෂණ පිලිවෙතක් අනුගමනය කරන ලදී.

වියදම් කළමනාකරණය

2022 වසරේ සැප්තැම්බර් මාසයේදී පැවතුණු උද්ධමන අගයන් ඉහළ උද්ධමනකාරී පරිසරයකට හේතු විය. කෙසේ වෙතත්, මූලික වශයෙන් සේවක මණ්ඩල පිරිවැය වැඩිවීම හේතුවෙන් මෙහෙයුම් පිරිවැය 14% කින් වැඩි වුවද, අපගේ වියදම් කළමනාකරණය කර ගැනීමට අපි සාර්ථක විය. ද්විත්ව ඉලක්කම් උද්ධමනය මධ්‍යයේ, බැංකුවේ ඵලදායී පිරිවැය පාලනය මගින් අනෙකුත් වියදම් 12% ට අඩු වැඩිවීමකට කළමනාකරණය කර ඇත.

ආර්ථික අර්බුදය සහ උද්ධමනය සැලකිල්ලට ගනිමින් ජීවන වියදම් දීමනාවක් ලබා දීමෙන් සේවක යහපැවැත්ම සහ රඳවා තබා ගැනීම සඳහා ආයෝජනය කිරීමට බැංකුව ගත් තීරණය සේවක මණ්ඩල පිරිවැය ඉහළ යාමට හේතු වේ. බැංකුව විසින් ඉන්ධන අර්බුදය තුළ සේවකයන්ට ප්‍රවාහන පහසුකම් ද සපයා ඇති අතර, ගනුදෙනුකරුවන් සඳහා ව්‍යාපාරික අබණ්ඩතාව සහ සුමට මෙහෙයුම් සහතික කළේය.

	2022 රු. '000	2021 රු. '000
සේවක මණ්ඩල වියදම්	28,991,429	24,981,940
ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	4,286,899	4,146,256
වෙනත් වියදම්	14,018,161	12,552,393

බදු අය කිරීම


2022 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වැට් බදු අනුපාතය 15% සිට 18% දක්වා වැඩි වීමත් සමඟ වසර සඳහා මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VAT) රු. බිලියන 11.0 දක්වා 22% කින් වැඩි විය. බැංකුව විසින් වසරක් තුළ එක් වර බදු අය කිරීම ලෙස පනවන ලද අධිභාර බද්ද ලෙස රු. බිලියන 6.7 ක් ගෙවන අතර තුර වසර තුළදී අලුතින් හඳුන්වා දුන් 2.5% ක සමාජ ආරක්ෂණ දායකත්වය වෙත රු. මිලියන 281.3 ක් ගෙවා ඇත. තවද, බැංකුව වසර තුළ ආදායම් බදු ලෙස ද රු. බිලියන 5.5 ක් ගෙවා ඇත.

වසර තුළදී රු. බිලියන 14.5 ක විලම්බිත බදු ප්‍රතිවර්ත්‍යයක් සිදු කරන ලද්දේ ප්‍රධාන වශයෙන් විදේශ මුදලින් වන ස්වෛරී උපකරණ, ණය සහ අත්තිකාරම් මත කරන ලද නිශ්චිත ප්‍රතිපාදන මත වෙන් කර ඇති කල් දැමූ බද්ද සහ ආදායම් බදු අනුපාතය 24% සිට 30% දක්වා ඉහළ නැංවීමට අනුකූලව වත්මන් බදු අනුපාතිකයට ගැලපීම හේතුවෙනි. ඒ අනුව, බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මගින් රු. මිලියන 995.8 ක බදු ප්‍රතිවර්ත්‍යයක් පිළිබිඹු වන අතර එමඟින් බදු ගෙවීමෙන් පසු ලාභය රු. බිලියන 32.0 කි.

ලාභදායීත්වය

වසර තුළ ලංකා බැංකුවේ ප්‍රධාන අවධානය යොමු වූයේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම සහ රටේ ආර්ථික කැලඹීම හේතුවෙන් පෙර නොවූ විරූ අභියෝග වලට මුහුණ දී සිටින ගනුදෙනුකරුවන්ට සහාය වීමය. බැංකුවේ ශුද්ධ පොළී ආදායම් වර්ධනය 14% දක්වා අඩු වූ අතර ක්ෂේත්‍රයේ ඉහළම අගය ලෙස බදු පෙර ලාභය රු. බිලියන 31.0 ක වාර්තා කළේය.

ලාභදායීත්වය




වෙනත් විස්තීර්ණ ආදායම් (OCI)

ලංකා බැංකුවේ අනෙකුත් විස්තීරණ ආදායම 233% කින් රු. බිලියන 27.8 දක්වා වර්ධනය වී ඇති අතර, සමස්ත විස්තීරණ ආදායම රු. බිලියන 59.8 දක්වා ළඟා වූ අතර, එය වසරින් වසර 30% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇ.ඩො/රුපියල් හුවමාරු ක්‍රමය මත ඇ.ඩො මිලියන 90 ක් හෙජ් ගිණුම්කරණ මත හඳුනාගත් අතර ඊට අදාලව සැලකිය යුතු හෙජ් සංචිතයක් හඳුනා ගන්නා ලදී.

මූල්‍ය තත්ත්වය

වත්කම්

වත්කම් සංයුතිය



ලංකා බැංකුවේ මුළු වත්කම් වසර තුළ 14% කින් වර්ධනය වී රු. ට්‍රිලියන 4.3 දක්වා ළඟා වූ අතර එය අපගේ තාර්කික වර්ධන ඉලක්ක කරා ළඟා වෙමින් සිටීම පෙන්නුම් කරයි. අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ වුවද බැංකුවේ මූලික ව්‍යාපාරයේ දිගුකාලීන තිරසාර බව පිළිබිඹු කරමින් බැංකුවේ වත්කම් සංයුතිය සාපේක්ෂ වශයෙන් නොවෙනස්ව පැවතුණි.

ණය සහ අනෙකුත් උපකරණ 2022 දී රු. ට්‍රිලියන 1.6 දක්වා සැලකිය යුතු ලෙස 44% කින් වර්ධනය වූ අතර, ශුද්ධ ණය සහ අත්තිකාරම් 4% කින් අඩුවීමක් දක්නට ලැබුණි, මූලික වශයෙන් ඉහළ පොළී පාලන තන්ත්‍රය සහ මධ්‍යස්ථ ණය රුචියක් ඇති කිරීමට හේතු වූ අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් මීට හේතු විය.

වත්කම්වල ගුණාත්මකභාවය

ආර්ථිකයේ මන්දගාමීත්වය හේතුවෙන් ක්ෂේත්‍රය පුරා වත්කම් වල ගුණාත්මක භාවයේ පිරිහීම කැපී පෙනෙන බැවින්, වත්කම් වල ගුණාත්මකභාවය වසර තුළ මූලික අවධානය යොමු කළ කරුණක් විය. බැංකුවේ තුන්වන අදියරේ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය රු. බිලියන 324.9 දක්වා 29% කින් වැඩි විය. අවදානම් අධීක්ෂණය සහ මධ්‍යස්ථ කිරීම සඳහා බැංකුව දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කළ අතර වසර තුළ සැලකිය යුතු හානිකරණය සඳහා වන ප්‍රතිපාදනයක් සිදු කරමින් ක්‍රියාශීලී ප්‍රවේශයක් ගත්තේය. ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙන් 2022 දී බැංකුවේ හානිකරණය සඳහා වන ප්‍රතිපාදන දෙගුණයකින් පමණ වැඩි විය. ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍රවල ගනුදෙනුකරුවන්ට නිරාවරණය වීම සැලකිල්ලට ගත යුතු කරුණක් වන අතර, ආයෝජන ආකාරයෙන් රජයට නිරාවරණය වීම සහ රජය සතු ව්‍යවසායන් වෙත ණය දීම. වසර කිහිපයක ආර්ථික ආතතිය සහ රජය විසින් ණය වගකීම් පැහැර හැරීම හෝ ප්‍රමාද කිරීම 2022 දී ණය හානිකරණය සඳහා වන ප්‍රතිපාදන සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයයි.

ද්‍රවශීලතාවය සහ ආයෝජන


2022 දී මූල්‍ය අංශයේ අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණක් වූයේ ද්‍රවශීලතාවයි. කෙසේ වෙතත්, බැංකුවට එහි දේශීය හා විදේශීය මුදල් ද්‍රවශීලතා තත්ත්වයන් නියාමන අවම මට්ටමට වඩා ඉහළින් පවත්වා ගැනීමට හැකි විය. බැංකුවේ තත්ත්වය සමීපව කළමනාකරණය කිරීම සහ ද්‍රවශීලතා පුරෝකථනය සමඟ සම්බන්ධ වූ අතර, අභියෝගාත්මක පරිසරයක් තුළ නියාමක සහ ක්ෂේත්‍රයේ ඉල්ලීම්වලට සුදුසු ලෙස ප්‍රතිචාර දැක්වීමට අපට හැකි විය.

ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා සහ ගනුදෙනුකාර ඉල්ලීම් සපුරාලීම සඳහා බැංකුවේ විදේශ මුදල් ද්‍රවශීලතා තත්ත්වය සුදුසු පරිදි වෙන් කර ඇත. වසර තුළ විවිධ ක්‍රියාමාර්ග හරහා ප්‍රේෂණ දිරිගැන්වීම සහ ඉදිරියට ගෙනයාම කෙරෙහි ද අපි අවධානය යොමු කළෙමු. ප්‍රේෂණ ගලා ඒම සහ මෙම ක්ෂේත්‍රයේ අබණ්ඩ වෙළඳපළ නායකත්වයට බැංකුවේ විදේශ මුදල් ද්‍රවශීලතාවයට සහාය විය.

වසර තුළදී රජයේ සුරැකුම්පත්වල ආයෝජනය රු. බිලියන 1,566.0 දක්වා 45% කින් වර්ධනය විය.

වගකීම් සහ ප්‍රාග්ධනය

වගකීම් සංයුතිය



16% ක සැලකිය යුතු වර්ධනයක් අත්කරගත් තැන්පතු වල ශක්තිමත් කාර්යසාධනය හේතුවෙන් මුළු වගකීම් වසර තුළදී රු. ට්‍රිලියන 4.1 දක්වා 13% කින් වර්ධනය විය. බැංකුවේ තැන්පතු පදනම වසර අවසන් වන විට රු. ට්‍රිලියන 3.3 දක්වා ළඟා වූ අතර එමඟින් අබණ්ඩ ගනුදෙනුකාර විශ්වාසය සහ ලංකා බැංකුවෙ හි වෙළඳපළ නායකත්ව තත්ත්වය පෙන්නුම් කරයි. වැඩිවන අනුපාත, ඉහළ උද්ධමනය සහ කොවිස් වෙළඳපළේ අස්ථාවරත්වය සමඟ සමපාත වන පරිදි ගනුදෙනුකරුවන්ගේ අවධානය ස්ථාවර තැන්පතු වෙත මාරුවීම සහ දේශීය මුදල් තැන්පතුවල වැඩිවීම ද මෙය පිළිබිඹු කරයි. ස්ථාවර තැන්පතු සඳහා ඇති ඉල්ලුම වැඩිවීම නිසා ලංකා බැංකුවේ කාල තැන්පතු පදනම පෙර වසරේ රු. ට්‍රිලියන 1.4 සිට 2022 දී රු. ට්‍රිලියන 1.6 දක්වා වර්ධනය වීමට හේතු විය. ඉහළ ජීවන

මූල්‍ය සමාලෝචනය

වියදම හේතුවෙන් ඉතුරුම් පදනමේ සමපාත අඩුවීම නිසා ජංගම සහ ඉතුරුම් ගිණුම් (CASA) අනුපාතය වසර තුළ 36% සිට 29% දක්වා අඩු විය. කෙසේවෙතත්, වෙළඳපළ තුළ පවතින ද්‍රවශීලතා ආතතිය නොතකා බැංකුව සිය ද්‍රවශීලතා තත්ත්වය උපායමාර්ගිකව කළමනාකරණය කළේය.

පීඩාවට පත් වූ ආර්ථික තත්ත්වයන් සහ ප්‍රාග්ධනය සැපයීමට හිතකර නොවන රජයේ මූල්‍ය තත්ත්වය අනුව, බැංකුව අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් සහ ලාභාංශ ගෙවීම් කළමනාකරණය තුළින් ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීමට උත්සාහ කළේය. ක්ෂේත්‍රය පුරා වත්කම්වල ගුණාත්මක භාවය පිරිහීම සමඟ සමපාත වූ ප්‍රාග්ධන අවශ්‍යතා මත ඇති වූ ආතතීන් හේතුවෙන් වර්ධන අපේක්ෂාවන් සීමා විය.

2022 දී බාසල් III අනුකූල යටත් කළ II මට්ටමේ ණයකර රු. මිලියන 6,490 ක් නිකුත් කිරීම මගින් බැංකුවේ ස්ථර II ප්‍රාග්ධනය වැඩි දියුණු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව වසරේ මැද භාගයේදී ප්‍රාග්ධන සංරක්ෂණ අවරෝදකය සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතා අඩු කිරීමට අවසර දෙන ලදී. කෙසේ වෙතත්, මෙම ලිහිල් කිරීම් භාවිතා නොකර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පවත්වා ගනිමින් වසර තුළදී කටයුතු කිරීමට අපට හැකි විය.

සමූහයේ කාර්යසාධනය

සමූහයේ කාර්යසාධනය සඳහා පරිපාලිත සමාගම්වල දායකත්වය 1% ට වඩා අඩු මට්ටමක පවතී. අවදානම්, යහපාලනය, මූල්‍ය, අභ්‍යන්තර පාලන සහ නීතිමය කාරණා යන ක්ෂේත්‍ර ආවරණය වන පරිපාලිත සමාගම් සඳහා කළමනාකරණ ක්‍රියාවලීන් සහ ප්‍රමිතීන් සකසන මනාව නිර්වචනය කරන ලද පරිපාලිත ප්‍රඥප්තියක් හරහා බැංකුව එහි පරිපාලිත ආයතන කළමනාකරණය කරයි.

වසර තුළ, ලංකා බැංකුවේ පරිපාලිත ආයතනයක් වූ සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම 2022 ඔක්තෝබර් 27 දින සිට කොළඹ කොටස් වෙළඳපළේ හි නිල ලැයිස්තුවෙන් ඉවත් කර ඇත. ඉවත් කිරීමේ ක්‍රියාවලිය යටතේ රු. මිලියන 287.9 ක කොටස් 1,573,272 ක් සමාගම විසින් නැවත මිලදී ගෙන ඇත. 2022 දෙසැම්බර් 31 වන දිනට නිකුත් කරන ලද සහ සම්පූර්ණයෙන් ගෙවා ඇති සාමාන්‍ය කොටස් සංඛ්‍යාව 64,426,728 ක් විය. ඉවත් කිරීමේ ක්‍රියාවලියත් සමඟ ලංකා බැංකුවෙ හි කොටස් හිමිකම 95.55% සිට 97.89% දක්වා වර්ධනය විය.

තවද, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා සහ ෆිනෑන්ස් පීවිල්සී විසින් වසර තුළ සුරුකුම් රහිත, යටත් කාලීන, මුදාගත හැකි, ලැයිස්තුගත ණයකර රු. මිලියන 67.7 ක් නිකුත් කරන ලදී.

ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික අවපාතය 2023 සහ ඉන් ඔබ්බට අපේක්ෂා කරන විට බැංකුවට අභියෝග ගණනාවක් ඉදිරිපත් කරයි, පවතින ආර්ථික අර්බුදයේ සම්පූර්ණ බලපෑම තවමත් දැකගත නොහැක. මෙම අවිනිශ්චිතතා සහ ඉදිරි වසර තුළ ආර්ථිකයේ ඇති විය හැකි පසුබෑම මධ්‍යයේ, බැංකුව 2023 දී මධ්‍ය කාලීන මධ්‍යස්ථ වර්ධනයක් කෙරෙහි අවධානය යොමු කරනු ඇති අතර එමඟින් එය රටේ පුනර්ජීවන පථය සමඟ වේගවත් කිරීමට හොඳින් ස්ථානගත වී ඇති බව සහතික කරයි.

රාජ්‍ය බැංකුවක් සහ වගකිවයුතු ආයතනික පුරවැසියෙකු වශයෙන්, අපි බැංකුවේ උපායමාර්ග සහ සැලසුම් ජාතික ප්‍රමුඛතා සමඟ පෙළගස්වා ඇත්තෙමු. 2023 සහ ඉන් ඔබ්බට අපගේ පාර්ශ්වකරුවන්ට හොඳම සේවය සැපයීම සඳහා අපි බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය සකස් කරමින් සිටිමු. ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධනය ප්‍රමුඛතා වෙන් කිරීම පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් ප්‍රශස්ත කිරීම මගින් රටේ අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරාලනු ඇත. ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීමට, ඔවුන්ගේ ව්‍යාපාර පුනර්ජීවනයට සහය වීමට සහ ඔවුන්ගේ දිගුකාලීන තිරසාරභාවය සඳහා අඛණ්ඩව උත්සාහයන් පුළුල් කිරීමට බැංකුව සැලසුම් කර ඇත.

බැංකුවේ පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තියට අනුව සහ තිරසාර මූල්‍ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ග සිතියමට අනුකූලව හරිත ණය දීම සහ පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධති භාවිතයන් පුළුල් කිරීමට අපි සැලසුම් කරමු.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සාම්ප්‍රදායික සහ සහස්‍ර ගනුදෙනුකරුවන්ට සේවය කරමින් බැංකුවේ වර්ධන අපේක්ෂාවන් කෙරෙහි ඉහළ අවධානයක් යොමු කරන අංශයක් වනු ඇත.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සහ අභ්‍යන්තර ක්‍රියාවලීන් අඛණ්ඩව ඩිජිටල්කරණයට ලක්වෙමින් පවතින අතර ඉදිරි වසර වලදී දැනුවත් සහ කාලෝචිත තීරණ ගැනීමට සහාය වීම සඳහා ඒවා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. ඊට අමතරව, විනිවිදභාවය, වගවීම සහ ආයතනික වගකීම යන බැංකුවේ ආචාරධර්මවලට අනුකූලව මූල්‍ය සහ තිරසාර වාර්තාකරණයේ ජාත්‍යන්තර හොඳම භාවිතයන් තහවුරු කිරීමට අපි කැපවී සිටිමු. බැංකුව 2023 සහ ඉන් ඔබ්බට ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි අවධානය යොමු කරනු ඇති අතර බැංකුවේ ස්ථායිතාව සහ කෙටි කාලීන ලාභයට වඩා ශේෂ පත්‍රයේ ශක්තියට ප්‍රමුඛත්වය දීම පිළිබඳව විමසිල්ලෙන් සිටියි.



ශාඛා බැංකුකරණය

ලංකා බැංකුවේ ශාඛා බැංකුකරණ අංශය පුද්ගලයන්, ව්‍යවසායකයින් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කර ගනිමින් ණය දීම, තැන්පතු සහ ගනුදෙනු බැංකු විසඳුම් මාලාවකින් සමන්විත වේ.

කාර්යසාධනයේ විශේෂ අවස්ථා 2022


ආකර්ෂණීය නව තැන්පතු නවයක් හඳුන්වා දෙන ලදී.

පෙර වසර හා සසඳන විට හරිත ණය කළඹ **7%** කින් වර්ධනය වී ඇත.

පෙර වසර හා සසඳන විට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය **88%** කින් වර්ධනය වී ඇත.

2022 වසරේදී ශාඛා ගෙවීම සඳහා හොඳම බැංකුව ලෙස ලංකා පේ ටෙක්නොලොජිස් සම්මාන උළෙලේදී පිදුම් ලබන ලදී.

ශාඛා බැංකුකරණ අංශයේ තැන්පතු හා ණය කළඹ



ලංකා බැංකුවේ ශාඛා බැංකුකරණ අංශය වෙළඳපලේ සැලකිය යුතු කොටසක් නියෝජනය කරන අතර බැංකුවේ මුළු ණය ප්‍රමාණයෙන් 36% කින් සමන්විත වේ. ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,000 කට අධික සංඛ්‍යාවක් සමඟින්, එය බැංකුව සිය ගනුදෙනුකරුවන් වෙත සේවය සපයන ප්‍රමුඛ නාලිකාවක් ද වේ. බැංකුව සිය විවිධාකාර ගනුදෙනුකාර පදනමට වටිනාකමක් ලබා දෙන සේවා සැපයීම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සඳහා, පිටු 78 සිට 88 වෙත යොමු වන්න.

මෙහෙයුම් සන්දර්භය

කොවිඩ්-19 වසංගතය සහ රටේ ආර්ථික අර්බුදයද අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය සහ දැඩි නියාමන පාලනයන්ද ශාඛා බැංකුකරණ අංශයට දැඩි ලෙස බලපෑවේය. පද්ධතිමය වශයෙන් වැදගත් ප්‍රමුඛ පෙළේ රාජ්‍ය බැංකුවක් ලෙස, 2022 වසරේ දී ලංකා බැංකුවේ අවධානය යොමු වූයේ රටේ ආර්ථිකයේ, ව්‍යාපාරවල සහ ප්‍රජාවන්ගේ යහ පැවැත්මට සහාය වීම කෙරෙහි ය.

අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය සහ මූල්‍ය අංශයේ ස්ථායීතාවයට ඇති අවදානම් සැලකිල්ලට ගනිමින්, ශාඛා බැංකුකරණ අංශය ව්‍යාපාරවලට සහ තනි ගනුදෙනුකරුවන්ට සහාය වීම කෙරෙහි අවධානය යොමු කිරීමට කටයුතු කළේය.

මෙහෙයුම් පරිසරයේ බලපෑම

- බලපෑමට ලක් වූ ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තත්ත්වයන්
- ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම පිළිබිඹු කරමින් උද්ධමනයේ තියුණු වැඩිවීමක්
- අරමුදල්වල පිරිවැය මත පොළී අනුපාත වැඩිවීමේ බලපෑම
- ක්ෂේත්‍රය පුරා වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම
- සමාජ දේශපාලන පෙරළිය හේතුවෙන් ව්‍යාපාර වල අඛණ්ඩ පැවැත්මට ඇති වූ අභියෝග

ව්‍යාපාරික අංශ සමාලෝචනය

උපායමාර්ගයට එරෙහි කාර්යසාධනය

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

- ඉන්ධන හිඟය සහ සමාජ-දේශපාලනික නොසන්සුන්තා මධ්‍යයේ වුවද, ව්‍යාපාර වල අඛණ්ඩ පැවැත්ම ප්‍රමුඛ කොට සහතික කර ඇත.
- පීඩාවට පත් වූ අංශවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අමතර ණය/මුදල් ලබා දීම.
- ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා "BOC ගම්මාන" හඳුන්වාදීම.
- මූල්‍යමය වශයෙන් බලපෑමට ලක්වූ ණය ගැතියන් සහ ව්‍යාපාර පසුබෑමකට ලක්ව සිටි අතර, ඔවුන්ගේ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම සඳහා සහාය ලබා දීමට ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය වෙත යොමු කරන ලදී.

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- ශාඛා ගනුදෙනුකරුවන් සඳහා සේවා සැපයීම වැඩිදියුණු කිරීමට ඩිජිටල් නිෂ්පාදන දියත් කරන ලදී.
- ඩිජි පෑඩ් භාවිතය පුළුල් කිරීම.
- BOC කනෙක්ට් පුළුල් කරන ලදී.
- ගනුදෙනුකාර – ඇතුළත්වීමේ ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම.
- අභ්‍යන්තර බැංකු ක්‍රියාවලි බොහෝමයක් ස්වයංක්‍රීය කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් සඳහා මාර්ගගත ණය අයදුම්පත් ක්‍රමය සක්‍රීය කිරීම.

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

- සංචාරක ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා නව සංවර්ධන ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම
- කෘෂිකර්මාන්තයේ, කුඩා තේ වතු හිමියන්ගේ සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ආයෝජන සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් සමඟ විශේෂ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය සැපයීම් තුළින් ශ්‍රී ලාංකීය කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා කාන්තාවන් මගින් මෙහෙයවන ව්‍යාපාර සඳහා වැඩි ණය පහසුකම් ලබා දීම.
- ව්‍යාපාර පුනර්ජීවනය තුළින් ප්‍රකෘතිමත් වීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- අක්‍රීය ණය පහසුකම් සඳහා නැවත සැලසුම් කළ පැකේජ දියත් කරන ලදී.
- ණය ගැතියන් මුහුණ දෙන අර්බුදකාරී මූල්‍ය ගැටළු වලට ප්‍රතිචාර වශයෙන් පුද්ගලික සහ විශ්‍රාමිකයින්ගේ ණය යෝජනා ක්‍රමවල විවිධ්‍ය පොළී අනුපාතය ස්ථාවර අනුපාතයකට වෙනස් කිරීම.
- ව්‍යාපාරවල ප්‍රක්ෂේපිත මුදල් ප්‍රවාහයන්ට අනුකූලව, ඉල්ලීම් මත පදනම්ව, බලපෑමට ලක් වූ ණය ගැතියන්ගේ පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම.

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැඟීම

- වෙනස් වන අභියෝගවලට මුහුණ දීම සඳහා කාර්ය මණ්ඩල භූමිකාවන් සමාලෝචනය කර නැවත සකස් කර ඇත.
- දුෂ්කර තත්ත්වයන් තුළ පුනර්ජීවන ඒකකවල සහ ශාඛාවල කාර්ය මණ්ඩලය ගනුදෙනුකරුවන් සමඟ සමීපව කටයුතු කරන ලදී.
- දුරස්ථ වැඩ කිරීමේ අවස්ථා ගවේෂණය කර තෝරාගත් අංශ සඳහා ආරම්භ කර ඇත.
- සේවක වේතන සහ ප්‍රතිලාභ වර්තමාන වෙළඳපළ අනුපාත සහ අවශ්‍යතා වලට සාපේක්ෂව සමාලෝචනය කරන ලදී.
- ගනුදෙනුකාර සේවයේ යෙදී සිටින සේවකයින්ට අවශ්‍ය පුහුණුව ලබා දී ඇත.

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- ව්‍යාපාර තිරසාරභාවය සහ ආංශික ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ඉලක්ක තාර්කික කිරීම.
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 9 විචක්ෂණ අධීක්ෂණ යාන්ත්‍රණය හඳුන්වා දෙන ලදී.
- විගණන සහ අනුකූලතා අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම.
- නව තැන්පතු සහ ණය දීම හරහා හරිත බැංකු සංකල්පය ප්‍රවර්ධනය කිරීම.

තැන්පතු

ශාඛා බැංකුකරණ අංශයේ තැන්පතු පදනම 2022 වසරේදී දැඩි අභියෝගාත්මක තත්ත්වයන් හමුවේ වුවද ආකර්ෂණීය කාර්යසාධනයක් පෙන්නුම් කළේය. ස්ථාවර තැන්පතු 29% කින් සහ මුළු තැන්පතු 20% කින් වර්ධනය විය. තැන්පතුවල සාර්ථකත්වයෙන් පිළිබිඹු කරන්නේ බැංකුව කෙරෙහි තබා ඇති ගැඹුරු විශ්වාසය, බැංකුවේ නිපැයුම් කළඹේ ශක්තිය සහ වෙනස්වන පරිසරයට සහ පොළී සහ විනිමය අනුපාතවල සීඝ්‍ර උච්චාවචනයන්ට ප්‍රතිචාර වශයෙන් නව නිෂ්පාදන ගණනාවකට පුරෝගාමී වීමට බැංකුවේ අඛණ්ඩ ක්‍රියාකාරී මැදිහත්වීමයි. 34% ක් වූ පංගම සහ ඉතිරිකිරීමේ තැන්පතු අනුපාතය මගින් වසර තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්, ව්‍යවසායකයින් සහ පුද්ගලික ගනුදෙනුකරුවන් මුහුණ දුන් අභියෝගාත්මක ව්‍යාපාරික පරිසරය පිළිබිඹු කරයි.

වසර තුළ හඳුන්වා දුන් නව තැන්පතු වර්ග

දින 100 තැන්පතු

දින 200 තැන්පතු

දින 400 තැන්පතු

ඩබල් යුවර් ඉන්වෙස්ට්මන්ට්

BOC රිලැක්ස්

BOC හරිත කැකුළු ළමා ඉතිරිකිරීමේ යෝජනා ක්‍රමය

BOC දියවර කැකුළු

BOC ඊ-තුරු හරිත ඉතිරිකිරීමේ ගිණුම

BOC මයි හේල්ත් ඉතිරිකිරීමේ ගිණුම

වසර තුළ නැවත දියත් කරන ලද නිපැයුම්

ස්මාර්ට් ඉන්වෙස්ටර්

ස්මාර්ට් ලේඩි

කාන්තා රන් ගිණුම්

ණය සහ අත්තිකාරම්


අවපාත ආර්ථික තත්ත්වයන්, නියාමන ක්‍රියාමාර්ග, ද්‍රවශීලතා පාලනය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය සහ වඩාත් දැඩි ප්‍රතිපාදන අවශ්‍යතා නිසා බැංකුවේ ශාඛා බැංකුකරණයේ ණය කළඹ දැඩි ලෙස බලපෑමට ලක් විය. කෙසේ වෙතත්, අභියෝග මධ්‍යයේ වුවද, අභියෝග ජය ගැනීම සඳහා ක්‍රියාශීලී සහ ප්‍රතිචාරාත්මක ක්‍රමවේද බැංකුව විසින් සොයා ගන්නා ලදී.

වර්ෂය තුළදී, විදුලි වාහන මිලදී ගැනීම සඳහා නිශ්චිත පිරිස් ඉලක්ක කරගනිමින් හරිත මූල්‍ය සඳහා කැපවූ ලීසිං පහසුකම් බැංකුව විසින් සපයන ලදී.

බලශක්ති මිල සහ ඉන්ධන ලබා ගැනීමේ හැකියාව කෙරෙහි බලපාන ලද ආර්ථික අර්බුදයත් සමඟ 2022 දී බැංකුවේ හරිත ණය සඳහා කැපී පෙනෙන යොමුවක් දක්නට ලැබුණි. පරිසර හිතකාමී විදුලි බයිසිකල්, ජීව වායු සහ සූර්ය බලශක්තිය වැනි පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් සමඟ සම්බන්ධ වූ ණය යෝජනා ක්‍රම වසර තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර හරිත ණය කළඹ වසර අවසන් වන විට රු. මිලියන 1,964.9 දක්වා ළඟා විය.

වසර පුරාවටම, බැංකුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සහ ව්‍යවසායකයින්ට අඛණ්ඩව සහයෝගය ලබා දෙමින් අර්බුදකාරී තත්ත්වයන්ට ලක් වූ ගනුදෙනුකරුවන්ට අවශ්‍ය ණය ලබා දුන්නේය. ලංකා බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කවය වැනි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහය දැක්වීම සඳහා වූ නව මුලපිරීම් සහ දිවි උදාන සහ BOC මිතුරු වැනි පවත්නා ණය යෝජනා ක්‍රම හේතුවෙන් 2022 වසරේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත රු. මිලියන 1,478 (88% ක වර්ධනයක්) ණය පහසුකම් ලබා දීමට හැකි විය.

වසර තුළ හඳුන්වා දුන් නව ණය දීමේ නිපැයුම්



සූර්ය බලශක්ති පද්ධති, විදුලි බයිසිකල්/මෝටර් බයිසිකල් සහ ජීව වායු ඒකක ස්ථාපනය සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක්.



සංචාරක අංශය සඳහා නව කාරක ප්‍රාග්ධනය සහ ප්‍රතිසංස්කරණ ණය යෝජනා ක්‍රමයක්.

ගනුදෙනු බැංකුකරණය

වැඩි දියුණු කරන ලද ගනුදෙනුකාර පහසුව සමඟින් ඩිජිටල්කරණය සහ ඩිජිටල් භාවිතය සඳහා වැඩි යොමුවක් අඛණ්ඩව පවත්වාගෙන යමින්, හර කාඩ් සහ ණය කාඩ් ගනුදෙනු පරිමාව 25% ක වර්ධනයක් වාර්තා කළ අතර 2022 වසරේ දී ගනුදෙනුවල වටිනාකම 27% කින් වර්ධනය විය. බැංකුවේ අන්තර්ජාල ගෙවීම් දොරටුව (IPG) සඳහා ද වැඩි ප්‍රවනතාවයක් හඳුනා ගැනීම හේතුවෙන් වෙළෙඳුන් 126 ක් වසර අවසන් වන විට බැංකුව සතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගනුදෙනු පරිමාවේ 38% ක වැඩිවීමක් සහ බැංකුවේ IPG හරහා පහසුකම් සපයන ගනුදෙනුවල වටිනාකම 100% කින් පමණ වැඩි විය. තවද, බැංකුවේ PoS යන්ත්‍රවල වෙළඳපළ විනිවිද යාම වසර තුළ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළ අතර, එය 2022 වසර අවසන් වන විට PoS යන්ත්‍ර 8,967 ක් විය.

ගනුදෙනු බැංකුකරණයේ වර්ධනය වන සාර්ථකත්වය වැඩි ඩිජිටල්කරණයක් කරා බැංකුවේ අඛණ්ඩ ගමනේ කොටසක් වන අතර හවුල්කරුවන් ගණනාවක් සමඟ සාමූහිකව සම්බන්ධ වීමේ ඍජු ප්‍රතිඵලයකි. ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ බැංකුවේ සම්බන්ධය පිළිබඳ වැඩි විස්තර සඳහා 114 පිටුව වෙත යොමු වන්න.



රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා "Affinity Card" දියත් කරන ලදී.


ව්‍යාපාරික අංශ සමාලෝචනය

වසර තුළ නව ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්

මාලදිවයිනේ හි පිහිටි බැංකුවේ විදේශ ශාඛාවේදී වෙළඳ බේරුම්කරණය, ප්‍රකාශ යැවීම සහ වෙළඳ කොමිස් ගණනය ස්වයංක්‍රීය කිරීම.

ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය හරහා රු. මිලියන 5 කට වැඩි වෙළෙඳ ගෙවීම් ස්වයංක්‍රීය කිරීම.

ජාත්‍යන්තර ගෙවීම් ක්‍රමයේ 3DS 2.0 සත්‍යාපන ප්‍රොටෝකෝලය වෙත ලියාපදිංචි වීම.



කාඩ්පත් සම්බන්ධ ගාස්තු සහ ගෙවීම් මතක් කිරීම් සඳහා ගනුදෙනුකරුවන්ට පණිවිඩ යැවීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම.

ස්ථාවර නියෝග ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම.

GoAML වාර්තාකරණයන් ආරම්භ කිරීම.

ණය සහන දීමනා සහ සහනාධාර

රට සහ ප්‍රජාව කෙරෙහි ගැඹුරු කැපවීම ප්‍රදර්ශනය කරමින් ලංකා බැංකුව සැමවිටම සිය ගනුදෙනුකරුවන් සමඟ සිටී. 2022 වසරේ දී අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් හමුවේ ගනුදෙනුකරුවන්ට සහ ව්‍යාපාරවල පැවැත්මට සහ පුනර්ජීවනයට සහාය වීම කෙරෙහි අවධානය යොමු කිරීමට බැංකුව උපායමාර්ගික තීරණයන් ගැනීම මේ සඳහා ඇති පැහැදිලිම සාක්ෂියයි. ණය සහන පමා කාලය දීර්ඝ කිරීම, ආපසු ගෙවීමේ කාල ලබා දීම, පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ව්‍යාපාර පුනර්ජීවනය සඳහා කාරක ප්‍රාග්ධනයට ප්‍රවේශය සහතික කිරීම මගින් වර්ෂය තුළ ප්‍රකෘතිමත් වීම සහ පුනර්ජීවනය සඳහා බැංකුව ප්‍රමුඛත්වය ලබා දුන්නේය.

2022 දෙසැම්බර් අවසානය වන විට, ශාඛා බැංකු කළඹෙන් 2% ක් ණය සහන පමා කාල ලබා දුන් ණය යටතේ පැවතුනි. මෙය 2021 දෙසැම්බර් වන විට 5% ක් ව පැවතුණි.

පොළී අනුපාතවල අනපේක්ෂිත වැඩිවීම විචල්‍ය අනුපාත මත ණය ලබාගත් පුද්ගලික ණය ගනුදෙනුකරුවන්ට සෘණාත්මකව බලපෑවේය. අරමුදල් පිරිවැයේ දැවැන්ත වැඩිවීම්වලට බැංකුව මුහුණ දී තිබියදීත්, එවැනි ගනුදෙනුකරුවන් මත ඇති පීඩනය අවම කිරීම සඳහා බැංකුව අවශ්‍ය පොළී අනුපාත පහසුකම් ලබා දුන්නේය. ඒ අතරම, අරමුදල් පිරිවැය ඉහළ ගියද, ස්ථාවර අනුපාත යටතේ ලබා දුන් ණය වලෙසින්ම පවත්වා ගැනීමට බැංකුව තීරණය කරන ලදී. ගනුදෙනුකරුවන්ට බැංකුවෙන් ලබා දුන් සහනදායී සහයෝගය සහ එහි ව්‍යාපාර පුනර්ජීවන ප්‍රයත්නවල සාර්ථකත්වය පිළිබඳ වැඩි විස්තර සඳහා 82 පිටුව වෙත යොමු වන්න.

ණය කළඹේ ගුණාත්මකභාවය

වත්කම් වල ගුණාත්මකභාවය පිරිහීමට එරෙහිව ක්‍රියාශීලී පාලනයන් සහ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීමට උත්සාහ දැරුවද, ක්ෂේත්‍රය පුරා ණය කළඹේ ගුණාත්මකභාවය කෙරෙහි ඇතිවූ බලපෑම සැලකිය යුතු විය.

පෙර වසරේ මෙන්ම, 2022 වසරේ දී ද බැංකුවේ අවධානය යොමු වූයේ ව්‍යාපාර පුනර්ජීවනය සහ ගනුදෙනුකරුවන්ගේ දිගු කාලීන තිරසාරත්වය උදෙසාය. වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමට එරෙහිව බැංකුවේ මූලපිරිම් සහ යහපාලනයන් පිළිබඳ වැඩි විස්තර සඳහා 82 පිටුව වෙත යොමු වන්න.

අවදානම්

- බැංකුවේ ශාඛා ගනුදෙනුකරුවන්, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, පවතින අර්බුදයෙන් හා ජීවනෝපායන් සහ ව්‍යාපාර පවත්වාගෙන යාමට අරගල කරමින් දැඩි ලෙස පීඩාවට පත්ව සිටිති. වැඩිවන මෙහෙයුම් පිරිවැය දැනටමත් පොළී ආන්තිකයට අහිතකර බලපෑම් එකතු කරන අතර ව්‍යාපාර වල අබණ්ඩ පැවැත්මට තර්ජනය කරයි.
- තනි පුද්ගල ශාඛා ගනුදෙනුකරුවන් අර්බුදයෙන් දැඩි ලෙස පීඩාවට පත් වී ඇති අතර, අඩු ආදායම් සහ ඉහළ ගිය ජීවන වියදම් හේතුවෙන් නව ණය වෙත ප්‍රවේශ වීමට හෝ ආපසු ගෙවීමේ හැකියාවක් නොමැත.
- ආනති සහගත ආර්ථික පරිසරය සහ මූල්‍ය අංශයේ සංවේදීතාව සැලකිල්ලට ගනිමින්, ඉදිරි මාසවලදී ණය-වර්ධනය සහ ව්‍යාප්තිය අඩාල වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- ද්විත්ව ඉලක්කම් උද්ධමනය, නොකඩවා පවතින ඉහළ පොළී අනුපාත සහ විනිමය අනුපාත උච්චාවචනයන් අරමුදල් පිරිවැය සහ ණය ගැනීම සම්බන්ධයෙන් ක්ෂේත්‍රයට අභියෝග කරයි.
- දිග්ගැස්සෙන අර්බුදය සහ පීඩාවට පත් ආර්ථිකය හේතුවෙන් අවදානමට ලක්විය හැකි අංශ සහ සමාජයේ කොටස් සඳහා අබණ්ඩ අභියෝග ඇති වන බැවින්, ගනුදෙනුකරුවන් තවදුරටත් සහන අපේක්ෂා කළ හැකිය.

අවස්ථාවන්

- සංශෝධිත මුදල් ප්‍රවාහ සහ ශක්තිමත් ව්‍යාපාර සැලසුම් මත පදනම්ව කර්මාන්ත සහ ව්‍යවසායන් සඳහා ණය දීමේ අවස්ථා උදා විය හැක.
- අර්බුදයට මුහුණ දීමට සහ දිගුකාලීන ගමන් පථයක මෙහෙයුම් විසඳීමට හැකි ව්‍යාපාර සඳහා ඒකාබද්ධ කිරීම හරහා වර්ධන අවස්ථා උදා විය හැකිය.
- නව වෙළඳපළ කොටස් තුළ මූල්‍ය ඇතුළත් කිරීම් හරහා අවස්ථා පුළුල් කළ හැකි වීම.
- හරිත නිෂ්පාදන මූලපිරීම් හරහා ව්‍යාපාර පුළුල් කිරීමට අවස්ථා ඇති වීම

ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකුව ලෙස, ලංකා බැංකු ගනුදෙනුකරුවන්ගේ, රටෙහි සහ ප්‍රජාවගේ පුනර්ජීවනය සහ ශක්තිමත් නැගීසිටීම සඳහා සහාය වීමට කැපවී සිටී.

ශාඛා ගනුදෙනුකරුවන් අතර තැන්පතු සහ ණය පහසුකම් හරහා හරිත නිෂ්පාදන සංචලනය වැඩි කිරීමට බැංකුව සිය උත්සාහයන් දිගටම කරගෙන යනු ඇත.

විශේෂයෙන් අවිධිමත් අංශ සඳහා මූල්‍ය ඇතුළත් කිරීම් පිළිබඳ ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව කටයුතු කරනු ඇත.

ශාඛා කටයුතු සඳහා වඩා හොඳ පිරිවැය ඵලදායී සේවාවන් සැපයීමට සහ පුළුල් කිරීමේ මාර්ගයක් ලෙස BOC කනෙක්ට් භාවිතා කරනු ඇත.

බැංකුවේ ශාඛා බැංකුකරණ අංශය ගනුදෙනුකාර සේවා වැඩිදියුණු කිරීමේ දිගු කාලීන ගමනක යෙදෙන අතරම ඩිජිටල්කරණය සහ විශාල ඩිජිටල් හුරුවීමක් තුළින් උද්ගතවන අවස්ථා උපයෝගී කර ගැනීමට අදහස් කරයි.

ශාඛා ගනුදෙනුකරුවන් සමඟ ලංකා බැංකුවේ ශක්තිමත් සබඳතාව, නිෂ්පාදන සහ ස්ථානගත කිරීම් සඳහා ක්‍රියාශීලී සහ නව්‍ය ප්‍රවේශයක් සමඟින්, අනාගතයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතියට සහය දැක්වීමේ හැකියාව සහතික කරයි.

ව්‍යාපාරික අංශ සමාලෝචනය


ආයතනික හා අක්වෙරළ බැංකුකරණය

බැංකුවේ ආයතනික සහ අක්වෙරළ බැංකු අංශය පෞද්ගලික අංශයට සහ රාජ්‍ය අංශයට ව්‍යාපෘති ණය දීම, වෙළඳ මූල්‍යකරණය සහ අක්වෙරළ බැංකු පහසුකම් ඇතුළුව විවිධ මූල්‍ය සේවා සපයයි. මෙම අංශයේ විශාලතම ණය දෙන්නන් අතරින් ප්‍රධානියෙක් ලෙස, ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන ව්‍යවසායන් සඳහා සහාය වෙමින් වෙළඳපළ ක්‍රියාකාරකම්වල උත්ප්‍රේරක භූමිකාවක් ඉටු කරයි.

කාර්යසාධනයේ විශේෂ අවස්ථා 2022

- ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) සහ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහනදායී අරමුදල් මාර්ගවල සාර්ථක පරිශීලනය
- ලංකා බැංකුවේ අපනයන කවය හඳුන්වා දෙන ලදී
- මාලදිවයිනේ ව්‍යාපෘති සඳහා සාර්ථක හවුල්කාරිත්ව සහ ගනුදෙනු විධිවිධාන ක්‍රම දෙකක් හඳුන්වා දීම

ආයතනික සහ අක්වෙරළ බැංකු අංශයේ තැන්පතු සහ ණය කළඹ



ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම ණය දෙන්නා වන අතර, 2022 අවසානයේ දී රු. ට්‍රිලියන 4 කට අධික වත්කම් පදනමක් ඇත. ලංකා බැංකුවේ ආයතනික බැංකු අංශය විශාලතම කර්මාන්ත, ආයතන සහ ව්‍යාපෘති සඳහා සහාය දක්වයි. මෙය සමස්ත සැපයුම් දාමයට බලපාන අතර මිලියන ගණනක ශ්‍රී ලාංකිකයන්ගේ රැකියා සඳහාද දායක වෙයි. අක්වෙරළ බැංකු අංශය, ලංකා බැංකුව මෙන්ම රටේද විදේශ විනිමය අවශ්‍යතා සඳහා සහායවේ. 2022 දී, මෙම අංශය බැංකුව වෙත විදේශ විනිමය 50% කට වඩා ගලා ඒමට දායක වූ අතර, වසර තුළ ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමෙන් දළ වශයෙන් 10% කට පමණ දායක විය. ආයතනික සහ අක්වෙරළ අංශය බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් වලින් 55%ක්, පොළී ආදායමෙන් 56% ක් සහ මුළු තැන්පතු පදනමෙන් 30% ක් සඳහා දායක වේ.

අභියෝගාත්මක වසරක් සහ මෙහෙයුම් සඳහා දැඩි සීමාවන් තිබියදීත්, මෙම අංශය ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සහ කර්මාන්තවල හදිසි අවශ්‍යතා සපුරාලීමට සමත් වූ අතර, සමස්ත ආර්ථිකයේ සුමට ක්‍රියාකාරිත්වයට සහ ව්‍යාපාරවල තිරසාරභාවයට සහාය වේ.

මෙහෙයුම් සන්දර්භය

කොවිඩ්-19 වසංගතයේ වසර දෙකක් තිස්සේ පැවතුණු පීඩනයෙන් පසුව, ශ්‍රී ලංකාව 2022 දී වර්ධනය වන උද්ධමනය සහ විනිමය අනුපාත සහ පොළී අනුපාතවල අනපේක්ෂිත වැඩිවීම ඇතුළු බහුවිධ බාධා කිරීම් සහ අර්බුදවලට මුහුණ දුන්නේය. ව්‍යාපාර සඳහා, මෙම පෙර නොවූ විරූ අභියෝගවල ප්‍රතිඵලය වූයේ තරඟකාරිත්වය ගිලිහීම, ප්‍රාග්ධන පිරිවැය වැඩිවීම, කාරක ප්‍රාග්ධනය සහ මුදල් ප්‍රවාහ ගැටළු සහ දුෂ්කරම අවස්ථාවන්හිදී: ව්‍යාපාර අසාර්ථක වීම සහ වසා දැමීමට සිදු වීමයි.

වසර තුළ ආනයන සීමා කිරීම් අඛණ්ඩව පැවතීම වෙළඳ මූල්‍ය අවස්ථා කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළ අතර ව්‍යාපෘති නැවැත්වීම, අත්හිටුවීම හෝ මන්දගාමී වීම හේතුවෙන් ව්‍යාපෘති මූල්‍යකරණය සීමා කළේය. ඒ අතරම, විදේශ විනිමය ද්‍රවශීලතා ගැටළු සහ පොළී අනුපාත ඉහළ යාමත් සමඟ අක්වෙරළ බැංකුකරණය සඳහා ඇති අවස්ථා සීමිත විය.

මෙම පීඩන මධ්‍යයේ වුවද, බැංකුවේ ආයතනික සහ අක්වෙරළ බැංකු අංශයට ගනුදෙනුකරුවන්ට, ප්‍රජාවන්ට සහ රටට සහාය වීමට අවස්ථාවන් ලබා ගැනීමට හැකි විය. එමෙන්ම අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සහතික කිරීමට පහසුකම් සලසා ඇත. තවද ද්විපාර්ශ්වික සහ සහනදායී අරමුදල් මාර්ග ගවේෂණය කර සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. අර්බුදවලට ගොදුරු වූ ව්‍යාපාරවලට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා කෙටි කාලීන අරමුදල් සපයා ඇති අතර, බලපෑමට ලක් වූ කර්මාන්තවල සැපයුම් දාමය හරහා බහුවිධ සේවා මධ්‍යස්ථාන හරහා තවදුරටත් සහාය ලබා දෙන ලදී. ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා දේශීය ධාරිතාව සහ ප්‍රවීණතාවයෙන් යුත් නව සහ නැගී එන කර්මාන්ත සඳහා සහාය ලබා දෙන ලදී. මුළු කාලය තුළම බැංකුව දැඩි අධීක්ෂණයක් ආරම්භ කර, ගනුදෙනුකාර පහසුව සඳහා නව විශේෂාංග හඳුන්වා දුන් අතර, කාර්යසාධන කාණ්ඩයේ ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට ප්‍රතිසාධන සහතික කරන අතරම ව්‍යාපාර පුනර්ජීවනයට ප්‍රමුඛත්වය දීමට ගනුදෙනුකරුවන් සමඟ සමීපව කටයුතු කළේය.

මෙහෙයුම් පරිසරයේ බලපෑම

- වත්කම්වල ගුණාත්මක භාවය පිරිහීම සහ දළ අක්‍රිය ණය අනුපාතය (NPA) වැඩි වීම
- අරමුදල්වල පිරිවැය වැඩි වීම
- වඩාත් ආකර්ෂණීය වෙළඳපළවල් හේතුවෙන් අක්වෙරළ බැංකු අංශයට ඇති තරඟය
- ආනයන සීමා කිරීම් නව සහ නැගී එන දේශීය කර්මාන්තවල වර්ධනයට හේතු විය
- ශ්‍රී ලංකා රුපියල විවිල්‍යවීම හේතුවෙන් අපනයන පරිමාව ඉහළ යාම

උපායමාර්ගයන්ට එරෙහිව කාර්යසාධනය

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

- නැවත ගෙවීමේ සහන කාල ලබා දීම සහ සහන ලබා දීම
- පවතින පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම.
- බලපෑමට ලක් වූ අංශවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අමතර ණය/මුදල් ලබා දීම.
- අපනයන ව්‍යාපාර සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශ සැපයීම.
- මහජන අවශ්‍යතා සපුරාලීම සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා තීරණාත්මක විදේශ විනිමය ලබා දීම.

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- ආයතනික ගනුදෙනුකරුවන් සඳහා ස්මාර්ට් ඔන්ලයින් ද්වාරය 2022 දී ආරම්භ විය.
- බහු ගනුදෙනුකරුවන් මුහුණ දෙන බැංකු ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කිරීම.
- බහු අභ්‍යන්තර බැංකු ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කිරීම.
- වෙළඳ මූල්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීම.
- ණය ලබාදීම ස්වයංකෘත කිරීම සිදුවෙමින් පවතී.

ණය සංස්කෘතිය සහ ගුණාත්මකභාවය

- වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමට එරෙහිව ක්‍රියාශීලී පාලනයන් සහ පියවර ගන්නා ලදී.
- ඇණවුම් සහ මුදල් ප්‍රවාහ දැඩි අධීක්ෂණය මඟින් කාර්යසාධන කාණ්ඩයේ ප්‍රතිසාධන සහ පවත්වාගෙන යන ණය සඳහා සහාය විය.
- වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට දායක වූ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැගීම

- අතථ්‍ය රැස්වීම් විධිමත් කිරීම, සාකච්ඡා කළ ඉලක්ක, සහ කාර්ය මණ්ඩලය සම්මත වේලාවෙන් ඔබ්බට සේවයට කැපවීමක් පෙන්නුම් කරයි.
- සේවාදායක අවශ්‍යතා සඳහා කාර්ය මණ්ඩලය ප්‍රශංසනීය ප්‍රතිචාර දැක්වීමක් පෙන්නුම් කළේය.
- ඵලදායිතා වැඩිදියුණු කිරීමේ මුලපිරීම් සිදු කරන ලදී.
- දුරස්ථ වැඩ කිරීමේ අවස්ථා ගවේෂණය සහ නියමු.
- සේවක වේතනය සහ ප්‍රතිලාභ වත්මන් වෙළඳපළ අනුපාත සහ අවශ්‍යතා වලට සාපේක්ෂව සමාලෝචනය කෙරේ.

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- SLFRS 9 විචක්ෂණ අධීක්ෂණ යාන්ත්‍රණය හඳුන්වාදීම.
- බැංකුවේ චෙන්නායි ශාඛාවේ මෙහෙයුම් සඳහා නොස්රෝ පහසුකම දියත් කරන ලදී.
- ණය අයකර ගැනීමට වඩා, පුනර්ජීවනය සඳහා ව්‍යාපාරවලට සහාය වීම කෙරෙහි අවධානය යොමු කිරීම.

පුද්ගලික අංශයේ ණය දීම

පුද්ගලික අංශයට ණය දීම 2022 දී ක්ෂේත්‍රයේ මුළු ණය කළඹෙන් 30% ක් වූ අතර, එය 15% ක වර්ධනයක් පිළිබිඹු කරයි, නව ගනුදෙනුකරුවන් ඇතුළු වී ඇති බව, ගවේෂණය කරන ලද ව්‍යාපාර, නැගී එන කර්මාන්තවලට සහාය වීම සහ කාරක ප්‍රාග්ධන මූල්‍යකරණය අර්බුදකාරී ව්‍යාපාර සඳහා ව්‍යාප්ත විය.

ස්වෛරී ශ්‍රේණිගත කිරීම සහ සීමිත විදේශ විනිමය ද්‍රවශීලතාවය පහත හෙළීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය ව්‍යාපාර ණයවර ලිපි (LCs) සහ ඇපකර ලිපි (LGs) පිළි නොගැනීම, ජාත්‍යන්තර බැංකුවලින් ණය සීමාවන් සීමා කිරීම සහ 100% ආන්තික පවත්වා ගැනීමේ අවශ්‍යතා වැනි ගැටළු වලට මුහුණ දීමට සිදු විය. මෙම තත්ත්වය තුළ, කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා කෙටි කාලීන අරමුදල් සහාය ඇතිව ව්‍යාපාර සඳහා සහාය වීමට බැංකුවට හැකි විය.


ව්‍යාපාරික අංශ සමාලෝචනය

ජාත්‍යන්තර බැංකු සමඟ ආධාර නොවන අරමුදල් විශාල වශයෙන් සොයා ගැනීමට නොහැකිව තිබියදීත් ඇඟලුම්, ඉදිකිරීම්, සංචාරක, පොහොර සහ තවත් බොහෝ දේ ඇතුළුව පුද්ගලික අංශයේ දැඩි ලෙස පීඩාවට පත් වූ කොටස් වෙත සහාය ලබා දෙන ලදී. වෛද්‍ය නිපැයුම් නිෂ්පාදනය ඇතුළු නිෂ්පාදන අංශයේ නව ව්‍යාපෘති සඳහා බැංකුව විසින් ප්‍රධාන පෞද්ගලික අංශයේ ණය ලබා දෙන ලදී.

2022 වසරේ ඇති වූ ප්‍රධාන සාර්ථකත්වයක් වූයේ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) හරහා දේශීය ව්‍යාපාර සඳහා සහනදායී අරමුදල් මාර්ග පිළිබඳ සාකච්ඡා කිරීමයි. ලංකා බැංකුවේ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති (ESMS) ප්‍රතිපත්තිය බහුපාර්ශ්වික ණය දෙන්නන්ගේ අවශ්‍යතා සමඟ සමපාත වූ අතර පාරිසරික සහ සමාජීය (E&S) සාධක සඳහා ණය පිරික්සීමට හැකියාව ලබා දුන්නේය. මේ සම්බන්ධයෙන් බැංකුවේ උත්සාහයන් පිළිබඳ වැඩි විස්තර සඳහා 103 පිටුව බලන්න.

ආයතනික සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශවල දිවයින පුරා කොවිඩ් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා උප-ණය ගැණුම්කරුවන්ට ණය ලබා දීම සඳහා AIIB වෙතින් ඇ.ඩො. මිලියන 90 ක සහනදායී ණය මාර්ගයක් සුරක්ෂිත කර ඇත. එම ණය මාර්ග සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යවසායන් සඳහා මූල්‍ය ආධාර සඳහා ප්‍රමුඛත්වය දී ඇත.

ආසියානු යටිතලපහසුකම් ආයෝජන බැංකුවේ අරමුදල් සපයන ලද අංශ



රු. බිලියන 22.4 ක ණය 775 ක් ප්‍රදානය කිරීම සහ අවම අක්‍රීය ණය පවත්වා ගනිමින් වසංගතයේ සෘණාත්මක බලපෑම් මධ්‍යයේ ව්‍යවසායන්ට ඔරොත්තු දීමට ලංකා බැංකුව සහාය විය.

ලංකා බැංකුවේ සංයුක්ත විසඳුම් සහ ව්‍යවසායකයින් සමඟ ඇති ශක්තිමත් ව්‍යාපාරික සබඳතා නිසා ව්‍යවසායන් ලාභදායීව පවත්වා ගැනීමටත්, ඔවුන්ගේ ව්‍යාපාර තිරසාර ලෙස පවත්වාගෙන යාමටත් හැකියාව ලැබී ඇත.

ව්‍යාපෘති මූල්‍යකරණය

බොහෝ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සහ ඉදිකිරීම් ව්‍යාපෘති නැවැත්වීම, සෘජු විදේශ ආයෝජන අඩුවීම සහ දේශීය ආයෝජන සඳහා බලා සිටීමේ ප්‍රවේශය 2022 වසර තුළ ව්‍යාපෘති මූල්‍යකරණයේ විෂය පථය සීමා කිරීමට දායක වී ඇත.

අපනයන මත පදනම් වූ නිෂ්පාදන කර්මාන්ත, සෘජු විදේශ ආයෝජන හරහා අර්ධ වශයෙන් මූල්‍යකරණය කරන ලද මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති, ආනයන ආදේශක ලෙස භාවිත කළ හැකි සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදන සහ පුනර්ජනනීය බලශක්ති අංශය දියුණු කිරීම සඳහා මූල්‍ය ආධාර සඳහා බැංකුව හවුල් විය.

කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය කිරීම, විදුලි බයිසිකල් සහ ඒ ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය කිරීම, ජාතියේ අභිවෘද්ධිය සඳහා විදේශ විනිමය ඉපැයීමට සහ ඉතිරි කිරීමට හැකි අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති ඇතුළුව නැගී එන වෙළඳපළ තුළ ශක්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශක සේවා ද ලංකා බැංකුව විසින් සපයන ලදී.

සෑම ව්‍යාපෘතියක් සඳහාම පාරිසරික හා සමාජීය (E&S) පරීක්ෂාව සහ ඉහළ මට්ටමේ තිරසාරත්ව කමිටුවක් මගින් ඉහළ අවදානම් සහිත ව්‍යාපෘති සමාලෝචනය කිරීමෙන් අනතුරුව. බැංකුවේ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති (ESMS) ප්‍රතිපත්තිය ව්‍යාපෘති මූල්‍යකරණයේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. රටෙහි තිරසාර සංවර්ධනය සඳහා වන කැපවීමට අනුකූලව ලංකා බැංකුව ජාතික පාරිසරික පනතේ මාර්ගෝපදේශවලට අනුකූල වේ.

2022 දී ව්‍යාපෘති මූල්‍යකරණයේ විශේෂ අවස්ථා තුළ පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- නැව් තැනීමේ අංශය, මුහුදු යට කේබල් එලීම සම්බන්ධිත නැව් මෙහෙයුම් සඳහා සාර්ථක ලෙස මූල්‍යකරණය සැපයීම.
- රටේ ප්‍රධාන ජල අංශයේ ව්‍යාපෘති සඳහා සහාය සැපයීම.
- ප්‍රධාන නිශ්චල දේපළ සහ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛ බැංකුකාර භූමිකාවක් ලෙස හවුල් විධිවිධාන ඇතුළු නිශ්චල දේපළ අංශයේ සහය.
- මෝටර් රථ ආශ්‍රිත කර්මාන්ත සහ අනෙකුත් අපනයන නැඹුරු අගය එකතු කළ ව්‍යාපාරවල මහා පරිමාණ නිශ්පාදන සඳහා මූල්‍ය සහාය.
- දේශීය කොන්ත්‍රාත්කරුවන් විසින් නිම කරන ලද මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටසක් ඉදිකිරීම සඳහා සහය ලබාදීම.

වෙළඳ මූල්‍යකරණය

බැංකුවෙහි ජාතික කැපවීමේ කොටසක් ලෙස, ඉන්ධන, දියර පෙට්‍රෝලියම් ගෑස්, ආහාර ද්‍රව්‍ය, චීන්නත්, ඖෂධ සහ තවත් දෑ ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනයට සම්බන්ධ රජයේ ප්‍රමුඛතා අංශ වෙත බැංකුව අඛණ්ඩව සහයෝගය ලබා දුන්නේය.

හුවමාරු විධිවිධානවල සිට බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ණය මාර්ග සක්‍රීය කිරීම දක්වා, ලංකා බැංකුව ජාතික අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය ලබා දුන් අතර, එම ක්‍රියාවලියේදී බොහෝ විට අධික ආනයන බිල්පත් දරන ලදී. බැංකුවේ දැඩි අභ්‍යන්තර පාලනයන් සහ දැඩි අධීක්ෂණය මගින් වෙළෙඳ මූල්‍යකරණ ප්‍රයත්නවල සාර්ථකත්වය සහතික කළ අතර, බැංකුවේ දිගුකාලීන තිරසාරභාවයට ප්‍රයෝජනවත් වන ව්‍යාපාර සහ අභ්‍යන්තර ගනුදෙනුකරුවන් ප්‍රචාරණය කිරීමට මෙම අංශය අවස්ථාව යොදා ගත්තේය.

2022 වර්ෂය තුළදී, ලංකා බැංකුව අපනයනය-නැඹුරු ආරම්භක සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහය දැක්වීමට ප්‍රමුඛත්වය දුන් අතර සුළු අපනයනකරුවන් සඳහා පෙර හා පසු මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය ලබා දුන්නේය.

අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) වැනි ප්‍රධාන රාජ්‍ය ආයතන සහ අවශ්‍ය වෙළඳ සංගම් සමඟ සම්බන්ධ වන අපනයන සහ ඒ ආශ්‍රිත උපදේශන සේවා පිළිබඳ මාර්ගෝපදේශය බැංකුවේ අපනයන කවය මඟින් ලබා දුන්නේය. මේ සම්බන්ධයෙන් බැංකුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ප්‍රධාන අපනයන ගනුදෙනුකරුවන් වෙත රු. බිලියන 1.2 ක් ලබා දී ඇත.

අක්වෙරළ බැංකුකරණය

2022 දී විදේශ මුදල් ද්‍රවශීලතා ගැටළු සහිත අභියෝගාත්මක පරිසරයක් මධ්‍යයේ, බැංකුවේ අක්වෙරළ බැංකු අංශය අපනයනය ඉලක්ක කරගත් කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා අපනයනකරුවන්ට විදේශ මුදල් ප්‍රමාණය අනුව විදේශ මුදල් ප්‍රේෂණ සඳහා මූල්‍ය ආධාර සහ පහසුකම් සැලසීම අබණ්ඩව සිදු කළ අතර එමඟින් ආර්ථිකයේ අපනයන ආදායම ඉහළ ගියේය.

වසරේ ප්‍රධාන විශේෂත්වය වූයේ මාලදිවයින් ජනරජයේ විශාල ව්‍යාපෘති දෙකක් සඳහා අරමුදල් ලබාදීම සාර්ථකව නිම කිරීමයි. එක් ව්‍යාපෘතියක් ඒකාබද්ධ ණය විධිවිධානයක් යටතේ මූල්‍යකරණය කරන ලද අතර, ලංකා බැංකුවේ අක්වෙරළ බැංකු අංශය මෙහි ප්‍රධාන සංවිධායකයා වූ අතර අනෙක් ව්‍යාපෘතිය විශේෂ ගිවිසුමක් හරහා මූල්‍යකරණය කරන ලදී.

ණය කළඹේ ගුණාත්මකභාවය

2022 අවසානය වන විට අර්බුදකාරී අංශ සඳහා ලබා දී ඇති ණය සහනකාල පමා සහිත ණය ප්‍රමාණය රු. බිලියන 50.6 ක් වේ. (සංචාරක අංශය: 40%, නිෂ්පාදන අංශය: 20%, ඉදිකිරීම් අංශය: 13%, වෙළඳාම සහ වෙනත්: 27%) වේ. මේ අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ වුවද, ව්‍යාපාර පැවැත්ම සහතික කිරීම සහ බැංකුවේ ක්‍රීය වත්කම් (NPA) කළමනාකරණය කිරීම සඳහා බැංකුව ගනුදෙනුකරුවන් සමඟ සමීපව සම්බන්ධ වෙමින් අබණ්ඩව කාරක ප්‍රාග්ධනය සඳහා සහාය ලබා දුන්නේය.

අවදානම්

- බැංකුවේ සමහර ආයතනික ගනුදෙනුකරුවන් ආර්ථික අර්බුදය හමුවේ ව්‍යාපාර අසාර්ථක වීම/වසා දැමීම බරපතල තර්ජනයකි.
- අබණ්ඩව ඉහළ යන උද්ධමනය අනුපාතය, අබණ්ඩව ඉහළ යන පොළී අනුපාත සහ විනිමය අනුපාත සමඟ සම්බන්ධ වීම සමස්ත අංශයටම විශාල අභියෝගවලට තුඩු දිය හැකි කරුණක් විය.
- මන්දගාමී ආර්ථික ප්‍රකෘතිය සහ පුනර්ජීවනය විවිධ අංශ හරහා ණය කළඹේ ගුණාත්මක භාවයට අහිතකර ලෙස බලපෑ හැකිය.

අවස්ථාවන්

- අපනයන කෙරෙහි නව අවධානයක් යොමු කිරීම, නව සහ නැගී එන කර්මාන්ත සහ අගය එකතු කළ නිෂ්පාදන ඇතුළුව ශ්‍රී ලංකාවේ අපනයන අංශය පුළුල් කිරීමට හැකියාව ඇත.
- ආර්ථිකයේ පුනර්ජීවනය පුද්ගලික අංශයේ ණය දීමේ වර්ධනය සඳහා නිසි ලෙස ස්ථානගත කිරීමට බැංකුවට අවස්ථාව ඇත.
- සංචාරක අංශය වැනි ප්‍රධාන අංශ කෙටි කාලයක් තුළ සැලකිය යුතු වර්ධන විභවයක් ලබා දීමට පොරොන්දු වී ඇති අතර හොඳින් ස්ථානගත වුවහොත් එය ප්‍රතිලාභයක් විය හැකිය.

ඉදිරි දැක්ම

2022 දී මුහුණ දුන් ආර්ථික අර්බුදය සාර්ථක ලෙස පසුකිරීමෙන් පසු, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිය කරා යන ගමනේ දී ඇති වන අවස්ථා මඟින් උපරිම ප්‍රයෝජන ගැනීමට බැංකුව හොඳින් සූදානම් වේ. පුද්ගලික අංශයේ ප්‍රධාන ණය දෙන්නෙකු ලෙස බැංකුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ සහ ව්‍යාපාරවල පුනර්ජීවනය පෙළගැස්වීම සඳහා ශක්තිමත් සහ තරඟකාරී ස්ථානයක් රඳවා ගනී.

ආයතනික සහ අක්වෙරළ බැංකු අංශය පුළුල් කිරීම සඳහා මුදල් ප්‍රවාහය පදනම් කරගත් ව්‍යාපෘතිය සහ ඒකාබද්ධ ණය දීම කෙරෙහි ප්‍රධාන අවධානය යොමු කෙරේ.

තවද, ශ්‍රී ලංකා රජය සමඟ සම්බන්ධවන, ආර්ථිකයේ පුනර්ජීවය සඳහා රජය සතු ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ මූලපිරීම ඉදිරි මාස වලදී සිදුවන ඇත.

කාර්යක්ෂමතාවය සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සඳහා ලංකා බැංකුවහි අබණ්ඩ ප්‍රගතිය, ඩිජිටල්කරණය සහ ගනුදෙනුකාර සේවා වැඩිදියුණු කිරීම් සමඟ සම්බන්ධ වී අනාගතයේදී බැංකුවේ තිරසාර බව සහතික කරනු ඇත.

ව්‍යාපාරික අංශ සමාලෝචනය

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම්

බැංකුවේ මෙම මෙහෙයුම් අංශය විදේශීය මුදල් සම්බන්ධ ගනුදෙනු සඳහා පහසුකම් සපයන ජාත්‍යන්තර මෙහෙයුම්; ද්‍රවශීලතා කළමනාකරණය සහ අරමුදල් කළමනාකරණය සිදුකරන භාණ්ඩාගාර මෙහෙයුම්; බැංකුවේ ආයෝජන කටයුතු හසුරුවන ආයෝජන; සහ විදේශීය මෙහෙයුම්, බැංකුවේ විදේශීය ශාඛා හසුරවන විදේශීය මෙහෙයුම් යන අංශ වලින් සමන්විත වේ.

කාර්යසාධනයේ විශේෂ අවස්ථා 2022

ආර්ථික අර්බුදය මධ්‍යයේ වුවද **ඇ.ඩො. මිලියන 3,159.3** ක් අභ්‍යන්තර ප්‍රේෂණ ලැබී ඇත.

පෙර වසරට සාපේක්ෂව ආයෝජන මත පොළී ආදායමේ **130%** ක කැපී පෙනෙන වර්ධනයක්.

BOC Foreign Circle හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකා බැංකුවක් විසින් ප්‍රථම ඉන්දීය රුපියල් නොස්ට්‍රෝ ගිණුම විවෘත කිරීම.

ද්‍රවශීලතාවය හා ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් සහතික කිරීම, බැංකුවේ ලාභදායිත්වයට දායක වීම, ජාත්‍යන්තර පැවැත්මක් පවත්වා ගැනීම සහ විදේශීය බැංකු හා ප්‍රතිපාර්ශ්වයන් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම ආදිය මඟින් මෙම අංශය බැංකුවේ තිරසාර වර්ධනයට දායක වේ. 2022 දී, අතිමහත් අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් පැවතියද, බැංකුව අභ්‍යන්තර ප්‍රේෂණවල වෙළඳපළ නායකත්ව තත්ත්වය රඳවා ගත්තේය. ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර අංශවල කාර්යසාධනය මඟින් සමූහ මෙහෙයුම්වල සාර්ථකත්වය මෙහෙයවනු ලැබූ අතර, අංශ කණ්ඩායම්වල කැපවීම සහ බැංකුවේ ක්‍රියා පටිපාටි, ක්‍රියාවලි සහ පාලන කාර්යවිධි අඛණ්ඩව වැඩිදියුණු කිරීමට හේතු විය.

මෙහෙයුම් සන්දර්භය


2022 වසරේ පළමු කාර්තුව තුළ, ජාත්‍යන්තර මෙහෙයුම් මඟින් ගෝලීය සාර්ව ආර්ථික තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ ස්ථාවර විනිමය අනුපාතිකය මත ඇති වූ අඛණ්ඩ පීඩනය පිළිබිඹු කරමින් මන්දගාමී අභ්‍යන්තර ප්‍රේෂණ පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, වසර අවසානයේදී ශ්‍රී ලංකා රුපියල කළමනාකරණය කර ගැනීමත් සමඟ අභ්‍යන්තර ප්‍රේෂණ වේගවත් විය.

2022 දී රටේ ස්වෛරී පැහැර හැරීම නිවේදනය කිරීම, ස්වෛරී ශ්‍රේණිගත කිරීම සහ ක්ෂේත්‍රය පුරා ආයතන ශ්‍රේණිගත කිරීම පහත හෙළීමට හේතු විය. මෙය බැංකුවේ විදේශීය සහ දේශීය මුදල් බැඳීම් මත දැඩි පීඩනයක් ඇති කළේය. කෙසේ වෙතත්, බැංකුව සියලු නියාමන අවශ්‍යතා සහ අනුපාතවලට අනුකූල වූ අතර ජාතික අවශ්‍යතා සඳහා ද සහාය වෙමින් අවශ්‍ය සහාය ලබා දුන්නේය.

රජයේ මූල්‍ය අර්බුදය සහ රටේ ආර්ථික පසුබෑම නිසා බැංකුවට එහි ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීමට අවශ්‍ය විය. මීට අමතරව, ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අවශ්‍යතා පවත්වා ගනිමින් බැංකුවේ මුදල් ප්‍රවාහ කළමනාකරණය කෙරෙහි වැඩි වැදගත්කමක් ලබා දී ඇති අතර, මෙම අංශය දීර්ඝ කරන ලද සහන කාල ලබා දීම් සහ වත්කම් ගුණාත්මක භාවය පිරිහීම මත ඇතිවන බලපෑම කෙරෙහි වැඩි අවධානය යොමු කරන ලදී.

ප්‍රතිපත්ති පොළී අනුපාත අනපේක්ෂිත ලෙස ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ අරමුදල් පිරිවැය ඉහළ යාමත් සමඟ ආයෝජන මත පීඩනයක් ඇති විය. රටේ උද්ධමන පීඩනය සීඝ්‍රයෙන් ත්වරණය වීම මෙයට ප්‍රධානව හේතු විය.

අභ්‍යන්තර ප්‍රේෂණ 2022



මෙහෙයුම් පරිසරයේ බලපෑම

- ගෝලීය වශයෙන් වූ අහිතකර වෙළඳපළ තත්ත්වයන් නිසා ඇතිවන ආයෝජන සඳහා අඩු ප්‍රවණතාවක්
- විස්තීරණ සහන කාල ලබා දීම සහ ණය-ගුණාත්මක ආතතීන් හේතුවෙන් ද්‍රවශීලතාව මත පීඩනය
- ස්වෛරී ණය ගෙවීම් පැහැර හැරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රේණිගත කිරීම් පහත වැටීම්
- විනිමය අනුපාතිකයේ අස්ථාවරත්වය සහ විදේශ මුදල් ණය ගැනීම් කෙරෙහි බලපෑම
- විනිමය අනුපාතික උච්චාවචනයෙන් සහ අවිධිමත් නාලිකා

උපායමාර්ගයට එරෙහි කාර්යසාධනය

ගනුදෙනුකාර කේන්ද්‍රීය බව

- විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන්ගේ අභ්‍යන්තර ප්‍රේෂණ අවශ්‍යතා සැපයීම සඳහා හවුල්කාරිත්වයන් වැඩි කිරීම.
- ගනුදෙනුකරුවන්ට නව පෙර සහ පසු ණය යෝජනා ක්‍රම ලබා දී ඇත.
- විදේශිකයන්ට සහ විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන්ට සේවා සැපයීම සඳහා විදේශ කවයක් පිහිටුවීම.
- ගනුදෙනුකරුවන් සඳහා සංවිධානය කරන ලද පුහුණු, දැනුවත් කිරීම් සහ සහාය වැඩසටහන්.
- විදේශ අධ්‍යාපනය ලබන සිසුන්ගේ සහ අනෙකුත් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවලට සරිලන පරිදි ලංකා බැංකුවේ බහු මුදල් සංචාරක කාඩ්පත නැවත ආරම්භ කරන ලදී.
- ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනු අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකු අංශය පුළුල් කර නව නොස්රෝ ගිණුම් දියත් කරන ලදී.
- ද්‍රවශීලතා පීඩනය මධ්‍යයේ වුවද, අධ්‍යාපනික ගෙවීම් කිරීම සඳහා මුල්තැන ලබා දෙමින් පහසුකම් සැපයූ අතර පොදු අවශ්‍යතා සපුරාලීම සඳහා හා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා විදේශ විනිමය ද සපයා දෙන ලදී.
- ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, රත්මලාන සහ යාපනය ගුවන් තොටුපළවල නව විදේශ මුදල් හුවමාරු ඒකක විවෘත කිරීම.
- ඉන්දියානු රුපියල් වලින් වෙළඳාම් කිරීම 2022 දෙසැම්බර් මාසයේදී ආරම්භ විය.

ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය

- Smart Remit පද්ධතිය 2022 වසරේ දී වැඩිදියුණු කරන ලදී.
- මාලේ ශාඛාවේ ස්මාර්ට් ඔන්ලයින් බැංකු පද්ධතිය දියත් කරන ලදී.
- මාලේ ශාඛාවේ ස්වයංක්‍රීය වෙළඳ මූල්‍ය පද්ධතිය හඳුන්වා දෙන ලදී.
- ආයෝජන බැංකුකරණය ස්වයංක්‍රීයකරණය කිරීමට කටයුතු ආරම්භ කර ඇත.
- බහු ගනුදෙනුකාර-ඇතුළත් කිරීමේ ක්‍රියාවලි ස්වයංක්‍රීය කරන ලදී.
- බහු අභ්‍යන්තර බැංකු ක්‍රියාවලි ස්වයංක්‍රීය කරන ලදී.

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩ නැඟීම

- ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි වන අතරම සේවක කණ්ඩායම්වල ආරක්ෂාව සහතික කෙරේ.
- දේශීය හා විදේශීය ශාඛාවල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
- කාර්ය මණ්ඩලය ගනුදෙනුකරුවන්ගේ හදිසි අවශ්‍යතා සඳහා ක්ෂණික ප්‍රතිචාර දැක්වීමක් පෙන්නුම් කළේය.
- ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ මුලපිරීම් සිදු කරන ලදී.
- දුරස්ථ වැඩ කිරීමේ අවස්ථා ගවේෂණය කර නියමු කර ඇත.

ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය

- අභ්‍යන්තර පාලන සහ සයිබර් ආරක්ෂක පද්ධති ශක්තිමත් කිරීම සඳහා විදේශීය ශාඛාවල ජාල ඇගයීම සිදු කෙරේ.
- බැංකුවේ අනාගත වර්ධන විභවයන් සඳහා ආරම්භ කරන ලද උපායමාර්ගික හවුල්කාරිත්වයන්.
- නව ණයකර නිකුත් කර ඇත.

ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය

- වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමට එරෙහිව ගනු ලබන ක්‍රියාකාරී පාලනයන් සහ ක්‍රියාමාර්ග.
- සුදුසු පසු විපරම් සහ මුදල් ප්‍රවාහ අධීක්ෂණය මඟින් සක්‍රීය මට්ටමේ ණය පවත්වා ගැනීමට සහ අක්‍රීය ණය අයකර ගැනීමට සහාය විය.

ව්‍යාපාරික අංශ සමාලෝචනය

ජාත්‍යන්තර අංශය

විනිමය අනුපාතිකයේ අස්ථාවරත්වය සහ අවිධිමත් වෙළඳපළවල්වල ව්‍යාප්තිය තිබියදීත්, ලංකා බැංකුව විදේශ ප්‍රේෂණ සහ විනිමය ආයතන සමඟ ඇති ශක්තිමත් සබඳතා හේතුවෙන් වසර තුළදී විශාල ප්‍රේෂණ ප්‍රමාණයක් රඳවා ගැනීමට බැංකුවට හැකි විය. වසර තුළදී ලංකා බැංකුව හරහා ලංකාවට එවන ලද ඇ.ඩො. මිලියන 3,159.3 ක් සමඟින් බැංකුවේ අභ්‍යන්තර ප්‍රේෂණ සමඟින් බැංකුවේ වෙළඳපළ නායකත්ව තත්ත්වය ශක්තිමත් වූ අතර වසර තුළ බැංකුවේ සේවක ප්‍රේෂණවල වෙළඳපළ කොටස 22% දක්වා ළඟා විය.

අභ්‍යන්තර ප්‍රේෂණ සහ වෙළඳ මූල්‍යවල ජාතික වැදගත්කම සපුරාලීම සඳහා බැංකුව ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් 33 ක් යොදවා, නව පාර්ශවයන් 14 ක් සමඟ හවුල්කාරිත්වයන් ආරම්භ කර, 2022 වසර තුළදී විදේශීය නියෝජිත බැංකු සමඟ සබඳතා පුළුල් කළේය. බිම් මට්ටමේ දේශීය සහභාගීත්වය සමඟ අත්වැල් බැඳගත් චිතෙර මෙතෙර සහ රන් කහවනු වැනි දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් සිදු කරන ලදී. ලංකා බැංකුව පිට පිට රට තෑගි වැනි සම්මාන ප්‍රදානෝත්සවයන් ද වසර තුළ ක්‍රියාත්මක කරන ලද අතර එමඟින් විධිමත් ප්‍රේෂණ මාර්ග භාවිතා කිරීම සඳහා දිරිගැන්වීම් නිර්මාණය කිරීම, සාවද්‍ය තොරතුරු වලට එරෙහිව දැනුවත් කිරීම සහ බැංකුවේ විශ්වාසනීයත්වය පිළිබඳ ගනුදෙනුකරුවන් සහතික කිරීම සිදු කරන ලදී.

බැංකුවේ 83 වැනි සංවත්සරයට සමගාමීව, විදේශ කවය, විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත. එය කැපවූ දුරකථන මාර්ග සහ මනා පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් සමඟින් වසර තුළ පැය 24 පුරා ක්‍රියාත්මක ඒකකයකි. බැංකුවේ වෙළඳපළ නායකත්ව තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා වසර තුළදී නව ගනුදෙනුකරුවන් ගණනාවක් ඇතුළත් කර ගන්නා ලදී.

වර්ෂය තුළ වසංගත සහ අර්බුදකාරී අභියෝග මධ්‍යයේ වුවද, දුරස්ථ සේවය නියමුගත කරන ලදී, ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම සහතික කරන ලද අතරම බැංකුවේ ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව අපනයන ආදායම ලබා ගැනීමට හැකි විය.

භාණ්ඩාගාර මෙහෙයුම්

බැංකුව තුළ දෛනික මුදල් ප්‍රවාහ සහ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේ වගකීම භාණ්ඩාගාර අංශය සතු වේ. අරමුදල් සහ ආයෝජන රැස්කිරීමේ අංශයක් ලෙස සේවය කරන අතරම, අංශය බැංකුවේ ලාභදායිත්වයට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය.

ආතති තත්වයන්ට ප්‍රතිචාර දක්වමින්, බැංකු නියාමකයා වන ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නියම කර ඇති පරිදි මුදල් ප්‍රවාහයන් සහ ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා ප්‍රමිතීන් දූරදර්ශීව කළමනාකරණය කිරීම කෙරෙහි මෙම අංශය අවධානය යොමු කළේය. ඉන්ධන, ගෑස්, ඖෂධ සහ ආහාර ද්‍රව්‍ය වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට බැංකුවේ විදේශ මුදල් ද්‍රවශීලතාව සමීපව කළමනාකරණය විය. මේ අතර, බැංකුවේ අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව සඳහා අංශයේ මුදල් සහ ද්‍රවශීලතා පුරෝකථනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ශ්‍රේණිගත කිරීම් පහත වැටීම් තිබියදීත්, විදේශීය පාර්ශව සමඟ ඇති සමීප සබඳතා බැංකුවට ණය ලබා ගැනීම සඳහා අවස්ථාවන් ලබා දුන් අතර බැංකුවට සියලු වගකීම් සහ හිඟ මුදල් ගෙවීමට හැකි විය.

අංශයේ වෙළඳ අවස්ථා ඉහළ නැංවීම සහ රජයේ සුරැකුම්පත් කාලෝචිත කළමනාකරණය කිරීම කැපී පෙනෙන කාර්යසාධනයක් සඳහා හේතු විය.

ආයෝජන බැංකුකරණය

2022 දී බාසල් III අනුකූල, යටත් කාලීන II මට්ටමේ ප්‍රාග්ධනයට ගැනෙන ණයකර ව්‍යුහගත කිරීම සහ නිකුත් කිරීම තුළින් බැංකුවේ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා මෙම අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. මේ අතර, ආයෝජන බැංකු ක්‍රියාකාරකම් ස්වයංක්‍රීය කිරීම අවසන් වෙමින් පවතී.

ඉහළ වෘත්තීමය සේවක සංඛ්‍යාවකගේ සහය ඇතිව, මෙම අංශය වසර තුළදී අරමුදල් කළමනාකරණය, ආයෝජන කළඹ කළමනාකරණය සහ නව සේවාදායකයින් ගණනාවක් බඳවා ගැනීම ද සිදු කරන ලදී. අරමුදල් ගොඩනැගීමේ අඛණ්ඩ ප්‍රවණතාවයට අනුකූලව, අනාගතයේදී බැංකුවේ ආයෝජන කළඹ තවදුරටත් ශක්තිමත් කරන ආන්තික වෙළඳාමක් ආරම්භ කිරීමට පියවර ගෙන අවශ්‍ය කටයුතු සකස් කරන ලදී.

විදේශීය මෙහෙයුම්

2022 වසර බැංකුවේ විදේශ මෙහෙයුම් සඳහා ඔරොත්තු දෙන වසරක් වූ අතර, මාලේ ශාඛාව සහ සීෂෙල්ස් ශාඛාව බදු ගෙවීමට පෙර ඔවුන්ගේ ඉහළම වාර්ෂික ලාභය වාර්තා කළේය. ලංකා බැංකුවේ විදේශීය ශාඛා තුන, ක්‍රියාශීලී අධීක්ෂණය සහ අඛණ්ඩව ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීම තුළින් අක්‍රීය ණය සහ අත්තිකාරම් කළමනාකරණය කර ඇත. ප්‍රාග්ධන ගැටළු සහ ගෝලීය ආර්ථික පීඩනයන් මධ්‍යයේ වුවද, විදේශීය ශාඛා ලාභ ඉපැයූ අතර, වර්ෂය තුළ බැංකුවේ ලාභය සඳහා කැපී පෙනෙන ලෙස දායක විය.

ලංකා බැංකුවේ චෙන්නායි ශාඛාව හරහා මූලික ගනුදෙනුව සිදු කිරීමත් සමඟ ශ්‍රී ලංකා බැංකුවක් විසින් ප්‍රථම වරට ඉන්දීය රුපියල් නොස්ට්‍රෝ ගිණුමක් විවෘත කිරීම ද මෙම වසරේ දී සිදු විය. නව ස්මාර්ට් ඔන්ලයින් බැංකු පද්ධතියක්, ස්වයංක්‍රීය වෙළඳ මූල්‍ය පද්ධතියක් සහ බාහිර ප්‍රේෂණ පද්ධතියට (Smart remit) වැඩිදියුණු කිරීම් මාලේ ශාඛාවේදී දියත් කරන ලදී. නියාමන අවශ්‍යතාවලට අනුකූලව, විදේශයන්හි ව්‍යාප්ත කිරීම සඳහා බැංකුවේ අනාගත උපායමාර්ග අනුව අභ්‍යන්තර පාලන සහ සයිබර් ආරක්ෂණ පද්ධති ශක්තිමත් කරන ලද බැවින්, ශාඛා තුනෙහිම තවදුරටත් ජාල වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.

වසර තුළ ඉදිරියට ගමන් කරමින්, ලංකා බැංකුව සීෂෙල්ස් හි අඛණ්ඩව තීරණාත්මක ශාඛා මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීම සඳහා අවශ්‍යතාවලට අනුකූලව අංගසම්පූර්ණ ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් විවෘත කළේය.

අවදානම්

- කොටස් වෙළෙඳපළෙහි අබණ්ඩ අස්ථාවරත්වය කාර්යසාධනය සීමා කරනු ඇත.
- ප්‍රමාද වූ ආර්ථික ප්‍රකෘතිය සහ පුනර්ජීවනය බැංකුවේ ශ්‍රේණිගත කිරීම්වලට ඍණාත්මක ලෙස බලපෑ හැකි අතර එහි ප්‍රතිඵලයක් ලෙස තවදුරටත් අභියෝගවලට මුහුණ දීමට සිදුවේ.
- ගෝලීය සාර්ව ආර්ථික පීඩනය සහ දේශීය අවපාතය අබණ්ඩව පැවතීම හේතුවෙන් විදේශ මුදල්වල උග්‍ර හිඟය සහ මූල්‍ය බාධාවන් ඇති විය හැකිය.

අවස්ථාවන්

- ලංකා බැංකුවේ ජාත්‍යන්තර ප්‍රවේශය පුළුල් කිරීම සහ නව වෙළඳපළවල් වලට පිවිසීමෙන් එහි පැවැත්ම.
- ඩිජිටල්කරණය, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය, කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ මානව ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කිරීමෙන් අබණ්ඩ ජයග්‍රහණ අත්කර ගැනීමට හැකිවීම.
- මුදල් සහ ද්‍රවශීලතා පුරෝකථනය සහ පුරෝකථන වාර්තා කිරීම තුළින් ව්‍යාපාර තීරණ ගැනීම දිරිමත් කිරීම.
- ප්‍රාග්ධන වෙළඳපළ උපදේශන සේවා සැපයීම, භාරකරු ක්‍රියාකාරකම් පුළුල් කිරීම සහ ආයෝජන කළඹ කළමනාකරණ සේවා සැපයීම සඳහා බැංකුවේ ශක්තීන් උපයෝගී කර ගැනීමට හැකිවීම.

ඉදිරි දැක්ම

මෙම අංශය ජාත්‍යන්තර හවුල්කරුවන් සහ විදේශීය බැංකු තුළ බැංකුවේ සම්බන්ධතාවේ ප්‍රධාන අංගයක් නියෝජනය කරයි, එමෙන්ම ශක්තිමත් සබඳතා ඉදිරියට තීරනාත්මක කාර්යභාරයක් ඉටු කරයි. තිරසාර වර්ධන ගමන් පථයක් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, විශේෂ විශ්ලේෂණයන්, ශක්‍යතා ඇගයීම සහ නියාමන අනුමැතිය මත අබණ්ඩව විදේශයන්හි ව්‍යාප්ත කිරීමේ අභිලාෂයන් බැංකුව සතු වේ.

තවද, ණය නොවන විදේශ විනිමය ගලා ඒම සඳහා බැංකුවේ ප්‍රවේශය සඳහා අංශයේ කාර්යභාරය, වර්ධනය සඳහා අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංශයක් ලෙස අබණ්ඩව පවතී. මීට අමතරව, ආයෝජන බැංකු ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා බැංකුව සිය වෘත්තීය කාර්ය මණ්ඩලයේ සහ විශ්වාසනීය සේවාවන්හි ශක්තිය උපයෝගී කර ගැනීමට අපේක්ෂා කරයි.

ජාත්‍යන්තර, භාණ්ඩාගාර සහ ආයෝජන මෙහෙයුම්වලට අදාළ සියලුම විදේශීය ශාඛා සහ කාර්යයන් හරහා ඩිජිටල්කරණය වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා බැංකුව අබණ්ඩව ආයෝජනය කරයි.

විවිධ ගනුදෙනුකාර පදනම ලංකා බැංකුවේ ව්‍යාපාර ආකෘතියේ මූලික අංගයකි. අභියෝගාත්මක වසරක් තුළ ලංකා බැංකුව සිය ගනුදෙනුකරුවන්ට පුළුල් සහන ලබා දෙමින් ව්‍යාපාර පුනර්ජීවනය කිරීමට සහ ප්‍රතිස්ථාපනය කිරීමට උත්සුකුව කටයුතු කිරීම මත රටේ රැකියා සුරක්ෂිතතාව සහ වටිනාකම් නිර්මාණයට දායක වන ලදී.

විශේෂ අවස්ථා

2,166
සෘජු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන

වඩාත්ම ආකර්ශණීය සන්නාම – LMD සහ බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස්
බැංකු අංශයේ 2 වැනි ස්ථානය

හොඳම මහජන බැංකු සේවා මුලපිරීම –
ආසියානු ඩිජිටල් මූල්‍ය සංසදය සහ සම්මාන

නව සංකල්ප
BOC සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) කවය, BOC අපනයනය කවය, BOC විදේශ කවය

2021 වසරේ අභියෝගාත්මක ව්‍යාපාරික පරිසරයක සිට ඉදිරියට යමින් නව වසර බැංකුවේ ගනුදෙනුකරුවන්ට නව අභියෝග රාශියක් ගෙන එන ලදී. ඉහළ පොළී අනුපාත වෙත වෙනස් වීම සහ ආපසු ගෙවීමේ හැකියාව මූලික අවධානයට ලක් වූ අතර, වසර තුළ මෙම කරුණු සම්බන්ධයෙන් බැංකුවට විමසීම් ගණනාවක් ලැබුණි.

බැංකුව විසින් බැංකුවේ මූල්‍ය තත්ත්වයෙහි ස්ථායීතාවයට ප්‍රමුඛත්වය දුන් අතර, ආයතනික ගනුදෙනුකරුවන්ගේ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් දේශීය සහ විදේශ මුදල් ද්‍රවශීලතාව සහතික කරන අතරම අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීමේදී ජාතික අවශ්‍යතා සඳහාද සහය විය. බැංකුවේ මෙම සහ අනෙකුත් ප්‍රයත්නයන් පිළිබඳ විස්තර පිටු අංක 65 සිට 77 දක්වා පිටුවල ව්‍යාපාරික අංශ සමාලෝචනයේ සහ පිටු අංක 103 සිට 113 දක්වා ප්‍රජාව සහ පරිසරය යන කොටසේ විස්තර කර ඇත.

මෙහෙයුම් සන්දර්භය

- ආර්ථික අර්බුදය, උද්ධමන පීඩනය ඉහළ යාම, විනිමය අනුපාත උච්චාවචනයන් සහ ඉහළ පොළී අනුපාතයන් ගනුදෙනුකරුවන්ට දැඩි ලෙස බලපෑවේය.
- ඉන්ධන අර්බුදයෙන් පීඩාවට පත් ගනුදෙනුකරුවන්ට බැංකු සේවා සඳහා සීමිත ප්‍රවේශයක් සහ ව්‍යාපාර වලට බාධා කිරීම් ඇතිවිය.

බැංකුවේ ප්‍රතිචාරය

- නියාමන අවශ්‍යතාවලට ඉහළින් සහ ඉන් ඔබ්බට ආයතනික සහ ශාඛා ගනුදෙනුකරුවන්ට ඒකාබද්ධ සහන සැලසීම.
- ගනුදෙනුකරුවන්ට සහය වීමට සහ ඔවුන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා නව නිෂ්පාදන සහ සහනදායී ණය දියත් කරන ලදී.
- සේවා සඳහා ප්‍රවේශය පහසු කිරීමට පුළුල් ජංගම සහ ව්‍යාප්ත ජාලයක් සමඟ භාවිත කළ ඩිජිටල් නාලිකා හරහා ව්‍යාපාරික අඛණ්ඩතාව තහවුරු කරන ලදී.

ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සඳහා අවධානය යොමු කිරීම

සම්බන්ධ වීමේ වේදිකා

- තෘප්තිමත්භාවය පිළිබඳ කාලානුරූප සමීක්ෂණ
- ශාඛා සහ ඩිජිටල් නාලිකා හරහා සෘජුව සම්බන්ධ වීම (අඛණ්ඩව)
- වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වේදිකා (අඛණ්ඩව)
- ගනුදෙනුකාර ක්ෂණික ඇමතුම් අංකය (අඛණ්ඩව)
- මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් (අඛණ්ඩව)
- අළෙවිකරණය, ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය (අඛණ්ඩව)



අවශ්‍යතා

- කඩිනම් සහ පහසු සේවාවක්
- පහසු, විශ්වාසනීය සහ ආරක්ෂිත සේවා ක්‍රම
- ණය සහන
- විනිවිද පෙනෙන මිලකරණය
- මුදල් පහසුකම් සඳහා ප්‍රවේශය

ප්‍රතිචාර දක්වන ආකාරය

- ගනුදෙනුකාර කේන්ද්‍රීය විසඳුම්
- ගනුදෙනුකාර අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කිරීම
- ඩිජිටල් සේවාවන් වැඩිදියුණු කිරීම
- ස්වයංක්‍රීයකරණය හරහා ගනුදෙනු පිරිවැටුම් කාලය අඩු කිරීම

ගනුදෙනුකාර පැතිකඩ

නව ගනුදෙනුකරුවන්
652,961

ඉලක්ක වෙළඳපළ අනුපාතය
67%


ගනුදෙනුකරුවන්
මිලියන 14.9

කාන්තා ගනුදෙනුකරුවන්
50%

ලංකා බැංකුව ශ්‍රී ලංකාව පුරා සහ විදේශයන්හි සිටින මිලියන 14 කට අධික විවිධ ගනුදෙනුකරුවන් පිරිසකට පුළුල් පරාසයක සේවය සපයයි. 67% අසමසම ඉලක්ක වෙළඳපළ ප්‍රතිශතයක් වන මෙම ආකර්ෂණීය ගනුදෙනුකාර පදනම, පුද්ගලයන්, ළදරුවාගේ සිට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දක්වාද, ක්ෂුද්‍ර ව්‍යවසායන්ද, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන්ද, විශාල සමාගම්ද, බහුජාතික සමාගම් සහ රජය සතු ව්‍යවසායන්ගෙන් සමන්විත වේ.

ශීඝ්‍රයෙන් වෙනස් වන ආර්ථිකයක ගතික අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකුව ගෝලීය හවුල්කරුවන් සමඟ දිගුකාලීන සබඳතා සහ පුළුල් නිෂ්පාදන මිශ්‍රණයක් උපයෝගී කර ගනිමින් සිය ගනුදෙනුකරුවන්ට කැපී පෙනෙන වටිනාකමක් ලබා දෙයි.


ගනුදෙනුකරුවන්



ගනුදෙනුකරුවන්

මූල්‍ය සේවා වෙත ප්‍රවේශය

භූගෝලීය පිහිටීම අනුව ගනුදෙනුකරුවන්



● බස්නාහිර පළාත ● දකුණු පළාත ● සබරගමු පළාත ● ඌව පළාත
● වයඹ පළාත ● මධ්‍යම පළාත ● උතුරු මැද පළාත ● නැගෙනහිර පළාත
● උතුරු පළාත

ස්ත්‍රී පුරුෂ භාවය අනුව ගනුදෙනුකරුවන්



● පුරුෂ ● ස්ත්‍රී

මූල්‍ය සේවා වෙත ප්‍රවේශය

ලංකා බැංකුව සමාජයේ සෑම අංශයකටම සේවා සපයන අතර රටේ පුළුල්තම ශාඛා ජාලය සහ භෞතික පැවැත්ම, අනර්ඝ සහ විවිධාංගිකරණය වූ නිපැයුම් මිශ්‍රණයක් සහ වේගයෙන් ව්‍යාප්ත වන ඩිජිටල් ප්‍රවේශයක් හරහා සෑම තරාතිරමකම ගනුදෙනුකරුවන් වෙත ළඟා වේ. මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීම තුළින් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම, ඉතුරුම් සංස්කෘතිය පෝෂණය කිරීම සහ අවම පහසුකම් සහිත සහ අවම නියෝජනයක් ඇති අය වෙත ළඟාවීම බැංකුවේ ප්‍රමුඛත්වය හිමි අංග වේ.

මූල්‍ය ඇතුළත් කිරීම්

සමාජයේ වඩාත්ම දුරස්ථ, අවදානමට ලක්විය හැකි සහ චෛතිහාසික වශයෙන් අවම පහසුකම් සහිත හෝ බැංකු පද්ධතිය හා සම්බන්ධ නොවූ කොටස් සඳහා මූල්‍ය සහ මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයකි. බැංකුවේ පුළුල් භූගෝලීය ප්‍රවේශයක් සහිත ජංගම සහ සීමිත සේවා ශාඛා සමඟ සම්බන්ධ වූ පුළුල් ශාඛා ජාලයකින් සමන්විත වන අතර, ඒ හරහා මිලියන සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන් සඳහා මූල්‍ය සේවාවන් සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව සහතික කරයි.

ලංකා බැංකුවේ ජංගම සහ ව්‍යාප්ති සේවාවන් වන Branch on wheels රථ 10 හරහා ජංගම බැංකු සේවා දුෂ්කර කාල සීමාවලදී හුදෙකලා ස්ථාන සඳහා බැංකු සේවා සඳහා බාධාවකින් තොරව ප්‍රවේශය සහතික කිරීම සඳහා ඉතා වැදගත් විය.

ව්‍යවසායක ව්‍යාපාර, ක්ෂුද්‍ර, සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෘහ සහ ප්‍රජා කර්මාන්ත සඳහා ඉලක්කගත සංවර්ධන ණය දීම වැනි විශාල මූල්‍ය ඇතුළත් කිරීම් සාක්ෂාත් කර ගැනීම සඳහා ලංකා බැංකුව දැරූ අනෙකුත් ප්‍රයත්නයන් 103 පිටුවේ ප්‍රජාව සහ පරිසරය යන කොටසේ විස්තර කර ඇත.

BOC කනෙක්ට් (BOC Connect)

මේ සම්බන්ධයෙන් සුවිශේෂී නවෝත්පාදනයක් වන්නේ 2021 දී දියත් කරන ලද බැංකුවේ බිම් මට්ටමේ නියෝජිත-බැංකු ජාලය වන BOC කනෙක්ට් (BOC Connect) ය. මෙම නියෝජිත-බැංකු සේවාව දුරස්ථ ස්ථානවල සිටින ගනුදෙනුකරුවන්ට හෝ බැංකු කටයුතු සඳහා සීමිත ප්‍රවේශ්‍යතා ඇති ගනුදෙනුකරුවන්ට, නියෝජිතයන් හරහා මූල්‍ය ගනුදෙනු රාශියක් සිදු කිරීමට හැකියාව ලබා දෙයි. මෙම සේවාවන්ට මුදල් තැන්පතු, මුදල් ආපසු ගැනීම්, ක්‍රෙඩිට් කාඩ් සහ බිල්පත් පියවීම් සහ අරමුදල් මාරු කිරීම් ඇතුළත් වේ. වර්ෂය තුළ බැංකුව මේ හරහා ක්‍රියාත්මක කරන ලද මුළු ගනුදෙනු වටිනාකම රු. මිලියන 570.0 ක් ලෙස වාර්තා කර ඇත. තවද, මේ වසර තුළ ලබාගත් නියාමන අනුමැතිය මත පදනම්ව, 2023 දී නව නියෝජිතයින් 16 දෙනෙකු බඳවා ගැනීමට බැංකුව සැලසුම් කර ඇත. මේ අනුව මුළු BOC කනෙක්ට් ජාලය 50 දක්වා ඉහල යයි. නියෝජිතයන් සොයා බැලීමේ ක්‍රියාවලි සිදුවෙමින් පවතින අතර, අනාගතයේදී ග්‍රාමීය ප්‍රදේශවල සිටින තවත් දුරස්ථ ගනුදෙනුකරුවන් වෙත මෙම පහසුකම දීර්ඝ කිරීමට බැංකුව සැලසුම් කරයි.

ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම

2022 දිවයින පුරා ආර්ථික ක්‍රියාකාරකම් වලට, ප්‍රවාහනයට සහ ප්‍රවේශයට බාධා කිහිපයක් ඇතිවිය. කෙසේ වෙතත්, ගනුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ව්‍යාපාර අඛණ්ඩතාවට ප්‍රමුඛත්වය දීමට බැංකුව සියලු උත්සාහයන් දරන ලදී. ඉන්ධන අර්බුදය තුළ පවා ශාඛා වසා නොදැමීම සහතික කිරීම බැංකුවේ පුළුල් සේවා මධ්‍යස්ථාන මඟින් සේවා සඳහා බාධාවකින් තොරව ප්‍රවේශය ද සහතික විය.

මීට අමතරව, ඉන්ධන අර්බුදය අතරතුර ලංකා බැංකුවෙහි ජංගම බැංකු ඒකක සමඟ විශේෂයෙන් හුදකලා සහ දුරස්ථ ප්‍රදේශවලට ළඟා වීමට බැංකුව පියවර ගන්නා ලදී. කොවිඩ්-19 වසංගතය අතරතුර රට වසා දමා තිබෙන කාලයේදී තීරණාත්මක වූ මෙම ක්‍රියාමාර්ග 2022 දී ද අගනා බව ඔප්පු විය; ඉන්ධන අර්බුදය තුළ පවා දුරස්ථ ගනුදෙනුකරුවන්ට සේවා සඳහා ප්‍රවේශය රඳවා තබා ගැනීම සහතික කිරීම මේ හරහා ඉවහල් විය.


ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම සඳහා බැංකුව දරණ උත්සාහයන් පිළිබඳ වැඩිදුර විස්තර 65 පිටුවේ ව්‍යාපාරික අංශ සමාලෝචනයේ ශාඛා සහ ආයතනික බැංකුකරණ සමාලෝචනය යටතේ විස්තර කර ඇත.

විස්තීරණ බහු-නාලිකා පියසටහන

දිවයින පුරා සෘජු ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන 2,166 ක් සමඟින්, ලංකා බැංකුව සතුව ශ්‍රී ලංකාවේ වඩාත්ම පුළුල් භූගෝලීය ප්‍රවේශයක් ඇත. ඩිජිටල්කරණයක් සඳහා වන භෞතික සහ දේශීය ප්‍රවණතාවලට අනුකූලව, බැංකුව සිය ඉලෙක්ට්‍රොනික සහ ඩිජිටල් පියසටහන් පුළුල් කිරීම ඇතුළත් බහු-නාලිකා උපායමාර්ග ක්‍රියාත්මක කරයි. 2022 දී, විද්‍යුත් සහ ඩිජිටල් ගනුදෙනු වෙත මාරුවීම සියලුම ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනු වලින් 48% ක් ඩිජිටල් හෝ විද්‍යුත් බැංකු නාලිකා හරහා සිදු විය.

භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම් සඳහා අඛණ්ඩ ආයෝජනය ගනුදෙනුකරුවන් සඳහා ප්‍රවේශය වැඩි කරන අතරම ගනුදෙනුකාර පහසුව සහ සමස්ත ගනුදෙනුකාර අත්දැකීම වැඩිදියුණු කිරීමට දායක වේ. 2022 වසර තුළදී, බැංකුව ශාඛාවල වැඩිදියුණු කිරීම් කිහිපයක් සිදු කරමින් උඟව පළාතේ නව ශාඛාවක් විවෘත කරමින්ද, රෝහල්, අධ්‍යාපන ආයතන, ගුවන්තොටුපළ, දුම්රිය මාර්ග සහ සංචාරක ආකර්ෂණ ස්ථාන වැනි ප්‍රධාන ආයතනවල ඇති මුදල් චක්‍රීකරණ යන්ත්‍ර (CRMs) ජාලය පුළුල් කරන ලදී.

සම්ප්‍රදායික



ස්ථාවර

ශාඛා
581

සීමිත සේවා ශාඛා
65

දුරස්ථ සහාය/සේවාව

ඇමතුම් මධ්‍යස්ථානය

ජංගම/දිගු සේවා

BOC කනෙක්ට් නියෝජිතයන්
34

පාසල් සංසද
1,489


ජංගම පාසල් ඒකක
991

SME මධ්‍යස්ථාන
15

ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන
15

ජංගම සේවා රථ (ජංගම බැංකු ඒකක)
10

ඉලෙක්ට්‍රොනික



ස්වයං බැංකුකරණය (ඉලෙක්ට්‍රොනික් බැංකුකරණය)

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර
726


මුදල් තැන්පතු යන්ත්‍ර
159

මුදල් චක්‍රීකරණ යන්ත්‍ර
572

BOC ඩිජි බිල්පත් ගෙවීමේ යන්ත්‍ර
4

ශාඛා වලින් පිටත ස්මාර්ට් කලාප
242

ඩිජිටල්



ගනුදෙනු

මාර්ගගත බැංකුකරණය

අන්තර්ජාල ගෙවීම් ද්වාරය (IPG)

PoS and MPoS – BOC ස්මාර්ට් ගෙවීම සක්‍රීය කර ඇත

බී ඇප්

ස්මාර්ට් පේ

ස්මාර්ට් පාස්බුක්

ආයතනික වෙබ් අඩවිය

සමාජ මාධ්‍ය

ගනුදෙනුකරුවන්

සේවා නාලිකාවල ප්‍රගමනය

ගනුදෙනුකාර පහසුව වැඩි දියුණු කිරීම සඳහා ශාඛා නැවත ස්ථානගත කිරීම්
19

ශාඛා පරිවර්තනය කිරීම්
61

බදුල්ල දිස්ත්‍රික්කයේ ආඳාඋල්පොත නව ශාඛාවක් විවෘත කිරීම
1

සීමිත සේවා ශාඛා විවෘත කිරීම්
3

මුදල් චක්‍රීකරණ යන්ත්‍ර ස්ථාපනය කිරීම්
75

ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය

ගෙවීමේ කාල පමා සහන ලබා දී ඇති ණය
රු. බිලියන 74.4

සහන ලබා දීමෙන් ප්‍රතිලාභ ලද ගනුදෙනුකරුවන්
42,073

හඳුන්වා දුන් නව නිපැයුම්
12

ප්‍රතිව්‍යුහ ගත කළ පහසුකම්වල වටිනාකම
රු. මිලියන 7,397.2

ගෙවීමේ කාලය නැවත ගිවිසුම් ගත කිරීමෙන් ප්‍රතිලාභ ඇති වූ ගනුදෙනුකරුවන්
2,230

ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය ලංකා බැංකුවේ පරිවර්තන උපායමාර්ගයේ ප්‍රධාන සංධිස්ථානයකි. බැංකුව සෑම විටම ව්‍යාපාර කිරීම සඳහා ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශයක් පවත්වා ගෙන ගොස් ඇති අතර, ශ්‍රී ලංකාවේ පවතින අර්බුදවලින් පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන්ට බැංකුව දක්වන ප්‍රතිචාරය මෙයින් මනාව පැහැදිලි වේ.

ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපනය

GRI 201-1

පුනර්ජීවනය කල ව්‍යාපාර
40

පුනර්ජීවන සහාය යටතේ පවතින ව්‍යාපාර
22

ආසන්න වශයෙන්
2,500
සෘජු හා වක්‍ර ආකාරයෙන් රැකියා ආරක්ෂා කිරීම

ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන ඒකකය (BRRUs) විසින් කළමනාකරණය කරනු ලබන ගනුදෙනුකාර මුදල් ප්‍රවාහයන්
රු. බිලියන 11.8

පුනර්ජීවන සහාය සමඟ ගනුදෙනුකාර නිරාවරණය
රු. බිලියන 65.4

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ බාධා කිරීම් වලින් පසුව, 2022 දී ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය බැංකුවේ ආයතනික ගනුදෙනුකරුවන්ට පෙර නොවූ විරූ අභියෝග ගෙන එන ලදී. ව්‍යාපාර තරඟකාරීත්වය නැතිවීම, ප්‍රාග්ධන පිරිවැය වැඩි වීම, ප්‍රධාන කාරක ප්‍රාග්ධනය සහ මුදල් ප්‍රවාහ ගැටළු, සහ ව්‍යාපාර අසාර්ථකත්වය සහ වසා දැමීම් වලට මුහුණ දුන්නේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස අක්‍රීය ණය පහසුකම් (NPCFs) අඛණ්ඩව වැඩි විය.

පවතින අර්බුදවලට ප්‍රතිචාර වශයෙන්, ප්‍රකෘතිමත් වීම මත ව්‍යාපාර පුනර්ජීවනය කිරීම කෙරෙහි බැංකුව අවධානය යොමු කිරීම ණය සංස්කෘතිය හා ගුණාත්මකභාවය ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුවේ උපායමාර්ගයේ ප්‍රධාන අංගයකි.

වසර තුළදී, බැංකුව විසින් අර්බුද වලින් පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන්ට දීර්ඝ කාලීන සහන දීමනා, ගෙවීමේ කාලය නැවත ගිවිසුම් ගත කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ පහසුකම් ඇතුළුව තීරණාත්මක සහ අඛණ්ඩ සහාය ලබා දෙන ලදී. මීට අමතරව, බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට හා ඔවුන්ගේ පැවැත්ම සහ දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීමට නව පහසුකම් ලබා දෙන ලදී. බැංකුවේ ප්‍රයත්නයේ ප්‍රධාන අංගයක් වූයේ පෙර වසර තුළ ස්ථාපිත කරන ලද ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකයයි (BRRU).

2022 දී ව්‍යාපාර පුනර්ජීවනය සඳහා ගන්නා ලද ප්‍රධාන ක්‍රියාමාර්ග

සියළු පළාත්වලට ව්‍යාප්ත කරමින් ව්‍යාපාර පුනර්ජීවනය සහ ප්‍රතිස්ථාපන වැඩකටයුතු ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම.

ආයතනික ගනුදෙනුකරුවන්ට සහාය සහ සහන සම්බන්ධ තීරණ තක්සේරු කිරීම සහ ඉක්මන් කිරීම සඳහා සතිපතා සමාලෝචන රැස්වීම් පවත්වමින් ප්‍රධාන මූල්‍ය නිලධාරිතුමාගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටුවක් පිහිටුවීම.

සියළු මට්ටම්වල ණය සහ අත්තිකාරම් සඳහා බැංකුවේ සුපරීක්ෂණ සහ අධීක්ෂණ සහ ඇගයීම් කටයුතු ශක්තිමත් කිරීම.

ගනුදෙනුකරුවන් සමඟ සමීපව සම්බන්ධ වීම; අර්බුදය තුළ ව්‍යාපාරික උපදෙස්, උපදේශන සහ විසඳුම් සැපයීම සඳහා ක්‍රියාශීලී සහ සාමාන්‍ය හමුවීම්.

වැක් වැක් ගනුදෙනුකරුවාගේ මුදල් ප්‍රවාහයන්ට සරිලන පරිදි පහසුකම් අහිරුචිකරණය කිරීම, නැවත සැලසුම් කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම.

විවිධ ගනුදෙනුකාර අවශ්‍යතා වලට ප්‍රතිචාර දැක්වීමට සහ කඩිනම් සහ ගතික පුනර්ජීවන ක්‍රියාමාර්ග සැපයීමට කාර්ය මණ්ඩලයේ දැනුවත්භාවය සහ ධාරිතාව ගොඩනැගීම සඳහා නිතිපතා වැඩමුළු සහ පුනර්ජීවන සායන පැවැත්වීම.

බැංකුවේ නැවත අයකර ගැනීමේ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම.

ව්‍යාපාර පුනර්ජීවනය	2022	2021
පුනර්ජීවනය කරන ලද ව්‍යාපාර	**40**	16
පුනර්ජීවන සහාය යටතේ දැනට පවතින ව්‍යාපාර	**22**	6
සුරක්ෂිත කරන ලද රැකියා සංඛ්‍යාව (ආසන්න වශයෙන්)	**2,500**	**4,900**

ශාඛා ගනුදෙනුකරුවන්ට සහාය වීම

රු. බිලියන 67.9 ක

පුද්ගලික සහ විශ්‍රාමිකයින්ගේ ණය යෝජනා ක්‍රමය සඳහා පොළී අනුපාත තාර්තිකකරණය

2022 දී පොළී අනුපාත උච්චාවචනයන් සහ පවතින ඉහළ පොළී අනුපාත තත්ත්වය යටතේ විචල්‍ය පොළී අනුපාත මත ණය ලබා ගත් පුද්ගලික ණය ගනුදෙනුකරුවන්ට දැඩි බලපෑමක් ඇති විය. බැංකුව අභ්‍යන්තර තීරණයක් ගෙන අර්බුදකාරී තත්ත්වයට පත් වූ පුද්ගලික ණය ගැණුම්කරුවන්ට සහාය වීම සඳහා නියාමක නිර්දේශවලට ඉඩ ලබා දුන්නේය. සුදුසු අවස්ථාවලදී, එම ණය ගැණුම්කරුවන්ට සහනදායී පොළී අනුපාතිකයක් දීර්ඝ කරන ලද අතර, අතිරේක අරමුදල් පිරිවැය බැංකුව විසින් අවශෝෂණය කර ගනිමින්, නියාමක අවශ්‍යතාවලට අනුකූලව ස්ථාවර අනුපාත යටතේ ලබා දෙන ණය අගයන ලදී. තවද, ශාඛා ගනුදෙනුකරුවන්ට සහය දැක්වීම පිළිබඳ තොරතුරු 65 පිටුවේ ව්‍යාපාරික අංශ සමාලෝචනයේ විස්තර කර ඇත.

නවෝත්පාදන සහ ගනුදෙනුකාර අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීම

බැංකුව ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා අඛණ්ඩව කටයුතු කරන අතර ඔවුන්ගේ ගැටළු වලට ප්‍රතිචාර දක්වමින්, නියාමක නිර්දේශයන්ට ඉඩ සලසමින් වෙළඳපල පරිමාවට ගැලපෙන විවිධ නිපැයුම් පරාසයක් සැපයීම සඳහා වෙළඳපල පර්යේෂණ සිදුකරයි. අර්බුදකාරී තත්ත්වයට සහ ගනුදෙනුකරුවන්ගේ වෙනස් වන අවශ්‍යතා වලට ප්‍රතිචාර වශයෙන්, පොළී අනුපාත චලනයන්ට අනුකූලව ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ආයෝජන අවශ්‍යතා සපුරාලීමට හැකි වන පරිදි ස්ථාවර තැන්පතු ඇතුළු නව නිපැයුම් ගණනාවක් බැංකුව විසින් දියත් කරන ලදී. රාජ්‍ය අංශයේ සේවයින් සඳහා ම සුවිශේෂී වූ කාඩ්පතක්, සෞඛ්‍ය ඉතුරුම් ගිණුමක් ශ්‍රී ලංකාවේ පළමුවරට ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් නව නිපැයුම් හා සේවා අතර වේ. නිපැයුම් පිළිබඳ වැඩි විස්තර පිටු අංක 65 හි ව්‍යාපාරික අංශ සමාලෝචනයේ දැක්වේ.

ගනුදෙනුකරුවන්ගේ සහ රටේ අවශ්‍යතා සපුරාලීම සඳහා නවෝත්පාදනය කිරීම ලංකා බැංකුවේ ව්‍යාපාර ආකෘතියේ ප්‍රධානතම කාර්යභාරයක් වන අතර ඔවුන්ගේ පිරිනැමීම් විවිධාංගීකරණය කිරීමට, නව වෙළඳපල වෙත ප්‍රවේශ වීමට, ඔවුන්ගේ ව්‍යාපාර පුළුල් කිරීමට සහ දේශීය සහ ජාත්‍යන්තර නිරාවරණය ලබා ගැනීමට ප්‍රධාන ගනුදෙනුකාර අංශවලට සහාය වීම සඳහා බැංකුව පුරෝගාමී වී ඇත. මේවායින් ප්‍රධාන වන්නේ පෙර වසරේ දියත් කරන ලද BOC අපනයන කවය සහ 2022 ජනවාරි මාසයේ දියත් කරන ලද නව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක කවයයි. බැංකුවේ සංවර්ධන ණය දීම පිළිබඳ වැඩි විස්තර 103 පිටුවේ ප්‍රජාව සහ පරිසරය යන කොටසේ දක්වා ඇත.

අපනයන කවය

අපනයන කවය යටතේ ලබා දී ඇති ණය

රු. බිලියන 1.2 ක්

අපනයන කවය යටතේ අපනයනකරුවන් මුණගැසීම්

191

ලංකා බැංකුවේ අපනයන කවයේ මූල්‍ය ආධාරයන්ට අමතරව ජාලකරණ අවස්ථා සහ ධාරිතා ගොඩනැගීම සමඟ අපනයනය අභිමුඛ ව්‍යාපාරවලට, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට සහය දක්වයි. ගනුදෙනුකරුවන්ට තීරණාත්මක, කාලෝචිත සහ අඛණ්ඩ සහයෝගයක් ලබා දීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය වැනි ප්‍රධාන රාජ්‍ය සහ කර්මාන්ත නියෝජිත ආයතන සමඟ බැංකුව සමීපව කටයුතු කරයි. මෙම ප්‍රයත්නය මගින් අපනයනවල තරගකාරිත්වය වැඩිදියුණු කිරීම තුළින් රට තුළට විදේශ විනිමය ගලා ඒම වැඩි කිරීමට බැංකුවේ අවධානය යොමු විය.

ගනුදෙනුකරුවන්

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කවය

අපනයන නැඹුරු, සුළු හා මධ්‍ය පරිමාණ නවෝත්පාදකයින්, නව නිපැයුම්කරුවන් සහ තාක්ෂණික ආරම්භකයින් කෙරහි අවධානය යොමු කරයි.

ණය ලබා දීමට අමතරව තොරතුරු සහ උපෙදේශන සේවා සැපයීම.

2022 ජනවාරි මස හඳුන්වා දුන් ලංකා බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කවය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ අපනයන-අභිමුඛ ව්‍යාපාර, නවෝත්පාදකයින්, නව නිපැයුම්කරුවන් සහ ව්‍යාපාර සහ තාක්ෂණික ආරම්භයන්හි ව්‍යාපාර ආරම්භ කිරීම සහ මූලික අරමුදල් සැපයීමේ ස්වරූපෙයන් ණය සඳහා ප්‍රවේශයට අමතරව තොරතුරු සහ උපදේශන සේවා සැපයීම කෙරහි අවධානය යොමු කරයි. වසර තුළදී බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට ණය සඳහා අයදුම් කිරීමට සහ ඉල්ලීම් ඉහළ නැංවීමට ඉඩ සැලසීම සඳහා විශේෂිත ජංගම යෙදුමක් සහ වෙබ් ද්වාරයක් දියත් කරන ලදී.

විදේශ කවය

5,446 ක්

සේවා සැපයූ ගනුදෙනුකරුවන්

ගනුදෙනුකරුවන් ඉලක්ක කර ගනිමින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

21

83 වැනි සංවත්සරය සැමරීම නිමිත්තෙන් ලංකා බැංකුව සිය ජාත්‍යන්තර ගනුදෙනුකාර සේවා ආධාරක ඒකකය වන "BOC විදේශ කවය" දියත් කරන ලදී. බැංකුවේ ජාත්‍යන්තර අංශය විසින් දියත් කරන ලද මෙම ඒකකය විදේශයන්හි සේවය කරන සහ ජීවත්වන ලංකා බැංකුවෙහි ගනුදෙනුකරුවන්ට උපරිම සේවා පහසුව සැලසීම අරමුණු කරයි.

නව ඒකකයේ නියෝජිතයින් ආසියාවේ, යුරෝපයේ, මැදෙපරදිග සහ වෙනත් රටවල ගනුදෙනුකරුවන් සමඟ ඉක්මනින් සහ පහසුවෙන් ශ්‍රී ලංකාවේ සේවාවන් වෙත ප්‍රවේශ විය හැකි බව සහතික කරනු ඇත. මේ හරහා ක්ෂණික ගිණුම් විවෘත කිරීම, හර සහ වෙනත් කාඩ්පත් ලබා ගැනීම, ණය සහ අන්තර්ජාල බැංකු සේවා වැනි සේවාවන් අත්විඳීමට ගනුදෙනුකරුවන්ට හැකි වේ.

ගනුදෙනුකාර අත්දැකීම

ගනුදෙනුකාර සේවාවේ විශිෂ්ටත්වය බැංකුවේ උපායමාර්ග වලින් එකකි, එමඟින් ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීම සහ නව ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීම සහතික කරන අතරම, ක්ෂේත්‍රය තුළ කැපී පෙනෙන සහ වෙනස් වූ පැවැත්මක් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව සහතික කරයි.

ලංකා බැංකුවෙහි ගනුදෙනුකාර අත්දැකීම් ඒකකය ගනුදෙනුකාර පැමිණිලි හැසිරවීමට සහ සේවා සම්බන්ධ ගැටළු විසඳීමට කැපවූ කණ්ඩායමක් ලෙස සේවය කරන අතරම, ඉදිරි පෙළ කාර්ය මණ්ඩලයේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර හඳුනා ගනී. බැංකුවේ පර්යේෂණ හා සංවර්ධන ඒකකය ගනුදෙනුකාර තෘප්තිය තක්සේරු කිරීමට සහ ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා දුර්වල ස්ථාන හඳුනා ගැනීමට සමීක්ෂණ පවත්වයි. මෙම අංගයන් බැංකුව තුළ සේවා නැඹුරු සංස්කෘතියක් ඇති කිරීමට උපකාරී වී ඇත.

වසර තුළදී, බැංකුව විසින් ශාඛා, ව්‍යාපාරික අංශ සහ ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන හරහා ගනුදෙනුකාර අත්දැකීම් සහ සේවා සැපයීම වැඩිදියුණු කිරීමට මූලපිරීම් ගණනාවක් සිදු කරන ලදී.

- ගනුදෙනුකාර අත්දැකීම් ඒකකය ශක්තිමත් කරන ලද අතර කාර්ය මණ්ඩල ධාරිතාව වැඩි දියුණු කරන ලදී.
- ලංකා බැංකුවෙ හි සන්නාම සහ ශාඛා ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ශාඛා සහ ස්මාර්ට් කලාප වැඩිදියුණු කරන ලදී.
- ශාඛාවල 5S ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කර වැඩිදියුණු කිරීම. තරඟ සහ අභියෝග විසින් අනුගමනය කරන ලද භෞතික ඇගයීම්.
- මූල්‍ය දිරිගැන්වීම් සහ තත්‍ය කාලීන ප්‍රමුඛ පුවරු ඇතුළුව සිදු කරන ලද ශාඛා මට්ටමේ කාර්යසාධනය සහ අභිප්‍රේරණ ක්‍රියාමාර්ග, දෝෂ අඩු කිරීමට සහ සේවා සැපයීම වැඩිදියුණු කිරීමට දායක වේ.
- අභිප්‍රේරණය සහ සේවා බෙදා හැරීමේ ප්‍රමිතීන් සහතික කිරීම සඳහා අන්තර් බැංකු සම්මාන සහ අභියෝග (Spirit සම්මාන සහ අභියෝග සම්මාන) සිදු කරන ලදී.

අභ්‍යන්තරව, බැංකුව ගනුදෙනුකාර පහසුව වැඩි දියුණු කරන ක්‍රියාවලීන් සඳහා රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (RPA) සඳහා ආයෝජනය කර ක්‍රියාත්මක කරයි. මෙම ආයෝජනයන් සේවා සැපයුම් කාලය සහ ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කර ඇත.

ගනුදෙනුකාර අත්දැකීම් වැඩිදියුණු කිරීමේ ප්‍රධාන පියවරක් වූයේ ගනුදෙනුකරුවන්ට වැඩි පහසුවක් සහ විශ්වසනීයත්වයක් ලබා දෙන නව ඩිජිටල් සේවාවන් හඳුන්වා දීමයි. අන්තර්ජාල බැංකුකරණය සහ ජංගම බැංකුකරණය ඇතුළු බැංකුවේ ඩිජිටල් වේදිකා ගණනාවක් හරහා බාධාවකින් තොරව සිදු කළ හැකි ගනුදෙනු සඳහා ස්වයංක්‍රීයකරණයන් ඇතුළත් වේ. මීට අමතරව, ඩිජිටල් ගනුදෙනුකාර ගමනේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් ගනුදෙනුකාර සේවා සහ ගනුදෙනුකාර අත්දැකීම් ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම සඳහා විශාල රැකුලක් ලබා දී ඇත.

ලේඛන කළමනාකරණ පද්ධතිය හරහා වැඩ ප්‍රවාහ ස්වයංක්‍රීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්

ක්‍රියාවලිය	පෙර තත්ත්වය	වත්මන් තත්ත්වය
හර කාඩ් නැවත සක්‍රීය කිරීම.	මධ්‍යගතව හසුරුවන කාලය – දින 3	නැවත සක්‍රීය කිරීම සඳහා ශාඛා මට්ටමේ ගත වන කාලය – විනාඩි 10
ණය කාඩ්පත් සඳහා මාර්ගගත අයදුම්පත.	විශේෂාංගය නොමැත.	ලංකා බැංකුවෙහි වෙබ් ද්වාරය හරහා ගනුදෙනුකරුවන්ට ණයපත් ඉල්ලා සිටිය හැක.
උකස් කිරීම සඳහා ආවරණ අනුමැතිය.	සාමාන්‍ය ක්‍රියාවලිය – දින 3	ස්වයංක්‍රීය කඩදාසි රහිත ක්‍රියාවලිය ගත වන කාලය – පැය 1
ආයතනික අංශයේ පූර්ව අනුමැතිය සඳහා වැඩි දියුණු කිරීම්. ආසන්න මුදල් ණය සඳහා වැඩිදියුණු කිරීම්.	ගත වන කාලය පිළිබඳව ගැටළු සහිත විය.	ක්‍රියාවලිය වැඩිදියුණු කර ඇත.
සාමාන්‍ය අනුමත කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම.		වැඩි දියුණු කළ සිද්ධි සෙවීම් විකල්ප සහ හඳුනාගත් ගැටළු නිවැරදි කිරීම.
ස්ථාවර තැන්පතු විවෘත කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම.	විශේෂ පොළී ඉහළ සීමාව කෝත මට්ටම්හි වලංගු කිරීම. දත්ත තත්ත්ව දර්ශක වලංගු කිරීම් නොමැත.	විශේෂ ගාස්තු ඉහළ සීමාව පරාමිතිකරණය කර ඇත. දත්ත තත්ත්ව දර්ශක වලංගු කිරීම් ඒකාබද්ධ වේ. නිපැයුම් මට්ටමේ සම්පූර්ණ ස්ථාවර තැන්පතු ප්‍රමාණය වලංගු කිරීම් එකතු කර ඇත.

මීට අමතරව, ඩිජිටල් ගනුදෙනුකාර ගමන් මඟේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් ගනුදෙනුකාර සේවා සහ ගනුදෙනුකාර අත්දැකීම් සඳහා විශාල පිටුවහලක් විය.

බැංකුවේ පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය සියලු පාර්ශ්වකරුවන් සමඟ විනිවිදභාවය සහ වගවීම සහතික කරයි. පාර්ශ්වකරුවන්ට ගුණාත්මක සේවාවක් සැපයීමේ ඉදිරි දර්ශනය සමඟින් සෑම ගණුදෙනුකාර මධ්‍යස්ථානයකදීම ප්‍රතිපෝෂණ දිරිමත් කරනු ලැබේ.

	2022	2021
ඉ/ගෙන ගිය පැමිණිලි ගණන	**39**	36
වසර තුළ ලැබුණු ගනුදෙනුකාර පැමිණිලි ගණන	**3,054**	2,159
වසර තුළ විසඳනු ලැබූ ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි ගණන	**3,069**	2,156
පැමිණිලි ගණන ඉ/ගෙන ආ	**24**	39
ශුද්ධ ප්‍රවර්ධක ලකුණු (NPS)	**35**	40
ගනුදෙනුකාර තෘප්තිමත් අනුපාතය (%)	**78**	79

2021 ට සාපේක්ෂව 2022 වසරේ පැමිණිලි සංඛ්‍යාව 41% කින් වැඩි වී ඇත, මූලික වශයෙන් එයට හේතු වන්නේ:

– ඉහළ ගිය ණය පොළී අනුපාත පිළිබඳ පැමිණිලිවල සැලකිය යුතු වැඩිවීමක්

– ණය අයකර ගැනීමේ ගැටළු

– ස්ථාවර තැන්පතු/දඩ ගාස්තු අනුපාත කලින් මුදා ගැනීම සඳහා අදාළ වන පොළී අනුපාත

ගනුදෙනුකාර ගමන්මඟ ඩිජිටල්කරණය කිරීම

ගනුදෙනුකාර අත්දැකීම් සහ බැංකුකරණයේ පහසුව වැඩිදියුණු කරන අතරම බැංකු අංශයේ නවීන ඉල්ලීම් සපුරාලීම සඳහා ඩිජිටල්කරණයේ තීරණාත්මක කාර්යභාරය ලංකා බැංකුව හඳුනාගෙන ඇත. එනිසා, ඩිජිටල් විශිෂ්ටත්වය මධ්‍ය කාලීන සිට දිගු කාලීන තිරසාරත්වය සඳහා බැංකුවේ උපායමාර්ගයේ මූලික සන්ධිස්ථානයකි. බැංකුව සිය ගනුදෙනුකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලන ඩිජිටල් යටිතල පහසුකම් සහ විසඳුම් සඳහා අඛණ්ඩව ආයෝජනය කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 දී ඩිජිටල් හෝ ඉලෙක්ට්‍රොනික බැංකු නාලිකා හරහා සිදුවන සියලුම ගනුදෙනුකාර ගනුදෙනු වලින් 48% ක් ඩිජිටල් නාලිකා හරහා සිදු වී අත.

2022 දී ගනුදෙනුකාර ගමන වැඩි ඩිජිටල්කරණයක් සඳහා ගෙන යාමට බැංකුව දරණ උත්සාහයේ විශේෂ අවස්ථා:

- විද්‍යුත් අත්සන සහිත කඩදාසි රහිත ගනුදෙනුකරුවන්ගේ ඇතුළත් කර ගැනීම ඇතුළුව සියලුම ශාඛා වෙත ඩිජිටල් KYC හඳුන්වාදීම.
- ලංකා බැංකුවහි ස්මාර්ට් පේ යෙදවුම් සක්‍රීය POS සහ MPOSS යන්ත්‍රවලින් සමන්විත පුළුල් වෙළඳ ජාලය.
- ස්මාර්ට් පේ යෙදවුම් හරහා භෞතික මුදල් රහිත ගනුදෙනු සක්‍රීය කිරීම සඳහා රාජ්‍ය ආයතන, ඉන්ධන පිරවුම්හල් සහ පුණ්‍යායතන සමඟ නව හවුල්කාරිත්වයන් ආරම්භ කරන ලදී.
- ලංකා බැංකුවහි මාර්ගගත ගෙවීම් ද්වාරය (IPG) සඳහා නව සාමාජිකයින් ඇතුල් කිරීමෙන් අංක එකේ ඊ-වාණිජ්‍යය තත්ත්වය රඳවා තබා ඇත.
- පුද්ගලික ණය නිපැයුම්, නිවාස ණය, ඉතුරුම් ගිණුම්, සහ ණය කාඩ්පත් ඇතුළු විවිධ නව බැංකු ගනුදෙනු සඳහා සබැඳි පහසුකම් හඳුන්වා දීම.
- තත්‍ය කාලීන ඩිජිටල් උපකරණ පුවරු ඇතුළු ශාඛා මට්ටමේ මූලපිරීම් හරහා බැංකුවේ ඩිජිටල් නිෂ්පාදන සමඟ නැඹුරු වූ ගනුදෙනුකරුවන් භෞතික Meeter-Greeters ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වී ඩිජිටල් නිෂ්පාදන හඳුන්වා දීම.
- හර කාඩ් අවලංගු කිරීම සඳහා නව ස්වයංක්‍රීය මොඩියුල හඳුන්වාදීම, තාවකාලික අයිරා සඳහා අනුමැතිය ආවරණය ලබා ගැනීම, අනුමත කිරීම් ආවරණය කිරීම උකස් කිරීම, ඩිජිටල් තත්ත්ව දර්ශකය වලංගු කිරීම, ආදිය.
- ලංකා බැංකුවහි ශාඛා හරහා විශ්‍රාමිකයින් සඳහා ජීවන සහතික ඩිජිටල් යාවත්කාලීන කිරීමට පහසුකම් සැලසීම.
- SLIPS හරහා විශාල වටිනාකම්හි යුත් වෙළඳ ගෙවීම් ස්වයංක්‍රීය කිරීම.
- ස්වයංක්‍රීය ගනුදෙනුකාර දැනුම්දීම් සහ යාවත්කාලීන පද්ධතිය.

ගනුදෙනුකරුවන්

ඩිජිටල්කරණය භාවිතය



ඉලෙක්ට්‍රොනික බැංකුකරණය

(ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර හා මුදල් චක්‍රීකරණ යන්ත්‍ර)

ගනුදෙනු වටිනාකම
රු. බිලියන 3,034.5
(+26%)

ගනුදෙනු පරිමාව
මිලියන 152.0
(+19%)

ලංකා බැංකුවේ ණයපත්

ගනුදෙනු වටිනාකම
රු. බිලියන 15.7
(+26%)

ගනුදෙනු පරිමාව
මිලියන 2.6
(+12%)

ස්මාර්ට් පේ යෙදවුම

ගනුදෙනු වටිනාකම
රු. බිලියන 3.2
(+88%)

ගනුදෙනු පරිමාව
මිලියන 8.3
(+80%)

නව ලියාපදිංචි වීම්
291,478
(+42%)

ස්මාර්ට් පාස්බුක් යෙදවුම

ලියාපදිංචි වීම්
1,974,138
(+31%)

ස්මාර්ට් ඔන්ලයින් බැංකුකරණය සහ බී ඇප් යෙදුම

ගනුදෙනු වටිනාකම
රු. බිලියන 1,202.6
(+87%)

ගනුදෙනු පරිමාව
මිලියන 33.9
(+25%)

නව ලියාපදිංචි වීම්
322,923

BOC IPG

ගනුදෙනු වටිනාකම
රු. බිලියන 59.0
(+98%)

ගනුදෙනු පරිමාව
මිලියන 26.9
(+38%)

ලියාපදිංචි වෙළෙන්දන්
126
(+43%)

BOC PoS

ගනුදෙනු වටිනාකම
රු. බිලියන 114.0
(+43%)

ගනුදෙනු පරිමාව
මිලියන 29.3
(+32%)

PoS යන්ත්‍ර
8,967
(+16%)

ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම

ඩිජිටල් නිෂ්පාදන සහ සේවාවන් වැඩි වශයෙන් භාවිතා කිරීමත් සමඟම, ඩිජිටල් ගනුදෙනුවල වර්ධනයෙක් ඇති විය. බැංකුව බහුවිධ නාලිකා හරහා විශ්වසනීයත්වය, පද්ධති බිඳ වැටීම් අවම කිරීම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩව ආයෝජනය කළේය. ප්‍රධාන ව්‍යාපාරික ඒකක සහ කාර්ය මණ්ඩලය සඳහා KPI ලෙස පද්ධති සක්‍රීයව පැවති කාලය ගැනේ.

ගනුදෙනුකාර සේවය නඟා සිටුවීම සඳහා 2022 දී ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමේ විශේෂ අවස්ථා:

- අන්තර්ජාල බැංකු ගනුදෙනු වල වැඩි ප්‍රමාණයක් සඳහා සහය වීම සඳහා පසු-අන්තය ශක්තිමත් කර ඇත
- හර කාඩ් නැවත සක්‍රීය කිරීම, ස්ථාවර තැන්පතු විවෘත කිරීම, ඩිජිටල් තත්ත්ව දර්ශකය වලංගු කිරීම්, ආසන්න මුදල් ණය යනාදිය ඇතුළුව, වැඩ ප්‍රවාහ කිහිපයක ස්වයංක්‍රීයකරණය.
- වසර තුළ ඉහළ ඩිජිටල් ගනුදෙනු සඳහා යටිතල පහසුකම් සැපයීම සඳහා දෘඩාංග සම්බන්ධව රු. මිලියන 810 ක ආයෝජනයක්.
- දුරස්ථ වැඩ කිරීම සඳහා විධිවිධාන සහ බැංකු සේවකයින් සඳහා නිවසේ සිට වැඩ කිරීමට අවස්ථාව සැලැස්වීම හරහා ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම
- රාජ්‍ය ආයතන, ඉන්ධන පිරවුම්හල්, පුණ්‍ය ගෙවීම් සහ Web QR ගෙවීම් සඳහා Lanka QR දීර්ඝ කිරීම ඇතුළුව විවිධ වෙළෙන්දන් සහ අංශවල අවශ්‍යතා සපුරාලීම සඳහා BOC Smart Pay විශේෂාංග වැඩිදියුණු කිරීම.
- ගතික ක්ෂණික ප්‍රතිචාර කේත සහ වෙළඳ ද්වාරයක් හඳුන්වා දීම. (ගතික ක්ෂණික ප්‍රතිචාර කේතය, සවිස්තරාත්මක විස්තර වාර්තා සහ වෙබ් ඉක්මන් ප්‍රතිචාර කේතයේ අන්තර් ක්‍රියාකාරිත්වය සමඟ)
- BOC Connect සඳහා නව විශේෂාංග හඳුන්වාදීම සහ පුළුල් නියෝජිත ජාලයකට ව්‍යාප්ත කිරීම.
- ලංකා බැංකුවේහි ස්මාර්ට් පාස්බුක් යෙදවුම සඳහා බහුභාෂා සහාය හඳුන්වාදීම.
- බැංකුවේ විදේශීය ශාඛා සඳහා අන්තර්ජාල සහ ජංගම බැංකු පද්ධති ක්‍රියාත්මක කිරීම.
- නව වෙළෙඳ මූල්‍ය ක්‍රමයක් හඳුන්වාදීම.
- බැංකුවේ තොරතුරු තාක්ෂණ අංශය සඳහා නව පුද්ගලයින් සහ ඉංජිනේරුවරුන් බඳවා ගැනීම.
- සියලුම ශාඛා වෙත Digi-pads ව්‍යාප්ත විය.
- මූල්‍ය අපරාධ වැළැක්වීමේ බැංකුවේ ප්‍රයත්නවල කොටසක් ලෙස විධිමත් goAML වාර්තාකරණය.

ගනුදෙනුකාර අධ්‍යාපනය

අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා සෘජුවම ප්‍රතිලාභ ලැබූ ගනුදෙනුකරුවන්
1,019

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, කාන්තා ව්‍යවසායකයින්, ශිෂ්‍යයින් සහ රාජ්‍ය සේවකයින් ඇතුළු විවිධ පරාසයන්ගේ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් අඛණ්ඩ ගනුදෙනුකාර අධ්‍යාපනය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට ලංකා බැංකුව කැපවී සිටී.

වසර තුළදී, බැංකුව අධ්‍යාපන දැනුවත් කිරීම සහ මූල්‍ය සාක්ෂරතාවයට දායක වීම සඳහා විවිධ වැඩසටහන් පවත්වන ලදී.

- සංවර්ධන සහකාරවරුන් සහ සංවර්ධන බැංකු කාර්ය මණ්ඩලය ඉලක්ක කර ගනිමින් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්.
- ගෘහස්ත, කෘෂිකර්ම සහ සංවර්ධන ගනුදෙනුකරුවන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්.
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි තවාන් වගාකරුවන් සඳහා අධ්‍යාපන වැඩසටහන්.
- බැංකුවේ සහනදායී දියවර දිරිය ණය යෝජනා ක්‍රමය පිළිබඳව ධීවර ප්‍රජාවන් සමඟ දැනුවත් කිරීමේ වැඩසටහන්.
- ආමුඛ ප්‍රේෂණ පිළිබඳ විධිමත් නාලිකා හරහා අධ්‍යාපනය සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- ළමා බැංකු නිපැයුම් සහ හරිත ඉතුරුම් නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්: e-තුරු, දියවර කැකුළු, හරිත කැකුළු.
- අසත්‍ය තොරතුරුවලට එරෙහිව සටන් කිරීමට හා බැංකු ක්ෂේත්‍රය කෙරෙහි විශ්වාසය ගොඩනැගීමට ඒකාබද්ධ සන්නිවේදන සහ බහු නාලිකා ව්‍යාපාර.

වගකීම් සහිත බැංකුකරණය

ලංකා බැංකුව ගනුදෙනුකරුවන් සමඟ ඇති සියලුම අන්තර්ක්‍රියා වලදී විනිවිදභාවය සහ වගවීම ප්‍රගුණ කරන අතර, සියලුම නිපැයුම් සහ සේවා පිළිබඳ පැහැදිලි සහ නිවැරදි තොරතුරු සැපයීමට කැපවී සිටී. එනම් පොළී අනුපාත, කල්පිරීමේ කාලසීමාවන්, සහ සියලුම නියමයන් සහ කොන්දේසි වැනි විස්තර ඇතුළුව බැංකුව ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ අභිමත භාෂාවෙන් අදාළ සියලු තොරතුරු පැහැදිලිව සන්නිවේදනය කරයි. ගනුදෙනුකරුවන්ට අපේක්ෂා කළ හැකි වගකීම් සහ ප්‍රමිතීන් ගෙනහැර දක්වන ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනුකාර ප්‍රඥප්තිය සමඟ බැංකුකරණ භාවිතයන් සහ ගනුදෙනුකරුවන්ගේ සහභාගීත්වය සම්පූර්ණයෙන්ම සමපාත වේ.

දත්ත රහස්‍යතාව සහ තොරතුරු තාක්ෂණ ආරක්ෂාව

ඩිජිටල්කරණයක් සහ මාර්ගගත සහ ජංගම ගනුදෙනු කරා යන ගමනට සමගාමීව, බැංකුව තොරතුරු සුරක්ෂිතතාව සහ දත්ත රහස්‍යතාව එහි වගකීමේ ප්‍රධාන අවධානය යොමු කරන අංශ ලෙස සලකයි. ගනුදෙනුකරුවන් දෙසට. දැඩි තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සහ අවදානම් සහිත ආයතනික සංස්කෘතියක් හරහා ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික සහ මූල්‍ය තොරතුරුවල පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීමට බැංකුව කැපවී සිටී.

GRI 418/FN-CB-230a.1

ගනුදෙනුකාර පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පැමිණිලි ලැබී නැත. වර්ෂය තුළ දත්ත කඩ කිරීම් හඳුනාගෙන නොමැති අතර පුද්ගලිකව හඳුනාගත හැකි කිසිදු තොරතුරක් දත්ත කඩකිරීම් වලට ලක් නොවූ අතර, දත්ත කඩකිරීම් වලින් කිසිදු ගිණුම් හිමියන්ට බලපෑමක් සිදු නොවීය.

FN-CB-230a.2

වසර තුළදී, ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමට අමතරව, ප්‍රතිපත්ති සංශෝධනය කිරීම, නිරන්තර අවදානම් පරීක්ෂණ පැවැත්වීම සහ ප්‍රමුඛ පෙළේ තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ

ගනුදෙනුකරුවන්

ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම මගින් තොරතුරු තාක්ෂණ ආරක්ෂාව ශක්තිමත් කිරීමට බැංකුව පියවර ගත්තේය. තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය කිරීමට බැංකුව දරන උත්සාහයන් 140 පිටුවේ අවදානම් කළමනාකරණ වාර්තාවේ තවදුරටත් විස්තර කර ඇත.

2022 දී දත්ත රහස්‍යතාව සහ තොරතුරු තාක්ෂණ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා බැංකුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග:

- ක්ෂේත්‍රයේ ප්‍රමිතීන්ට අනුකූල වන අතර ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව උපරිම කිරීම සඳහා 3DS 2.0 සත්‍යාපන ප්‍රොටෝකෝලය හරහා ද්වි-සාධක සත්‍යාපනය (2FA) සක්‍රීය කිරීම.
- වංචා වැලැක්වීමේ තාක්ෂණය බැංකුවේ චෙන්නායි ශාඛාව තුළ ක්‍රියාත්මක කිරීම.
- ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් සහ ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණය සඳහා ISO 20001 සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම.
- COBIT IT පාලන රාමුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම.
- විවිධ ව්‍යාපාරික අංශ හරහා කාර්ය මණ්ඩලය සඳහා සයිබර් ආරක්ෂණ පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- දත්ත ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි සමාලෝචනය කිරීම.
- දත්ත අහිමිවීම වැළැක්වීම (DLP) සහ දත්ත කාන්දුවීම වැළැක්වීමේ විසඳුම් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ සහ විදේශීය ශාඛාවල ක්‍රියාත්මක වන අතර, සියලුම ශාඛා වෙත ද ව්‍යාප්ත කිරීමට සැලසුම් කිරීම.

GRI 418-1

	2022	2021
දත්ත ආරක්ෂණ කඩ කිරීම් (සංඛ්‍යාව)	**කිසිවක් නැත**	කිසිවක් නැත
පුද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු නිරාවරණය වීමේ සිද්ධි ගණන වාර්තා වූ මුළු දත්ත ආරක්ෂණ කඩ කිරීමේ ප්‍රතිශතයක් ලෙස. (PII) (%)	**කිසිවක් නැත**	කිසිවක් නැත
දත්ත කඩකිරීම්වලින් පීඩාවට පත් ගිණුම් හිමියන් (සංඛ්‍යාව)	**කිසිවක් නැත**	කිසිවක් නැත

ඉදිරි දැක්ම

2023 දී ද ගනුදෙනුකරුවන්ට සහාය වීමට බැංකුව ස්ථානගත වී ඇත. 2022 දෙසැම්බර් මාසයේදී සහන කාලය අවසන් වන අතර අර්බුදකාරී ව්‍යාපාර ආපසු ගෙවීමේ පීඩනයට මුහුණ දෙන විට, ඉදිරි වසර තුළ පීඩාවට පත් ණය ගැනුම්කරුවන්ට තවදුරටත් සහන සඳහා අපේක්ෂිත නියාමන නිර්දේශයන්ට අනුකූලව ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමට ලංකා බැංකුව කැපවී සිටී.

2023 සහ ඉන් ඔබ්බට බැංකුව සඳහා ප්‍රධාන ප්‍රමුඛතා ක්ෂේත්‍ර:

- අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහ ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය අනුගමන කිරීම ඇතුළුව ඩිජිටල් නිපැයුම් සහ සේවාවන් ඩිජිටල්කරණය ඉහළ නැංවීම සහ සම්මත කිරීම් කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කරයි.
- ගනුදෙනුකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දීම සඳහා ශ්‍රම බලකායේ ධාරිතා ගොඩනැගීම සඳහා අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සහ ආයෝජනය කිරීම
- විශාල පරිමාවන් හැසිරවීමට මධ්‍යම ව්‍යාපාර පුනර්ජීවන හා ප්‍රතිස්ථාපන චක්‍රීකය ශක්තිමත් කිරීම, ව්‍යාපාර සහ ආර්ථිකය පුනර්ජීවනයට සහභාගී වීම සහ බැංකුව තුළ ව්‍යාපාර පුනර්ජීවන සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- ස්වයං සේවා වැඩිදියුණු කිරීම් ඇතුළුව BOC කාඩ්පත් හිමියන් සඳහා ප්‍රතිලාභ සහ පහසුව සඳහා විශ්ලේෂාංග ගවේෂණය කිරීම.
- ආරක්ෂක යටිතල පහසුකම්, ජාල යටිතල පහසුකම් සහ දුරස්ථ වැඩ කිරීමේ හැකියාවන් තවදුරටත් වැඩිදියුණු කිරීම්.
- හරිත ණය දීම සහ හරිත නිපැයුම් වැඩි දියුණු කිරීම.
- බැංකුවේ පුරෝකථන හැකියාවන් සහ කාර්යයන්යට සහාය වීම සඳහා කෘතිම බුද්ධිය සහ තාක්ෂණය ගවේෂණය කිරීම.
- වැඩි ප්‍රවේශ්‍යතා සහ අනෙකුත් විශේෂාංග සහිත නව වෙබ් අඩවියක් දියත් කිරීම.
- නව සාම්ප්‍රදායික නොවන සමාජ මාධ්‍ය වේදිකා සහ ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන ගවේෂණය කිරීම.

සේවකයින් බැංකුවේ අත්‍යවශ්‍ය මානව ප්‍රාග්ධනය වන අතර ලංකා බැංකුවේ මෙහෙයුම් කටයුතුවල කොඳු නාරටිය වේ. බැංකු ක්ෂේත්‍රයේ විශාලතම සේවා යෝජකයා ලෙස, ලංකා බැංකුව සාර්ථක වීමට තම කණ්ඩායම සවිබල ගැන්වීමට සහ සන්නද්ධ කිරීමට කැපවී සිටින අතර ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයේ ධාරිතාව සහ වෘත්තීයභාවය වර්ධනය කිරීමටද දායක වේ.

විශේෂාංග

ආසියාවේ හොඳම සේවා යෝජක සන්නාම සම්මානය 2022 -
ලෝක මානව සම්පත් සම්මේලනය

ගෝලීය මානව සම්පත් විශිෂ්ටත්ව සම්මානය 2022 -
ලෝක මානව සම්පත් සම්මේලනය

කාන්තා නියෝජනය **59%**

තොරතුරු තාක්ෂණයේ අත්‍යවශ්‍යය නව කාර්යයන් සඳහා නව බඳවා ගැනීම් **65%**

පුහුණු හා සංවර්ධනය සඳහා ආයෝජනය **රු. මිලියන 73.9 ක්**

එක් සේවකයෙකුට වසරකට **මිනිස් පැය 16 ක** සාමාන්‍ය පුහුණුව

කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ බාධා සහ රුකියා ලෝකයට සිදු වූ වෙනස්කම් මත, ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ සමාජ දේශපාලන බිඳවැටීම 2022 දී බැංකුවේ මානව සම්පතට සැලකියයුතු අභියෝග ඉදිරිපත් කළේය. ඉන්ධන, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟය සහ ඉන් අනතුරුව ඇති වූ සිවිල් විරෝධතා හේතුවෙන් කාර්ය මණ්ඩලයට බැංකුවේ ශාඛාවලට, විශේෂයෙන් ප්‍රධාන කාර්යාලයට ප්‍රවේශ වීමට ඇති හැකියාව කෙරෙහි බලපෑ අතර රට පුරා පැවති විදුලි කප්පාදුවද ව්‍යාපාරික කටයුතු වලට බාධාවක් විය. ආර්ථිකයේ තත්ත්වය සහ රජයේ මූල්‍ය අර්බුදය සැලකිල්ලට ගෙන, බැංකුවේ නියමිත සහ සාමාන්‍ය බඳවා ගැනීම් දිගටම කල් දැමිණි. විදේශ රටවලට සංක්‍රමණය වීම වැඩිවීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවූ බුද්ධි ගලනය ද ක්ෂේත්‍රයට සහ බැංකුවට අභියෝගයක් විය. මීට අමතරව, උද්ධමන පීඩනය වේගවත් වීම මගින් ඉහළ යන ජීවන වියදම බැංකුවේ සේවකයින්ගේ අවධානයට ලක්වන ප්‍රධාන කරුණක් විය.

මෙම වාතාවරණය තුළ බැංකුව විසින් ව්‍යාපාරික අඛණ්ඩතාව සහ සේවකයින්ගේ යහපැවැත්ම සඳහා ප්‍රමුඛත්වය දුන් අතර ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කර ගැනීම සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම සහ ශ්‍රම බලකාය සවිබල ගැන්වීම සිදු කරයි.

මෙහෙයුම් සන්දර්භය

- ඉන්ධන හිඟය හේතුවෙන් ශාඛා වෙත ප්‍රවේශය සීමා වීම මඟින් වැඩ කටයුතු අඩාල වීම
- සංක්‍රමණය සහ එහි ප්‍රතිඵලයක් ලෙස බුද්ධි ගලනය සමඟින් කුසලතා රඳවා ගැනීම අභියෝගයට ලක් විය
- උද්ධමන පීඩනය සහ ජීවන වියදම ඉහළ යාම

බැංකුවේ ප්‍රතිචාරය

- නිවසේ සිට වැඩ කිරීම/ දුරස්ථ වැඩ කිරීම හඳුන්වා දීම.
- ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩලය වෙත ප්‍රවාහන පහසුකම් සලසා දීම
- ප්‍රධාන වර්ධන ක්ෂේත්‍රවල බඳවා ගැනීම් වලට ප්‍රමුඛතාවය
- වෘත්තිකයන් සහ ඉහළ නිපුණතා සහිත කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවේශය ලෙස කොන්ත්‍රාත්තු පදනම මත සේවා ලබාගැනීම්
- ප්‍රවර්ධන ප්‍රතිපත්ති, ප්‍රතිලාභ, සහ දීමනා වෙළෙඳපළ අවශ්‍යතා සමඟ සම වීමට සමාලෝචනය කරන ලදී

සේවකයින්

අපගේ සේවකයින්ගේ අවශ්‍යතා සඳහා සවන් දීම

සම්බන්ධවීමේ වේදිකා

- බහු මට්ටම් කාර්ය මණ්ඩල රැස්වීම් (අඛණ්ඩව)
- විවෘත දොර සංස්කෘතිය (අඛණ්ඩව)
- දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය (අඛණ්ඩව)
- tvBOC හරහා අතථ්‍ය සබැඳියාව (අඛණ්ඩව)
- කාර්යසාධන ඇගැයීම් (වාර්ෂික/අර්ධ වාර්ෂික)
- වෘත්තීය සමිති හරහා සම්බන්ධ වීම (අඛණ්ඩව)
- වාර්ෂික ක්‍රියාකාරකම් දින දර්ශනය (අඛණ්ඩව)



අවශ්‍යතා

- තරඟකාරී වැටුප් යෝජනා
- ආරක්ෂිත සේවා ස්ථාන
- වෘත්තීය දියුණුව
- කුසලතා වර්ධනය සඳහා අවස්ථා
- සමාන අවස්ථාවන්
- රැකියා සුරක්ෂිතභාවය
- පශ්චාත් විශ්‍රාම සේවා සැලැස්ම

ප්‍රතිචාර දක්වන ආකාරය

- භෞතික සහ මානසික සුවය සහතික කිරීම සඳහා පියවර
- පුහුණුව සහ කුසලතා සංවර්ධනය සඳහා අඛණ්ඩ අවස්ථා
- ආකර්ශනීය වැටුප් සහ වැටුප් නොවන දීමනා
- විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

කාර්ය මණ්ඩල පැතිකඩ

බැංකු ක්ෂේත්‍රයේ විශාලතම මූල්‍ය ආයතනය ලෙස ලංකා බැංකුව විවිධාකාර ගතික සහ අභිප්‍රේරිත ශ්‍රමබලකායක් බිහිකරන සේවා ස්ථානයක් වේ. ශ්‍රී ලංකාවේ පළාත් නවය පුරාම මෙන්ම මාලදිවයින, සීෂෙල්ස් සහ ඉන්දියාවේ ශාඛාවල සහ බැංකුවට අනුබද්ධ ආයතනයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කරන වික්සත් රාජධානියේ පිහිටි පරිපාලිත සමාගමට අනුයුක්තව සේවය කරන සේවකයින් 8,209 කින් සමන්විත ශක්තිමත් කණ්ඩායමක් ඇත. ඔවුන් බහු ආගම්, බහු වාර්ගික සහ විවිධ සමාජ-ආර්ථික පසුබිම් නියෝජනය කරමින් අප කණ්ඩායමට හා සංස්කෘතියට විවිධත්වයක් එක් කර ඇත. ක්ෂේත්‍රයේ වඩාත්ම පිළිගැනීමක් සහිත සේවා යෝජකයෙකු ලෙස, බැංකුවේ බොහෝ ජයග්‍රහණ පිටුපස සිටින ගාමක බලවේගය වන රටේ ඉහළම දක්ෂතා සහිත සේවක ප්‍රජාවක් ආකර්ෂණය කර ගැනීමට ලංකා බැංකුවට හැකි වී තිබේ.



ශ්‍රම බලකායේ මුළු සේවකයින් (ස්ථිර)

8,209

කාන්තා නියෝජනය (ස්ථිර)

59%

සේවකයින්

පළාත	2022 ස්ථිර	2022 බාහිර ආයතන වලින් බඳවා ගත්	2022 කොන්ත්‍රාත්	2021 ස්ථිර	2021 බාහිර ආයතන වලින් බඳවා ගත්	2021 කොන්ත්‍රාත්
ශ්‍රී ලංකාව						
බස්නාහිර පළාත	3,601	368	3	3,620	351	13
මධ්‍යම පළාත	708	162	0	723	160	1
නැගෙනහිර පළාත	456	131	0	469	131	0
උතුරු පළාත	511	130	0	521	120	1
උතුරු මැද පළාත	564	126	0	580	127	4
වයඹ පළාත	665	130	0	676	131	5
සබරගමු පළාත	530	120	0	552	121	1
දකුණු පළාත	723	150	0	740	153	0
ඌව පළාත	451	118	0	456	118	0
එකතුව	8,209	1,435	3	8,337	1,412	25

දිවයින පුරා විසිරීම සහ ජාත්‍යන්තර ප්‍රවේශය

තරුණ සේවක පිරිස සහ අත්දැකීම්වල තුලනය


වයස අවුරුදු 35 ට අඩු සේවක පිරිස – **52%**

වයස අවුරුදු 35 සහ 55 අතර සේවකයින් – **44%**


වසර **11+** සේවකයින්ගේ සාමාන්‍ය සේවා කාලය

දේශීය ප්‍රජාව අතරින් බඳවා ගත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සාමාජික ප්‍රතිශතය – **100%**

වයස අනුව සේවකයින්



සේවා කාලය අනුව සේවකයින්




පැහැදිලි වෘත්තීය සංවර්ධනය සහ ප්‍රගතිය




කළමනාකරණ/අධීක්ෂණ වගකීම් සහිත භූමිකාවන්හි නියෝජනය
20%

රැකියාවේ ස්වභාවය අනුව සේවකයින්



● ස්ථිර ● බාහිර ආයතන වලින් බඳවා ගත් ● කොන්ත්‍රාත්

ශ්‍රේණිය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක ව්‍යාප්තිය



අ – ආයතනික සහ විධායක කළමනාකාරීත්වය
ආ – කළමනාකාරීත්ව (ප්‍රධාන කළමනාකරුවන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්, ශාඛා කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන්)
ඇ – නිලධාරීන් (කළමනාකරණ අභ්‍යාසලාභීන් ඇතුළුව),
ඈ – බැංකු සහකාර/කාර්යාල සහකාර සහ සමාන ශ්‍රේණි,

● පුරුෂ ● ස්ත්‍රී

විවිධත්වය සහ ඇතුළත් කිරීම

බැංකුව විසින් සේවය සපයන ගනුදෙනුකරුවන්ගේ හා පාර්ශ්වකරුවන්ගේ පිළිබිඹුවක් වන ලංකා බැංකුවේ සේවකයන් විවිධ සහ ගතික වේ. බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය සහ විනය සංග්‍රහය, අනෙකුත් ප්‍රතිපත්ති අතර, සමාන අවස්ථා සහ ලිංගික හිංසනයෙන් තොර සේවා පරිසරයක් සහතික කරයි. මීට අමතරව, සාධාරණ සහ ඇතුළත් සේවා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ලංකා බැංකුවෙහි කැපවීම තවදුරටත් පෙන්නුම් කරමින් සේවක දුක්ගැනවිලි විසඳීම සඳහා ද බැංකුවට වෙනම ප්‍රතිපත්තියක් ඇත.


මීට අමතරව, 2022 වසර තුළදී බැංකුවේ සේවාවන් සහ සංස්කෘතිය සාරවත් කරමින් විවිධ ආබාධ සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන් 16 දෙනෙකුගෙන් සමන්විතව, විවිධ ආබාධ සහිත පුද්ගලයින් බඳවා ගැනීම සඳහා බැංකුවේ ප්‍රතිපත්තිවල ප්‍රතිපාදන ඇත.

2022 දී, පාර්ශ්වකරුවන්ගේ පුළුල් උපදේශනයෙන් පසු බැංකුව නව පිටවීමේ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරන ලදී. සමාජ මාධ්‍යවල ශීඝ්‍ර වර්ධනය සහ වී ආශ්‍රිත අවදානම් මධ්‍යයේ, පුද්ගලික සමාජ මාධ්‍ය වෘත්තීමය ලෙස හැසිරවීම පිළිබඳ සේවක දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා බැංකුව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළේය.

GRI 405-1


2022 දී 59% ක කාන්තා නියෝජනයක් සහිතව ක්ෂේත්‍රයේ ඉහළම කාන්තා නියෝජන අනුපාතය ලංකා බැංකුව රඳවා තබා ගනී. කළමනාකරණ/අධීක්ෂණ මට්ටමේ ද මෙම විවිධත්වය නියෝජනය කරමින් බැංකුවේ විධායක කළමනාකාරීත්වය කාන්තා නියෝජනයෙන් 94% ක් පෙන්වයි.

පාලන යාන්ත්‍රණයෙහි විවිධත්වය



● විධායක කළමනාකාරීත්වය ● අධ්‍යක්ෂ මණ්ඩලය ● ආයතනික කළමනාකාරීත්වය

සේවකයින්ගේ විවිධත්වය



GRI 401-3

	2022	2021
වසර ආරම්භක දිනට මාතෘ නිවාඩු සඳහා හිමිකම් සහිත සේවිකාවන්	4,869	4,970
වසර තුළ මාතෘ නිවාඩු ලබා ගත් සේවිකාවන්	445	505
මාතෘ නිවාඩු සම්පූර්ණ කිරීමෙන් පසු වසර තුළ නැවත සේවයට පැමිණි සේවිකාවන්	414*	427
මාතෘ නිවාඩු සම්පූර්ණ කිරීමෙන් පසු වසර තුළ නැවත සේවයට පැමිණීමට නියමිත සේවිකාවන්	445	505
මාස 12 කට පසුවත් සේවයේ නියුතු සේවිකාවන්**	505	505
මාතෘ නිවාඩු ලබා ගන්නා සේවිකාවන්ගෙන් නැවත සේවයට වාර්තා කිරීමේ අනුපාතය	100%	100%
මාතෘ නිවාඩු ලබා ගන්නා සේවිකාවන් සේවයේ රැඳී සිටීමේ අනුපාතය	100%	100%

* 2021 දී ලබා ගත් මාතෘ නිවාඩු වලින් 2022 දී සේවිකාවන් 46 දෙනකු නැවත සේවයට පැමිණ ඇත
** 2021 දී මාතෘ නිවාඩු ලබා ගත් තවදුරටත් සේවයේ රැඳී සිටින සේවිකාවන්

වැටුප් සමානාත්මකතාවය

GRI 405-2

2021-2023 සඳහා අත්සන් කරන ලද සාමූහික ගිවිසුම සහ බැංකුවේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන පරිදි, ලංකා බැංකුව ස්ත්‍රී සහ පුරුෂ යන සේවක කණ්ඩායම් දෙක අතර සමාන වැටුප් (1:1) අනුපාතයක් පවත්වාගෙන යන බව සහතික කරයි.

ඇතුළත් සංස්කෘතිය සහ වැඩ පරිසරය

රැකියා ස්ථානයේ ඇති විය හැකි ලිංගික හිරිහැර සම්බන්ධයෙන් කටයුතු කිරීමට කඩිනම් විධාන, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි සහිත විනය සංග්‍රහයක් බැංකුව සතුව ඇත. බැංකුවේ දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය විමසුමේ සිට විසඳීම දක්වා දුක්ගැනවිලි හැසිරවීම තවදුරටත් නියම කර ක්‍රමවත් කරයි.

GRI 401-3

මෙම ප්‍රතිපත්ති, සාධාරණ සේවා පරිචයන් පවත්වාගෙන යාමට බැංකුවේ කැපවීම සමඟින් කාන්තාවන්ට හිතකර සේවා පරිසරයක් නිර්මාණය කරයි. ප්‍රධාන කාන්තා කුසලතා ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට බැංකුව දරන උත්සාහයේ වැදගත් අංගයක් වන්නේ මාපිය නිවාඩු ලබා දීමයි. මාපිය නිවාඩු ගන්නා සේවකයින්ගෙන් අඛණ්ඩව ඉහළ ආපසු පැමිණීමේ අනුපාතයක් දැකගත ඇති අතර, මාපිය නිවාඩු ලබා ගන්නා සේවකයින්ගෙන් 100% ක් සාර්ථකව රඳවා ගැනීමට හැකි වී ඇත.

බඳවා ගැනීම්

GRI 401-1

බැංකුවේ සියලුම බඳවා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත මිනිස් බල සැලැස්මක් අනුව සිදු කෙරේ. ඕනෑම බඳවා ගැනීමේ අවස්ථාවක් පිළිබඳ පොදු ප්‍රචාරණය සහතික කර ඇති අතර, ලිඛිත විභාගවලට එරෙහිව කාර්යසාධනය ඇතුළුව නව බඳවා ගැනීම් සඳහා දැඩි ප්‍රමිතීන් සහ පරීක්ෂණ ක්‍රියාපටිපාටි පවත්වාගෙන යනු ලැබේ.

රට සහ ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය හමුවේ බැංකුව විසින් නියමිත බඳවා ගැනීම් දිගින් දිගටම කල් දැමීය. කෙසේ වෙතත්, බැංකුවේ ඩිජිටල්කරණ ප්‍රයත්නයට සහාය පිණිස, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ තනතුරු 37 ක් පිරවීම සඳහා බඳවා ගැනීම් සිදු කරන ලදී. අවම ප්‍රතිස්ථාපන මට්ටම් පවත්වා ගනිමින්, වසර තුළදී නව බඳවා ගැනීම් 57 ක් සිදු කරන ලදී.



නව බඳවා ගැනීම් **57** ක්

නව බඳවා ගැනීම් වලින් කාන්තා නියෝජනය **61%**

තොරතුරු තාක්ෂණයේ අත්‍යාවශ්‍ය වර්ධන අංශ සඳහා නව බඳවා ගැනීම් **65%**

පළාත් **5 ක්** අවරණය වන පරිදි මෙම බඳවා ගැනීම් සිදු කිරීම

නව බඳවා ගැනීම්	2022	2021
පුරුෂ	22	3
ස්ත්‍රී	35	2

සේවකයින්

පළාත් අනුව බඳවා ගැනීම්

පළාත	පුරුෂ	ස්ත්‍රී
මධ්‍යම පළාත	–	–
නැගෙනහිර පළාත	–	–
උතුරු පළාත	–	–
උතුරු මැද පළාත	–	2
වයඹ පළාත	–	1
සබරගමු පළාත	–	2
දකුණු පළාත	–	1
ඌව පළාත	–	–
බස්නාහිර පළාත (ප්‍රධාන කාර්යාලය ඇතුළත්ව)	22	29
එකතුව	22	35

මුළු සේවයෙන් ඉවත් වීම්
224

විශ්‍රාම ගැනීමෙන් සේවයෙන් ඉවත් වීම්
38%

ඉල්ලා අස්වීමෙන් සේවයෙන් ඉවත් වීම්
58%

	2022	2021
ඉල්ලා අස්වූ සහ මියගිය		
පුරුෂ	35	15
ස්ත්‍රී	105	30
විශ්‍රාමගත්		
පුරුෂ	34	0
ස්ත්‍රී	50	0
මුළු ඉවත් වීම්	224	42

පිරිවැටුම

සේවක පිරිවැටුම

රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් සේවක පිරිවැටුම, බඳවා ගැනීම් සහ රඳවා තබාගැනීම් මත බලපෑම් තිබියදීත්; ව්‍යාපාර අඛණ්ඩතාව සහ ඉලක්ක සපුරා ගැනීම සහතික කිරීම සඳහා මෙහෙයුම් හරහා සේවක කණ්ඩායම සමඟ සමීපව අනුවර්තනය වීමට සහ වැඩ කිරීමට බැංකුවට හැකි විය.

GRI 401-1

ව්‍යාකූල සහ අස්ථාවර ව්‍යාපාරික පරිසරය සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ කාර්ය මණ්ඩල පිරිවැටුමේ සුළු වර්ධනයක් පෙන්නුම් කළේය. වසර තුළදී සේවක සේවිකාවන් 224 ක් ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීම් සහ විශ්‍රාම ගැන්වීම් හරහා බැංකුවෙන් ඉවත් විය. ශ්‍රම වෙළඳපළේ තත්ත්වයට ප්‍රතිචාර දක්වමින්, බැංකුව විසින් කාර්යක්ෂමතාවයන් සහ සහයෝගීතාවයන් උත්තේජනය කිරීම සඳහා කාර්යසාධන දර්ශක සමාලෝචනය කරන ලද අතර අනාගත සේවකයින් සඳහා ලංකා බැංකුවෙහි ආකර්ශනීය බව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රවර්ධන ප්‍රතිපත්තිය නැවත නිරීක්ෂණය කරන ලදී. තවද, සංක්‍රමණික පීඩනයන්ට ප්‍රතිචාර වශයෙන් නව සේවක රඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීමට බැංකුව කටයුතු කරමින් සිටී.

කාර්යක්ෂම සේවක කණ්ඩායමක් ගොඩනැගීම

ලංකා බැංකුවේ කැපවූ සේවකයන් බැංකුවේ උපායමාර්ගික අභිලාෂයන් සහ ඉලක්ක සඳහා ප්‍රධාන වේ. ඔවුන් බැංකුවේ හෘද ස්පන්දනය වන අතර බැංකුව සිය ගනුදෙනුකරුවන්ට සේවය සපයන මූලික මුහුණත වේ. එනිසා, බැංකුවේ සේවකයින් ශක්තිමත් කිරීම සහ ප්‍රශස්ත ලෙස ක්‍රියා කිරීමට ඔවුන් සන්නද්ධ කිරීම ප්‍රධාන අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයකි.

සේවකයින් සඳහා වටිනාකම්

වේතනය සහ ත්‍යාගවලින් ඔබ්බට ගිය විවිධ ක්‍රම හරහා බැංකුව සිය සේවකයන්ට වටිනාකම් නිර්මාණය කරයි.

- තරඟකාරී වේතන සහ කුසලතා මත පදනම් වූ දීමනා
- අබණ්ඩ නියැලීම සහ සේවක අභිප්‍රේරණය
- ඇතුළත්, සාධාරණ සහ කුසලතා මත පදනම් වූ සේවා ස්ථාන සංස්කෘතිය
- කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යය සහ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරමින් වැඩ-ජීවිත සමතුලිතතාවය
- ආරක්ෂිත සහ ගතික වැඩ පරිසරය
- සහනදායී සහ අනුපූරක ප්‍රතිලාභ
- පුහුණුව, සංවර්ධනය සහ වෘත්තීය ප්‍රගතිය සඳහා අබණ්ඩ ආයෝජනය
- පශ්චාත් රැකියා ප්‍රතිලාභ (විශ්‍රාම වැටුප්)

2022 වසර තුළ බැංකුව සිය නිර්මිත වටිනාකම් සේවකයින්ට ලබා දී ඇති ආකාරය පහත කොටස් වලින් දැක්වේ.

ලංකා බැංකුවේ සංස්කෘතිය

ලංකා බැංකුව විවිධාකාර, ඇතුළත්, වෘත්තීය සහ කුසලතා පදනම් කරගත් සේවා ස්ථාන සංස්කෘතියක නිවහන වේ. මෙම සංස්කෘතිය බැංකුවේ ගතික, අභිප්‍රේරිත සහ ඉහළ කාර්යසාධනයක් සහිත ශ්‍රම බලකායේ සාර්ථකත්වය සඳහා මූලික වේ.


අබණ්ඩ නියැලීම; පුහුණුව, සංවර්ධනය සහ වෘත්තීය දියුණුව සඳහා අබණ්ඩ ආයෝජනය; සාධාරණ වේතනය; සහ ආරක්ෂිත සහ විශිෂ්ටත්වය කේන්ද්‍ර කරගත් සේවා පරිසරයකට පහසුකම් සැලසීම බැංකුවේ උපායමාර්ග සහ සංස්කෘතියේ ප්‍රධාන අංග වේ. මෙමඟින් ලංකා බැංකුව රටේ හොඳම දක්ෂතා ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට හැකි ක්ෂේත්‍රයේ වඩාත් කැමති සේවා යෝජකයෙකු බව සහතික කරයි.

ලංකා බැංකුවේ සංස්කෘතිය සහ ශ්‍රම බලකාය, බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා වන ඩිජිටල්කරණයේ විශිෂ්ටත්වය; ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය, ණය සංස්කෘතිය සහ ගුණාත්මකභාවය සහ ස්ථාවරත්වය, යහපාලනය සහ තිරසාර වර්ධනය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන සාධකයකි.

වේතන, දීමනා සහ ප්‍රතිලාභ

2021 සිට 2023 දක්වා කාලය සඳහා අත්සන් කරන ලද සාමූහික ගිවිසුමට අනුකූලව, බැංකුවේ සේවකයින්ට වෙළඳපළ අනුපාතවලට අනුකූලව ප්‍රතිලාභ සහ දිරිගැන්වීම් රාශියක් ලැබේ. බැංකුවේ මානව ප්‍රාග්ධනයේ කැපවීම සහ ආයෝජනයේ කොටසක් ලෙස සේවකයින්ට අභිමතය පරිදි ප්‍රසාද දීමනා සහ දිරි දීමනා, වැටුප් සහිත නිවාඩු, වෛද්‍ය ප්‍රතිපූරණ සහ සහනදායී ණය පහසුකම් ද ලැබේ.

සහන පොළී යටතේ සේවක මණ්ඩලයට ලබා දුන් ණය යෝජනා ක්‍රම



වසර තුළදී, රටේ ආර්ථික අර්බුදය සහ උද්ධමන අනුපාත වේගයෙන් ඉහළ යාම තුළ තරඟකාරිත්වය සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා බැංකුව සිය සේවක වැටුප් සහ ප්‍රතිලාභ වැඩසටහන පිළිබඳ පුළුල් සමාලෝචනයක් පවත්වන ලදී. වෙළෙඳපළ මිල ගණන්වලට අනුකූලව විදේශීය ශාඛා සඳහා ද වැටුප් සංශෝධන සිදු කරන ලදී.

GRI 201-3

ලංකා බැංකුවේ සේවා කාලය සම්පූර්ණ කළ එහි හිටපු සේවකයන්ට සුවිශේෂී විශ්‍රාම දීමනාවක් සහ වෛද්‍ය අවශ්‍යතා සඳහා ද බැංකුව සහාය දක්වයි. බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව වැන්දඹුවන්ට සහ අනාථ දරුවන්ට ද මෙම ආධාරය ලබා දේ.
රජය විසින් නියම කරන ලද නිර්දේශවලට සමගාමීව විශ්‍රාම වැටුප් අගයන් වසර තුළ සංශෝධනය කරන ලදී.

- විශ්‍රාමිකයින් 7,326 ක් බැංකුවේ විශ්‍රාමික වැඩසටහන මඟින් ප්‍රතිලාභ ලබයි
- වැන්දඹු/වැන්දඹු හා අනත්දරු ප්‍රතිලාභීන් 2,001
- උද්ධමන පීඩන සඳහා සහාය සැපයීමට ඒකාබද්ධ ප්‍රතිලාභ චක්‍රලේඛය සමාලෝචනය කරන ලදී

GRI 401-2

බැංකුව විසින් අත්සන් කරන ලද සාමූහික ගිවිසුම මඟින් සේවකයින් සඳහා සියලුම වැටුප් සහ වැටුප් නොවන ප්‍රතිලාභ අර්ථ දක්වා ඇත. බැංකුවේ සියලුම සේවකයන්ට සුදුසු පරිදි සාධාරණ හා සමාන වේතන සහ ප්‍රතිලාභ ලබා දෙන බව ගිවිසුමෙන් නියම කෙරේ.

GRI 201-3

	2022 රු. බිලියන
වන්දි සහ ප්‍රතිලාභ සඳහා ආයෝජනය කිරීම	27.5
විශ්‍රාමිකයින්ට විශ්‍රාම ආධාර	1.5

කාර්ය මණ්ඩල ගෙවීම්

	2022 %
ස්ත්‍රී	60
පුරුෂ	40

සාධාරණ වැඩ පිළිවෙත්

සමාන අවස්ථා සළසන සේවා යෝජකයෙකු ලෙස, ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම හෝ වෙනත් සාධක නොසලකා සියලු සේවකයින්ට සමාන සැලකීම සහ අවස්ථා සහතික කිරීම සඳහා බැංකුව ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ ගණනාවක් ක්‍රියාත්මක කර ඇත. ලංකා බැංකුවෙ හි දැඩි ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ වෙනස් කොට සැලකීමක් නොවන වැඩ පරිසරයක් නිර්මාණය කරන අතර සියලුම දේශීය රෙගුලාසි සහ ජාත්‍යන්තර භාවිතයන්ට අනුකූල වේ.

මහා කළමනාකරුගේ සභාපතිත්වයෙන් යුත් මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව; මානව සම්පත් සහ වේතන අනුකමිටු සමඟ එක්ව; ප්‍රතිපත්ති මට්ටමේ දිශානතිය සහ සහාය ඇතුළුව බැංකුවේ අතිවිශාල මානව සම්පත් උපායමාර්ග සම්බන්ධ සියලු කාරණා අධීක්ෂණය කරයි. බැංකුවේ මානව සම්පත් කළමනාකරණ කාර්යය ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරයි. සියලුම සේවක ස්ථාන මාරුවීම් ස්ථාන මාරු මණ්ඩලයක් මඟින් අධීක්ෂණය කරයි.

මෙහෙයුම් සහ ධූරාවලියේ වාර්තාකරණ ප්‍රවාහය හරහා විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා බැංකුව විවෘත ප්‍රතිපත්තියක් ද අනුගමනය කරයි.

2022 වසර තුළදී, බැංකුව විසින් නව පිටවීමේ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනු ලැබුවේ මානව සම්පත් ක්‍රියාකාරිත්වයට සේවක නියැලීම සහ රඳවා තබා ගැනීම සඳහා වන එහි ප්‍රයත්නයන් මනාව සකස් කිරීමට උපකාර කිරීම සඳහාය.

GRI 407

අපගේ සේවකයින්ගෙන් 100% ක් වෘත්තීය සමිති හයෙන් එකකට හෝ අයත් වන අතර සාමූහික කේවල් කිරීමේ නිදහස බැංකුව තහවුරු කරයි. වෘත්තීය සමිති සමඟ සියලු සාකච්ඡා පවත්වනු ලබන්නේ තේරී පත් වූ නියෝජිතයන් හරහා වන අතර උපරිම විනිවිදභාවය සහතික කෙරේ. 2021 සිට 2023 දක්වා කාලය සඳහා 2021 දී අත්සන් කරන ලද සාමූහික ගිවිසුම 2022 තුළ දිගටම බලාත්මක විය.

සේවකයින්

GRI 402-1

සියලුම ස්ථිර සේවකයින් සැලකිය යුතු මෙහෙයුම් වෙනස්කම් වලට පෙර සපයා ඇති මාස හයක දැනුම් දීමේ කාල සීමාවක් සහිතව දැනුම්දීමේ කාල සීමාව සහ උපදේශන සහ සාකච්ඡා සඳහා විධිවිධාන දක්වා ඇති සාමූහික ගිවිසුම් මගින් ආවරණය කෙරේ.

GRI 404-3

බැංකුව විසින් කලින් තීරණය කරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) මත පදනම්ව සියලුම සේවකයින් සඳහා අර්ධ-වාර්ෂික කාර්යසාධන ඇගයීම් සිදු කරයි. බැංකුවේ ප්‍රවර්ධන සහ වෘත්තීය උසස්වීම් ප්‍රතිපත්තිය උසස්වීම් සඳහා අවශ්‍ය නිර්ණායක දක්වා ඇති අතර, සම්මුඛ පරීක්ෂණ කාර්යසාධනය සහ පූර්ව සම්මුඛ පරීක්ෂණ ලකුණු වල එකතුවක් මත උසස්වීම් ප්‍රදානය කෙරේ. කාර්යසාධන කළමනාකරණ පද්ධතියෙන් ලැබෙන පූර්ව සම්මුඛ පරීක්ෂණ ලකුණු සැලකිය යුතු ප්‍රතිශතයක් වන අතර එය සම්මුඛ පරීක්ෂණ වලට පෙර දැනුම් දෙනු ලැබේ.

කුසලතා මත පදනම් වූ උසස්වීම්	2022	2021
පුරුෂ	301	303
ස්ත්‍රී	287	426

GRI 406-1

වෙනස් කොට සැලකීම් සහ ඒ සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගෙන ඇති සිදුවීම් වසර තුළ වාර්තා වී නොමැත.

ආරක්ෂිත සහ ගතික වැඩ පරිසරය

ලංකා බැංකුව සිය සේවකයින්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම කෙරෙහි විශාල වැදගත්කමක් දරයි. සේවා ස්ථානයේ සෞඛ්‍ය සහ ආරක්ෂාව (H&S) යන ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා බැංකුව සවිස්තරාත්මක මාර්ගෝපදේශ ස්ථාපිත කර ඇත. තවද, බැංකුවේ වෛද්‍ය ආධාර යෝජනා ක්‍රම යටතේ සේවක හිමිකම්, වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව (OHS) කාරණා සඳහා සහභාගීත්වය සහ උපදේශනය ප්‍රවර්ධනය කරන සාමූහික ගිවිසුම්වල පැහැදිලිව දක්වා ඇත.

ඉන්ධන අර්බුදයට සහ කොවිඩ්-19 වසංගතයට ප්‍රතිචාරය

- කොවිඩ්-19 සහ ඉන්ධන අර්බුදයට ප්‍රතිචාර වශයෙන් කාර්ය මණ්ඩල ආරක්ෂාව සහ ප්‍රවේශය (ප්‍රවාහනය) සඳහා රු. මිලියන 47.6 ක් ආයෝජනය කර ඇත.
- කාර්යයන් තෝරාගැනීම සඳහා නිවසේ සිට වැඩ කිරීම (WFH) නියමු කර ඇති අතර පුළුල් කිරීමේ සැලසුම් ක්‍රියාත්මක වේ.
- නිවසේ සිට වැඩ කිරීම් මිනිස් දින 887 ක් සපයා ඇත.
- දුරස්ථ වැඩ සඳහා යටිතල පහසුකම් පුළුල් කර ඇත.
- 3,000 කට අධික සේවක පිරිසක් අර්බුදය තුළ බැංකුව විසින් සපයන ලද ප්‍රවාහන පහසුකම් භාවිතා කළහ.
- තාවකාලික ස්ථාන මාරුවීම්, නම්‍ය වේලාවන්, වැඩ ලැයිස්තු සහ අවශ්‍යතා මත පහසු ඇඳුම් ආදී සහන සපයන ලදී.
- කොවිඩ්-19 බලපෑමට ලක් වූ සේවකයින් සහ පවුලේ සාමාජිකයින් සඳහා වෛද්‍ය ප්‍රතිපූරණය ලබාදීම අඛණ්ඩව සිදු විය.

GRI 403-7/403-8/403-9/403-10

නොපැමිණීම හෝ රැකියාවට සම්බන්ධ අනතුරු සහ/හෝ රැකියාවට අදාළ අයහපත් සෞඛ්‍ය තත්ත්වයන් හේතුවෙන් වසර තුළ අහිමි වූ දින 56 ක් වාර්තා විය. කොවිඩ්-19 වසංගතයේ බලපෑම අවම කිරීමට සහ සියලුම සේවකයින් සඳහා ආරක්ෂිත සේවා පරිසරයක් සහතික කිරීමට බැංකුව දරන අඛණ්ඩ උත්සාහය මෙමඟින් පිළිබිඹු කරයි.

GRI 403-2/403-1/403-3

	දින
රැකියාවට සම්බන්ධ තුවාල සහ/හෝ වෘත්තීය රෝග හේතුවෙන් අහිමි වූ දින හෝ නොපැමිණි දින ගණන	56
කොවිඩ්-19 ආසාදන හේතුවෙන් අහිමි වූ දින ගණන	51
කොවිඩ්-19 ආශ්‍රිත නිරෝධායනය සඳහා විශේෂ නිවාඩු ලබා දී ඇති දින ගණන	331

GRI 403-4/403-5

සේවකයින්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව තහවුරු කිරීමට බැංකුවේ කැපවීමේ කොටසක් ලෙස, විධිමත් වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව (OHS) උදෙසා කමිටු ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා සේවකයින්ගේ නියෝජනය ද ඇතුළත් වේ. සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ සංස්කෘතියක් තුල සේවකයන් දැනුවත් කිරීම සඳහා ගිනි ආරක්ෂණ පෙරහුරුවක් සහ නිත්‍ය සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් වසර තුළ පවත්වන ලදී. මීට අමතරව, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයෙන් සැදුම්ලත් ඉහළ මට්ටමේ විශේෂ ආරක්ෂක කාර්යසාධක බලකායක්, සියලුම සේවකයන් සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම අඛණ්ඩව සිදු කරයි.

GRI 403-6

සේවකයින්ගේ සෞඛ්‍යය පවත්වා ගැනීමට සහාය වීම සඳහා බැංකුව ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර වෛද්‍යවරයකු සහ ෆාමසියක් ලබා දී ඇති අතර බාහිර රෝගී (OPD) ප්‍රතිකාර, රෝහල්ගතවීම සහ අනෙකුත් චිකිත්සා අතර කොවිඩ්-19 සඳහා ප්‍රතිකාර ආවරණය වන පරිදි සියලුම ස්ථිර සේවකයින් සඳහා පුළුල් වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමයක් පිරිනමයි.

පුහුණු හා සංවර්ධන

සේවක පුහුණුව සඳහා ආයෝජනය කිරීම ලංකා බැංකුවේ ප්‍රමුඛතාවයක් ලෙස පවතින අතර, මෙම ප්‍රයත්නය සඳහා සැලකිය යුතු සම්පත් කැප කර ඇත. බැංකුවේ මානව සම්පත් කාර්යය සේවකයින්ට වඩා හොඳ නායකයින්, ඵලදායී තීරණ ගන්නන් සහ අභිප්‍රේරිත සහ තෘප්තිමත් පුද්ගලයන් බවට පත්වීමට ඉඩ සැලසීමට උත්සාහ කරයි.

මෙම අගයන් ප්‍රත්‍යස්ථ ශ්‍රම බලකායක් ගොඩනැගීමට සහ තිරසාර වටිනාකම් නිර්මාණය සහ වර්ධනය සහතික කිරීමට බැංකුව දරන ප්‍රයත්නවල කේන්ද්‍රස්ථානය වේ.

විශේෂයෙන්ම බැංකුවේ පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත්තේ ශීඝ්‍රයෙන් වෙනස් වන, විචල්‍යය සහ සංකීර්ණ පරිසරයක් තුළ දියුණු වීමට අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් තම ශ්‍රම බලකාය සන්නද්ධ කිරීමටය. අවශ්‍යතා තක්සේරු කිරීම, ඉලක්ක සැකසීම, වැඩසටහන් සැලසුම් කිරීම සහ ඉගෙනුම් ප්‍රතිඵල නිරූපනය කිරීම, පුහුණු ක්‍රම තෝරා ගැනීම සහ පුහුණුවේ ඵලදායිතාවය තහවුරු කර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා
වන පද්ධති සහ ක්‍රියාවලි ද රාමුව මඟින් දක්වා ඇත.

2022 වසර තුළදී බැංකුව විසින් සේවකයින් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 73.9 ක් වෙන් කරන ලදී. නායකත්ව සංවර්ධනය සහ වෘත්තීය ප්‍රගතිය සම්බන්ධයෙන්, කළමනාකාර තනතුරු සහ ඉහළ තනතුරු සඳහා අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාත්මක කිරීමට බැංකුව දත්ත මත පදනම් වූ, තාක්ෂණික ආධාරක ප්‍රයත්නයන් ආරම්භ කළේය. විශේෂිත භූමිකාවන් හඳුනා ගැනීම සහ වැඩි වගකීම් සහ ජ්‍යෙෂ්ඨ තනතුරු භාර ගැනීමට සුදුසු අපේක්ෂකයින් හැඩගැන්වීම ආදී ප්‍රයත්නයන් සඳහා බාහිර පුද්ගලයින් සහ ආයතන යොදා ගනිමින් සියලුම කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා සකස් කරන ලද ඒකාබද්ධ නායකත්ව සංවර්ධන වැඩසටහන් මඟින් සහය විය.

වසංගතයේ අවසාන කාල සීමාවේ සහ ආර්ථික අර්බුදය ආරම්භයේ එල්ල වුනු අභියෝග මධ්‍යයේ වුවද, සහ MSTeams, Zoom සහ tvBOC වැනි තාක්ෂණික මාර්ග භාවිතා කරමින් බැංකුව සිය පුහුණු කිරීමේ කටයුතු දිගටම පවත්වන ලදී. පුහුණුකිරීමේ නිලධාරීන් විවිධ අන්තර් ක්‍රියාකාරී සහ ආකර්ෂනීය සම්පත් සමඟ සබැඳි සහ ඩිජිටල් වේදිකාවලට ගැලපෙන පරිදි පුහුණු වැඩසටහන් අනුවර්තනය කරන ලදී.

බැංකුවේ මහරගම විශේෂිත පුහුණු මධ්‍යස්ථානයේ ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි සුදුසුකම් ලත් සහ ප්‍රවීණ සම්පත්දායකයින් සමඟ පුහුණු කටයුතු සිදු කරන අතර අනෙකුත් පුහුණුවීම් සඳහා ද පහසුකම් සපයයි.

GRI 404-1

බැංකුව විසින් වසර තුළදී මිනිස් පැය 129,493 ක පුහුණුවක් ලබා දී ඇති අතර, වර්ෂය සඳහා සාමාන්‍යයෙන් එක් සේවකයෙකු සඳහා මිනිස් පැය 16 ක පුහුණුවක් ලබා දී ඇත.

	2022 රු. මිලියන	2021 රු. මිලියන
පුහුණුව සඳහා ආයෝජනය	73.9	64.1



පවත්වන ලද පුහුණු වැඩසටහන්
663

මුළු පුහුණු මිනිස් පැය
129,493

ශ්‍රවණාගාර, දේශන ශාලා, පුස්තකාල, නේවාසිකාගාර පහසුකම් සහ විශේෂිත සම්පත් දායකයින්ගේ සංචිතයකින් සමන්විත අංග සම්පූර්ණ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනය

එක් සේවකයකුට වසරකට සාමාන්‍ය පුහුණු **මිනිස් පැය 16**

මාර්ගගත සහ ඩිජිටල් පුහුණු නාලිකා සඳහා අනුගත වීම

ශීඝ්‍රයෙන් වෙනස් වන ව්‍යාපාරික පරිසරයකට අනුවර්තනය වීමේ පියවරක් ලෙස, 2022 දී බැංකුවේ පුහුණු සහ සංවර්ධන මූලපිරිම්, බැංකුකරණය සහ ඩිජිටල්කරණය වූ මූල්‍ය සේවාවල නව යුගයක් සඳහා සේවකයින් නැවත පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර, ලංකා බැංකුවෙහි දිගුකාලීන සැලැස්ම ඉදිරියට ගෙනයාම සඳහා ගණුදෙනුකාර කේන්ද්‍රිත්වය ප්‍රධාන කොට ගෙන සේවක කාර්යක්ෂමතාවය, හැකියාව හා නිපුණතා වැඩි දියුණු කිරීමට කටයුතු කරන ලදී.

GRI 404-2

වර්ෂය තුළ ප්‍රධාන පුහුණු වැඩසටහන් වෙනත් ක්ෂේත්‍රයන්ට පරිබාහිරව පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී:

- ණය දීම
- තොරතුරු තාක්ෂණය
- අනුකූලතා
- චකිතු කිරීම සහ අයකර ගැනීම්
- සාමාන්‍ය බැංකුකරණය සහ බැංකුකරණ මෙහෙයුම්
- අභ්‍යන්තර පාලනය සහ විගණනය
- භාණ්ඩාගාර මෙහෙයුම්
- මානව සම්පත්
- නිපුණතා සංවර්ධන
- විකුණුම් සහ අලෙවිකරණය
- මුදල් හා ක්‍රම සම්පාදන
- අවදානම් කළමනාකරණය
- නීතිමය
- ආරක්ෂක
- පුද්ගලික සංවර්ධනය සහ ආචාර විධි
- වැඩ ජීවිතයේ සමබරතාවය සහ ආතතිය කළමනාකරණ

tvBOC ආයතනය සේවකයින්ට ගතික සහ ආකර්ෂනීය පුහුණු වැඩසටහන් ලබා දෙන ඒකාබද්ධ නාලිකාවකි. අනෙකුත් විද්‍යුත් ඉගෙනුම් සහ ඩිජිටල් වේදිකා සමඟ ඒකාබද්ධව, බැංකුව විසින් සේවකයන්ට කාලානුරූපීව තීරණාත්මක පුහුණුවක් ලබාදීම සහතික කරන ලදී.

සේවකයින්

tvBOC හරහා විකාශන වූ ප්‍රධාන පුහුණු වැඩසටහන්:

- උකස් කිරීම්, විදේශ මුදල් සහ ප්‍රේෂණ පිළිබඳ සාකච්ඡා වැඩසටහන්
- ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ වාර්තා උත්පාදනය සහ දත්ත විකේතණය කිරීම
- කල් බදුකරණය, සංවර්ධන ණය දීම සහ ප්‍රතිමූල්‍යකරණය පිළිබඳ වැඩසටහන් මාලාව

සේවක සහභාගිත්වය

විනිවිද පෙනෙන, ස්ථාවර සහ ක්‍රමානුකූල සේවක නියුක්ත වීම බැංකුවේ සේවකයින් සමඟ ඇති සබඳතාවයේ ශක්තිය, එහි චෙතිහාසික වශයෙන් පහළ කාර්ය මණ්ඩල පිරිවැටුම සහ බැංකුවේ සේවකයින්ගේ විශිෂ්ට කාර්යසාධනය තීරණය කරන ප්‍රධාන සාර්ථක සාධකයක් වී ඇත. කොවිඩ්-19 වසංගතය සහ දුරස්ථ වැඩ වැනි බාධා කිරීම් හමුවේ වුවද සේවකයින් සමඟ සම්බන්ධ වීමට බැංකුවේ කැපවීම ඉහළ මට්ටමේ අභිප්‍රේරණයක් පවත්වා ගැනීමට දායක වී ඇත.

බැංකුව විවෘත සන්නිවේදනය අගය කරන අතර, ඒ සඳහා විවෘත ප්‍රතිපත්තියක් භාවිතා කරයි. කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම, සම්බන්ධ කිරීම සහ නිරත වීම සහතික කිරීම සඳහා මාර්ග ගණනාවක් භාවිතා කරයි.

2022 දී, බැංකුවේ අභ්‍යන්තර රූපවාහිනී නාලිකාව වන tvBOC ඇතුළු නාලිකා මිශ්‍රණයක් e-Learning platforms, MS Teams වැනි නව ඩිජිටල් නාලිකා; ඊමේල් සහ ඊමේල් පුවත් පත්‍රිකා වැනි සම්ප්‍රදායික ඩිජිටල් නාලිකා; WhatsApp වැනි සමාජ මාධ්‍ය යෙදුම්; සහ උත්සව සහ තරඟ වැනි සාම්ප්‍රදායික භෞතික නාලිකා; සේවක සහභාගිත්වය ලබා ගැනීම සඳහා වඩාත් ඵලදායී බව ඔප්පු විය.

සේවක සම්බන්ධීකරණ සමීක්ෂණයක් 2022 වසරේ දී ආරම්භ කරන ලද අතර, සමීක්ෂණයේ ප්‍රතිඵල ඉදිරි මාසවලදී අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

ලංකා බැංකු "Spirit" සම්මාන සහ හොඳම ශාඛා තරඟය වැනි කාර්යසාධනය පදනම් කරගත් සම්මාන බැංකුවේ සේවක සහභාගිත්වයේ ප්‍රධාන විශේෂතා වූ අතර එමඟින් ඉහළ කාර්යසාධනයක් ඇති සහ වෙහෙස මහන්සි වී වැඩ කරන සේවකයින්ට ත්‍යාග පිරිනැමීමට සහ පිළිගැනීමට හැකි විය.

තවද, ව්‍යාපාරික ඒකක, මෙහෙයුම් සහ අංශ හරහා විවෘත බෙදාගැනීම, අදහස් සහ නවෝත්පාදනය සඳහා පහසුකම් සැලසීම සඳහා හරස් ක්‍රියාකාරී කණ්ඩායම් 2022 වසරේ දී හඳුන්වා දෙන ලදී. කැපී පෙනෙන අදහස් පිළිගනු ලබන අතර ඒවා බැංකුව තුළ ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාව තක්සේරු කිරීමට ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව වෙත යොමු කෙරේ.

- tvBOC හරහා පැය 100 පුහුණු විකාශනය
- සේවක යහපැවැත්ම සහ සුභසාධනය සඳහා පහසුකම් පරාසය
- සේවක මානසික සහ සමාජීය සෞඛ්‍යය ඉලක්ක කරගත් වැඩසටහන් සහ මුලපිරීම්
- නිවාඩු බංගලා සහ නිවාඩු නිකේතන
- බහුවිධ අවස්ථා සහ ප්‍රවර්ධන වැඩසටහන්
- ශාඛා මට්ටමේ නියැලීමේ මුලපිරීම්

2022 වසරේ දී tvBOC හරහා පැය 100 ක වැඩසටහන් විකාශනය කිරීමත් සමඟ, බැංකුවේ මෙහෙයුම් පුළුල්ව ආවරණය වන පරිදි සේවක සහභාගිත්වයේ ප්‍රධාන මූලාශ්‍රයක් බවට මෙම නාලිකාව පත්ව ඇත.

2022 වසරේ දී tvBOC හරහා විකාශය වූ වැඩසටහන් තුළ ඇතුළත් විය:

- සේවක නියැලීම සහ දැනුවත් කිරීම ඉලක්ක කර ගනිමින් නැවත දියත් කරන ලද වට්ස්ඇප් ෂෝ වැඩසටහන
- සංස්කෘතික හා ආගමික වැඩසටහන්
- මාසික පුවත්පත්

බැංකුවේ සේවකයින් සම්බන්ධ කර ගැනීමේ නාලිකා

බහු මට්ටමේ කාර්ය මණ්ඩල රැස්වීම්	විවෘත දොරටු සංස්කෘතිය	දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය	tvBOC හරහා සජීවී සහ පටිගත වැඩසටහන්
සේවක ඉදිරිපත් කිරීම් සහිත සීබෑන්ක් පුවත් පත්‍රිකාව	වෘත්තීය සමිති හරහා සම්බන්ධ වීම	Peo TV හරහා වෙන් වූ නාලිකා දෙකක්	ලංකා බැංකු පුස්තකාලය හරහා විද්‍යුත් තැපෑල සහ ආංශික පුවත් මඟින් දැනුවත් කිරීම
කාර්යසාධනය ඇගයීම	වසර පුරා ක්‍රියාකාරකම් දින දර්ශනය	දක්ෂතා සංදර්ශන, ගායන තරඟ, ක්‍රීඩා හමුව	

- සෞඛ්‍ය දැනුවත්භාවය සහ සේවක යහපැවැත්ම ප්‍රවර්ධනය කරන වැඩසටහන්
- උපදේශනය සහ මනෝ සමාජීය යහපැවැත්ම පිළිබඳ විශේෂ වැඩසටහන්
- සේවකයින්ගේ පවුල් සහ දරුවන්ට උපකාර වන අධ්‍යාපනික වැඩසටහන්
- බැංකුවේ නිල උත්සව සජීවීව ආවරණය කිරීම
- ප්‍රවර්ධන වැඩසටහන්

තවද, දෛනික බැංකු කටයුතු වලින් ඔබ්බට ක්‍රියාකාරකම්වල නිරත වීමට සේවකයින් දිරිමත් කිරීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස, බැංකුව සශ්‍රීක ගෙවත්ත - ගෙවතු වගා වැඩසටහන ආරම්භ කළේය. මෙම වැඩසටහන දිවයින පුරා සිටින ප්‍රජාවන්ගේ ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීමේ ජාතික ප්‍රමුඛතාවය සමඟ ද සමපාත වේ. ශාඛා 328 ක් සහ සේවක සේවිකාවන් 148 ක් වැඩසටහන හා සම්බන්ධ වෙමින් ආකර්ෂණීය ලෙස මෙම වැඩසටහන සිදු කරන ලදී. ශාඛාවල හා කාර්ය මණ්ඩලයේ උත්සාහයන් අගය කිරීම, හොඳම භාවිතයන් බෙදාගැනීම සහ සාර්ථකත්වය හඳුනා ගැනීම උදෙසා ශාඛා කළමනාකරණය සමාජ මාධ්‍ය භාවිතා කරයි.

කාර්ය මණ්ඩල යහපැවැත්ම සහ සුභසාධන පහසුකම්

කාර්යමණ්ඩල යහපැවැත්ම සහ සුබසාධනය සඳහා බැංකුවේ පහසුකම් පරාසය සේවකයින් දිරිමත් කිරීම සහ සම්බන්ධ කර ගැනීම සඳහා ඵලදායී බව ඔප්පු වේ. මෙම පහසුකම් අතරට ව්‍යායාම මධ්‍යස්ථානයක්, පුස්තකාලයක් සහ දිවයින පුරා පිහිටි සංචාරක නිකේතන ගණනාවක් ඇතුළත් වේ.

2022 වර්ෂයේදී බැංකුව පුස්තකාල පහසුකම් වැඩිදියුණු කර පුස්තකාලය ප්‍රධාන කාර්යාලයට ගෙන යන ලදී. මනෝ සමාජීය උපදේශනය ද හඳුන්වා දී ඇති අතර සියලුම කාර්ය මණ්ඩලය සඳහා මෙම පහසුකම් ලබා ගත හැකිය.

ඉදිරි දැක්ම

බැංකුවේ අනාගත දිශානතිය සහ තිරසාරභාවය සම්බන්ධයෙන් බැංකුවේ සේවකයන්ට විශාල වගකීමක් ඇත. ඔවුන් බැංකුවේ ගනුදෙනුකරුවන්ට මුහුණ දෙන මෙහෙයුම්වල සම්බන්ධය වන අතර ලංකා බැංකුවෙහි ගනුදෙනුකාර කේන්ද්‍රීය සංස්කෘතියේ නියෝජිතයන් සහ තානාපතිවරුන් වනු ඇත.

ලංකා බැංකුවෙහි මානව ප්‍රාග්ධනය බැංකුවේ ඩිජිටල් පරිවර්තනය ඉදිරියට ගෙනයාමේ ප්‍රධාන අංගයක් ද වේ. එනිසා, තාක්ෂණිකව දියුණු සහ ප්‍රතිඵල ඉලක්ක කරගත් කණ්ඩායමක් ගොඩනැඟීම කෙරෙහි බැංකුව අවධානය යොමු කරයි.

ශීඝ්‍රයෙන් වෙනස් වන ව්‍යාපාරික පරිසරයක් තුළ කඩිසර බව සහ ගතිකත්වය වඩාත් තීරණාත්මක අවශ්‍යතාවන් වන අතර, බැංකුවේ තිරසාර වටිනාකම් නිර්මාණය කෙරෙහි දිගුකාලීන අවධානය යොමු කිරීම එහි ශ්‍රම බලකායේ අදහස්, නවෝත්පාදන සහ පරිවර්තනීය ධාරිතාව මත රඳා පවතී.

බලාපොරොත්තු වන පරිදි, සේවකයින් සඳහා සෞඛ්‍ය සම්පන්න රැකියා-ජීවිත සමතුලිතතාවයක් ප්‍රවර්ධනය කරන අතරම තරුණයින් ආකර්ෂණය කර ගැනීමට සහ ඔවුන්ව සපුරාලන නව වැඩ විධිවිධාන සහ වැඩ කිරීමේ ක්‍රම ගවේෂණය කිරීමට බැංකුව කැපවී සිටී.

අඛණ්ඩ ආයෝජන මගින් බැංකුවේ අනාගත ගමන් පථයට සමගාමීව සේවකයින්ගේ නිපුණතා සහ නායකත්ව හැකියාවන් සංවර්ධනයට සැලසුම් කිරීම අඛණ්ඩව සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

6

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්

ලංකා බැංකුව මෙරට ප්‍රථම රාජ්‍ය වාණිජ බැංකුව වන අතර එය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජය සතු වේ. බැංකුව සිය ණය සුරැකුම්පත් මිලදී ගන්නා පුද්ගලයින් සහ සංවිධාන මෙන්ම තීරණාත්මක මූල්‍ය ආධාර සපයන ණය දෙන්නන්ගෙන් ද ආයෝජන ආකර්ෂණය කර ගනී. මීට අමතරව, බැංකුව සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙසද ක්‍රියා කරයි; ජාත්‍යන්තර නියෝජිතායතන වලින් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික අරමුදල් ප්‍රයෝජනයට ගැනීම සහ ඉලක්කගත කර්මාන්තවලට සහ සමාජයේ කොටස්වලට සෘජුවම සහාය වීම සඳහා ප්‍රතිමූල්‍යකරණයේ නිරතවන නිසා බැංකුව සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙසද ක්‍රියා කරයි. මෙම හවුල්කාරිත්වයන් මගින් ලංකා බැංකුවේ සේවාවන් වැඩිදියුණු කිරීමට සහ ජාතික සංවර්ධනයට දායක වීමට හැකියාව ලැබේ.

විශේෂ අවස්ථා

රු. බිලියන 6.5
බාසල් III අනුකූල, යටත් කාලීන ස්ථර II ණයකර සම්පූර්ණයෙන්ම දායක වී ඇත.

වර්ෂය තුළ රාජ්‍ය භාණ්ඩාගාරය විසින් යොදවන ලද ප්‍රාග්ධනය
රු. මිලියන 730

ලාභාංශ ප්‍රතිපත්තිය අභ්‍යන්තර ප්‍රාග්ධනය වර්ධනය සඳහා උත්පාදනය කරන ලද ලාභය රඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

29% පිරිවැය-ආදායම් අනුපාතය, අධි-උද්ධමන පීඩනය තිබියදීත් ඵලදායී පිරිවැය කළමනාකරණය පිළිබිඹු කරයි.

අනාගත කම්පනවලට මුහුණ දීම සඳහා හානිකරණ ප්‍රතිපාදන වෙන්කිරීම් ණය සහ අත්තිකාරම් වලින් **10%** ක් ආවරණය කරමින් ශේෂ පත්‍රය ශක්තිමත් කර ඇත.

රු. 10,167.37
කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම

මෙහෙයුම් සන්දර්භය

අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තිබියදීත්, ලංකා බැංකුව කොටස් හිමියන්ට තම කැපවීම් ඉටු කිරීමේදී නොසැලී සිටියේය. බැංකුවේ තිරසාර ව්‍යාපාර ආකෘතියේ ගතිකත්වය සහ වේගවත් බව, උපායමාර්ගික තීරණ ගැනීම සහ අර්බුද ප්‍රතිචාර දැක්වීම යන කැපී පෙනෙන කාර්යසාධනය ලබා දීම සඳහා ලංකා බැංකුව පෙර නොවූ විරූ අභියෝගවලට සාර්ථකව මුහුණ දුන්නේය. විසර පුරා, පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දීම, කැපවීම් ඉටු කිරීම සහ බැංකුවේ ප්‍රස්තුතය තහවුරු කිරීම කෙරෙහි අධානය යොමු විය.

මේ සම්බන්ධයෙන් බැංකුවේ කාර්යසාධනය 60 පිටුවේ මූල්‍ය සමාලෝචනයේ සහ 65 පිටුවේ සිට 77 පිටුව දක්වා ව්‍යාපාර අංශ සමාලෝචනයේ විස්තරාත්මකව දක්වා ඇත.

අපගේ කොටස් හිමියාගේ සහ අරමුදල් සපයන්නන්ගේ අවශ්‍යතා සඳහා සවන් දීම

සම්බන්ධ වීමේ වේදිකා

- ✔ වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන (අඛණ්ඩව)
- ✔ වරින් වර රැස්වීම් (අඛණ්ඩව)
- ✔ ලංකා බැංකු වෙබ් අඩවිය (අඛණ්ඩව)
- ✔ විශාල ආයෝජකයින් සමඟ පුද්ගලික රැස්වීම් (කාලීන)
- ✔ ආයෝජක ඉදිරිපත් කිරීම් සහ මාර්ග දර්ශන (කාලීන)
- ✔ වෙළඳපළ අතරමැදියන් හරහා සම්බන්ධ වීම (කාලීන)



ඔවුන්ගේ අවශ්‍යතා

- ✔ අවදානමට සරිලන පරිදි ප්‍රමාණවත් ප්‍රතිලාභයක්
- ✔ විනිවිද හා කාලෝචිත වාර්තාකරණය
- ✔ ශක්තිමත් ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන්
- ✔ කීර්තිය
- ✔ වගකීම් සහගත ව්‍යාපාරික පිළිවෙත්

අප ප්‍රතිචාර දැක්වූ ආකාරය

- ✔ ප්‍රමාණවත් ප්‍රතිලාභ ජනනය වන බවට සහතික වීම
- ✔ ශේෂ පත්‍රයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම
- ✔ ඵලදායී ආන්තික කළමනාකරණය
- ✔ කාලෝචිත ලෙස ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම සහ ශක්තිමත් කිරීම
- ✔ කාලීන වෙළඳපළ හෙළිදරව් කිරීම්

ලාභදායීත්වය

බදු ගෙවීමට පෙර ලාභය
රු. බිලියන 31.0

ශුද්ධ පොළී ආදායමේ වර්ධනය
14%

91%
විදේශ විනිමය ලාභය මඟින් මූලික වශයෙන් දායක වන ලද අරමුදල් නොවන ආදායමේ වර්ධනය

ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම වැඩිවීම **15%**

ණය සහ අත්තිකාරම්වලට හානිකරණය,වෙන්කිරීම් සහ විදේශ මුදල් නම් කරන ලද රජයේ සුරැකුම්පත්
රු. බිලියන 87.2

29%
පිරිවැය සහ ආදායම් අනුපාතය

ශේෂ පත්‍රයේ ශක්තිය

සෘණ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයට විරෙහිව වත්කම් වර්ධනය
14%

10%
පුද්ගලික අංශයේ ණය කළඹ වර්ධනය

43%
ආයෝජන කළඹේ වර්ධනය

හානිකරන ප්‍රතිපාදන දළ ණය සහ අත්තිකාරම්හි ප්‍රතිශතයක් ලෙස
10%

කොටස් හිමියා සහ අරමුදල් සපයන්නන්


ප්‍රාග්ධනීකරණය

වර්ෂය මුළුල්ලේ පවත්වා ගනු ලැබූ ප්‍රාග්ධන අවශ්‍යතාවයන්


වසර තුළ අභ්‍යන්තරව උත්පාදනය කරන ලද ප්‍රාග්ධනය
රු. බිලියන 24.9

රු. බිලියන 6.5 ක
සම්පූර්ණ ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම සඳහා නිකුත් කරන ලද ස්ථර II අනුකූල ණයකර

කොටසක ශුද්ධ වත්කම් වටිනාකම



කොටසක ලාභාංශ



කොටස් හිමියාගේ ප්‍රතිලාභය

ස්කන්ධය මත ප්‍රතිලාභය
14.1%

කොටසකට ඉපැයීම්
රුපියල් 1,279

කොටසකට ලාභාංශ
රුපියල් 13.86


කොටසක ශුද්ධ වත්කම්

බැංකුවේ ස්ථාවරත්වය සහ ශක්තිය පෙන්නුම් කරමින් බැංකුවේ කොටසකට ශුද්ධ වත්කම් අගය වසර ගණනාවක් පුරා ඉහළ ගොස් ඇත. 2022 වර්ෂය තුළ, වත්කම් පදනමේ වාර්තා වූ 14% වර්ධනයට අනුකූලව කොටසකට ශුද්ධ වත්කම් අගය 27% කින් වැඩි වී ඇත.

කොටසක ඉපැයුම

2022 වර්ෂය බැංකුවට අභියෝගාත්මක වසරක් වූ අතර, වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය 2021 ට සාපේක්ෂව 15% කින් පහත හෙලීය. බදු ගෙවීමෙන් පසු ලාභයෙහි පහත වැටීමට සමගාමීව, වර්ෂය සඳහා බැංකුවේ කොටසක ඉපැයුම ද 15% කින් අඩු විය.

කොටසක ඉපැයුම



කොටසක ලාභාංශ

නියාමක විසින් ලබා දී ඇති විවක්ෂණ විධානයන් පිළිපදින අතරම කොටස් හිමියාගේ එකඟතාවය මත බැංකුවේ ස්ථාවරත්වය සහ අනාගත වර්ධනය සහතික කිරීම සඳහා අභ්‍යන්තරව ජනනය කරන ලද ප්‍රාග්ධනය සංරක්ෂණය කිරීම නිසා බැංකුවේ කොටසකට ලාභාංශය වසර තුළ 81% කින් අඩු විය.

ඉදිරි දැක්ම

2023 සහ ඉන් ඔබ්බට ආර්ථික වාතාවරණය තුළ පවතින අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගනිමින්, ලංකා බැංකුව බැංකුවේ දිගුකාලීන තිරසාරභාවය සහ වටිනාකම්-නිර්මාණය කිරීමේ හැකියාව හඹා යාම සඳහා ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමට ප්‍රමුඛත්වය දෙයි.

ඉදිරි වසර තුළ ප්‍රධාන ක්ෂේත්‍රවල මධ්‍යස්ථ වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම, සහයෝගිතාවයන් උත්තේජනය කිරීම සහ අවස්ථා උපරිම කර ගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

කෙටි, මධ්‍ය සහ දිගු කාලීනව සිය වගකීම් හා කැපවීම් අඛණ්ඩව ඉටු කිරීමට බැංකුව කැපවී සිටී. සාර්ථක ද්‍රවශීලතා කළමනාකරණයේ පසුබිම මත, වගකිවයුතු සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙස, බැංකුව මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදය ජය ගැනීමටත්, රටේ ආර්ථික පුනර්ජීවනයට සමගාමීව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට, කර්මාන්ත අංශයට සහ ආයතනවලට සහාය වීමටත් පියවර ගෙන ඇත.

ප්‍රධාන බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික මාර්ගෝපදේශවලට සහ ලංකා බැංකුවෙහි පාරිසරික සහ තිරසාර කළමනාකරණ ප්‍රතිපත්තියට අනුකූලව, පරිසර සහ සමාජීය තක්සේරුව ස්ථාවර පරිමාණයෙන් ඉහළ නැංවීමට ලංකා බැංකුව කැපවී සිටී.

ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව සහ රජය සතු පද්ධතිමය වශයෙන් වැදගත් ආයතනයක් ලෙස, ප්‍රජාව සහ පරිසරය සම්බන්ධයෙන් ලංකා බැංකුවේ වගකීම ඉතා වැදගත් වේ. ජාතික සංවර්ධනයට සහ ආර්ථික වර්ධනයට ප්‍රමුඛත්වය දෙමින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීමට බැංකුව කැපවී සිටී. ප්‍රධාන ප්‍රවාහයේ තිරසාරකත්වය යනු බැංකුවේ උපායමාර්ගික සැලැස්මේ ඇති උපායමාර්ගික සක්‍රියක කරන්නන් පහෙන් එකකි, එය බැංකුවේ ක්‍රියාකාරකම් ප්‍රජාව සහ පරිසරය දෙසට යොමු කරයි.

විශේෂාංග

රු. බිලියන 52.6
ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දී ඇති ණය

රු. බිලියන 5.45
ක්ෂුද්‍ර මූල්‍යකරණ මුලපිරීම් හරහා බෙදා හරිනු ලැබේ

අලුතින් දියත් කල
හරිත ඉතිරිකිරීම් සහ ණය නිෂ්පාදන

ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි ප්‍රමිතීන්
දක්වා ගෙන එන ලද ශාඛා

BOC ගම්මාන
ආදර්ශ ගම්මාන මුලපිරීම්

31%
කාන්තාවන් සතු/කාන්තා මූලික කරගත් ව්‍යාපාර සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබා දී ඇත

රු. මිලියන 998.5
2022 වන විට තිරසාර නිෂ්පාදන සඳහා ලබාදුන් අරමුදල්

රු. බිලියන 1.9
2022 අවසානයේ පුනර්ජනනීය බලශක්ති අංශයට ලබාදුන් ණය වලින් ගෙවිය යුතු ප්‍රමාණය

රු. බිලියන 4.7
පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති (ESMS) අනුකූලතාවයෙන් පසුව මුදල් ලබා දීම

3,219.3
මෙගා වොට් පැය
ජනනය කරන ලද පුනර්ජනනීය බලශක්තිය (ඇස්තමේන්තු මත පදනම්ව)

13%
පුනර්ජනනීය ප්‍රභවයන්ගේ මෙහෙයුම් සඳහා බලශක්ති අවශ්‍යතාව

51
සූර්ය බලශක්තියෙන් බල ගන්වන ලද මුළු ශාඛා

GRI 302-3

වාර්ෂික හරිත ගොඩනැගිලි සම්මාන උළෙලේදී,
වසරේ හරිත ව්‍යාපාරික නායකත්ව සම්මාන ලබන ලදී.

මෙහෙයුම් සන්දර්භය

2022 වසරේ මෙහෙයුම් සන්දර්භය ප්‍රජාවන්ට, රටට සහ පරිසරයට ප්‍රධාන අභියෝග ගෙන ආවේය. ව්‍යාපාරවලට සහ ජීවනෝපායන්ට තර්ජනයක් වූ ආර්ථික පරිසරයේ ශීඝ්‍රයෙන් ඉහළ යන උද්ධමනය සහ අස්ථාවරත්වය නිසා ප්‍රජාවන්ට දැඩි බලපෑම් එල්ල විය.

ඒ අතරම, දේශගුණික විපර්යාස නිසා ඇති වන තර්ජන සහ අවදානම් නිසා ණය දීම සහ ආයෝජනය වැනි මූල්‍ය ක්‍රියාකාරකම් වලදී පාරිසරික හා සමාජීය සාධක සලකා බැලීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

ස්වෛර්ථ පැහැර හැරීමේ බලපෑම් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රේණිගත කිරීම් පහත වැටීම තිරසාර සංවර්ධනය සහ හරිත නිෂ්පාදන සඳහා මූල්‍යකරණය සඳහා අඩු පිරිවැය සහිත බාහිර අරමුදල් වෙත ප්‍රවේශ වීමට බැංකුවට ඇති අවස්ථා සීමා කළේය. කෙසේ වෙතත්, බැංකුව සතු අරමුදල් උපයෝගී කර ගනිමින් මෙම කටයුතුවලට ප්‍රමුඛත්වය දෙමින් ඉදිරියට යාමට බැංකුව උපායමාර්ගික තීරණයක් ගත්තේය.

පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ

ප්‍රජාව සහ පරිසරය

මෙහෙයුම් සන්දර්භය

- ආර්ථික අර්බුදයේ ප්‍රතිවිපාක වලින් බලපෑමට ලක් වූ රට සහ ප්‍රජාවන් - ඉන්ධන සහ බලශක්ති අර්බුදය ප්‍රතිඵලයක් ලෙස හිඟය, බාධා කිරීම් සහ ප්‍රජාවන් සඳහා වියදම් ඉහළ යාම.
- ලෝකයට සහ රටට බලපාන දේශගුණික විපර්යාස ඇතුළු පාරිසරික ගැටළු

බැංකුවේ ප්‍රතිචාරය

- සමාජ සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ග්‍රාමීය සංවර්ධනයට සහාය වීම සඳහා ස්වේච්ඡා සේවය ප්‍රවර්ධනය කිරීම
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් සහ කාන්තා මූලික ව්‍යාපාර සඳහා ණය හරහා ග්‍රාමීය සංවර්ධනයට සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සහාය වීම.
- ව්‍යාපාර අඛණ්ඩතාවයට ප්‍රමුඛත්වය දී ඇති අතර මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා සහය දක්වයි
- කාබන් රහිත අනාගතයකට සහාය වීම සඳහා නව නිෂ්පාදන සහ සහනදායී ණය දියත් කරන ලදී
- බැංකුව සඳහා කාබන් කළමනාකරණ සැලැස්ම අවසන් කරන ලද අතර පාරිසරික පියසටහන අඩු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී
- ණය දීමේ දී පාරිසරික හා සමාජීය සාධක සඳහා නිර්ණායක සෑදීම පරීක්ෂා කිරීම
- තිරසාර න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම සඳහා විශේෂිත තිරසාර බැංකු ඒකකයක් නම් කර ඇත

ප්‍රජාව සහ පරිසරය සමග සම්බන්ධ වීම

සම්බන්ධ වීමේ වේදිකා

- ✓ වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන (අඛණ්ඩව)
- ✓ ලංකා බැංකු වෙබ් අඩවිය (අඛණ්ඩව)
- ✓ කර්මාන්ත සංසද සහ රැස්වීම් (අඛණ්ඩව)
- ✓ ශාඛා හරහා සම්බන්ධ වීම (අඛණ්ඩව)
- ✓ ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් සහ අනුග්‍රහය (අඛණ්ඩව)
- ✓ මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය ප්‍රචාරණ (අඛණ්ඩව)

අවශ්‍යතා

- ✓ ව්‍යාපාරවලට සහය වීම සහ ආර්ථිකයේ පුනර්ජීවනය ඇති කිරීම
- ✓ මූල්‍ය අංශය තුළ විශ්වාසය පවත්වා ගැනීම
- ✓ ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට බැංකුවේ උපායමාර්ගය පෙළගැස්වීම
- ✓ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය
- ✓ වගකීම් සහගත ව්‍යාපාරික පිළිවෙත්
- ✓ මූල්‍ය ඇතුළත් කිරීම් සහ සවිබල ගැන්වීම



අපි ප්‍රතිචාර දැක්වූ ආකාරය

- ✓ ශක්තිමත් පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන්
- ✓ රැකියා උත්පාදනය
- ✓ රට පුරා මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා පහසුකම් සැලසීම
- ✓ ආයතනික සමාජ වගකීම් සහිත ව්‍යාපෘති සඳහා අඛණ්ඩව දිගුකාලීන ආයෝජනය
- ✓ රජයට වටිනාකම් නිර්මාණය කිරීම
- ✓ රටේ ආර්ථික පුනර්ජීවනයට සහය වීම

ජාතික සංවර්ධනය

පෙර නොවූ විරූ අභියෝග මධ්‍යයේ ජාතික සංවර්ධනය සඳහා ලංකා බැංකුවේ කාර්යභාරය මෙම වාර්ෂික වාර්තාව හරහා අවධාරණය කෙරේ. මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සඳහා බැංකුවේ දායකත්වය, අත්‍යවශ්‍ය බැංකු සේවා සැපයීම, සාර්ව ආර්ථික ස්ථායීතාවයට සහාය වීම, අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම, සහ ආර්ථික පුනර්ජීවනය සඳහා සහාය වීම. ආදී තොරතුරු පිළිබඳ තොරතුරු 43 පිටුවේ මෙහෙයුම් සන්දර්භය, 65 සිට 77 දක්වා පිටුවල ව්‍යාපාරික අංශ සමාලෝචනය යටතේ සාකච්ඡා, 78 සිට 119 දක්වා පිටුවල පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ සහ 140 සිට 156 දක්වා පිටුවල බැංකුවේ අවදානම් කළමනාකරණ වාර්තාව තුල ඇතුළත් වේ.

අත්‍යවශ්‍ය බැංකු සේවා සැපයීම

2022 වසරේ අභියෝග සහ බාධා මධ්‍යයේ වුවද ව්‍යාපාර වල අඛණ්ඩ පැවැත්මට බැංකුව ප්‍රමුඛත්වය දුන් අතර, සියලු ශාඛා විවෘතව හා ක්‍රියාත්මකව පවතින බව සහතික කළේය. බැංකුවේ විශාල ශාඛා ජාලය, සහ ඩිජිටල් වේදිකා, බීම් මට්ටමේ නියෝජිත ජාලය සහ ජංගම දුරකථන හරහා ගණුදෙනුකරුවන් වෙත පුළුල් ලෙස ළඟා වේ. දිවයින පුරා බැංකු සේවා සඳහා අඛණ්ඩව ප්‍රවේශ වීමට ජංගම බැංකු සේවා ඒකක මගින් ඉඩ ලබා දී ඇත. ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග, 78 සිට 88 දක්වා පිටු වල ගනුදෙනුකාර අංශයේ සහ 77 පිටුවේ ව්‍යාපාරික අංශ සමාලෝචන වල විස්තර කර ඇත.

සාර්ව ආර්ථික ස්ථාවරත්වයට සහාය වීම

ඇ. ඩොලර් බිලියන 3.2

අභ්‍යන්තර ප්‍රේෂණ පහසුකම් සලසා ඇත

රු. බිලියන 31.9

බදු සහ ලාභාංශ වශයෙන් රජයේ ආදායමට දායක විය

රජයට රටේ ආර්ථික වාතාවරණය ශක්තිමත් කිරීම අරමුණු කරගත් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ලංකා බැංකුව සහයෝගය ලබාදී තිබේ. ප්‍රේෂණවල වෙළෙඳපොළ ප්‍රමුඛයා ලෙස, වර්ෂය තුළ ප්‍රමුඛතා පදනම මත බැංකුව රට තුළට තීරණාත්මක විදේශ මුදල් ගලා ඒම් සඳහා පහසුකම් සලසා ඇත. මීට අමතරව, බදු සහ ලාභාංශ මෙන්ම රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපලේ ආයෝජන මඟින්ද රාජ්‍ය ආදායමට බැංකුව දායක වේ.

අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම

ඇ. ඩොලර් බිලියන 1.9

බනිජ තෙල් සහ ගෑස් ආනයනය සඳහා මුල්‍ය සම්පාදනය

ඇ. ඩොලර් මිලියන 69.9

වට්නාකමින් යුත් ඖෂධ ආනයනය සඳහා පහසුකම් සලසා ඇත

මුදල් සංචිත සඳහා දැඩි පීඩනයක් තිබියදීත්, බනිජ තෙල්, ගෑස්, ඖෂධ සහ වෛද්‍ය නිෂ්පාදන වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට ලංකා බැංකුව පහසුකම් සලසා ඇත. 2022 දී ලංකා බැංකුව පෙට්‍රෝලියම් සහ ගෑස් ආනයනය සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 1.9 ක මූල්‍ය පහසුකම් ලබාදී ඇත. මීට අමතරව, ආහාර, ඖෂධ, භාණ්ඩ සහ අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා ද්විපාර්ශ්වික අරමුදල් මාර්ග සහ ණය රේඛා ක්‍රියාත්මක කිරීමට බැංකුව සහාය විය.

බැංකුව විසින් සිය ගනුදෙනුකරුවන්ගේ, විදේශයන්හි අධ්‍යාපනය ලබන සිසුන් සහ ණයවර ලිපි විවෘත කිරීමේදී, විදේශ විනිමය අවශ්‍යතා සඳහා ද අඛණ්ඩව පහසුකම් සපයයි. වැටුප්, විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ගෙවීම් සඳහා පහසුකම් සපයන අතරම ප්‍රධාන රාජ්‍ය ආයතනවල ද්‍රවශීලතා ගැටලු මඟහරවා ගැනීම හරහා අත්‍යවශ්‍ය රාජ්‍ය සේවාවන්හි මෙහෙයුම් සඳහාද බැංකුව සහාය විය.

ආර්ථික පුනර්ජීවනය

රු. බිලියන 19.5

සංවර්ධන ණය යටතේ කෘෂිකර්මාන්තය, ආහාර සැකසීම සහ පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ලබා දී ඇත

40

බැංකුවේ ව්‍යාපාර පුනර්ජීවන සහ ප්‍රතිස්ථාපන ඒකකය යටතේ සහාය දක්වන ව්‍යාපාර

විවිධ ක්‍රියාමාර්ග හරහා රටේ ආර්ථික ප්‍රබෝධය ඇති කිරීමට බැංකුව සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. අර්බුදවලින් පීඩාවට පත් ගනුදෙනුකරුවන්ට උපකාර කිරීම සහ ඔවුන්ගේ ව්‍යාපාර තිරසාරභාවයට සහාය වීම සඳහා බැංකුව විසින් දීර්ඝ කරන ලද තාවකාලික සහන, ප්‍රතිව්‍යුහගත සහ ප්‍රතිනිර්මාණය කරන ලද පහසුකම් සපයා ඇති අතර, ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව සහ පුනර්ජීවනය සඳහා සහාය වීමට තද බලලෙස බලපෑමට ලක් වූ අංශ වෙත අරමුදල් යොමු කරන ලදී. බැංකුවේ ව්‍යාපාර පුනර්ජීවන ඒකකයේ ක්‍රියාකාරකම් 78 පිටුවේ ගනුදෙනුනකර අංශයේ විස්තර කර ඇත.

යටිතල පහසුකම් සංවර්ධනය

දිවයින පුරා ආර්ථික ක්‍රියාකාරකම්වලට සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට දායක වන පෙරළිකාර යටිතල පහසුකම් ව්‍යාපෘති ඇතුළුව, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍යමය වශයෙන් ණය දෙන්නෙකු ලෙස ලංකා බැංකුව කටයුතු කරයි. වසර අවසානයේදී, ඉදිකිරීම් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා බැංකුවේ නිරාවරණය රු. බිලියන 243.6 ක් විය. ලංකා බැංකුව විසින් මූල්‍යකරණය කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ වැඩි විස්තර සඳහා, 72 පිටුවේ ඇති ආයතනික සහ අක්වෙරළ ව්‍යාපාරික අංශ සමාලෝචනයේ ඇති ව්‍යාපෘති මූල්‍යකරණ කාර්යසාධනය අධ්‍යනය කරන්න.

ප්‍රජා සංවර්ධනය

රු. මිලියන 45.9

ප්‍රධාන කර්මාන්ත සහ ආගමික හා සංස්කෘතික සංවර්ධනය සඳහා ආධාර කිරීම සඳහා ආයෝජනය කර ඇත

3

BOC ගම්මාන වැඩසටහන යටතේ අනුග්‍රහය දක්වන ලද ආදර්ශ ගම්මාන

රු. මිලියන 60.1

ආයතනික සමාජ වගකීම්හි ආයෝජනය

ලංකා බැංකුව ආයතනික සමාජ සඳහා උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කරයි. ආයතනික සමාජ වගකීම සහ සමාජ ආයෝජන, එම පුද්ගලයා සහතික කිරීම, ව්‍යාපෘති ලංකා බැංකුවෙහි දිගුකාලීන තිරසාර න්‍යාය පත්‍රය, මෙහෙවර සහ ආයතනික අගයන් සමඟ සමපාත වේ. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, සියලු ව්‍යාපෘති අර්ථවත් සහ දිගු කාලීන වෙනසක් ඇති කරන ගෝලීය ඉලක්ක සමඟ සමපාත වන ඇගයුම් ආකෘතියකට යටත් වේ. සම්පත් ඵලදායි ලෙස යෙදවීම සහ ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සහතික කරමින් බැංකුවේ තිරසාරකත්ව ඒකකය මගින් සියලුම ප්‍රජා සහභාගීත්වය සහ සංවර්ධන වැඩසටහන් අධීක්ෂණය කරනු ලැබේ.

GRI 413-1

බැංකුව 2022 වසරේදී BOC ගම්මාන හරහා ගම්මාන තුනක් සංවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ සහයෝගය ඇතුළු වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළේය. මෙම වැඩසටහන පාරිසරික, සමාජීය, සහ ඉලක්කගත ගම්මානවල සෞඛ්‍ය සහ සුබසාධනය වැඩිදියුණු කිරීම සඳහා සාකල්‍ය සහය තුළින් ප්‍රජාවගේ සංවර්ධන අවශ්‍යතා සහ අනෙකුත් ආයතන සහ සේවාවන් සමඟ හවුල් විය. බැංකුව විසින් මෙම ප්‍රජාවන්ට ඉතිරි කිරීමේ පුරුදු, මූල්‍ය සාක්ෂරතාවය සහ ගිණුම් පොත් තැබීම පිළිබඳව පුහුණුවක් ද ලබා දෙන ලදී.

තවද, බැංකුව සමාජයේ ප්‍රධාන කොටස්වල අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන අතර,ව්‍යාපාරික සංවර්ධනය සහ ව්‍යවසායකත්වය, සංස්කෘතික, ආගමික සහ ක්‍රීඩා කටයුතු, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ විද්‍යා හා තාක්ෂණ යන ක්ෂේත්‍ර සඳහා සහාය වීම සඳහා දළ වශයෙන් රු. මිලියන 45.9 ක් ආයෝජනය කළේය. වසර තුළ, ලංකා බැංකු සේවකයින් ඔවුන්ගේ ප්‍රජාවන්හි අර්බුදවලට හෝ හදිසි අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් ප්‍රජා සංවර්ධන වැඩසටහන් ස්වේච්ඡාවෙන් සංවිධානය කරමින් සහාය දැක්වීය.

පරිසර සංරක්ෂණය

රු. මිලියන 3.2

ලංකා බැංකු හරිත අරණ ව්‍යාපෘතිය හරහා නැවත වන වගාව සඳහා ආයෝජනය කරන ලදී

වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස කැපවීමේ කොටසක් ලෙස සහ වන ආවරණයේ ප්‍රමාණය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට රජය දරණ ප්‍රයත්නයන්ට අනුකූලව, ශ්‍රී ලංකාවේ වටිනා ස්වභාවික සම්පත් සුරැකීමට සහ සංරක්ෂණයට ලංකා බැංකුව දායක වේ. යුනෙස්කෝව විසින් නම් කරන ලද පෙවගෝල රක්ෂිතයක් සහ ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සහ අනෙකුත් වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ශාඛ හා සත්ත්ව විශේෂ සඳහා වැදගත් වාසස්ථානයක් වන හබරණ හුරුළු රක්ෂිතයේ විනාශ වූ වනාන්තර හෙක්ටයාර 100ක් ප්‍රතිසංස්කරණය කිරීමේ බහු වසර ව්‍යාපෘතියකට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීව සහය දක්වයි. 2022 දී මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 3.2 ක මුදලක් ආයෝජනය කරන ලදී.

ප්ලාස්ටික් දූෂණය හේතුවෙන් පරිසරයට සහ පරිසර පද්ධතිවලට සිදුවන පීඩනයන් හඳුනා ගනිමින්, බස්නාහිර පළාතේ පාසල්වල දිරාපත් නොවන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා 2019 දී බැංකුව විසින් මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සමඟ එක්ව ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් 2022 දී ද ක්‍රියාත්මක විය.

තිරසාර මූල්‍යකරණය

රු. බිලියන 5.3 කි

ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව බෙදා හරින ලද තිරසාර මූල්‍යමය වටිනාකම

ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් සකස් කර ඇති තිරසාර මූල්‍යකරණය සඳහා වූ මාර්ග සිතියමට අනුකූලව ලංකා බැංකුව ක්‍රියා කරයි. පාරිසරික හා සමාජ අවදානම් කළමනාකරණය; අපගේ ණය දීමේ තීරණ වලදී දේශසීමා සහ සමාජීය සලකා බැලීම් වලට ප්‍රමුඛත්වය දීම; සහ විවිධ හරිත මූල්‍ය ණය මාර්ග සහ ආධාරක සේවා හරහා සමාජීය වශයෙන් ඇතුළත් සහ පරිසරය/දේශගුණික හිතකාමී ව්‍යාපෘති, නිෂ්පාදන සහ සේවාවන් සඳහා ක්‍රියාකාරිව සහාය දක්වයි.

කළමනාකාරිත්වයේ කැපවීම

බැංකුව සිය තිරසාර මූල්‍ය නෙතුය පත්‍රය ක්‍රියාත්මක කිරීමට සහ ලංකා බැංකුවෙහි ප්‍රාථමික ව්‍යාපාරික ඒකක සඳහා මෙහෙයුම් සහ සහායක සහාය සැපයීම සඳහා කැපවූ තිරසාර බැංකු ඒකකයක් පිහිටුවා ඇත. තිරසාර බැංකු ඒකකය 2022 දී බල ගැන්වූ අතර, ප්‍රධාන කළමනාකාරිත්වයේ පිරිස් පත් කිරීමද සිදු විය. බැංකුවේ තිරසාර මූල්‍ය නෙතුය පත්‍රය බැංකුවේ මහා කළමනාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් තිරසාර කමිටුවක් හරහා කළමනාකාරිත්වයේ සහාය ලබාගෙන ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

ලංකා බැංකුව අරමුදල් සපයන මූල්‍ය ආයතනවල සහ ආයතනවල පාරිසරික හා සමාජ බලපෑම් කළමනාකරණ අවශ්‍යතා දැඩි ලෙස පිළිපදින අතර තෝරාගත් ණය කාණ්ඩ සම්බන්ධයෙන් පුළුල් පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තියක් සහ ක්‍රියාපටිපාටි අනුගමනය කරයි.

හරිත මූල්‍යකරණය

රු. මිලියන 49.6

තිරසාර කෘෂිකර්මාන්තය සඳහා ලබා දී ඇත

162

2022 දී ලබා දුන් නව හරිත මූල්‍ය ණය

රු. බිලියන 1.9

2022 අවසානයේ පුනර්ජනනීය බලශක්ති අංශයට ලබාදුන් ණය වලින් ගෙවිය යුතු ප්‍රමාණය

1,761

2022 අවසානයේ පුනර්ජනනීය බලශක්ති අංශයට ලබා දුන් ක්‍රියාකාරී ණය



ගෘහස්ත සහ වාණිජ බලශක්ති භාවිතා කරන්නන් අතර පුනර්ජනනීය බලශක්තිය සහ පිරිසිදු තාක්ෂණයන් ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීමේදී ලංකා බැංකුව ඉලක්කගත සහනදායී අරමුදල් විකල්ප ඇතුළු හරිත මූල්‍ය වැඩසටහන් රැසකට පුරෝගාමී වී ඇත. 2022 දී, බැංකුව විසින් සූර්ය බලශක්ති පද්ධති සහ ජීව වායු පද්ධති සඳහා ණය, පොසිල ඉන්ධන මත යැපීම අඩු කරන විදුලි ප්‍රවාහන විකල්ප සඳහා ණය සහ ලීසිං ඇතුළු නව නිෂ්පාදන ගණනාවක් හඳුන්වා දෙන ලද අතර, එමඟින් කාබන් විමෝචනය අඩු කිරීමෙන් දේශගුණික විපර්යාස අවම කිරීමට දායක වේ.

ප්‍රජාව සහ පරිසරය

බාහිර අරමුදල් සඳහා ප්‍රවේශය නොමැති වුවද, 2022 දී රු. මිලියන 711.6 ක නව හරිත මූල්‍ය පහසුකම් ප්‍රදානය කිරීමට බැංකුව අරමුදල් වෙන් කරන ලදී. 2022 දෙසැම්බර් 31 දින වන විට, තිරසාර බලශක්ති විසඳුම් ඉදිරියට ගෙන යාම සඳහා ලංකා බැංකුවේ කැපවීම පෙන්නුම් කරමින්, පුනර්ජනනීය බලශක්ති අංශය සඳහා බැංකුව ලබා දුන් හිඟ ණය ප්‍රමාණය රු. බිලියන 1.9 ක් විය.

GRI 302-4

පුනර්ජනනීය බලශක්ති අංශය ලබා දුන් ණය වල නැවත ගෙවිය යුතු වටිනාකම (රු. මිලියන)	1,964.9
පුනර්ජනනීය බලශක්ති අංශය සඳහා ලබා දුන් ණය ගණන	1,761
හරිත මූල්‍ය සඳහා ලබා දී ඇති නව පහසුකම්වල වටිනාකම (රු. මිලියන)	5,284.0
හරිත මූල්‍ය සඳහා ලබා දී ඇති නව පහසුකම් සංඛ්‍යාව	1,809

වගකිවයුතු ආයෝජන

රු. 616,788.2

නව රාජ්‍ය ආයෝජන නිෂ්පාදන හරහා හරිත මූල්‍යකරණ මුලපිරීම්

2022 දී බැංකුව මහජනතාවගේ වගකීම් සහගත ආයෝජන මෙහෙයවන අතරම දේශගුණික විපර්යාස සහ ගෝලීය පාරිසරික ගැටළු පිළිබඳව දැනුවත් කිරීමේ මුලපිරීම් නියම කළේය. වසර තුළ පාසල් ළමුන් සඳහා හරිත කැකුළු සහ අනෙකුත් පුද්ගලික සහ පුද්ගලික නොවන ගනුදෙනුකරුවන් සඳහා e-තුරු තැන්පතු ලබා ගැනීමේ නිෂ්පාදන දෙකක් හඳුන්වා දෙන ලදී: මෙම විශේෂිත ආයෝජන නිෂ්පාදන බැංකුව විසින් සිදුකරන හරිත මූල්‍යකරණ මුලපිරීම් සඳහා තම අරමුදල් යෙදවීමට ගනුදෙනුකරුවන්ට ඉඩ සැලසීය.

ගෝලීය පාරිසරික ගැටළු පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සහ බැංකුවේ අනුග්‍රහය ඇතිව රුක් රෝපණ සහ නැවත වන වගා කිරීමේ මුලපිරීම්වල නිරත වීමට අවස්ථාව සලසන නිෂ්පාදන සමඟ බැංකුව විසින් ක්‍රියාකාරකම් සහ වැඩසටහන් ගණනාවක් සිදු කරන ලදී.

පාරිසරික, සමාජීය සහ යහපාලන ඒකාබද්ධතාවය

රු. බිලියන 4.7

පාරිසරික හා සමාජීය කළමනාකරණ පද්ධති අනුකූලතාවයෙන් පසු මුදල් ලබා දීම

841

වසර තුළ පාරිසරික හා සමාජීය නිර්ණායක සඳහා පරීක්ෂා කරන ලද ණය

153

වසර තුළ පාරිසරික හා සමාජීය පරීක්ෂාව සඳහා පුහුණු වූ නිලධාරීන්

රු. මිලියන 711.6

තිරසාර මූල්‍යකරණය සඳහා 2022 දී ලබා දී ඇත

FN-CB-410a.2

බැංකුවේ පාරිසරික, සමාජීය, සහ ආයතනික යහපාලනය සලකා බැලීම් එහි මූලික ව්‍යාපාරය සමඟ ඒකාබද්ධ කිරීම පරිසර හා සමාජීය අවදානම තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම දක්වා පරාසයක පවතී. පාරිසරික හා සමාජ අවදානම් ඒකකය ප්‍රධාන අවදානම් නිලධාරි වෙත වාර්තා කිරීම; ප්‍රමිතිගත පාරිසරික, සමාජීය, සහ ආයතනික යහපාලනය පරීක්ෂාව ප්‍රමිතික සහ දර්ශකවලට විරෙහිව ආයතනික අනාවරණය; සහ වාණිජ ණය සහ ව්‍යාපෘති මූල්‍යකරණය පිළිබඳ විස්තීර්ණ පාරිසරික, සමාජීය, සහ ආයතනික යහපාලනය පරීක්ෂාව සහ ඇගයීම සමඟ වගකීම් සහිත ණය දීම, බැංකුවේ ESMS ප්‍රතිපත්තිය මගින් මෙහෙයවනු ලැබේ.

පාරිසරික, සමාජීය, සහ ආයතනික යහපාලනය පිළිබඳ අනාවරණයන්

2022 දී ලංකා බැංකු සිය දහවන වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කරයි. මෙම වාර්තාව ජාත්‍යන්තර වාර්තාකරණ රාමු සහ හොඳම භාවිතයන්, අනුගමනය කරන අතර පාරිසරික, සමාජීය, සහ ආයතනික යහපාලනය/තිරසාර බව තොරතුරු වල බාහිර සහතිකය ද ඇතුළත් වේ. ආයතනික හෙළිදරව් කිරීමේදී පාරිසරික, සමාජීය, සහ ආයතනික යහපාලනය සංස්ථාගත කිරීම පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් 4 පිටුවේ "මෙම වාර්තාව පිළිබඳව" යන කොටසේ ඉදිරිපත් කර ඇත.

ධාරිතාව ගොඩනැගීම

ලංකා බැංකුව බැංකුවේ පාරසරික සහ සමාජ කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තියට අනුකූලව සහ ලංකා බැංකුවහි ස්වාධීන වීකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) යටතේ කැප වූ ESMS වීකකය මගින් මඟ පෙන්වනු ලබන අතර, එහි සේවක සංඛ්‍යාවේ ධාරිතා ගොඩනැගීම සඳහා අඛණ්ඩව ආයෝජනය කරයි. බැංකුව 2022 දී ආයතනික කළමනාකාරිත්වයේ ඉහළම ස්ථරයේ සිට බැංකුවේ ණය නිලධාරීන් සහ සම්බන්ධතා නිලධාරීන් දක්වා සේවකයින්ගේ දැනුවත්භාවය සහ ධාරිතාවය ගොඩනැගීම සඳහා අභ්‍යන්තර හා බාහිර සම්පත් සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් උපයෝගී කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් සිදු කරන ලදී.

වගකීම් සහිත ණය දීම සහ පාරිසරික, සමාජීය සහ ආයතනික යහපාලනය සම්බන්ධ අවදානම් කළමනාකරණය

වසර තුළදී, ගනුදෙනුකාර හා සංවර්ධන බැංකු අංශය යටතේ ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම නියෝජනය කරමින් පාරිසරික හා සමාජීය නිර්ණායක සඳහා ණය පහසුකම් 841 ක් බැංකුව විසින් පරීක්ෂා කරන ලදී. වසර තුළ, පාරසරික සහ සමාජ කළමනාකරණ පද්ධති අනුකූලතාවයට අනුකූල වීමෙන් පසු රු. බිලියන 1.3 ක ණය ලබා දී ඇත.


පාරිසරික හා සමාජීය නිර්ණායක පරීක්ෂණය සඳහා පුහුණු වූ නිලධාරීන් සංඛ්‍යාව	153
වර්ෂය තුළ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති අනුකූලතා සඳහා පරීක්ෂා කරන ලද ණය ගණන	841
වර්ෂය තුළ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති අනුකූලතා තහවුරු කිරීමෙන් පසු ලබා දුන් පහසුකම්වල වටිනාකම (රු. බිලියන)	4.7
පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙන් වර්ෂය තුළ ප්‍රතික්ෂේප වූ ණය සංඛ්‍යාව	නැත

FN-CB-410a.1

ආසියානු සංවර්ධන බැංකුව, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුකූල වන ලංකා බැංකුවේ හොඳින් ස්ථාපිත පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තියට අනුව A, B හෝ C ලෙස ශ්‍රේණිගත කරන ලද ණය පාරිසරික හා සමාජීය නිර්ණායක සඳහා පරීක්ෂා කරනු ලැබේ.

පෙළව විවිධත්වයට හානි කරන ව්‍යාපෘති සඳහා අරමුදල් ලබා නොදීමට බැංකුව කැපවී සිටී. මීට අමතරව, මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් තහවුරු කරන ලද සහ ජාතික පාරිසරික පනතේ දක්වා ඇති රෙගුලාසිවලට අනුව, අරමුදල් අපේක්ෂා කරන ව්‍යාපෘති පාරිසරික ආරක්ෂණ බලපත්‍රය (EPL) සඳහා සමාලෝචනය කර සුදුසු බලධාරීන්ගේ පූර්ව අනුමැතිය ලබා ගනී.

BOC මිතුරු සමාජ පළාත් අනුව ව්‍යාප්තිය



මූල්‍ය ඇතුළත් කිරීම

රු. බිලියන 52.6
කුඩා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දී ඇති ණය

රු. බිලියන 5.4
කුඩා මූල්‍යකරණ මුලපිරීම් හරහා බෙදා හරින ලද ණය

21,495
කුඩා මූල්‍ය අංශයට නව ණය ලබාදීම

රු. බිලියන 4.3
කාන්තාවන් සතු/කාන්තා මූලික කරගත් ව්‍යාපාර සඳහා කුඩා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් සඳහා ලබා දෙන ණය

31%
කාන්තාවන් සතු/කාන්තා මූලික කරගත් ව්‍යාපාර සඳහා ලබා දී ඇති කුඩා මූල්‍ය පහසුකම්

9,211
කාන්තාවන් සතු/කාන්තා මූලික කරගත් ව්‍යාපාර සඳහා ලබා දී ඇති නව කුඩා මූල්‍ය ණය

4,091
කාන්තාවන් සතු/කාන්තා මූලික කරගත් ව්‍යාපාර සඳහා ලබා දෙන අනෙකුත් සංවර්ධන ණය

1,000+
දැනුවත් කිරීමේ සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් වලට සහභාගිවූවන් ගණන

34
නියෝජිත බැංකුකරණය යටතේ ලියාපදිංචි නියෝජිතයන්

ප්‍රජාව සහ පරිසරය

දිවයින පුරා පුළුල්ම ප්‍රවේශයක් ඇති රාජ්‍ය බැංකුවක් ලෙස, මූල්‍ය ප්‍රවේශය සහ සමාජීය සහ මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා පහසුකම් සැලසීම සහ සහතික කිරීම බැංකුවේ බල පැවරුමෙහි කොටසක් වන අතර එහි තිරසාර ව්‍යාපාර ආකෘතිය තුළ අන්තර්ගත වේ.

සේවා සඳහා ප්‍රවේශය

මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා ලංකා බැංකුවේ දායකත්වයට රටේ වඩාත්ම දුරස්ථ, අවදානමට ලක්විය හැකි සහ වෙතිහාසික වශයෙන් අඩු පහසුකම් සහිත කොටස් සඳහා මූල්‍ය ප්‍රවේශය සහතික කිරීම ඇතුළත් වේ; මූලික වශයෙන් පුළුල් ශාඛා ජාලයක් සහ පුළුල් ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන හරහාය. BOC Connect සහ බැංකුවේ ජංගම සේවා ශාඛා මුලපිරීම හරහා පුළුල් බිම් මට්ටමේ නියෝජිත බැංකු ජාලයක් බැංකුවේ ප්‍රවේශයට ඇතුළත් වේ. ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන පිළිබඳ විස්තර සහ ප්‍රමාණය 79 පිටුවේ බැංකුව පිළිබඳ කෙටියෙන් යටතේ විස්තර කර ඇත.

FN-CB-240a.4

2022 වසර තුළදී, ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මට ප්‍රමුඛත්වය ලබාදීමට සහ අභියෝග මධ්‍යයේ වුවද මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය සහතික කිරීමට අමතරව, මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීමට සහ බැංකුවේ සහනදායී නිෂ්පාදන සහ සේවකයින් සහ ගනුදෙනුකරුවන් අතර පිරිනැමීම් පිළිබඳව දැනුවත් කිරීමට බැංකුව වසර පුරා මූලපිරීම් සිදු කළේය. ගනුදෙනුකාර පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු 84 පිටුවේ ගනුදෙනුකාර අංශයේ විස්තර කර ඇත.


සංවර්ධන ණය ලබාදීම

බැංකුවේ දායකත්වයේ තවත් ප්‍රධාන අංගයක් වන්නේ, සමස්ත සැපයුම් දාමයන්ට සහාය වන, ව්‍යවසායකත්වය දිරිමත් කරන, රැකියා උත්පාදනය සහ තිරසාරව, රට පුරා ග්‍රාමීය හා කාර්මික සංවර්ධනයට දායක වන සංවර්ධන ණය දීමයි.

සමාජීය සහ මූල්‍ය ඇතුළත් කිරීම් සහ සාධාරණ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින්, ලංකා බැංකුව වෙතිහාසික වශයෙන් අඩු පහසුකම් සහිත, එහෙත් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවතේ පවතින වඩාත් අවදානමට ලක්විය හැකි අංශ සහ කර්මාන්ත සඳහා මූල්‍ය සේවා සපයයි. බැංකුව අර්බුදවලින් පීඩාවට පත් වූ අංශවලට සහන සලසන, දිවයින පුරා අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහාය දෙන සහ හරිත තාක්ෂණයන් සහ ව්‍යාපාර ප්‍රවර්ධනය කරන විවිධ සහනදායී අරමුදල් මාර්ග සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනයක් (PFI) ලෙසද කටයුතු කරයි.

17 PARTNERSHIPS FOR THE GOALS

සංවර්ධන ණය ලබාදීමේ සංයුතිය



FN-CB-240a.1

විශේෂ ණය දීමේ නිෂ්පාදන සහ එහි සාර්ථක ක්ෂුද්‍ර මූල්‍යකරණ මුලපිරීම, BOC මිතුරු හරහා, බැංකුව ව්‍යවසායක ව්‍යාපාර, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෘහ කර්මාන්ත සඳහා සහාය සහ මූල්‍ය පහසුකම් සපයයි. 2022 දී, බැංකුවට මෙම කොටස සඳහා ණය ලබා දීමට තමන්ගේම අරමුදල් වෙන් කිරීමට හැකි වූ අතර, එය රු. මිලියන 52.6 ක් වන අතර, එම කොටස සඳහා එවැනි හිඟ ණය රු. මිලියන 105.4 ක් විය. වසර තුළදී තවත් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් 21,495 කට රු. බිලියන 5.45 ක් ලබා දී ඇති අතර, වසර අවසානයේ දී ක්ෂුද්‍ර මූල්‍ය හරහා නොගෙවූ මුළු ණය ප්‍රමාණය රු. බිලියන 13.1 දක්වා ගෙන එයි.

ප්‍රජාවේ මෙම තීරණාත්මක කොටස් සඳහා බැංකුවේ මූල්‍ය සහාය උපදේශන සේවා, දැනුවත් කිරීම් සහ වෙළඳපළ ප්‍රවේශය සඳහා වන සහයෝගය සමඟ අත්වැල් බැඳගනී. 2022 දී, බැංකුව BOC හෙළ බොජුන් සහ BOC මිතුරු පොළේ හි පුරෝගාමී වූ අතර, BOC මිතුරු සමිති වෙතින් නැවුම් නිෂ්පාදන, හස්ත කර්මාන්ත සහ අනෙකුත් නිෂ්පාදන සඳහා ව්‍යවසායක සහාය සහ වෙළඳපළ ප්‍රවිෂ්ටය ලබා දුන්නේය.

බැංකුවේ අනෙකුත් සංවර්ධන ණය සඳහා විශේෂිත නිෂ්පාදන සහ සහභාගීත්ව මූල්‍යකරණය සහ ශ්‍රී ලංකා මහ බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) වැනි බහුපාර්ශ්වික නියෝජිත ආයතන හරහා ප්‍රතිමූල්‍යකරණය ඇතුළත් විය. කෘෂිකාර්මික, ජලජීවී වගාව, ධීවර, කිරි, ආහාර සැකසුම් සහ සංචාරක ඇතුළු ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ සහ සමාජයේ ප්‍රධාන අංශ, කර්මාන්ත සහ අංශවල කුඩා වතු හිමියන්ට සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත මෙම යෝජනා ක්‍රම යටතේ ණය පහසුකම් ලබා දී ඇත. 2022 දී, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා එවැනි සංවර්ධන ණය ලබා දීම රු. බිලියන 19.7 ක් වූ ණය 1,302 ක් හරහා ලබා දී ඇති අතර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා බැංකුවේ කැපීපෙනෙන සංවර්ධන ණය කළඹ රු. බිලියන 105.4 ක් විය.

කාන්තා ව්‍යවසායකයින් සහ කාන්තා මූලික ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා බැංකුව සිය උත්සාහයන් කෙරෙහි අවධානය යොමු කරයි, දිවයින පුරා සිටින දහස් ගණන් කාන්තාවන්ට තමන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ ඔවුන්ගේ ප්‍රජාවන්ට උපකාර කළ හැකි ආදායම් උත්පාදන අවස්ථා සහ ජීවනෝපායන් සංවර්ධනය කිරීමට සහ විවිධාංගීකරණය කිරීමට හැකි වේ. වසර තුළදී, බැංකුව කාන්තා ව්‍යවසායකයින් සහ කාන්තාවන් සතු හෝ කාන්තා මූලික ව්‍යාපාර සඳහා රු. බිලියන 1.67 ක නව ක්ෂුද්‍ර මූල්‍ය ණය 9,211 ක් ලබා දී ඇත. මෙය 2022 දී බැංකුවේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රියාකාරකම්වලින් 31% ක් නියෝජනය කළේය. මීට අමතරව, විවිධ අංශ හරහා කාන්තාවන් විසින් මෙහෙයවන ව්‍යාපාර සඳහා රු. බිලියන 2.7 ක් වන වෙනත් සංවර්ධන ණය 4,091 ක් ලබා දී ඇත. 2022 දී ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා වන සංවර්ධන ණය බැංකුවේ ණය වලින් 5% නියෝජනය කරයි.

FN-CB-240a.3

ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම්

	2022
ක්ෂුද්‍ර මූල්‍යකරණය	
නව ක්ෂුද්‍ර මූල්‍ය ණය දීමේ වටිනාකම (රු. මිලියන)	5,453.9
නව ක්ෂුද්‍ර මූල්‍ය ණය සංඛ්‍යාව	21,495
කාන්තා මූලික ව්‍යාපාර සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය දීමේ වටිනාකම (රු. මිලියන)	1,673.8
කාන්තා මූලික ව්‍යාපාර සඳහා නව ක්ෂුද්‍ර මූල්‍ය ණය සංඛ්‍යාව	9,211
වසර අවසානයේ ක්ෂුද්‍ර මූල්‍යකරණය හරහා හිඟ ණයවල වටිනාකම (රු. මිලියන)	13,087.1

මෙහෙයුම්වල පාරිසරික පියසටහන්

වාර්ෂික හරිත ගොඩනැගිලි සම්මාන උළෙලේදී වසරේ හරිත ව්‍යාපාර නායකත්ව සම්මානය පිරිනමන ලදී

ලංකා බැංකුවේ පුළුල් භූගෝලීය ප්‍රවේශය සහ පුළුල් ගනුදෙනුකාර පදනම හේතුවෙන් මෙහෙයුම්වල පාරිසරික පියසටහන් අඩු කිරීම සඳහා උපායමාර්ගික සහ ඒකාබද්ධ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. මෙහෙයුම් හරහා පරිසර හිතකාමී භාවිතයන් ක්‍රියාත්මක කිරීම සහ බැංකුවේ වටිනාකම් දාමය ඔස්සේ තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම මගින් මෙය සාක්ෂාත් කර ගැනීමට ලංකා බැංකුව අරමුණු කරයි.

සේවකයින් අතර සිදු කරන ලද පුහුණුවීම් සහ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් වලට අමතරව, තිරසාර ප්‍රතිඥාවක් හඳුන්වා දෙන ලද අතර, කාර්ය මණ්ඩලය සඳහා සූර්ය බලශක්ති ස්ථාපනය සඳහා විශේෂ ණය යෝජනා ක්‍රම ලබා දෙන ලදී. තිරසාරභාවය පිළිබඳ පණිවිඩය රැගෙනයාමට සහ සේවක සහභාගීත්වය ලබා ගැනීමට අද්විතීය මුලපිරීමක් ලෙස බැංකුව ශාඛා මට්ටමින් ගෙවතු වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කළේය. 2022 දී ශාඛා 328 ක් සහ සේවකයින් 148 ක් බැංකු භූමිය තුළ දේශීය නිෂ්පාදන වගා කිරීමේ සක්‍රීයව නිරත විය.

GRI 302-1/2/3

බලශක්ති පරිභෝජනය

51

2022 දී සූර්ය බල ශක්තිය උපයෝගී කරගත් ශාඛා

7

රන් සම්මාන,

1

රිදී සම්මානය සහ

1

ප්ලැටිනම් සම්මානය

හරිත ගොඩනැගිලි සංකල්පය අනුගමනය කරමින් ශාඛා විසින් දිනා ගන්නා ලදී

3,219.3

මෙගා වොට් පැය

ජනනය කළ පුනර්ජනනීය බලශක්තිය

13%

පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් මෙහෙයුම් සඳහා බලශක්ති අවශ්‍යතාවය

9

හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිම කර ඇති ශාඛා



ප්‍රජාව සහ පරිසරය

ෆොසිල ඉන්ධන මත යැපීම අඩු කරන අතරම, මෙහෙයුම් සහ ශාඛා ජාලය හරහා බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට බැංකුව කැපවී සිටී. 2022 දී ලංකා බැංකුවේ ශාඛා සූර්ය බලශක්තියට පරිවර්තනය කිරීම අඛණ්ඩව සිදු වූ අතර, සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා තාක්ෂණයෙන් සමන්විත තවත් ශාඛාවක් සහ සූර්යාලෝකකරණ කරන ලද ශාඛා පහක් ඇත.

බැංකුව විසින් සිදු කරනු ලබන සියලුම නව ගොඩනැගිලි ඉදිකිරීම් හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් නිකුත් කරන ලද හරිත ගොඩනැගිලි සඳහා වන ප්‍රමිතීන්ට අනුව සිදු කරන බවට නියම කරන ප්‍රමිති සහ ප්‍රතිපත්ති ලංකා බැංකුව විසින් අනුගමනය කර ඇත.

2022 අවසන් වන විට, ශාඛා 51 ක් (බැංකුවේ මුළු ශාඛා ජාලයෙන් 9%) සූර්යකරණය කර ඇත. ශාඛා හතක් GREENSL® Gold ශ්‍රේණිගත කර ඇති අතර 01 ශාඛාවක් ගොඩනඟන ලද පරිසරය සඳහා GREENSL® හරිත ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය යටතේ ප්ලැටිනම් ශ්‍රේණිගත කිරීම රඳවා තබා ගනී. තවත් ශාඛා 07ක් හරිත ගොඩනැගිලි සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලියේ පවතී.

බැංකුව හරිත ගොඩනැගිලි කවුන්සිලයේ සහතිකය ලත් ඉංජිනේරුවන් සේවයේ යොදවා ඇති අතර තිරසාර ඒකකය NCPC සහතිකය සහිත සේවකයින් විසින් බල ගැන්වේ. බලශක්ති කාර්යක්ෂමතාව සහ හරිත තාක්ෂණය සම්බන්ධ කුසලතා ගොඩනැගීම සඳහා ආයෝජනය කරමින්, බැංකුව 2022 දී බාහිර පුහුණුව සහ ධාරිතාව ගොඩනැගීම සඳහා ප්‍රධාන කාර්ය මණ්ඩලය නම් කරන ලදී.

ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් සංවිධානය කරන ලද 2022 වාර්ෂික හරිත ගොඩනැගිලි සම්මාන උළෙලේදී සූර්යාලෝකය සහ හරිත ගොඩනැගිලි සහතික කිරීම සඳහා බැංකුවේ ජයග්‍රහණ ඇගයීමට ලක් විය. ලංකා බැංකුව 2022 වසරේ හරිත ව්‍යාපාර නායකත්ව සම්මානයෙන් පිදුම් ලැබීය - බැංකු අංශයේ සහ වාද්දුව ශාඛාවට රන් සම්මානයක් හිමි විය. ලංකා බැංකුවේ විදුලි ඉංජිනේරු එන්කේ බී තිලකවර්ධන මහතා වසරේ විශිෂ්ට හරිත වෘත්තිකයා කාණ්ඩය යටතේ ගෞරවනීය උපහාරයෙන් පිදුම් ලැබීය.

බලශක්ති පරිභෝජනය

GRI 302-1/302-4/305-4

	2022	2021	වෙනස%
විදුලිය (මෙගා වොට් පැය)	25,301.4	24,861.4	2
ඉන්ධන (ඝණ මීටර)	226.9	808.7	(72)
සූර්ය බලශක්තිය (මෙගා වොට් පැය)	3,219.3	1,758.0	83
හරිතාගාර වායු විමෝචනය (tCO_2eqv)	27,332.7	25,010.5	9

GRI 305-1/305-2/305-3

විමෝචනය

4,471.6 tCO_2eqv
1 කාණ්ඩය හරිතාගාර වායු විමෝචනය

13,394.6 tCO_2eqv
2 කාණ්ඩය හරිතාගාර වායු විමෝචනය

8,186.9 tCO_2eqv
3 කාණ්ඩය හරිතාගාර වායු විමෝචනය

1,279.5 tCO_2eqv
4 කාණ්ඩය හරිතාගාර වායු විමෝචනය

3.3 tCO_2eqv
(2021 දී 3) හරිතාගාර වායු විමෝචන තීව්‍රතාවය

GRI 305-4



හරිතාගාර වායු විමෝචනය ප්‍රමාණනය කිරීම සහ වාර්තා කිරීම සඳහා ISO 140064:1 ප්‍රමිතිය මත පදනම්ව බැංකුව හරිතාගාර වායු විමෝචනය තක්සේරු කර අනාවරණය කරයි. 2022 දී බැංකුව විස්තීර්ණ කාබන් කළමනාකරණ සැලැස්මක් සකස් කර ලංකා බැංකුවෙහි කාබන් පියසටහන මැහීම, අවම කිරීම සහ කළමනාකරණය සඳහා නව උපායමාර්ග සකස් කළේය.

ද්‍රව්‍ය පරිභෝජනය

කඩදාසි රහිත බැංකුකරණය සඳහා බැංකුවේ පෙළඹවීම තවදුරටත් ඉහළ නංවමින්, ලංකා බැංකුව ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය ඉහළ නැංවීමට අඛණ්ඩව කටයුතු කළේය. 2022 දී ලේඛන කළමනාකරණ පද්ධතියට සිදු කරන ලද වැඩිදියුණු කිරීම් වැනි බැංකුවේ මෙහෙයුම් හරහා කඩදාසි පරිභෝජනය අඩු කිරීමේ ප්‍රවණතාව දිගටම කරගෙන ගියේය.

ඩිජිටල්කරණය සඳහා ලංකා බැංකුවේ උපායමාර්ගික අවධාරනය සහ ඩිජිටල් නාලිකා වෙත ගනුදෙනුකරුවන් හුරු කිරීම මඟින්, ඉදිරි වසර වලදී කඩදාසි පරිභෝජනය දිගටම අඩු කිරීමට බැංකුව සාර්ථකව සූදානම් වේ.



GRI 306-1/306-3/306-4

අපද්‍රව්‍ය කළමනාකරණය

මෙ.ටොන් 21.9
ප්‍රතිචක්‍රීකරණය
කරන ලද කඩදාසි

රු. මිලියන 547.7
කසළ කළමනාකරණ
ව්‍යාපෘති සඳහා අරමුදල්



GRI 306-1/306-3/306-4

එහි මෙහෙයුම්වල සෘජු ප්‍රතිඵලයක් ලෙස, ලංකා බැංකුව ප්‍රාථමික අපද්‍රව්‍ය වර්ග දෙකක් නිෂ්පාදනය කරයි: භාවිත කළ කඩදාසි සහ විද්‍යුත් අපද්‍රව්‍ය, විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය සහ විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා බැංකුව සතුව අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් ඇත. නව අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් සහ විස්තීර්ණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් කෙටුම්පත් කරමින් පවතින අතර, බැංකුව සිය මෙහෙයුම් හරහා අපද්‍රව්‍ය අවම කිරීම සහ වගකීමෙන් අපද්‍රව්‍ය බැහැර කිරීම ප්‍රවර්ධනය කිරීමට කැපවී සිටින බව සහතික කරනු ඇත.

ඉදිරි දැක්ම

සමාජයේ සියලුම කොටස් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම සඳහා දිගුකාලීන දැක්මක් අනුගමනය කිරීමට ලංකා බැංකුව කැපවී සිටී.

තිරසාර මූල්‍යකරණය සඳහා වූ ප්‍රබල යෝජනාවක් ඉදිරි වසරවල බැංකුවේ තිරසාර ප්‍රයත්නවල පිහිටා ඇත්තේ බැංකුවේ විධිවිධාන, උපායමාර්ග සහ වටිනාකම් ප්‍රස්තුතය ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍යකරණ මාර්ග සිතියම සමඟ සමීපව පෙළගැසී ඇති බැවිනි. ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනයට සහය වීමට සූදානම් වීමත් සමඟ, සංවර්ධන ණය දීම, හරිත මූල්‍යකරණය සහ මූල්‍ය ඇතුළත් කිරීම් ප්‍රජාවට සහ පරිසරයට විශාල බලපෑමක් ඇති කරන ප්‍රධාන වටිනාකම් ධාවකයන් බවට සහතික වේ.

රජයේ සංවර්ධන ප්‍රයත්නයන්ට සහාය වන අතරම, සිය මෙහෙයුම් ක්ෂේත්‍රවලට අනුකූලව තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම බැංකුවේ අරමුණයි. මීට අමතරව, සැලකිය යුතු සමාජ ගැටලු විසඳීමට සහ එහි ප්‍රජාවන් තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීමට බැංකුව උපායශීලීව ආයතනික සමාජ වගකීම් මූලපිරීම් සඳහා ආයෝජනය කරනු ලබයි.

ලංකා බැංකුව එහි වටිනාකම් දාමය හරහා සහ පුළුල් ප්‍රජාව තුළ පාරිසරික තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම දිගටම කරගෙන යනු ඇත.

ව්‍යාපාරික හවුල්කරුවන්

ලංකා බැංකුවේ ව්‍යාපාරික හවුල්කරුවන් ගණයට ගෝලීය හවුල්කරුවන් සහ දේශීය සැපයුම්කරුවන් ඇතුළු මූල්‍ය සේවා වටිනාකම් දාමය ඇතුළත් වන අතර තොරතුරු සන්නිවේදන තාක්ෂණ (IT) පද්ධතීන් පුළුල් ලෙස ආවරණය කිරීමට ද වර්ධනය වී ඇත.

විශේෂ අවස්ථා

602
ලියාපදිංචි සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන්

91
විදේශ මුදල් හුවමාරු මධ්‍යස්ථාන

2022 දී දේශීය සැපයුම්කරුවන්ට සිදු කරන ලද ගෙවීම
රු. බිලියන 6.4

784
නියෝජිත බැංකු

40
2022 දී බැංකුව සමඟ සැපයුම් කටයුතු වල නියැලී සිටින ව්‍යවසායකයින් සහ කුඩා ව්‍යාපාර

95%
දේශීය සැපයුම්කරුවන්ට සිදු කරන ලද ගෙවීම

මෙහෙයුම් සන්දර්භය

ගෝලීය පසුබෑම සහ සැපයුම් දාම වලට ඇති වූ බාධා ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට බලපාන ලද අතර එමඟින් විවිධ අංශ හරහා සැපයුම් දාමයන් මත පීඩනය ඇතිවීම මඟින් මෙම තත්ත්වය උග්‍ර විය. රටේ ස්වෛර්ය පැහැර හැරීම් සහ විදේශ විනිමය අර්බුදය ජාත්‍යන්තර ව්‍යාපාරික හවුල්කරුවන්, වාර්තාකරුවන් බැංකු සහ ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ ගනුදෙනු කිරීමේදී සබඳතාවල ශක්තිය කෙරෙහි වැඩි වැදගත්කමක් ලබා දීමට හේතු විය. FinTech නියෝජිත ආයතන, සහ ප්‍රමුඛ තාක්ෂණික හවුල්කරුවන් ඇතුළු ICT ආයතන සමඟ සබඳතා ඉදිරියට රැගෙනයාම තොරතුරු තාක්ෂණයේ වර්ධනයන් මත ඉතා වැදගත් විය.

ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සම්බන්ධ වීම

සම්බන්ධ වීමේ වේදිකා

- අඛණ්ඩ ලිඛිත සන්නිවේදනය
- නිතිපතා රැස්වීම්
- ලංසු තැබීමේ ක්‍රියාවලිය
- කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තා



අවශ්‍යතා

- විනිවිදභාවයෙන් යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලි සහ තරඟකාරී මිලකරණය
- ගනුදෙනු කිරීමේ පහසුව
- එකඟ වූ කාල අනුව ගෙවීම්
- ස්ථිර සහ පුරෝකථනය කළ හැකි ඉල්ලුම

ප්‍රතිචාර දැක්වූ ආකාරය

- සැපයුම්කරුවන්ට රු. බිලියන 6.4 ක් ගෙවීම
- විනිවිදභාවයෙන් යුත් තෝරා ගැනීමේ සහ තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය
- ගෙවීම් පැහැර හැරීම් නොමැත
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය

වගකිව යුතු ප්‍රසම්පාදනය

බැංකුවට සහ එහි ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන් ගණනාවක් සමඟ බැංකුව කටයුතු කරයි. මේවාට දේශීය හා ජාත්‍යන්තර නියෝජිත ආයතන, සංස්ථා සහ ආයතන ඇතුළත් වන අතර, බැංකුවට වටිනාකමක් ඇති කිරීමට ඇති හැකියාවට දායක වන අතර, අනෙක් අතට ඔවුන්ගේ අදාළ කර්මාන්තවල විශිෂ්ටත්වය දැක්වීමට බලගැන්වීම සහ සහාය ලබා දේ.

SASB FN-CB-510a.2

බැංකුව පුළුල් "විසිල් බ්ලෝවර්" ප්‍රතිපත්තියක් භාවිතා කරන අතර අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන්ට සහ හවුල්කරුවන්ට විය හැකි ගැටළු සහ උත්සුකයන් ගැන කතා කිරීමට බලය ලබා දෙන සංස්කෘතියක් පෝෂණය කරන අතර දූෂණය, මුදල් විශුද්ධිකරණය, වංචා සහ වෙනත් සදාචාර විරෝධී හෝ නීති විරෝධී ගනුදෙනු සක්‍රීයව වැළැක්වීමට සහ වාර්තා කිරීමට දිරිමත් කරයි. "විසිල් බ්ලෝවර්" ප්‍රතිපත්තිය පුද්ගලිකත්වයද තහවුරු කරන අතර පැමිණිලි ගොනු කරන පාර්ශ්වයන්ට ආරක්ෂාව සපයයි.

GRI 204

රජය සතු ආයතනයක් ලෙස, ලංකා බැංකුව ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට අනුකූලව විනිවිද පෙනෙන, සමානාත්මතාවයෙන් යුතු සහ බහුවිධ සාධක සලකා බලන දැඩි රාජ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත් අනුගමනය කරයි. තවද, සියලුම භාණ්ඩ සහ ස්ථාවර වත්කම් ප්‍රසම්පාදනය සඳහා සුදුසු ආරක්ෂාව, තිරසාරභාවය සහ පරිසර හිතකාමී නිර්ණායක සපුරාලීම සහතික කිරීම සඳහා බැංකුව විසින් දැඩි පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියකට භාජනය වේ.

මූල්‍ය සේවා අංශයේ ප්‍රධානියෙකු ලෙස, ලංකා බැංකුව සැපයුම්කරුවන්ට සහ හවුල්කරුවන්ට ප්‍රසම්පාදන පිළිවෙත් සහ රෙගුලාසිවලට අනුකූල වීමට සහාය වන අතර සැපයුම් දාමයේ සංවර්ධනයට දායක වීම සඳහා දේශීය සැපයුම්කරුවන් වෙත ප්‍රසම්පාදනයේදී ප්‍රමුඛත්වය දෙයි. නියමිත වේලාවට ගෙවීම් සිදු කිරීම බැංකුව සහතික කරන අතර, ගෙවීම් කාලය අඩු කිරීමට සහ සැපයුම්කරුවන්ට සහ ව්‍යාපාරික හවුල්කරුවන්ගේ පහසුව වැඩිදියුණු කිරීමට අනාගතයේදී විධිවිධාන තවදුරටත් යොදනු ඇත.

ව්‍යාපාරික හවුල්කරුවන් බැංකුවේ තිරසාර ව්‍යාපාර ආකෘතියේ සහ උපායමාර්ගයේ ප්‍රධාන අංගයක් ලෙස ලංකා බැංකුව සලකන අතර පාරිසරික හා සමාජීය (E&S) අවදානම් හඳුනා ගැනීමට, කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. සැපයුම්කරුගේ තක්සේරු කිරීම් සහ විගණනය අත්‍යවශ්‍ය සහ විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් වන අතර එමඟින් බැංකුව අනුකූලතාව සහතික කරයි.

සැපයුම්කරුවන් විගණනය

මූලික පාරිසරික හා සමාජීය ප්‍රමිතීන්ට අනුකූල වීම තහවුරු කිරීම සඳහා බැංකුව සැපයුම්කරුවන්ගේ තක්සේරු කිරීම් සහ ස්ථානීය විගණන සිදු කරයි. මෙම විගණන මඟින් නිශ්චිත ISO ප්‍රමිතීන්ට අනුකූල වීම තක්සේරු කරන අතර සාධාරණ ශ්‍රම පරිචයන්, බලශක්ති කාර්යක්ෂමතා භාවිතයන් සහ අපද්‍රව්‍ය කළමනාකරණය සහ ප්‍රතිචක්‍රීකරණ භාවිතයන් සඳහා සැපයුම්කරුවන් සමාලෝචනය කරයි.

GRI 407/408/409

ළමා ශ්‍රමයේ හෝ බලහත්කාර/අනිවාර්ය ශ්‍රමයේ අවදානම පිළිබඳව බැංකුවේ සැපයුම්කරුවන් පරීක්ෂාවට ලක් නොකළ අතර, ජාතික ප්‍රතිපත්ති සහ සැපයුම් දාමය හරහා එය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම, ඉතා අඩු අවදානම් පැතිකඩක් පෙන්වයි. තවද, වසර තුළ සංගමයේ හෝ සාමූහික කේවල් කිරීමේ නිදහස අහිමි වූ අවස්ථා වාර්තා වී නොමැත.

හවුල්කාරිත්වයන් හරහා ප්‍රවේශය පුළුල් කිරීම



රට පුරා ඇති අධික ඩිජිටල් භාවිතයට අනුකූලව, ගනුදෙනුකරුවන්ට ප්‍රවේශය සහ ප්‍රශස්ත සේවාවක් සහතික කිරීම සඳහා බැංකුව දේශීය හවුල්කරුවන්ගේ පුළුල් ජාලයක් සමඟ කටයුතු කරයි. බැංකුව අන්තර්ජාල ගෙවීම් ද්වාර (IPG) පහසුකම්, PoS පහසුකම් සහ තවත් බොහෝ අංශවල වෙළෙඳුන් සමඟ හවුල් වේ. ගනුදෙනුකරුවන්ට අපගේ වටිනාකම් සේවාවන් වැඩිදියුණු කිරීමේදී, ලොව පුරා මුදල් ආපසු ගැනීම් සහ ගෙවීම් සඳහා ප්‍රවේශය පහසු කිරීම සඳහා බැංකුව පුළුල් ගෙවීම් කාඩ්පත් හවුල්කරුවන්ගේ ජාලයක් සමඟ ද කටයුතු කරයි.

සමාජයේ අඩු පහසුකම් සහිත කොටස් සහ බැංකු නොවන ගනුදෙනුකරුවන් වෙත බැංකුවේ ප්‍රවේශයේ ප්‍රධාන අංගයක් වන්නේ BOC Connect නියෝජිත ජාලයයි. ශ්‍රී ලංකාවේ ගනුදෙනුකරුවන්ට සහ ප්‍රජාවන්ට වැඩි ගනුදෙනුකාර පහසුව සහ ප්‍රවේශවීමේ අවසාන ඉලක්කය සමඟ අනෙන්‍යන්‍ය වශයෙන් වාසිදායක හවුල්කාරිත්වයක් සහතික කිරීම සඳහා බැංකුව කටයුතු කරයි. බැංකුවේ BOC කනෙක්ට් ජාලය පිළිබඳ වැඩි විස්තර 78 පිටුවේ ගනුදෙනුකාර අංශයේ ඇත.

බැංකුව ජාත්‍යන්තර බැංකු සහ මූල්‍ය ආයතන සමඟ සබඳතා පවත්වාගෙන යාම සහ හුවමාරු ආයතන සමඟ සමීප සහයෝගීතාව ඇතුළු ජාත්‍යන්තර හවුල්කරුවන් රාශියක් සමඟ ක්‍රියා කරයි. මෙම සබඳතා මඟින් ලංකා බැංකුවට විදේශීය ස්ථාන හරහා සම්බන්ධතාව පහසු කිරීමට හැකි වන අතර බැංකුවේ ප්‍රේෂණ මෙහෙයුම්, විදේශීය මෙහෙයුම් සහ අක්වෙරළ මෙහෙයුම් සඳහා සහාය වේ.

බැංකුව ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන සමඟ ද සමීපව කටයුතු කරන අතර, ශ්‍රේණිගත කිරීමේ අවශ්‍යතා සහ ප්‍රමිතීන් පිළිබඳ බැංකුව යාවත්කාලීන බව සහතික කිරීම සහ විනිවිදභාවයෙන් යුතුව හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වේ.

ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ බැංකුවේ සබඳතා පිළිබඳ වැඩි විස්තර 65 පිටුවේ ව්‍යාපාර අංශ සමාලෝචනවල විස්තර කර ඇත.

සම්මාන සහ පිළිගැනීම

හවුල් අරමුණු සඳහා බැංකුවේ දායකත්වය සහ හවුල්කරුවන් සමඟ නවෝත්පාදන සහ සේවා ප්‍රමිතීන්හි විශිෂ්ටත්වය අගයමින් ලංකා බැංකුව වසර තුළ සම්මාන ගණනාවක් දිනාගන්නා ලදී

Daraz ගෙවීම් හවුල්කාර කාර්යසාධන සම්මානය 2022

2022 සඳහා හොඳම ක්‍රියාකාරී හර කාඩ් පදනම - අඛණ්ඩව දෙවන වසර සඳහා

ආසියානු ඩිජිටල් මූල්‍ය සංසදය සහ සම්මාන

මහජනතාව සඳහා හොඳම බැංකු සේවා මුලපිරීම



ලංකා පේ ටෙක්නෝවේශන් සම්මාන

අන්තර් බැංකු ඩිජිටල් ගෙවීම්වල විශිෂ්ටත්වය වෙනුවෙන් සමස්ත රන් සම්මානය මෙන්ම උත්සවයේ දී වැඩිම සම්මාන සංඛ්‍යාවක් ලබා ගැනීම

2021 වසරේ වඩාත්ම ජනප්‍රිය ඩිජිටල් ගෙවීම් නිෂ්පාදනය

ශාඛා ගෙවීම් සඳහා හොඳම බැංකුව

මූල්‍ය ඇතුළත් කිරීම් සඳහා වසරේ බැංකුව

වසරේ හොඳම පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සක්‍රීය කරන්නා - කුසලතා සම්මානය

මූල්‍ය සේවා සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සඳහා සහාය වීම

රටේ විශාලතම බැංකුවක් ලෙස, ලංකා බැංකුව කර්මාන්ත අංශ සහ ශ්‍රී ලංකා ආර්ථිකයට සහාය වීම සඳහා විශ්වසනීය සංවිධාන සමඟ සහයෝගීතාවය සහ හවුල්කාරිත්වය සඳහා අවස්ථා සොයමින්, කර්මාන්ත සංගම් සහ හවුල්කාරිත්වයන් පෝෂණය කිරීම සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දෙයි. ලංකා බැංකුව මූල්‍ය සේවා අංශයේ සංවර්ධනයට දායක වන අතර, මෙම ඉලක්ක බෙදා හදා ගන්නා සංස්ථා සහ ආයතනවල ධනාත්මක බලපෑම් වේගවත් කිරීමට සහ ගැඹුරු කිරීමට කැපවී සිටී.

2022 දී බැංකුව පහත සඳහන් ආයතන සමඟ සාමාජිකත්වය රඳවා ගත්තේය:

- ආසියා පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය සංගමය (APRACA)
- ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ අවදානම් ව්‍යාත්තිකයන්ගේ සංගමය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය
- බයෝ ඩයිවර්සිටි ආයතනය - ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (සීමාසහිත) සමාගමය
- ශ්‍රී ලංකා බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමය
- ශ්‍රී ලංකා නීති විද්‍යාලය

ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනයට සමගාමීව, දේශීය සැපයුම් දාමය පුරා ඇති සංස්ථා සහ ව්‍යාපාර සමඟ ළඟින් සහයෝගය දැක්වීමට සහ සම්බන්ධ වීමට බැංකුව කැපවී සිටී.

දූෂණය, මුදල් විශුද්ධිකරණය, වංචාව හෝ වෙනත් නීතිවිරෝධී ගනුදෙනු සඳහා ඇති හැකියාව සක්‍රීයව වළක්වන සදාචාරාත්මක ව්‍යාපාරික සංස්කෘතියක් ආරක්ෂා කිරීම ඇතුළුව ප්‍රසම්පාදනයේදී හොඳම භාවිතයන් ආරක්ෂා කිරීම ප්‍රධාන අවධානය යොමු කරන ක්ෂේත්‍රයක් ලෙස පවතී. මේ සඳහා අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් අතර පුහුණුව සහ දැනුවත් කිරීම සඳහා බැංකුව අඛණ්ඩව ආයෝජනය කරනු ඇත.

ඩිජිටල්කරණය යනු බැංකුවේ අවධානය යොමුවන ප්‍රධාන ක්ෂේත්‍රයක් වේ. තවද සේවා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට සහ වැඩි විනිවිදභාවය සහ වගවීම සඳහා දායක වීමට පොරොන්දු වේ.

ලංකා බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඇතුළුව එහි ප්‍රාථමික නියාමකයින් සමඟ ශක්තිමත් සබඳතා ඇතිකර ගනී. නියාමකයින්ගේ අපේක්ෂාවන් ඒ අයුරෙන්ම සපුරාලීමට බැංකුව ක්‍රියා කරයි.

විශේෂ අවස්ථා

බලපෑමට ලක් වූ ණය ගැනියන්ට
සහන දීර්ඝ කර ඇත

ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති
තිරසාර මූල්‍ය දිශානතිය

නියාමන අනුපාත සහ ස්වාරක්ෂක
සමඟ අනුගතව ඇත

අධීක්ෂණ වාර්තාවල කරුණු පිළිබඳව
ක්‍රියාමාර්ග ගෙන ඇත

මෙහෙයුම් සන්දර්භය

2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදය නිදහසින් පසු මූල්‍ය අංශයට සැලකිය යුතු බලපෑමක් ඇති කරමින් ශ්‍රී ලංකාවේ ඇති වූ බරපතලම ආර්ථික අර්බුදය වේ. මෙම මෙහෙයුම් පරිසරය සඳහා රටේ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීමට දැඩි නියාමන පාලනයක් අවශ්‍ය විය. නියාමකයා මෙම කාල සීමාව තුළ අදාළ වර්ධනයන් සාවධානව අධීක්ෂණය කළේය. මූල්‍ය ආයතන සඳහා විධි විධාන සහ රෙගුලාසි ගණනාවක් ස්ථාපිත කරන ලද අතර, ආර්ථිකයේ අර්බුදකාරී බලපෑමට ලක් වූ අනෙකුත් අංශ සඳහා සහන සහ ආධාරක ක්‍රියාමාර්ග නිර්දේශ කරන ලදී. අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තිබියදීත්, ලංකා බැංකුව රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූල වීම සහ බැංකුවේ අවදානම් පැතිකඩ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා නියාමකයින් සමඟ ක්‍රියාශීලී සහ විනිවිද භාවයකින් කටයුතු කළේය. මෙම කාලසීමාව තුළ බැංකුව මූල්‍ය සේවා අංශයේ ස්ථායීතාවය සහ අර්බුදවලින් පීඩාවට පත් ගනුදෙනුකරුවන්ට සහ අනෙකුත් ප්‍රධාන කොටස්කරුවන්ට සහය දැක්වීමට ප්‍රමුඛත්වය දී ඇත.

නියාමයකයින්ගේ අවශ්‍යතා සඳහා සවන් දීම

සම්බන්ධවීමේ වේදිකා

- ✔ නියාමන වාර්තාකරණය (අඛණ්ඩව)
- ✔ පුද්ගලික රැස්වීම් (අඛණ්ඩව)
- ✔ කර්මාන්ත සංසද හරහා සාකච්ඡා (අඛණ්ඩ)
- ✔ වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන (අඛණ්ඩව)

අවශ්‍යතා

- ✔ ව්‍යාපාර සහ ආර්ථික පුනර්ජීවනයට සහය වීම
- ✔ මූල්‍ය ක්ෂේත්‍රය කෙරෙහි විශ්වාසය තබා ගැනීම
- ✔ ශක්තිමත් පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන්
- ✔ මූල්‍ය ඇතුළත් කිරීම සඳහා පහසුකම් සැලසීම



ප්‍රතිචාර දැක්වූ ආකාරය

- ✔ කාලෝචිත වාර්තාකරණය සහ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම්
- ✔ සියලුම රෙගුලාසි/මාර්ගෝපදේශ සමඟ පූර්ණ අනුකූල වීම
- ✔ අවධානයට ලක්විය හැකි කොටස් සඳහා අනිවාර්ය ණය දීමේ අවශ්‍යතා පිළිපැදීම
- ✔ දැඩි බලපෑමට ලක් වූ අංශ සඳහා අඛණ්ඩ සහය
- ✔ අඛණ්ඩතාව සහ ක්ෂේත්‍රයේ සහයෝගිතාවය පවත්වා ගැනීම

නිකුත් කරන ලද නව විධාන, රෙගුලාසි සහ මාර්ගෝපදේශ සමඟ අනුකූල වීම

ලංකා බැංකුව 2022 දී ආර්ථික මූලධර්ම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව කෙරෙහි අවධානය යොමු කළේය. බැංකුව ගතානුගතික ප්‍රවේශයක්, පටු ආන්තිකය සහ දැඩි පාලනයන් සමඟ සාර්ථකව මෙහෙයුම් කළමනාකරණය කළේය; අනුපාත කඩ කිරීමක් හෝ ස්වාරක්ෂක භාවිතයක් නොමැති බව සහතික විය. අතිරේක සීමාවන් ඇතුළත් කර ඇති සහ මිණුම් සලකුණු වලට අනුකූලව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පවත්වා ගන්නා ලදී. යෝග්‍ය සහ කළමනාකරණය කළ හැකි සීමාවන් තුළ ණය ගැණුම්කරුවන්ට ණය අනුපාත ප්‍රතිලාභ සහ සහන ද ලබා දෙන ලදී.

ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම පිළිබඳ 2021 අංක 13 දරණ මහ බැංකුවේ උපදෙස් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම පිළිබඳ 2021 අංක 14 දරණ උපදෙස්, 2022 ජනවාරි පළමුවැනිදා සිට ක්‍රියාත්මක විය. අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය තුළ, ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම ශක්තිමත් කිරීමට මෙම නියෝග සැලසුම් කර ඇත.

ණය පහසුකම් සහ වත්කම් පිළිබඳ වැඩි පරීක්ෂා කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම සම්බන්ධයෙන් ලංකා බැංකුවෙහි පාලන රාමුව, අවදානම් කළමනාකරණ රාමුව සහ අභ්‍යන්තර විගණන කාර්යයන් ශක්තිමත් කිරීම සම්බන්ධ විධානවලට අනුකූල වීම. වසර තුළ බැංකුවේ ශේෂ පත්‍රය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ පහසුකම් නැවත වර්ගීකරණය කිරීම සහ හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීම ද ඊට ඇතුළත් විය.

තවද, වර්ෂය තුළ නිකුත් කරන ලද අනෙකුත් සියලුම නියාමන නියෝග සහ මාර්ගෝපදේශ සපුරාලීමට ලංකා බැංකුව කටයුතු කළේය. ප්‍රධාන වර්ධනයන් ඇතුළත් වේ (නමුත් ඒවාට සීමා නොවේ)

- ද්‍රවශීලතා අනුපාත පිළිබඳ නියාමන අවශ්‍යතා SLAR, LCR, NSFR සපුරාලීම සහ නඩත්තු කිරීම
- බලපෑමට ලක් වූ ණය ගැතියන් සඳහා සහන දීර්ඝ කර ඇත: ප්‍රතිව්‍යුහගතකරණය කිරීම, නැවත සැලසුම් කිරීම, සහන කාල සීමාවන් ආදිය
- ව්‍යාපාර පුනර්ජීවන ඒකකයේ ක්‍රියාකාරකම් මාර්ගෝපදේශ අනුව අනුගත කිරීම
- ප්‍රමුඛතා අංශ සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍යකරණය සහ පොළී සහනාධාර යෝජනා ක්‍රම
- තිරසාර මූල්‍ය මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු විය
- නියාමන වාර්තාකරණ අවශ්‍යතා තහවුරු කර ඇත
- විදේශ විනිමය රෙගුලාසිවලට අනුකූල විය
- ආන්තික අවශ්‍යතා සපුරා ඇත

තිරසාර මූල්‍ය සඳහා ශ්‍රී ලංකා මහා බැංකුවෙහි මාර්ග සිතියමට අනුව පෙළගැස්වීම

පාරිසරික, සමාජීය සහ පාලන අවදානම් වඩා හොඳින් කළමනාකරණය කිරීම සහ හරිත, දේශගුණික හිතකාමී තාක්ෂණයන් භාවිතා කරමින් සමාජීය හා මූල්‍ය ඇතුළත් කිරීම් වැඩිදියුණු කිරීමේ අරමුණින් රට තුළ තිරසාර මූල්‍යකරණයක් සංවර්ධනය කිරීමට මහ බැංකුවේ තිරසාර මූල්‍ය මාර්ග සිතියම සැලසුම් කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ග සිතියමට අනුව තිරසාර මූල්‍යකරණය ක්‍රියාත්මක කිරීමේදී ලංකා බැංකුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිටු 103 සිට 113 දක්වා ප්‍රජාව සහ පරිසරය යන කොටස් තුළ විස්තරාත්මකව දක්වා ඇත;

ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික ආර්බුදය ඉදිරියටත් පැවතිය හැකි බැවින්, විධානවලට අනුකූල වීම සහතික කිරීමට සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට ප්‍රමුඛත්වය දෙන වගකීම් සහගත ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට බැංකුව නියාමකයින් සහ සියලුම පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කරනු ඇත.

සම්මාන

CMA විශිෂ්ටතා ඒකාබද්ධ වාර්තාකරණ සම්මාන 2021

- වටිනාකම් නිර්මාණය පිළිබඳ හොඳම හෙළිදරව් කිරීම
- හොඳම ඒකාබද්ධ වාර්තාව - රාජ්‍ය අංශයේ ව්‍යාපාර/සමාගම් සම්මාන
- වසරේ හොඳම ඒකාබද්ධ වාර්තා දහය අතර

HR – ආසියානු මානව සම්පත් නායකත්ව සම්මාන උළෙලේ හොඳම සේවා සපයන්නා

ටෙක්නොවේෂන් සම්මාන 2022

- අන්තර්බැංකු ඩිජිටල් ගෙවීම් විශිෂ්ටත්වය පිළිබඳ - සමස්ත ජයග්‍රාහක
- ශාඛා බැංකු ගෙවීම් සඳහා හොඳම සන්නාමය - රන් සම්මාන
- වඩාත්ම ජනප්‍රිය ඩිජිටල් ගෙවීම් නිපැයුම (B App යෙදුම) - රන් සම්මාන
- මූල්‍ය අන්තර්කරණය සඳහා වසරේ හොඳම බැංකුව A කාණ්ඩය - රන් සම්මාන

Daraz ගෙවීම් හවුල්කාර කාර්යසාධන සම්මාන 2022 - 2022 වසර සඳහා හොඳම ක්‍රියාකාරී හර කාඩ් පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද "TAGS සම්මාන 2022" වාර්ෂික වාර්තා සම්මාන උළෙලේ දී රාජ්‍ය බැංකු කාණ්ඩයේ විශිෂ්ටත්ව රන් සම්මානය

සේවය කිරීමට හොඳම මානව සම්පත් සංවිධානය - 2022 වසරේ ගෝලීය මානව සම්පත් විශිෂ්ටතා සම්මාන

හොඳම ජයග්‍රාහකයින් දසදෙනා අතරට - හොඳම කළමනාකරණ පරිචයන් සඳහා වන සම්මාන - ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය

ශ්‍රී ලංකාවේ අංක 1 බැංකු සන්නාමය ලෙස අඛණ්ඩව 14 වන වරටත් ලංකා බැංකුව නම් කරන ලදී



ද බැන්කර් සඟරාව විසින් නම්කරන ලද 2022 වසරේ ලෝකයේ ප්‍රමුඛම බැංකු දහස අතරින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකුව ලෙස ලංකා බැංකුව පත් විය

ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින්

- වසරේ හරිත ව්‍යාපාර නායකත්ව සම්මාන 2022 - බැංකු අංශයේ හොඳම බැංකුව
- එම අංශයෙන් වාද්දූව ශාඛාව රන් සම්මානයෙන්ද පිදුම් ලැබීය

මහජනතාව වෙත හොඳම බැංකු සේවා මුලපිරීම් - ආසියානු ඩිජිටල් මූල්‍ය සංසද සම්මාන, කොලරාකෝ මූල්‍ය හා කළමනාකරණ ගෝලීය ඇකඩමිය - ඇමරිකා එක්සත් ජනපදය

හොඳම කළමනාකරණ පරිචයන් සඳහා වන සම්මාන - "නව සාමාන්‍යකරණය යටතේ (2020 සහ 2021) නැවත ව්‍යාපාරයන්ට යොමුවීම" - 2022 ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ ජාත්‍යන්තර කළමනාකරණ සමුළුව

ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ – Kantar ජනතා සම්මාන 2022

- 2022 වසරේ විශිෂ්ටතම සේවා සැපයුම්කරු
- වසරේ බැංකු සේවා සන්නාමය යන සම්මානයන්ගෙන් ලංකා බැංකුව පිදුම් ලැබීය.

7 ආයතනික යහපාලනය

ආයතනික යහපාලනය පිළිබඳ සභාපතිතුමාගේ පණිවිඩය



ලංකා බැංකුවේ මෙහෙයුම් හා වෙළඳපළ අභියෝග රාශියක් හමුවේ බැංකුවේ ආයතනික යහපාලනය එහි මෙහෙයුම්වල තීරණාත්මක අංශයක් වන අතර, බැංකුවේ යහපාලන රාමුවද අතිශයින්ම වැදගත්ය.

බැංකුවේ දෘඪතර පද්ධතීන් හා ක්‍රියාවලීන් රාජ්‍ය බැංකුවකින් අපේක්ෂා කෙරෙන කාර්යවිධි සමග අනුකූල වන අතරම ඒවා නියාමන අවශ්‍යතා හා විශිෂ්ටතම පිළිවෙත් සමග අනුකූල වෙයි. එමෙන්ම ඒවායින් බැංකුවේ ආචාරධර්ම පිළිබිඹු වන අතර ඒවා සැකසී ඇත්තේ අපගේ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ඉහළින්ම සපුරාලන අතරම, බැංකුවෙහි කෙටි හා මැදි කාලීන උපායමාර්ගික පරමාර්ථයන් සාක්ෂාත් වන පරිද්දෙනි. ශ්‍රී ලංකාව පසුගිය වර්ෂයේ අත්විඳි ප්‍රවේගී හා අර්බුදකාරී ව්‍යාපාරික පරිසරය තුළ සුවිලාස්තාවෙන් හා වගකීමෙන් යුතුව කටයුතු කිරීමට බැංකුවේ යහපාලන පිලිවෙත් උපකාරී විය.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රවීන වෘත්තීයවේදීන් කණ්ඩායමකින් සමන්විත වෙයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාවේ යොදවනු ලබන උපායමාර්ගික නායකත්වය, තියුණු අධීක්ෂණය හා අනුකූලතා-පාදක පාලනවිධි වර්ෂය තුළ බැංකුවේ ස්ථාවරත්වය සහතික කිරීමෙහිලා අතිශයින් වැදගත් විය.

අනුකූලතාව

මෙම වාර්තාවේ 366 පිටුවේ ඇති අනුකූලතාව පිළිබඳ ඇමුණුම් මෙම බැංකුවෙහි යහපාලනය ක්‍රියාත්මක වන ආකාරය හා ආයතනික යහපාලන රෙගුලාසි හා විශිෂ්ටතම පිළිවෙත් අබණ්ඩව අනුගමනය කිරීම කෙරෙහි බැංකුවෙහි ප්‍රවේශය දක්වයි.

ඉදිරි දැක්ම

බැංකුව එහි ආචාරධර්මයන්ට සත්‍යවාදී වන බවට සහ අඛණ්ඩව සියලු පාර්ශ්වකරුවන් වෙත සුවිශේෂී වටිනාකමක් ගෙන දෙන බවට සහතික වෙමින් ඉදිරි වර්ෂය තුළ ස්ථාවර ප්‍රවේශයක් ඔස්සේ බැංකුව මෙහෙයවීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඇපකැපව සිටී. බැංකුව අඛණ්ඩව ඩිජිටල්කරණය තුළ ආයෝජනය කරමින් හා සිය ගනුදෙනුකරුවන් වෙත ඉදිරිපත් කරන සිය ඩිජිටල් සේවාවන් ශක්තිමත් කරමින් සිටින වකවානුවක, අපි මහාචාර්ය කිත්සිරි ලියනගේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම හා රාජ්‍ය පරිපාලනය හා ඩිජිටල් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් එතුමා රැගෙන එන අත්දැකීම් සම්භාරය පිළිගන්නේ ඉමහත් සතුටිනි.

තවද, අප සතු ශක්තීන් ප්‍රයෝජනයට ගනිමින් අපගේ විවිධාකාර වූ පාර්ශ්වකරුවන් සඳහා තවදුරටත් වටිනාකම් ජනනය කරන ආකාරයේ වර්ධනයක් ගාමනය කරනු පිණිස අපි අපගේ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් සමඟ සමීපව කටයුතු කිරීමට අපේක්ෂාවෙන් සිටිමු. ගෝලීය විශිෂ්ටතම පිළිවෙත් සමග දිශාගත වන සේ අපි පාරිසරික හා සාමාජීය පරිකෂණ පරිචයන් ඉහළ නැංවීම හා ඉදිරියේ එන අභියෝගාත්මක තත්ත්වයන් හරහා ශ්‍රී ලංකාවේ ආර්ථිකය, ව්‍යාපාර සහ ප්‍රජාවන් ගේ දියුණුව උදෙසා උර දීම කෙරෙහි කැප වී සිටිමු.

අප ඉදිරියේ ඇති අභියෝගාත්මක ආර්ථික පරිසරය හරහා බැංකුව මෙහෙයවීමේදී අපි අඛණ්ඩව අපගේ ආයතනික යහපාලන පද්ධතීන් හා ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා ආයෝජනය කරන්නෙමු. නිරීක්ෂණය හා අධීක්ෂණය සඳහා නව කමිටු හඳුන්වා දීමේ හා මුඛ්‍ය ගනුදෙනුකාර කොටස් සමග අපගේ සබඳතා වඩා හොඳින් කළමනාකරණය කරනු පිණිස නව ඒකක පිහිටුවීමේ සිට, අවදානම් හඳුනා ගැනීම හා ඒවායේ ප්‍රතිඵල අවම කිරීම සඳහා අපගේ ක්‍රියාවලීන් හා පාලනවිධි ශක්තිමත් කිරීම දක්වා, අපගේ පාර්ශ්වකරුවන් සඳහා දීර්ඝ-කාලීන වටිනාකම ලබා දීමට බැංකුවට හැකියාව තිබෙනු ඇති බවට වගබලා ගනු පිණිස අපි අවශ්‍ය සෑම පියවරක්ම ගනිමින් සිටිමු.

රොනල්ඩ් සී පෙරේරා (ජනාධිපති නීතිඥ)
සභාපති

2023 පෙබරවාරි 24
කොළඹ දීය

2022 වර්ෂය තුළ යහපාලන ක්‍රියාවලියේ ප්‍රගතිය සහ විශේෂතා

2022 වර්ෂය තුළ රටේ රාජ්‍ය මූල්‍ය හා සාර්ව ආර්ථික තත්ත්වයන් ඔස්සේ, ලංකා බැංකුව හා මූල්‍ය ක්ෂේත්‍රය පෙර අත් නොවිඳි අභියෝගයන්ට මුහුණ දුනි. මෙම සන්දර්භය තුළ, බැංකුවේ යහපාලන කාර්යපටිපාටි පරීක්ෂාවට ලක් කොරුණු අතර ඒවා ගනුදෙනුකරුවන්ට හා වෙනත් පාර්ශ්වකරුවන්ට සාමූහික උපකාර ලබා දෙන අතරේ දුෂ්කර තත්ත්වයන් තරණය කිරීමට ලංකා බැංකුවට ඉඩ සැලසීමෙහිලා වැදගත් විය. කටයුතු තීව්‍ර කිරීම, අවදානම් කළමනාකරණ පිළිවෙත් තවත් ශක්තිමත් කිරීම සහ තමන් ක්‍රියා කරන පරිසරය පූර්ව-ක්‍රියාකාරී ලෙස නිරීක්ෂණය කිරීම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය සිය සුපරීක්ෂක රාජකාරී ඉටු කළහ.

තමන් ක්‍රියාත්මක වන පරිසරයේ සැලකිය යුතු වෙනස්කම්වලට හා අභිනවයෙන් හඳුන්වා දෙන ලද අභ්‍යන්තර ක්‍රියාවලීන්ට ප්‍රතිචාර වශයෙන්, බැංකුව මෙම වර්ෂය තුළ සියලුම ප්‍රතිපත්ති සමාලෝචනය කොට යාවත්කාලීන කළ අතර එයට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දෙන ලද අදහස්ද සැලකිල්ලට ගෙන ලංකා බැංකු ආඥාපනත සංශෝධනය සඳහා වූ යෝජනා පිළිබඳ සමාලෝචනයක්ද ඇතුළත් විය.

විදේශ විනිමය හා දේශීය මුදල් ද්‍රවශීලතාව පිළිබඳ පූර්ණ අවධානය

ස්වෛරී ණය ගෙවීම් පැහැර හැරීම, උච්ඡාවචනය වන විනිමය අනුපාතිකය හා අභිනවයෙන් පනවන ලද පොළී අනුපාතික ක්‍රමය සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ විදේශ විනිමය හා දේශීය මුදල් ද්‍රවශීලතාව පිළිබඳව සමීපව සාකච්ඡා කළේය. ලංකා බැංකුවේ මූල්‍ය තත්ත්වය සුරක්ෂිත කිරීමට උපකාරී වූ සමීප නිරීක්ෂණය හා සුපරීක්ෂාකාරී අධීක්ෂණය මඟින් ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට ක්‍රියාමාර්ග ඇති කරන ලදී. විදේශ විනිමය පිටතට ප්‍රවාහය වීම් පිරික්සීමට, ප්‍රතිපාර්ශ්ව හා දේශීය සීමාවන් යලි සලකා බලා ප්‍රතිශෝධනය කිරීමට, විදේශ විනිමය/දේශීය මුදල් ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට හා බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය සමීපව නිරීක්ෂණය කිරීමට විශේෂ සුපරීක්ෂණ කමිටු ස්ථාපිත කරන ලදී.

අවදානම් කළමනාකරණය

බැංකුවේ අවදානම් කළමනාකරණ මෙහෙයුම්වලට අඛණ්ඩව ආයෝජනය කිරීමට සමගාමීව, බැංකුවේ යහපාලනයේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ අවදානම් කමිටුව හා අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගැයීම් ක්‍රියාවලියේ මෙහෙයුම් කමිටුව හරහා සමීපව නිරීක්ෂණය හා අධීක්ෂණය කිරීමයි. එමඟින් ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්තිය ඔස්සේ නීතිපතා හා සඵලදායී ලෙස ප්‍රත්‍යාබල පරීක්ෂාව සිදු කෙරෙන බවටත්, සීමා හා මාර්ගෝපදේශ ස්වරූපයෙන් අවදානම් අභිරුචිය අනුගමනය කෙරෙන බවටත් සහතික කෙරේ. එමෙන්ම බැංකුව ද්‍රවශීලතා අවදානම, පොළී අනුපාතික අවදානම සහ පාරිසරික හා සාමාජීය අවදානම මත අවධානය වැඩි කරනු පිණිස නිරීක්ෂණයට ලක් කෙරෙන අවදානම්වල විෂය පථය පුළුල් කර තිබේ. ද්‍රවශීලතා හා පොළී අනුපාතික අවදානම මත විශේෂ අවධානය සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවදානම් වාර්තාකරණය ශක්තිමත් කරන ලදී.

උපායමාර්ගික අධීක්ෂණය

වාර්ෂික උපායමාර්ග වැඩමුළුවේ පවත්වනු ලැබූ අතර, වෙළඳපළ තත්ත්වයන් ඔස්සේ වන පරිදි කෙටි-කාලීන සිට දිගු-කාලීන දක්වා වූ උපායමාර්ගික ඉලක්ක සහ ක්‍රියාමාර්ග සැලසුම් වඩා යහපත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථායික සැලැස්මට සාපේක්ෂව බැංකුවේ කාර්යසාධනය සමාලෝචනය කළහ.

පාරිසරික හා සාමාජීය නිරසාරභාවය

මෙම වර්ෂය තුළ පාරිසරික හා සාමාජීය නිරීක්ෂණ පිළිවෙත් ව්‍යාප්ත කරන ලද්දේ සියලු ව්‍යාපෘති මූල්‍යකරණ පහසුකම් ආවරණය වන පරිද්දෙනි. බැංකුවේ පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තිය මෙහෙයුම් සන්දර්භයේ වෙනස්කම් වලට හා ගෝලීය විශිෂ්ටතම පිළිවෙත් වලට අනුගත වන පරිදි සමාලෝචනය කරන ලදී.

යහපාලනය පිළිබඳ දර්ශනය හා රාමුව

ශ්‍රී ලංකාවේ සාමාජීය හා මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛත්වය දරණ පාර්ශ්වකරුවකු වශයෙන් ලංකා බැංකුව විවිධාකාරී වූ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලන අතරම, මෙරට බැංකු පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීමට එයට ඇති වගකීම පිළිගනී. ඩිජිටල්මය වශයෙන් හැකියා සම්පන්න කරන ලද, අනාගතයට ඔරොත්තු දෙන සංවිධානයක් වීමේ බැංකුවේ පරමාර්ථයට අවදානම් වටහා ගන්නා, සම්පත් ප්‍රතිපාදනය කළමනාකරණය කරන හා තිරසාර අගය නිර්මාණය කරන මනා යහපාලන ප්‍රතිපත්තියක රුකුල ලැබේ.

විශේෂයෙන්ම රජයට අයත් පද්ධතික වශයෙන් වැදගත් දේශීය බැංකුවක් වශයෙන් ලංකා බැංකුවේ යහපාලන රාමුව නියාමන අවශ්‍යතාවන් හා ගෝලීය විශිෂ්ටතම පිළිවෙත් සමඟ දිශාගතව පවතිනුයේ පාර්ශ්වකරුවන්ගේ විවිධාකාර අවශ්‍යතා ආමන්ත්‍රණය කරන හා කෙටි-කාලීන හා දිගු-කාලීන ප්‍රතිඵලයන් සමබර කරන අතරමය.

නායකත්වයේ ප්‍රාරම්භක වගකීම



උපායමාර්ගික දිශානතිය නියම කිරීම හා ප්‍රගතිය පිළිබඳව අධීක්ෂණය සැපයීම



දෘඪතර අවදානම් කළමනාකරණ රාමු ස්ථාපිත කිරීම



බැංකුවෙහි කීර්තිනාමය ආරක්ෂා කිරීම



රෙගුලාසි, ප්‍රතිපත්ති, ප්‍රමිති හා කාර්යපටිපාටි සමඟ අනුකූල වන බවට වගබලා ගැනීම

ආයතනික යහපාලනය

යහපාලන රාමුවේ මුඛ්‍ය සංරචක

ප්‍රජාව

නිරවුල්ව නිරූපිත කාර්යභාරයන් හා වගකීම් සමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අත්දැකීම්, පළපුරුද්ද, ධාරිතාව හා ස්වාධීනත්වය

අභිමතාර්ථ

බැංකුවේ දීර්ඝ-කාලීන අභිමතාර්ථ, සංස්ථායික සාරධර්ම හා ආචාරධර්ම සංග්‍රහය සමඟ දිශාගත වීම

ක්‍රියාවලි

සඵලදායී නායකත්වය, වගකීම, විනිවිදභාවය හා අවංකභාවය සහතික කරන යාන්ත්‍රණ හා කාර්යපටිපාටි

කාර්යසාධනය

ආයතනික යහපාලන පිළිවෙතෙහි සඵලදායීත්වය පිළිබඳව අඛණ්ඩ තක්සේරුව හා මැනීම

නියාමන රාමුව

- 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත (“ආඥාපනත” ලෙස සඳහන් කෙරෙන) සහ එහි සංශෝධන
- 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි ආනුෂංගික සංශෝධන
- බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳව වූ 2007 අංක 11 දරණ බැංකු පනත් විධානය
- කොළඹ කොටස් හුවමාරුවේ අවිච්ඡින්න ලෙස ලැයිස්තුගතව සිටීම පිළිබඳ නියමයන්
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2017 දෙසැම්බර් මස නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ විශිෂ්ටතම පිළිවෙත් සංග්‍රහය
- 2021 අංක 19 දරණ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත

අභ්‍යන්තර මඟපෙන්වීම් හා යාන්ත්‍රණ

- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය
- අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු ප්‍රඥප්ති
- අධ්‍යක්ෂවරුන් සඳහා ව්‍යාපාරික චර්යා හා ආචාරධර්ම සංග්‍රහය
- විස්තීර්ණ ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි
- පරිපාලිත ආයතන කළමනාකරණ ප්‍රඥප්තිය
- ගනුදෙනුකාර ප්‍රඥප්තිය
- නව සම්පත් සහ පුද්ගල කළමනාකරණය
- උපායමාර්ගික හා සංස්ථායික සැලසුම්කරණය
- අවදානම් කළමනාකරණය
- තොරතුරු තාක්ෂණ හා සයිබර් සුරක්ෂිතතා තන්ත්‍රණය
- සේවකයින් සඳහා චර්යාධර්ම සංග්‍රහය

ආයතනික වටිනාකම්

- ගනුදෙනුකාර කේන්ද්‍රිකත්වය
- විවිධත්වය කෙරෙහි ගරුත්වය
- ඉහළම මට්ටමේ ආචාරධර්ම, යහපාලනය හා වෘත්තීයවේදීත්වය සඳහා ඇපකැප වීම
- නම්‍යශීලී සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම
- තම ක්‍රියාමාර්ග පිළිබඳව වගවීම


පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීම

- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- කොටස් හිමියා හා අරමුදල් සපයන්නන්
- රට සහ ප්‍රජාව
- නියාමකයින්
- ව්‍යාපාරික හවුල්කරුවන් හා සැපයුම්කරුවන්

යහපාලන ව්‍යුහය

අධ්‍යක්ෂ මණ්ඩලයට විගණනය, නාමයෝජනා, පාරිශ්‍රමික, අවදානම් කළමනාකරණය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇතුළු කාරණා සම්බන්ධයෙන් වී වී කාරණාවලට අදාළ කමිටුවල සහයෝගය ලැබේ. මෙම සැකැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට උපායමාර්ගික න්‍යාය පත්‍ර අංග පිළිබඳව අවධානය යොමු කිරීමේ හැකියාව ලබා දෙයි. එක් එක් කමිටුවේ සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සිය කටයුතු පිළිබඳ වාර්තා කොට නිර්දේශ ඉදිරිපත් කරන අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. බැංකුවේ එදිනෙදා කළමනාකරණය කිරීම මහා කළමනාකාරතුමා ප්‍රමුඛ කළමනාකරණ කණ්ඩායමකට පැවරේ.

එයට අමතරව, බැංකුව පැහැදිලිව නිර්වචනය කරන ලද කාර්ය පැවරුම් හා වගකීම් සහිතව විධායක මට්ටමේ කමිටු කිහිපයක් ස්ථාපිත කොට ඇත. අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු හා විධායක කමිටු පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා 125 පිටුව බලන්න.



යහපාලනය කෙරෙහි ප්‍රවේශය

යහපාලනය කෙරෙහි බැංකුවේ ප්‍රවේශය බැංකුවෙහි ආයතනික යහපාලන රාමුවෙහි පුද්ගලයින්, අභිප්‍රාය, ක්‍රියාවලි හා කාර්යසාධනය යන සංරචකයන් හතර හරහා පිළිබිඹු කෙරේ.

ප්‍රජාව

ඒ ඒ තනතුරු සඳහා නිවැරදි පුද්ගලයින් පත් කෙරෙන බවටත්, මනා ආයතනික යහපාලනය ක්‍රියාගැන්වීම තහවුරු කරනු පිණිස ඔවුන් නිවැරදි මෙවලම් වලින් සන්නද්ධ කෙරෙන බවටත් බැංකුව වගබලා ගනී. මේ සම්බන්ධයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අත්දැකීම්, ධාරිතාව හා ස්වාධීනත්වයේ ප්‍රමාණය, කාර්යභාරයන් හා වගකීම් නිරූපනය, සහ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීමේ, හඳුන්වාදීමේ හා අධ්‍යක්ෂ පුහුණුව යන අංග පහත කොටසින් විස්තර කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හය දෙනකුගෙන් සමන්විත විය යුතු නමුදු, 2022 වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට එහි සිටියේ අධ්‍යක්ෂවරුන් සිව්දෙනෙක් පමණි. කෙසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ විවිධ කුසලතා, අත්දැකීම් හා විශේෂඥතා සංකලනයක් රැගෙන ආහ. සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන කාර්යභාරයකින් සේවය කරන අතර ඉන් එක් අධ්‍යක්ෂවරයෙක් "විෂය භාර මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයකු විසින් නිල බලයෙන්ම දරනු ලබන තනතුර දරන අධ්‍යක්ෂවරයා" වීම හේතුවෙන් ස්වාධීන නොවන ලෙස සැලකුණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය ආඥාපනත තුළ ස්ථාපිත කර ඇති අතර රාජ්‍ය බැංකු සඳහා වගකීම දරන අමාත්‍යවරයා අධ්‍යක්ෂවරුන් පත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වර්ෂය මුළුල්ලේම නොවෙනස්ව පැවතුණේ අභියෝගාත්මක කාලපරිච්ඡේදයක දැක්මේ, සාමූහික චින්තනයේ හා ප්‍රවේශයේ අඛණ්ඩතාව සහතික කරමිනි. සිය ධුරකාලය අවසන් කළ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් 2023 ජනවාරි මාසයේ සිය අධ්‍යක්ෂ ධුරවලට සමු දුන්හ. සභාපතිවරයකු හා අධ්‍යක්ෂවරයකු අභිනවයෙන් පත් කරනු ලැබූ අතර තවත් නාමයෝජනා කිරීමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ යුතුව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ගුණාත්මකතාව

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ තොරතුරු 27 සිට 29 දක්වා පිටු තුළ දක්වා ඇත.

කාර්යභාරයන් හා වගකීම් වෙන් කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයන් හා වගකීම් නිරවුල්ව දක්වන අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය හරහා ලංකා බැංකුවේ කාර්යභාරයන් පිළිබඳ නිරවුල් බව හා වගකීම් සවලදායී ලෙස වෙන් කෙරෙන බව සහතික වෙයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය දෙයි. මහා කළමනාකරු විධායක නායකත්ව කණ්ඩායම මෙහෙයවන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරක් නොඋසුලයි. මෙම වෙන් කිරීම කාර්යභාරයන් පිළිබඳව පැහැදිලි බව හා සවලදායී තීරණ ගන්නා බව සහතික කරයි. එයට අතිරේකව, කිසිදු අධ්‍යක්ෂවරයෙක් තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ අසීමිත බලය තනිව නොදරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වය

අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ තක්සේරුවේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශයන් අනුගමනය කෙරේ. 2022 වර්ෂය අවසාන වන විට, සාමාජිකයින් සිව් දෙනා අතරින් අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙක් ස්වාධීන ලෙස සැලකුණි.

ආයතනික යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම හා මූලික දැනුවත් කිරීම්

යෝග්‍යතාව හා උචිතත්වය පිළිබඳ නිර්ණායකයන්ට අනුකූලව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියට යටත්ව, රාජ්‍ය බැංකු සම්බන්ධයෙන් වගකීම දරණ අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලැබේ. 2021 අංක 19 දරණ නව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා (SEC) පනත යටතේ, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවද නව අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම් අනුමත කරයි. කවර හෝ අධ්‍යක්ෂවරයකුගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම අදාළ අමාත්‍යවරයාගේ අවධානයට ගෙන එනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස් වීම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව හා කොළඹ කොටස් හුවමාරුව දැනුවත් කෙරේ. බැංකුව විසින් සම්මත කර ගෙන ඇති පරිදි වූ අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් ස්ථාපිතව ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය නිපුණතා, අත්දැකීම් ආදිය දක්වමින් පත් කිරීම් පිළිබඳව පත් කිරීමේ බලධාරීන් දැනුවත් කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කිරීම හා පුහුණුව

සියලුම නව අධ්‍යක්ෂවරුන්ට බැංකුවෙහි යහපාලන රාමුව, සංස්කෘතිය හා වටිනාකම් පිළිබඳව අවධානය යොමු කරන්නා වූ විශේෂයෙන් සකසන ලද දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු කෙරේ. 2022 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කිරීමේ ක්‍රියාවලිය තුළ කිසිදු වෙනස්කමක් නොතිබුණි.

- මෙම මූලික දැනුවත් කිරීම සඳහා බැංකුව පිළිබඳ දළ විස්තරයක්, යහපාලන රාමුව පිළිබඳ විස්තර (උදා.: සංවිධානමය ව්‍යුහයන්, ප්‍රඥප්තීන් ආදිය), නියාමන රාමු සහ ආයතනික කළමනාකරණ කණ්ඩායම හා අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ උපකාරක රාමුව, සහ තවත් දේ පිළිබඳ විස්තර ඇතුළත් වේ.
- මහා කළමනාකාරතුමා විසින් කෙරෙන ඉදිරිපත් කිරීමකින් බැංකුවේ ඉතිහාසය, ව්‍යාපාරික ආකෘතිය, ව්‍යාපාරික සිරස් ආකෘති හා උපකාරක ක්‍රියාකාරිත්වයන් පිළිබඳව විස්තර කෙරේ.
- තවද, රැස්වීම් හා දෙපාර්තමේන්තු වෙත ගොස් කෙරෙන නිරීක්ෂණයන් අවශ්‍ය පරිදි හා ඉල්ලීම මත සූදානම් කෙරේ.

අධ්‍යක්ෂවරුන්ට සිය වගකීම් සඵලදායී ලෙස සිදු කිරීමට අවශ්‍ය දැනුමෙන් ඔවුන් සන්නද්ධ කරන පුහුණු වැඩසටහන් වෙත ඔවුන්ට ප්‍රවිෂ්ටය ලැබෙන බවට බැංකුව වගබලා ගනී. මෙම වැඩසටහන් වලට සාමාන්‍යයෙන් අදාළ නීති රීති හා රෙගුලාසි පිළිබඳව දැනුම අළුත් කිරීම්, ප්‍රමිති හා කාර්ය සංග්‍රහ පිළිබඳ යාවත්කාලීන කිරීම් හා කර්මාන්තයේ මතුවෙමින් එන ප්‍රවණතා ඇතුළත් වේ.

කෙසේ වුවද, 2022 වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන් කිසිදු බාහිර පුහුණු වැඩසටහනකට සහභාගි වූයේ නැත.

අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකාරිත්ව කණ්ඩායම සමඟ ක්‍රියාකාරී ලෙස කටයුතු කිරීම හරහා දැනුවත්ව පැවතියේය. මේ සඳහා කළමනාකාරිත්ව කණ්ඩායම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පැමිණ අදහස් ඉදිරිපත් කිරීමට ඇරයුම් කිරීම මෙන්ම විද්‍යුත් පද්ධතිය හරහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා වෙනත් අදාළ තොරතුරු සංසරණය කිරීම සිදු කෙරේ. අධ්‍යක්ෂවරුන්ට ස්වාධීන වෘත්තීයවේදී උපදෙස් වෙත ප්‍රවිෂ්ටය පිළිබඳ ප්‍රතිපත්තිය බැංකුවේ පිරිවැය මත විශේෂඥ අදහස් ලබා ගැනීම සඳහාද ඉඩ සලසයි.

ක්‍රියාවලිය

බැංකුවේ සඵලදායී නායකත්වය හා පාලනය ප්‍රවර්ධනය කරන ක්‍රියාවලීන් හා කාර්යපටිපාටි වලින් යහපාලන රාමුවේ කේන්ද්‍රීක සංරචකයක් වන අතරම එමඟින් වගවීම, විනිවිදභාවය හා අවංකභාවය පෝෂණය කෙරේ.

ප්‍රතිපත්ති රාමුව

උපායමාර්ගික හා මෙහෙයුම් අංශ සම්බන්ධයෙන් ඒකාකාර ලෙස කටයුතු කෙරෙන බවට වගබලා ගනු පිණිස වූ පරිපූර්ණ ප්‍රතිපත්ති රාමුවක් බැංකුවේ ස්ථානගතව ඇත. මෙම රාමුව වෙනස් වන අභ්‍යන්තර හා බාහිර සාධකයන්ට දිශාගතව පවතින බවට වගබලා ගනු පිණිස එය නිති සමාලෝචනය හා යාවත්කාලීන කෙරේ. බැංකුවේ ප්‍රතිපත්ති මඟින් මානව සම්පත්, අවදානම් කළමනාකරණය, යහපාලනය, අධ්‍යක්ෂ මණ්ඩල කාර්යපටිපාටි, ඩිජිටල්කරණය, ආයෝජන ඇතුළු විවිධ ක්ෂේත්‍ර ආවරණය කෙරේ.

පවත්නා සියලුම ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම හැරුණු විට, අධ්‍යක්ෂ මණ්ඩලය කොවිඩ්-19 තත්ත්වයත් සමඟ රැකියා ලෝකයේ ඇති වූ වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, දුරස්ථ වැඩ/නිවසේ සිට වැඩ කිරීම පිළිබඳ නව ප්‍රතිපත්තියක් 2022 වර්ෂය තුළ අනුමත කළේය.

හඳුන්වා දෙන ලද/ප්‍රතිශෝධනය කරන ලද මුඛ්‍ය ප්‍රතිපත්ති

අවදානම් කළමනාකරණය

- ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- රට තුළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකත්ව තක්සේරු ක්‍රියාවලි ප්‍රතිපත්තිය
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

පුද්ගල කළමනාකරණය

- පුහුණු හා සංවර්ධන ප්‍රතිපත්තිය
- බඳවා ගැනීම් පටිපාටිය
- මානව සම්පත් ප්‍රතිපත්තිය
- නිවසේ සිට වැඩ කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය
- ඉවත් වීමේ සම්මුඛ සාකච්ඡා ප්‍රතිපත්තිය

තොරතුරු තාක්ෂණවේදය

- විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය
- තොරතුරු සුරක්ෂිතතා ප්‍රතිපත්තිය

තිරසාරභාවය

- පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තිය
- යහපාලන ප්‍රතිපත්තිය
- ගනුදෙනුකාර පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය හා කාර්යපටිපාටි

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල වගකීම් හා කාර්යපටිපාටි අදාළ උපකමිටු ප්‍රඥප්ති තුළ විග්‍රහ කර තිබේ. ඒවා සවලදායී ලෙස ක්‍රියා කරන බවට වගබලා ගැනීම හා ඒවායේ ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම සම්බන්ධයෙන් වූ වගකීම මෙම උපකමිටුවල සභාපතිවරු දරති. සමාලෝචිත වර්ෂය තුළ, සියලු උපකමිටුවල ප්‍රඥප්ති සමාලෝචනයට ලක් කරන ලදුව යාවත්කාලීන කරන ලදී.

විගණන කමිටුව

මෙම කමිටුව විසින් අභ්‍යන්තර පාලනවිධි සහ අභ්‍යන්තර හා බාහිර විගණනය ඇතුළු දේ පිළිබඳ වාර්තා කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කරනු ලැබේ. විගණන කමිටුවේ වාර්තාව සඳහා කරුණාකර 130 හා 131 පිටු බලන්න.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) කමිටුව

මෙම කමිටුව තොරතුරු තාක්ෂණවේද නිෂ්පාදන, සේවාවන්, ප්‍රතිපත්ති, පිළිවෙත් හා යටිතල පහසුකම් සඳහා අධීක්ෂණ වගකීම දරයි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ වාර්තාව සඳහා කරුණාකර 138 හා 139 පිටු බලන්න.

නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව

ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරු සඳහා තේරීම හෝ පත්කිරීම, චර්යාධර්ම සංග්‍රහය ක්‍රියාත්මක කිරීම හා ආයතනික යහපාලන පිළිවෙත් දියුණු කිරීම සඳහා වූ කාර්යපටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරයි. නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවේ වාර්තාව සඳහා කරුණාකර 136 හා 137 පිටු බලන්න.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)

ණය, වෙළඳපළ, ද්‍රවශීලතා, මෙහෙයුම්, සයිබර්/තොරතුරු තාක්ෂණ, උපායමාර්ගික, කීර්තිනාම හා පාරිසරික හා සාමාජීය තන්ත්‍රණ අවදානම් ඇතුළු අවදානම් කළමනාකරණය සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට හා අදාළ නීති රීති හා රෙගුලාසිවලට අනුකූල වන බවට සහතික වීම සඳහා වගකීම දරයි. බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව සඳහා කරුණාකර 132 හා 133 පිටු බලන්න, බැංකුවේ අවදානම් කළමනාකරණ වාර්තාව සඳහා පිටු අංක 140 සිට 156 පිරික්සන්න.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

පාරිශ්‍රමික ප්‍රතිපත්තිය, ප්‍රධාන කළමනාකරණ පිරිස්වල කාර්යසාධනය ඇගයීම හ අරමුණු නියම කිරීම සහ බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය නිර්ණය කිරීම සඳහා වගකීම දරයි. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ වාර්තාව සඳහා කරුණාකර 134 හා 135 පිටු බලන්න.

විධායක කමිටු

ලංකා බැංකුවේ විධායක කමිටු

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO)	මෙහෙයුම් අලාභයන් පිළිබඳව කටයුතු කරන කමිටුව	හානි තක්සේරු හා ප්‍රතිෂ්ඨාපන කමිටුව (DARC)	රජයේ සුරැකුම්පත් තුළ ආයෝජනය සඳහා වූ කමිටුව
ශාඛා අංශ ණය කමිටුව	ආයතනික තොරතුරු සුරක්ෂිතතා කමිටුව	මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව	තොරතුරු තාක්ෂණවේද මෙහෙයුම් කමිටුව
ව්‍යාපාරික අඛණ්ඩතා සම්බන්ධීකරණ කමිටුව	ආයතනික කළමනාකරණ කමිටුව	අක්‍රීය වත්කම් කමිටුව	අලෙවිකරණ කමිටුව
ව්‍යාපාරික අඛණ්ඩතා ක්‍රියාත්මක කිරීමේ කමිටුව	ආයතනික උපායමාර්ග සමාලෝචන කමිටුව	අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලි මෙහෙයුම් කමිටුව	අක්‍රීය වත්කම් සමාලෝචන කමිටුව (NPAC)
ව්‍යාපාරික අඛණ්ඩතා කළමනාකරණ විකල්ප කමිටුව (BCMAC)	ණය කමිටුව	ආයෝජන කමිටුව	මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව
ප්‍රතිලාභ හා ඇගයීම් කමිටුව (RRPC)	ශිෂ්‍යත්ව වැඩසටහන් තේරීම් කමිටුව (සමාලෝචන කමිටුව)	ශිෂ්‍යත්ව කමිටුව	තිරසාර කමිටුව
tvBoC හි ක්‍රියාකාරී නියමු කමිටුව	tvBoC ක්‍රියාකාරී කමිටුව	තාක්ෂණික හා මෙහෙයුම් කමිටුව	විදේශ මුදල් ගෙවීම් ප්‍රවාහ කළමනාකරණ කමිටුව

ආයතනික යහපාලනය

අවදානම් අධීක්ෂණය

අධ්‍යක්ෂ මණ්ඩලය දෘඪතර අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කිරීම හා බැංකුවේ අවදානම් කළමනාකරණ හා අභ්‍යන්තර පාලන රාමු අධීක්ෂණය කිරීම සඳහා වගකීම දරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සිය අවදානම් කළමනාකරණ හා අභ්‍යන්තර පාලන වගකීම් බැඳියාවන් ඉෂ්ට කිරීමෙහිලා සහාය වෙයි. 2022 වර්ෂයේ පැවති ආර්ථික පීඩනයන් සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, පොළී අවදානම සහ පාරිසරික හා සාමාජීය අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යයන් ප්‍රමුඛත්වගත කළේය.

අවදානම් ආශ්‍රිත ක්‍රියාකාරිත්වයන්

1. බැංකුවේ අවදානම් අභිරුචිය අනුමත කිරීම
2. බැංකුව මුහුණ දෙන ප්‍රධාන අවදානම් නිතිපතා තක්සේරු කිරීම
3. නිර්වචනය කළ පරාමිතීන්ට සාපේක්ෂව අවදානම් අභිරුචි හා කාර්යසාධනය සමාලෝචනය කිරීම
4. පැන නඟිය හැකි අවදානම් සාර්ථක ලෙස මැඩපත්වනු පිණිස, හානි අවකරණ මෙවලම් නිසිපරිදි යොදා ගැනෙන බවට සහතික වීම

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

රටේ පැවති ඉන්ධන හිඟය විසින් ගමනා ගමනය කෙරෙහි ඇති කරන ලද බාධකයන් නොතකා ව්‍යාපාරික අඛණ්ඩතාව සහතික කරනු පිණිස වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා රැස්වීම් පැවැත්වීය. රැස්වීම් න්‍යාය පත්‍ර අංග සැකසීම, තොරතුරු සංසරණය, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පහසුකම් සැලැස්වීම සහ කාර්ය සටහන් තබා ගැනීම යන කටයුතු වලදී සියලු අවශ්‍ය කාර්යපටිපාටි අනුගමනය කෙරෙන බවට සමාගම් ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වගබලා ගනී. උපායමාර්ගික සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව හා යහපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් කාලයක් කැප කරන බවට වගබලා ගනු පිණිස විශේෂ අවධානය යොමු කෙරේ.

වර්ෂය තුළදී, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 24 ක් හා උපකමිටු රැස්වීම් 41 ක් පවත්වනු ලැබිය.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා වූ ක්‍රියාවලිය

කාලසටහන සැකසීම

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා උපකමිටු රැස්වීම් සඳහා දින වකවානු නියම කෙරෙන අතර, වාර්ෂික කාලසටහනක් හරහා අධ්‍යක්ෂවරුන්ට දැනුම් දීම කෙරේ.

න්‍යාය පත්‍ර සැකසීම

සමාගම් ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් න්‍යාය පත්‍රය සකස් කර සභාපතිගේ අනුමැතිය ලබා ගනියි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡාව සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට නිදහස තිබේ. අභ්‍යන්තර/බාහිර ප්‍රවණතාවන් ගෙන් පැන නඟින කාරණා න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සැකසීම හා සංසරණය

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා පිළියෙළ කොට, සාකච්ඡාවට ගැනීමට නියමිත කාරණා පිළිබඳව සමාලෝචනය කිරීමට හා අවශ්‍ය නම් අතිරේක පැහැදිලි කර ගැනීම් සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන බවට වගබලා ගනිමින් විද්‍යුත් මාධ්‍ය ඔස්සේ අධ්‍යක්ෂවරුන් අතර සංසරණය කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා කාර්යසාධන යාවත්කාලීනයන්, පාලන කාරණා, ණය හා උපකමිටු වෙතින් ලැබෙන අවදානම් වාර්තා ඇතුළත් නිර්දේශ වැනි සාකච්ඡා අංග ඇතුළත් වේ. කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ආරාධනා ලබන අතර අවශ්‍ය විට අවශ්‍ය පරිදි ඔවුහු අතිරේක පැහැදිලි කිරීම් සපයති.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පසු

සමාගම් ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කාර්ය සටහන් (රැස්වීමෙහි ලුහුඬු වාර්තාව) සකස් කර රැස්වීම පැවැත්වූ දින සිට දින 10 ක් ඇතුළත එය විද්‍යුත් මාධ්‍යයෙන් අධ්‍යක්ෂවරුන් අතර සංසරණය කරයි. රැස්වීම් දිනට පසු දිනම එහි කෙටුම්පත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම අතර සංසරණය කෙරේ. එම කාර්ය සටහන් අනුමත කෙරෙනුයේ පසුව එළඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදීය. නොවිසඳී ඇති කාරණා සම්බන්ධයෙන් අඛණ්ඩව විමර්ශණය කර වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම්වල සහභාගීත්වය

	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් (24)	විගණන කමිටු රැස්වීම් (9)	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් (4)	නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටු රැස්වීම් (11)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් (8)	තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද කමිටු රැස්වීම් (9)
කාංචන රත්වත්තේ මහතා						
සභාපති	24/24	–	–	–	–	–
ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා						
නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ	24/24	9/9	4/4	10/11	8/8	–
ජී හර්ෂ විජේවර්ධන මහතා						
විධායක-නොවන අධ්‍යක්ෂ	24/24	9/9	–	7/11	7/8	9/9
ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා						
විධායක-නොවන අධ්‍යක්ෂ[3]	24/24	9/9	4/4	11/11	1/1	9/9
මේජර් ජෙනරල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි මහතා, වී.සේ.වී.						
විධායක-නොවන අධ්‍යක්ෂ[2]	23/24	9/9	4/4	4/4	0/1	2/2
ජයම්පති මොල්ලිගොඩ මහතා						
විධායක-නොවන අධ්‍යක්ෂ[1]	2/2	8/9	–	2/2	1/1	1/1

1. 2022 ජනවාරි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය.
2. තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද කමිටුවට 2022 ඔක්තෝබර් 05 දින සිට, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට 2022 ඔක්තෝබර් 19 දින සිට හා නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවට 2022 ජූලි 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලදී.
3. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සහභාගි වූයේ ආරාධනය අනුවය.

සමාගම් ලේකම්

සමාගම් ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් බැංකුවේ ආයතනික යහපාලන රාමුව තුළ මුඛ්‍ය කාර්යභාරයක් ඉටු කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යපටිපාටීන් අදාළ නීති රීති හා රෙගුලාසිවලට අනුකූල වන බවට වගබලා ගනී. ලේකම් නිතිපතා මතුවෙමින් එන විශිෂ්ටතම පිළිවෙත්, නියාමන වෙනස්කම් හා පාර්ශ්වකාර අභිලාෂයන් සැලකිල්ලට ගනිමින් යහපාලන රාමුව සමාලෝචනය කරයි. සියලු අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් ලබා ගැනීමේ ප්‍රවිෂ්ටය තිබේ.

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස සේවය සලසන අතර, බැංකු පනත හා එහි අදාළ සංශෝධනයන්හි අවශ්‍යතාවන්ට අනුකූලව පත්කරනු ලැබ සිටී.

අභිමාතර්ථ

බැංකුවේ යහපාලන රාමුව මඟින් අධ්‍යක්ෂවරුන්ගේ හා කළමනාකාරිත්වයේ ක්‍රියාකලාපය බැංකුවේ දීර්ඝ කාලීන පරමාර්ථය, සංස්ථායික සාරධර්ම හා චර්යාධර්ම සංග්‍රහය සමඟ දිශාගත වන බවට වගබලා ගැනේ. සිය රාජකාරී ඉෂ්ට කිරීමෙහිලා අවංකභාවය, විනිවිදභාවය හා වගවීම ප්‍රදර්ශනය කිරීම හා එමඟින් බැංකුවේ ඉහළම මට්ටමේ චර්යාධර්ම ප්‍රමිතීන් ස්ථාපිත කිරීම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙතින් අපේක්ෂා කෙරේ. ලංකා බැංකුවේ අභිමතාර්ථ සඳහා සාමූහිකව ජවය ලබා දෙන එහි දැක්ම, මෙහෙවර හා සාරධර්ම පිටු අංක 3 හි දැක්වේ.

2022 වර්ෂයේ ක්‍රියාකාරකම්

1. පාර්ශ්වකාර අභිලාෂයන් සමතුලිත කිරීම මඟින් බහු-පාර්ශ්වකාර අගය නිර්මාණය කෙරෙහි අවධානය යොමු කිරීම
2. අවංකභාවය හා විනිවිදභාවය සහිත සංස්කෘතියක්ද ඇතුළුව ඉහළ මට්ටමෙහි උචිතම විලාසය ඇති කිරීම
3. ණය අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම
4. යහපාලන රාමුව ශක්තිමත් කිරීම
5. 2023-2025 ආයතනික සැලැස්ම සහ 2023 වර්ෂය සඳහා ආයතනික අයවැය අනුමත කිරීම
6. බැංකුවේ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සමාලෝචනය කිරීම

බැංකුවේ ආයතනික සාරධර්ම හා උපායමාර්ගික අරමුණු සමඟ දිශාගතව බැංකුව විසින් ගන්නා ලද වැඩිදුර ක්‍රියාමාර්ග පිටු අංක 65 සිට 77 දක්වා වූ ව්‍යාපාරික අංශ සමාලෝචන තුළ හා පිටු අංක 78 සිට 118 දක්වා වූ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ තුළ දක්වා ඇත.

සාරධර්ම-පාදක සංස්කෘතිය

අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළම මට්ටමෙන් ආචාරධර්ම ප්‍රමිතීන් ස්ථාපිත කරන අතර, බැංකුවේ ආයතනික සාරධර්ම මත පදනම්ව ආචාරධර්ම හා අවංකභාවය සහිත සංස්කෘතියක් පෝෂණය කිරීමේ බැංකුවේ ප්‍රයත්නයන්ට ජවය ලබා දෙයි. මෙම ප්‍රවේශය ගනුදෙනුකරුවන්ට වගකීමෙන් හා සාධාරණ ලෙස සැලකීම හා ආචාරධර්ම මූලික කර රඳවා ගනිමින් ව්‍යාපාර කටයුතු මෙහෙයවීම පිළිබඳව අවධාරණය කරයි.

අධ්‍යක්ෂවරුන් සඳහා වන ව්‍යාපාරික ආචාරධර්ම සංග්‍රහය හා සේවක ආචාරධර්ම සංග්‍රහය යන ද්විත්වය වගකීමෙන් යුතු හා ආචාර-ධර්මානුකූල චර්යාවෙන් යුතු සංස්කෘතියක් ප්‍රවර්ධනය කරනු පිණිස වූ ආදර්ශ ආකෘතිය ලෙස කටයුතු කරන අතර එයට බැංකුව සතු විස්ල් බ්ලෝවිං ප්‍රතිපත්තියේ හා දූෂණ විරෝධී ක්‍රියාමාර්ගයේ ආධාරය ලැබේ.

ආයතනික යහපාලනය

චර්යා හා ආචාරධර්ම සංග්‍රහය

අධ්‍යක්ෂවරුන්ගේ ආචාරධර්ම සංග්‍රහය

අධ්‍යක්ෂ මණ්ඩලය චර්යා හා ආචාරධර්ම සංග්‍රහය මගින් බැඳෙන අතර එම සංග්‍රහයේ විධිවිධාන පිළිපැදි බවට වාර්ෂික තහවුරු කිරීමක් ලබා දිය යුතුය. මෙම සංග්‍රහය අවංකභාවයේ, විනිවිදභාවයේ හා දූෂණ මර්ධනයේ ශක්තිමත් සංස්කෘතියක් රෝපණය කිරීමට ඉලක්ක කරන අතර බැංකුවේ උපරිම යහපත සැලසෙන ආකාරයෙන් ක්‍රියා කිරීමට අධ්‍යක්ෂවරුන් දිරිගන්වයි.

සේවක ආචාරධර්ම සංග්‍රහය

සියලුම සේවකයින්ට අදාළ වන මෙය බාහිර හා අභ්‍යන්තර පාර්ශ්වකරුවන්, චර්යාව, අල්ලස හා දූෂණය පිළිබඳව කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ බැංකුවේ අපේක්ෂණයන් දක්වයි.

විස්ල් බ්ලෝවිං ප්‍රතිපත්තිය

"විස්ල් බ්ලෝවිං ප්‍රතිපත්තිය" අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එම ප්‍රතිපත්තිය සොරකම/වංචාව, දූෂණය, බැංකුවේ වත්කම් අවභාවිතය හෝ ආචාර සම්පන්න නොවන හෝ නීති විරෝධී යැයි සැලකෙන අන් කවර හෝ ක්‍රියා පිළිබඳව පැමිණිලි කිරීමට සේවකයින් හෝ සේවකයින් නොවන අය දිරිගන්වයි. පැමිණිලි ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කෙරෙන අතර එම නිලධාරියා විසින් ඒ පිළිබඳ කටයුතු අධීක්ෂණය කෙරේ. එනමුත් නියෝජ්‍ය මහා කළමනාකාර ශ්‍රේණියේ හෝ එයට ඉහළ ශ්‍රේණියක තනතුරු දරන්නන්ට එදිරිව කෙරෙන පැමිණිලි විගණන කමිටුවේ සභාපති වෙත ඉදිරිපත් කෙරේ.

දූෂණ මර්ධනය

මෙම බැංකුව අල්ලස හා දූෂණය මුළු මනින්ම පිටු දැකීමේ ප්‍රවේශයක් අනුගමනය කරන අතර, එය ක්‍රියාත්මක වන කවර ව්‍යාපාරික ගනුදෙනු හා සබඳතාවලදී වුවද වෘත්තීයවේදී, සාධාරණ හා අවංක ලෙස කටයුතු කිරීමටත්, අල්ලස පිටුදකිනු පිණිස සඵලදායී පද්ධති ක්‍රියාත්මක හා බලාත්මක කිරීමටත් ඇපකැප වී සිටී. දූෂණය හා අල්ලස පිටුදැකීම සම්බන්ධයෙන් වූ බැංකුවේ ප්‍රතිපත්තිය සේවක බඳවා ගැනීම් සමඟ ක්‍රියාවට නැංවෙන හඳුන්වාදීමේ වැඩසටහන් වලදී සියළු සේවකයින් වෙත නිරවුල්ව සන්නිවේදනය කෙරෙන අතර, එය නිතිපතා පුහුණු හා දැනුවත් කිරීමේ සැසිවලදී තවත් සවිමත් කෙරේ.

වගකීමෙන් යුතු සංස්ථායික පුරවැසිත්වය

බැංකුවේ බලපෑම හා වගකීමෙන් යුතු ආයතනික පුරවැසියෙක් වශයෙන් වූ එහි කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලබන්නේ මෙය බැංකුවේ ක්‍රියාත්මක වීමේ සුජාතභාවය හා සාමාජීය බලපත්‍රය කෙරෙහි සෘජුවම බලපාන බැවිනි. තිරසාරභාවය කරා වූ ලංකා බැංකුවේ ප්‍රවේශය "තිරසාරභාවය ජීවන ශෛලියකි" යන විශ්වාසය මත කේන්ද්‍රගතව ඇති අතර, එහිදී ආර්ථික, පාරිසරික හා සාමාජීය තිරසාරභාවය පිළිබඳ මුඛ්‍ය අංශ තුන මත අවධානය යොමු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය තිරසාරභාවයට අදාළ සියලු කාරණා පිළිබඳව අධීක්ෂණය සපයන අතර, මහා කළමනාකරු ප්‍රධානත්වය දරන "තිරසාර කමිටුව" අදාළ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරයි.

43 සිට 46 දක්වා පිටු තුළ දැක්වෙන "මෙහෙයුම් සන්දර්භය", 55 සිට 59 දක්වා පිටු තුළ විස්තරාත්මකව දැක්වෙන "තිරසාරබවට අනුගතව" සහ 78 සිට 118 දක්වා පිටු තුළ විස්තර කර ඇති පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ යන ත්‍රිත්වය එක්ව වගකීමෙන් යුතු සංස්ථායික පුරවැසියෙක් වශයෙන් ලංකා බැංකුවේ ක්‍රියාමාර්ග පිළිබඳව විස්තීර්ණ දසුනක් සපයයි.

මුදල් විශුද්ධිකරණ මර්ධනය (AML) හා ත්‍රස්තවාදයට මූල්‍ය සම්පාදනය පිටුදැකීම (CTF)

අනුකූල නොවන අවස්ථා

දණ්ඩන දිනය	ගෙවීම් දිනය	දණ්ඩන වර්ගය	ආශ්‍රිත රෙගුලාසිය/නීතිය	දණ්ඩනයට හේතුව	වටිනාකම ශ්‍රී ලංකා රුපියල්
2022 ඔක්තෝබර් 13	2022 නොවැම්බර් 14	පරිපාලන	2012 අංක 1 දරණ චක්සත් ජාතීන්ගේ රෙගුලාසියේ 5 ඡේදය සහ නිසි බලධාරීන් වන රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 1853/25 දරන 2014.05.22 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය	ඉහත රෙගුලාසිය අනුව ගනුදෙනුකරුවකු හඳුනා ගැනීමට අසමත් වීම	මිලියන 3 යි (3,000,000)

සමාලෝචිත වර්ෂය තුළ ඉහත දක්වා ඇති පාඩුව හැර වංචා, ඇතුළාන්ත ගනුදෙනු, සාංගමික එකඟත්ව, තරඟකාරිත්ව විරෝධී චර්යා, වෙළඳපළ හැසිරවීම, අයථා ක්‍රියා හෝ වෙනත් මූල්‍ය කර්මාන්තය ආශ්‍රිත නීති හා රෙගුලාසි හා සම්බන්ධ නීති පටිපාටිවල ප්‍රතිඵලයක් වශයෙන් පැන නඟින වෙනත් මූල්‍ය හානි නොතිබුණි.

ආයතනික වාර්තාකරණය

නිකුත් කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු සියලු බාහිර වාර්තාවන්හි නිරවද්‍යතාව හා අවංකභාවය පිළිබඳව වග බලා ගැනීමේ අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි.

- **වාර්ෂික වාර්තාව:** බැංකුව සිය පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම උත්පාදනය කරන ආකාරය පිළිබඳව අපක්ෂග්‍රාහී සංක්ෂේපයක් පිරිනමන, පාර්ශ්වකරුවන් වෙත ඉදිරිපත් කෙරෙන මූලික ප්‍රකාශනයයි.
- **වාර්ෂික මූල්‍ය ප්‍රකාශ:** සමූහයේ සම්පූර්ණ විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශ හා ඒ හා යාව ඇති සටහන් අඩංගු වේ.

පාර්ශ්වකාර සබඳතා

බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය, විවෘත හා කල්පවත්නා සබඳතා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව, අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමග සඵලදායී සන්නිවේදනය පවත්වා ගෙන යාම සඳහා වූ මාර්ගෝපදේශකයක් ලෙස සේවය සලසයි. මෙම ප්‍රතිපත්තිය එක් එක් කොටස්කරුවා කෙරෙහි වූ වටිනාකම් යෝජනාව විග්‍රහ කරයි. මේ සම්බන්ධයෙන් වූ බැංකුවේ කාර්යසාධනය 78 සිට 118 දක්වා වූ පිටු තුළ "පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ" යන කොටසේ විස්තර කර තිබේ.

ගනුදෙනුකරුවන් සඳහා: විශ්වාසය හා ස්ථාවරභාවය විසින් ශක්තිමත් කරන ලද, සුවපහසු මාර්ග ඔස්සේ පිරිනමනු ලබන නිෂ්පාදන

සේවකයින් සඳහා: ප්‍රතිලාභ සහිත හා හිතකාමී පරිසරයක් තුළ වෘත්තීය හා නිපුණතා සංවර්ධනය සඳහා ඉඩප්‍රස්ථා

කොටස් හිමියන් සහ අරමුදල් සම්පාදකයින් සඳහා: දරනු ලබන අවදානම්වලට සෘජුව තිරසාර ප්‍රතිලාභ උත්පාදනය

ප්‍රජාව සහ පරිසරය සඳහා: ජාතික සමාජ-ආර්ථික සංවර්ධනය, මූල්‍ය අන්තර්කරණය, සහ දේශීය හා ගෝලීය පාරිසරික අභියෝග ජය ගැනීම සඳහා දායකත්වය

ව්‍යාපාරික හවුල්කරුවන් සඳහා: අන්‍යෝන්‍ය වර්ධනය සඳහා ඉඩප්‍රස්ථා නිර්මාණය කිරීම

නියාමකයින් සඳහා: අදාළ නියාමන හා ව්‍යවස්ථාපිත නියමයන්ට පූර්ණ ලෙස අනුකූල වන බව සහතික වීම

කාර්යසාධනය

බැංකුව සිය අධ්‍යක්ෂ මණ්ඩලයේ, එහි උපකමිටුවල සහ බැංකුවේ සමස්ත ආයතනික යහපාලන පිළිවෙතෙහි සඵලදායීත්වය අඛණ්ඩව තක්සේරු කිරීම හා මැනීම දිරිගන්වයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය නිරීක්ෂණය කිරීම

බැංකුව සිය අධ්‍යක්ෂ මණ්ඩලයේ සඵලදායීත්වය මනිනු පිණිස බාහිර සම්පත් මූලාශ්‍රයක් සමග සම්බන්ධීකරණයෙන් යුතුව සංවර්ධනය කරන ලද, ව්‍යුහගත ස්වයං ඇගයීම් යාන්ත්‍රණයක් උපයෝගී කර ගනී. සෑම අධ්‍යක්ෂවරයෙක්ම කාර්යසාධන ඇගයීම් පත්‍රයක් සම්පූර්ණ කිරීමට බැඳී සිටින අතර ඉන් පසු එය ඒකාබද්ධ කොට නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. එයට අතිරේකව උපකමිටුද සන්සන්දනය කළ හැකි තක්සේරුවක් සිදු කරති.

පාරිශ්‍රමික සමාලෝචනය

ඉහළ කාර්යසාධක කණ්ඩායමක් හා විශිෂ්ටත්වයේ සංස්කෘතියක් ගොඩනැගීමේ ප්‍රයත්නයෙහි කොටසක් වශයෙන්, පාරිශ්‍රමිකය සාධාරණ හා තරගකාරී වනවා මෙන්ම දිරිදීමනා හා වෙනත් ක්‍රියාමාර්ග ආකාරයෙන් කාර්යසාධනය සමග බැඳී ඇති බවට බැංකුව සහතික වෙයි.

පාරිශ්‍රමිකය කරා වූ ප්‍රවේශය

ලංකා බැංකුවේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය නිර්මාණය වී ඇත්තේ බැංකුවේ උපායමාර්ගික අරමුණු ප්‍රගමණය කිරීම සඳහා සහ බැංකුව හා එහි පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කිරීම සඳහා සේවයින්ට අවශ්‍ය සම්පත්, පිළිගැනීම, හානි පූරණය හා ප්‍රබෝධනය ලබා දෙනු පිණිසය. දීර්ඝ කාලීන තිරසාර කාර්යසාධනය දිරිගන්වනු පිණිස මෙම ප්‍රතිපත්තිය ඔවුන්ට ඉදිරිපත් කරනු ලබන ප්‍රතිලාභ පොදිය තුළ සාධාරණත්වය හා තරගකාරිත්වය අවධාරණය කෙරේ.

බැංකුවේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය තරගකාරිත්වයේ, සර්ව සාධාරණත්වය, විනිවිදභාවය හා අන්තර්කරණය පිළිබඳ මූලධර්ම අනුගමනය කරයි.

පාරිශ්‍රමික ව්‍යුහයන්

ශ්‍රී ලංකා රජයේ චක්‍රලේඛ හා නියමයන්ට මෙන්ම බැංකු ආඥාපනත හා එහි සංශෝධනවලට අනුකූල වන "අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය" අනුව අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය නිශ්චය කෙරේ. කිසිදු අධ්‍යක්ෂවරයෙක් තමාගේ පාරිශ්‍රමිකය නියම කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන්නේ නැත.

මහා කළමනාකාරතුමාගේ (GM) හා ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) සඳහා වූ පාරිශ්‍රමික පදනම් වී ඇත්තේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වූ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මත ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (HR&RC) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය ආඥාපනත හා එහි සංශෝධන මගින් නියම කර ඇති පරිද්දෙන්, අවසාන අනුමැතිය සඳහා සිය ප්‍රතිචාර අදාළ අමාත්‍යවරයා වෙත ලබා දෙයි. මහා කළමනාකරුගේ (GM) හා ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) සඳහා වූ පාරිශ්‍රමික සෑම අවුරුදු තුනකට වරක් සමාලෝචනය කෙරේ.

බැංකුවේ පාරිශ්‍රමික ව්‍යුහය පහත සඳහන් අත්‍යවශ්‍ය සංරචකයන් හා සම්බන්ධ වේ:

ස්ථිර පාරිශ්‍රමිකය: කාර්යභාරය හා සේවක ශ්‍රේණිය අනුව නිශ්චය කරනු ලබන මූලික වැටුප හා වෙනත් ස්ථාවර සංරචකයන්

විචල්‍ය පාරිශ්‍රමිකය: දිරිගැන්වීමේ ප්‍රසාද දීමනාව

වෙනත් මුදල් නොවන ප්‍රතිලාභ: සේවා-නියුක්තියෙන් පසු ප්‍රතිලාභ, විශේෂ යෝජනාක්‍රම යටතේ ණය මුදල්, ණයවර පත් හෙවත් ක්‍රෙඩිට් කාඩ්පත් ආදිය

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය පිළිබඳ විස්තර සඳහා 208 පිටුව හා ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස් සඳහා වූ පාරිශ්‍රමිකය 389 පිටුව බලන්න. එයට අමතරව, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (HR & RC) පිළිබඳ වාර්තාව 134 පිටුව තුළ සඳහන් වේ.

මහා කළමණාකාරතුමා (GM) හා ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) පිළිබඳ ඇගැයීම

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ (HR & RC) සහාය ඇතිව, අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථායික සැලැස්මෙහි මූල්‍ය හා මූල්‍ය-නොවන අරමුණු හා කාර්යසාධන දර්ශකවලට සාපේක්ෂව මහා කළමනාකාරතුමාගේ (GM) හා ප්‍රධාන කළමනාකරණ පිරිස්වල (KMP) කාර්යසාධනය පිළිබඳව වාර්ෂික තක්සේරුවක් සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අපේක්ෂණයන් පිළිබඳව නිරවුල් අවබෝධයක් සහතික කරනු පිණිස තක්සේරුව සඳහා වූ නිර්ණායක මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) සමග ඒකාබද්ධව වර්ෂය මුලදී නිශ්චය කරනු ලැබේ. මෙම ඇගැයීමේදී ව්‍යාපාරික පරිසරයේ වෙනස් වන ස්වභාවය හා ඇගයීමට භාජනය වන තැනැත්තා වෙතින් ලබා ගන්නා ලද ප්‍රතිචාර සැලකිල්ලට ගනු ලැබේ.

7 අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

විගණන කමිටු වාර්තාව

2022 වසර තුළ කමිටුවේ සංයුතිය

(1) **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා**
සභාපති/ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

(2) **පී හර්ෂ විජයවර්ධන මහතා***
සාමාජික/ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

(3) **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
සාමාජික/නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂ

(4) **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී ඒ චන්ද්‍රසිරි වී.එස්.වී.**
සාමාජික/ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

* 2023 ජනවාරි 13 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉල්ලා අස්විය.

අඛණ්ඩව සහභාගිවන්නන්

- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ප්‍රධාන අවදානම් නිලධාරී
- සහකාර මහා කළමනාකරු (මෙහෙයුම් විගණන)
- සහකාර මහා කළමනාකරු (ණය විගණන)
- සහකාර මහා කළමනාකරු (විමර්ශන)
- සහකාර මහා කළමනාකරු (තොරතුරු පද්ධති විගණන)
- අභ්‍යන්තර විගණක
- විගණකාධිපතිගේ නියෝජිතයන් (බැංකුවේ බාහිර විගණක)

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුරද දරණ ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙස ද ක්‍රියා කරයි.

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- මහා කළමනාකරු
- ප්‍රධාන මූල්‍ය නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්)
- නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා)
- ආයතනික හෝ විධායක කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු හෝ සේවක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු

2022 වසරේ දී පැවැත්වූ රැස්වීම් වාර ගණන: නවයයි.

(සාමාජික සහභාගිත්වය මෙම වාර්තාවේ පිටු අංක 127 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන් දෙදෙනකු හෝ සාමාජිකයන්ගෙන් බහුතරය යන දෙකෙන් වැඩි අගය

කමිටුවේ කාර්යභාරය

විගණන කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන විගණන කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත විගණන කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ "ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය" සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග වල අවශ්‍යතා සහ ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ප්‍රධානතම අවධානය

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන හා විෂයානුබද්ධ සමාලෝචනයක් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කාර්යයන් ඉටු කරලීම සඳහා සහය දැක්වීම කෙරෙහි විගණන කමිටුව මූලිකව සිය අවධානය යොමු කර ඇත.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

විගණන කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරේ. එහිදී සියලු ප්‍රධාන කරුණු, ගන්නා ලද ක්‍රියාමාර්ග, අත්පත් කර ගත් හෝ අත්පත් කරගැනීමට ඇති ප්‍රතිඵල සහ පසුවිපරම් ක්‍රියාමාර්ග පැහැදිලි කර ගැනීම සඳහා සාකච්ඡා කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2022 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

මූල්‍ය වාර්තාකරණය

- බැංකුවේ මාසික, කාර්තුමය, හා වාර්ෂිකව විගණනය නොකළ/කළ මූල්‍ය ප්‍රකාශන සුපරීක්ෂණ හා නියාමන බලධාරීන් විසින් පනවන ලද අවශ්‍යතා හා අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා අනුරූප වන පරිදි පිළියෙල කොට හා ප්‍රසිද්ධ කොට තිබෙන බව තහවුරු කරනු පිණිස මෙම ප්‍රකාශන සමාලෝචනය කරන ලදී.
- ද්‍රවශීලතා කළමනාකරණය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ විදේශ මුදල් කළමනාකරණය සමාලෝචනය කරන ලදී.

නියාමන අනුකූලතාවය

- අනිවාර්ය බැංකු කටයුතු හා අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ වූ අනුකූලතාවය සමාලෝචනය කරන ලදී.
- නියාමකයින් විසින් පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණයන්ගෙන් හඳුනාගන්නා ලද කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග වල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

අභ්‍යන්තර පාලනය

- අභ්‍යන්තර පාලන අනුකෘතිය මඟින් 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග වල 3 (8) (ii) (ආ) කොටසට අනුකූලව බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මකතාවය සහ සඵලත්වය සමාලෝචනය කරන ලදී.
- නිරන්තරව සහ අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය හේතු විශ්ලේෂණ මත පද්ධති, පටිපාටි සහ අභ්‍යන්තර පාලන විධිවිධාන වල ශක්තිමත්භාවය ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන ක්‍රියාමාර්ග වල ස්වාධීනත්වය, වාස්තවිකත්වය සහ කාර්යසාධනය සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ වර්තමාන සන්දර්භයට ව්‍යුහය ගැලපීම අරමුණු කරගනිමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය සමාලෝචනය කර සංශෝධනය කරන ලදී. ඒ අනුව නව වෘත්තීය කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට නිර්දේශ කර ඇත.
- බැංකුවේ ණය කළඹේ ගුණාත්මකභාවය ඇගයීම සහ ණය ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මූලපිරීම් නිර්දේශ කිරීම.
- අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කරමින් සැලසුම ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය වසර පුරාම සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර පාලනයේ අධීක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ මුල්පිරීම්හි ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝගවලට අනුව අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ සහ විගණන කමිටු ප්‍රඥප්තියේ අනුකූලතාවය අධීක්ෂණය කරන ලදී.
- පරිපාලිත ආයතනවල අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.
- අපේක්ෂිත ණය අලාභ ආකෘති, සයිබර් ආරක්ෂාව, පරිත්‍යාගශීලීන්ගේ නියෝජිත ආයතන අරමුදල් ලෙස ලබාදී ඇති ණය පිළිබඳව විශේෂ සමාලෝචනයක් සිදු කරන ලදී.

බාහිර විගණනය

- රටේ ව්‍යවස්ථාව අනුව බාහිර විගණනය කරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසිනි. ඵලදායී ලෙස හා ස්වාධීනව බාහිර විගණන කටයුතු කරගෙන යන බවටත් විගණන ප්‍රවේශය හා ක්‍රියා පිළිවෙත අනුව විගණකාධිපතිගේ නියෝජිතයන් සමඟ අබණ්ඩව සම්බන්ධතාවක් පවත්වා ගෙන යන බවටත් කමිටුව සහතික වේ.
- විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් සමඟ "සංවෘත සාකච්ඡා" පැවැත්විණි.

ඉදිරි දැක්ම

වසර 2022 හා ඉන් ඔබ්බට අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමට ධනාත්මක සහ ඵලදායී අභ්‍යන්තර පාලන පරිසරයක් ඇති කිරීමට විගණන කමිටුව කැප වේ.

විගණන කමිටුව වෙනුවෙන්,

ඒ සී මනිල්ක ප්‍රනාන්දු
සභාපති
විගණන කමිටුව

2023 පෙබරවාරි 24

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

2022 වසර තුළ කමිටුවේ සංයුතිය

2022 වසර තුළ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

(1) **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
සභාපති/නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂ

(2) **පී හර්ෂ විජයවර්ධන මහතා**
සාමාජික/ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

(3) **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී ඒ චන්ද්‍රසිරි වී.එස්.වී.**
සාමාජික/ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ – 2022 ඔක්තෝබර් 19 සිට

(4) **ජයම්පති මොල්ලිගොඩ මහතා**
සාමාජික/ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - 2021 මාර්තු 04 සිට 2022 ජනවාරි 31 දක්වා

(පී හර්ෂ විජයවර්ධන මහතා 2023 ජනවාරි 13 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය. ලාංකා බැංකුවේ සභාපති රොනල්ඩ් පෙරේරා මහතා 2023 ජනවාරි 31 දින සිට බලපැවැත්වෙන පරිදි කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත්විය.)

2021 වසරේ දී පැවැත්වූ රැස්වීම් වාර ගණන: අටයි.

(සාමාජික සහභාගිත්වය මෙම වාර්තාවේ පිටු අංක 127 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන් දෙදෙනකු හෝ සාමාජිකයන්ගෙන් බහුතරය යන දෙකෙන් වැඩි අගය

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුරද දරණ ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙස ද ක්‍රියා කරයි.

අඛණ්ඩව සහභාගිවන්නන්

- මහා කළමනාකරු
- ප්‍රධාන මූල්‍ය නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා)

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- ආයතනික හෝ විධායක කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු හෝ සේවක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු

කමිටුවේ කාර්යභාරය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග වල අවශ්‍යතා සහ ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ප්‍රධානතම අවධානය

අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණයේ සියලුම අංශයන් සඳහා සිය සුපරීක්ෂක වගකීම් ඉටු කරන්නට සහය වීමට කමිටුව ප්‍රධාන ලෙසම වග බලා ගනී. මේ පිළිබඳව කටයුතු කරද්දී කමිටුව ණය වෙළෙඳපොළ, ද්‍රවශීලතා මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචනය කරන්නේ උචිත අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු අනුසාරයෙනි.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2022 වර්ෂය තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

ද්‍රවශීලතාවය

- බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා උපරිම ප්‍රමුකතාවය ලබා දුන් අතර ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳ වාර්තා පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී. අභියෝගාත්මක ආර්ථික තත්ත්වයකදී බැංකුව ස්ථාවරව පැවතීම සහතික කිරීම සඳහා සාම්ප්‍රදායික නොවන උපායමාර්ග, විශේෂ කණ්ඩායම් සහ කාර්යන් නිර්දේශ කරන ලදී.
- බැංකුවේ විදේශ මුදල් වල ද්‍රවශීලතාවයේ හිඟය මධ්‍යයේ, ණයවර ලිපි ඉල්ලා සිටින ගනුදෙනුකරුවන්ට එය ලබා දීම සඳහා රීති මත පදනම් වූ පද්ධතියක් එනම් විශේෂ කමිටුවක් ස්ථාපනය කරන ලදී. මෙම කාර්යය පාලනය කිරීම සඳහා ප්‍රධාන අවධානම් නිලධාරීගේ ප්‍රධානයෙන් යුතු කළමනාකරණ කමිටුවක් ස්ථාපනය කරන ලදී.
- ජාතික අවශ්‍යතා මත රාජ්‍ය ව්‍යවසාය ආයතන වලින් කරන ලද ඉල්ලීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරන ලදී. බැංකුවේ ස්ථායිතාවය ආරක්ෂා කරමින් ඔවුන් සමඟ ව්‍යාපාරයට ඉඩ සැලසීමේ යෝග්‍යතාවය සහ ශක්‍යතාවය තක්සේරු කිරීම සඳහා කමිටුව හරහා අඛණ්ඩව පසු විපරම් සිදු කරන ලදී.

වත්කම්වල ගුණාත්මකභාවය

රට මුහුණ දෙන ලද අභියෝගාත්මක ආර්ථික තත්ත්වය හමුවේ ණය ගුණාත්මකබව පිරහීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමට සමාලෝචිත වර්ෂය තුළ සිදුවිය. වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ සාකච්ඡා බහුවිධ විය. දැඩි අධීක්ෂණයක් සහ නිරන්තර වාර්තාකරණයක් සහිත ණය ගුණාත්මක ඒකකය හරහා ණය ගුණාත්මකභාවය අධීක්ෂණය කරන අතරම, වැඩිවන ක්‍රියාකාරී නොවන අත්තිකාරම් සීමා කිරීම සඳහා පුළුල් සැලැස්මක් සකස් කරන ලදී. ණය ගුණාත්මකභාවය පිරහීම වැළැක්වීමේ අරමුණින් අඩු ක්‍රියාකාරී කොටස් සහ ගනුදෙනුකරුවන් පුනර්ජීවනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

අනුකූලතාවය

ශාඛා ජාලයේ මෙන්ම අංශවල අවධාරණය කර ඇති අනුකූලතා අවදානම් ගැටළු තක්සේරු කර ඒවා අවම කිරීම සඳහා සුදුසු උපායමාර්ග යෝජනා කරන ලදී. පරිපාලිත සමාගම්වල අනුකූලතා අවදානම නිරන්තර වාර්තා මගින් අධීක්ෂණය කරන ලද අතර සුදුසු උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට වලංගු කරන ලදී.

නියාමකයාට අවශ්‍ය නියාමන වාර්තාකරණ වේදිකාව වන goAML ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කමිටුව අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී.

විනිමය හුවමාරු සමාගම් සහ විදේශ රටවල නියෝජිත සබඳතා වල AML/CFT අවදානම තක්සේරු කිරීම සඳහා විස්තීරණ අවදානම් අනුකෘතියක් අනුගමනය කිරීම නිර්දේශ කර ඇත.

පරිපාලිත සමාගම්වල අවදානම් පැතිකඩ තහවුරු කර ගැනීම සඳහා පුළුල් අවදානම් සමාලෝචන සිදු කරන ලද අතර ඒවා බැංකුවේ අවදානම් විධානය අනුව පවතින බව සහතික කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) සහ ප්‍රතිසාධන සැලැස්ම

ස්ථම්භ II අවදානම් සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටමක් පවත්වා ගැනීමට සහ බැංකුවේ ආතතිය පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේදී ඉස්මතු වූ අනපේක්ෂිත නමුත් පිළිගත හැකි සිදුවීම් වලට ඔරොත්තු දීමේ අරමුණින් ලංකා බැංකු සමූහයේ ICAAP සමාලෝචනය කර නිර්දේශ කරන ලදී.

සම්පූර්ණ පරාසයක විශ්වසනීය ප්‍රතිසාධන විකල්ප සමඟ නියාමකයාගේ උපදෙස් අනුව සකස් කරන ලද බැංකුවේ ප්‍රතිසාධන සැලැස්මේ පළමු ඉදිරිපත් කිරීම නිර්දේශ කරන ලදී. අනතුරු ඇඟවීම් සහ ප්‍රේරක සිදුවීම් පිළිබඳ පසු විපරම් කළමනාකරණය විසින් ගන්නා ලද ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සමඟ විස්තරාත්මකව සාකච්ඡා කරන ලදී.

ESMS මූල පිරිමි – බැංකුවේ පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තිය සහ පාරිසරික සහ සමාජීය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ ව්‍යාපාරික ඒකක වෙත නිකුත් කරන ලද විස්තීරණ මාර්ගෝපදේශ මාලාවක් සම්මත කර ඇත.

තොරතුරු ආරක්ෂාව/තොරතුරු තාක්ෂණ අවදානම – ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව බැංකු අත්දැකීමක් ලබාදීමට සමගාමීව ඩිජිටල් වේදිකාවල සේවා වලට බාධා කිරීම් ඉහළ ප්‍රමුඛතාවයක් ලෙස සලකනු ලැබීය. තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු තාක්ෂණයෙන් මතුවන අවදානම් අවම කිරීම සඳහා පවතින පාලනයන් සමඟ සාකච්ඡා කරන ලදී.

අවදානම් සීමාවන් – අවදානම් අංශය විසින් ඉදිරිපත් කරන ලද අවදානම් වාර්තා හරහා බැංකුවේ අවදානම් අභිරුචිය අනුමත කරන ලද කමිටුව වෙත ව්‍යතිරේක අඛණ්ඩව අධීක්ෂණය කිරීම. බැංකුවේ ස්ථාපිත කර ඇති සීමා කළමණාකරණ රාමුවේ ව්‍යතිරේක, ඒවායේ යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් යෝජනා කරන ලද ක්‍රියාමාර්ග සමඟ දැඩි ලෙස නිරීක්ෂණය කරන ලදී.

ප්‍රතිපත්ති සහ කළමනාකරණ මට්ටමේ කමිටු – විදේශ ශාඛා ප්‍රතිපත්ති ඇතුළුව අවදානමට අදාළ සියලුම ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ව්‍යාපාරික හෝ නියාමනයට අදාළ වෙනස්කම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී. විශේෂිත අවදානම් හෝ අවදානම් සමහර පැති සම්බන්ධයෙන් කටයුතු කරන සියලුම කළමනාකරණ කමිටුවල යොමු වූ නියමයන් සමාලෝචනය කර සංශෝධනය කරන ලදී. බැංකුවේ සියලුම කළමනාකරණ කමිටුවල කාර්යක්ෂමතාවය ඇගයීමට ලක් කොරුණේ, එක් එක් කමිටුවේ විධිවිධානයට අනුව ඒවා රැඳී සිටීම සහ එහි කාර්යයන් ඉටු කිරීම සහතික කිරීම සඳහා අදාළ අරමුණට එරෙහිව ය.

කාර්යසාධනය ඇගයීම

ප්‍රධාන අවදානම් නිලධාරී සහ නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා) ගේ කාර්යසාධන ඇගයීම් සිදු කරන ලදී.

සාමාජිකයින් විසින් කමිටුවේ කාර්යසාධනය සාමූහිකව ඇගයීමට ලක් කරන ලදී.


සමාප්තිය

කමිටුවට යහපාලනය සඳහා සෘජු සහ පැහැදිලි සම්බන්ධයක් ඇත. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කර ඇත්තේ අවදානම් ගැනීම සඳහා අවදානම් ගැනීමට වඩා දැනුවත් සහ ගණනය කළ අවදානම් ගනිමින් ඉදිරියට යාමේ තර්ජන ඇතිවීමේ සම්භාවිතාව අවම කිරීම සඳහා ය.

තාක්ෂණ අභිවර්ධනයන් ගොඩනැගීම, සාර්ව ආර්ථික කම්පන මෙන්ම නිතර වෙනස් වන තත්ත්වයන් නිසා ද වංචා හා සයිබර් අපරාධ බැංකු ක්ෂේත්‍රය පුරාම විශාල තර්ජනයක් වීමට පටන් ගැනීම හේතුවෙන් විමසිලිමත් වීමටත් යෝග්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීමටත් අවශ්‍ය බව කමිටුවේ අවබෝධය වේ.

කාර්ය මණ්ඩලය අතර අවදානම් කළමනාකරණය, අනුකූලතාවය සහතික කිරීම පිළිබඳව දැනුවත්භාවය සහ සේවක මණ්ඩල පුහුණුව මෙම ප්‍රවේශයේ වැදගත් අංගයන් වේ. බැංකුව සිය පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමට අවදානම් කළමනාකරණ අභියෝගයන්ට සහ අනුකූලතාවයන්ට අනුව නිවැරදි මාවතක ගමන් කරන බව කමිටුවේ දැක්ම වේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙනුවෙන්,



ආර් එම් ප්‍රියන්ත රත්නායක
සභාපති
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2023 පෙබරවාරි 24

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

2022 වසර තුළ කමිටුවේ සංයුතිය

පහත දැක්වෙන අධ්‍යක්ෂවරු 2022 වසර තුළ කමිටුවේ සාමාජිකත්වය දරණ ලදී.

(1) **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා**
සභාපති/ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

(2) **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
සාමාජික/නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂ

(3) **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.එස්.වී.**
සාමාජික/ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙසද ක්‍රියා කරයි.

2022 වසරේදී පැවැත්වූ රැස්වීම් වාර ගණන: හතරයි

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 127 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන් දෙදෙනෙකු

ආරාධනයෙන් පමණක් සහභාගි වන්නන්

- මහා කළමනාකරු
- නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්)
- ආයතනික හෝ විධායක කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු

කමිටුවේ කාර්යභාරය

කමිටුවේ විෂය පථය හා ප්‍රධාන වගකීම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ශ්‍රී ලංකාව තුළ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ නියාමනයන් මත මූලික වශයෙන් පදනම් වී ඇති අතර එය පහත පරිදි වේ:

- බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සම්බන්ධයෙන් වූ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) නිගමනය කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අරමුණු හා ඉලක්ක නියම කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ලබාදුන් අරමුණු හා ඉලක්ක වල කාර්යසාධනය කාල පදනමක් මත ඇගැයීම හා කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා තුළ පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා අනිකුත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම නිශ්චය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවට යොමු කළ කාර්ය මණ්ඩලයට අදාළ කරුණු සමාලෝචනය.
- බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය හා සංවිධාන ව්‍යුහය නිශ්චය කිරීම.

ප්‍රධානතම අවධානය

මූලිකව ප්‍රධාන කළමනාකරණ පිරිස් ඇගැයීම පිළිබඳව මානව සම්පත් සම්බන්ධ ගැටළු විසඳීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට උපකාරී වීම පිළිබඳව මෙම කමිටුව අවධානය යොමු කරයි.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර කමිටුවේ නිර්දේශයන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2022 වර්ෂය තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂවරුන්ගේ වේතන

ඉහත සඳහන් 2007 අංක 11 දරණ බැංකු ආඥා පනතේ නියෝග අනුව, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මෙම කමිටුව විසින් නිශ්චය කළ යුතුය. කෙසේ වුවත් ලංකා බැංකුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කෙරෙනු ලබන්නේ, එහි එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ හා උපදෙස් අනුව යමිනි.

මෙහිදී 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා ඊට කළ සංශෝධනයන් ද සැළකිල්ලට ගනු ලැබේ. ඉහත දැක්වෙන පදනමින් පිළියෙළ කළ, රජය විසින් නව රෙගුලාසි නිකුත් කරන විට අවශ්‍ය වන පරිදි සංශෝධනය කරනු ලබන පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත. අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමික පිළිබඳ විස්තර, වාර්ෂික වාර්තාව තුළින්, වාර්ෂික පදනමකින් අනාවරණය කෙරේ.

ප්‍රධාන කළමනාකරණ පිරිස් හි වේතන

සේවක මණ්ඩලයේ පාරිශ්‍රමික, ලංකා බැංකුවේ කටයුතු විෂය පථය යටතට ගැනෙන අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව වසර තුනකට වරක් ප්‍රතිශෝධනය කරනු ලැබේ.

2022 වර්ෂයේදී වැටුප් සංශෝධනයක් සිදු නොවූ අතර ඒ අනුව 2022 දී ප්‍රධාන කළමනාකරණ පිරිස් හි වේතන පිළිබඳව කමිටුව සාකච්ඡා කළේ නැත.

ඉලක්ක සහ අරමුණු

කමිටුව 2022 වසර සඳහා ආයතනික කළමනාකාරිත්වය හා මහා කළමනාකරුගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) සමාලෝචනය කොට නිර්දේශ කළේය.

කාර්යසාධන ඇගයීම

2022 න් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රධාන කළමනාකරණ පිරිසේ කාර්යසාධන වාර්තා (අදාළ උපකමිටු වලට ඉදිරිපත් කරන ලද නියෝජ්‍ය මහා කළමනාකරු (අනුකූලතා), ප්‍රධාන අවදානම් නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධන වාර්තා හැර) ආයතනික සැලැස්මට අනුකූලව වර්ෂය ආරම්භයේ නියමකර ඇති ඉලක්ක මත පදනම්ව කමිටුව විසින් ඇගැයීමට ලක් කරන ලදී.

සේවක සංවර්ධනය

සේවක මණ්ඩලය තුළ අවශ්‍ය නිපුනතා, දැනුම හා ආකල්ප සංවර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම මත පසු විපරම් කටයුතු කළේය.

සංවිධාන ව්‍යුහය

පරමාදර්ශී ව්‍යුහයක් කරා ක්‍රමානුකූලව ගමන් කිරීමේ කොටසක් ලෙස බැංකුව සඳහා නව සංවිධාන ව්‍යුහයක් සලකා බලා නිර්දේශ කරන ලදී.

සමාලෝචනය කරන ලද ප්‍රතිපත්ති/ප්‍රඥප්ති

පහත දැක්වෙන ප්‍රතිපත්ති/ප්‍රඥප්ති භාවිතයට ගැනීම නිර්දේශ කළේය.

- සමාලෝචනය කළ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ප්‍රඥප්තිය.
- සංශෝධන කළ බැංකුවේ විනය නීති සංග්‍රහය.
- සංශෝධන කළ බැංකුවේ ආචාරධර්ම සංග්‍රහය.
- සහකාර මහා කළමනාකරු හා නියෝජ්‍ය මහා කළමනාකාර ශ්‍රේණි සඳහා උසස්වීම් වලදී විශේෂ ප්‍රශංසා සඳහා ලකුණු ලබා දීම හා අසතුටුදායක නිරීක්ෂණ/දඬුවම් සඳහා ලකුණු කපා හැරීමේ පිළිවෙත සංශෝධනය කරනු ලැබිය.
- අභ්‍යාසලාභී/පරිවාස සේවකයන් විසින් පරිවාස/අභ්‍යාසලාභී කාලසීමාව තුළ ලබාගත් ප්‍රසුත නිවාඩු පිළිබඳ ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය කරනු ලැබීය.

ඉදිරි දැක්ම

කමිටු සාමාජිකයන් විසින්, කමිටුවේ කාර්යසාධනය සාමූහිකව ඇගැයීමට ලක් කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

කමිටුව බැංකුව තුළ ප්‍රශස්ත මානව සම්පත් පරිචයන් භාවිතය දිරිගැන්වීම උදෙසා තවදුරටත් කටයුතු කරනු ඇත.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙනුවෙන්.

ඒ සී මනිල්ක ප්‍රනාන්දු
සභාපති,
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2023 පෙබරවාරි 24

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු වාර්තාව

2022 වසර තුළ කමිටුවේ සංයුතිය

පහත දැක්වෙන අධ්‍යක්ෂවරු 2022 වසර තුළ කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

(1) ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා
සභාපති/ස්වාධීන, විධායක නොවන
(2022 පෙබරවාරි 01 දින සිට සභාපති, ඊට පෙර සාමාජික)

(2) ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
සාමාජික/විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

(3) ජී හර්ෂ විජයවර්ධන මහතා
සාමාජික/ස්වාධීන, විධායක නොවන
අධ්‍යක්ෂ

2022 ජූලි 07 සිට

(1) මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.එස්.වී.
සභාපති/ස්වාධීන, විධායක නොවන
අධ්‍යක්ෂ

(2) ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා
සාමාජික/ස්වාධීන, විධායක නොවන
අධ්‍යක්ෂ

(3) ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
සාමාජික/විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

(4) ජී හර්ෂ විජයවර්ධන මහතා
සාමාජික/ස්වාධීන, විධායක නොවන
අධ්‍යක්ෂ (2023 ජනවාරි 13 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.)

2022 ජනවාරි 31 දින දක්වා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කළ ජයම්පති මොල්ලිගොඩ මහතා ඒ දක්වා කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන ලදී.

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙස ද ක්‍රියා කරයි.

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- මහා කළමනාකරු
- කමිටුවේ අභිමතය පරිදි කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකු

2022 වසරේ දී පැවැත්වූ රැස්වීම් වාර ගණන: එකොළහයි

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 127 හි දක්වා ඇත.)

ගණපූර්ණය: සාමාජිකයන් දෙදෙනෙකු

කමිටුවේ කාර්යභාරය

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනත හා සංශෝධන වලට අදාළ නියෝග වල අවශ්‍යතාවය හා ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය වීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ හොඳම පරිචය පිළිබඳ සංග්‍රහය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ප්‍රධානතම අවධානය

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුව නීතියෙන් නියමකර ඇති ආයතනික යහපාලන මූලධර්මයන්ට අනුකූල බවට සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වන අතරම මහා කළමනාකරු/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන ආයතනික කළමනාකාරිත්වයේ පිරිස් පත් කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2022 වර්ෂය තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ප්‍රතිපත්තිය

ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත් කළ එහි පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතු වන බැවින් අධ්‍යක්ෂවරුන් පත් කිරීම රාජ්‍ය බැංකු අධීක්ෂණය හා අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධන වල විධිවිධාන වලට අනුව සිදු කරනු ලබයි. එම නිසා අධ්‍යක්ෂවරුන් පත් කිරීමට නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව සම්බන්ධ නොවේ. කෙසේ වෙතත් ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ දී ඉහළ මට්ටමේ නිපුණතා ඇති, වගකීම් හෙබවිය හැකි අධ්‍යක්ෂවරු පත් කිරීමට සැලකිලිමත් වනු ලබන අභ්‍යන්තර ප්‍රතිපත්තියක් අනුමත කර ඇත.

- ලංකා බැංකුවේ පරිපාලිත සමාගම් සඳහා අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලදී.

ආයතනික යහපාලනය

- ස්ථාපනය කරන ලද ආයතනික යහපාලන ප්‍රතිපත්තිය සහ පහත සඳහන් ප්‍රතිපත්ති සංශෝධනය කර සමාලෝචනය කරන ලදී.
  - බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය.
  - අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා ප්‍රවේශය පිළිබඳ ප්‍රතිපත්තිය.
  - නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටුවේ ප්‍රඥප්තිය.
  - ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ප්‍රතිපත්තිය.
  - අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රඥප්තිය.
  - අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු ප්‍රඥප්තිය.
  - සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල වේතන ප්‍රතිපත්තිය.
  - අධ්‍යක්ෂවරුන් සඳහා වූ ව්‍යාපාර ආචාරධර්ම සහ හැසිරවීමේ සංග්‍රහය
  - අධ්‍යක්ෂවරුන්ගේ මැදිහත්වීම් පිළිබඳව අවධානය යොමු කෙරෙන ප්‍රතිපත්තිය.
  - පරිපාලිත කළමනාකරණ ප්‍රඥප්තිය.
  - පරිපාලිත සමාගම් සඳහා අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ප්‍රතිපත්තිය.
  - විසිල් බ්ලෝවින් ප්‍රතිපත්තිය.
  - ලංකා බැංකුවේ මහා කළමනාකරු තෝරාගැනීමේ නිර්නායක
- අදාළ ආයතනික යහපාලන රෙගුලාසි හා අනුකූලතාවය සහතික කෙරුණි.
- 2022 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීම් වාර්තාව නිර්දේශ කරන ලදී.

නිසි හා යෝග්‍යතාව

- නිලධාරීන් ප්‍රධාන කළමනාකාරීත්ව කණ්ඩායමට පත් කළ හෝ උසස් කළ විට ඔවුන් එම තනතුරු දැරීමට නිසි හා යෝග්‍ය පුද්ගලයින් බවට සහතික කරන ලදී.

අනුප්‍රාප්තික විධිවිධාන

- කුසලතා වර්ධනයේ අනිවාර්ය අංගයක් වන සංශෝධිත අනුප්‍රාප්තික සැලැස්ම නිර්දේශ කරන ලදී. හදිසි ආවරණය, මධ්‍ය කාලීන (අවුරුදු 1-3) සහ දිගු කාලීන (අවුරුදු 3-5) ලෙස හඳුනා ගනිමින් සකස් කරන ලද සියලුම ප්‍රධාන කළමනාකරණ භූමිකාවන් සඳහා කුසලතා ඉදිරි දැක්ම සමාලෝචනය කරන ලදී. මහා කළමනාකරුගේ අනුප්‍රාප්තිකයා හඳුනාගැනීමට කමිටුව ක්‍රියාමාර්ග ගෙන තිබුණි.
- ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයන්ගේ ශ්‍රේණියට පහළ අනුප්‍රාප්තික සැළසුම් පිළිවෙත් සකස් කිරීමේහිදී කෘතිම බුද්ධි මෙවලම් භාවිතා කරමින් පසු විපරම් කෙරුණි.
- 2022 වර්ෂයේ මිනිස් බල සැලැස්ම සමාලෝචනය කරන ලදී.
- ප්‍රධාන කළමනාකාරීත්ව කණ්ඩායමට නායකත්ව සංවර්ධනය සඳහා පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම.
- කළමනාකාරීත්වය විසින් නිර්දේශ කරන ලද පරිදි, ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින්ගේ නව තනතුරු නාම හඳුන්වාදීම හා ස්ථාන මාරු සමාලෝචනය කොට නිර්දේශ කෙරුණි.
- ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකරුවකු තෝරා ගැනීමේ නිර්ණායක හඳුන්වා දුණි.

ඉදිරි දැක්ම

නියාමකයින් විසින් නිකුත් කරනු ලබන උපදෙස් ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින්, කමිටුව ලංකා බැංකුව තුළ ප්‍රශස්ත යහපාලන පරිචයන් පවත්වා ගෙන යාමට උපරිමයෙන් කටයුතු කරනු ඇත.

සමාප්තිය

සාමූහිකව සිදු කරන ලද වාර්ෂික ඇගැයීම තුළින් කමිටුව සිය කාර්යයේ කාර්යක්ෂමතාව සමාලෝචනය කළේය. මෙම කමිටුවේ කාර්යයන් තුළින් කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වලට තවදුරටත් වටිනාකමක් එක්කරනු ඇත.

නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව වෙනුවෙන්



මේජර් ජෙනරාල් (විශ්‍රාමික)
ජී ඒ චන්ද්‍රසිරි වී.එස්.වී.
සභාපති
නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව

2023 පෙබරවාරි 24

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව

2022 වසර තුළ කමිටුවේ සංයුතිය

පහත දැක්වෙන අධ්‍යක්ෂවරු 2022 වසර තුළ කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

(1) **පී හර්ෂ විජයවර්ධන මහතා**
සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2023 ජනවාරි 13 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස්විය.)

(2) **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා**
සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

(3) **ජයම්පති මොල්ලිගොඩ මහතා**
සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2022 ජනවාරි 31 දින සිට බලපැවැත්වෙන පරිදි ධූරයෙන් ඉල්ලා අස්විය.)

වර්තමානයේ කමිටුව පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

(1) **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා**
සභාපති/විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

(2) **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා**
සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

(3) **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි වී.එස්.වී.**
සාමාජික/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

කමිටුවේ ලේකම්

නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහා කළමනාකාරිණී තනතුර ද දරණ ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙසද ක්‍රියා කරයි.

2022 වසරේදී පැවැත් වූ රැස්වීම් වාර ගණන: නවයයි

(සාමාජික සහභාගීත්වය මෙම වාර්තාවේ පිටු අංක 127 හි දක්වා ඇත.)

ගණපූරණය: සාමාජිකයන් දෙදෙනෙකු

අඛණ්ඩව සහභාගිවන්නන්

- මහා කළමනාකරු
- ප්‍රධාන තොරතුරු නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන)
- ප්‍රධාන අවදානම් නිලධාරී

ආරාධනයෙන් පමණක් සහභාගී වන්නන්

- තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ සහකාර මහා කළමනාකරුවන්
- සහකාර මහා කළමනාකරු (නිමැවුම් සංවර්ධන කටයුතු සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ)
- කමිටුවේ අභිමතය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ, ආයතනික කළමනාකාරිත්වයේ හෝ කාර්ය මණ්ඩලයේ වෙනත් ඕනෑම සාමාජිකයෙකු

කමිටුවේ කාර්යභාරය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ විෂය පථය සකස් කර ඇත.

ප්‍රධානතම අවධානයි

කමිටුවේ මුලික අරමුණ වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ වගකීම ඉටු කිරීම සඳහා බැංකුවේ තොරතුරු තාක්ෂණ නිෂ්පාදන හා සේවා, ප්‍රතිපත්තීන් සහ භාවිතයන් සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා තොරතුරු තාක්ෂණ නිෂ්පාදන සහ ප්‍රධාන තාක්ෂණික ආයෝජනයන්හි ක්‍රියාකාරිත්වය ඵලදායීව පවත්වා ගැනීමට සහය වීමයි. එමඟින් බැංකුවේ යටිතල පහසුකම් සහ හැකියාවන් ශක්තිමත් ලෙස සෑම විටම ස්ථානගත කොට ඇති බවටත් නව තාක්ෂණික ප්‍රවණතා විශ්ලේෂණය කොට බැංකුවේ ආයතනික සැලැස්මට අනුගත වෙමින් හා ඉහළම ක්‍රියාපිළිවෙත් ඔස්සේ පවත්වා ගෙන යන බවටත් සහතික කරයි.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු රැස්වීම් වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ.

2022 වසර තුළ අවධානය යොමු කළ අංශ සහ ක්‍රියාකාරකම්

සංවර්ධන අධීක්ෂණය

- විදේශීය ශාඛාවන් වන මාලදිවයින, චෙන්නායි සහ සීෂේල්ස් බැංකුවේ ක්‍රියාත්මක තොරතුරු තාක්ෂණ වර්ධනයන්/තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ව්‍යාපෘති පසු විපරම් කොට යෝජිත වර්ධනයන්/ඉහළ නැංවීම මත මඟ පෙන්වීම.
- බැංකුවේ පවත්නා තීරණාත්මක භාවිතයන්ගේ මෙහෙයුම් විපරම්කොට, පවත්නා ගැටළු නිරාකරණය/ සමථය කිරීම පිළිබඳ අත්‍යවශ්‍ය මඟපෙන්වීම සම්පාදනය.
- බැංකුවේ යෝජිත ඩිජිටල් බැංකුකරණ විසඳුම (අන්තර්ජාල හා ජංගම බැංකුකරණ පද්ධතිය, බී ඇප්) හි ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබීය.
- බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ නව්‍යකරණය විවරණය කරන ලදී.
- ආයතනික සැලැස්ම තුළ ග්‍රහණය කරන ලද බැංකුවේ ඩිජිටල් ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා කරන ලදී.
- බැංකුව සඳහා ඩිජිටල් අත්සන් වේදිකාව ආරම්භ කිරීම.
- යෝජිත ජීව දත්ත පදනම් කරගත් හඳුනාගැනීමේ විසඳුම් විවරණය කරන ලදී.

මානව සම්පත්

- තොරතුරු තාක්ෂණ අංශය සඳහා අවශ්‍ය මානව සම්පත් සැපයුමට සහය වන ලදී.
- නව ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී බඳවා ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කරන ලදී.

ප්‍රතිපත්ති

- පහත සඳහන් දේ නිර්දේශ කරන ලදී
  - මාලදිවයින් ශාඛාවේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය
  - මාලදිවයින් ශාඛාවේ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය
  - සීෂෙල්ස් ශාඛාවේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය
  - කමිටු ප්‍රඥප්තිය සමාලෝචන කරන ලදී.

ඉදිරි දැක්ම


බැංකුවේ තාක්ෂණික වැඩසටහන් බැංකුවේ ව්‍යාපාරික අරමුණු සහ උපායමාර්ග සඳහා සහය වන බව සහතික කිරීමට සහ සුදුසු දත්ත ආරක්ෂාව සැපයීමට කමිටුව උත්සාහ කරනු ඇත.

සමාප්තිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ සාමාජිකයින් 2022 වර්ෂය තුළ කමිටුවේ කාර්යසාධනය, ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාව ඇගැයීමට ලක් කර ඇත.

2022 වර්ෂයේ දී කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ ජී. හර්ෂ විජයවර්ධන මහතා මෙම කමිටුවට ලබාදුන් විශිෂ්ඨ දායකත්වය වෙනුවෙන් කමිටුවේ ප්‍රණාමය පිරිනමනු ලැබේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව වෙනුවෙන්



ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
සභාපති
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

2023 පෙබරවාරි 24

7 අවදානම් කළමනාකරණය


2022 වර්ෂය තුළ ගෝලීය වශයෙන් ඇති වූ අඛණ්ඩ භූ-දේශපාලනික කැළඹීම් හා ජාතික මට්ටමේ බහුවිධ අර්බුද මධ්‍යයේ, ශ්‍රී ලංකාව අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන්ට මුහුණ පාන ලදී. රාජ්‍ය බැංකුවක් ලෙස සිය කාර්යභාරයට ගරු කරමින් මෙරට මූල්‍ය අංශයේ විශාලතම බැංකුව වශයෙන් සිය බලපෑමක් ඇති කළ හැකි තත්ත්වය ප්‍රයෝජනයට ගෙන ඉහළ නැගි රාජ්‍ය මූල්‍ය, විදේශ හා මූල්‍ය ක්ෂේත්‍ර අතර අසමතුලිතතාවන්ට ප්‍රතිචාර දැක්වීමෙහිලා ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියට උර දීම ලංකා බැංකුවේ ප්‍රමුඛතාව විය.

අර්බුදකාරී මෙහෙයුම් පරිසරය ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි සැලකිය යුතු අවිනිශ්චිතතාවක් ඒල්ල කල අතර එමගින් බැංකුව සම්බන්ධයෙන් අවදානම් කිහිපයක් පැන නැඟිණි. කෝවිඩ්-19 වසංගතයේ බලපෑම් 2022 වර්ෂයේද යම් තරමකට පැවති අතරම, ප්‍රධාන අභියෝග වෙනත් ක්ෂේත්‍ර වෙතින් පැමිණුනි. පොළී අනුපාතික ක්‍රමානුකූලව වැඩි වීම අතර මූලිකම දේ වූ අතර, එය මෙම අංශය මත විශාල බලපෑම් ඇති කළේය. 2022 පළමු කාර්තුව තුළ විනිමය අනුපාතිකය පාවෙන්නට සැලැස්වීම මගින් වර්ෂය තුළ ද්‍රවශීලතාව හා විදේශ විනිමය පිළිබඳ සැලකිය යුතු ගැටළු ඇතුළත් විය. නියාමන අධිකාරිය විසින් වසර පුරා නිරීක්ෂණ අඛණ්ඩව පවත්වා ගෙන ගියේය.

මෙම පරිසරය තුළ රටෙහි ආර්ථික මූලිකාංගවලට හා මූල්‍ය පද්ධතියට උරදීමෙහිලා හා ඒවා ස්ථායීකරණය කිරීමෙහිලා ලංකා බැංකුවෙහි කාර්යභාරය අතිශයින්ම වැදගත් විය. නියාමනීය අනුපාත උල්ලංඝණය කිරීමෙන් හා නියාමක විසින් ඉඩ සලසන ලද ස්වාරක්ෂකයන් ඌණනය කිරීමෙන් තොරව මෙම දුෂ්කර කාලපරිච්ඡේදය කළමනාකරණය කිරීමෙහිලා බැංකුව සාර්ථක විය. සමාලෝචිත වර්ෂය සාර්ථක ලෙස සමාප්ත වූයේ අතිරේක සීමාවන් අන්තර්ග්‍රහණය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය නියාමන අගයන්ට අනුගතව පවත්වා ගෙන යාම හා පෙර ප්‍රමාද වූ හෝ විලම්බනය වූ ගෙවීම් පියවීමද සමගිනි.


පහත අංශ මගින් බැංකුවේ ජාතික වගකීම පවත්වා ගෙන යමින් හා අවදානම් කළමනාකරණයේ විශිෂ්ටතම පරිචයන් ක්‍රියාවේ යොදවමින් ප්‍රත්‍යාස්ථතාව හා ස්ථාවරභාවය සහතික කරනු පිණිස අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයට ප්‍රතිචාර දැක්වීමෙහිලා ලංකා බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරිත්වය විසින් ඉෂ්ට කරන ලද තීරණාත්මක කාර්යභාරය සාකච්ඡා කෙරේ.

2022 වර්ෂය තුළ අවදානම් සන්දර්භය




මුඛ්‍ය කාර්යසාධන දර්ශක

ශුද්ධ පොළී ආදායම ශුද්ධ පොළී ආන්තිකය



ද්‍රවශීලතාව



ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය



	බාහිර මෙහෙයුම් පරිසරය	අවදානම් සාධකය	ලංකා බැංකුවේ ප්‍රතිචාරය
මූල්‍ය අවදානම්	ගෝලීය භූ-දේශපාලනික සහ ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ-දේශපාලනික අර්බුද මගින් අස්ථාවර හා පීඩනකාරී ආර්ථික පරිසරයක් සඳහා පසුබිම සකස් කරන ලදී.	ද්‍රවශීලතා අවදානම විදේශ මුදල්/දේශීය මුදල්	වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුවට (ALCO) අමතරව, බැංකුව සමීප නිරීක්ෂණය හා අනලස් අධීක්ෂණය මගින් ද්‍රවශීලතාව මැනීමේ නව ක්‍රම ඇති කර තිබෙන අතර ඒවා බැංකුවේ මූල්‍ය තත්ත්වය සුරක්ෂිත කිරීමට දායක වී තිබේ. ප්‍රතිපාර්ශ්ව හා රටවල් පාදක කරගත් සීමාවන් යලි සලකා බලා ප්‍රතිශෝධනය කරන අතරේ විදේශ මුදල් පිටතට ප්‍රවාහය වීම් පරීක්ෂා කිරීමට විශේෂ කමිටුවක් ස්ථාපිත කරන ලදී.
	2022 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ ස්වෛරී ශ්‍රේණිය පහළ දැමීම හේතුවෙන් බැංකුවේ ශ්‍රේණිගත කිරීමද පහත හෙළන ලදී.	ණය සහන කාලයන් දීර්ඝ කිරීම ණය වර්ධනය කළමනාකරණය කිරීම පරිහානියට යමින් පැවති වත්කම්හි ගුණාත්මකතාව හා ඉහළ යමින් පැවති හානිකරන ප්‍රතිපාදන	බලපෑමට හසු වූ කර්මාන්ත හා ක්ෂේත්‍රවල නොනැසී පැවැත්මට හා පුනර්ජීවනයට උර දෙනු පිණිස ණය සහන කාලයට අමතරව, ප්‍රතිව්‍යුහගත කිරීමේ හා කාලය යලි සකස් කිරීමේ පහසුකම් ලබා දෙන ලදී. ව්‍යාපාරික හා ආර්ථික පරිසරයේ අබණ්ඩව පැවති අභියෝගයන්ට ප්‍රතිචාර වශයෙන්, බැංකුව ගනුදෙනුකරුවන් වෙත උපායමාර්ගික ආධාර සැපයීය. ආර්ථිකයට උපකාර කිරීම පැවරී ඇති රාජ්‍ය බැංකුවක් වශයෙන්, 2022 වර්ෂය තුළ බැංකුවේ අවධාන යොමු වූයේ විචක්ෂණශීලී ලෙස හානිකරන ප්‍රතිපාදන යොදවන අතරම ව්‍යාපාර පුනර්ජීවනය හා ප්‍රතිස්ථාපනය කිරීම මත ය.
	ආර්ථික අර්බුදය සහ සමාජ-දේශපාලනික අස්ථාවරභාවය මූල්‍ය ක්ෂේත්‍රය ඇතුළු බොහෝ ක්ෂේත්‍ර වල සේවක පිරිවැටුම මත අහිතකර ලෙස බලපෑවේය.	ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් මත තහංචි	කාර්යසාධනය හා සේවා ගුණාත්මකතාව හීන නොකරමින් ආශ්‍රිත වියදම් නිරීක්ෂණය හා කළමනාකරණය කරනු පිණිස වියදම් කළමනාකරණ හා ව්‍යාපාරික තිරසාරතා විධායක කමිටුවක් ස්ථාපිත කරන ලදී.
	වර්ෂය තුළ මුදලේ අගය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් ශ්‍රී ලංකා රුපියල තවදුරටත් දුර්වල විය.	සේවක පිරිවැටුම	ලංකා බැංකුව මෙම තත්ත්වය සමනය කළේ අතිශය වැදගත් මෙහෙයුම් සඳහා නව සේවකයින් සොයා ගෙන ඒ අනුව සිටින කාර්ය මණ්ඩලය යළි දිශාගත කිරීම මගින්ය. වර්ෂය තුළ පැවති මානව සම්පත් අභියෝග නොතකා, ව්‍යාපාරික අවිච්ඡින්නතාවට බැංකුවෙහි ඉහළම ප්‍රමුඛත්වය දෙනු ලැබූ අතර, කිසිදු බිඳ වැටීමක් වාර්තා වූයේ නැත.
නියාමන	බහුවිධ අර්බුදයන්ට ප්‍රතිචාර වශයෙන්, රජය විසින් වඩාත් තදබල ප්‍රතිපත්ති බලාත්මක කරමින්, ආනයන මත සීමා පනවා, මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කරන ලදී.	පොළී අනුපාතික අවදානම	බැංකුව ශුද්ධ පොළී ආදායම වඩා යහපත් කරනු පිණිස රජය සතු ව්‍යවසාය සඳහාද ඇතුළුව ණය දීමේ අනුපාතික වැඩි කළේය. එමෙන්ම පොළී අනුපාතික අවදානම අවම කරනු පිණිස තීරණ ගැනීමෙහිදී මූල්‍ය පිරිවැයෙහි, වත්කම් හා බැරකම් අතර නොගැලපීමෙහි හා ඉපැයුම් අවදානමෙහි බලපෑම, සහ ඉහළ පොළී අනුපාතික දරණ නිෂ්පාදනවල බලපෑම විශ්ලේෂණයට භාජනය කොට, ශුද්ධ පොළී ආදායම පිළිබඳව පුරෝකථනය කළේය.
	නියාමන පාලක හා සම්පීඩිත තත්ත්වයන් හමුවේ ප්‍රාග්ධන වියදම් මත තහංචි පැනවීම අවශ්‍ය විය.	ප්‍රාග්ධනය මත බාධක	බැංකුව ප්‍රාග්ධන අවහිරතාවයන් මධ්‍යයේ පටු ආන්තිකයන් සමඟින් මෙහෙයුම් කළමනාකරණය කර ඇත. බැංකුව නියාමනීය අවම අනුපාතික වෙතින් මතු වූ සම්පීඩිත තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වූයේ අභ්‍යන්තර ප්‍රාග්ධනය උත්පාදනය හරහා සහ ණයකර නිකුතු හරහාය.


අවදානම් කළමනාකරණය

ව්‍යවසාය අවදානම් කළමනාකරණ (ERM) රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ රාමුව නිරවුල්ව නිර්වචනය කරන ලද යහපාලන ව්‍යුහයන්ගෙන්, ප්‍රතිපත්ති රාමුවලින් හා අවදානම් දැනුවත්භාවයේ සංස්කෘතියකින් සමන්විත වන අතර, එය ඥානාන්විත ලෙස බැංකුව බලගැන්වීම හා බැංකුව මුළුල්ලේ ඇති අවදානම් ඒකාකාර ලෙස කළමනාකරණය කිරීම සිදු කරයි.


මෙම රාමුව ස්ථායී ආකාරයකට අවදානම් හඳුනා ගැනීම, මැනීම, අවම කිරීම හා වාර්තා කිරීම පිණිස වූ විස්තීර්ණ මාර්ගෝපදේශ සපයන අතර, වඩාත් ගතික ක්‍රියාත්මක පරිසරය හමුවේ එය උචිත වන බවට සහතික වනු පිණිස එය නිතිපතා සමාලෝචනය හා ප්‍රතිශෝධනය කෙරේ.

ක්‍රියාත්මක වන පරිසරයේ සුවිශේෂී වෙනස්කම් වලට හා අභිනවයෙන් හඳුන්වා දෙන ලද අභ්‍යන්තර ක්‍රියාවලීන්ට ප්‍රතිචාර වශයෙන්, බැංකුව විසින් 2022 වර්ෂය තුළ සියලුම ප්‍රතිපත්ති සමාලෝචනය කොට යාවත්කාලීන කරන ලදී. පීඩනයට ලක්ව ඇති ක්‍රියාත්මක පරිසරයේ සංකීර්ණතාව සැලකිල්ලට ගනිමින්, බැංකුව ද්‍රවශීලතා, පොළී අනුපාතික හා පාරිසරික හා සාමාජීය අවදානම් කෙරෙහි අවධානය වැඩි කරනු පිණිස නිරීක්ෂණයේ තබා ඇති අවදානම්වල විෂය සීමාව පුළුල් කර ඇත.



අවදානම් පාලනය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීමේ හා අධීක්ෂණය කිරීමේ සමස්ත වගකීම පැවරී තිබේ.



ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනකු ඇතුළු සාමාජිකයින් හතර දෙනකුගෙන් සමන්විත ය.

කාර්ය පටිපාටි රාමුව

- අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණය සම්බන්ධ සිය අධීක්ෂණ කාර්යභාරය ඉෂ්ට කිරීමෙහිලා සහාය වීම
- පවත්නා හා අනාගත අවදානම් සෙවීම, අධීක්ෂණය හා විශ්ලේෂණය සඳහා උචිත ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි ස්ථානගතව ඇති බවට වගබලා ගැනීම
- බැංකුවෙහි අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් බැංකුවේ අවදානම් අභිරුචිය සමග අනුගතව තිබෙන බවට වගබලා ගැනීම
- උචිත අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු හරහා නිතිපතා ආවර්ථික පදනමකින් බැංකුවට ඇති සියලුම අවදානම් තක්සේරු කිරීම
- බැංකුවෙහි ණය, වෙළඳපළ, මෙහෙයුම් හා තොරතුරු සුරක්ෂිතතා අවදානම් කළමනාකරණය උදෙසා බැංකුව විසින් ක්‍රියාවේ යොදවන විවිධ මූලකෘත්‍යයන් සම්බන්ධයෙන් උපායමාර්ගික මගපෙන්වීම් ලබා දීම
- ප්‍රත්‍යාබල පරීක්ෂාවේදී පෙන්වා දෙන ලද විභව්‍ය වේදන ලක්ෂ්‍ය හඳුනා ගෙන ඒවායේ හානි අවම කරන අතරම, බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) ඔස්සේ එහි ප්‍රාග්ධන තත්ත්වය හා අනාගත අවශ්‍යතාවන් සමාලෝචනය කිරීම
- බැංකුවෙහි ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලැස්ම සමාලෝචනය කිරීම
- බැංකුව තුළ අවදානම් කළමනාකරණ සංස්කෘතිය හා දැනුවත්භාවය තවත් ශක්තිමත් කිරීම

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)

ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් ප්‍රධානත්වය දරනු ලබන අතර ස්වාධීනව ක්‍රියා කරයි. මෙම අංශයට 2022 වර්ෂය තුළ ව්‍යූහාත්මක වෙනස්කම් කිහිපයක් හඳුන්වා දෙනු ලැබීය. අවදානම් කළමනාකරණ රාමුවෙහි දැක්වෙන පරිදි මෙහෙයුම් හා වෙළඳපළ අවදානම් කළමනාකරණය කෙරෙහි මෙම අංශයේ අවධානය ශක්තිමත් කරනු පිණිස නව විධායක කළමනාකරණ තනතුරක් ඇති කරන ලදී. මෙම අංශය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඵලදායී ලෙස සිදු කෙරෙන බවට වගබලා ගනියි.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය



අවදානම් කළමනාකරණය

අවදානම් පැතිකඩ

අවදානම් ප්‍රභේදය	මුඛ්‍ය අවදානම් දර්ශකය	නියාමන අවශ්‍යතා/ ප්‍රතිපත්ති පරාමිතිය	සැබෑ තත්ත්වය 31.12.2022	සැබෑ තත්ත්වය 31.12.2021
ණය අවදානම	ශුද්ධ අදියර 3 අවධියේ ණය අනුපාතය (%)	–	**5.27**	5.08
වත්කම් ගුණාත්මකතාව	හානිකරණ ආවරණ (අදියර 3) ණය අනුපාතය (%)	–	**59.73**	49.07
සංකේන්ද්‍රණය වීම හා නිරාවරණය	ක්ෂේත්‍ර අනුව සංකේන්ද්‍රණය වීම (HHI)	–	**999**	999
	භූගෝලීයව සංකේන්ද්‍රණය වීම	–	**2,062**	1,305
වෙළඳපළ අවදානම	ශුද්ධ පොළී ආදායම (NII) (රු. බිලියන)	–	**126.35**	111.25
	ශුද්ධ පොළී ආන්තිකය (NIM) (%)	–	**3.10**	3.28
	භාණ්ඩාගාර බැඳුම්කරවල පාදක ඒකකය සඳහා මිල වටිනාකම (PVBP) (රු. '000)	–	**75,767**	869,969
ද්‍රවශීලතා අවදානම	ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය මුදල්) (%)	20	**21.22**	24.97
	ද්‍රවශීල වත්කම් අනුපාතය (විදේශීය මුදල්) (%)	20	**32.79**	25.34
	ද්‍රවශීලතා ආවරණ අනුපාතය (දේශීය මුදල්) (%)	100	**122.77**	111.45
	ශුද්ධ ස්ථාවර අරමුදල් සම්පාදන අනුපාතය (%)	100	**139.00**	124.31
	ණය-තැන්පතු අනුපාතය (%)	–	**77.58**	89.88
උපායමාර්ගික අවදානම	ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය (%)	10.00	**12.41**	14.25
	මුළු ප්‍රාග්ධන අනුපාතය (%)	14.00	**15.38**	17.77
	පොදු ස්කන්ධ ස්ථර 1 අනුපාතය (%)	8.50	**11.34**	12.91
	ස්කන්ධ මත ප්‍රතිලාභ (%)	–	**14.06**	21.03
මෙහෙයුම් අවදානම	මෙහෙයුම් අලාභය අවදානම් අභිරුචියේ ප්‍රතිශතයක් ලෙස (%)	–	**82**	63

ත්‍රිත්ව ආරක්ෂක ආකෘතිය

1වන ආරක්ෂක වළල්ල

ව්‍යාපාරික ඒකක විසින් අවදානම දැරීම හා භාර ගැනීම

පූර්ව-ක්‍රියාකාරී ලෙස අවදානම් හඳුනා ගැනීම, තක්සේරුව හා මැනීම. එමෙන්ම පළමු වළල්ල විසින් අවදානම් රුචි රාමුව, ආශ්‍රිත ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ මඟින් නියම කර ඇති සීමාවන් ඇතුළත එදිනෙදා ගනුදෙනුවල හා කළඹ මට්ටමේ අවදානම් කළමනාකරණය කෙරේ.

2වන ආරක්ෂක වළල්ල

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් අවදානම කළමනාකරණය, පාලනය හා අධීක්ෂණය කිරීම

සංවිධානය මුළුල්ලේ අවදානම් අභිරුචිය නියම කිරීම හා අවදානම් සංස්කෘතිය ස්ථාපිත කිරීම සිදු කරන අතර අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධනය කිරීම හා ක්‍රියාවේ යෙදවීම, අවදානම් ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳව පළමු ආරක්ෂක වළල්ල හා කළමනාකාරිත්වය වෙත මඟ පෙන්වීම හා උපකාර ලබා දීම සිදු කරයි.

3වන ආරක්ෂක වළල්ල

අභ්‍යන්තර විගණනය විසින් වගකීම සහතික වීම

අවදානම් කළමනාකරණයේ හා අභ්‍යන්තර පාලනවිධිවල සඵලදායිත්වය හා ප්‍රමාණාත්මකතාව පිළිබඳව ස්වාධීන හා වාස්තවික සහතික කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙයි.

අවදානම් කළමනාකරණය කෙරෙහි බැංකුවේ ප්‍රවේශය

ලංකා බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය කේන්ද්‍රගතව ඇත්තේ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා, සංවිධානමය සංස්කෘතිය හා ආයතනික යහපාලන පරිචයන් සමග දිශාගත වන රාමුවක් ඇතුළත අවදානම් කළමනාකරණය කෙරෙන බවට සහතික කරන ආයතනික අවදානම් කළමනාකරණ (ERM) රාමුවක් වටා ය.

නිරවුල්ව ව්‍යුහ කරන ලද කාර්යභාරයන්හි හා වගකීම්වල සිට මනා ලෙස නිර්වචනය කරන ලද ප්‍රතිපත්ති, කාර්යපටිපාටි හා ක්‍රියාවලීන් දක්වා වූ බැංකුවේ ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව ව්‍යාපාරික ඒකක, කර්තව්‍ය හා මෙහෙයුම් සිසාරා අවදානම් හඳුනා ගැනීම හා කළමනාකරණය සඳහා උපකාර කරයි.

වෙනස් වන හා අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයට ප්‍රතිචාර වශයෙන් බැංකුව 2022 වර්ෂය තුළ නව පද්ධති, ක්‍රියාවලීන් හා කාර්යවිධි ඉදිරිපත් කර ඇත. කෝවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර ලෙස ස්ථානගත කරන ලද දුරස්ථ කාර්ය හා නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීම වැනි නව පද්ධති අඛණ්ඩ ලෙස ඩිජිටල්කරණය හා අනුවර්තනය කර ගැනීම හමුවේ, තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

බැංකුව 2022 වර්ෂය තුළ සිය අවදානම් කළමනාකරණ කර්තව්‍යයට වෙනස්කම් ගණනාවක් ඇති කර තිබෙනුයේ මූලිකවම ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හා මූල්‍ය ක්ෂේත්‍රයේ තත්ත්වයට ප්‍රතිචාර වශයෙනි.

අනාගතය දෙස නෙත් යොමු කරමින් ලංකා බැංකුව බැංකුකරණ පද්ධතිවල හා ක්‍රියාවලීන්හි අඛණ්ඩ තාක්ෂණවේද වර්ධනයන් හා යාවත්කාලීනයන් කළමනාකරණය කිරීම පිණිස දෘඪතර තොරතුරු සුරක්ෂිතතා අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට අපේක්ෂා කරයි.

තවද, මෙම බැංකුව ජාත්‍යන්තර විශිෂ්ටතම පිළිවෙත්, මෙරටෙහි ආශ්‍රිත නෛතික ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) තිරසාර මූල්‍ය මූලපිරීම් සමග අනුගත වන බවට වගබලා ගනිමින් එහි පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධතිය අඛණ්ඩව දියුණු කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කරමින් සිටියි.
මේ සම්බන්ධයෙන් වූ ප්‍රධාන සන්ධිස්ථාන වලට ප්‍රතිපාර්ශ්ව පාරිසරික හා සාමාජීය අවදානම් තක්සේරු සහ බැංකුවෙහි පරිසර හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) ආශ්‍රිත කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් එළිදැක්වීම අදාළ වේ.

බැංකුව තොරතුරු සුරක්ෂිතතා හා තොරතුරු තාක්ෂණ (IT) අවදානම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මත සිය අවධානය පවත්වා ගෙන යන අතර තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණය සඳහා ISO 27001 ලබා ගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හා මූල්‍ය ක්ෂේත්‍රයේ ගමන් මඟ සමග පෙළ ගැසෙන බවට සහතික වනු පිණිස බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරිත්වය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

අවදානම් සංස්කෘතිය

බැංකුව මතුව එන අවදානම් වඩාත් හොඳින් හඳුනා ගැනීමට, සාකච්ඡාවට භාජනය කිරීමට, ඉහළ අවධානයට ගෙන ඒමට හා හානි අවකරණය කිරීමට පළමු ආරක්ෂක වළල්ල ලෙස ක්‍රියා කරන, බැංකුවේ ව්‍යාපාරික ඒකකයන්ට හා ක්‍රියාකාරිත්වයන්ට උපකාරී වීමේ මූලික අරමුණ ඇති ව්‍යවසාය සිසාරා විහිදුණු අවදානම් සංස්කෘතියක් පෝෂණය කරයි.

සංවිධානමය හා වෙළඳපල පිළිබඳ අවබෝධය පිළිබඳව වූ ශක්තිමත් අවධාරණය අභ්‍යන්තර පාලනවිධි, බැංකුවේ චර්යාධර්ම සංග්‍රහය හා විස්තීර්ණ ප්‍රතිපත්ති රාමුව සමග එක්ව ගමන් කරයි. ශක්තිමත් ණය සංස්කෘතිය, පාරිසරික හා සාමාජීය අවදානම් කළමනාකරණය, තොරතුරු සුරක්ෂිතතා කළමනාකරණය, වෙළඳපල හා මෙහෙයුම් අවදානම් කළමනාකරණය ඇතුළු විෂය ක්ෂේත්‍ර තුළ අඛණ්ඩ පුහුණු වැඩසටහන් පැවැත්වෙනුයේ බැංකුව පුරා විහිදුණු අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ශක්තිමත් කරනු පිණිසය. මේවා බැංකුවේ ''ත්‍රිත්ව ආරක්ෂක ආකෘතිය'' ශක්තිමත් කිරීම සඳහා සේවය සලසන අතර, එමගින් බැංකුවේ තිරසාරභාවයට හා එහි පාර්ශ්වකරුවන් සඳහා කෙටි, මැදි හා දිගු කාලීනව අගය නිර්මාණය කිරීමට දායක වෙයි.

අවදානම් අභිරුචිය

බැංකුවේ අවදානම් අභිරුචිය නිර්වචනය කර ඇත්තේ එහි උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇති හැකියාව ඇතුළත් ගැනීමට සූදානම් අවදානමේ මට්ටම ලෙසය.

එය අවදානම් විධිවිධාන වශයෙන් ප්‍රමාණාත්මකවද, ප්‍රතිපත්ති හා පාලනවිධි ලෙස ගුණාත්මකවද ප්‍රකාශනය කෙරේ. අවදානම් නිරාවරණයන් පිළිබඳ නිර්දිෂ්ට සීමාවන්ට අමතරව, අවදානම් අභිරුචි ප්‍රකාශයෙහි අවදානම් අභිරුචි පිළිබඳ සිද්ධි-කාරක ඇතුළත් වන අතර, එම සීමා ඉක්මවන/ප්‍රතික්‍රියා විදහාදක්වන අවස්ථාවන්හිදී ගත යුතු විශේෂිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගද නිර්වචනය කරයි. පහත සාධකයන්හි ඇති විචල්‍යතාවන් සැලකිල්ලට ගෙන එය වාර්ෂිකව සමාලෝචනය කෙරේ:-

- ප්‍රාග්ධන පදනම
- සාර්ව ආර්ථික වෙනස්කම් (නව තාක්ෂණය හා පාරිසරික වෙනස් වීම්, දළ දේශීය නිෂ්පාදිතය, ආර්ථික ක්ෂේත්‍ර, නියාමන හා ප්‍රතිපත්ති වෙනස් වීම්)
- රටේ හා ප්‍රතිපාර්ශ්වයන්හි අවදානම
- අපේක්ෂිත ව්‍යාපාරික වර්ධනය
- සංස්ථායික සැලැස්ම

2022 වර්ෂය තුළ ඉහත සඳහන් සාධකයන්හි විතැන්වීම්වලට ප්‍රතිචාර වශයෙන්, බැංකුව යම් ක්ෂේත්‍ර සඳහා ප්‍රතිශෝධිත සීමාවන් හඳුන්වා දී ඇත.

ප්‍රත්‍යාබල පරීක්ෂාව

නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාව මගින් බැංකුවේ ව්‍යාපාරය මත විභව්‍ය අවදානම් ඇගැයීමත්, බැංකුවේ අවදානම් අභිරුචියට සාපේක්ෂව වත්මන් හා විභව්‍ය අවදානම් පැතිකඩෙහි සංවේදීතාව තක්සේරු කිරීමත් කරයි. බැංකුවේ ප්‍රත්‍යාබල පරීක්ෂා රාමුව සිද්ධිරූපන විශ්ලේෂණය සමගින් සාර්ව-ආර්ථික හා ව්‍යාපාරික ආකෘති ප්‍රත්‍යාබල පරීක්ෂාව ඇතුළු ශිල්පක්‍රම සංකලනයක් භාවිතා කරයි.

එමෙන්ම ප්‍රත්‍යාබල පරීක්ෂාව බැංකුවේ කාර්යයන් සිසාරා වැඩිදුර අවදානම් දැනුවත්භාවයක් සඳහා දායක වන අතර, පූර්ව-ක්‍රියාකාරී කළමනාකරණය මගින් ව්‍යාපාරික අවිච්ඡින්නතාව ආරක්ෂා කිරීමට ක්‍රියා කරයි. එය අවදානම් රුචිකත්ව හා ඉඩහැරීම් සීමාවන් නියම කිරීම, අවදානම් හඳුනා ගැනීම හා පාලනය කිරීම, වෙනත් අවදානම් කළමනාකරණ මෙවලම්වලට අනුපූරක සැපයීම, සම්භව්‍යතා සැලසුම් සංවර්ධනය කිරීම යන අංශවලින් බැංකුවට සහාය වන අතර, ප්‍රාග්ධන හා ද්‍රවශීලතා සැලසුම්කරණය සහ ව්‍යාපාරික තීරණ ගැනීම වැඩිදියුණු කරයි.

අවදානම් කළමනාකරණය

ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්ති රාමුව මගින් ණය, වෙළඳපළ, මෙහෙයුම්, සංකේන්ද්‍රණ, ද්‍රවශීලතා, විදේශ විනිමය හා පොළී අනුපාතික වැනි සියලුම බැරෑරුම් අවදානම් එකිනෙකට වෙනස් ප්‍රත්‍යාබල මට්ටම් – මෘදු, මධ්‍යම හා තදබල – යටතේ ආවරණය කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලාභදායිත්වය, ද්‍රවශීලතාව හා ප්‍රාග්ධනය මත ඇති වන බලපෑම කාර්තුමය (ත්‍රෛමාසික) පදනමින් හා අවශ්‍ය වන පරිදි හා අවශ්‍ය වන විට සවලදායී තීරණ ගැනීම සඳහා ඉහළ කළමනාකාරිත්වය හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත වාර්තා කෙරේ. එමෙන්ම ප්‍රත්‍යාබල පරීක්ෂාව මගින් සත්‍යරූපී ප්‍රත්‍යාබල සිද්ධිරූපන තුළ බැංකුවේ ප්‍රත්‍යාස්ථතාව මත සුපරීක්ෂකවරුන් හා නියාමන බලධාරීන් වෙත වඩා පුළුල් දසුනක් සැපයේ.

වත්මන් ක්‍රියාත්මක පරිසරය සහ 2022 වර්ෂයේ පැවති වෙළඳපළ තත්ත්වයන් සැලකිල්ලට ගෙන, බැංකුව ද්‍රවශීලතා හා පොළී අනුපාතික අවදානම් මත විශේෂ අවධානය ලබා දෙමින් විශ්ලේෂණයේ සංඛ්‍යාතය වැඩි කිරීම හා එකිනෙකට වෙනස් සිද්ධිරූපන මාලාවක් ඇතුළත් කිරීම හරහා ප්‍රත්‍යාබල පරීක්ෂාවන් වැඩි දියුණු කළාය. බැංකුව සමස්ත ප්‍රත්‍යාබල පරීක්ෂාවන් මාලාව අතර, ඇති විය හැකි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ (දේශීය මෙන්ම විදේශීය ආයෝජන සුරැකුම් මත අඩු වන වටිනාකම වෙනුවෙන් ප්‍රතිශතයක් කපා දැමීමේ) බලපෑම, පොළී අනුපාතික ඉහළ යාම හේතුවෙන් බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකය (NIM) කෙරෙහි බලපෑම සහ ශ්‍රී ලංකා මහ බැංකු යලි මිලට ගැනීමේ කවුළුව මත සීමා පැනවීමේ (පසුව ක්‍රියාවට නැංවූ) සම්භාවිතාව පූර්ව-ක්‍රියාකාරී ලෙස හා විස්තීර්ණ ලෙස ඇගයීය. එබඳු විශ්ලේෂණයක ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන බලපෑම මිල නියම කිරීමේ යාන්ත්‍රණ යලි සලකා බැලීමේ හා ප්‍රතිශෝධනය කිරීමේ, විභව්‍ය අවදානම සඳහා ප්‍රමාණවත් ලෙස හානිකරණ ප්‍රතිපාදනය කිරීමේ සහ විකල්ප අරමුදල් සම්පාදන මාර්ග සෙවීමේ හැකියාව ඇති කරන දූරදර්ශිභාවය ලබා දෙමින්, බැංකුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරවයි.

ප්‍රාග්ධන කළමනාකරණය හා අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

රාජ්‍ය බැංකුවක් ලෙස ලංකා බැංකුව සිය ප්‍රාග්ධනය සඳහා කොටස් වෙළඳපළ වෙත පිවිසීමේ හැකියාව අතින් සීමා වී සිටින අතර එයට ප්‍රාග්ධනය වර්ධනය කර ගැනීමෙහිලා ප්‍රධාන වශයෙන් සිය අභ්‍යන්තර ලාභ උත්පාදනය මත හා රාජ්‍ය ප්‍රදානයන් මත යැපීමට සිදුවෙයි.

2022 වර්ෂයේ ආර්ථිකය පිරිහීම හේතුවෙන් රජය විසින් දෙනු ලබන නව ප්‍රදාන පිළිබඳ බාධාවන් මධ්‍යයේ, තමන්ට තිබූ ප්‍රාග්ධනය ප්‍රශස්ත ලෙස කළමනාකරණය කළ අතර, බාසල් III අනුකූල, යටත් කාලීන ස්ථර II ණයකර හරහා රු. බිලියන 6.49 ක් ඉපයීම මගින් සිය ප්‍රාග්ධන තත්ත්වය වඩාත් ශක්තිමත් කර ගැනීමට සමත් විය.

මෙම මූලකෘත්‍යයන්වල ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය රු. බිලියන 264 දක්වා රු. බිලියන 22 කින් වැඩිදියුණු විය.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකත්වය	2022 දෙසැම්බර් %	2021 දෙසැම්බර් %
ස්ථර 1	**12.41**	14.25
එකතුව	**15.38**	17.77

ස්ථම්භ II තලයේ අවශ්‍යතාවන් සමග දිශාගතව ඇති අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) බැංකුවේ ප්‍රාග්ධන අවශ්‍යතාවන් එහි අවදානම් පැතිකඩට දිශාගත කිරීම සහ එමගින් එහි උපායමාර්ගික න්‍යායපත්‍රය ඉටු කරනු පිණිස ප්‍රමාණවත් ප්‍රාග්ධනය පවත්වා ගෙන යන බවට වගබලා ගැනීම මගින් සිය ප්‍රාග්ධන ව්‍යුහය දෘඪතර ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව ඇති කරයි. ණය වෙළඳපළ හා මෙහෙයුම් අවදානම්වලට අමතරවල අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) මගින් ද්‍රවශීලතාව, පොළී අනුපාතික අවදානම, කීර්තිනාම, අනුකූලතා, උපායමාර්ගික හා තොරතුරු සුරක්ෂිතතා අවදානම් සැලකිල්ලට ගනියි. මහා කළමනාකාරතුමා ප්‍රධානත්වය දරන අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලි හා ප්‍රකෘතිකරණ සැලසුම් (ICAAP & RCP) නියමු කමිටුව මෙම සැලකිය යුතු අවදානම් තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වගකීම දරයි.

ප්‍රත්‍යාබල පරීක්ෂාව වනාහි ස්ථම්භ II හි (සුපරීක්ෂණ සමාලෝචනය) වැදගත් සංරචකයක් වන අතර එය බැංකුවේ අවදානම් පැතිකඩ විචල්‍යයන් ගණනාවකට ඇති සංවේදිතාව දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද හා අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලි නියමු කමිටුවේ සමාලෝචන මගින් ශක්තිමත් වූ ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රත්‍යාබල පරීක්ෂාව සිදු කෙරෙන බවට වගබලා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

ප්‍රකෘතිකරණ සැලැස්ම

ප්‍රකෘතිකරණ සැලැස්ම බැංකුවේ පාලන සඳහා රාමුව නියම කිරීම, තදබල නමුත් සත්‍යරූපී ප්‍රත්‍යාබල සිද්ධිරූපන මාලාවක් තුළ නොනැසී පැවතීමට ඇති විශ්වාසය තැබිය හැකි විකල්ප තේරීම් හඳුනා ගැනීම, අවදානම් පැතිකඩ දියුණු කරන හා ව්‍යාපාරික අවිච්ඡින්නතාව සහතික කරන අතරේ ද්‍රවශීලතා හා ප්‍රාග්ධන කළමනාකරණ විධිවිධාන සඳහා වූ සැලැස්ම ඇති කිරීම සිදු කරයි.

බැංකුවේ ප්‍රකෘතිකරණ සැලැස්ම (RCP) එහි:

- උපායමාර්ගික, අවදානම් කළමනාකරණ හා ව්‍යාපාරික තීරණ ගැනීමේ ක්‍රියාවලීන්
- ප්‍රාග්ධන හා අරමුදල් සම්පාදන සැලසුම්කරණය, ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රවේශයන් සහ ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලසුම්කරණය
- ප්‍රාග්ධන හා ද්‍රවශීලතා තක්සේරු
- අවදානම් දත්ත සමාහාරය හා අවදානම් වාර්තාකරණය සමග ඒකාබද්ධ වී පවතී.

ප්‍රකෘතිකරණ සැලැස්ම යටතේ ප්‍රාග්ධන, ද්‍රවශීලතා, ලාභදායීත්ව, වත්කම් ගුණාත්මකතා සහ වෙළඳපළ හා සාර්ව ආර්ථික දර්ශක මත පදනම්ව, සිද්ධි-කාරක හා කල්-ඇතිව අනතුරු ඇඟවීමේ දර්ශක නියම කෙරේ. ආයතනයට විශේෂිත ප්‍රත්‍යාබලයන්, වෙළඳපළ පුරා ඇති ප්‍රත්‍යාබලයන් හෝ ඒ දෙකෙහි සංකලනයක් වෙතින් පැන නැඟීමට ඉඩ ඇති, විමෙන්ම ප්‍රාග්ධනය, ද්‍රවශීලතා හා අන් සියලු අංග කෙරෙහි ඇති වන කම්පනයන් පිළිබඳව කටයුතු කරනු පිණිස ප්‍රකෘතිකරණ විකල්ප මාලාවක් පූර්ව-නිශ්චය කර තිබේ. නියාමන බලධාරියාගේ විධානයන්ට අනුව විශ්වාසය තැබිය හැකි ප්‍රකෘතිකරණ විකල්පයන් සහිතව පිළියෙළ කරණ ලද පළමු ප්‍රකෘතිකරණ සැලැස්ම බැංකුව 2022 වර්ෂයේදී ඉදිරිපත් කරන ලදී.

පූර්ව-නිශ්චිත සිහි කැඳවීම් හා කලින් අනතුරු ඇඟවීම් දර්ශක කට්ටලය අඛණ්ඩව නිරීක්ෂණය කිරීම මගින් යම් සිදුවීමක් සිදු වීමට පෙර ගත යුතු පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග සඳහා ඉහළ කළමනාකාරිත්වයට වාර්තා කිරීම සඳහා ඇති අවශ්‍යතාව පෙන්නුම් කෙරේ. සිද්ධි-කාරකයක් ක්‍රියාත්මක වූ අවස්ථාවක, මහා කළමනාකාරතුමා ප්‍රධානත්වය දරන ප්‍රකෘතිකරණ සැලසුම් (RCP) හා අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවල මෙහෙයුම් කම්ටුව ප්‍රකෘතිකරණ විකල්පයන් ක්‍රියා ගැන්විය යුතුය. පූර්ව-නිශ්චිත ප්‍රකෘතිකරණ විකල්පයන් ක්‍රියා ගැන්වීම මගින් මූල්‍ය තත්ත්වය යථා තත්ත්වයට පත් කොට, අහිතකර කම්පනයකට පසුව යළි යථා තත්ත්වයට පැමිණීමට බැංකුවට ඇති ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳව වෙළඳපලෙහි විශ්වාසය ගොඩනගනු ඇති අතර, එය සියලුම කොටස්කරුවන්ගේ යහපත ආරක්ෂා කෙරෙන බවට සහතික කරයි.

අවදානම් වාර්තාකරණය

සියලුම අවදානම් නිරාවරණයන් අදාළ කළමනාකරණ මට්ටමේ කම්ටු වෙත වාර්තා කරනු ලබන අතර උචිත පරිදි අධ්‍යක්ෂ මණ්ඩල කම්ටු දක්වා ඉහළට යොමු කරනු ලැබේ. අවදානම් දර්ශන සටහන් වලින් හා අවදානම් අභිරුචි දර්ශකයන්ට සාපේක්ෂව කාර්යසාධනයෙන් සමන්විත විස්තීර්ණ අවදානම් වාර්තාවක් මාසික පදනමින් සහ අවශ්‍ය අවස්ථාවේදී අවශ්‍ය වන පරිදි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කම්ටුව වෙත සපයනු ලැබේ. 2022 වර්ෂයේ අභියෝගාත්මක කාර්ය පරිසරය හමුවේ, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවදානම් වාර්තාකරණය ශක්තිමත් කරන ලද්දේ ණය, ද්‍රවශීලතා, පොළී අනුපාතික හා තොරතුරු සුරක්ෂිතතා ආශ්‍රිත අවදානම් කෙරෙහි විශේෂ අවධානය ඇතිවය.

ඉහත ඒවාට අමතරව, 2022 වර්ෂයේ නියාමන බලධාරියාගේ සුපරීක්ෂාකාරිත්වය මගින් ක්‍රියාකාරී හා සීඝ්‍ර ලෙස වෙනස් වන අවදානම් සන්දර්භයක් තුළ වඩා වැඩි වාර ගණනකින් වාර්තා කිරීම නියම කොරුණි.

2022 වර්ෂයේ අවදානම් කාර්යසාධනය

ණය අවදානම

බැංකුවේ ණය අවදානම් කළමනාකරණ රාමුව "ත්‍රිත්ව ආරක්ෂක ආකෘතිය" අනුව පාලනය කෙරෙනුයේ ණය ලබාදීම් ආරම්භ වන මොහොතේ සිටමය. සමස්ත බැංකුව සිසාරා හා අවදානම් අභිරුචිය ඔස්සේ ඒකාකාර ආකාරයකට ණය අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය, අවකරණය කිරීම හා වාර්තා කිරීම සඳහා දෘඪතර රාමුවක පිටුවහල ලැබේ.

ණය අවදානම
2022 වර්ෂය තුළ අවධානය යොමු වූ ක්ෂේත්‍ර හා ප්‍රවණතා

1 ගනුදෙනුකරුවන් වෙත අඛණ්ඩ ණය සහන

ණය පහසුකම් සඳහා සහන කාල ලබා දීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රතිලේඛනගත කිරීම සහ උචිත විට අතිරේක ණය පහසුකම් ලබා දීම මගින් සිය ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගෙන යාමට සුළු හා මධ්‍ය පරිමාණ සහ සංස්ථායික ගනුදෙනුකරුවන්ට ලබා දෙන අඛණ්ඩ ණය සහන

2 ව්‍යාපාරික පුනර්ජීවනය හා ප්‍රතිස්ථාපනය

දීර්ඝ ආර්ථික අර්බුදය මගින් දැඩි බලපෑමට ලක් වූ ව්‍යාපාරවල නොනැසී පැවැත්ම උදෙසා උපකාර කරනු පිණිස දිවයින පුරා බැංකුවේ "ව්‍යාපාරික පුනර්ජීවන හා ප්‍රතිස්ථාපන ඒකක" ව්‍යාප්ත කරන ලදී. සම්මත ප්‍රකෘතිකරණ මූලකෘත්‍යයන් ඔස්සේ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු පිණිස බැංකුව මෙම තීරණය හා ස්ථාවරය ගෙන ඇත්තේ ජාතියට හා දීර්ඝ කාලීනව ආර්ථිකයට ප්‍රතිලාභදායක ක්‍රියාමාර්ගයක් වශයෙනි.

3 ණය සහන කාලයන් ලබා දීම

නියාමන බලධාරියාගේ නිර්දේශය මත ලබාදුන් ණය සහනයන්ට අමතරව බැංකුව විසින්ම හඳුන්වාදුන් ණය සහනයන්ද ලබා දෙන ලද්දේ 2022 අග දක්වා වූ ආනයන සීමා, ආර්ථික අර්බුදය හා දේශපාලනික අස්ථාවරභාවය මගින් පීඩාවට පත් ව්‍යාපාර හා තනි පුද්ගලයින් සඳහා සහන ලබා දීමේ අරමුණෙනි.

4 නිසි කලට ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම

ව්‍යාපාරික හා නියාමන පරිසරය තුළ නව ප්‍රවණතා අන්තර්ග්‍රහණය කරනු පිණිස විස්තීර්ණ ප්‍රතිපත්ති සමාලෝචන සිදු කරන ලදී.

5 නව සාමාන්‍ය තත්ත්වය යටතේ ණය ගුණාත්මකතාව පවත්වා ගෙන යාම

අර්බුද කාලය තුළ ණය ගුණාත්මකතාව පවත්වා ගෙන යාම පිණිස හා නව සාමාන්‍ය වාතාවරණයට අනුවර්තනය වීම පිණිස හානියට පත්/අවදානමේ ඇති අංශ (අවදානම් ඉහළ ගිය කර්මාන්ත) සඳහා විශ්ලේෂණයක් සිදු කරන ලදී.

6 පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) ක්‍රියාත්මක කිරීම

ණය දීමේ කටයුතු තුළ පාරිසරික හා සාමාජීය අවදානම තක්සේරුව ක්‍රියාගැන්වීම සඳහා අවශ්‍ය කාර්යන් ක්‍රියාවේ යොදවන ලදී.

7 ණය ගුණාත්මකතාව සහතික වීම ශක්තිමත් කිරීම

ණය ගුණාත්මකතාව සහතික වීමේ ඒකකයේ විෂය පථය පුළුල් කිරීම හරහා එමගින් ණය අනුමත කිරීමෙන් පසු සමාලෝචන සිදු කරන ලදී.

අවදානම් කළමනාකරණය

ණය අවදානම් කළමනාකරණය මෙහෙයවීමෙහිලා භාවිත කරනු ලබන පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්ති රාමුව හා ක්‍රමවේදයන් පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

බැංකුවේ ණය අවදානම් නිරාවරණයන් එහි නිර්වචනය කරන ලද අවදානම් අභිරුචිය ඇතුළත පවත්වා ගැනෙන බවට වගබලා ගැනීමෙහිලා ඉහළම වගකීම දරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයට සිය අවදානම් කළමනාකරණය හා ආශ්‍රිත රාජකාරී අධීක්ෂණය කිරීමෙහිලා උපකාර කරයි. බැංකුවේ ණය අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම හා නියත පදනමකින් කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සඳහා වගකීම දරයි.

ණය කමිටුව

- ණය අවදානම් අභිරුචි සීමා සැකසීම, සමාලෝචනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- බලය ලත් සීමාවන් ඇතුළත ණය යෝජනා අනුමත/නිර්දේශ කිරීම
- බැංකුවේ අවදානම් ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ තුළ නියාමන අනුකූලතාව සහතික කිරීම
- ණය ආශ්‍රිත ප්‍රතිපත්ති නිර්දේශ කිරීම
- අවදානම් සංකේන්ද්‍රණය වීම් නිරීක්ෂණය කිරීම

ණය අවදානම් කළමනාකරණ ඒකකය

පළමු ආරක්ෂක මාර්ගය පිළිබඳව ස්වාධීන සමාලෝචනය සපයයි. බැංකුව සිසාරා ණය අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය

ණය ගුණාත්මකභාවය සහතික කිරීමේ ඒකකය

විශාල ණය නිරාවරණයන් සම්බන්ධයෙන් අනුමැතියෙන් පසු සමාලෝචනය සිදු කරයි.

පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) ඒකකය

බැංකුවට සිය ණය කළඹේ පාරිසරික හා සාමාජීය අවදානම් කෙරෙහි නිරාවරණයන් හඳුනා ගෙන, කළමනාකරණය කරයි.

ණය අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ විස්තීර්ණ 'ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය' මගින් පහත දැක්වෙන ණය-පූර්ව අනුමැති හා ණය දීමෙන් පසුව නිරීක්ෂණ යාන්ත්‍රණයන් නියම කර ඇත.

ණය-පූර්ව අනුමැතිය


- ව්‍යුහගත ණය ඇගයීම් යාන්ත්‍රණ හා නිශ්චිත ණය නිර්ණායක
- විවිධ මට්ටම්වල අනුමත කිරීමේ බලය හා ප්‍රධාන අවදානම් නිලධාරී විසින් ස්වාධීන සමාලෝචනය
- පැහැර හැරීම්, සංකේන්ද්‍රණ හා ප්‍රතිපාර්ශ්වීය වැනි ණය අවදානම් ප්‍රභේද සඳහා සීමා
- ශාඛා ණය ගනුදෙනු ඇගයීම් පත්‍රිකා හා ණය ගැණුම්කරුවන් ශ්‍රේණිකරණ ආකෘති
- අවදානම්-පාදක මිලකරණය
- කල්-ඇතිව දැනුම් දීමේ සංඥා
- නියාමන සීමා

ණය-පශ්චිම නිරීක්ෂණය

- ක්‍රියාත්මකව ඇති හා දෘඪතර ණය සමාලෝචනය
- ණය කළඹ ඇගැයීම
- අවශ්‍යතාවන් හා ප්‍රත්‍යාබලයන් හඳුනා ගැනීමේදී ගනුදෙනුකරුවන් සමඟ පූර්ව-ක්‍රියාකාරී ලෙස නියැලීම
- ප්‍රත්‍යාබල පරීක්ෂාව හා සිද්ධි-රූපණ විශ්ලේෂණ
- අවදානම් සහිත නිරාවරණයන් නිරීක්ෂණය කිරීම
- ණය ගුණාත්මකභාවය සහතික කිරීමේ ඒකකය විසින් ණය සමාලෝචන යාන්ත්‍රණය සහතික කිරීම

2022 වර්ෂය තුළ ණය අවදානම් කාර්යසාධනය

භූගෝලීය සංකේන්ද්‍රණය




- බස්නාහිර පළාත
- දකුණු පළාත
- මධ්‍යම පළාත
- උතුරු පළාත
- නැගෙනහිර පළාත
- උතුරු මැද පළාත
- වයඹ පළාත
- සබරගමු පළාත
- ඌව පළාත
- අක්වෙරළ බැංකුකරණය
- වෙනත් ශාඛා

බස්නාහිර පළාත


A – බස්නාහිර පළාත උතුර
B – බස්නාහිර පළාත දකුණ
C – බස්නාහිර පළාත මධ්‍යම
D – ආයතනික
E – මෙට්ට්‍රොපොලිටන්
F – පිටකොටුව
G – ප්‍රධාන කාර්යාලය
H – කාඩ්පත් මධ්‍යස්ථානය
I – ඉස්ලාමීය බැංකු කටයුතු

ඇප සංකේන්ද්‍රණය




- මුදල්
- දේපළ
- රන්
- වෙනත්
- ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්/වගකීම් සහතික
- ඇප රහිත
- චංචල දේ

ශ්‍රේණි අනුව ව්‍යාප්තිය



- AAA සිට BB
- B සහ ඉන් පහළ


බැංකුව විදේශ රටවලට නිරාවරණය



- වෙනත් වත්කම්
- විදේශ රටවල වත්කම්


A – ඉන්දියාව
B – ඇමෙරිකා එක්සත් ජනපදය
C – වෙනත් රටවල
D – සීෂෙල්ස්
E – මාලදිවයින
F – එක්සත් රාජධානිය

ක්ෂේත්‍රමය සංකේන්ද්‍රණය



- කෘෂිකර්ම හා ධීවර
- බැංකු, මූල්‍ය, රක්ෂණ හා ව්‍යාපාරික සේවා
- හෝටල්, ගමන් බිමන් හා සේවා
- නිවාස, ඉදිකිරීම් හා යටිතල පහසුකම්
- නිෂ්පාදනය
- වාණිජ වෙළඳාම
- ස්වෛරී හා ඍජු රාජ්‍ය
- ප්‍රවාහන හා කාර්ය-සම්පාදන සේවා
- වෙනත් වාණිජ සේවා
- පරිභෝජනය හා වෙනත්

නිෂ්පාදන අනුව සංකේන්ද්‍රණය



- වෙළඳ මූල්‍ය
- රන් සුරැකුම්
- කල්බදු
- කාර්ය මණ්ඩල ණය
- යෝජනාක්‍රම යටතේ ණය
- අයිරා
- ණය කාඩ්පත්
- නිවාස ණය
- විදේශ මුදල් ණය - වෙනත්
- කෙටිකාලීන ණය
- බී.ඕ.සී. පුද්ගලික ණය
- උකස් ණය
- මුදල් වෙළඳපළ ණයි
- වෙනත් ණය
- රාජයට ලබාදුන් ණය - විදේශ මුදල්
- ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ණය

පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධතිය (ESMS)

බැංකුවේ ගනුදෙනුකරුවන්ගේ මෙහෙයුම් වෙතින් පැන නඟින පාරිසරික හා සාමාජීය අවදානම් හඳුනා ගැනීමට හා කළමනාකරණය කර ගැනීමට අසමත් වීම මගින් බැංකුවේ කීර්තිනාමයට හා එහි ව්‍යාපාර කටයුතුවලට බලවත් තර්ජනයක් නිරූපනය කෙරෙන අතර, එමගින් වියදම් අධික නඩු කටයුතුවලට මඟ පෑදිය හැකි අතර ආදායම් අහිමි විය හැකිය. මූල්‍ය ගනුදෙනුවල පාරිසරික හා සාමාජීය අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වූ කාර්යපටිපාටි පැහැදිලි කරන "ඒකාබද්ධ පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති ප්‍රතිපත්තියට" අනුකූලව බැංකුව විස්තීර්ණ "පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති" මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. පරිසරය, සිය සේවකයින් හා අවට ප්‍රජාවන් මත බැංකුවේ මෙහෙයුම්වල අහිතකර කම්පනයන් මගින් සිය ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය හා මෙහෙයුම් තිරසාරභාවය අභියෝගයට ලක් විය හැකි බව බැංකුව පිළි ගනී. තිරසාර හරිත මූල්‍යකරණය හා මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කරනු පිණිස නිෂ්පාදන සුලභ කිරීමට සහයෝගය දෙන අතරම, පරිසරය, සමාජය හා යහපාලනය ආශ්‍රිත කාරණාවන් සමග බැඳුණු පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) මගින් බැංකුවේ ණය දීමේ ක්‍රියාකාරකම් හා මෙහෙයුම් පාරිසරික හා සාමාජීය වශයෙන් වගකීමෙන් යුතු වන බවටත්, ඒවා අදාළ නියාමනීය, පාරිසරික හා සාමාජීය ප්‍රමිතීන්, රටේ රෙගුලාසි මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විශිෂ්ටතම පිළිවෙත් සමග අනුකූල වන බවටත් වගබලා ගනී. බැංකුව පරිසරය, සමාජය හා යහපාලනය ආශ්‍රිත දීප ව්‍යාප්ත පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් සිය මානව සම්පත ශක්තිමත් කර ඇත.

ලංකා බැංකුව ශ්‍රී ලංකාව තුළ වඩාත් හරිත හා තිරසාර ආර්ථිකයකට දායක වන "නිසි පාරිසරික හා සාමාජීය අනලස්භාවය" හරහා ඉඩප්‍රස්ථා හඳුනා ගැනීම මගින් අපගේ ගනුදෙනුකරුවන් සඳහා තිරසාර හා පාරිසරික වශයෙන් හිතකාමී යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය සහිතව, සිය ණය දීමේ කළඹ තුළ ඇති හරිත මූල්‍යකරණ ක්‍රියාකාරකම් හා දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම හා ඇගැයීම හරහා "ශ්‍රී ලංකාව තුළ තිරසාර මූල්‍යය" සඳහා වූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය දෙයි.

අවදානම් කළමනාකරණය

වෙළඳපළ අවදානම

වෙළඳපළ අවදානම ඇති වන්නේ පොළී අනුපාතික, විනිමය අනුපාතික, කොටස් මිල හා භාණ්ඩ මිල ගණන් වැනි විචල්‍යයන්හි ඍණාත්මක සංචලනය හේතුවෙනි. වෙළඳපළ අවදානම 'ණය දීමෙන් හා ආයෝජන හරහා පැන නඟින අතර, එයට පහත දේ ඇතුළත් වේ:-

පොළී අනුපාතික අවදානම - බැංකුවේ වෙළඳ හා වෙළඳ නොවන ආයෝජන වලින් පැන නඟින	විදේශ විනිමය අවදානම - විදේශ මුදලින් දැක්වෙන ගනුදෙනුවලින් මතු වන අවදානම්	ස්කන්ධ අවදානම - ස්කන්ධ මිල ගණන්වල විචල්‍යන් මත පැන නඟින අලාභ
පොළී අනුපාතික සංවේදී වත්කම් හා බැරකම් වෙත බැංකුවේ නිරාවරණය සලකන කල පොළී අනුපාතික අවදානම (IRR) ඉතා සුවිශේෂී වේ. බැංකුව පොළී අනුපාතික අවදානම කළමනාකරණය කරනුයේ නිරවුල්ව නිර්වචනය කරන ලද මෙවලම් හා දර්ශක හරහාය. කල් පිරීමේ නොගැලපීම්, පොළී අනුපාතික පරතරයන් හා පාදක ලක්ෂය සඳහා මිල වටිනාකම (PVBP) නිතිපතා පදනම්ින් නිරීක්ෂණය කෙරෙන අතර, සාර්ව ආර්ථික තත්ත්වයන්හි වෙනස් වීම්වල සංකූලතාවන් නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාවන් හරහා තක්සේරු කෙරේ.	අනුමැති යාන්ත්‍රණ, බාහිර නියාමන මාර්ගෝපදේශ හා බැංකුව හා නියාමන බලධාරියා විසින් නියම කරන ලද සීමාවන් ඇතුළු දැඩි අභ්‍යන්තර ප්‍රතිපත්ති මගින් විදේශ විනිමය ගනුදෙනු පාලනය කෙරේ. අභ්‍යන්තරිකව, හානිකර තත්ත්වයන් කළමනාකරණය කරනු පිණිස, තනි මෙන්ම සමස්ථයක් වශයෙන් මුදල් ඒකක නිරාවරණයන්හි විවෘත තත්ත්වයන් සඳහා අවදානමේදී අගය (VaR) සීමාවන් හා පරමා සීමාවන් යන මේවායින් සමන්විත විස්තීර්ණ සීමා ව්‍යුහයක් භාවිත කෙරේ. එමෙන්ම බැංකුව ගෝචර වන විදේශ විනිමය සිද්ධි-රූපන පිළිබඳ ප්‍රත්‍යාබල පරීක්ෂාවන් සිදු කරයි.	බැංකුවේ ආයෝජන තීරණයන් එහි අවදානම්-ආදායම් ගතිකයන් පිළිබඳ අපේක්ෂණයන් සමග අනුගතව ඇති බවට වගබලා ගනු පිණිස කැප වූ ආයෝජන කමිටුවක් ඇත. ස්කන්ධ කළඹ නිසි ලෙස කළමනාකරණය කරනු පිණිස නිසි සීමා ව්‍යුහයක් ස්ථානගතව ඇති බවට වෙළඳපළ අවදානම් අංශය වගබලා ගනියි. විස්තීර්ණ ප්‍රත්‍යාබල පරීක්ෂා විශ්ලේෂණයක් මගින් ස්කන්ධ අවදානම් කළමනාකරණ කාර්යය සඳහා ඌණ පූරණ සපයයි.

වෙළඳපළ අවදානම 2022 වර්ෂය තුළ අවධානය යොමු වූ ක්ෂේත්‍ර හා ප්‍රවණතා

1. **සීමා සමාලෝචනය**
   වත්මන් දේශීය හා විදේශීය අවදානම් පරිසරයන් කළමනාකරණය කරනු පිණිස ප්‍රතිපාර්ශ්වයන් වෙත නියම කරන ලද සීමාවන් ප්‍රතිශෝධනය කිරීම
2. **දියුණු වාර්තාකරණය**
   පද්ධතික හා ගති ලාක්ෂණික අවදානම් සාධක හේතුවෙන් පැන නඟින වත්මන් හා අනාගත අවදානම් සාධකයන් පිළිබඳ වඩාත් දියුණු තොරතුරු වැඩි සුලභතාවයකින් කළමනාකාරිත්වය වෙත ලබා දීම
3. **විභව්‍ය අවදානම් තක්සේරු කිරීම**
   ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව මත බලපෑම ඇගයීම පිණිස, විභව්‍ය අවදානම් සිද්ධි-රූපනයන් (උදාහරණ:- ජාත්‍යන්තර ස්වෛවේරි බැඳුම්කර මත ප්‍රතිශතයක් කපා හැරීම) පිළිබඳ සත්‍යරූපී තක්සේරුවක් සම්බන්ධයෙන් ප්‍රත්‍යාබල පරීක්ෂාවන් සිදු කරන ලදී.
4. **ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම**
   මෑත කාලීන ප්‍රවණතා හා වෙළඳපළ තත්ත්වයන් ඔස්සේ වූ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය

බැංකුවේ ණය අවදානම් නිරාවරණයන් පූර්ව-ක්‍රියාකාරී ලෙස නිරීක්ෂණය කෙරෙන බවට හා එහි නිර්වචනය කරන ලද අවදානම් අභිරුචිය ඇතුළත පවත්වා ගැනෙන බවට වගබලා ගැනීමෙහිලා ඉහළම වගකීම දරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයට සිය අවදානම් කළමනාකරණ හා ආශ්‍රිත රාජකාරී අධීක්ෂණය කිරීමෙහිලා උපකාර කරයි.

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO)

- මූල්‍ය වෙළඳපළ ආශ්‍රිත වෙළඳපළ අවදානම විශ්ලේෂණය කිරීම හා හානි අවකරණය කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම
- බලය පවරන ලද සීමාව ඇතුළත වෙළඳපළ අවදානම් සීමාවන් නිර්දේශ කිරීම හා අනුමත කිරීම
- ව්‍යවසාය සිසාරා වූ විවිධ වෙළඳපළ අවදානම් නිරාවරණයන් අධීක්ෂණය කිරීම
- උචිත මිලකරණ ව්‍යුහය නිර්දේශ කිරීම

මහා භාණ්ඩාගාර අතරමැදි කාර්යාලය/වෙළඳපල ණය අවදානම් කළමනාකරණ ඒකකය

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයේ අතරමැදි කාර්යාලය භාණ්ඩාගාර මෙහෙයුම් සමාලෝචනය කරයි.

භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ අතරමැදි කාර්යාලයේ කර්තව්‍යයන් මූලික වශයෙන් වෙළඳපළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා සීමා කළමනාකරණ රාමුව හරහා පාලනය කෙරේ.

වෙළඳපළ අවදානම කළමනාකරණ රාමුව

වෙළඳපළ අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ වෙළඳපළ අවදානම් කළමනාකරණ රාමුව දෘඪතර කළමනාකරණ පිළිවෙත්වල වැදගත්කම හඳුනා ගෙන ඇති අතර එය වෙළඳපළ අවදානම හඳුනා ගැනීම, ප්‍රමාණනය කිරීම හා කළමනාකරණය කිරීම පිණිස වූ නිරවුල්ව නිර්වචනය කරන ලද පාලන ව්‍යුහය, උපායමාර්ග සහ අවදානම් අවකරණය මෙවලම් හා කාර්යපටිපාටි මත පදනම්ව ඇත.

බැංකුවේ වෙළඳපළ අවදානම් කළමනාකරණ කාර්යයේ මුඛ්‍ය සංරචක

වෙළඳපළ අවදානම් ප්‍රතිපත්ති

වෙළඳපළ අවදානම් ප්‍රතිපත්ති රාමුව පහත ඒවායින් සමන්විත වේ:-

- වෙළඳපළ අවදානම ප්‍රතිපත්ති රාමුව
- සීමා කළමනාකරණ රාමුවව
- විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- ක්‍රියාත්මක වන සන්දර්භයෙහි වෙනස් වන ගතිකයන් සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරමැදි කාර්යාලයේ මෙහෙයුම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කෙරේ.

අවදානම් සීමා

විදේශ මුදල් විවෘත තත්ත්ව සීමාවන්, ප්‍රතිපාර්ශ්ව සීමාවන්, නැවතුම් අලාභ සීමාවන් හා අලෙවි නියෝජිත සීමාවන් ඇතුළු භාණ්ඩාගාර හා ආයෝජන ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා අවදානම් සීමාවන් නියම කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම අභ්‍යාසය සඳහා වූ අවසාන වශකීම දරන අතර එයට වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුවේ සහයෝගය ලැබේ.

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වෙතින් ලැබෙන යෙදවුම් සමගින්) නිතිපතා වෙළඳපළ ප්‍රවණතාවන්ට අනුකූලව සීමාවන් සමාලෝචනය හා යාවත්කාලීන කරයි.


අවදානම් නිරීක්ෂණය

පොළී ආන්තිකයන්, විදේශ මුදල් නිරාවරණයන්, ස්කන්ධ නිරාවරණයන් හා අරමුදල් අවශ්‍යතාවන් ඇතුළු දර්ශක මාලාවක් හරහා වෙළඳපළ අවදානම නිරීක්ෂණය කෙරේ.


නිරීක්ෂණ යාන්ත්‍රණය සඳහා අවදානමේදී අගය, පාදක ලක්ෂය සඳහා මිල වටිනාකම, කාලය, විතැන්වීම විශ්ලේෂණය, ප්‍රත්‍යාබල පරීක්ෂාව, සංවේදිතා විශ්ලේෂණය, සීමාවන් හා ශුද්ධ විවෘත ස්ථාවරයන් වැනි මෙවලම්වල ආධාරය ලැබේ.

2022 වර්ෂය තුළ වෙළඳපළ අවදානම් කාර්යසාධනය

වත්කම් හා බැරකම් පිළිබඳ සංවේදිතා විශ්ලේෂණය – 2022 දෙසැම්බර්




පාදක ලක්ෂ්‍යයේ සඳහා මිල වටිනාකම – භාණ්ඩාගාර බැඳුම්කර



අවදානම් කළමනාකරණය

වත්කම් හා බැරකම් කල්පිරීම පිළිබඳ විශ්ලේෂණය – 2022 දෙසැම්බර්



ද්‍රවශීලතා අවදානම

බැංකුවේ මූල්‍ය වගකීම්භාරයන් පැන නඟින පරිදි ඒ ඒ අවස්ථාවේදී සපුරා ලීමට නොහැකි වීම හේතුවෙන් ඉපැයීම්වලට සහ/හෝ ප්‍රාග්ධනයට ඇති විය හැකි අලාභයන් ද්‍රවශීලතා අවදානමට අදාළ වේ.

බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව පදනම්ව ඇත්තේ උපායමාර්ගය, යහපාලනය, ක්‍රියාවලි, පද්ධති හා දත්ත, ක්‍රමවේදය හා වාර්තාකරණය මතයි. එය අනපේක්ෂිත ද්‍රවශීලතා අර්බුද වාතාවරණයන්ට මුහුණ දීමෙහිලා බැංකුවේ ප්‍රත්‍යාස්ථතාව සහතික කරයි.

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO) ද්‍රවශීලතා අවදානම් සඳහා වගකීම දරන අතර, නියාමන අවශ්‍යතාවන් සමග අනුකූල වීම හා අභ්‍යන්තර ඉලක්ක සපුරා ගැනීම සහතික වනු පිණිස බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය ස්ථාවර ලෙස නිරීක්ෂණය කරයි.

ද්‍රවශීලතා අවදානම 2022 වර්ෂය තුළ අවධානය යොමු වූ ක්ෂේත්‍ර හා ප්‍රවණතා

1 නව අවදානම් කළමනාකරණ කමිටුව

බැංකුවේ දෛනික ද්‍රවශීලතා තත්ත්වය නිරීක්ෂණයට අභ්‍යන්තර කළමනාකරණ කමිටුවක් හා නව විදේශ මුදල් බැහැර ප්‍රවාහය පිළිබඳ කමිටුවක් ස්ථාපිත කිරීම

2 දෘඪතර වාර්තාකරණ යාන්ත්‍රණය

අවශ්‍ය කමිටු වෙත සුලභ පදනමින් යාවත්කාලීන ද්‍රවශීලතා තත්ත්වය අඛණ්ඩව වාර්තා කිරීම

3 ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේ මූලකෘත්‍යයන්

යලි මිලට ගැනීමේ ගිවිසුම් සඳහා නව මුදල් වෙළඳපළ නිෂ්පාදනය, තැන්පතු සජීවීකරණ ඉලක්කය හා බැංකුවේ සම්භව්‍යතා අරමුදල් සම්පාදනය සැලැස්ම ශක්තිමත් කිරීම සඳහා නිර්දේශය

අධ්‍යක්ෂ මණ්ඩලය

අවදානම් අභිරුචිය තුළ දක්වා ඇති නිර්වචනය කරන ලද පරාමිතීන් ඇතුළත බැංකුවේ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමේ අවසාන වගකීම දරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)

අධ්‍යක්ෂ මණ්ඩලයට සිය ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීමේ හා ඒ ආශ්‍රිත රාජකාරි සඳහා සහයෝගය දෙයි.

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO)

- නියාමන අවශ්‍යතාවන්ට හා අභ්‍යන්තර ඉලක්කවලට අනුකූලතාව සහතික කරනු පිණිස ද්‍රවශීලතා ස්වරූපය ස්ථාවර ලෙස නිරීක්ෂණය කිරීම
- සම්භව්‍ය ද්‍රවශීලතා සැලැස්මක් සකස් කිරීම
- ද්‍රවශීලතා අප්‍රමාණවත්කම් පියවීම හා විකල්ප අරමුදල් විධිවිධාන සඳහා මාර්ග ගවේෂණය කිරීම
- උචිත අවදානම් අභිරුචි සීමාවන් නිර්දේශ කිරීම
- ත්‍රෛමාසික ප්‍රත්‍යාබල පරීක්ෂාව ඇගයීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව

ද්‍රවශීලතා අවදානම් ප්‍රතිපත්ති

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය හා වත්කම් හා බැරකම් කළමනාකරණය වැනි ප්‍රතිපත්ති ද්‍රවශීලතා අවදානම් නිරාවරණයන් කළමනාකරණය කිරීමෙහිලා යොදා ගත යුතු යාන්ත්‍රණ, මෙවලම් හා ප්‍රත්‍යාබල පරීක්ෂා ක්‍රමවේද පිළිබඳව මාර්ගෝපදේශනය ලබා දෙයි.

ද්‍රවශීලතා මිනුම්

ප්‍රවාහ ප්‍රවේශය:- කාල කොටස් තුළ ප්‍රක්ෂේපිත/තථ්‍ය ඇතුළතට හා පිටතට ප්‍රවාහය වීම් තක්සේරුව


අරමුදල් ප්‍රවේශය:- ද්‍රවශීල වත්කම් අනුපාතය, ද්‍රවශීලතා ආවරණ අනුපාතය, ශුද්ධ ස්ථාවර අරමුදල් සම්පාදන අනුපාතය හා තැන්පතුවලට ණය අනුපාතය ආදිය හරහා ද්‍රවශීලතා තත්ත්වය මනිනු ලැබේ.

සම්භව්‍යතා අරමුදල් සම්පාදන සැලැස්ම


මෙම සැලැස්ම මගින් ද්‍රවශීලතා පීඩනයකදී ව්‍යාපාරික අඛිච්ඡින්නතාව සහතික කරනු පිණිස වගකීම් සහිතව විශේෂිත සිද්ධි-කාරකයන් හා ක්‍රියාමාර්ග සැලසුම් නිර්වචනය කෙරේ.

2022 වර්ෂය තුළ මුඛ්‍ය ද්‍රවශීලතා දර්ශක

අරමුදල් සංයුතිය



බැරකම් රහිත සුරැකුම්



ද්‍රවශීලතා ආවරණ අනුපාතය	**ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය**
122.77%	**139.00%**
2021 – 111.45%	2021 – 124.31%
ද්‍රවශීල වත්කම් අනුපාතය	**තැන්පතු මත ණය අනුපාතය**
21.28%	**77.58%**
2021 – 24.97%	2021 – 89.88%

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම වනාහි සංවිධානය සිසාරා විහිඳෙන විෂය ක්ෂේත්‍රයක් වන අතර, එය බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව තුළ ගැබ්ව ඇති මෙවලම් භාවිත කරමින් ක්‍රියාත්මක කෙරේ. මෙම රාමුව සැලකිය යුතු මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීමට, මැනීමට, කළමනාකරණය කිරීමට, නිරීක්ෂණය කිරීමට හා වාර්තා කිරීමට සහාය වෙයි.

මෙහෙයුම් අවදානම 2022 වර්ෂය තුළ අවධානය යොමු වූ ක්ෂේත්‍ර හා ප්‍රවණතා

1 අභ්‍යන්තර පාලනවිධි ශක්තිමත් කිරීම

ඇති විය හැකි අභ්‍යන්තර වංචා නැවතීම කෙරෙහි අවධානය යොමු කරමින් බැංකුව සියලු මට්ටම්වල කාර්ය මණ්ඩලයට, විශේෂයෙන්ම කළමනාකරුවන්ට හා අභ්‍යන්තර පාලන නිලධාරීන්ට දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය.

2 අවදානම් හා පාලන ස්වයං-තක්සේරුව (RSCA)

ක්‍රියාවලියේ හිමිකරුගේ අවධානයකින් තොරව ක්‍රියාවලිය තුළ ගැබ් වන නෛසර්ගික අවදානම් අවකරණය කරන ක්‍රියාවලි පාලනවිධි දියුණු කිරීමේ හැකියාව ඇති කරන ලද අවදානම් හා පාලන ස්වයං-තක්සේරු ක්‍රියාවලියට තෝරා ගත් තීරණාත්මක ඒකක භාජනය කරන ලදී.

3 ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම

නව රෙගුලාසි හා මෙහෙයුම් තුළ වෙනස්කම් අන්තර්ග්‍රහණය කිරීම

4 අවදානම් දෘෂ්ටිය සැපයීම

සියලුම නව නිෂ්පාදන/ක්‍රියාවලි අවදානම් කළමනාකරණ අංශය හරහා යවනු ලබන අතර එම අංශය අවදානම් අංශ මෙන්ම ඒවායේ උචිත බව හා තිරසාර බව පිළිබඳව ප්‍රතිපෝෂණය කරන අතරම එය බැංකුවට නව ප්‍රවණතා සම්බන්ධයෙන් ශ්‍රද්ධානාන්විත තීරණ ගැනීමට හැකියාව ඇති කර තිබේ.

5 බැංකුව පුරා ව්‍යාප්ත චක්‍රලේඛ යලි සකස් කිරීම

දශක අටකට වැඩි ඉතිහාසයක් සහිත බැංකුවක් වශයෙන් අපගේ මෙහෙයුම් කාර්යපටිපාටි පිරිපහදු කිරීමට අවශ්‍ය බව හඳුනා ගෙන ඇත. අවදානම් හා අනෙකුත් කොටස්කරුවන්ගේ ප්‍රතිපෝෂණ හා විශ්ලේෂණ සමගින් BPRP ඒකකය විසින් විශේෂ කාර්යයක් සිදු කරන ලදී.

අවදානම් කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය

අවදානම් අභිරුචිය තුළ නිර්වචනය කර ඇති පරාමිතීන්ට අනුකූලව බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය කෙරෙන බවට සහතික කිරීම පිළිබඳ ඉහළම වගකී දරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අවදානම් කළමනාකරණය ආශ්‍රිත රාජකාරී පිළිබඳ අධීක්ෂණය හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය ලබා දෙයි. බැංකුවේ මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීමේ රාමුව ක්‍රියාත්මක කිරීම සහ ස්ථාවර පදනමකින් කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සඳහා වගකීම දරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC)

වංචා අවදානම් කළමනාකරණ කමිටුව (FRMC)

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය (ORMU)

මෙවලම් හා යාන්ත්‍රණ

ප්‍රතිපත්ති රාමුව

මූඛ්‍ය ප්‍රතිපත්තිවලට ඇතුළත් වන්නේ:-

- මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- තොරතුරු සුරක්ෂිතතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

මේම ප්‍රතිපත්තීන් මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම, තක්සේරුව, අවකරණය හා නිරීක්ෂණය පිළිබඳ වගකීම්, මෙවලම් හා කාර්යපටිපාටි පිළිබඳ මාර්ගෝපදේශ දක්වයි.

අවදානම් හඳුනා ගැනීම හා මැනීම

අවදානම් හා පාලන ස්වයං තක්සේරු, විභව්‍ය වේදනා ලක්ෂ්‍ය හඳුනා ගැනීමේ හැකියාව ඇති කරන අතර වැදගත් ව්‍යාපාරික ඒකක සම්බන්ධයෙන් සිදු කෙරේ.

මෙහෙයුම් අවදානම වෙත නිරාවරණය ඇගයීමට මූඛ්‍ය අවදානම් දර්ශක, අභ්‍යන්තර අලාභ දත්ත හා මූල හේතුකාරක විශ්ලේෂණයද භාවිත කෙරේ

වාර්තාකරණය හා නිරීක්ෂණය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා මෙහෙයුම් අවදානම් සිදුවීම්/ අලාභයන් සහ පාලනවිධි අසාමාර්ථතා පිළිබඳව යාවත්කාලීන ලෙස දැනුවත් කෙරේ.


එමෙන්ම, ප්‍රවණතා හා මූල හේතුකාරක හඳුනා ගැනීමට ඉඩ සලසමින් බැංකුව මෙහෙයුම් අලාභයන් පිළිබඳ දත්ත සමුදායක්ද පවත්වා ගෙන යයි. අතිශය අවදානම් නිරාවරණයක් සහිත බැංකුවක් වශයෙන් මෙම බැංකුව සේවකයින්ට දැනුම බෙදාහදා ගැනීමට දිරිගන්වමින් අවදානම් සවිඥානක සංස්කෘතියක් පෝෂණය කිරීමට යත්න දරයි.

හානි අවකරණය

1. දෘඪතර අභ්‍යන්තර පාලන ව්‍යූහය
2. සියලු තීරණාත්මක ව්‍යාපාරික ඒකක සහ උපකාරක කාර්යයන් සඳහා ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලසුම්
3. අති නවීන ආපදා ප්‍රකෘතිකරණ කේන්ද්‍රය
4. විස්තීර්ණ රක්ෂණ ආවරණය
5. වැඩිදියුණු කිරීම් සඳහා අඛණ්ඩව ක්‍රියාත්මකව ඇති ක්‍රියාවලි ඇගැයීම


2022 වර්ෂය තුළ මූඛ්‍ය මෙහෙයුම් අවදානම් දර්ශක

2022 වර්ෂය සඳහා අලාභ දත්ත විශ්ලේෂණය



- කාර්ය ඉෂ්ට කිරීම්, භාර දීම් හා ක්‍රියාවලි කළමනාකරණය
- අභ්‍යන්තර වංචා
- සේවාලාභීන්, නිෂ්පාදන හා ව්‍යාපාරික පිළිවෙත්
- බාහිර වංචා
- ව්‍යාපාර ඇනහිටීම හා පද්ධති බිඳවැටීම්

2022 වර්ෂය තුළ අවදානම් අභිරුචියට සාපේක්ෂව තථ්‍ය අලාභයන් හා ප්‍රතිපාදන



- අවදානම් අභිරුචිය
- තථ්‍ය අලාභයන් හා ප්‍රතිපාදන

තොරතුරු සුරක්ෂිතතා හා තාක්ෂණවේද අවදානම

තොරතුරු සුරක්ෂිතතා හා තාක්ෂණවේද අවදානමට බැංකුව ඇතුළත තොරතුරු තාක්ෂණය යොදා ගැනීමෙන් පැන නඟින තොරතුරු, දත්ත හෝ මුදල් අහිමි වීම් හෝ සොරකම් හේතුවෙන් හෝ විභව්‍ය සේවා බිඳ වැටීම හේතුවෙන් ඇති වන අවදානම අදාළ වේ.

තොරතුරු සුරක්ෂිතතා හා තාක්ෂණවේද අවදානම
2022 වර්ෂය තුළ අවධානය යොමු වූ ක්ෂේත්‍ර හා ප්‍රවණතා

1

තාක්ෂණවේද අවදානම් ඉරියව්ව දිශාගත කිරීම

තාක්ෂණවේද අවදානම හා ප්‍රත්‍යාස්ථතාව පිළිබඳ නියාමන රාමුවට අනුකූල වන පරිදි බැංකුවේ තාක්ෂණවේද අවදානම් ඉරියව්ව දිශාගත කිරීම ඇරඹීම.

2

තොරතුරු තාක්ෂණ තන්ත්‍රණය හා සයිබර් ආරක්ෂක මූලකෘත්‍යයන්

කෝබිට් (තොරතුරු හා ආශ්‍රිත තාක්ෂණයන් සඳහා පාලන අරමුණු) තොරතුරු තාක්ෂණ යහපාලන රාමුව ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම.

සයිබර් ආරක්ෂාව සඳහා රක්ෂණ ආවරණය ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම.

ඇතුළාන්ත සංවර්ධනයන් සඳහා කර්මාන්තයේ පිළිගත් ප්‍රමුඛ තොරතුරු සුරක්ෂිතතා මාර්ගෝපදේශ හඳුන්වා දීම.

3

දැනුවත්භාවය ගොඩනැගීම

සාමාජීය ඉංජිනේරු ප්‍රහාර පිළිබඳව ප්‍රායෝගික සැසි ඇතුළත් කරමින් තොරතුරු සුරක්ෂිතතාව පිළිබඳව දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.

දැනුවත් තීරණ ගැනීම සඳහා පහසුකම් සලසනු පිණිස කළමනාකාරිත්වයට තොරතුරු තාක්ෂණ අවදානම් පිළිබඳව මතු වෙමින් එන හා වත්මන් තොරතුරු පෙන්වා දීම.

4

ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (SOC) හා ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC)

සතියේ දින 7 ම පැය 24 පුරාම ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (SOC) ක්‍රියාත්මකව පවතින බවට වගබලා ගැනීම හා ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC) විසින් උත්පාදනය කෙරෙන අනතුරු ඇඟවීම්වලට නිසි කලට ප්‍රතිචාර දැක්වීමට ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC) පිහිටුවීම.

5

අවදානම් තක්සේරුව

ස්විෆ්ට් (ලෝක-ව්‍යාප්ත අන්තර්-බැංකු මූල්‍ය විදුලිසන්නිවේදනය සඳහා වූ සමාජය) මෙහෙයුම් සම්බන්ධයෙන් බැංකුව මුහුණ දෙන අවදානම් වඩා හොඳින් අවබෝධ කර ගනු පිණිස විස්තීර්ණ ස්විෆ්ට් සිද්ධි-රූපන පාදක අවදානම් තක්සේරුව සම්පූර්ණ කිරීම.

6

තාක්ෂණවේද අවදානම්වල හානි අවකරණය

තාක්ෂණවේද අවදානම්වල හානි අවකරණය කරනු පිණිස (දත්ත පෞද්ගලිකත්වය සහ වර්ගීකරණය, අලාභ වැළැක්වීම ආදියද ඇතුළුව) නව පද්ධති අවශ්‍යතාවන්, නව සංවර්ධනයන් හා පවතින පද්ධතිවලට අවශ්‍ය වෙනස්කම් පිරික්සීම.

මානව සම්පත් අවදානම

කොවිඩ්-19 ඇති කළ අභියෝගයන් වර්ෂය තුළ සමාජ-දේශපාලනික කැළඹීම මගින් තවත් අයහපත් අතට හරවන ලද බැවින්, පුද්ගලාශ්‍රිත අවදානම් අංශ 2022 වර්ෂය තුළ සැලකිල්ලට ගත යුතු සාධකයක්ව පැවතුණි. ශාරීරික හා මානසික යහපැවැත්ම ආශ්‍රිත අවදානම්, සේවක හුදෙකලා බව පිළිබඳ අවදානම සහ සේවකයින්ගේ රැකියා හා ජීවිත අතර සමතුලිතතාව සුරැකීමේ අභියෝග මෙම වර්ෂයේදීද බැංකුවේ පුද්ගල කළමනාකරණ උපායමාර්ගය මගින් තවදුරටත් සැලකිල්ලට ලක් කරන ලදී.

2022 වර්ෂය තුළ පැවති අභියෝගාත්මක ආර්ථික හා සමාජ-දේශපාලනික තත්ත්වයන් මගින් බැංකුව සඳහා සේවක පිරිවැටුම ඇතුළු නව අවදානම් බිහි වීමට මග පෑදුණි. ස්වභාවික සේවක සංඛ්‍යා පහළ යාම හා බඳවා ගැනීමේ බාධක සමග අත්වැල් බැඳ ගත් ඉහළ සේවක පිරිවැටුම බැංකුවේ කුසලතා සංචිතයට අහිතකර ලෙස බලපෑවේය.

බැංකුවේ පුද්ගල කළමනාකරණ උපායමාර්ගයට පහත දේ ඇතුළත් වේ:-

- සියලු සේවකයින් සඳහා විස්තීර්ණ ආරක්ෂක විධිවිධාන සහතික කිරීම
- අඛණ්ඩ තථ්‍යරූපී නියැලීම් හා සංවර්ධන මූලපිරීම්
- නිවසේ සිට වැඩ කිරීමේ හා දුරස්ථ කාර්ය විධිවිධාන සඳහා පහසුකම් සැලැස්වීම
- මෙහෙයුම් අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අඛණ්ඩ තක්සේරු හා කාර්ය මණ්ඩල කාර්යභාරයන් යලි දිශාගත කිරීම
- තීරණාත්මක මෙහෙයුම් සඳහා වෘත්තීයවේදීන්ද ඇතුළුව නව සේවකයින් සඳහා විශේෂ මූලාශ්‍ර වෙතින් තෝරා ගැනීම
- බැංකුවේ කවර හෝ දෝෂ නවතනු පිණිස උපායමාර්ග සැකසීම සඳහා නික්මන් සම්මුඛ සාකච්ඡා.

නියාමන හා අනුකූලතා අවදානම

නියාමන මාර්ගෝපදේශ නිතර වෙනස් වීම හේතුවෙන් වෙනස් ලෙස අර්ථ නිරූපනය කිරීම මගින් හෝ ක්‍රියාත්මක කිරීමේ ආකාරය මගින් පැන නඟින නොපිළිපැදීමේ අවදානම වැඩි වී තිබේ. මෙය අවකරණය කරනු ලබන්නේ නියාමන බලධාරීන් සමග සමීපව හා පූර්ව-ක්‍රියාකාරී ආකාරයකින් කටයුතු කිරීම සහ මාර්ගෝපදේශවලට හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම නිරීක්ෂණය කරන ඇපකැප වූ අනුකූලතා ඒකකයක මෙහෙයුම් හරහාය.

දේශගුණය ආශ්‍රිත අවදානම

ස්වභාවික විපත් හා දීර්ඝ-කාලීන දේශගුණික අනුවර්තන හා විසඳුම් ක්‍රියාත්මක කිරීමට අසමත් වීම ඇතුළු දේශගුණය ආශ්‍රිත අවදානම් බැංකුවේ ගනුදෙනුකරුවන් මුහුණ දෙන මූලික අවදානම් අතර වේ. මෙය අවබෝධ කර ගනිමින්, ලංකා බැංකුව සිය දේශගුණික අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමට කටයුතු කරන අතර, දේශගුණය ආශ්‍රිත අවදානම් සඳහා හඳුනා ගැනීමේ හා හානි අවකරණය කිරීමේ කටයුතු අඛණ්ඩව වැඩිදියුණු කිරීමට ඇති සිය ඇපකැප වීම සමග දිශාගතව මෙම බැංකුව විසින් මෙම වර්ෂයේදීද විවිධ පියවර ගන්නා ලදී.

මේ සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවලට පහත ඒවා ඇතුළත් වේ:-

- බැංකුවේ පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධතිය (ESMS) උපයෝගී කර ගැනීමේ පරිමාණය අඛණ්ඩව ඉහළ දැමීම. වැඩිදුර තොරතුරු සඳහා ඉහත 149 පිටුව සහ ප්‍රජාව හා පරිසරය කොටසේ 103 පිටුව වෙත යොමු වන්න.
- ණය දීමේ දෘෂ්ටි කෝණයෙන් මෙන්ම අභ්‍යන්තර මෙහෙයුම් අංශයෙන්ද සුනීත බලශක්තිය කෙරෙහි වැඩි අවධානය
- බැංකුව තුළ පාරිසරික හා සාමාජීය කළමනාකරණ පද්ධති (ESMS) කළමනාකරණය පිළිබඳව සේවකයින්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම
- දේශගුණය ආශ්‍රිත මූල්‍ය අනාවරණයන් පිළිබඳ කාර්ය සාධක බලකාය (TCFD) සමග එක්ව අනුකූලතාව සඳහා පදනමක් ස්ථාපිත කිරීමට පියවර ගැනීම.

අවදානම් කළමනාකරණය

නෛතික අවදානම

නියාමන/ව්‍යවස්ථාපිත විධිවිධාන නොපිළිපැදීම, නීති කෘත්‍ය හේතුවෙන් වන අවිනිශ්චිතතාව හෝ බැංකුවට අදාළ වන නීති රීති හෝ රෙගුලාසිවල ව්‍යවහාරකත්වය හෝ අර්ථනිරූපනය නිසා ඇති වන අවිනිශ්චිතතාව කෙරෙන් පැන නඟින, විභව්‍ය ඉපැයීම් අහිමි වීම් සහ කීර්තිනාම හානි මෙයට ඇතුළත්ය.

- ඉහළ නිපුනත්වයැති හා අත්දැකීමෙන් යුතු නෛතික ක්‍රියාවලියක් මගින් නෛතික ලෙස බන්ධනීය ගිවිසුම් අඛණ්ඩව සමාලෝචනය කිරීම හරහා සියලුම නිරාවරණයන් අවකරණය කෙරෙන බවට වගබලා ගැනේ. මෙයට බැංකුවෙහි අනුකූලතා ක්‍රියාවලියෙහි උපකාරය ලැබේ.
- වෙනස් වන නියාමන අවශ්‍යතාවන් හා කොටස්කාර අවශ්‍යතාවන් හමුවේ සියලුම ප්‍රතිපත්ති, කාර්යපටිපාටි හා මාර්ගෝපදේශ දෘඪතර හා උචිත ඒවා වන බවට වගබලා ගනු ලැබේ.

නෛතික අවදානම නිසා බැංකුව අත්විඳි කිසිදු සැලකිය යුතු අලාභයන් නොවීය.

කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම බැංකුව කෙරෙහි විශ්වාසය නොමැති වීම හා ඍණාත්මක ආකල්පයක් ඇති වීම කෙරෙන් පැන නඟින අතර එමගින් ඉපැයීම්, වත්කම්, ප්‍රාග්ධන තත්ත්වය සහ/හෝ සන්නාම වටිනාකම කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකිය.

වර්ෂය තුළ පහත ක්‍රියාමාර්ග හරහා කීර්තිනාම අවදානම අවම කරන ලදී:-

- ආර්ථිකයේ අතිශය වැදගත් ක්ෂේත්‍රයන්ට ණය දීම හා ගනුදෙනුකරුවන් ප්‍රතිස්ථාපනය කිරීම/පුනර්ජීවනය සහ හැකි තැන්හිදී විදේශ විනිමය ප්‍රවාහයන්ට දායකත්වය දෙමින් රටේ සාර්ව ආර්ථික ස්ථාවරත්වයට හා ආර්ථික පුනර්ජීවනයට උර දීමෙහිලා ලංකා බැංකුව විසින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉෂ්ට කරන ලදී.
- අභියෝගකාරී තත්ත්වයන් මධ්‍යයේ පවා ව්‍යාපාරික අවිච්ඡින්නතාව හා ගනුදෙනුකාර සේවාව සහතික කිරීමට ප්‍රයත්න දරන ලදී.
- දිවයින පුරා මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කරනු පිණිස බැංකුව විසින් ප්‍රයත්නයන් යොදන ලදී.
- ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සන්නාමවලින් එකක් ලෙසත්, බැංකු ක්ෂේත්‍රය තුළ අංක 1 සන්නාමය ලෙසත් අඛණ්ඩව ශ්‍රේණිගත වෙයි.
- ඉන්ධන, ඖෂධ, ප්‍රතිශක්තිකරන චීන්නත් හා තවත් දේ ආනයනය හරහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වෙත අඛණ්ඩ ප්‍රවිෂ්ටය සඳහා හැකියාව ලබා දෙනු පිණිස මුඛ්‍ය ආයතන වෙත බැංකුව සිය සහයෝගය ලබා දී ඇත.

උපායමාර්ගික අවදානම

බැංකුවෙහි අනාගත ව්‍යාපාරික සැලසුම්වල ඇති විය හැකි දෝෂ සහ උපායමාර්ගයන් අප්‍රමාණවත් වීමේ හැකියාවන් වෙතින් පැන නඟින විභව්‍ය අලාභයන් ය.

බැංකුවේ උපායමාර්ගික අවදානම් පහත ක්‍රියාමාර්ග හරහා අවම කරනු ලැබේ:-

- බැංකුවෙහි දැක්ම හා මෙහෙවර මගින් දැක්වෙන උපායමාර්ගික දිශානතිය කාලය සමඟද බැඳුණු මැනිය හැකි විශේෂිත ඉලක්කද සහිතව සංස්ථායික සැලැස්ම මගින් ක්‍රියාවට නංවා තිබේ.
- ආයතනික හා විධායක කළමනාකරණ කණ්ඩායමේ අදහස්, ක්‍රියාත්මක සන්දර්භය පිළිබඳ තක්සේරුව, පාර්ශ්වකාර අවශ්‍යතාවන් පිළිබඳව සලකා බැලීම හා අවසාන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලද සාකච්ඡා යනාදිය අවශෝෂණය කර ගනිමින් උපායමාර්ගය සැකසීම සඳහා වන දෘඪතර යාන්ත්‍රණ පැවතීම
- නිශ්චිත ඉලක්කවලට සාපේක්ෂව කාර්යසාධනය අඛණ්ඩව නිරීක්ෂණය කිරීම
- උපායමාර්ගික අවදානම් නිරාවරණයන් මනිනු පිණිස වූ විස්තීර්ණ ලකුණු සටහන් පත්‍රිකා භාවිතය.

ඉදිරි දැක්ම

අවදානම් සන්දර්භය තුළ පවතින ගතික ස්වභාවය සහ 2023 කරා යන ගමනේ ඇති සම්පීඩිත මෙහෙයුම් පරිසරය සැලකිල්ලට ගෙන, මෙම බැංකුව අංක 1 වශයෙන් ඇති සිය තත්ත්වය පවත්වා ගෙන යන අතරම එළඹෙන වර්ෂය තුළ ස්ථාවරභාවය සහතික කරනු පිණිස සැලසුම් ස්ථානගත කර හා ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේ.

2023 දී අවධානය

1. ආයතනික අරමුණු සාක්ෂාත් කර ගන්නා බවට හා පාර්ශ්වකාර අගය දියුණු කරන බවට සහතික වීම
2. ප්‍රාග්ධනය ප්‍රශස්ත ලෙස භාවිතය හා වෘද්ධිය ඇති කිරීම
3. ව්‍යාපාර පුනර්ජීවනය හා ප්‍රතිස්ථාපනය කෙරෙහි අවධානය
4. විචක්ෂණ ලෙස ද්‍රවශීලතාව කළමනාකරණය කෙරෙන බවට වගබලා ගැනීම
5. ශුද්ධ පොළී ආන්තිකය (NIM) කළමනාකරණය කිරීම හා වැඩිදියුණු කිරීම
6. මෙහෙයුම් අලාභයන් අවම කරනු පිණිස නිෂ්පාදන හා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම
7. පාරිසරික හා සාමාජීය යහපාලනය ශක්තිමත් කිරීම
8. ජාත්‍යන්තර විශිෂ්ටතම පිළිවෙත් යොදා ගැනීම
9. අතිශය විචල්‍ය ආර්ථික තත්ත්වයන් යටතේ සන්නාම වටිනාකම පවත්වා ගනු පිණිස කීර්තිනාම අවදානම කළමනාකරණය හා අවකරණය කිරීම
10. නියමයන්ට අනුකූල ව්‍යාපාරික රාමුවක් හරහා අනුකූලතා අවදානම කළමනාකරණය හා අවකරණය කිරීම
11. ණය කළඹ කළමනාකරණය හරහා සවලදායී ලෙස සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කිරීම

8

මූල්‍ය වාර්තා

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව
158

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම
163

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව
165

ස්වාධීන සහතිකවීමේ වාර්තාව
167

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම
168

විගණකාධිපතිතුමාගේ වාර්තාව
169

ලාභ හෝ අලාභ ප්‍රකාශනය
174

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
175

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
176

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
178

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
182

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
184

8 ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

1. හැඳින්වීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන් හි අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලද 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන විගණන වාර්තාව සමඟ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ කටයුතු පිළිබඳ සිය වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. තවද මෙම වාර්තාව තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ වන 2007 අංක 11 දරණ බැංකු පනත් නියාමනයන් සහ එහි පසුකාලීන සංශෝධනයන් මඟින් හා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති මඟින් දක්වන අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කරන හෙළිදරව් කිරීම් ද ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 24 දින සමාලෝචනය කර අනුමත කරන ලදී .

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් යටතේ 1939 අගෝස්තු 1 දින ලංකා බැංකුව සංස්ථාපනය කරන ලද අතර 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් යටතේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වේ. බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව විසින් සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර නිකුත් කර ඇති අතර ඒවා කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත.

2. ව්‍යාපාර කටයුතු පිළිබඳ සමාලෝචනය

2.1 බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ලංකා රජයේ සුරැකුම්පත් සම්බන්ධව වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සමඟ ගනුදෙනු සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණයපත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් අදාළ මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

2.2 පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම්

පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක කරුණු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ පිටු අංක 184 හි ඇතුළත් වේ. සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි දක්වා ඇති වෙනස්වීම් හැරෙන්නට බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවය සමාලෝචිත වසර තුළදී සැලකිය යුතු තරමේ වෙනසකට භාජන වී නැත.

2.3 සමූහයේ සංයුතියේ වෙනස්වීම

වසර තුළ, ලංකා බැංකුවේ පරිපාලිත ආයතනයක් වන ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී (වර්තමානයේ ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් ලෙස හැඳින්වේ), 2022 ඔක්තෝබර් 27 දින සිට බලපැවැත්වෙන පරිදි කොළඹ කොටස් වෙළඳපොල තුල නිල ලැයිස්තුවෙන් ඉවත් කර ඇත. කොටස් 1,573,272 ක් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී විසින් නැවත මිලදී ගෙන ඇති අතර ඒ සඳහා ඉවත් කිරීමේ ක්‍රියාවලිය යටතේ රුපියල් මිලියන 287.9 ක සම්පූර්ණ සලකා බැලීමක් සිදු කර ඇත. 2022 දෙසැම්බර් 31 වන දිනට නිකුත් කරන ලද සහ සම්පූර්ණයෙන් ගෙවා ඇති සාමාන්‍ය කොටස් සංඛ්‍යාව 64,426,728 ක් විය.

ලැයිස්තුගත කිරීම ඉවත් කිරීමට අනුකූලව, ලංකා බැංකුවේ හි කොටස් හිමිකම 95.55% සිට 97.89% දක්වා වැඩි විය. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල මෙම කොටස් හිමිකාරිත්වයේ වෙනස සටහන් කිරීමට අවශ්‍ය ගැලපීම් සිදු කරන ලදී.

සමූහය පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 31 සහ 32 යටතේ පිටු අංක 253 සිට 261 දක්වා ඉදිරිපත් කර ඇත.

2.4 දැක්ම, මෙහෙවර සහ සංස්ථාපිත පරිවය

බැංකුවේ දැක්ම, මෙහෙවර සහ ආයතනික වටිනාකම් ප්‍රකාශනය මෙම වාර්ෂික වාර්තාවෙහි දෙවන ඇතුල් කවරයේ පිටුපස දක්වා ඇත. බැංකුව උසස්ම ආචාර ධර්ම පද්ධතියකට අනුරූපව තම කටයුතු ඉටු කරන අතර එමඟින් දැක්ම, මෙහෙවර හා වටිනාකම් ප්‍රකාශනය යටතේ ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු කරා බැංකුව මෙහෙයවනු ලැබේ.

2.5 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ/සමූහයේ කාර්යසාධනය සහ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව විවරණයක් පිටු අංක 14 සිට 16 දක්වා අන්තර්ගත සභාපතිතුමාගේ පණිවිඩයෙහි ඇතුළත් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් පිටු අංක 18 සිට 21 දක්වා වූ මහා කළමනාකාරතුමාගේ සමාලෝචනයෙහි ඇතුළත් කර ඇත. බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පිළිබඳව "මූල්‍ය සමාලෝචනය" තුළ පිටු අංක 60 සිට 64 තෙක් දක්වා ඇති අතර, එම වාර්තාවලින් සාධාරණ සමාලෝචනයක් ඉදිරිපත් කර ඇති අතර, ඒවා මෙම වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.6 ශාඛා ව්‍යාප්තිය

ඩිජිටල් භාවිතය වැඩි දියුණු කරමින්, බැංකුව සිය ජාලය දිවයින පුරා මුදල් චක්‍රීකරණ යන්ත්‍ර 75 කින් වසර තුළ පුළුල් කළ අතර, සෘජු ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන 2,166 දක්වා වැඩි කරන ලදී. මෙම සංඛ්‍යාවට ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ විය හැකි අනෙකුත් බැංකුවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ පාසල් ඉතුරුම් මධ්‍යස්ථාන (සංසඳ) සහ ජංගම ඉතුරුම් ඒකක ඇතුළත් නොවේ.

රට තුළ පැවති ආර්ථික පසුබෑම හේතුවෙන් මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව බැංකුවේ ප්‍රාග්ධන වියදම් සමීපව නිරීක්ෂණය කරන ලදී. 2022 වර්ෂය තුළ බැංකුවේ භෞතික බෙදාහැරීමේ නාලිකා ජාලයට එක් ශාඛාවක් එක් කර ඇත.

2.7 ආයතනික පරිත්‍යාග

2022 වර්ෂය තුළ සිදු කරන ලද ආයතනික සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම් සඳහා බැංකුව රුපියල් මිලියන 60.1 ක් පරිත්‍යාග කර ඇත (2021 – රු. මිලියන 79.5).

2.8 මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කරන ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට, 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනවලට,

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීතිවලට අනුකූලවන ආකාරයට මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බවයි. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී 2007 අංක 07 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදන ද භාවිතා කර ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 168 හි ඉදිරිපත් කර ඇති අතර, එය මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත්කරන වාර්ෂික වාර්තාවේ සංකලිත කොටසකි.

2.9 විගණක වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා, ලංකා බැංකුවේ විගණක වශයෙන් පත්කර ඇත. 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 169 සිට 173 තෙක් දක්වා ඇත.

2.10 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය සිය මූල්‍ය වාර්තා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං.ගි.ප්‍ර.) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.) අනුව පිළියෙල කරයි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 184 සිට 199 දක්වා දක්වා ඇත.

3. සැලසුම්ගත සංවර්ධන කටයුතු

අනාගතය සඳහා බැංකුව විසින් සැලසුම්කර ඇති වර්ධනයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම වාර්ෂික වාර්තාවේ 22 සිට 25 දක්වා පිටුවල නව සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරීවරයාගේ ඉදිරි දැක්මෙහි ඉදිරිපත් කර ඇත.

4. මුළු ආදායම

2022 වර්ෂය සඳහා සමූහයේ මුළු ආදායම රු. මිලියන 520,891.2 ක් වූ අතර එය පෙර වසරේ රු. මිලියන 297,620.8 ක් විය. බැංකුවේ මුළු ආදායම සමූහයේ මුළු ආදායමෙන් 99% (2021 – 98%) වේ. සමූහයේ ප්‍රධාන ආදායම පොලී ආදායම වන අතර එය මුළු ආදායමෙන් 89% (2021 – 90%) වේ.

5. ලාභාංශ සහ සංචිත

5.1 ලාභය සහ විසර්ජනයන්

2022 දී බැංකුව රු. මිලියන 30,976.6 ක බදු ගෙවීමට පෙර ලාභයක් වාර්තා කර ඇති අතර එය පෙර වසර සඳහා වාර්තා වූ රු. මිලියන 43,189.5 ට සාපේක්ෂව 28% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

රු. මිලියන 995.8 ක් ආදායම් බදු ප්‍රතිවර්ත්‍ය කල පසු (2021 ආදායම් බදු වියදම රු. මිලියන 5,599.4) 2022 වර්ෂය සඳහා බදු පසු ලාභය රු. මිලියන 31,972.4 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය 2021 වර්ෂයේ වාර්තා වූ බදු පසු ලාභය වන රු.මිලියන 37,590.1 ට වඩා 15% ක අඩු වීමක් වේ.

බැංකුවේ සහ සමූහයේ අදාළ ලාභය පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2022 රු. මිලියන**	**2021 රු. මිලියන**	**2022 රු. මිලියන**	**2021 රු. මිලියන**
සියලුම වියදම් දැරීමෙන් සහ ක්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන්, ක්‍රමක්ෂය, ණය හා අත්තිකාරම් සහ වෙනත් අලාභයන් සඳහා හානිකරණ ප්‍රතිපාදන හා අසම්භව්‍යන් සඳහා වෙන්කිරීමෙන් පසු, එහෙත් බදු පෙර වර්ෂයේ ලාභය	42,289.9	52,216.7	42,372.2	53,843.1
මූල්‍ය සේවා මත බදු	(11,313.3)	(9,027.2)	(11,442.5)	(9,339.7)
ආශ්‍රිත සමාගම්වල ලාභ/(අලාභ) කොටස, බදු පසු	–	–	122.8	133.7
ආදායම් බදු පෙර ලාභය	30,976.6	43,189.5	31,052.5	44,637.1
ආදායම් බදු වියදම	995.8	(5,599.4)	796.5	(5,953.7)
වර්ෂය සඳහා ලාභය	31,972.4	37,590.1	31,849.0	38,683.4
වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු	27,806.9	8,356.8	32,230.3	9,566.6
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	59,779.3	45,946.9	64,079.3	48,250.0
විසර්ජනයන්				
ස්ථාවර සංචිත අරමුදලට මාරු කිරීම	(640.0)	(752.0)	(640.0)	(752.0)
ලාභාංශ	(346.4)	(1,846.4)	(346.4)	(1,846.4)

ආදායම් බදු රු. මිලියන 796.5 ප්‍රතිවර්ත්‍ය කිරීමෙන් පසු (2021 – බදු අය කිරීම රු. මිලියන 5,953.7), සමූහයේ වර්ෂය සඳහා පසු ලාභය 2022 දී රු. මිලියන 31,849.0 කි (2021 – රු. මිලියන 38,683.4).

5.2 ලාභාංශ

සියලුම බදු, ණය අලාභයන් සඳහා වෙන්කිරීම් සහ සංචිත සඳහා අවශ්‍යවන්නා වූ මාරු කිරීම් යනාදිය සිදුකළ පසු ලාභය මත පදනම්ව බැංකුව විසින්, බැංකුවේ කොටස්කරු වශයෙන් ශ්‍රී ලංකා රජයේ උපදෙස් මත ලාභාංශ තීරණය කරනු ලැබේ. ඒ අනුව, 2022 වර්ෂය සඳහා ලාභාංශ ලෙස බැංකුව විසින් රු. මිලියන 346.4 ක මුදලක් ගෙවා ඇත (2021 – රු. මිලියන 1,846.4).

5.3 සංචිත

සමූහයේ මුළු සංචිත 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 245,743.6 ක් විය. (2021 – රු. මිලියන 188,807.3). සමූහයේ සංචිත පහත සඳහන් දෑ වලින් සමන්විත වේ.

	සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2022 රු. මිලියන**	**2021 රු. මිලියන**
ස්ථාවර සංචිත අරමුදල	15,131.0	14,491.0
මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය	25,620.6	3,239.3
ප්‍රත්‍යාගණන සංචිතය	27,558.1	26,302.6
නිදහස් සංචිතය	366.7	366.7
විනිමය පරිවර්තන සංචිතය	14,304.4	4,461.2
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	2,584.4	1,483.4
ව්‍යවස්ථාපිත සංචිතය	358.9	358.9
රඳවාගත් ඉපැයුම්	159,819.5	138,104.2
එකතුව	245,743.6	188,807.3

6. දේපළ, පිරියත හා උපකරණ

වර්ෂය තුළ දේපල පිරියත හා උපකරණ කල්බදු වත්කම් සහ අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රු. මිලියන 4,195.2 (2021 – රු. මිලියන 2,371.9) වන අතර, ඒවා පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 263 සිට 283 දක්වා සහ 285 සිට 288 දක්වා ඇති සටහන් අංක 34 සහ 36 මගින් නිරූපනය කරයි.

7. නිදහස් දේපලවල අගය

2022 දෙසැම්බර් 31 දිනට සමූහය සතු නිදහස් දේපලවල වටිනාකම රු. මිලියන 31,125.9 (2021 – රු. මිලියන 29,560.0) ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන 34 හි ඇතුළත් කර ඇත.

8. ප්‍රකාශිත ප්‍රාග්ධනය හා කොටස් හිමිකම

8.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවූ ප්‍රාග්ධනය රු. මිලියන 25,000 (2021 – රු. මිලියන 25,000) විය. වර්ෂය තුළ රජයේ භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත ප්‍රාග්ධන දායකත්වය ලෙස රු. මිලියන 730.0 ක් ලබා දුන් අතර 2022 දෙසැම්බර් 31 අවසන් වන විට මෙම මුදල විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය යටතේ සටහන් කර ඇත.

8.2 කොටස් හිමිකම

බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජයයි.

9. යටත් කාලීන ණයකර/බැදුම්කර නිකුතුව

වසර තුළදී, බැංකුව දෙවන මට්ටමේ ප්‍රාග්ධන පදනමට සහය වීම සඳහා බාසල් III අනුකූල, ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත කළ, සුරැකුම් රහිත, යටත් කාලීන, ණයකර නිකුතුව හරහා සාර්ථකව රු. මිලියන 6,490.0 (2021 – රු. මිලියන 5,400.0) රැස් කර ඇත.

මූල්‍ය තත්ත්වය ප්‍රකාශ දිනට හිඟ ණයකර පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල පිටු 305 සිට 307 දක්වා සටහන් 49 යටතේ දක්වා ඇත.

10. කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ කොටසක මූලික ඉපැයීම් සහ කොටසක ශුද්ධ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. 1,279.8 (2021 – රු. 1,539.6) සහ රු. 10,858.9 (2021 – රු. 8,552.3) විය.

11. ආයතනික තිරසාරභාවය සහ වගකීම

ආයතනික තිරසාරභාවය සහ සමාජීය වගකීම් යටතේ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් පිළිබඳ විස්තරාත්මක සමාලෝචනයක් මෙම වාර්තාවෙහි අංක 103 සිට 113 දක්වා වූ පිටුවල "ප්‍රජාව සහ පරිසරය" යන අංශ යටතේ දක්වා ඇත.

12. අධ්‍යක්ෂ මණ්ඩලය

2022 වර්ෂය තුළ කටයුතු කල අධ්‍යක්ෂකවරුන්ගේ සහ මෙම වාර්ෂික වාර්තාව අත්සන් කරන දිනට නිලය දැරූ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර 27 සිට 29 දක්වා පිටුවල දක්වා ඇත. බැංකුවේ අධ්‍යක්ෂවරුන් බැංකුවේ විධායක තනතුරු දරන්නේ නැත. ඔවුන් බැංකුවට පුළුල් පරාසයක කුසලතා සහ අත්දැකීම් ගෙන එයි. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද මෙම වාර්ෂික වාර්තාවේ පිටු 27 සිට 29 දක්වා දක්වා ඇත. වාර්ෂික වාර්තාව අත්සන් කිරීමේ දිනය වන විට, නිලතල දරන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතරකි (4). 2022 වර්ෂය තුළ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

12.1 අධ්‍යක්ෂක ලැයිස්තුව

කාංචන රත්වත්තේ මහතා
සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2020 ජනවාරි 02 වැනි දින පත් කරන ලද අතර 2023 ජනවාරි 01 දා සිට අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීම නතර විය.)

ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා
නිල බලයෙන් පත්වූ, විධායක නොවන අධ්‍යක්ෂ (පත්වීම ලද දිනය – 2020 අප්‍රේල් 28)

ජී හර්ෂ විජේවර්ධන මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ: (2020 ජනවාරි 14 වැනි දින පත් කරන ලද අතර 2023 ජනවාරි 13 දා සිට අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීම නතර විය.)

ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (පත්වීම ලද දිනය – 2020 අප්‍රේල් 21)

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (පත්වීම ලද දිනය – 2021 ජනවාරි 08)

ජයම්පති මොල්ලිගොඩ මහතා
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2021 පෙබරවාරි 18 වැනි දින පත් කරන ලද අතර 2022 ජනවාරි 31 දා සිට අධ්‍යක්ෂකවරයකු ලෙස කටයුතු කිරීම නතර විය).

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මගපෙන්වීම් අනුව අධ්‍යක්ෂකවරු, ස්වාධීන/ස්වාධීන නොවන අධ්‍යක්ෂකවරුන් ලෙස වර්ග කර ඇත.

12.2 අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුව

බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය සහ බැංකුවේ කටයුතු මනාව පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පහක් පිහිටුවා ඇත. උපකමිටු සංයුතීන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 130 සිට 139 දක්වා උප කමිටු වාර්තාවල සඳහන් කර ඇත.

12.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීවලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 127 වන පිටුවේ දක්වා ඇත.

12.4 ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

බැංකුව සමග ඇති ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂකවරුන්ගේ සෘජු සහ වක්‍ර ඇල්ම පිලිබඳව දත්තයන් 163 සහ 164 දක්වා වූ පිටුවල විස්තර කර ඇත.මෙම ඇල්ම පිලිබඳව තොරතුරු අධ්‍යක්ෂකවරු විසින් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී අනාවරණය කර ඇත. ඉදිරිපත් කර ඇති ගිවිසුම්වලට අමතරව කිසිම අධ්‍යක්ෂකවරයෙකු වෙනත් සෘජු හෝ වක්‍ර ඇල්මක් බැංකුව සමග ඇති කරගෙන නොමැති අතර, අනාගතයේදී යෝජිත ගිවිසුමකට සම්බන්ධයක් හෝ නොමැති බව ප්‍රකාශ කෙරේ.

12.5 බැංකුව/සමූහය මඟින් නිකුත්කර ඇති ණයකර පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

කිසිදු අධ්‍යක්ෂවරයෙකුගේ නමින් ණයකර ලේඛණගත කර නොතිබිණි.

12.6 අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා/ගාස්තු

අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන දීමනා/ගාස්තු සියල්ලම, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද, 2015 ජුනි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී ඊ ඩී 3/2015, 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී ඊ ඩී 01/2020 සහ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව සිදු කර ඇත. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ තොරතුරු පිටු අංක 208 හි සටහන් 17 යටතේ දක්වා ඇත.

13. අවධානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

13.1 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් ගනු ලැබූ නිශ්චිත ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ පිටු 140 සිට 156 දක්වා විස්තර කර ඇත.

13.2 අභ්‍යන්තර පාලනය

බැංකුව තුල විගණන කමිටුව හරහා වඩාත් ඵලදායි සහ විස්තීරණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ.

විගණන කමිටුව විසින් භාරකාර වගකීම නිදහස් කිරීම උදෙසා අධ්‍යක්ෂක මණ්ඩලයට සහයෝගය දෙනු ලැබේ. විගණන කමිටුවේ සභාපතිතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 130 සිට 131 දක්වා ඇත. සමාලෝචනයට පාත්‍ර වූ වර්ෂ තුල මූල්‍ය වාර්තාව සහ වාර්ෂික වාර්තාව නිකුත් කල දිනය දක්වා වූ අභ්‍යන්තර විගණන පාලන පද්ධතියෙහි ඵලදායිතාව පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමකට පත්වේ. බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳව මගපෙන්වීම්වල විධි විධාන අංක 3(8) (II) (ආ) අනුව අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳව වාර්තාවක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිකුත් කර ඇත. ඉහත සඳහන් වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 165 සහ 166 හි ඇතුලත් කර ඇත. මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සාධාරණ තහවුරුවක් ලැබෙන පරිදි නිර්මාණය කර ඇති බවටත්, බාහිර පාර්ශවයන්ට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශ, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වන ආකාරයෙන් සකස් වී තිබෙන බවටත්, අධ්‍යක්ෂක මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලය විසින්, අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශනය මත සහතික වීමේ වාර්තාවක් විගණකාධිපතිතුමාගෙන් ලබාගෙන ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 167 හි දක්වා ඇත.

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

14. ආයතනික යහපාලනය

වඩාත් ඵලදායී ආයතනික යහපාලන රාමුවක් සහ ක්‍රියාවලියන් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටියි. බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාකාරකම් ආයතනික යහපාලන පරිචයට අනුකූල වන පරිදි මෙහෙයවීම සහ කාර්යක්ෂමව පාලනය කිරීම සිදු වේ. වාණිජ බැංකුවල නියාමක වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිලිබඳව මඟපෙන්වීම් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිලිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට මෙම පද්ධතීන් සහ පරිචයන් අනුකූල වන අතර, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 120 සිට 129 දක්වා ඇති "ආයතනික යහපාලනය" යටතේ සවිස්තරාත්මකව සඳහන් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉහත දැක්වූ 2007 අංක 11 විධිවිධානයන්ට අනුකූලවීම මත විගණකාධිපතිතුමාගෙන් වාර්තාවක් ලබා ගෙන ඇත.

15. මානව සම්පත්

බැංකුව සතු ඉහල වටිනාකමක් සහිත සම්පතක් ලෙස එහි සේවකයන් සලකන අතර, ඔවුන්ගේ සංවර්ධනය බැංකුවට ඉතාමත් වැදගත් වනු ඇත. සංස්ථාපිත අරමුණු ඉටු කර ගැනීමේදී ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය උපරිම තත්වයෙන් පවත්වාගෙන යාමට ඉතා වටිනා මෙම මානව ප්‍රාග්ධනය තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියක් ගෙන ඇත. බැංකුවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ පරිචයන්, "සේවකයින්" යටතේ විස්තර කර ඇති අතර එය පිටු අංක 89 සිට 99 දක්වා ඇතුලත් කර ඇත.

16. නීති රීති සඳහා වූ අනුකූලතාවය

අධ්‍යක්ෂවරුන්, ඔවුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව මෙම වාර්තාවේ 128 පිටුවේ "අනුකූල නොවීම" යටතේ හෙළිදරව් කර ඇති දේ හැර නීති හා රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක් සමූහය විසින් සිදු කර නොමැති බව තහවුරු කරයි.

මෙම වාර්තාවේ අංගයක් වන "අනුකූලතා ඇමුණුම්" යන කොටස යටතේ 360 සිට 402 දක්වා පිටුවල බැංකුවේ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම පිළිබඳ විස්තර දක්වා ඇත.

17. සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය පරිදි සහ බැංකුවේ නීතිඥයින් විසින් තහවුරු කළ පරිදි දැනට බැංකුව විසින් මෙහෙයවනු ලබන තවමත් සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම් වලින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ අනාගත මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් අහිතකර බලපෑමක් සිදු වෙතැයි අපේක්ෂා නොකෙරේ.

18. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට ගෙවිය යුතු සහ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත කාලයේ සිදු කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසයෙන් තහවුරු කරයි.

19. පාරිසරික ආරක්ෂාව

පරිසරයට අයහපත් ප්‍රතිපල ළඟා කරදෙන කිසිම ක්‍රියාකාරකමක බැංකුව නිරත වී නැත. තවද පරිසරය රැකගැනීමේ අරමුණින් ගත් පියවර පිටු අංක 103 සිට 113 දක්වා "ප්‍රජාව සහ පරිසරය" යන මාතෘකාව යටතේ දක්වා ඇත.

20. ශේෂ පත්‍ර දිනෙන් පසු සිදු වූ සිද්ධීන්

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ගැලපීමක් හෝ හෙලිදරව්වක් සිදු කළ යුතු කිසියම් ප්‍රමාණාත්මක සිද්ධියක් ශේෂ පත්‍ර දින හා මෙම වාර්තාව නිකුත් කළ දින අතර කාල පරාසය තුළ සිදු වී නැති බවයි.

21. අඛණ්ඩභාවය

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩ පවැත්ම යන සංකල්පය භාවිතාකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන

ලේකම්,
ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2023 මාර්තු 31 දින කොළඹ දීය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි අවශ්‍යතාවන්ට අනුකූලව, "සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ අනාවරණය" විස්තරාත්මක වශයෙන් මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 61 හි දක්වා ඇත.

අතිරේක වශයෙන්, සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති හෝ අධ්‍යක්ෂධූර දරණ අනෙකුත් ආයතනයන් සමඟ කරන ලද ගනුදෙනු සම්බන්ධව විස්තරයක් පහත දැක්වේ.

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2022 '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2021 '000
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම					
කාංචන රත්වත්තේ මහතා (2020 ජනවාරි 02 දින ලංකා බැංකුවේ සභාපති වශයෙන් පත් විය)					
ෆස්ට් ගාර්ඩියන් ඉක්විටීස්	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්	50,000	4,226	22,047
සී/ස හොටෙල්ස් කලම්බු (1963) (2020 පෙබරවාරි 24 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		3,105	2,392
		ස්ථාවර තැන්පතු		87,918	81,585
		බැංකු අයිරා	15,000	36,989	7,596
		ණය		227,308	192,562
		වෙනත් ලැබිය යුතු ශේෂයන්		87,290	89,895
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී (2020 පෙබරවාරි 25 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		9,863	14,435
		ස්ථාවර තැන්පතු		3,235,160	2,763,560
		ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණු සුරැකුම්පත්		167,953	528,500
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී (2020 සැප්තැම්බර් 30 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		228,005	361,444
		ස්ථාවර තැන්පතු		29	28
		බැංකු අයිරා	283,000	121,461	159,014
		ණය	1,576,812	1,576,812	389,785
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම (2020 පෙබරවාරි 24 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		1,640	3,485
		ස්ථාවර තැන්පතු		962,600	811,900
		ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණු සුරැකුම්පත්		14,876	38,000
		අතිරේක පළමු පෙළ ප්‍රාග්ධන බැඳුම්කර (AT I)		250,000	250,000
ලංකා බැංකුව (යු.කේ.) සමාගම (2020 ජූලි 03 වන දින පත්විය)	සභාපති	ජංගම ගිණුම්		14,186	5,288
		ඉතිරිකිරීමේ ගිණුම්		48	26
		නොස්ට්‍රෝ ගිණුම්		ඇ.ඩො. 783	ඇ.ඩො. 1,446
				284,331*	289,826*
				ම.බ්‍රි.ප. 826	ම.බ්‍රි.ප. 263
				361,250*	71,038*
				යුරෝ 1,316	යුරෝ 90
				509,039*	20,324*
		බැංකු වල ඇති තැන්පතු		ඇ.ඩො. 8,000	ඇ.ඩො. 8,000
				2,904,880*	1,603,470*
				–	යුරෝ 250
				–	56,715*
				ම.බ්‍රි.ප. 52,000	ම.බ්‍රි.ප. 18,100
				22,742,086*	4,897,782*

* ශ්‍රී ලංකා රුපියල් වලට සමාන අගය

සටහන: මුදල් ඒකකය නිශ්චිතව සඳහන් නොකළ සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2022 '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම 31.12.2021 '000
පී එච් විජයවර්ධන මහතා (2020 ජනවාරි 14 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පත් විය)					
චිල් කේ ඩොමේන් රෙජිස්ට්‍රි ශ්‍රී ලංකා සමාගම	ආරම්භක අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		148	713
		ස්ථාවර තැන්පතු		30,000	30,000
ඒ සී එම් ප්‍රනාන්දු මහතා (2020 අප්‍රේල් 21 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පත් විය)					
සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පී එල් සී	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		378	340
		ඉතිරිකිරීමේ ගිණුම්		8,246	7,196
ආර් එම් පී රත්නායක මහතා (2020 අප්‍රේල් 28 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පත් විය)					
ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	නිලබලයෙන් පත්වූ අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		82,492	36,689
		ස්ථාවර තැන්පතු		645	641
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි (2021 ජනවාරි 08 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් පත් විය)					
ගුවන්තොටුපල සහ ගුවන් සේවා (පුද්ගලික) සමාගම	සභාපති	ජංගම ගිණුම්		424,396	377,792
		ඉතිරිකිරීමේ ගිණුම්		ඇ.ඩො. 445	ඇ.ඩො. 308
				161,560*	61,780*
		ස්ථාවර තැන්පතු		8,345,544	3,237,843
		ස්ථාවර තැන්පතු		ඇ.ඩො. 206,440	ඇ.ඩො. 195,879
				74,938,006*	39,318,710*
		ණය		–	266,667
		ණයවර ලිපි	5,000,000	3,553,900	2,432,000
		ඇපකර ලිපි	20,800	20,800	20,800

* ශ්‍රී ලංකා රුපියල් වලට සමාන අගය
සටහන: මුදල් ඒකකය නිශ්චිතව සඳහන් නොකළ සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

8

වගකීම

2007 අංක 11 දරණ බැංකු පනත් විධානයෙහි 3 (8) (ii) (ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා බැංකුවෙහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මතාවය සහ සඵලදායීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. මෙහිදී බැංකු කටයුතුවලට අදාළ අවදානම් හා ප්‍රතිඵල සමබර ලෙස කළමනාකරණය කළ යුතු අතර, බැංකුවේ අවදානම් අභිරුචිය පිළිබඳ සීමා හා දර්ශකවල විචල්‍යතා ඉස්මතුවන සේ අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් නිර්මාණය කරයි. මේ අනුව මූල්‍ය තොරතුරු හා වාර්තා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බව හෝ මූල්‍ය අලාභයන් හෝ වංචාවලට එරෙහිව අභ්‍යන්තර පාලන පද්ධතීන්ට ලබා දිය හැක්කේ පූර්ණ සහතිකයක් නොව සාධාරණ සහතිකයක් පමණි.

බැංකුව විසින් මුහුණපෑ හැකි සැලකිය යුතු අවදානම් කාරකයන් හඳුනා ගැනීම, ප්‍රමාණ නිර්ණය, නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ අඛණ්ඩව බලපැවැත්වෙන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කර ඇත. ව්‍යාපාර පරිසරයේ සහ ව්‍යවස්ථාපිත මඟ පෙන්වීම් වල සිදු වන වෙනස්වීම් වලට අනුරූපීව මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමද මෙයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් බැංකු අධ්‍යක්ෂවරුන් හට මඟ පෙන්වීම සඳහා නිකුත් කර ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව උපයෝගී කර ගනිමින් සහ ඒ අනුව යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරතුරුවම ඉහත සඳහන් ක්‍රමවේදය නිරීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන කටයුතු නිරීක්ෂණයේ දී ඉහත මඟපෙන්වීමෙහි සඳහන් පරිදි අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේ මූලධර්ම යොදාගෙන ඇත.

දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති සාධාරණ සහතික ප්‍රතිඥාවක් ලබා දීමට ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. තවද බාහිර උපයෝගීතාවය සඳහා පිළියෙළ කරන මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

මතු වූ අවදානම් හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට මෙන්ම එම අවදානම් අවම කිරීමට හා පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන විධි නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මඟින් අවදානම් සහ පාලනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග භාවිතයට කළමනාකාරීත්වය සහය දක්වනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම හා සඵලදායිතාවය සමාලෝචනය කිරීමේදී අනුගමනය කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මකභාවය සහ සංගතභාවය සමාලෝචනය කිරීමට ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රමවේදයන්හි පහත දෑ ඇතුළත් වේ:

- බැංකුවෙහි දෛනික කටයුතුවල සඵලතාවය සහ බැංකුවේ සමස්ත මෙහෙයුම් අනුමත කළ ආයතනික සැලැස්ම මඟින් උකහා පිළියෙළ කල ආයතනික අරමුණු, උපක්‍රම සහ වාර්ෂික අයවැය අනුව පවතීද, යන්න සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය පිණිස විවිධ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත.
- බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය නියැදි සහ චක්‍රීය ක්‍රියා පටිපාටි භාවිතා කරමින් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය පිලිබඳව අඛණ්ඩව පරීක්ෂා කරන අතර එමඟින් සොයා ගනු ලබන කිසියම් අනුගත නොවීම් සම්බන්ධයෙන් අවධානයට ලක් කරනු ලබයි. සියලු අංශවල සහ ශාඛාවල විගණනයන් පවත්වනු ලබන අතර, ස්වාධීන හා විෂය මූලික වාර්තාවක් සැපයීම සඳහා විගණනයෙහි වාර ගණන ඇගයීමට ලක්වූ අවදානම මත තීරණය වේ . වාර්ෂික විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශයේ සොයාගැනීම් ඔවුන්ගේ නිරන්තර රැස්වීම්වලදී සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. වසර තුළ පැවති වසංගත හා ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලය වූ අභියෝග මධ්‍යයේ වුවද, අභ්‍යන්තර විගණන අංශය සම්ප්‍රදායික ස්ථානීය විගණනයට අමතරව ආසන්න තත්‍ය කාලීන සහ ශාඛා විගණන ක්‍රමවේද කෙරෙහි අවධානය යොමු කරමින් සිය කාර්යයන් බාධාවකින් තොරව ඉටු කිරීමට සමත් විය. මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුළ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය සහතික කිරීමට සහ ප්‍රතිපත්ති/ක්‍රියාපටිපාටිවලට අඛණ්ඩව අනුකූල වීම සහතික කිරීමට විගණන අංශයට හැකි විය.
- නියාමන අධිකාරීන්, කළමනාකාරීත්වය, අභ්‍යන්තර හා බාහිර විගණකයින් විසින් හඳුනාගත් අභ්‍යන්තර පාලනය පිළිබඳ ගැටළු අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවධානය යොමු කර අවදානම් කළමනාකරණයෙහි සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සිදු කරයි. අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය සහ විෂය පථය පිරික්සීම ද විගණන කමිටුව මඟින් සිදු කරයි. සියලුම විගණන කමිටු රැස්වීම් වාර්තා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. බැංකුවේ විගණන කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණය පිටු 130 සිට 131 දක්වා විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත.
- මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේදී බැංකුවේ අදාළ නිලධාරීන් විසින් මූල්‍ය ප්‍රකාශනයන්හි වැදගත් ගිණුම්කරණ සහ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ සියළු ක්‍රියා පිළිවෙත් සහ පාලනයන් සිදු කරන ලදී. එම සැලැස්මේ උචිතභාවය හා සඵලතාවය පිළිබඳ අභ්‍යන්තර විගණන අංශය විසින් නැවත නිරීක්ෂණය කරන ලදී. මෙම ඇගයීමට බැංකුවේ පරිපාලිත සමාගම් ඇතුළත් නොවේ.
- බැංකුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 – "මූල්‍ය උපකරණ" 2018 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුගත වන ලදී. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. – 9 හි අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා, බාහිර උපදේශකයෙකුගේ සහාය ඇතිව හානිකරණ ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා පුළුල් පරාසයක පුරෝකථන ආර්ථික අවස්ථා භාවිතා කරමින් බැංකුව අපේක්ෂිත ණය අලාභ (ECL) ආකෘති නිර්මාණය කරන ලදී. වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ඇතිව අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම ආකෘති තහවුරු කර ඇත. 2022 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අංක 13 සහ 14 උපදෙස් වලට අනුකූල වීමට බැංකුව ප්‍රමාණවත් පියවර ගෙන ඇති අතර එය අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර ඇත.

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

- මූල්‍ය උපකරණ වඩාත් සවිලදායීව හා කාර්යක්ෂමව හඳුනා ගැනීම, මැනීම, වර්ගීකරණය හා අනාවරණය කිරීම යන අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහ "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ" ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා බැංකුව ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් යොදාගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරමින් සිටී. ස්වයංක්‍රීය පද්ධතිය මඟින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 – "මූල්‍ය උපකරණ" යටතේ ඇති හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීමට හැකි වන අතර අභ්‍යන්තර හා බාහිර වාර්තාකරණ අවශ්‍යතා සපුරාලීමට පහසුකම් සපයයි.
- උද්ධමනය සහ පොලී අනුපාත ඉහළ යාම මෙන්ම දේශීය මුදල් අවප්‍රමාණය වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් 2022 වර්ෂය තුළ ආර්ථිකයේ ඇති අවිනිශ්චිතතාවයන් බැංකුව විසින් සලකා බලා ඇත. අවශ්‍ය ඇස්තමේන්තු සහ විනිශ්චයන් සිදු කරනු ලැබුවේ ආර්ථික අවිනිශ්චිතතාවයන්ට වැඩි අවධානමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමිනි. විදේශ විනිමය වශයෙන් නම් කරන ලද මූල්‍ය උපකරණ සහ ස්වෛරීත්වයට ණය සහ අත්තිකාරම් සඳහා ප්‍රතිපාදන සැකසීමේදී ස්වෛරී ශ්‍රේණිගත කිරීම "CC" සිට "RD" දක්වා පහත හෙළීම ද සලකා බලන ලදී.
- බැංකුව, රජය විසින් හඳුන්වා දුන් සහන පැකේජවලට අනුකූල වූ අතර 2022 දී ද කොවිඩ් – 19 මඟින් පීඩාවට පත් වූවන්ට අබණ්ඩව සහන සලසන ලදී. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 – "මූල්‍ය උපකරණ" යටතේ අපේක්ෂිත ණය අලාභ (ECL) ක්‍රමය භාවිතයෙන් හානි ප්‍රතිපාදන තක්සේරු කිරීමේදී ණය නොගෙවීමේ අවදානම් සහිත කර්මාන්තවල ගනුදෙනුකරුවන්ට කොවිඩ් – 19 නිසා ඇති වූ බලපෑම ද සලකා බලන ලදී. බැංකුව වත්මන් ආර්ථික තත්ත්වය තුළ අපේක්ෂිත පාඩුව ගණනය කිරීමේදී භාවිත කරන ආර්ථික සාධක ගැලපීම (EFA) සංශෝධනය කිරීමෙන් හානිකරන පාඩු ගණනය කර ඇත.
- ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 යටතේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ මැනීම සඳහා නියාමකයා විසින් නිකුත් කරන ලද උපදෙස් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් බැංකුවේ විවිධ විෂයයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් ස්වයංක්‍රීය මූල්‍ය වාර්තාකරණ විසඳුම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කරයි.
- බැංකුවේ සහ විදේශීය ශාඛා වල ණය හා අත්තිකාරම්, මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කිරීම්, අවදානම් කළමනාකරණයට අදාළ පාර්ශ්වීය ගනුදෙනු සහ වෙනස්වන නියාමන හා වෙළඳපළ තත්ත්වයන් මත පදනම්ව අනෙකුත් සියලුම වැදගත් බැංකු කටයුතු සම්බන්ධ අන්තර් ක්‍රියාපටිපාටිය බැංකුව විසින් නිරන්තරයෙන් අධීක්ෂණය හා යාවත්කාලීන කරනු ලැබේ. පුහුණුකිරීම් හා දැනුවත් කිරීමේ සැසි මඟින් ශ්‍රී ලං.මූ.වා.ප්‍ර./ලං.හි.ප්‍ර. යටතේ ඇති අවශ්‍යතා පිලිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් දැනුවත් කර ඇත.
- පෙර වර්ෂයන්හි මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකයින්ගේ නිර්දේශයන් සමාලෝචනය කර යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වර්ෂය තුළ දී ගන්නා ලදී. මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් 2022 වර්ෂයේ දී බාහිර විගණක නිර්දේශයන් සම්බන්ධයෙන් අනාගතයේ ක්‍රියා කරනු ඇත.

සහතික කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලීන් හා ක්‍රියාදාමයන් පදනම්ව බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවයන් සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව, බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශන සැකසීමේ යථානුරූපී බව පිලිබඳව සාධාරණ සහතිකවීමක් සැපයෙන අයුරින් බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදී,

සභාපති - විගණන කමිටුව

සභාපති

අධ්‍යක්ෂ

2023 මාර්තු 31 දින
කොළඹ දීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/B/BOC/IC/2022
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 27 April 2023

සභාපති

ලංකා බැංකුව,

ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයන්ට අදාළව අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් අධ්‍යක්ෂකවරුන් වෙත ඉදිරිපත් කරනු ලබන ස්වාධීන සහතික වීමේ වාර්තාව

හැඳින්වීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවේ ඇතුළත් ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකවීමක් මෙම වාර්තාවෙන් සපයනු ලැබේ.

කළමනාකරණයේ වගකීම

බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ නියාමනයන් වල 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති "අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂකවරුන් සඳහා වූ මාර්ගොපදේශය" ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම,කළමනාකරණය සතු වගකීම වේ.

මාගේ වගකීම හා ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාර ප්‍රමිත (ශ්‍රී. ලං. ස. කා .ප්‍ර) 3050 (සංශෝධිත) ට අනුකූල වීම

මාගේ වගකීම වන්නේ අධ්‍යක්ෂවරුන් විසින් සකස් කරන ලද ලියකියවිලි මඟින් මාගේ ප්‍රකාශනයට සහය දක්වයි යන්න සහ අභ්‍යන්තර පාලනයේ සැලසුම් සහ සඵලදායිතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් අනුගමනය කර ඇති ක්‍රියාවලිය උචිත ලෙස පිලිබිඹු වේද යන්න තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු ආයතන සඳහා සහතික වීමේ වාර්තාව ශ්‍රී.ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුකූලව මාගේ සහතිකවීමේ කාර්යභාරය මා විසින් මෙහෙයවා ඇත. මෙම ප්‍රමිතියට අනුව කළමනාකරණය විසින් සියලු ප්‍රමාණාත්මක ආකාරයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳව ප්‍රකාශය සකස් කර තිබේද යන්න පිළිබඳව සීමිත සහතිකයක් ලබා ගැනීම සඳහා ක්‍රියා පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුය. මෙම කටයුත්ත සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් මම වගකිව යුතු නොවේ.මෙම කටයුත්ත අතරතුර මම මූල්‍ය තොරතුරු විගණනයක් හෝ සමාලෝචනයක් කර නැත.

ඉටුකළ කාර්යයේ සාරාංශය

අදාළ ප්‍රකාශය, අධ්‍යක්ෂවරුන් විසින් හෝ අධ්‍යක්ෂවරුන් සඳහා හෝ පිළියෙළ කල ලිපි ලේඛන මඟින් තහවුරු වන්නේ ද, සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේ දී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන තිබෙන ක්‍රියාවලිය මඟින් මැනවින් පිලිබිඹු වන්නේ ද යන්න ඇගයීම සඳහා මාගේ කාර්යභාරය මෙහෙයවා තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කල ක්‍රියා මාර්ග සනාථ කර ගැනීම සඳහා නියැදි ලෙස බැංකුවේ කාර්ය මණ්ඩලයෙන් විමසීම, ලිපි ලේඛන පරීක්ෂාව යන ක්‍රියා පටිපාටි සිදු කරන ලදී.

මෙම ප්‍රකාශය තුලින් සියලු අවදානම් හා පාලනයන් ආවරණය වන්නේදැයි සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියා පටිපාටිවල සඵලදායීතාවය පිළිබඳ මතයක් ගොඩනැගීම හෝ ශ්‍රී.ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුව අවශ්‍ය නොවේ. එසේම ශ්‍රී.ලං.ස.කා.ප්‍ර. 3050 (සංශෝධිත) ට අනුව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන අංශයන් පිළිබඳව පවතින සැලකිය යුතු ගැටළු සඳහා ක්‍රියා කිරීමට විස්තර කර ඇති ක්‍රියාවලීන් මඟින් එම ගැටළු සඳහා නියත පිළියම් ලැබේදැයි මා විසින් සලකා බැලීම අවශ්‍ය නොවේ.

තෝරාගත් ක්‍රියා පටිපාටි රඳා පවතින්නේ බැංකුවේ ස්වභාවය, ප්‍රකාශය සකස් කර ඇති සිද්ධිය හෝ ගනුදෙනුව පිළිබඳ මගේ විනිශ්චය සැලකිල්ලට ගෙනය.

මගේ නිගමනයට පදනමක් සැපයීමට මා ලබාගත් සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියා පටිපාටීන් මත පදනම්ව වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම හා සඵලදායකත්වය පිළිබඳ සමාලෝචනයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදවා ඇති ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය හා සංගත නොවන බවට විශ්වාස කිරීමට හේතුවන කරුණු කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

අත්සන් කලේ,

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

8 මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණයට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ හා විගණකවරුන්ගේ වගකීම් පැහැදිලිව දැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ ප්‍රකාශය සකසනු ලබයි. ලංකා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශය මඟින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශ

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් සමඟ 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් සහ නියාමනයන්ට අනුව, සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් නිරවද්‍යතාවක් සමඟ බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබිඹු කෙරෙන ගිණුම් පොත් බැංකුව විසින් පවත්වාගෙන යාම තහවුරු කිරීමත් සහ බැංකුවේ කටයුතු පිළිබඳ තත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය වන ආකාරයට සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කිරීමත් බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි මෙම වාර්ෂික වාර්තාවේ නිරූපණය කර ඇති, 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති අතර, ඒවා සංගතභාවයෙන් යුතුව භාවිතා කර, කළමනාකරණය විසින් වඩාත් සාධාරණ හා විචක්ෂණ ලෙස තම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම් පාදක කරගෙන ඇත. භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් එවැනි දෑ පිළිබඳව අනාවරණය හා පැහැදිලි කිරීම් කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන් හා අනෙකුත් නියාමන අවශ්‍යතාවයන් හා අනුකූලවන පරිදි සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කෙරේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, බැංකුවට හා සමූහයට අනාගත නිශ්චිත කාලයක් සඳහා තම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී තව දුරටත් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය භාවිතා කර ඇත.

අභ්‍යන්තර පාලන,අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය

බැංකුවේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් සහ අවකලමනාකරණය වැලක්වීමට,වඩාත් ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරයක් පවත්වාගෙන යාම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දීම, අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය ද අධ්‍යක්ෂකවරුන් සතු වගකීමකි.

ආවේනික හා අවශේෂ අවදානම් මුළුමනින්ම තුරන් කරලීම කළ නොහැකි නමුත් කලින් තීරණය කරන ලද පද්ධති හා සීමා පැනවීම් තුළ උචිත යටිතල පහසුකම්, පාලනයන්, පද්ධති හා ආචාරධර්ම පදනම් වූ චර්යාවන් භාවිතය හා ක්‍රියාවට නැංවීම තුලින් එවැනි දෑ අවම කරගැනීම තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

මූල්‍ය වාර්තාකරණයේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා දෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකසා ඇති බව පිටු අංක 165 සහ 166 හි මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මඟින් තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ ඒ සඳහා වන මඟපෙන්වීම් මනා ලෙස සංවිධානය කර ඇත. ප්‍රමාණාත්මක අවදානම් පාලනය කිරීමටත්, ඒවා කළමනාකරණය කිරීමටත් කළමනාකරණ කමිටු ස්ථාපිත කර ඇත. අවධානම් පිළිබඳ මාසික වාර්තා සමාලෝචනය සහ සාකච්ඡාව සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා විධිවිධාන ක්‍රියාත්මක වේ. අදාළ නීති, රෙගුලාසි, රීති, විධානයන් සහ මඟපෙන්වීම් සමඟ අනුකූලවන ආකාරය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් අධීක්ෂණය කරන අතර, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා විගණන කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩව ක්‍රියා කරයි. විගණන කමිටුවේ හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 130 සිට 133 දක්වා අන්තර්ගත වේ.

විගණන වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත විගණන වාර්තාව සහ අවසාන විගණන මතය ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 169 සිට 173 දක්වා විගණකාධිපතිගේ වාර්තාවේ ඇතුළත් කර ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳව විගණකාධිපතිවරයා විසින් ලබාදුන් සහතිකය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 167 හි දක්වා ඇත.

අනුකූලතාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට නියාමන හා ව්‍යවස්ථාපිත අධිකාරීන්ට ගෙවීමට ඇති සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ පරිපාලිතයන් විසින් නියමිත පරිදි ගෙවා අවසන් කර හෝ ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි සෑහීමට පත් වේ.

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ඔවුන්ගේ වගකීම යථා පරිදි ඉටුකර ඇති බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන

ලේකම්,
ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2023 මාර්තු 31 දින
කොළඹ දීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } BAN/B/BOC/FA/2022

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 28 February 2023

සභාපති

ලංකා බැංකුව

ලංකා බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා බැංකුවේ ("බැංකුව") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගෙ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි .ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ප්‍රධාන විගණන කරුණු

ප්‍රවර්තන කාලපරිච්ඡේදය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී මාගේ වෘත්තිමය විනිශ්චය අනුව වඩාත් වැදගත් වන කරුණු ප්‍රධාන විගණන කරුණු ලෙස සලකයි.බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ විගණනයේදී මෙම කරුණු සමස්තයක් ලෙස සලකා බලනු ලබන අතර මෙම කරුණු පිළිබඳ වෙන් වෙන්ව මතයක් මා විසින් ප්‍රකාශ කරුණු නොලැබේ.

අංක 306/72, පොළුවිල පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රධාන විගණන කරුණු	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කරන ලද ආකාරය
ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ මූල්‍ය වත්කම්වල හානිකරණය සඳහා දීමනාව සටහන් 28 සහ 29 හි දක්වා ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්වල හානිකරණ සඳහා ප්‍රතිපාදන 4.4.11, 28 සහ 29 සටහන්වල විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව කළමනාකරණය විසින් තීරණය කර ඇත. මෙහි ප්‍රධාන විගණන කරුණක් වීමට හේතු වන්නේ, වාර්තා කරන ලද හානිකරණ ප්‍රතිපාදනවල ප්‍රමාණාත්මකභාවයට සංකීර්ණ ගණනය කිරීම්, විනිශ්චයන්හි ප්‍රමාණය, උපකල්පනවල වැදගත්කම සහ එවැනි මූල්‍ය වත්කම්වලින් ලැබීමට අපේක්ෂා කරන අනාගත මුදල් ඇස්තමේන්තු කිරීම හා සම්බන්ධ ඇස්තමේන්තු අවිනිශ්චිතාවන්හි මට්ටම් සම්බන්ධ වීමයි. හානිකරණය සඳහා වන ප්‍රතිපාදන තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරන ලද සැලකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනවල ප්‍රධාන ක්ෂේත්‍රවලට පහත සඳහන් දෑ ඇතුළත් විය. • වත්මන් ආර්ථික සංකෝචනය අන්තර්ගත කිරීම සඳහා කළමනාකරණ ආවරණ. • අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වත්මන් සහ අපේක්ෂිත අනාගත බාහිර සාධක පිළිබිඹු වන පරිදි ඉදිරි දැක්මක් ඇති තොරතුරු ඇතුළත් කිරීම, බහු ආර්ථික අවස්ථා වලදී සහ මෙම එක් එක් අවස්ථා සඳහා බරිත සම්භාවිතාව තීරණය කිරීම.	ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ මූල්‍ය වත්කම්වල හානිකරණය සඳහා වූ ප්‍රතිපාදනවල ප්‍රමාණවත් බව ආමන්ත්‍රණය කිරීමේදී, මගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය. මගේ වාර්තාවේ දිනය දක්වා පවතින තොරතුරු මත පදනම්ව, එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ වෙළඳපල ආර්ථික අස්ථාවරත්වයට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව හානිකරණ ගණනය කිරීම් සහ පාදකව පවතින ක්‍රමවේදයන් සඳහා බැංකුවේ විධිවිධාන පෙළගැස්වීම මම තක්සේරු කළෙමි. • බැංකුවේ කළමනාකාරිත්වය විසින් අධීක්ෂණ මට්ටම තක්සේරු කිරීම, හානිකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සඳහා ප්‍රතිපාදන සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම ඇතුළත්, හානිකරණ ඇස්තමේන්තු කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනයන් මම ඇගයීමට ලක් කළෙමි. • බැංකුවේ අදාළ මූලාශ්‍ර වාර්තා හා ගිණුම් වාර්තාවලට එකඟ කරමින් හානිකරණ ගණනය කිරීම් සඳහා පාදක කරගත් දත්තවල සම්පූර්ණතාවය හා නිරවද්‍යතාව මා විසින් පරීක්ෂා කරන ලදී. • ඉහත කරුණු වලට අමතරව පහත දැක්වෙන ක්‍රියාපටිපාටීන් සිදු කරන ලදී. ණය හා අත්තිකාරම් කේවල පදනමට හානිකරණය සඳහා ඇගයීම – ණය තත්ත්ව තක්සේරුවල සාධාරණත්වය මම ඇගයීමට ලක් කළෙමි. – මම පහතින් පවතින කේවල පදනමට හානිකරණය ගණනය කිරීම් වලට පාදක වූ අංක ගණිතමය නිරවද්‍යතාවය පරීක්ෂා කළෙමි. – වර්තමාන ආර්ථික සංකෝචනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සිදු කරන ලද හානිකරණය සඳහා ප්‍රතිපාදන සඳහා භාවිතා කරන ප්‍රධාන යෙදවුම්වල සාධාරණත්වය මම ඇගයීමට ලක් කළෙමි. විශේෂයෙන් ඉහළ අවදානම් කර්මාන්ත, ණය සහන සහ ඇපකරවල ප්‍රතිසාධන ක්‍රියාමාර්ගවල තත්ත්වය සම්බන්ධයෙන් මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු වටිනාකම සහ කාලසීමාව සැලකිල්ලට ගනිමින් එවැනි ඇගයීම් සිදු කරන ලදී. මූල්‍ය වත්කම් සාමූහික පදනමට හානිකරණය සඳහා ඇගයීම. – මම ණය හානිකරණය ප්‍රතිපාදන සඳහා භාවිතා කරන ප්‍රධාන යෙදවුම් සහ ගණනය කිරීම් පරීක්ෂා කළෙමි. – අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරන ලද විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු, පාදක ක්‍රමවේදය සහ කළමනාකරණ ආවරණ සාධාරණදැයි මම තක්සේරු කළෙමි.ලබා ගත හැකි වෙළඳපල දත්ත, සලකා බැලූ ආර්ථික අවස්ථා සහ එම එක් එක් අවස්ථා සඳහා පවරන ලද සම්භාවිතා බර මත පදනම්ව භාවිතා කරන ඉදිරි දැක්ම තොරතුරුවල සාධාරණ බව ඇගයීම මගේ පරීක්ෂණයට ඇතුළත් විය. • මම සටහන් 28 සහ 29 හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත් බව තක්සේරු කළෙමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රධාන විගණන කරුණු	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කරන ලද ආකාරය
තොරතුරු තාක්ෂණ පද්ධති සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය මත පාලනයන් බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීය ක්‍රියාවලි සහ අභ්‍යන්තර පාලනයන් සහිත බහු තොරතුරු තාක්ෂණ පද්ධති මත සැලකිය යුතු ලෙස රඳා පවතී. තවද, තොරතුරු තාක්ෂණ පද්ධති මගින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිතා කරමින් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සකස් කරනු ලැබේ, ඒවා පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කර ඇත. ඒ අනුව, මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ.	මගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය: • මූල්‍ය වාර්තාකරණයට සහ හෙළිදරව් කිරීම් වලට අදාළ ක්‍රියාවලියන්හි අභ්‍යන්තර පාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගත්තෙමි. • බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතිවල අදාළ පාලනයන් හඳුනාගෙන පරීක්ෂා කළෙමි. • පරිශීලක ප්‍රවේශය සහ වෙනස් කළමණාකරණයට අදාළ ඒවා ඇතුළුව තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාළ පාලනවල සැලසුම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීමට සහ ඇගයීමට මගේ විශේෂිත සම්පත් සම්බන්ධ කර ගත්තෙමි. • බැංකුවට බලපාන සයිබර් ආරක්ෂණ අවදානම් සහ මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව මූලික වශයෙන් විමසීම් තුළින් ඉහළ මට්ටමේ අවබෝධයක් ලබා ගත්තෙමි. • සාමාන්‍ය ලෙජර් සැසඳීම ඇතුළුව නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය සඳහා හෙළිදරව් කිරීම් උත්පාදනය කිරීමට භාවිතා කරන වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කළෙමි.

1.4 බැංකුවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමුහයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිලිබදව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුලත් නොවන තොරතුරු ,අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ .මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්දයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාලව,මගේ වගකීම වන්නේ ඉහත හදුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමය.

බැංකුවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට ,එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කලොත්,නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්,ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ .

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමුහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර,කළමනාකාරිත්වය සමුහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්වට අදාළ කරුණු අනාවරනය කිරීම ද කළමණාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමුහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව,සමුහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැක අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවන්හිදී සුදුසු විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී .

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී .
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර,එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විගණනය කල යුතුය.කෙසේ වුවද,අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩව පැවැත්ම අවසන් වීමට හැකිය .
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් .අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන් කළේ,
ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

8 ලාභ හෝ අලාභ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2022 රු. '000	බැංකුව 2021 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2022 රු. '000	සමූහය 2021 රු. '000	සමූහය වෙනස %
මුළු ආදායම	7	513,149,335	290,362,494	76.7	520,891,164	297,620,853	75.0
පොළී ආදායම		456,267,458	260,513,393	75.1	463,203,346	266,565,137	73.8
අඩු කළා: පොළී වියදම		329,921,080	149,261,452	121.0	333,434,454	151,575,510	120.0
ශුද්ධ පොළී ආදායම	8	126,346,378	111,251,941	13.6	129,768,892	114,989,627	12.9
ගාස්තු සහ කොමිස් ආදායම		22,837,771	17,649,434	29.4	23,165,682	17,931,406	29.2
අඩු කළා: ගාස්තු සහ කොමිස් වියදම		6,486,129	3,470,032	86.9	6,505,334	3,508,619	85.4
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	9	16,351,642	14,179,402	15.3	16,660,348	14,422,787	15.5
වෙළඳපොළ ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	10	17,602,384	4,742,396	271.2	17,678,455	4,813,011	267.3
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	11	(804,438)	1,347,097	(159.7)	(956,745)	1,309,021	(173.1)
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	12	861,349	393,920	118.7	877,853	466,392	88.2
වෙනත් මෙහෙයුම් ආදායම්	13	16,384,811	5,716,254	186.6	16,922,573	6,535,886	158.9
මූළු මෙහෙයුම් ආදායම		176,742,126	137,631,010	28.4	180,951,376	142,536,724	27.0
අඩු කළා: ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවිර්ත්‍ය) කිරීම	14	87,155,696	43,733,731	99.3	87,294,905	43,661,965	99.9
ශුද්ධ මෙහෙයුම් ආදායම		89,586,430	93,897,279	(4.6)	93,656,471	98,874,759	(5.3)
අඩු කළා: මෙහෙයුම් වියදම්							
සේවක මණ්ඩල වියදම්	15	28,991,429	24,981,940	16.0	31,352,978	26,925,255	16.4
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	16	4,286,899	4,146,256	3.4	4,507,368	4,239,633	6.3
වෙනත් වියදම්	17	14,018,161	12,552,393	11.7	15,423,966	13,866,816	11.2
මුළු මෙහෙයුම් වියදම		47,296,489	41,680,589	13.5	51,284,312	45,031,704	13.9
මූල්‍ය සේවා මත බදු වලට පෙර ලාභය/(අලාභය)		42,289,941	52,216,690	(19.0)	42,372,159	53,843,055	(21.3)
අඩු කළා: මූල්‍ය සේවා මත බදු	18.1	11,313,292	9,027,173	25.3	11,442,505	9,339,679	22.5
මූල්‍ය සේවා මත බදු වලට පසු ලාභය/(අලාභය)		30,976,649	43,189,517	(28.3)	30,929,654	44,503,376	(30.5)
ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස, බදු පසු	19	–	–	–	122,847	133,677	(8.1)
ආදායම් බද්දට පෙර ලාභය/(අලාභය)		30,976,649	43,189,517	(28.3)	31,052,501	44,637,053	(30.4)
අඩු කළා: ආදායම් බදු වියදම	18.2	(995,759)	5,599,410	(117.8)	(796,516)	5,953,659	(113.4)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		31,972,408	37,590,107	(14.9)	31,849,017	38,683,394	(17.7)
වර්ෂයේ ලාභයෙන්:							
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස		31,972,408	37,590,107	(14.9)	31,994,638	38,490,392	(16.9)
පාලනයට යටත් නොවන හිමිකම්		–	–	–	(145,621)	193,002	(175.5)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		31,972,408	37,590,107	(14.9)	31,849,017	38,683,394	(17.7)
කොටසක ඉපැයුම් සහ කොටසක ලාභාංශ	20						
කොටසක මූලික ඉපැයුම් (රු.)		1,278.90	1,503.60	(14.9)	1,279.79	1,539.62	(16.9)
කොටසක තනුක ඉපැයුම් (රු.)		1,272.08	1,503.60	(15.4)	1,272.96	1,539.62	(17.3)
කොටසක ලාභාංශ (රු.)		13.86	73.86	(81.2)	13.86	73.86	(81.2)

පිටු අංක 184 සිට 359 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව			සමූහය		
	2022 රු. '000	2021 රු. '000	වෙනස %	2022 රු. '000	2021 රු. '000	වෙනස %
වර්ෂය සඳහා ලාභය/(අලාභය)	31,972,408	37,590,107	(14.9)	31,849,017	38,683,394	(17.7)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්						
විදේශීය මෙහෙයුම්වල මූල්‍ය චාර්තා පරිවර්තනයේ දී ඇතිවන ශුද්ධ විනිමය ලාභ/(අලාභ)	7,564,044	794,531	852.0	9,843,204	1,126,180	774.0
මුදල් ප්‍රවාහ හෙජ් උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	22,381,369	3,239,266	590.9	22,381,369	3,239,266	590.9
වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන ණය උපකරණවල ආයෝජන මත ශුද්ධ ලාභ/(අලාභ)	1,328,890	(1,246,474)	(206.6)	1,312,732	(1,256,480)	(204.5)
වෙනත් විස්තීර්ණ අදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය ආයෝජන මත ශුද්ධ ලාභ/(අලාභ) ලාභයට හෝ අලාභයට මාරු කිරීම	(5,631)	(44,002)	(87.2)	(5,631)	(44,002)	(87.2)
ආරම්භක ශේෂය මත අනුපාත වෙනස් වීමේ බලපෑම ඇතුළුව විලම්බිත බදු බලපෑම	(140,185)	321,430	(143.6)	(140,185)	321,430	(143.6)
ආශ්‍රිත සමාගම්හි වෙනත් විස්තීර්ණ ආදායම් කොටස, බදු පසු	–	–	–	(20,342)	11,376	(278.8)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්ගේ එකතුව	31,128,487	3,064,751	915.7	33,371,147	3,397,770	882.1
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්						
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන ස්කන්ධ උපකරණවල සාධාරණ අගයේ වෙනස්කම්	(313,328)	(187,320)	67.3	547,780	(155,320)	(452.7)
ආරම්භක ශේෂය මත අනුපාත වෙනස් වීමේ බලපෑම ඇතුළුව විලම්බිත බදු බලපෑම	(586,301)	40,437	(1,549.9)	(586,301)	40,437	(1,549.9)
ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) වල වෙනස්කම්	1,818,193	(284,831)	(738.3)	3,695,662	345,441	969.8
ආරම්භක ශේෂය මත අනුපාත වෙනස් වීමේ බලපෑම ඇතුළුව විලම්බිත බදු බලපෑම	(1,859,253)	979,181	(289.9)	(2,422,494)	1,144,315	(311.7)
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභ)	(3,845,217)	6,769,360	(156.8)	(3,797,222)	6,834,355	(155.6)
ආරම්භක ශේෂය මත අනුපාත වෙනස් වීමේ බලපෑම ඇතුළුව විලම්බිත බදු බලපෑම	1,464,274	(2,024,826)	(172.3)	1,421,714	(2,040,425)	(169.7)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්ගේ එකතුව	(3,321,632)	5,292,001	(162.8)	(1,140,861)	6,168,803	(118.5)
වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු	27,806,855	8,356,752	232.8	32,230,286	9,566,573	236.9
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	59,779,263	45,946,859	30.1	64,079,303	48,249,967	32.8
මුළු විස්තීර්ණ ආදායමෙන්:						
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස	59,779,263	45,946,859	30.1	64,189,129	48,028,306	33.6
පාලනයට යටත් නොවන හිමිකම	–	–	–	(109,826)	221,661	(149.5)
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	59,779,263	45,946,859	30.1	64,079,303	48,249,967	32.8

පිටු අංක 184 සිට 359 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

8 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව 2022 රු. '000	බැංකුව 2021 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2022 රු. '000	සමූහය 2021 රු. '000	සමූහය වෙනස %
වත්කම්							
මුදල් සහ මුදල් හා සමාන දෑ	22	128,401,532	82,647,406	55.4	135,230,827	82,313,908	64.3
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	23	70,494,529	74,121,781	(4.9)	70,494,529	74,121,781	(4.9)
බැංකුවල ඇති තැන්පතු	24	16,459,303	4,957,417	232.0	17,811,665	5,342,369	233.4
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	25	1,480,403	2,074,474	(28.6)	1,463,368	2,976,664	(50.8)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	26	57,155,486	4,342,531	1,216.2	57,155,486	4,342,531	1,216.2
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	27	10,280,055	9,230,022	11.4	10,636,190	9,640,813	10.3
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්							
ණය සහ අත්තිකාරම්	28	2,325,594,329	2,413,762,291	(3.7)	2,355,978,333	2,446,330,329	(3.7)
ණය සහ වෙනත් උපකරණ	29	1,555,897,307	1,082,179,876	43.8	1,562,373,679	1,082,837,662	44.3
වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්	30	8,690,802	18,302,556	(52.5)	10,750,044	22,879,810	(53.0)
පරිපාලිත සමාගම්වල ආයෝජන	31	8,181,138	8,181,138	–	–	–	–
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	32	92,988	92,988	–	684,536	595,531	14.9
ආයෝජන දේපළ	33	2,414,640	2,414,640	–	104,798	107,704	(2.7)
දේපළ, පිරියත හා උපකරණ	34	34,845,004	32,757,485	6.4	50,992,323	46,944,191	8.6
භාවිත අයිතිය සහිත වත්කම්/කල්බදු දේපළ	35	3,002,305	3,137,955	(4.3)	2,624,300	2,825,719	(7.1)
අස්පෘශ්‍ය වත්කම්	36	1,442,433	1,039,985	38.7	1,593,344	1,214,591	31.2
විලම්බිත බදු වත්කම්	37	15,577,466	2,152,712	623.6	15,598,541	2,213,847	604.6
වෙනත් වත්කම්	38	96,449,984	61,888,586	55.8	97,276,598	63,262,306	53.8
මුළු වත්කම්		4,336,459,704	3,803,283,843	14.0	4,390,768,561	3,847,949,756	14.1
වගකීම්							
බැංකු වලට ගෙවිය යුතු	39	11,514,897	17,936,070	(35.8)	11,547,714	18,646,339	(38.1)
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	40	180,218,543	162,156,413	11.1	179,938,744	161,668,335	11.3
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	41	921,033	380,328	142.2	921,033	380,328	142.2
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම්							
තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	42	3,334,774,261	2,866,894,010	16.3	3,358,198,424	2,886,237,094	16.4
වෙනත් ණය ගැනීම්	43	390,489,543	444,107,977	(12.1)	397,083,583	447,875,002	(11.3)
නිකුත් කළ ණය සුරැකුම්පත්	44	–	–	–	58,807	2,107,182	(97.2)
ප්‍රවර්තන බදු වගකීම්	45	6,523,443	647,993	906.7	6,853,709	978,532	600.4
විලම්බිත බදු වගකීම්	37	–	–	–	2,694,221	2,153,309	25.1
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	46	–	–	–	355,190	413,743	(14.2)
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	46	–	–	–	662,773	526,017	26.0
වෙනත් වගකීම්	47	94,075,650	46,042,365	104.3	96,425,230	47,461,127	103.2
යටත් කාලීන වගකීම්	49	63,758,191	64,358,855	(0.9)	63,498,599	64,105,970	(0.9)
මුළු වගකීම්		4,082,275,561	3,602,524,011	13.3	4,118,238,027	3,632,552,978	13.4

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව 2022 රු. '000	බැංකුව 2021 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2022 රු. '000	සමූහය 2021 රු. '000	සමූහය වෙනස %
ස්කන්ධය							
කොටස් ප්‍රාග්ධනය	50	25,730,000	25,000,000	2.9	25,730,000	25,000,000	2.9
ස්ථාවර සංචිත අරමුදල	51	15,131,000	14,491,000	4.4	15,131,000	14,491,000	4.4
රඳවාගත් ඉපැයුම්	52	158,616,238	136,739,177	16.0	159,819,481	138,104,222	15.7
මුදල් ප්‍රවාහ හෙජ් සංචිත	53	25,620,635	3,239,266	690.9	25,620,635	3,239,266	690.9
වෙනත් සංචිත	54	29,086,270	21,290,389	36.6	45,172,451	32,972,844	37.0
බැංකුවේ කොටස්හිමියාට අයත් මුළු ස්කන්ධය		254,184,143	200,759,832	26.6	271,473,567	213,807,332	27.0
පාලනයට යටත් නොවන හිමිකම	55	–	–	–	1,056,967	1,589,446	(33.5)
මුළු ස්කන්ධය		254,184,143	200,759,832	26.6	272,530,534	215,396,778	26.5
මුළු වගකීම් සහ ස්කන්ධය		4,336,459,704	3,803,283,843	14.0	4,390,768,561	3,847,949,756	14.1
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	57	1,344,899,769	999,726,729	34.5	1,346,920,056	1,018,141,749	32.3
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	50	10,167.37	8,030.39	26.6	10,858.94	8,552.29	27.0

පිටු අංක 184 සිට 359 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කරන බවට සහතික කරමි.

එම් පී රුවන් කුමාර
වැඩ බලන ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

රොනල්ඩ් සී පෙරේරා
සභාපති

ඒ සී එම් ප්‍රනාන්දු
අධ්‍යක්ෂ

ඩබ් පී රසල් ෆොන්සේකා
මහා කළමනාකරු

2023 පෙබරවාරි 24
කොළඹ දීය.

8 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

බැංකුව

	සටහන	කොටස් ප්‍රාග්ධනය	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	මුදල් ප්‍රවාහ හෙජ් සංචිත
		රු. '000	රු. '000	රු. '000	රු. '000
2021 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	–	13,739,000	–
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		–	–	–	–
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		–	–	–	3,239,266
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		–	–	–	3,239,266
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
2021 සඳහා ලාභාංශ	20.3	–	–	–	–
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	–	–	752,000	–
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන අතිරික්තය		–	–	–	–
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ මුළු ගනුදෙනු		–	–	752,000	–
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	–	14,491,000	3,239,266
2022 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	–	14,491,000	3,239,266
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		–	–	–	–
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		–	–	–	22,381,369
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		–	–	–	22,381,369
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
අධිභාර බද්ද		–	–	–	–
2022 සඳහා ලාභාංශ	20.3	–	–	–	–
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	50.1	–	730,000	–	–
වෙනත් විස්තීර්ණ අදායම් සංචිතයෙන් මාරු කිරීම	54.4	–	–	–	–
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	–	–	640,000	–
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ මුළු ගනුදෙනු		–	730,000	640,000	–
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	730,000	15,131,000	25,620,635

පිටු අංක 184 සිට 359 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

අනෙකුත් සංචිත				
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	වෙනත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
1,704,356	2,550,889	16,681,190	96,983,948	156,659,383
–	–	–	37,590,107	37,590,107
(1,115,929)	794,531	694,350	4,744,534	8,356,752
(1,115,929)	794,531	694,350	42,334,641	45,946,859
–	–	–	(1,846,410)	(1,846,410)
–	–	–	(752,000)	–
–	–	(18,998)	18,998	–
–	–	(18,998)	(2,579,412)	(1,846,410)
588,427	3,345,420	17,356,542	136,739,177	200,759,832
588,427	3,345,420	17,356,542	136,739,177	200,759,832
–	–	–	31,972,408	31,972,408
283,445	7,564,044	(41,060)	(2,380,943)	27,806,855
283,445	7,564,044	(41,060)	29,591,465	59,779,263
			(6,738,542)	(6,738,542)
–	–	–	(346,410)	(346,410)
–	–	–	–	730,000
(10,548)	–	–	10,548	–
–	–	–	(640,000)	–
(10,548)	–	–	(7,714,404)	(6,354,952)
861,324	10,909,464	17,315,482	158,616,238	254,184,143

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

සමූහය

	සටහන	කොටස් ප්‍රාග්ධනය	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	මූදල් ප්‍රවාහ හෙජ් සංචිත
		රු. '000	රු. '000	රු. '000	රු. '000
2021 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	–	13,739,000	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		–	–	–	–
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		–	–	–	3,239,266
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		–	–	–	3,239,266
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
2021 සඳහා ලාභාංශ	20.3	–	–	–	–
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		–	–	–	–
පරිපාලිතයන්හි පාලනය අහිමිවීම		–	–	–	–
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	–	–	752,000	–
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන අතිරික්තය		–	–	–	–
පාලනයට යටත් නොවන හිමිකම වෙනස් වීම		–	–	–	–
ලබා නොගත් ලාභාංශ නැවත මාරු කිරීම		–	–	–	–
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු		–	–	752,000	–
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	–	14,491,000	3,239,266
2022 ජනවාරි 1 දිනට ශේෂය		25,000,000	–	14,491,000	3,239,266
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		–	–	–	–
වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු		–	–	–	22,381,369
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		–	–	–	22,381,369
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
අධිභාර බද්ද		–	–	–	–
2022 සඳහා ලාභාංශ	20.3	–	–	–	–
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	50.1	–	730,000	–	–
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයෙන් මාරු කිරීම		–	–	–	–
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	51	–	–	640,000	–
පාලනයට යටත් නොවන හිමිකම වෙනස් වීම		–	–	–	–
ලබා නොගත් ලාභාංශ නැවත මාරු කිරීම		–	–	–	–
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු		–	730,000	640,000	–
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		25,000,000	730,000	15,131,000	25,620,635

පිටු අංක 184 සිට 359 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස					
	අනෙකුත් සංචිත				
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය රු. '000	වෙනත් සංචිත රු. '000	ප්‍රත්‍යාගණන සංචිතය රු. '000	රඳවාගත් ඉපැයුම් රු. '000	පාලනයට යටත් නොවන හිමිකම රු. '000	මුළු හිමිකම රු. '000
2,573,148	4,060,608	24,853,005	97,463,266	1,267,787	168,956,814
–	–	–	38,490,392	193,002	38,683,394
(1,089,736)	1,126,180	1,468,637	4,793,566	28,660	9,566,573
(1,089,736)	1,126,180	1,468,637	43,283,958	221,662	48,249,967
–	–	–	(1,846,410)	–	(1,846,410)
–	–	–	–	(10,280)	(10,280)
–	–		(64,923)	(6,142)	(71,065)
–	–	–	(752,000)	–	–
–	–	(18,998)	18,998	–	–
–	–	–	–	116,419	116,419
–	–	–	1,333	–	1,333
–	–	(18,998)	(2,643,002)	99,997	(1,810,003)
1,483,412	5,186,788	26,302,644	138,104,222	1,589,446	215,396,778
1,483,412	5,186,788	26,302,644	138,104,222	1,589,446	215,396,778
–	–	–	31,994,638	(145,621)	31,849,017
1,111,492	9,843,204	1,255,459	(2,397,033)	35,795	32,230,286
1,111,492	9,843,204	1,255,459	29,597,605	(109,826)	64,079,303
–	–	–	(7,042,422)		(7,042,422)
–	–	–	(346,410)	–	(346,410)
–	–	–	–	–	730,000
(10,548)	–	–	10,548	–	–
–	–	–	(640,000)	–	–
–	–	–	134,511	(422,653)	(288,142)
–	–	–	1,427	–	1,427
(10,548)	–	–	(7,882,346)	(422,653)	(6,945,547)
2,584,356	15,029,992	27,558,103	159,819,481	1,056,967	272,530,534

8 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2022 රු. 000	බැංකුව 2021 රු. 000	සමූහය 2022 රු. 000	සමූහය 2021 රු. 000
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
ආදායම් බදු පෙර ලාභය		30,976,649	43,189,517	31,052,501	44,637,053
ගැලපුම්:					
ශුද්ධ පොළී ආදායම	8	(126,346,378)	(111,251,941)	(129,768,892)	(114,989,627)
ලාභාංශ ආදායම	10/13	(450,977)	(302,564)	(515,426)	(391,238)
පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වලින් ලැබූ ලාභාංශ	13	(107,430)	(394,454)	–	–
ආශ්‍රිත සමාගම්වල (ලාභ)/පාඩු කොටස, බදු පසු	19	–	–	(122,847)	(133,677)
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	56.1	(392,658,229)	(495,708,888)	(389,853,461)	(497,153,928)
මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්	56.2	510,080,706	535,337,949	517,045,767	535,950,023
බදු පෙර ලාභයේ ඇතුළත් මුදල් නොවන වෙනත් අයිතමයන්	56.3	105,190,513	46,351,388	105,731,706	46,385,644
ආයෝජන කටයුතුවලින් ලද වෙනත් ශුද්ධ ලාභ		(56,912)	(1,741,017)	72,145	(1,775,413)
		126,627,942	15,479,990	133,641,493	12,528,837
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් ප්‍රතිලාභ ගෙවීම		(11,204,969)	(8,890,151)	(11,275,993)	(8,897,006)
පොළී ලැබීම්		289,089,403	193,501,226	295,198,149	199,239,746
පොළී ගෙවීම්		(177,094,051)	(136,973,421)	(180,307,490)	(138,568,991)
ලාභාංශ ලැබීම්		73,282	75,792	73,282	126,157
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්, බදු පෙර		227,491,607	63,193,436	237,329,441	64,428,743
ආදායම් බදු ගෙවීම්	45	(5,500,380)	(8,166,811)	(5,796,331)	(8,399,520)
අධිභාර බදු ගෙවීම්		(6,738,542)	–	(7,042,422)	–
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්		215,252,685	55,026,625	224,490,688	56,029,223
ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ					
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජනවල ශුද්ධ වැඩිවීම්		(136,219,260)	(345,016,186)	(142,193,560)	(344,484,560)
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම		10,731,712	(4,346,097)	14,095,845	(6,339,860)
පරිපාලිත සමාගම්වල ආයෝජන		–	(1,668,090)	–	–
පරිපාලිත සමාගම් විකිණීමෙන් ලද ආදායම		–	–	–	180,550
දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්		(2,243,640)	(1,771,198)	(2,301,746)	(1,900,544)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම්		(1,027,211)	(471,365)	(1,039,078)	(471,365)
දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලැබීම්		1,414	21,998	8,748	102,831
ලාභාංශ ලැබීම්		485,126	621,226	448,891	265,081
පොළී ලැබීම්		115,497,384	53,951,314	116,324,524	54,264,536
ආයෝජන කටයුතු වලින් ලද/(භාවිතා කළ) ශුද්ධ මුදල්		(12,774,475)	(298,678,398)	(14,656,376)	(298,383,331)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව 2022 රු. 000	බැංකුව 2021 රු. 000	සමූහය 2022 රු. 000	සමූහය 2021 රු. 000
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
වෙනත් ණයට ගැනීම්වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම්)		(64,302,108)	245,235,448	(61,175,038)	245,076,637
කොටස් නිකුතුවෙන් ලද මුදල්		730,000	–	730,000	233,902
ණයකර/ප්‍රාග්ධන බැඳුම්කර නිකුතුවෙන් ලද මුදල්		6,490,000	8,750,000	6,557,700	8,500,000
ණයකර නිදහස් කිරීම සඳහා ගෙවූ මුදල්		(8,103,950)	(9,232,254)	(10,211,132)	(9,222,244)
බැංකුවේ කොටස්හිමියාට ගෙවූ ලාභාංශ		(346,410)	(1,846,410)	(346,410)	(1,846,410)
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ ලාභාංශ		–	–	–	(10,280)
කොටස් නැවත මිලදී ගැනීම සඳහා ගෙවීම්		–	–	(287,910)	–
ණය ගැනීම් හා ණය සුරැකුම්පත් සඳහා පොළී ගෙවීම්		(85,222,144)	(16,443,988)	(85,537,678)	(17,165,671)
මූල්‍ය කටයුතු වලින් ලද/(භාවිතා කළ) ශුද්ධ මුදල්		(150,754,612)	226,462,796	(150,270,468)	225,565,934
වර්ෂය තුළදී මුදල් සහ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		51,723,598	(17,188,977)	59,563,844	(16,788,174)
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		66,789,233	83,978,210	65,745,466	82,533,640
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		118,512,831	66,789,233	125,309,310	65,745,466
මුදල් සහ මුදල් හා සමාන දෑ විශ්ලේෂණය					
මුදල් සහ මුදල් හා සමාන දෑ	22	128,401,532	82,647,406	135,230,827	82,313,908
බැංකු අයිරා	39	(9,888,701)	(15,858,173)	(9,921,517)	(16,568,442)
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		118,512,831	66,789,233	125,309,310	65,745,466

පිටු අංක 184 සිට 359 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

8 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 වාර්තාකරණ ඒකකය

1.1 ආයතනික තොරතුරු

ලංකා බැංකුව ("බැංකුව"), 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත යටතේ 1939 අගෝස්තු 1 දින ශ්‍රී ලංකාව තුළ ප්‍රතිෂ්ඨාපිත රාජ්‍ය බැංකුවකි. 1988 අංක 30 දරණ බැංකු පනත හා ඒ හා අනුෂාංගික සංශෝධනවලට යටත්වන ලෙස ස්ථාපිත කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ලංකා බැංකුවේ ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ 01, ලංකා බැංකු මාවතේ, ලංකා බැංකු චතුරශ්‍රයෙහි අංක 01 දරණ ස්ථානයේ පිහිටා ඇත. ලංකා බැංකුව නිකුත් කර ඇති ණයකර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත. 2022 දෙසැම්බර් 31 දිනට සේවකයින් 8,209 ක් ලංකා බැංකුවෙහි සේවයේ නියුක්තව සිටියහ (2021 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 8,337 කි).

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2022 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන බැංකුව, ඊට අයත් වන පරිපාලිතයන් (බැංකුව සහ එහි පරිපාලිතයන්ගේ එකතුව සමූහය සහ තනිව ගත් කල සමූහ ආයතන ලෙස හැඳින්වේ) සහ ආශ්‍රිත සමාගම්වල සමූහයට ඇති අයිතිය අයත් වන ආකාරයට සකස් කර ඉදිරිපත් කර ඇත. සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකොඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම සහ සී/ස සීබෑන්ක් ඇසෙට් මැනෙජ්මන්ට් සමාගම යන ආශ්‍රිත සමාගම් හැර සමූහයේ අනෙකුත් සමාගම්වල ගිණුම් වර්ෂය දෙසැම්බර් 31 න් අවසන් වේ. සමූහයේ අවසාන මව් සමාගම බැංකුව වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම්

1.3.1 බැංකුව

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ප්‍රාථමික වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ වත්කම් කළමනාකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණයපත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

1.3.2 පරිපාලිතයන්

ලංකා බැංකුවේ පරිපාලිතයන්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත:

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම	ලංකා බැංකු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ අයිතිය, පාලනය, නඩත්තු කිරීම හා උපයෝගීතාවය රඳවා ගැනීම.
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	කල්බදුකරණය සහ කුලී පිට ගනුදෙනු, ආයතනික හා ශාඛා ණය පහසුකම්, ආයතනික උපදේශක සේවා, ප්‍රාග්ධන වෙළඳපොළ ක්‍රියාකාරකම්, ආන්තික වෙළඳාම සහ ක්ෂුද්‍ර මූල්‍යනය, කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම, දේපළ ආශ්‍රිත සේවා, උකස් සේවා, ඉස්ලාමීය මූල්‍යකරණය සහ තැන්පතු බාරගැනීම.
ලංකා බැංකුව (යූ කේ) සමාගම	එක්සත් රාජධානියේ මූල්‍ය සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති, වාණිජ බැංකුවක් වන අතර, ශාඛා සහ ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත බැංකු සේවා සහ වෙළඳ මූල්‍ය සේවා සැපයීමේ නිරතව සිටී.
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම	කොළඹ 03, බී ඕ සී මර්චන්ට් ටවර් හි සහ මහනුවර සීබෑන්ක් හවුස් හි කාර්යාල අවකාශ කුලියට දීම.
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සේවා සම්බන්ධ කටයුතුවල නිරතවීම.
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	හෝටල් සේවා සැපයීම.
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක නිවාස/හෝටල්/විවේකාගාර/ආගන්තුක නිවාස කළමනාකරණය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගම	ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ සේවා සැපයීම.
සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම	මෙහෙයුම් කටයුතු නවතා ඇත.

1.3.3 ආශ්‍රිතයන්

ලංකා බැංකුවේ ආශ්‍රිත සමාගම්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	ඒකක භාර අරමුදල් සහ ආයතනික සහ පෞද්ගලික ආයෝජන කළමනාකරණය.
සී/ස ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගම	ලියාපදිංචි කොටස් තැරැව්කරුවෙකු වන අතර ස්කන්ධ සහ ණය සුරැකුම් ගනුදෙනු, ස්කන්ධ සහ ණය සුරැකුම් තැරැව්කාර සේවා සහ ණය සහ ස්කන්ධ සුරැකුම් භාර ගැනීම.
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම	ගොඩනැගිලි සහ වත්කම් කුලියට දීම.
සී/ස සද්ර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම	ක්‍රියාකාරිත්වයේ නොමැති අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම, 2007 වසරේ සිට සිය මූලික ව්‍යාපාර කටයුතු සිදු කර නැත. සී/ස සද්ර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම ක්‍රියාකාරිත්වයේ නොමැති අතර සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් සමාගම ඈවර කිරීමට තීරණය කර ඈවර කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

2.1 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන ප්‍රතිපාදන, 1988 අංක 30 දරණ බැංකු ආඥා පනත හා එහි සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං.ගි.ප්‍ර/ශ්‍රී.ල.මූ.වා.ප්‍ර) අනුව, බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි හා ආශ්‍රිතයන්හි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

- ලාභ හෝ අලාභ ප්‍රකාශනය
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 පෙබරවාරි 24 වන දින අනුමත කරන ලදි.

3 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

3.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී. ලං. මූ. වා. ප්‍ර.) හා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං. ගි. ප්‍ර.) වලින් සමන්විත වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මගපෙන්වීම් අනුකූලව සකස් කර ඇත.

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට, 1988 අංක 30 දරණ බැංකු පනතට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සිදුකර ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කෙරෙන පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2022 දෙසැම්බර් 31 වැනි දිනට බලපැවැත්වෙන ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර සහ ලං.ගි.ප්‍ර. වලට අනුකූල වන පරිදි පිළියෙළ කර ඇති අතර ඒ සමඟ සංසන්දනාත්මක වර්ෂය වන 2021 දෙසැම්බර් 31 වැනි දිනට සහ දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දත්ත ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2019 අංක 2 දරණ බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළිදරව් කිරීම් ප්‍රසිද්ධ කිරීමට අදාල චක්‍ර ලේඛනය මඟින් නියම කර ඇති ආකෘතියට අනුගත වෙමින් මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළිදරව් කිරීම් සඳහා ආකෘති භාවිතා කර ඇත.

3.2 මිනුම්කරණයේ පදනම

පහත සඳහන් ඒවා හැරුණු විට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සංගතතා පදනමට චෛතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නා වූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගය මත මැනීම (සටහන් අංක 26 සහ 41)
- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය උපකරණ (සටහන් අංක 27)
- වෙනත් විස්තීරණ අදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම් (සටහන් අංක 30)
- අයිතිකරු විසින් පදිංචි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන්කිරීම් අඩු කල අගයට වාර්තා කෙරේ (සටහන් අංක 34).
- නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් ආයුගණකවරයෙකු විසින් තක්සේරු කර වර්තමාන අගය මත හඳුනාගත් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වලින් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කර වාර්තා කරනු ලැබේ (සටහන් අංක 48).
- මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය, හෙජ් ගිණුම්කරණයට අනුව ගිණුම්ගත කර ඇත (සටහන් අංක 53).

3.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති අයිතම එම අයිතමයේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය හා කල්පිරීමේ කාලය අනුව පෙළගස්වා ඉදිරිපත් කරනු ලැබේ. වාර්තාකරණ දිනයේ සිට මාස 12 ඇතුලත කල් පිරෙන (ජංගම) හා මාස 12 න් පසුව කල්පිරෙන (ජංගම නොවන) වත්කම් හා වගකීම් පිලිබඳ විස්තරයක් සටහන් අංක 60, වත්කම් හා වගකීම් වල කල්පිරීම විශ්ලේෂණය හි අන්තර්ගත වේ.

3.3.1 ව්‍යවහාර හා වාර්තාකරණ මුදල් ඒකක

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් අයිතමයන් මිනුම්කරණය හා වාර්තාකරණය කරනු ලබන්නේ බැංකුව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ පවතින මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

3.3.2 උපචිත පදනම මත ගිණුම්කරණය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය හැරුනු කොට අනෙකුත් මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

3.3.3 හිලව් කිරීම

සාමාන්‍යයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල මූල්‍ය වත්කම් හා වගකීම් වෙන් වෙන් වශයෙන් වාර්තා කරන අතර මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කිරීම, ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදුවන්නේ නීතිමය වශයෙන් බලය ලබාදී ඇති විටක සහ පහත සඳහන් අවස්ථාවල දී සම්බන්ධිත පාර්ශවයන් විසින් එකවිටම වත්කම් උපලබ්ධිය මඟින් වගකීම් පියවා ගැනීමේ අදහස් ඇති විට පමණක් වේ.

- සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු
- ණය පැහැර හැර ඇති අවස්ථාවක දී
- බැංකුවට/ සමූහයට සහ එහි පාර්ශ්වයන්ට වගකීම් පියවීමට නොහැකි අවස්ථාවන්හි හෝ බුන්වත් අවස්ථා වල දී

ගිණුම්කරණ ප්‍රමිතයක් මඟින් ඉඩ සලසා ඇති අවස්ථාවල දී හෝ අර්ථ නිරූපනය කර ඇති විටක සහ විශේෂයෙන් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තින්හි සඳහන් කර ඇති විටක පමණක් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සඳහන් අදායම් සහ වියදම් හිලව් කරනු ලැබේ.

3.3.4 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අවශ්‍ය අවස්ථා හිදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු විස්තරාත්මකව දක්වා ඇත. ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට සමගාමීව පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අතර ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කිරීම් වලට අනුකූල වීම සඳහා අවශ්‍ය අවස්ථාවන් වලදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලැබේ.

3.3.5 ප්‍රමාණාත්මකභාවය සහ ඒකරාශි කිරීම

ලං. ගි. ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අනුකූලව, සමාන අයිතමයන්හි සෑම ප්‍රමාණාත්මක වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. විවිධ ස්වභාවයේ අසමාන අයිතමයන් හෝ කාර්යයන් ද ප්‍රමාණාත්මකවේ නම් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

3.3.6 වැටයීම

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විටෙක, ලං.ගි.ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" ට අනුව සියලුම අගයන් ආසන්නම රුපියල් දහස දක්වා වන පරිදි වටයා ඇත.

3.3.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ලං. ගි. ප්‍ර. 7 "මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" ප්‍රමිතියට අනුව ලාභයට ගැලපීම් කර මෙහෙයුම් මුදල් ප්‍රවාහ ගණනය කිරීමේ වක්‍ර ක්‍රමයට සිදු කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ යටතට අතැති මුදල්, ද්‍රවශීලතාවයෙන් ඉහළ දින 7 කට අඩු කාලයකදී පරිණත ආයෝජන සහ බැංකු අයිරා අයත්වේ.

3.3.8 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේ භාවිතය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ඒ සඳහා භාවිතා කළ යුතු සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, තීරණය කිරීම හා වාර්තා වන වත්කම් සහ වගකීම් අගයන් මෙන්ම ආදායම් සහ වියදම් නිශ්චය කිරීමේ දී ඒ සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිශ්චය කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. සැබෑ ප්‍රතිඵලය ඇස්තමේන්තු සමඟ වෙනස් විය හැක. විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් අතීත අත්දැකීම් සහ විවිධ අවස්ථාවන් මත සෑහීමකට පත්විය හැකි සාධක මත පදනම් වන අතර මේවා කාලීන පදනමක් මත සමාලෝචනයට භාජනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සමාලෝචනයේ දී ඒවා පිළිබඳව සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළ දී සහ අනාගත කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධනයන් අදාළ වන පරිදි ගිණුම්ගත කෙරේ. සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමේ දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වඩා වැදගත් බලපෑමක් ඇති කරන්නා වූ අගයන් මත කළමනාකරණය විසින් පහත සඳහන් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් භාවිතා කර ඇත. තවද, සමූහයේ වත්කම් මැනීමේදී අදාළ පරිදි ඇස්තමේන්තුවල වෙනස්කම් සිදු කරන ලදී. උපකල්පන, ඇස්තමේන්තු තීරණයන් සහිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

3.3.8.1 අඛණ්ඩ පැවැත්ම

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි බවට සෑහීමකට පත්විය හැකි සම්පත්, සමූහය සතු බවට කළමනාකාරිත්වය තක්සේරුවක් කර ඇත. තවද සමූහයෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකියයුතු අවිශ්වාසයක් හෝ අවිනිශ්චිතතාවයක් කළමනාකාරිත්වය හඳුනාගෙන නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සමූහය අඛණ්ඩව පවතීය යන සංකල්පය භාවිතා කර ඇති අතර අඛණ්ඩව පවතීය යන පදනම සාධාරණ යැයි කළමනාකාරිත්වය සෑහීමකට පත්වී ඇත.

3.3.8.2 බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියළුම හඳුනාගත හැකි සහ මැනිය හැකි වගකීම් හි වටිනාකම් ගිණුම් තබනු ලැබේ. අසම්භාව්‍ය වගකීම් යනු අනාගත අවිනිශ්චිත සිදුවීම්වල තහවුරු කිරීමක් මත ඇතිවිය හැකි බැඳියාවක් හෝ වර්තමානයේ බැඳීමක් ඇතත් ආර්ථික ප්‍රතිලාභයන් ගලා යාමේ සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි වගකීම්ය. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර, ඒවායේ සිදුවිය හැකි බව දුරස්ථ නොවන්නේ නම් අනාවරණ කරනු ලැබේ.

3.3.8.3 සාධාරණ අගය මත මූල්‍ය උපකරණ

අගය කරනු ලබන දිනට වෙළඳපළ ගනුදෙනුකරුවන් අතර සාමාන්‍ය ව්‍යාපාර කටයුත්තක් ලෙස වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් පියවීමට ගෙවන මුදල සාධාරණ අගය වේ.

සාධාරණ අගයට වර්ගකරන වත්කම් වල හෝ වගකීම් වල සාධාරණ අගය ප්‍රශස්ත ක්‍රියාකාරී වෙළඳපොළක ඇති ඉල්ලුම් මිල හෝ ඉදිරිපත් කරන මිල ලෙස තක්සේරු කරනු ලැබේ.

කිසියම් වත්කමකට හෝ වගකීමකට අදාලව ක්‍රියාකාරී වෙළඳපොළක් නොමැති අවස්ථාවල එම වත්කම් වල හෝ වගකීම් වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා ගණිතමය තක්සේරු ක්‍රම, ආසන්නව සිදුවූ සාධාරණ ගනුදෙනුවල තීරණය වූ මිල, වට්ටම් කල මුදල් ප්‍රවාහ විශ්ලේෂණය, මිල කිරීම් ආදී තක්සේරු ක්‍රම යොදා ගනී. සාධාරණ අගය ගණනය කිරීමේදී ණය අවදානමද අදාල පරිදි ගලපනු ලැබේ.

මෙම අගය කිරීමේ ක්‍රමවලදී අවම වශයෙන් ආයතනයට විශේෂ වූ යෙදවුම් පදනම් වන අතර උපරිම වශයෙන් හඳුනාගත හැකි වෙළඳපොළ යෙදවුම් යොදාගනී.

මූල්‍ය උපකරණයක් මුල් වරට හඳුනා ගැනීමේදී සාධාරණ අගය සඳහා ප්‍රශස්ත පදනම ගනුදෙනු කරන ලද මිලයි. එසේ නොමැතිනම් එම මූල්‍ය උපකරණ වල හඳුනාගත් වෙලඳපලක වර්තමාන ගනුදෙනු මිල හෝ හඳුනාගත් වෙළඳපලක දත්ත පදනම්ව සිදු කරන අගය කිරීම් යොදාගනු ලැබේ. සමූහය විසින් සාධාරණ අගය සහ ගනුදෙනු මිල අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයට හඳුනා ගනී. මූල්‍ය උපකරණ අගය කිරීම සවිස්තරාත්මකව සටහන් 63 හි දක්වා ඇත.

කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා මූල්‍ය වෙලඳපොළවල ඇතිවූ සැලකිය යුතු උච්චාවචනයන් නිසා සමූහයේ මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම තීරණය කිරීමේදී සැලකිය යුතු බලපෑමක් සිදුවී නොමැත.

3.3.8.4 ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ

ණය හා අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ තීරණය කිරීමේදී ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ මුදල් ප්‍රවාහ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණයට නිගමන වලට එළඹීමට සිදුවේ.

ඒ අනුව සෑම වාර්තා කරන දිනකට අදාලව සමූහය විසින් කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් ඇගයීමක් සිදු කරන අතර හානිකරණ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කෙරේ.

විශේෂයෙන්ම හානිකරණ අලාභය ගණනයේදී අනාගත මුදල් ප්‍රවාහ ප්‍රමාණ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චයන් අවශ්‍යවේ.

මෙම මුදල් ප්‍රවාහ නිර්ණය කිරීමේදී සමූහය විසින් ණයකරුගේ මූල්‍ය තත්ත්වය, උකස්කරයන් විකුණා ලැබිය හැකි මිල ආදී කරුණු සලකා බලයි. සාධක බොහෝමයක් සඳහා සිදු කරනු ලබන උපකල්පන මත මෙම තක්සේරුව සිදු කරනු ලබන නිසා සත්‍ය ප්‍රතිඵල වෙනස් වීම මත හානිකරණ ප්‍රතිපාදන වලටද අනාගත වෙනස්කම් ඇති විය හැකිය. කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ කේවල වශයෙන් ප්‍රමාණාත්මක වුවත් හානිකරණය නොවූ ණය සහ අත්තිකාරම් සමාන ලක්ෂණ සහිත කාණ්ඩ වලට බෙදා සමූහ හානිකරණ වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

සමූහ හානිකරණ ඇගයීමේදී ණය කළඹයන්හි ණයවල ගුණාත්වය, හිඟ මට්ටම, ණය භාවිතය ආදිය සහ සංකේන්ද්‍රණ අවදානම, විරැකියාව, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදන වර්ධනය, රටට අදාල දර්ශක ආදී ආර්ථික දත්තයන්ද, විවිධ පුද්ගල සමූහයන්ගේ කාර්යය සාධනයන්ද සැලකිල්ලට ගෙන ඇත.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 – "මූල්‍ය උපකරණ" වලට අනුව අපේක්ෂිත ණය අලාභ ක්‍රමය පදනම්ව ණය හානි අවශ්‍යතා හඳුන්වා දී ඇති අතර එමඟින් මූල්‍ය උපකරණයන්හි ණය ගුණාත්මකතාවයේ වර්ධනය හෝ අඩුවීම නිරූපනය වේ. සමූහය විසින් කේවල වශයෙන් හෝ සමූහ වශයෙන් අපේක්ෂිත ණය අලාභය ගණනය කරනු ලැබේ. මූලික හඳුනා ගැනීමේ සිට ණය වල ගුණාත්වය පහළ යාම පදනම්ව ණය හානිකරණය හෝ වෙන් කිරීම් ලෙස අපේක්ෂිත අලාභ ප්‍රමාණය හඳුනා ගන්නා අතර එය පහත පරිදි ගණනය කරනු ලැබේ.

- ඉදිරි මාස 12 තුළ අපේක්ෂිත ණය අලාභ (අදියර 1); සැලකිය යුතු ලෙස ණය අවදානම් අඩු තත්ත්වයක්.
- ආයු කාලය පුරා අපේක්ෂිත ණය අලාභ (අදියර 2 සහ අදියර 3); තනි තනි වශයෙන් හෝ කාණ්ඩ වශයෙන් ණය අවදානම ඉහළ ගොස් ඇති විට මෙම පදනම යොදා ගනේ.

සමූහය විසින් අපේක්ෂිත ණය අලාභ ක්‍රමයට අදාලව පහත සඳහන් අමතර නිගමනයන් හා තක්සේරු සිදු කර ඇත.

- මූල්‍ය වත්කම් වල ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්නම් ඒවා ආයුකාලය පුරා අපේක්ෂිත ණය අලාභ පදනමට අගය කල යුතුය.
- අපේක්ෂිත ණය අලාභ ආකෘතීන් ගොඩ නැගීමේදී විවිධ සමීකරණ සහ යෙදවුම් වල තෝරා ගැනීම් සිදු කල යුතුය.
- දළ දේශීය නිෂ්පාදන වර්ධනය, උද්ධමනය, පොළී අනුපාත, විදේශීය විනිමය අනුපාත සහ සේවා වියුක්තිය වැනි සාර්ව ආර්ථික තත්ත්වයන් ණය පැහැර හැරීමේ සම්භාවිතාව, ණය පැහැර හරින අවස්ථාවේ නිරාවරණ අගය සහ ණය පැහැර හැරීමේ අලාභය සමඟ පවතින සම්බන්ධතාවය නිර්ණය කිරීම.
- අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීමේ ආකෘතියට අනාගත සාර්ව ආර්ථික යෙදවුම් තෝරා ගැනීම හා බර තැබීම.

සාමූහික ප්‍රතිපාදන ගණනය කිරීම සඳහා පාදක වූ ආර්ථික අවස්ථා සහ ඉදිරි දැක්ම සාර්ව ආර්ථික උපකල්පන සටහන 4.4.11 හි දක්වා ඇත.

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව සමාන ලක්ෂණ සහිත ණය සඳහා සමූහ හානිකරණ වෙන්කිරීම සංඛ්‍යාත්මක ආකෘතියක් හෝ අතීත පාඩු අනුපාත අත්දැකීම් පදනම් සම්කරණ ප්‍රවේශය, හිඟ හිටි දින පිලිබඳ තොරතුරු පදනම්ව අලාභ ප්‍රමාණය තීරණය කිරීම සඳහා සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමවේදයන්ද යොදා ගනිමින් ගණනය කරයි. අලාභ ඇස්තමේන්තුව තහවුරු කර ගැනීම සඳහා වාර්තා කරන දිනයට ගැලපෙන ආකාරයට ආර්ථික තත්ත්වයන් සහ ණය කළඹේ සුවිශේෂිතා ගැලපීම සඳහා අතීත තොරතුරු ගලපනු ලැබේ. අලාභ ප්‍රතිශත සත්‍ය අලාභ සමඟ නිරතුරුව සසඳා බලනු ලැබේ. සත්‍ය අලාභ අත්දැකීම් පදනම්ව ආකෘති කාලානුරූප ඇගයීම් සිදු කිරීම හා ගැලපීම් සිදු කිරීම සමූහයේ ප්‍රතිපත්තියයි. ආකෘතිවල යොදාගන්නා උපකල්පන සහ හානිකරණ පරිමිතීන්වල නිවැරදිතාවය මත හානිකරණ වෙන්කිරීම් වල නිවැරදිතාවය තීරණය වේ. ණය හා අත්තිකාරම් මත හානිකරණ අලාභ පිලිබඳ විස්තරාත්මක තොරතුරු සටහන් 14 හි දක්වා ඇත.

3.3.8.5 පරිපාලිත සමාගම්වල ආයෝජනයන්හි හානිකරණය සහ වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් සඳහා හානිකරණය

ආයෝජනයක් හෝ මූල්‍ය වත්කමක් හානිකරණයට ලක්වේදැයි සලකා බැලීම සඳහා බැංකුව සහ සමූහය විසින් ලං.හි.ප්‍ර. 36 - "වත්කම් සඳහා හානිකරණය" හා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" ප්‍රමිතියන්හි දී ඇති උපදෙස් අනුගමනය කරයි. වත්කමක පොත් අගයට වඩා අයකර ගත හැකි වටිනාකම අඩු වේ නම් හානිකරණයන් ඇති වන අතර එම හානිකරණය තීරණය කිරීම හා මැනීම සඳහා අදාළ බාහිර හා අභ්‍යන්තර පරිසරය මඟින් ලබා දෙන සංඥා හඳුනා ගත යුතු වේ. එම සංඥා හඳුනා ගැනීමට සහ හානිකරණ වටිනාකම තීරණය කිරීම සඳහා ආසන්න ව්‍යාපාරික පරිසරය විශ්ලේෂණය කිරීම සහ අදාළ වන ව්‍යාපාර බණ්ඩයේ මූල්‍ය පරිසරයේ ස්වාභාවය, කර්මාන්තය, තාක්ෂණය සහ මෙහෙයුම් පරිසරය වෙනස් වීම යන සාධක අනාගත මුදල් ප්‍රවාහ සමඟ විශ්ලේෂණය කළ යුතු වේ. මෙම ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන් භාවිතා වේ.

3.3.8.6 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම්

ආයුගණක තක්සේරු යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් සහ අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් හි පිරිවැය නිර්ණය කරනු ලබයි. ආයුගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාත, සැලසුම් වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාතය සහ අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම යන උපකල්පන භාවිතා කරනු ලැබේ. මෙම සැලසුම් දිගු කාලීන ස්වභාවයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු අවිනිශ්චිත ස්වභාවයක් ගනු ඇත.

වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වලට අදාළ කාලපරිච්ඡේදයන්ට සමාන ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කර වල පොළී අනුපාතය සලකා බලයි. උපත් හා මරණ අනුපාතය සඳහා ප්‍රසිද්ධ කර ඇති උපත් හා මරණ අනුපාත වගු යොදා ගෙන ඇත. වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම, අනාගත උද්ධමන අනුපාතය සහ සමූහයේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය මත පදනම් වී ඇත. සෑම උපකල්පනයක්ම වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලබන අතර වර්ෂය තුළදී යොදාගත් උපකල්පන සටහන් 48 හි දක්වා ඇත.

3.3.8.7 ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය

සමූහයේ නිදහස් අයිතිය සහිත ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ඇති ගොඩනැගිලි වල සාධාරණ අගයෙන් සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර සටහන් කරනු ලැබේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 13 "සාධාරණ අගය මිනුම්කරණය" අනුව, දේපළ වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා සමූහය විශේෂඥ ස්වාධීන තක්සේරුකරුවන් යොදවනු ලැබේ. නිදහස් අයිතිය සහිත ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු අයිතිය සහිත ඉඩම් මත ගොඩනැගිලි තක්සේරුවට අදාළ විස්තර සටහන් 34 හි දක්වා ඇත.

3.3.8.8 දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවිත කාලය

දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් වල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම තක්සේරු කිරීම් සඳහා කළමනාකරණය විසින් විවිධ ප්‍රතිශතයන්, අගයන් සහ ක්‍රමවේදයන් යොදාගනු ලබන බැවින් එම විනිශ්චයන් යම් අවිනිශ්චිතතාවයකට භාජනය විය හැක. එක් එක් වත්කම් බණ්ඩය සඳහා යොදා ගත් ක්ෂය කිරීමේ ක්‍රමවේදය සහ ක්ෂය අනුපාතයන් සටහන් 34 හි දක්වා ඇත.

3.3.8.9 ආයෝජන දේපළ වර්ග කිරීම

දේපළක් ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් ලැබීම නිර්ණය කිරීම කළමනාකරණ විනිශ්චයන් මත සිදුවේ. බදු කුලී ලබා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම හෝ ඒ අරමුණු දෙකම සඳහා පවත්වා ගනු ලබන දේපළ තුළින්, සමූහය පවත්වාගෙන යනු ලබන අනෙකුත් වත්කම්වලින් ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ජනනය කරනු ලබයි නම් එම දේපළ ආයෝජන දේපළක් ලෙස නිර්ණය කෙරේ. අනෙක් අතට මෙහෙයුම් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන හෝ සේවා සැපයීමේ ක්‍රියාවලියේ යොදාගන්නා හෝ පරිපාලන අරමුණින් පවත්වාගෙන යනු ලබන ස්වාධීනව මුදල් ප්‍රවාහ ජනනය නොකරන වත්කම්, දේපළ පිරියත සහ උපකරණ ලෙස නිර්ණය කරනු ලැබේ.

3.3.8.10 ආයෝජිතයන් පාලනය කිරීම තීරණය කිරීම

පරිපාලිතයන් යනු බැංකුව විසින් පාලනය කරන ආයතන වේ. බැංකුව ආයෝජිතයා තුළ ආයෝජනය කිරීම නිසා විචලනය වන ප්‍රතිලාභ ලැබීමට අයිතියක් හෝ එසේ ලැබීමට සිටුවේ නම් සහ ආයෝජකයාගේ කටයුතු පාලනය කිරීම තුළින් ලැබෙන ප්‍රතිලාභ වලට බලපෑමක් සිදු කිරීමට බැංකුවට හැකියාවක් ඇත්නම් එවැනි ආයෝජන මත බැංකුවට පාලනය කිරීමේ හැකියාවක් ඇතැයි නිගමනය කළ හැක. බැංකුව විසින් එහි ආයෝජිතයන් පාලනය කිරීම තීරණය කිරීම පිළිබඳව කළමනාකරණ විනිශ්චයන්ට එළඹීමට සිදු වේ.

3.3.8.11 බදුකරණය

සමූහය විසින් ආදායම් බදු සහ එකතුකළ අගය මත බද්ද (VAT) ඇතුළුව අනෙකුත් අදාළ බදු ගෙවිය යුතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන කාලය තුළ අදාළ වන්නා වූ බදු නීතිරීතිවල හා එම නීති අර්ථ නිරූපනය කරන ආකාරයෙන් ඇති අවිනිශ්චිතතාවයන් නිසා ආදායම් බදු වගකීම, විලම්බිත බදු වගකීමට හා වෙනත් බදු වගකීම් වලට අදාළ වෙන් කිරීම් සඳහා ගිණුම්කරණ විනිශ්චයන් යොදා ගත යුතු වේ. අදාළ බදු අනුපාතයන් සහ බදුකරණයට අදාළ වෙනත් තොරතුරු සටහන් 4.8, 18 සහ 37 යටතේ දක්වා ඇත.

පැවරුම් මිල රෙගුලාසීන්ට සමූහය යටත් වන අතර මෙවැනි ගනුදෙනුවල බලපෑම තීරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චය භාවිතා කිරීම අවශ්‍ය වේ. ආශ්‍රිත ගනුදෙනු, සාධාරණ මිල තීරණය කිරීම සහ සුදුසු මිල ගණන් තෝරා ගැනීම ඇතුළුව පැවරුම් මිල රෙගුලාසිවලට අනුකූල වීම සඳහා එහි බලපෑම තීරණය කිරීමට අවශ්‍ය අවස්ථාවල දී මෙම කළමනාකරණ විනිශ්චයන් භාවිතා කරන ලදී.

ප්‍රවර්තන බදු වියදම මෙම විනිශ්චයන් පදනම්ව ගණනය කර ඇත. ඇස්තමේන්තු කරන ලද ආදායම් බදු වියදම හා සත්‍ය බදු ගෙවීම අතර වෙනසට හේතු වන්නේ කළමනාකාරිත්වයේ බදු සම්බන්ධ අර්ථ දැක්වීමේ වෙනස්කම් හා බදු රෙගුලාසි භාවිතා කිරීමෙන් ඇති වූ වෙනසයි.

4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගන්නා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දැක්වේ. විශේෂයෙන් සඳහන් වන අවස්ථාවක දී හැර අන් සෑම විටකම පහත සඳහන් සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ දී සෑම කාලපරිච්ඡේදයක් සඳහාම අඛණ්ඩව භාවිතා කර ඇත.

4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 10 – "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ" සහ ලං.ගි.ප්‍ර. 27 – "කෝවල මූල්‍ය ප්‍රකාශ" අනුව බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ කර සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. ලං.ගි.ප්‍ර. 28 – "ආශ්‍රිතයන් සහ ඒකාබද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන" අනුව ආශ්‍රිත සමාගම් වල ලාභ හා ශුද්ධ වත්කම් අයත් ප්‍රමාණය හා පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

දේශීය බැංකු අංශයේ, අක්වෙරළ බැංකු අංශයේ සහ අන්තර්ජාතික ගනුදෙනු අංශයේ ඒකාබද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ.

පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 31 හා 32 යටතේ දක්වා ඇත.

4.1.1 ව්‍යාපාර සංයෝජනය

සමූහය, ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 – "ව්‍යාපාර සංයෝජන" හි නිර්වචනයට අනුකූලව දේපළ අත්පත් කරගැනීම සහ වගකීම් භාර ගැනීම සිදු වී ඇත්නම් ගනුදෙනුව හෝ වෙනත් සිද්ධියක් ව්‍යාපාර සංයෝජනයක්ද යන වග නිර්ණය

කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ ක්‍රමය මඟින් ව්‍යාපාර සංයෝජනය ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය මත හෝ ආයෝජකයාගේ හඳුනාගත් ශුද්ධ වත්කම්වල පාලනයට යටත් නොවන හිමිකමට සමානුපාත කොටසෙනි.

අත්පත් කර ගැනීම සම්බන්ධිත වියදම යනු ව්‍යාපාර සංයෝජනයේ දී අත්පත් කරනු ලබන්නා විසින් දරන ලද වියදම් වේ. එම වියදම්වල අඩංගු වන්නේ තැරැව්කාර ගාස්තු, උපදේශක, නීති, ගිණුම්කරණ, ඇස්තමේන්තු සහ අනෙකුත් වෘත්තිමය උපදේශන ගාස්තු, සාමාන්‍ය පරිපාලන වියදම්, අභ්‍යන්තර අත්පත් කරගැනීමේ දෙපාර්තමේන්තු පවත්වා ගැනීමේ වියදම් සහ ණය සහ ස්කන්ධ සුරැකුම්පත් ලියාපදිංචි කිරීමේ සහ නිකුත් කිරීමේ වියදම්ය. ණය සහ ස්කන්ධ සුරැකුම්පත් නිකුත් කිරීමේ කටයුතු හා සම්බන්ධ නොවන අනෙකුත් අත්පත් කර ගැනීම් සහ සම්බන්ධිත වියදම් එම සේවාවට අදාළව දැරූ විට එම කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම් ගණනය කිරීම සඳහා පදනම වශයෙන් සාධාරණ අගයට ගනුදෙනුවෙන් ගනුදෙනුවට හෝ ශුද්ධ වත්කම්වලින් සමානුපාතික කොටස සමූහය විසින් තෝරා ගනු ලැබේ.

සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයේ දී දරන ලද ණය නිකුත් කිරීමේ දී හා ස්කන්ධ සුරැකුම්පත් සඳහා ගන්නා ලද වියදම් හැරුණු විට අනෙකුත් වියදම් දැරූ අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනා ගැනේ.

4.1.2 පාලනය අහිමි වීම

පාලනය අහිමි වීමේ දී සමූහය විසින් පරිපාලිතයන්ගේ හඳුනාගත් වත්කම් සහ වගකීම්, පාලනයට යටත් නොවන හිමිකම් සහ ස්කන්ධය අදාළව වෙනත් අගයන්ද ඇත්නම් සියළු අගයන් පොත් වලින් ඉවත් කරනු ලැබේ. තවද වෙනත් විස්තීර්ණ ආදායම යටතේ පෙර හඳුනාගත් යම් අගයක් වේ නම් ඒවා සුදුසු පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශයට හෝ රඳවාගත් ඉපැයුම් වලට නැවත හඳුනාගනු ලැබේ. පාලනය අහිමි වීමේ දී ඇතිවන ඌනතාවය හෝ අතිරික්තය ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ගලපනු ලැබේ. සමූහය විසින් අදාළ පරිපාලිතයේ යම් ඇල්මක් රඳවා තබා ගනී නම් එවැනි රඳවාගත් හිමිකම පාලනය අහිමි වන දිනට සාධාරණ අගයට මනිනු ලැබේ. ඉන් පසු රඳවාගත් ආයෝජනය ස්කන්ධ ආයෝජන පදනමට හෝ සමූහයේ මූල්‍ය උපකරණ ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති අනුව ගිණුම් තැබේ.

4.2 විදේශ මුදල් පරිවර්තනය

4.2.1 විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ගනුදෙනු ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන්නේ ගනුදෙනුව සිදු වන දිනට පවතින විනිමය අනුපාත මඟින් පරිවර්තනය කිරීමෙනි. විදේශ වලංගු මුදල්වලින් නිරූපණය කෙරෙන මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනට බලපැවැත්වෙන විනිමය අනුපාතිකයන්ට අනුව ව්‍යවහාර මුදල් වලට නැවත පරිවර්තනය කරනු ලබන අතර වෙළඳ නොවන කටයුතු තුළින් ඇතිවන්නා වූ වෙනස්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ "සටහන් 13 – ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ සටහන් කරනු ලැබේ.

විදේශ මුදල් වලින් වෙතිහාසික පිරිවැයට නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් එම ගනුදෙනුව මුලින්ම සිදු වන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදල් වලින් නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල වටිනාකම සාධාරණ අගයට වාර්තා කරන විට, ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ සාධාරණ අගය තීරණය කරන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය. නැවත පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය වෙනස්කම් ඇතුළු ලාභ හෝ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි. ඉදිරි විනිමය ගිවිසුම් තක්සේරු කරනු ලබන්නේ වාර්තා කරන දිනට බලපැවැත්වෙන ඉදිරි වෙළඳපොල අනුපාතිකයන්ට අනුව වන අතර ඉන් ඇතිවන උපලබ්ධි නොවූ ශුද්ධ ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සටහන් කරනු ලැබේ.

4.2.2 විදේශීය මෙහෙයුම්

ශ්‍රී ලංකා රුපියල් නොවන ව්‍යවහාර මුදල් භාවිතා කරන්නා වූ විදේශීය මෙහෙයුම්වල මෙහෙයුම් ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වයන් පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශීය මෙහෙයුම්වල පවතින වත්කම් සහ වගකීම් වාර්තාකරණ දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් කාලපරිච්ඡේදයේ සාමාන්‍ය විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කෙරේ. විදේශ මෙහෙයුම් පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය අසමානතා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි. යම් විදේශ මෙහෙයුමක් බැහැර කිරීමේ දී අදාළ මෙහෙයුමට අදාළව පරිවර්තන සංචිතයේ ඇති ප්‍රමාණය විකිණීමෙන් ලද ලාභයක් හෝ අලාභයක් ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් හෝ වියදම් යටතේ දැක්වේ.

4.2.3 හෙජ් ගිණුම්කරණය

විදේශ මුදල් ගනුදෙනුවලින් විදේශ විනිමය අවදානම අවම කිරීම සඳහා බැංකුව වෙනත් පාර්ශ්ව සමඟ හෙජින් විධිවිධානවලට එළඹේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 ට – "මූල්‍ය උපකරණ" අනුව, ආයතනයක් අයිතමයක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෙජ් අයිතමයක් ලෙස නම් කළ හැක. හෙජින් සබඳතාවයක් හෙජින් ගිණුම්කරණය සඳහා සුදුසුකම් ලබන්නේ හෙජින් සම්බන්ධතාව සුදුසුකම් ලත් හෙජින් උපකරණ සහ සුදුසුකම් ලත් හෙජින් අයිතම වලින් පමණක් සමන්විත වන්නේ නම් පමණි. හෙජින් සබඳතාවයේ ආරම්භයේ දී හෙජින් සබඳතාවයේ විධිමත් නම් කිරීම සහ ලේඛනගත කිරීම සහ ආයතනයේ අවදානම් කළමනාකරණ පරමාර්ථය සහ හෙජ් භාර ගැනීම සඳහා උපාය මාර්ග ඇත. එම ලේඛනයට හෙජින් උපකරණය හඳුනා ගැනීම, ආරක්ෂිත අයිතමය, ආරක්ෂිත අවදානමේ ස්වභාවය සහ හෙජින් සම්බන්ධතාව හෙජ් කාර්යක්ෂමතාවයේ ප්‍රභවයන් විශ්ලේෂණය කිරීම සහ එය තීරණය කරන්නේ කෙසේද යන්න ඇතුළුව, හෙජ් සවලතා අවශ්‍යතා සපුරාලන්නේද යන්න තක්සේරු කරන්නේ කෙසේද යන්න ඇතුළත් විය යුතුය. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 09 – "මූල්‍ය උපකරණ" නම් කරන ලද කොටස් තුනක් යටතේ හෙජ් ගිණුම්කරණයට මඟ පෙන්වයි. මුදල් ප්‍රවාහ හෙජ් (ඉහළ සම්භාවිතා පුරෝකථනයක් සහිත ආයතනික බැඳීමක් සහිත ගනුදෙනු (මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන් නොකළ), විදේශ ව්‍යවහාර මුදල් ප්‍රවාහ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගත් හෝ පුරෝකථනය කළ අන්තර් සමාගම් ගනුදෙනු), ශුද්ධ හෙජ් ආයෝජන (විදේශ මෙහෙයුම් ශුද්ධ ආයෝජන සඳහා නම් කරන ලද),ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 09 – "මූල්‍ය උපකරණ" හි නිශ්චිතව දක්වා ඇති හෙජ් ගිණුම්කරණය යටතේ බැංකුව මෙම ගනුදෙනු ගිණුම් ගත කරනු ලබන අතර එවැනි උපකරණවල එක් එක් වාර්තාකරණ දිනයන් අනුව ඉදිරි විනිමය අනුපාත භාවිතා කරමින් අගය කරනු ලැබේ.

4.3 මූල්‍ය උපකරණ ණය සහ ස්කන්ධ ලෙස වර්ග කිරීම

පහත සඳහන් ණය සහ ස්කන්ධ ලෙස පදනම්ව මූල්‍ය උපකරණ වර්ග කෙරේ.

- මූල්‍ය උපකරණයට දී ඇති නම
- ස්ථිර පරිනත දිනයක් ඇති හෝ නොමැති බව
- උපකරණයේ ආයු කාලය
- ගෙවීමේ ප්‍රභව
- ගෙවීම් ලබා ගැනීම සඳහා බලපෑම් කිරීමේ අයිතිය
- කළමනාකරණයට සහභාගීවීමේ අයිතිය
- උපකරණ සමඟ බැඳී ඇති අවදානම
- මුදල් ප්‍රවාහ වල විචලනය
- සුරැකුම් ලෙස දී ඇති දෑ

4.4 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්


4.4.1 මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා බැහැර කිරීම

මූල්‍ය වත්කම් හා වගකීම් ගෙවීම් සිදුකරන දිනයේදී එනම් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමූහය පාර්ශ්වකරුවෙකු බවට පත් වන දිනයේදී මූලිකව හඳුනා ගනී. "ක්‍රමවත් ආකාරයේ වෙළඳාම" මෙයට ඇතුලත් වේ. ක්‍රමවත් ආකාරයේ වෙළඳාම යනු වෙළඳපල තුළ සාමාන්‍යයෙන් පවතින සම්මුතීන් හා නියාමනයන් අනුව ස්ථාපනය කර ඇති කාල රාමුව අනුව වත්කම් ලබාදීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හා විකිණීමයි. ණය ලබා ගන්නාට මුදල් අත්තිකාරම් ලබා දුන් විට (හෝ ගෙවූ විට) ණය හා අත්තිකාරම් හඳුනාගනු ලබයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ වටිනාකමට හඳුනා ගනී. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම හා ඍජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට හඳුනා ගනී.

වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහ කල් පිරෙන විට හෝ හිමිකාරිත්වයේ සියලු අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස හුවමාරු වන ගනුදෙනුවකින් මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය හුවමාරු වේ නම් සමූහය විසින් මූල්‍ය වත්කම් බැහැර කරයි. හුවමාරු කල මූල්‍ය වත්කමක ඇති වූ හෝ රඳවාගත් අයිතියක් ඇත්නම් සමූහය විසින් එය වෙනමම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී. වගකීම සඳහා ඇති බැඳියාව නිදහස් කල විට හෝ අවලංගු වූ විට හෝ කල් පිරී ඇති විට මූල්‍ය වගකීම් ඉවත් කරයි. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණය දෙන්නාගෙන් ප්‍රමාණවත් ලෙස වෙනත් වගකීමකින් වෙනස් වූ කොන්දේසි වලින් ප්‍රතිෂ්ඨාපනය කරන විට හෝ පවතින වගකීමේ කොන්දේසි ප්‍රමාණවත් ලෙස සංශෝධනය කර ඇත්නම් එවැනි හුවමාරුවක් හෝ සංශෝධනයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සලකා නව වගකීමක් හඳුනා ගනී. මුල් මූල්‍ය වගකීම පවත්වාගෙන යාමේ වටිනාකම හා ගෙවූ ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.4.2 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා පවතින සමූහයේ ව්‍යාපාර ආකෘතිය හා මූල්‍ය වත්කම් වල මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම්ගත කොන්දේසි මත පදනම්ව වර්ගීකරණය තීරණය වේ. බැංකුව මූල්‍ය වත්කම් වර්ගීකරණය කරන ආකාරය පහත රූප සටහන මඟින් නිරූපණය කෙරේ.



4.4.2.1 ආරම්භයේදී මූල්‍ය වත්කම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි

- ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනිනු ලබන මූල්‍ය වත්කම් (සටහන 4.4.7 සහ 27)
- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම්
  - ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම් (සටහන 28)
  - ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ (සටහන 4.4.8 සහ 29)
- වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කළ මූල්‍ය වත්කම් (සටහන 4.4.9 සහ 30)

4.4.2.2 ආරම්භයේදී මූල්‍ය වගකීම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි

- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම්
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු (සටහන 42)
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් වෙනත් ණය ගැනීම් හා යටත්කාලීන ණය (සටහන 43 සහ 49)

4.4.3 මූල්‍ය උපකරණයන් මූලිකව අගය කිරීම

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කර ඇති අවස්ථාවලදී හැර මූල්‍ය වත්කම් හා වගකීම් ඒවායේ සාධාරණ වටිනාකම හා ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට මූලිකව අගය කරයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වලට අදාල ගනුදෙනු පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

4.4.4 "එක් දින" ලාභ හෝ අලාභ

යම් මූල්‍ය උපකරණයක ගනුදෙනු වන මිල, එම මූල්‍ය උපකරණයම ගනුදෙනු වන වෙනත් නිරීක්ෂිත වර්තමාන වෙළඳපොළක සාධාරණ අගයට හෝ නිරීක්ෂිත වර්තමාන වෙළඳපොළ දත්ත මත ගණනය කරන ලද සාධාරණ අගයට හෝ වෙනස් වන්නේ නම් එම සාධාරණ අගයෙහි හා ගනුදෙනු මිලෙහි වෙනස සමූහය විසින් වහාම ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගැනේ. නිරීක්ෂිත නොවන දත්ත මත සාධාරණ අගය ගණනය කරනු ලබන අවස්ථාවන්හිදී ගනුදෙනු මිල සහ ආදර්ශ මිල අතර වෙනස එම මූල්‍ය උපකරණයේ ආයුකාලය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.4.5 ව්‍යාපාර ආකෘති ඇගයීම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුව, 2018 ජනවාරි 1 දින සිට බල පැවැත්වෙන පරිදි, සමූහය විසින් සිය ව්‍යාපාර ආකෘතිය හා එහි අරමුණු පදනම් කර ගනිමින් මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබයි. එහෙත් එය වත්කම වෙන වෙනම ඇගයීම සිදු නොකරනු ලබන අතර වත්කම් කළඹ වශයෙන් ව්‍යාපාර ආකෘතිය සමඟ සසඳා වර්ගීකරණය කරනු ලබයි. එයට හේතු වන්නේ ව්‍යාපාරය කළමනාකරණය කරන ක්‍රමය සහ කළමනාකරණයට තොරතුරු ගලාගෙන යන ආකාරය මෙය වන බැවිණි. මූල්‍ය වත්කම් වර්ගීකරණය සඳහා සලකා බලන තොරතුරු පහත දැක්වේ.

- ආයෝජන කළඹ සඳහා අදාල වන ප්‍රතිපත්ති හා අරමුණු හා ඒවා ක්‍රියාත්මක වන ආකාරය, විශේෂයෙන්ම, ගිවිසුම් ගත පොළී ආදායම උපයා ගැනීම, විශේෂිත පොළී අනුපාතයක් පවත්වා ගැනීම, වත්කම් ආයෝජනය කර ඇති කාලසීමාව හා එම වත්කම් සඳහා අරමුදල් ප්‍රතිග්‍රහණය කරණු ලබන වගකීම් වල කාලසීමාව සංසන්දනය කිරීම හෝ මුදල් ජනනය සඳහා වත්කම් විකිණීම වැනි කටයුතු කෙරෙහි කළමනාකාරිත්වයේ උපායමාර්ගික අවධානයේ ස්වභාවය,
- ආයෝජන කළඹේ කාර්යසාධනය ඇගයීමට ලක්කරන්නේ කෙසේද යන්න සහ බැංකුවේ කළමනාකාරිත්වයට වාර්තා කරන්නේ කෙසේද යන්න පිළිබඳව,
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ පවත්වා ගෙන යන මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න,
- ව්‍යාපාර කළමනාකරුවන්ට ගෙවීම් සිදුවන්නේ කෙසේද? එනම් කළමනාකරණය කරන වත්කම් වල සාධාරණ අගය මත පදනම්ව හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීම මඟින් ගෙවීම් සිදු වේද යන්න හා
- පෙර වර්ෂ වලදී මූල්‍ය වත්කම් විකුණු වාර ගණන, ප්‍රමාණය සහ කාල සීමා, මෙම විකුණුම් වලට බලපාන ලද හේතු සහ අනාගතයේදී වත්කම් විකිණීමට ඇති අපේක්ෂාවන්. කෙසේ වෙතත්, විකුණුම් පිළිබඳ තොරතුරු හුදෙකලාව නොසැලකෙන අතර මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම තුළින් බැංකුවේ ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සහ මුදල් ප්‍රවාහ ජනනය කළ ආකාරයද සලකා බලයි.

ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කර ඇත්තේ "හානිකර අවස්ථාව" හෝ "ආතති අවස්ථාව" යන කරුණු සලකා නොගෙන සාධාරණ අපේක්ෂිත සිදුවීම මතය. මූලික හඳුනාගැනීමකින් පසුව මූල්‍ය වත්කම් වලට අපේක්ෂිත මුදල් ප්‍රවාහයේ මූලික වෙනසක් සිදු වූවත්, බැංකුව විසින් ඉතිරි මූල්‍ය වත්කම් වල වර්ගීකරණයේ වෙනස් කිරීමක් සිදු නොකරනු ලැබේ. එහෙත් අළුතින් මිලදී ගන්නා මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී ඉහත අපේක්ෂාවන්ගේ වෙනස් වීම සැලකිල්ලට ගනු ලැබේ.

4.4.6 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි පොළිය හා මූලික මුදල් පමණක් ගෙවීමේ ලක්ෂණයන්ගෙන් යුක්ත දැයි තක්සේරු කිරීම (SPPI පරීක්ෂණය)

වත්කම් වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පියවර ලෙස, මූල්‍ය වත්කම් SPPI පරීක්ෂණය සමත් වන්නේ දැයි සොයා බැලීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම් ගත නියමයන් අධ්‍යයනය කරනු ලැබේ.

මෙම තක්සේරුව සිදු කිරීම සඳහා "මූලික මුදල" ලෙස අදාල මූල්‍ය වත්කම මූලික හඳුනාගැනීමේදී පොත්වල හඳුනාගන්නා ලද මූල්‍ය වත්කම් වල සාධාරණ අගය ලෙස අර්ථ දැක්විය හැකිය. එමෙන්ම මෙම වටිනාකම මූල්‍ය වත්කමේ ආයු කාලය පුරා වෙනස් විය හැකිය (උදා: අධිමිල හෝ අවමිල ක්‍රමක්ෂය කිරීම හෝ මූලික මුදල කොටස් වශයෙන් ගෙවීම).

"පොළිය" නිර්වචනයට මුදලේ කාල වටිනාකම සහ ආයෝජනය කරනු ලබන කාල පරිච්ඡේදය සඳහා ණය අවදානම සඳහා පිරිවැය මෙන්ම ලාභයද ඇතුලත් වේ.

මීට අමතරව, මුදල් ප්‍රමාණයක් පොළී තුළ අන්තර්ගත ඉහත කරුණු වලට අමතරව යම්කිසි ප්‍රමාණයක මුදල් ප්‍රවාහ වෙන්කිරීමත් ණය අවදානම හෝ වෙනත් විචල්‍යයන් ලෙස අයකර ගනී නම් එවිට එම මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කරන මූල්‍ය වත්කම් ලෙස වර්ගකල යුතුය.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තුළ අන්තර්ගත වන්නේ මූලික මුදල හා පොළිය පමණක්ද යන්න තීරණය කිරීමේදී, සමූහය උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි සලකා බලයි. මූල්‍ය වත්කමෙහි මෙම කොන්දේසිය සපුරාලිය නොහැකි වන පරිදි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ වෙලාව හෝ ප්‍රමාණය වෙනස් කල හැකි ගිවිසුම්ගත යෙදුමක් තිබේද යන්න තක්සේරු කිරීම මෙයට ඇතුලත් වේ.

තක්සේරුව සිදු කිරීමේදී සමූහය පහත දෑ සලකා බලයි.

- මුදල් ප්‍රවාහයන්ගේ වටිනාකම හා කාලය වෙනස් කරන අසම්භාව්‍ය සිද්ධීන්
- තෝලන ලක්ෂණ
- පෙරගෙවුම් හා දීර්ඝ කිරීමේ කොන්දේසි
- නිශ්චිත වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා සමූහයේ හිමිකම් සීමාකරණ නියමයන්
- මුදලේ කාල වටිනාකම සලකා බැලීම වෙනස් කරන ලක්ෂණ

4.4.7 ලාභ හෝ අලාභ මඟින් හඳුනාගන්නා මූල්‍ය වත්කම් - සාධාරණ අගයට අගය කිරීම

ලාභ හෝ අලාභ මඟින් හඳුනාගන්නා සාධාරණ අගයට අගය කරන අයිතමයන් ලෙස අඩංගු වන්නේ

- වෙළඳපල ගනුදෙනු සඳහා පවතින අයිතමයන්
- ආරම්භක හඳුනාගැනීමේදී ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට විශේෂයෙන් නම් කල අයිතමයන් හා
- මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම්ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට පවත්වාගෙන යන මූල්‍ය උපකරණ මූලිකව හඳුනාගනු ලබන්නේ ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනාගත් දැරෑ ගනුදෙනු පිරිවැය සමඟ සාධාරණ වටිනාකමටය. පසුව සාධාරණ වටිනාකමට අගය කරන අතර කිසියම් ලාභයක් හෝ අලාභයක් පැනනගින විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී. මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට අගය කරන විටදී ණය අවදානමේ වෙනස් වීම් වලට අදාලව සාධාරණ අගයේ සංචලනයන් නිරූපනය වන පරිදි, ප්‍රතිපාර්ශවයේ ණය ශක්‍යතාවය පිලිබිඹු වන සේ ණය තක්සේරුකරණ ගැලපුමක් සිදු කරයි.

4.4.7.1 වෙළඳ ගනුදෙනු සඳහා පවතින මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයන් වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ග කරනුයේ විකිණීමේ අරමුණින් මූලිකවම අත්පත් කරගෙන ඇති නම් හෝ දරා ඇත්නම් හෝ නුදුරේදී නැවත මිලදී ගන්නේ නම් හෝ කෙටි කාලීනව ලාභ ලබා ගැනීමේ අරමුණ සහිත හා එක්ව කළමනාකරණය කරන මූල්‍ය උපකරණ වල ආයෝජන කළඹේ කොටසක් වන හෝ සුදුසුකම් ලබන හෙජින් සම්බන්ධතාවයක් නොමැති ව්‍යුත්පන්න උපකරණයන් වන විටදීය. වෙළඳ ව්‍යුත්පන්න හා වෙළඳ සුරැකුම්පත්, වෙළඳපළ ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ගීකරණය කරන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ වටිනාකමට හඳුනාගනී. සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වෙළඳපල ගනුදෙනු වලින් ලද ලාභ/(පාඩු) (සටහන 10) හා ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය උපකරණ වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 11) යටතේ හඳුනා ගනී. වෙළඳපල ගනුදෙනු සඳහා පවතින මූල්‍ය උපකරණ වලින් ලද පොළී ආදායම ශුද්ධ පොළී ආදායම (සටහන 8) යටතේ හඳුනා ගන්නා අතර ලාභාංශ ආදායම ගෙවීමට ඇති අයිතිය ස්ථාපිත කර ඇති විට වෙළඳපල ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 10) යටතේ හඳුනාගනී.

4.4.7.2 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කල හා නම් කල මූල්‍ය උපකරණ

මූලික හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කිරීම හා නම් කිරීම සිදු කල හැක. වෙනත් පදනමක් මත මූල්‍ය වත්කම් හා වගකීම් මිනුම් කරන විට ඇති වන මිණුම්කරණ හෝ හඳුනාගැනීමේ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කරයි නම් හෝ සම්පූර්ණයෙන් ඉවත් කරයි නම් (එනම් ගිණුම්කරණ නොගැලපීම් ඉවත් කරයි) පමණක් මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක. ගිණුම්කරණ නොගැලපීම් ඉවත්කිරීමට හෝ සැලකිය යුතු ලෙස අඩු කළ හැකි නම් හෝ පහත අවස්ථාවල මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ හැක.

- ධාරක ගිවිසුම ව්‍යුත්පන්න උපකරණ එකක් හෝ කිහිපයකින් සමන්විත වේ නම් හෝ
- ලේඛනගත අවදානම් කළමනාකරණ හෝ ආයෝජන ක්‍රමවේදය අනුව සාධාරණ වටිනාකම පදනම මත මූල්‍ය වත්කම් හා වගකීම් දෙකම කළමනාකරණය හා එහි කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ නම් ගිණුම්කරණ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කල හොත් හෝ ඉවත් කල හොත් හෝ පහත අවස්ථාවල මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක. මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කර ඇති විට නීරීක්ෂණය කල හැකි වෙළඳපොළ පොළී අනුපාතිකයන්ට ඉහළ ණය විහිදීම් වල වෙනස්වීම් නිරීක්ෂණය කිරීමෙන් සමූහයේ ණය ගුණත්වයේ වෙනස්වීම් වලට ආරෝපිත සාධාරණ අගයේ සංචලනයන් ගණනය කර වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වෙනමම ඉදිරිපත් කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කළ කිසිදු මූල්‍ය වගකීමක් 2022 දෙසැම්බර් 31 දිනට නොමැත.

4.4.7.3 මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම් ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම යන පරීක්ෂණයෙන් සමත් නොවන මූල්‍ය ණය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට ගිණුම් ගත කෙරේ.

4.4.8 ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම් ණය උපකරණ

පහත අවස්ථා වලදී ණය උපකරණයන්හි ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දිනවලදී හිඟ හිටි මුදල් මත පොළිය හා මූලික මුදල් පමණක් පිලිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීමට තබා ගැනීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලගා කරගන්නා විට

මෙම ණය උපකරණයන් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර ඵලදායී පොළී අනුපාතය භාවිතා කිරීමෙන් ක්‍රමක්ෂය පිරිවැයට පසුව හඳුනා ගනී. පහත සටහන 4.4.11 මූල්‍ය වත්කම් හානිකරණය යටතේ විස්තර කර ඇති මට්ටම් තුනක අපේක්ෂිත ණය හානි ආකෘතිය මත පදනම්ව ණය හානිකරණය ගණනය කරනු ලබයි.

4.4.9 වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

4.4.9.1 ණය උපකරණ

පහත අවස්ථාවන්හිදී ණය උපකරණයන්හි ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දින වලදී හිඟ හිටි මුදල මත මූලික මුදල හා පොළිය පමණක් පිළිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලඟා කර ගන්නා විට

මෙම ණය උපකරණ මූලිකව හඳුනා ගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර පසුකාලීනව සාධාරණ වටිනාකමට හඳුනා ගනී. සාධාරණ වටිනාකමේ වෙනස්වීම් මත ඇති වන ලාභ හෝ අලාභයන් ස්කන්ධයේ වෙනම කොටසක් යටතේ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ දක්වයි. හානිකරණ අලාභයන් හෝ ප්‍රතිවර්තන්‍ය කිරීම්, පොළී ආදායම හා විදේශ විනිමය ලාභ හෝ අලාභයන් ලාභ හෝ අලාභ යටතේ හඳුනා ගනී. විකුණන අවස්ථාවේදී කලින් වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභයන් වෙනත් විස්තීර්ණ ආදායමේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.

වත්කම්හි යොදාගත් ආකෘතිය අනුව ක්‍රමක්ෂය මත පදනම් වූ මූල්‍ය ශේෂ හානිකරණ මැනීම අපේක්ෂිත ණය අලාභ අදියර 3 මත පදනම් වේ. මෙම අපේක්ෂිත ණය අලාභ ආකෘති සටහන් අංක 4.4.11 විස්තර කර ඇත.

4.4.9.2 ස්කන්ධ උපකරණ

වෙළඳපොළ ගනුදෙනු සඳහා පවතින හා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 - "ව්‍යාපාර සංයෝජනය" යටතේ ව්‍යාපාර සංයෝජනය සඳහා සමූහය විසින් හඳුනාගන්නා අසම්භාව්‍ය ප්‍රතිෂ්ඨාව සඳහා වන ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන හැර කළමනාකරණය විසින් වෙනස්කල නොහැකි විකල්පය තෝරාගෙන ඇතිවිට එම ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන, වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට අගය කරයි. වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට යන වෙනස් කල නොහැකි විකල්පය ආයෝජන කලඹයන් සඳහා කළමනාකරණය සලකා නොබලයි නම් එම ආයෝජන නිරායාසයෙන් ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට අගය කල යුතුයි.

විකිණීමේදී වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට මාරු නොකරයි. කෙසේ වෙතත් සම්පූර්ණ විකිණීමකදී හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයේ සිට ස්කන්ධය තුළ රඳවාගත් ඉපයීම් වලට මාරු කරයි. මෙම ආයෝජන වල ලාභාංශ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ "ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම්" (සටහන 13) යටතේ හඳුනා ගනී.

4.4.10 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමට අදාල ව්‍යාපාර ආකෘතිය සමූහය විසින් වෙනස් කරන විටදී පමණක් සමූහය විසින් එහි මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරයි. ක්‍රමක්ෂය පිරිවැයට, වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කරනු ලබන මූල්‍ය වත්කම් සමූහය විසින් නැවත වර්ගීකරණය කරනු ලබයි නම් නැවත වර්ගීකරණය කරන දිනයේ සිට අනාගතයට බලපාන පරිදි නැවත වර්ගීකරණය ගලපනු ලබයි. සමූහය කලින් හඳුනාගත් ලාභ, අලාභ (හානිකරණ අලාභයන්ද ඇතුලත්ව) හෝ පොළිය නැවත සංශෝධනය සිදු නොකෙරේ.

නැවත වර්ගීකරණය කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ සඳහා වන ගිණුම්කරණ පිළියම් පහත වගුව මඟින් සාරාංශ ගත කර ඇත.

මූලික මිනුම් කිරීම	නැවත වර්ගීකරණය කිරීමෙන් පසු මිනුම් කිරීම	නැවත වර්ගීකරණය සඳහා වූ ගිණුම්ගත කිරීම්
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම එහි නව පවත්වාගෙන යාමේ දළ වටිනාකම බවට පත් වේ. එම වටිනාකම මත පදනම්ව ඵලදායී පොළී අනුපාතය ගණනය කරයි. හානිකරණ අවශ්‍යතා සඳහා යොදා ගන්නා ආරම්භක දිනය ලෙස නැවත වර්ගීකරණය කල දිනය භාවිතා කරයි.
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ අගය නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පත් වේ. නැවත වර්ගීකරණය කරන දිනයට ඇති වත්කම් වල සාධාරණ වටිනාකම මත පදනම්ව ඵලදායී පොළී අනුපාතිකය තීරණය කරයි.
වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	කලින් වෙනත් විස්තීර්ණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයෙන් ඉවත් කර මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන දිනයේ සාධාරණ වටිනාකමට ගලපනු ලැබේ. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානියට ගැලපීමක් සිදු නොකෙරේ.
වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පත් වේ. නැවත වර්ගීකරණය කරන දිනයේ නැවත වර්ගීකරණය කිරීමේ ගැලපුමක් ලෙස කලින් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.
ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම හා කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසින් ඇතිවන ලාභය හෝ අලාභය ලාභ හෝ අලාභය යටතේ හඳුනාගනී.
ක්‍රමක්ෂය පිරිවැයට	වෙනත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට	මූල්‍ය වත්කමක කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය හා නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම අතර වෙනසින් ඇතිවන ලාභය හෝ අලාභය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනී. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානිය මැනීමට කිසිදු ගැලපීමක් සිදු කරනු නොලැබේ.

4.4.10.1 මූල්‍ය උපකරණ වැඩිදියුණු/උසස් කිරීම

2021 අංක 14 දරණ විධිවිධානය අනුව බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කල ප්‍රතිපත්ති වලට අනුකූලව බැංකුවට මූල්‍ය උපකරණ ඉහළ ස්ථරයකට වැඩිදියුණු කළ හැක. එම නිසා, බැංකුව විසින් සුදුසු තර්කනයකට අනුව ප්‍රධාන අවදානම් නිලධාරියාගේ අභිමතය පරිදි මූල්‍ය උපකරණ වැඩිදියුණු කරයි.

4.4.11 මූල්‍ය වත්කම් හානිකරණය

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මිනුම් නොකරන පහත සඳහන් වර්ගයේ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සමූහය මට්ටම් තුනක් යටතේ සිදු කරයි.

- ක්‍රමක්ෂය පිරිවැයට හා වෙනත් විස්තීරණ ආදායම් තුලින් සාධාරණ අගයට මනිනු ලබන ණය උපකරණ
- ණය බැඳීම්; සහ
- මූල්‍ය ඇප ගිවිසුම්

ස්කන්ධ ආයෝජන සඳහා කිසිදු අපේක්ෂිත ණය අලාභ හඳුනා නොගනී.

මූල්‍ය උපකරණයේ ඉතිරි ආයු කාලය පුරාවට සිදු වූ පැහැර හැරීමේ අවදානමෙහි වෙනස සැලකිල්ලට ගනිමින් මූල්‍ය උපකරණයන්ගේ ණය අවදානම ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදීම සමූහය විසින් තක්සේරු කරයි. මෙම ක්‍රියාවලිය මත පදනම්ව ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි වෙනස්වීම මත මූල්‍ය වත්කම් පහත සඳහන් මට්ටම් තුන තුළ සංක්‍රමණය වේ.

4.4.11.1 අදියර 1 - මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය අලාභය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදුවී නොමැති හා ආරම්භයේ සිට ණය හානිකරණය වී නොමැති නිරාවරණයන් සඳහා ඉදිරි මාස 12 තුළ සිදුවිය හැකි පැහැර හැරීම් අවස්ථා වල සම්භාවිතාවය සඳහා වූ අපේක්ෂිත ණය හානියේ කොටස හඳුනා ගනී. සැලකිය යුතු ලෙස ණය පිරිහීමට ලක් නොවූ ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය අලාභය බැංකුව විසින් තීරණය කරයි.

4.4.11.2 අදියර 2 - ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය අලාභය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදු වූ නමුත් ණය හානිකරණය නොවූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා වූ (එනම් මූල්‍ය වත්කම් වල ඉතිරි ආයුකාලය පිළිඹිබු වන පරිදි) අපේක්ෂිත ණය අලාභය හඳුනාගනී.

4.4.11.3 අදියර 3 - ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය අලාභය

වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර බලපෑමක් ඇතිකරන සිද්ධීන් එකක් හෝ වැඩි ගණනක් සිදු වූ විට, එම නිරාවරණයන් ණය හානිකරණය වූ නිරාවරණයන් ලෙස තක්සේරු කරනු ලැබේ. ණය හානිකරණය වූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය අලාභය හඳුනා ගනී. පොළී ආදායම ගණනය කිරීමේදී ක්‍රමක්ෂය පිරිවැයට (ප්‍රතිපාදනයන්ට පසු) ඵලදායී පොළී අනුපාතය භාවිත කිරීමෙන් ගණනය කරයි.

4.4.11.4 අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීම

අපේක්ෂිත මුදල් හිඟය ගණනය කිරීම සඳහා සම්භාවිතාවය මත බර තැබූ අවස්ථා තුනක් මත පදනම්ව අපේක්ෂිත ණය අලාභය ගණනය කරනු ලබන්නේ ඵලදායී පොළී අනුපාතිකයකට ආසන්න අනුපාතයකින් වට්ටම් කිරීමෙනි. මුදල් හිඟය යනු ගිවිසුමට අනුව ආයතනය සඳහා ලැබිය යුතු මුදල් ප්‍රවාහයන් සහ ආයතනය අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනස වේ. සමූහයේ අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීම් පිළිබඳ යාන්ත්‍රණය පහත දැක්වෙන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ:

පැහැර හැරීමේ සම්භාවිතාවය (PD)

පැහැර හැරීමේ සම්භාවිතාවය යනු කිසියම් කාල සීමාවක් තුළදී ණය පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳව තක්සේරුවකි. ණය පහසුකම පෙර කාලච්ඡේදයකදී හඳුනාගෙන නොමැති නම් හා තවමත් එම වත්කම කළඹ තුළ ඇත්නම් යම් නිශ්චිත කාලච්ඡේදයක් පුරාවට පැහැර හැරීම සිදුවේ. පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳ සංකල්පය සටහන 28 යටතේ තවදුරටත් විස්තර කර ඇත.

ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය (EAD)

ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය යනු අනාගත දිනකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවේදී පැහැර හැරීම සිදුවන අගයයි. මෙම අගය ගණනය කරනු ලබන්නේ වාර්තාකරණ දිනට පසුව සිදුවන පොළී සහ ප්‍රාග්ධන ගෙවීම්, එකඟ වූ පහසුකම් ලබාගැනීම්, මග හැරුණු ගෙවීම් වලට අදාළ උපචිත පොළිය යනාදිය ගැලපීමෙන් පසු ලැබෙන නිරාවරණය වීමේ අගය වේ. සටහන 28 යටතේ ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

පැහැර හැරීමේ අලාභය (LGD)

පැහැර හැරීමේ අලාභය යනු කිසියම් පැහැර හැරීමක් සිදුවන අවස්ථාවක ඇතිවන අලාභයේ ඇස්තමේන්තුවක් වේ. යම් කිසි කාලච්ඡේදයක් තුළදී පැහැර හැරීමෙන් පසුව සුරැකුම් උපලබ්ධි කිරීම් වැනි දෑ සැලකිල්ලට ගනිමින් අයකර ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය හා ගිවිසුම්ගත මුදල් ප්‍රමාණය අතර වෙනස මත පැහැර හැරීමේ අලාභය පදනම් වේ. මෙය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගයෙහි ප්‍රතිශතයක් ලෙස සාමාන්‍යයෙන් දක්වයි. සටහන 28 යටතේ පැහැර හැරීමේ අලාභය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

4.4.11.5 හානිකරණය සඳහා මට්ටම නිර්ණය කිරීම

සෑම වාර්තාකරණ දිනයකදීම ආරම්භක හඳුනාගැනීමේ සිට නිරාවරණයන්ගේ ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි. මෙය තක්සේරු කරනු ලබන්නේ ආරම්භක හඳුනාගැනීමේ දිනය හා අපේක්ෂිත ජීවිත කාලය අතර පැහැර හැරීමේ අවදානමක් තිබේද යන්න සැසඳීමෙනි. මෙම කාර්යයේදී විශේෂ වියදමක් හෝ වෑයමක් නොමැතිව ලබාගන්නා සාධාරණ හා විශ්වාසදායක තොරතුරු පිලිබඳව සමූහය සලකා බලයි. මෙය ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු මෙන්ම ඉදිරි දැක්මක් සහිත විශ්ලේෂණයකින්ද යුක්ත වේ.

වත්කම් වල ගුණාත්මකභාවය පිරිහීයාමේදී නිරාවරනයන් අපේක්ෂිත ණය හානියේ අදියර තුළ සංක්‍රමණය වේ. පසුකාලීනව වත්කම් වල ගුණාත්මකභාවය වර්ධනය වුවහොත් හා කලින් තක්සේරු කරන ලද ආරම්භයේ සිට ඇති ණය අවදානමෙහි සැලකිය යුතු අඩු වීමක් සිදු වුවහොත් අවිනිශ්චිත ණය සඳහා කරන වෙන් කිරීම් ජීවිත කාලය සඳහා වන අපේක්ෂිත ණය හානියේ සිට මාස 12 සඳහා වූ ණය හානිය දක්වා අඩු වේ. ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස පිරිහී ගොස් නොමැති හෝ පිරිහීම සමූහයේ ආයෝජන ශ්‍රේණිගත නිර්නායකයන් තුළ පවතින හෝ හිඟ හිටි දින ගණන සිට දින 30 කට වඩා අඩු නිරාවරණයන් පහල ණය අවදානමක් ඇති නිරාවරණයන් ලෙස සැලකේ. මෙම මූල්‍ය වත්කම් සඳහා හානිකරණ වෙන් කිරීම මාස 12 ක් සඳහා වූ අපේක්ෂිත ණය අලාභය මත පදනම්ව සිදු කරයි.

කේවල හා සාමූහික පදනම මත නිරාවරණයන් සඳහා වන ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි. උපකරණයේ වර්ගය, ණය අවදානම් ඇගයුම්, ඇප වර්ගය, ආරම්භක හඳුනාගැනීමේ දිනය, කල් පිරීමට ඇති කාලය, කර්මාන්තය, ණය ගැතියාගේ භූගෝලීය ව්‍යාප්තිය හා අනෙකුත් අදාල සාධක යනාදිය සැලකිල්ලට භාජනය කර සාමූහික හානිකරණ ඇගයීම සඳහා ණය අවදානම් ලක්ෂණ පදනම් කරගෙන මූල්‍ය උපකරණ කාණ්ඩගත කෙරේ.

4.4.11.6 ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණය ගණනය කිරීම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ අවසර දී ඇති ණය සහ අත්තිකාරම් සඳහා වන හානිකරණය ගණනය කිරීමේදී බැංකුව උපකල්පනයන් භාවිතා කරයි. පහත සඳහන් පරිදි හිඟහිටි දින ගණන මත පදනම්ව ණය කළඹ අදියර තුනකට වර්ගීකරණය කර ඇති අතර මාස 12 අපේක්ෂිත ණය අලාභ (ECL) සහ ජීවිත කාලය අපේක්ෂිත ණය අලාභ(ECL) වල අදාළ වීමේ මට්ටම අදියර මත රඳා පවතී. ණය පහසුකමක වර්ගීකරණ තීරණය කිරීමේදී ණය පහසුකම්වලට අදාලව ලබා ගන්නා ලද සුරැකුම් වර්ගය සහ වටිනාකම සලකා බලනු නොලැබේ. ණය ගැණුම්කරුවෙකුට බැංකුව සමඟ අයිරා සීමාවන් සහිත ජංගම ගිණුම් කිහිපයක් තිබේ නම්, අයිරා වර්ගීකරණය කිරීමේ අරමුණු සඳහා, සමස්ථ අනුමත සීමාව සහ එවැනි සියලුම ගිණුම්වල දෛනික හිඟ සමස්ත ශේෂය සලකා බලනු ලැබේ.

4.4.11.6.1 සක්‍රීය ණය පහසුකම්

(අ) ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ අදියර 1 ලෙස වර්ග කර ඇති සියලුම ණය පහසුකම් සහ

(ආ) ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" යටතේ ණය පහසුකම් ණය අවදානම් සැලකිය යුතු වැඩි වීමක් හඳුනාගෙන ඇත්නම් ඒවා (ඌන ක්‍රියාකාරී ණය පහසුකම්), 2 වන අදියර ලෙස වර්ගීකරණය කර ඇත.


4.4.11.6.2 අක්‍රීය ණය පහසුකම් (NPCF)

අක්‍රීය ණය පහසුකම් (NPCF) යන්නෙන් අදහස් වන්නේ,

(අ) ගනුදෙනුකරුවෙකුගේ ගෙවිය යුතු ගිවිසුම්ගත නියමිත දින සිට දින 90කට වැඩි කාලයක් ගතවී ඇති (ගෙවිය යුතු ගිවිසුම්ගත නියමිත දින සිට ගෙවිය යුතු දින ගණන ගණනය කරනු ලැබේ).

(ආ) අනුමත සීමාව දින 90කට වඩා වැඩි කාලයක් පුරා පැවතුනි.

(ඇ) ශ්‍රී ලං.මූ.වා.ප්‍ර 9 - "මූල්‍ය උපකරණ" අනුව අදියර 3 ලෙස වර්ග කර ඇති වෙනත් ඕනෑම ණය පහසුකම් (විභව අවදානම් සහ ආරම්භයේ හානිකරණය මත පදනම්ව අක්‍රීය ණය පහසුකම් ලෙස වර්ග කර ඇති පහසුකම්).



	සක්‍රිය ණය	අක්‍රිය ණය පහසුකම් (NPCF)
අදියර 1	**අදියර 2**	**අදියර 3**
• ගෙවිය යුතු දින සිට 30ක් හෝ දින 30 කට අඩු කාලයක් හිඟහිටි	• ගෙවිය යුතු දින සිට දින 31 ක් සිට දින 89 ක කාලයක් හිඟහිටි	• ගෙවිය යුතු දින සිට දින 90ක් හෝ දින 90 කට වඩා වැඩි කාලයක් හිඟහිටි
• අදියර 2 හෝ 3 යටතේ වර්ගීකරණය කර නොමැති සියලුම ණය පහසුකම්	• ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු පළමු ප්‍රාග්ධනය සහ/හෝ පොළී වාරිකය නියමිත දින සිට අවම වශයෙන් දින 90ක සතුටුදායක සක්‍රීය කාලසීමාවක් යටතේ, ණය පහසුකම් වැඩිදියුණු කිරීම හැර, දෙවරක් ප්‍රතිව්‍යුහගත කරන ලද සියලුම ප්‍රතිව්‍යුහගත ණය. • සටහන 28 - "ණය සහ අත්තිකාරම්" යටතේ දක්වා ඇති පිරිහීමේ සාධක මත පදනම්ව හඳුනාගත් සැලකිය යුතු ණය පිරිහීමක් ලෙස අර්ධක්‍රියාකාරී ණය පහසුකම්/ නිරාවරණය	• ප්‍රතිව්‍යුහගත ණය පහසුකම්/නිරාවරණ වැඩිදියුණු කිරීම් සහ සතුටුදායක තත්ත්වයන් යටතේ වන පළමු ප්‍රාග්ධනය සහ/හෝ පොළී වාරිකය නියමිත දින සිට අවම වශයෙන් දින 90ක සතුටුදායක සක්‍රීය කාලසීමාවක් යටතේ කාර්ය සාධන කාලයක් නොමැති දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කර ඇති ණය පහසුකම් • නැවත ගිවිසුම් ගත කර ඇති සියලුම ණය සහ අත්තිකාරම් • මහ බැංකුවේ විධිවිධාන අනුව අක්‍රීය ලෙස වර්ග කර ඇති සියලුම ණය පහසුකම් • සටහන 28 - "ණය සහ අත්තිකාරම්" යටතේ ලබා දී ඇති පිරිහීමේ සාධක අනුව සැලකිය යුතු ණය පිරිහීමකින් හඳුනාගත් ගනුදෙනුකරුවන්

ඉහත වර්ගීකරණ කාර්යය සඳහා, ණය ගුණාත්මක භාවයේ පිරිහීම හේතුවෙන් මුල් ආපසු ගෙවීමේ නියමයන් සංශෝධනය කර ඇත්නම්, එම පහසුකම ප්‍රතිව්‍යුහගත පහසුකමක් ලෙස සලකනු ලබන අතර ප්‍රතිව්‍යුහගත පහසුකම් හඳුනාගැනීමේදී බැංකුවේ "ණය දරාගැනීමේ ප්‍රතිපත්තිය" ද සලකා බැලිය යුතුය. බැංකුවේ ණය දරාගැනීමේ ප්‍රතිපත්තියට අනුව, පහත සඳහන් වෙනස්කම්/නිර්ණායක ණය පහසුකමක මුල් ආපසු ගෙවීමේ කොන්දේසිවලට වෙනස්කම් ලෙස පිළිගැනේ.

- පොළී අනුපාත වෙනස් වීම
- දිගුවන් (පරිණත) වෙනස් කිරීම
- සහන කාල සීමාවට වෙනස්කම්
- පොළී කපාහැරීම

4.4.11.6.3 අක්‍රීය ණය පහසුකම් (NPCF) උප වර්ගීකරණය

හිඟ හිටි දින ගණන සහ විභව අවදානම් මට්ටම මත පදනම්ව අක්‍රීය ණය පහසුකම් (NPCF) පහත සඳහන් පරිදි තවදුරටත් කාණ්ඩ හතරකට වර්ග කර ඇත:

වර්ගීකරණය	හිඟ හිටි දින ගණන	විභව අවදානම් නිර්ණායක
විශේෂයෙන් හදුනාගත්	>90 සහ < = 180	කාලානුරූපීව නිවැරදි නොකළහොත් අනාගතයේදී පාරිභෝගිකයාගේ ආපසු ගෙවීමේ හැකියාවට අහිතකර ලෙස බලපෑ හැකි දුර්වලතා පෙන්නුම් කරයි.
ආශ්‍රිත සම්මත	> 180 සහ < = 270	පවත්නා කොන්දේසි මත ආපසු ගෙවීමේ අවදානම සහ ආපසු ගෙවීමේ අවිනිශ්චිතතාවයට බාධා ඇති කළ හැකි ව්‍යාපාරය, මුදල් ප්‍රවාහය හෝ පාරිභෝගිකයාගේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් නිශ්චිත දුර්වලතා ප්‍රදර්ශනය කරයි.
අඩමාණ	> 270 සහ < = දින 360	පැහැර හැරීමේ ඉහළ හෝ අර්ධ අවදානමක් පෙන්නුම් කරන හෝ සම්පූර්ණ වකතු කිරීම අවිනිශ්චිත විට සහ පැහැර හැරීමේ ඉහල අවදානමක් ඇතිවිට වේ.
අලාභයට ගිය	> දින 360	වකතු කළ නොහැකි යැයි සලකන හෝ බොහෝ දුරට නිශ්චිත ආපසු ගෙවීමක් සිදු නොකරනු ඇති අතර ඉහත කාණ්ඩ යටතේ ඇතුළත් නොවන අනෙකුත් සියලුම අක්‍රීය ණය පහසුකම් (NPCF).

4.4.11.7 ණය පහසුකම් වැඩිදියුණු කිරීම

ආරම්භක අවස්ථාවට සාපේක්ෂව පසු දිනවලදී ණය පිරිහීමෙහි වැඩිදියුණු වීමේ මට්ටම මත පදනම්ව අදියර අතර ණය පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරේ.

ණය පහසුකම් වැඩිදියුණු කිරීමට අදාළ ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය යටතේ සපයා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව බැංකුව විසින් ණය පහසුකම් වැඩිදියුණු කරනු ඇත.

4.5 මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනකටම අදාළව මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය හා සම්බන්ධ වන සංඥාවන් පිළිබඳව බැංකුව තක්සේරු කරනු ලැබේ. එවන් සංඥාවක් පවතින විට දී හෝ හානිකරණය පිළිබඳව පරීක්ෂාවක් අවශ්‍ය විටක දී එම මූල්‍ය නොවන වත්කම් යළි අයකර ගැනීමේ ශක්‍යතාවය පිළිබඳව සළකා බැලේ. වත්කම් නැවත අයකර ගත හැකි අගය වනුයේ වත්කම භාවිතයේ පවතින වටිනාකම සහ එහි මුදල් ජනනය කරන ඒකකයන්ගේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් ඉවත් කළ පසු අගය යන දෙකෙහි උපරිම අගයයි. වත්කමේ ධාරණ අගය එහි නැවත අයකර ගැනීමේ අගය ඉක්මවන විට, එය හානිකරණයට ලක් වූ ලෙස සලකා වත්කම නැවත අයකර ගත හැකි අගයට ගිණුම්වල ගලපනු ලැබේ. භාවිතයේ පවතින වටිනාකම ගණනයේ දී, වත්කමට බද්ධ වන අවදානම සහ වෙළඳපොළ තක්සේරුව මත මුදලේ කාලානුරූපී වටිනාකම අර්ථ නිරූපනය කෙරෙන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ඇත. විකුණුම් පිරිවැය සාධාරණ අගයෙන් අඩුකර තීරණය කිරීමේදී ඒ සඳහා සුදුසු තක්සේරු ආකෘතීන් භාවිතා කෙරේ. මෙම තක්සේරුකරණයන් බහුවිධ තක්සේරු ක්‍රම, ප්‍රසිද්ධියේ විකිණෙන පරිපාලිතයන්ගේ ලැයිස්තු ගත කොටස් මිල හෝ අනෙකුත් වටිනාකම් ඇති සාධාරණ මිලක් පෙන්වන සංඥාවක් මඟින් තව දුරටත් තහවුරු කෙරේ.

4.6 භාරකාර සේවා

පාරිභෝගිකයින් වෙනුවෙන් වත්කම් රඳවා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සමූහය විසින් භාරකාර සේවා සපයනු ලැබේ. භාරකාරත්වයේ පවතින වත්කම් සමූහය මඟින් පාලනය නොකරන නිසා සහ සමූහය එම වත්කම් වල ප්‍රතිලාභ ලබාගන්නා අයිතිකරු නොවන නිසා එම වත්කම් සමූහයේ මූල්‍ය ප්‍රකාශවල හඳුනා නොගැනේ.

4.7 ප්‍රතිපාදනයන්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමානයේ දී නෛතික හෝ සම්මුතික වගකීමක් ඇති වූ විට දී එම වගකීම නිවැරදිව තක්සේරුගත කල හැකි නම් සහ අදාළ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයන්හි පිටතට ගලා යාමක් සිදුවන බවට අපේක්ෂාවක් වේ නම් ඒ සඳහා ප්‍රතිපාදනයන් වෙන් කෙරේ.

ප්‍රතිපාදන වටිනාකම තීරණය කිරීමේදී වාර්තාකරණ දිනට පවතින වගකීම් පියවීමට අවශ්‍ය වඩාත් යෝග්‍යතම අගය ඇස්තමේන්තු කරන අතර එහිදී අදාළ සිද්ධිය සිදුවීමට ඇති අවිනිශ්චිතතාව හා අවදානම සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රතිපාදන තීරණය කිරීමේදී වර්තමාන වගකීම පියවීමට අවශ්‍ය මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරනු ලබයි නම්, එහිදී අදාළ මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය මත පදනම්ව දරා සිටින අගය තීරණය කරයි. භාරදූර ගිවිසුම් සඳහා ප්‍රතිපාදනයන් කරනු ලබන්නේ අදාල ගිවිසුමෙන් සමූහයට ලැබෙන අපේක්ෂිත ප්‍රතිලාභ එම ගිවිසුම් ඉටු කිරීමේදී දැරීමට සිදු වන නොවැලැක්විය හැකි පිරිවැයට වඩා අඩු නම් පමණි. අදාල ගිවිසුම අත්හිටුවීමට සිදුවුවහොත් එහිදී දැරීමට සිදුවන පිරිවැය හා ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යාමට දැරිය යුතු අපේක්ෂිත ශුද්ධ පිරිවැය යන දෙකෙහි වර්තමාන අගයන්ගේ අඩු අගය ප්‍රතිපාදනය ලෙස හඳුනාගනු ලැබේ.

4.8 ආදායම් බදු වියදම හා අනෙකුත් බදු

4.8.1 ආදායම් බදු වියදම

ආදායම් බදු, ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු යන කොටස් දෙකකින් සමන්විත වේ. විස්තරාත්මක තොරතුරු සටහන 18 යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

4.8.2 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VATFS)

එකතු කල අගය මත බද්ද සඳහා පදනම වන්නේ සේවක පාරිශ්‍රමික හා බදු පෙර ලාභයට නියම කර ඇති ආකාරයට ක්ෂය ගැලපීමෙන් පසු ලැබෙන ලාභයයි. 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත හා ආනුෂාංගික සංශෝධන අනුව 2022 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බැංකුවේ මුළු එකතු කළ අගය මත 18% (2021: 15%) ක බද්දකට යටත් විය. එසේම සමූහය "වටිනාකම ආරෝපිත ක්‍රමය" යටතේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කෙරේ.

4.8.3 බෝග රක්ෂණ බද්ද

2013 අංක 12 දරණ මුදල් පනත යටතේ බෝග රක්ෂණ බද්ද 2013 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන අතර බදු අය කිරීමෙන් පසු ලාභයෙන් 1% ක බද්දක් ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවිය යුතු වේ.

4.8.4 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL)

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට අනුව, 2022 ඔක්තෝම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා සඳහා එකතු කල අගය මත 2.5% ක ප්‍රමාණයක සහ මූල්‍ය නොවන සේවා පිරිවැටුම මත 2.5% ක ප්‍රමාණයක් සමාජ ආරක්ෂණ දායකත්ව බදු ලෙස ගනනය කරනු ලැබේ.

4.8.5 බැංකුව, පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන් විසින් බෙදා හරින ලද ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT)

බැංකුව විසින් බෙදා හරින ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද

බැංකුව එහි එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජයට ලාභාංශ බෙදා දෙන ලදී . 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ තුන්වන උපලේඛනය අනුව සහ එහි සංශෝධනවලට අනුව, ශ්‍රී ලංකා රජය විසින් ව්‍යුත්පන්න කරන ලද මුදල් ආදායම් බද්දෙන් නිදහස් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රජයට කරන ලද ලාභාංශ ගෙවීම් මත රඳවා ගැනීමේ බද්දක් අඩු නොවේ.

පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන් විසින් බෙදා හරින ලද ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT)

2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුව, නේවාසිකයින්ගෙන් ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT) අඩු කිරීමේ අවශ්‍යතාවය 2020 ජනවාරි 1 සිට ඉවත් කර ඇත. අනේවාසිකයින්ට ගෙවන ලාභාංශ ආදායම් බද්දෙන් නිදහස් කර ඇත. පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන්ගෙන් ලැබෙන ලාභාංශ ආදායම 2022 සැප්තැම්බර් 30 දක්වා 14%ක ආදායම් බද්දකට යටත් විය.

ඒ අනුව, 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂයේ පළමු භාගය සඳහා ලාභාංශ ආදායම මත 14% ක ආදායම් බදු අනුපාතයක් යොදන ලද අතර, දෙවන භාගය තුළ ලැබුණු ලාභාංශ ආදායම 15% ක අනුපාතයකට යටත් විය.

2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුව,ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT) 2023 ජනවාරි 1 සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දී ඇත. ඒ අනුව, පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්වලින් ලැබෙන ලාභාංශ ආදායම 15% ක අනුපාතයකට ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT) සඳහා යටත් අතර එය අවසාන රඳවා ගැනීමේ බද්දක් විය යුතුය.

5 රක්ෂණ ව්‍යාපාරය

5.1 ප්‍රතිරක්ෂණය

මෙමඟින් සමූහය සිය සියලු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සමඟ බැඳි රක්ෂණ අවදානම පැවරීමකට ලක්කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම මඟින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු ශේෂයන් නිරූපණය වේ. ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු ප්‍රමාණය තීරණයේ දී ප්‍රතිරක්ෂණ ගිවිසුම් සහ බැඳි හිමිකම්පෑම් සඳහා වන ප්‍රතිපාදන සහ ගෙවා නිමකල හිමිකම් සැලකිල්ලට භාජනය කරනු ඇත.

වාර්තාකරණ වර්ෂය තුළ සංඥාවක් ලද විට හෝ වාර්තාකරණ දිනයේ දී හෝ ප්‍රතිරක්ෂණ වත්කම්වල හානිකරණය පිළිබඳව සමාලෝචනයකට ලක්කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කමෙහි හඳුනා ගැනීමෙන් අනතුරුව සිදු වන ලද යම් සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු මුදල් නොලැබී යාමේ විෂයානුබද්ධ සාක්ෂියක් සපයනු ලබන විට හානිකරණයක් සිදු ව ඇති බවට නිගමනය කෙරේ. එය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිරක්ෂණය කරන ලද හෝ කිරීමට බලාපොරොත්තු වන ගිවිසුම්වලට අදාල වාරික ලැබීම් හා හිමිකම් දළ පදනම මත වාර්තා කරනු ලැබේ. ගිවිසුම් ගත අයිතිය නිම වූ පසු හෝ වෙනත් පාර්ශ්වයකට පැවරූ පසු ප්‍රතිරක්ෂණ වත්කම හෝ වගකීම බැහැර කිරීම සිදු වේ.

5.2 ලැබිය යුතු රක්ෂණ

ලැබිය යුතු රක්ෂණ ඒවා උපචිත වූ විට හඳුනා ගැනෙන අතර මූලික හඳුනා ගැනීමේ දී ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලවේ සාධාරණ අගය මත ගිණුම් ගත කෙරේ. ධාරණ අගය ගත නොහැකි බවට යම් සිද්ධියක් හෝ අවස්ථාවක් සංඥාවන් සපයන විට දී, ලැබිය යුතු රක්ෂණයන්හි ධාරණ අගයෙහි හානිකරණය පිළිබඳව සලකා බැලේ. එසේ හානිකරණ අලාභයක් වේ නම් එය ලාභ හෝ පාඩු ප්‍රකාශයෙහි හඳුනාගනී.

5.3 විලම්බිත වියදම්

5.3.1 විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය (DAC)

නව ව්‍යාපාර අත්පත්කර ගැනීම සඳහා දරන කොමිස්, ප්‍රතිරක්ෂණය, අලෙවිකරණ, ප්‍රතිපත්ති නිකුත් කිරීමේ පිරිවැය වැනි පිරිවැයන් නව ව්‍යාපාර හෝ අභිමතය පරිදි සහභාගී වීමේ විශේෂාංග සහිත ආයෝජන ගිවිසුම්වල අනාගත වාරික වලින් ආවරණය කරගත හැකි ආකාරයට විලම්බිත කෙරේ. අනෙකුත් සියළු අත්පත් කර ගැනීමේ වියදම් ඒවා දරන අවස්ථාවේදීම වියදම් ලෙස වාර්තා කෙරේ.

මූලිකව හඳුනා ගැනීමෙන් පසුව සාමාන්‍ය රක්ෂණ සඳහා විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය නොඉපයූ වාරික ක්‍රමක්ෂය කරනු ලබන කාල පදනමට ක්‍රමක්ෂය කරනු ලැබේ. ප්‍රතිරක්ෂණකරුවන්ගේ විලම්බිත අත්පත්කර ගැනීම් පිරිවැය කොටස අදාල වත්කම ක්‍රමක්ෂය කරන ආකාරයටම ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කෙරේ.

වත්කමට අදාලව අපේක්ෂිත ඵලදායී ජීවකාලයේ හෝ අනාගත ප්‍රතිලාභ ලැබීමේ රටාවේ වෙනස් විමක්, ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය වෙනස් කිරීම් මඟින් ගිණුම්ගත කරන අතර එය ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස් විමක් ලෙස සලකනු ලැබේ. ගිවිසුම් අවසන් වීම හෝ අවලංගු කිරීමකදී විලම්බිත අත්පත්කර ගැනීමේ පිරිවැය ඉවත්කරනු ලැබේ.

5.4 ප්‍රතිරක්ෂණ කොමිස්

පිටස්තර ප්‍රතිරක්ෂණ ගිවිසුම මත ලැබිය යුතු කොමිස් එම ප්‍රතිරක්ෂණ ගිවිසුම් කාලයට අදාලව විලම්බනය සහ ක්‍රමක්ෂය කරනු ලැබේ.

5.5 ආයෝජන ගිවිසුම් වගකීම්

ආයෝජන ගිවිසුම් අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.) සහිත හා රහිත ගිවිසුම් ලෙස වර්ගීකරණය කරයි. අ.ස.ල. සහිත ආයෝජන ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සමාන වේ.

අ.ස.ල. රහිත ආයෝජන ගිවිසුම් වගකීම් හඳුනා ගනු ලබන්නේ ගිවිසුමට ඇතුලත් වූ පසු සහ වාරිකය අය කිරීමෙන් පසුවය. මෙම වගකීම් මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර මෙම සාධාරණ අගය වන්නේ ගිවිසුම නිකුත් කෙරෙන ගනුදෙනු මිලයි. එම ගනුදෙනු මිල සඳහා සෘජුවම ආරෝපිත කල හැකි ගනුදෙනු පිරිවැය ඇතුලත් නොවේ. ආයෝජන ගිවිසුම් වගකීම මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව එය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මනිනු ලැබේ.

තැන්පතු හා නැවත ගැනීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම්වලට ගැලපුමක් වශයෙන් සෘජුවම වාර්තා කරයි. සාධාරණ අගයට ගැලපුම් සෑම වාර්තා කරන දිනකම සටහන් කරන අතර ඒවා ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනු ලබයි. සාධාරණ අගය අනාගතය සඳහා වූ වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රම භාවිතය තුළින් නිර්ණය කරනු ලබයි. ඒකක ගත ගිවිසුම් සඳහා සාධාරණ අගය ගණනය කරනුයේ සෑම ඒකකයකම ඔප්පු හිමියන් සඳහා ඇති ඒකක ගණන එම අරමුදල වාර්තාකරණ දිනයේ දී ඇති ඒකක මිලෙන් වැඩි කිරීම මඟින්ය. වාර්තාකරණ දිනයට ඒකක මිල තීරණය කිරීම සඳහා යොදා ගනු ලබන අරමුදල්මය වත්කම් සහ වගකීම්වල පදනම රඳා පවතින්නේ ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්වෙන අගයට විලම්බිත බදු සහ උපචිත නොවූ ලාභ වෙනුවෙන් වන ගැලපීම් සිදු කළ පසු අගයයි. ඒකක ගත නොවූ ගිවිසුම් ද අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලබන අතර ඒවා වට්ටම් ගත මුදල් ප්‍රවාහ හා අනුමානගත ආකෘති යන තක්සේරු ක්‍රම භාවිතය මඟින් නිර්ණය කරනු ලබයි. මෙම ආකෘතිවල වලංගු භාවය, ක්‍රමාංකිත බව සුදුසුකම් සහිත ස්වාධීන පුද්ගලයෙකු විසින් කලින් කල ඇගයීම් කරනු ලබයි.

ගිවිසුම කල් පිරුණු පසුව නිදහස් කිරීමෙන් හෝ අවලංගු කිරීමක් මඟින් වගකීම් බැහැර කල යුතුය. ඔප්පු හිමියාට අවලංගු කල හැකි ගිවිසුම් සඳහා වන සාධාරණ අගය අයිතිය අත්හරින අගයට වඩා අඩු නොවිය යුතුය. ගිවිසුම් මූල්‍ය අවදානම් සංරචක සහ සැළකිය යුතු රක්ෂණ අවදානම් සංරචකවලින් සමන්විත වන අතර සහ මෙම සංරචක දෙක සඳහා වූ මුදල් ප්‍රවාහයන් එකිනෙකට වෙනස් අතර ඒවා විශ්වාසී ලෙස මිනුම්කරණය කළ හැකිය. මේ සඳහා පාදක වන වටිනාකම් කලඹයක් ලෙස නොපවතී. රක්ෂණ අවදානම් සඳහා වන අධිභාර රක්ෂණය ගිණුම් ගත කරන පදනමට සමානව ගිණුම් ගත කෙරේ.

5.6 අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.)

අ.ස.ල. මඟින් ගිවිසුම් ගත අයිතීන් ඔප්පු හිමියන් වෙත පරිපූරක පොරොන්දු වූ ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ගේ අයිතීන් ලබාදෙනු ලබන අතර සැලකිය යුතු වැඩිපුර ප්‍රතිලාභ අ.ස.ල. කළඹ පවතින වත්කම්වල ක්‍රියාකාරිත්වය මත පදනම් වේ. 90/10 පදනම මත ඔප්පු හිමියන්ට සහ කොටස් හිමියන්ට අ.ස.ල. අරමුදලේ අතිරික්ත, කොන්දේසි ප්‍රකාරව බෙදා දිය හැකිය. මෙම අතිරික්ත ඔප්පු හිමියන් වෙත බෙදා දීමේ දී එහි වටිනාකම සහ කාලය තීරණය කිරීමේ අභිමතය සමූහය සතුය. පොරොන්දු වූ සහ අභිමතානුරූපී, වෙන්නොකළ අතිරික්ත ද ඇතුව සියලුම අ.ස.ල. වගකීම් රක්ෂණය යටතේ හෝ ආයෝජන ගිවිසුම් වගකීම් යටතේ සුදුසු ලෙස වාර්ෂිකව රඳවා තබා ගනු ලැබේ.

5.7 නොඉපැයූ වාරික මුදල් සංචිතය

නොඉපැයූ වාරික මුදල් සංචිතය නිරූපණය කරන්නේ නොඉක්ම වූ කාල සීමාව සඳහා ආවරණය වන අදාළ වාරිකවල අගයයි. නාමික නොඉපැයූ වාරික මුදල් ගණනය කර ඇත්තේ 1/24 පදනමටය.

6 අළුතින් නිකුත් කරන ලද සහ සංශෝධිත ගිණුම්කරණ ප්‍රමිත සහ අර්ථකතනයන්

6.1 වර්ෂය තුළ නිකුත් කරන ලද නව ගිණුම්කරණ ප්‍රමිති/දැනටමත් පවතින ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස් කිරීම්

6.1.1 ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 - "ව්‍යාපාර සංයෝජන"

1989 දී නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වූ රාමුව එහි අවශ්‍යතා සැලකිය යුතු ලෙස වෙනස් නොකර 2018 මාර්තු මාසයේදී නිකුත් කරන ලද මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුව වෙත යොමු කිරීමක් ප්‍රතිස්ථාපනය කරන ලදී.

මෙම සංශෝධනය බලාත්මක වන දිනය 2022 ජනවාරි 1 වේ.

ස්කන්ධ අවදානම යනු ස්කන්ධ දර්ශක සහ තනි කොටස්වල මට්ටමේ වෙනසක් හේතුවෙන් කොටස් කළඹේ සාධාරණ වටිනාකම පිරිහීමේ අවදානමයි. ස්කන්ධ අවදානම අධීක්ෂණය කරනු ලබන්නේ සමස්ත කළඹ සීමාවන්, තැරැව්කාර සීමාවන්, පාඩු සීමාවන් සහ අවදානමේදී අගය (VaR) ක්‍රමවේදය භාවිතා කිරීමෙනි. මෙම ආර්ථික අවපාත තත්ත්වය තුළ කොටස් විකිණීමෙන් ලාභ අත්කර ගැනීමට බැංකුව සිය සියලු උත්සාහයන් දරනු ලබයි.

64.5 මෙහෙයුම් අවදානම

ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයින්ගේ හෝ පද්ධතිවල ප්‍රතිඵලයක් ලෙස හෝ බාහිර සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස අලාභ ඇතිවීමේ අවදානම මෙහෙයුම් අවදානම ලෙස නිර්වචනය කෙරේ. මූලික දර්ශක ප්‍රවේශය (Basic Indicator Approach - BIA) ඇසුරෙන්, මෙහෙයුම් අවදානම සඳහා සැළකිය යුතු ප්‍රාග්ධනයක් වෙන් කිරීම බැංකුව විසින් සිදු කරන නමුත්, සත්‍ය මෙහෙයුම් අලාභය උක්ත සඳහන් ප්‍රාග්ධන වෙන් කිරීමට සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පැවතිනි. බැංකුවේ සාර්ව සහ විස්තීරණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව මඟින් අදාල සියළු අවදානම් සක්‍රියව කළමනාකරණය කිරීම සහතික කරයි.

64.6 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය යනු බැංකුව විසින් උපකල්පනය කරන අවදානම් වලට එරෙහිව ඇති මූල්‍යමය ආවරණයයි. ව්‍යාපාරයේ දිගුකාලීන ස්ථාවරත්වය සහතික කිරීම සඳහා නිසි ප්‍රාග්ධන කළමනාකරණය ඉතා වැදගත් වේ. ප්‍රාග්ධන කළමනාකරණයේ මූලික පරමාර්ථය වන්නේ අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා පවත්වාගෙන යාම සහ උපරිම ලාභදායීතාවය සඳහා ප්‍රශස්ථ ප්‍රාග්ධන භාවිතය සහතික කිරීමය. ව්‍යාපාරයේ විශාලත්වය සහ ස්වභාවය අනුව, බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනයේ මූලික මූලාශ්‍රය වන්නේ රඳවාගත් ඉපැයීම් ය. ව්‍යාපාර ව්‍යාප්තිය සඳහා පූර්ව තීරණය කළ ප්‍රාග්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රභවයන් ප්‍රාග්ධන වර්ධක සැලැස්ම තීරණය කරයි.

64.6.1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය යනු බැංකුවේ මූල්‍ය ශක්තියේ මිනුමක් වන අතර එහි ප්‍රාග්ධනයේ ණය, වෙළඳපොළ සහ ව්‍යාපාරයේ මෙහෙයුම් අංශවල අවදානම් බර සහිත වත්කම් (RWAs) අනුපාතයක් ලෙස ප්‍රකාශ වේ. මෙම අනුපාතය මඟින් පෙන්නුම් කරන්නේ, සාධාරණ මට්ටමේ අවදානමක් පවත්වා ගත හැකි ආකාරය ඵලදායි ලෙස තහවුරු කරන මූල්‍ය සෞභාග්‍ය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාවයි. දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු (DSIBs) සඳහා අවම මුළු ප්‍රාග්ධන අවශ්‍යතාවය 14% වන අතර බැංකුවට ස්ථර I ප්‍රාග්ධන මට්ටම 10% පවත්වා ගැනීමට අවශ්‍ය වේ.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්තා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) නියාමකයා විසින් නියම කර ඇති බාසල් අවශ්‍යතාවයට සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව සියලු අවදානම් වලට එරෙහිව පවත්වා ගත යුතු ප්‍රාග්ධන මට්ටම තීරණය කරයි. බැංකුව නිරාවරණය වන සියලුම අවදානම් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගෙන යන බව සහතික කරන ලද සහ සැලසුම් කළ ව්‍යාපාරික ක්‍රියාවලිය මත පදනම්ව ප්‍රාග්ධන සැලසුම්කරණය ICAAP විසින් පහසු කරනු ලැබේ. ICAAP හි ස්ථම්භ II අවදානම් තක්සේරු කිරීම සඳහා බැංකුව ජාත්‍යන්තරව පිළිගත් අභ්‍යන්තර ආකෘති භාවිතා කරන අතර මුළු ප්‍රාග්ධන අවශ්‍යතාවය තීරණය කිරීම සඳහා බහුවිධ අවස්ථා භාවිතා කරමින් පුළුල් ආතති පරීක්ෂාවක් සිදු කරයි.කිර්තිනාම අවදානම, අනුකූලතා අවදානම සහ තොරතුරු තාක්ෂණ අවදානම වැනි සියලුම ගුණාත්මක අවදානම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) මඟින් සලකා බලනු ලැබේ. උපායමාර්ගික අවදානම තක්සේරු කරනු ලබන්නේ අභ්‍යන්තරව ගොඩනගන ලද අවදානම් දර්ශකයක් හරහා වන අතර සංකේන්ද්‍රන අවදානම තක්සේරු කිරීම මඟින් බැංකුව කුමන හෝ පාර්ශවයකට, නිෂ්පාදනයකට, අංශයකට හෝ භූගෝලීය කාණ්ඩයකට අධික ලෙස නිරාවරණය නොවූ විවිධාංගීකරණය වූ කළඹක් ඇති බව සහතික කරයි.

ප්‍රාග්ධන මට්ටම්	2022 රු. '000	2021 රු. '000
ණය අවදානම් බරිත වත්කම් සඳහා ප්‍රාග්ධන ගාස්තුව	216,511,528	172,957,147
ණය වෙළෙඳපොළ අවදානම් බර සහිත වත්කම් සඳහා ප්‍රාග්ධන ගාස්තුව	2,763,445	2,321,172
මෙහෙයුම් අවදානම් බරිත වත්කම් සඳහා ප්‍රාග්ධන ගාස්තුව	21,422,430	16,152,434
ස්ථර I ප්‍රාග්ධනය (අවම නියාමනය – 10%)	12.41	14.25
මුළු ප්‍රාග්ධනය (අවම නියාමනය – 14%)	15.38	17.77

9

අනුකූලතා ඇමුණුම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා
361

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා
366

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා
385

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා
387

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
392

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
අ	**අධ්‍යක්ෂ මණ්ඩලය**
අ.1	1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුකූලව කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් විෂය භාර අමාත්‍යවරයා හරහා අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම සිදු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ දී ඉහළ මට්ටමේ නිපුණතා ඇති, වගකීම් හෙබවිය හැකි අධ්‍යක්ෂවරු පත් කිරීමට සැලකිලිමත් වනු ලබන අභ්‍යන්තර ප්‍රතිපත්තියක් අනුමත කර ඇත. ඒ අනුව සුදුසුකම් හා අත්දැකීම් ඇති අධ්‍යක්ෂවරුන් බැංකුව නිවැරදි දිශානතියට ඵලදායී ලෙස හසුරුවනු ලැබේ. ඉහත සඳහන් කරන ලද ආඥා පනතට අනුව අනුමත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ගණන සය දෙනෙකි. 2022 ජනවාරි මාසයේ දී අධ්‍යක්ෂවරයකුගේ ඉවත් වීම හේතු කොට ගෙන වර්ෂය අවසානය වන විට අධ්‍යක්ෂ මණ්ඩලය හතර දෙනෙකුගෙන් සමන්විත විය. 2022 වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩලයේ සංයුතිය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 120 සහ 123 හි සඳහන් වේ. එක් නව අධ්‍යක්ෂවරයකු නියාමන ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත කිරීමේ ක්‍රියාවලියට යටත්ව ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් හා අත්දැකීම් ඔවුන් පිලිබඳ විස්තර වලින් දැක්වේ.
අ.1.1	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්
	සෑම දෙසතියකට වරක්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වෙන අතර අවශ්‍යතාවයන් පැන නැඟුන විට විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලැබේ. වසර ආරම්භයේදි රැස්වීම් සඳහා සැලැස්මක් සකස් කරන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේ ව්‍යුහයකට එකඟවී ඇත. එසේ එකඟ වූ පරිදි තීරණ ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ. වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය 24 වරක් රැස් වූ අතර පැමිණීමේ වාර්තාවල සාරාංශය 127 පිටුවේ දැක්වේ.
අ.1.2	අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව හා වගකීම
	අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය තුළ අධ්‍යක්ෂවරුන්ගේ භූමිකාව හා වගකීම අන්තර්ගතවන අතර එය අවසන් වරට සමාලෝචනය කරන ලද්දේ 2022 වසරේදි වන අතර බැංකුවේ මෑතකදී සම්මත කරගත් ආයතනික යහපාලන ප්‍රතිපත්තියට එය ඇතුලත් කර ඇත.
අ.1.3	රටේ පවත්නා නීතියට අනුකූලව කටයුතු කිරීම
	1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන්ට අනුව බැංකුව නියාමනය වේ. තවද ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකුවේ විදේශීය ශාඛා ඇති රටවල නියාමනයන්, සුරැකුම්පත් හා විනිමය කොමිසම හා කොළඹ කොටස් හුවමාරුව මඟින් නිකුත් කර ඇති නියාමනයන්ට බැංකුව අනුකූල වන අතර බැංකුවට අදාළ වන නීති වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කරයි. ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා ප්‍රවේශය අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය වූ විට බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සඳහා අනුමත ප්‍රතිපත්තිය මත ප්‍රවේශ විය හැකි අතර එය 2022 වසර තුළ සමාලෝචනය කර ඇත.
අ.1.4	සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන්
	සියළුම අධ්‍යක්ෂවරුන්ට, නීතිඥවරියක් වන ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමියගෙන් උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති හා රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සහ බැංකුවට අදාළ වාර්තා තබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, ඉවත් කිරීමේ අවශ්‍යතාවයන් පැන නැඟුන විට එය මුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම සැලකිල්ල යොමු කර ක්‍රියාවට නැංවිය යුතු කාර්යයක් වේ.
අ.1.5	ස්වාධීන විනිශ්චය
	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික සැළසුම්, කාර්යසාධනය, සම්පත් විභාජනය, අවදානම් කළමනාකරණය, අනුකූල වීම් හා සම්මතයන් පවත්වාගෙන යාමට අදාළ කාර්යයන් හා වගකීම් වලදී ස්වාධීන විනිශ්චයන් දරනු ලැබේ.
අ.1.6	අධ්‍යක්ෂ මණ්ඩලයේ හා බැංකුවේ කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි කාලය වෙන් කිරීම හා කැපවීම
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සලස්වන අතර එමඟින් වැඩිදුර තොරතුරු සොයා බැලීමට හා අවශ්‍ය දත්ත ගැන විමසීමට ප්‍රමාණවත් කාලයක් ලැබී ඇත. පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය යැයි සැලකෙන විට සැලසුම් කරනු ඇත.
අ.1.7	යෝජනාවන් ඉදිරිපත් කිරීම
	බැංකුවේ කටයුතු පිළිබඳව බැංකුවේ යහපත උදෙසා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හට තනි තනිව තමන්ගේ යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
අ.1.8	අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණු වීම්
	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පළමු වරට පත් වීමේදී හඳුන්වාදීමේ වැඩසටහනකට සහභාගි වීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සැලසෙන අතර එහිදී බැංකුවට අදාළ නියාමන අවශ්‍යතාවන්, බැංකුවේ ඉතිහාසය, සංවිධාන ව්‍යුහය, බැංකුවේ පරිපාලිතයන් හා ආශ්‍රිතයන් පිළිබඳ විස්තර, බැංකුවේ නිෂ්පාදන හා සේවා පිළිබඳ විස්තර ද අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ද ඇතුළත් සවිස්තරාත්මක ලිපිගොනුවක් ලබාදෙන අතර දත්ත ලබා ගැනීම සඳහා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයට පිවිසීමට ඉඩ සලස්වනු ලැබේ. පුහුණු සැසි සඳහා සහභාගී වීමට අධ්‍යක්ෂවරුන් උනන්දු කරවන අතර බැංකුවේ බාහිර පරිසරයේ වර්තමාන සහ නව්‍ය උපායමාර්ගයන්, පිළිඳව බැංකුවේ ආයතනික කළමනාකාරිත්වය මඟින් හෝ බාහිර සම්පත් දායකයකු මඟින් හෝ විස්තරාත්මකව පැහැදිලි කිරීම් සිදු කෙරේ. වසර තුළ අධ්‍යක්ෂවරු කිසිදු පුහුණු වැඩසටහනකට සහභාගි වී නැත.
අ.2	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරිතුමා අතර වගකීම් විභාජනය
	ලංකා බැංකුවේ සභාපති තනතුර හා ප්‍රධාන විධායක නිලධාරී තනතුර (ලංකා බැංකුවේ මහා කළමනාකරු) පුද්ගලයන් දෙදෙනෙකු විසින් දරණු ලබයි. සභාපති, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. බැංකුව විසින් නිකුත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුව ලංකා බැංකුවේ සභාපතිතුමාගේ හා මහා කළමනාකාරතුමාගේ වගකීම් ඉතා පැහැදිලිව දක්වා ඇත.
අ.3	සභාපතිතුමාගේ භූමිකාව
	බැංකුවේ සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සපයනු ලැබේ. මහා කළමනාකාරතුමා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් අදාළ කරුණු වලට අනුව ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය සභාපතිතුමාගේ අවසරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍ර සකස් කරයි. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය විසින් සකස් කරන ලද න්‍යාය පත්‍රය සභාපතිතුමා විසින් අනුමත කරයි. උපායමාර්ග, කාර්යසාධනය, සම්පත් විභජනය, අවදානම් කළමනාකරණය හා අනුකූල වීම යන සියළු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි මෙම න්‍යාය පත්‍ර සකස් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින හතකට පෙර අදාළ කරුණු පිළිබඳ ප්‍රමාණවත් විස්තර ඇතුලත් න්‍යාය පත්‍රය ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. සියළුම අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ යුතුකම් හා වගකීම් ද (අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි) අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල ව්‍යුහයද පැහැදිලිව ප්‍රකාශ කිරීම හේතු කොට ගෙන සිය වගකීම් නිසි ආකාරයෙන් ඉටු කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් ඔවුන්ගේ හැකියාවන් මත බැංකුවේ සාර්ථකත්වයට උපරිම දායකත්වය ලබා දෙයි. සියළුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම් න්‍යාය පත්‍රයට අදාළ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට හා අවශ්‍ය වැඩිදුර දත්ත ලබා ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දී ඇති අතර ආයතනිකමය වශයෙන් වැදගත් යැයි හැඟෙන කරුණු න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ඉල්ලා සිටීමට අවස්ථාව සලසා ඇත. සැලකිල්ලට භාජනය කරන ලද ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තහවුරු කරනු ලබන අතර, එවැනි සාකච්ඡාවන් පිළිබඳ විස්තරාත්මකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ සටහන් කර ඇත.
අ.4	මූල්‍ය නිපුණතාවය
	බැංකුවේ කටයුතුවලට මඟපෙන්වීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය දැනුමක් හා නිපුණතාවයක් අධ්‍යක්ෂවරුන් සතුව ඇති අතර ඒ සඳහා ඔවුන්ට තම ව්‍යාපාර/වෘත්තීය තුළින් ලද පෙරහුරුවන් මහෝපකාරී වේ.
අ.5	අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිතතාවය
	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සෑම විටම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. විකල්ප අධ්‍යක්ෂවරුන් පත්වන අවස්ථා වලදී ද ඔවුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වීම අනිවාර්ය වේ.
අ.6	කාලීන තොරතුරු සැපයීම
	න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු පත්‍රිකා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු රැස්වීම් වලට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වීම මඟින් ඒ සඳහා තොරතුරු සොයා බැලීමට අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සුමටව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී අවශ්‍ය කරුණු පැහැදිලි කර ගැනීම සඳහා පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කරනු ලැබේ. පැහැදිලි කිරීම් කටයුතු සඳහා ආයතනික කළමනාකාරිත්වයේ අදාළ සාමාජිකයන් සුදානම්ව සිටී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සිට දින 10 ක් ඇතුළත දී එහි වාර්තාව අධ්‍යක්ෂවරුන්ට ලබා ගැනීමට ඉඩ සලස්වා ඇත.
අ.7	අධ්‍යක්ෂ මණ්ඩල සඳහා පත්වීම්
	ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් තම විෂය පථයට බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් බැංකු ආඥා පනත හා එහි සංශෝධන හා අදාළ නීතිරීති වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් කරනු ලැබේ. එමෙන්ම අදාළ අමාත්‍යාංශ සමඟ හුවමාරු කරගත් අධ්‍යක්ෂවරුන් පත් කිරීමට අදාළ අභ්‍යන්තර ප්‍රතිපත්තියක් බැංකුව සතුව පවතී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
අ.8	නැවත පත් කිරීම
	තම සේවා කාලයට ප්‍රථම අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් කළහොත් හෝ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට අනුව ධූරය හෙබවීමෙන් ඉවත් වුවහොත් හැර සෑම අධ්‍යක්ෂවරයෙකුම අවුරුදු තුනක සේවා කාලයක් සඳහා පත් කරනු ලබන අතර මෙම අවස්ථා දෙකෙහිදීම බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් වීමට බාධාවක් ඇති නොවේ. **ධූරයෙන් ඉල්ලා අස්වීම** පත් වූ අධ්‍යක්ෂවරයෙකු තම අධ්‍යක්ෂ ධූරයෙන් ඉල්ලා අස්වන විට හා සේවා කාලය අවසන් වනවිට තම ඉල්ලා අස්වීමේ ලිපිය බැංකු කටයුතු විෂය භාර අමාත්‍යවරයාට ලිඛිතව ලබාදිය යුතුවේ. තවද විශේෂ හේතුවක් මත සේවයෙන් ඉවත් වන්නේ නම් එයද තම ලිපියෙහි සඳහන් කළ යුතුවේ. ජයම්පති මොල්ලිගොඩ මහතා පෞද්ගලික හේතූන් මත 31 ජනවාරි 2022 සිට බලපැවැත්ත් වන පරිදි ඉල්ලා අස්විය.
අ.9	අධ්‍යක්ෂ මණ්ඩලයේ හා එහි උපකමිටු වල කාර්යසාධනය ඇගයීම
	අධ්‍යක්ෂ මණ්ඩලයේ හා උපකමිටු වල අදාළ ඉලක්ක නිවැරදිව ළඟා කර ගනිමින් අදාළ කමිටු වගකීම් තෘප්තිමත් විය හැකි අයුරින් ඉටුකර ඇති බව තහවුරු කර ගැනීමට ස්වයං ඇගයීම් ක්‍රියාවලියක අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාළ උපකමිටු නිරත වේ. එම කමිටු සියල්ලේම සාමූහික ප්‍රතිඵලය අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සමාලෝචනය කරනු ලැබේ. මෙම වර්ෂයේදී මෙම ස්වයං ඇගයීම් හා සමාලෝචන ක්‍රියාවලිය නාමයෝජනා සහ යහපාලන අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු හරහා සිදු කර ඇත. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු සාමාජිකන් එම උපකමිටු වල කාර්යසාධනයන් හි ඵලදායකත්වය සහ කාර්යක්ෂමත්වය සාමූහිකව ඇගයීමට ලක් කරන ලදී.
අ.10	අධ්‍යක්ෂවරු සම්බන්ධයෙන් තොරතුරු වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කිරීම
	අධ්‍යක්ෂවරු හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු වාර්ෂික වාර්තාවේ සඳහන් වේ. නම, සුදුසුකම්, ප්‍රවිණතාවය දක්වන ක්ෂේත්‍ර, විධායක හෝ විධායක නොවන බව ද ඇතුළුව අධ්‍යක්ෂවරුන්ට අදාළ විස්තර පිටු අංක 26 සිට 29 දක්වා ඇත. සම්බන්ධිත පාර්ශ්ව විස්තර පිටු අංක 320 සහ 322 දක්වා ඇති අතර වෙනත් ආයතන වල දරණ අධ්‍යක්ෂධූර පිළිබඳ විස්තර පිටු අංක 26 සිට 29 දක්වා ඇත. උපකමිටු වල සමාජිකත්වය, වර්ෂය තුළ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම් වල සහභාගීත්වය පිළිබඳ පිටු අංක 127 හි දක්වා ඇත.
අ.11	ප්‍රධාන විධායක නිලධාරී/මහා කළමනාකරු ඇගයීම
	මහා කළමනාකාරතුමාගේ වාර්ෂික කාර්යසාධන වාර්තාව මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මඟින් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර කාර්යසාධනය මැන බැලීමට ගන්නා නිර්ණායක ලෙස බැංකුව අදාළ වර්ෂය තුළ ළඟා කරගත් ඉලක්ක හා ඊට අනුබද්ධිතව ඇති වර්ෂය ආරම්භයේ සකස් කල ආයතනික සැලැස්ම යොදා ගනී.
ආ	**අධ්‍යක්ෂ පාරිශ්‍රමික**
ආ.1	සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය (සියළුම විධායක නොවන) සඳහා පාරිශ්‍රමික ගෙවීමේ විධිමත් ක්‍රමවේදයක් ඇති අතර එය අදාළ අමාත්‍යාංශය හරහා කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ සහ අනෙකුත් ව්‍යවස්ථාපිත නීති රීති වලට අනුකූලව ද සිදු කරනු ලබයි.
ආ.2	බැංකුවේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට, අධ්‍යක්ෂවරුන්ගේ දීමනා පිළිබඳ තීරණ ගැනීමට බලයක් නොමැත. (එහෙත් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගේ පාරිශ්‍රමික සඳහා නිර්දේශයන් ඉදිරිපත් කිරීමට බලය ඇත).
ආ.3	පාරිශ්‍රමික පිළිබඳ හෙළිදරව් කිරීම
	සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප් ප්‍රතිපත්තිය තුළ අන්තර්ගත කරුණු මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 129 හි දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවූ මුළු පාරිශ්‍රමික පිළිබඳව පිටු අංක 208 හි දක්වා ඇත. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සංයුතිය පිටු අංක 134 හි දක්වා ඇත.
ඇ	**කොටස්කරුවන් හා ඇති සම්බන්ධය**
ඇ.1	බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජය වන අතර බැංකුව හා කොටස් හිමියා අතර විවිධ ආකාරයෙන් සන්නිවේදන කටයුතු සිදු වේ. ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් නිලධාරියෙක් (මුදල් අමාත්‍යාංශ නිලධාරියෙකු) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන අතර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම ද සිදුවේ. වාර්ෂික වාර්තාව පිළිබඳ විමසීම් කිරීම් සඳහා පාර්ලිමේන්තුවේදී ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
ඇ.2	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල සන්නිවේදන ප්‍රතිපත්තියක් ඇත. බැංකුවේ කොටස්කරු වශයෙන් රජය සතුව පවතින බැංකුවට අදාළ වන ප්‍රධාන ගැටළු හා විශේෂිත අංශයන් පිළිබඳ සාකච්ඡා කිරීම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සිදු කරන අතර එහිදී රජයේ ප්‍රධාන නියෝජිතයා හා අවශ්‍ය වූ විට අමාත්‍යාංශයේ උසස් නිලධාරීන් සහභාගි වේ. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ අභ්‍යන්තර සහ භාහිර පාර්ශ්ව සමඟ සාර්ථක සන්නිවේදනයක් සඳහා පිහිටුවා ඇති සන්නිවේදනය ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.
ඇ.3	තවද 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත, 1988 අංක 30 දරණ බැංකු පනත, සුරැකුම්පත් හා විනිමය කොමිසම් පනත හා ඒවාහි සංශෝධන, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ නීති රීති වලට අදාළව අධ්‍යක්ෂවරු විසින් අදාළ අමාත්‍යාංශයට/අමාත්‍යවරයාට බැංකුවේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශාල සැලකිය යුතු වැදගත්කමක් සහිත ගනුදෙනු පිළිබඳ අවශ්‍ය වූ විට අනාවරණය කරනු ලැබේ. පිටු අංක 320 සහ 322 හි ඇතුළත් මූල්‍ය ගනුදෙනු වලට අමතරව බැංකුවේ කාර්යසාධනය/ලාභදායිත්වය හෝ ශුද්ධ වත්කම් පදනමට ප්‍රමාණාත්මක ලෙස බලපාන පරිදි කිසිදු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවක් අදාළ වර්ෂය තුළ සිදු වී නැත.
ඈ	**වගවීම හා විගණනය**
ඈ.1	මූල්‍ය හා ව්‍යාපාර වාර්තාකරණය (වාර්ෂික වාර්තාව) අදාළ මිනුම් දඬු භාවිතා කර බැංකුවේ මූල්‍ය තත්ත්වය, බැංකුවේ කාර්යසාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන හා අභියෝග, අවස්ථාවන් හා අපේක්ෂා පිළිබඳ වාර්තා පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයෙන් මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත. අදාළ නීති නියාමන හා මඟ පෙන්වීම් වලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කර ඇති අතර සැලකිය යුතු අපගමන අවස්ථා වලදී සාධාරණ පැහැදිලි කිරීම් ද මෙම වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කර ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතා, වෙනත් නියාමන ආයතන වලට ලබා දෙන වාර්තා, අතුරු සහ වෙනත් මිල සංවේදී ප්‍රසිද්ධ වාර්තා පිළියෙල කිරීමේදී සමතුලිත සහ පහසුවෙන් අවබෝධ කරගත හැකි අයුරින් පිළියෙල කර ඇති බව තහවුරු කරයි. බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තා සත්‍ය හා සාධාරණ බවට ප්‍රධාන මූල්‍ය නිලධාරී හා මහා කළමනාකාරතුමන් විසින් සහතික කරයි. සියළු මූල්‍ය වාර්තා ප්‍රසිද්ධ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පෙර විගණන කමිටුව මඟින් සමාලෝචනය කර අනුමැතිය සඳහා නිර්දේශ කරයි. අනුකූලතා අනාවරණ අවශ්‍යතා සපුරාලීම සඳහා පහත ප්‍රකාශන වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇත. බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව පිටු අංක 158 සිට 162 දක්වා ඇත. මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිටු අංක 165 සහ 166 දක්වා ඇත. අගය එකතු කිරීම යටතේ කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණ පිටු අංක 52 සිට 119 දක්වා ඇත. ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම හා ඔවුන්ට සම්බන්ධිත පාර්ශ්ව මඟින් කළ ගනුදෙනු පිළිබඳ සාරාංශය පිටු අංක 320 සහ 322 දක්වා ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිටු අංක 168 හි දක්වා ඇත. විගණකාධිපති වාර්තාව පිටු අංක 169 සිට 173 දක්වා ඇත.
ඈ.2	පවතින අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන විධි බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීමට යාමේදී ඇතිවිය හැකි ප්‍රධාන අවදානම් වල ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් බැංකුවේ පැවැත්ම, අවදානම් කළමනාකරණ වැඩසටහන් වල මෙහෙයුම් හා කාර්යක්ෂමතාවය, බැංකුවට බලපෑ හැකි විවිධ අවදානම් වළක්වා ගැනීම සඳහා ඇති ප්‍රතිපත්ති හා භාවිතයන් ද ඊට අදාළ අනුකූලතා පිළිබඳ විස්තරද සපයමින් අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුකම් සලසයි. බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ මෙහෙයුම් කටයුතු, මූල්‍ය හා අනුකූලතා කටයුතු නිවැරදිව හැසිරවීම විගණන කමිටුවේ තවත් වගකීමක් වේ. බැංකුවේ අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන පද්ධති සුපරීක්ෂණය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා විගණන කමිටුව පත් කර ඇති අතර එම කමිටු වල කාර්යක්ෂමතාව වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කෙරේ. බැංකුව සතුව සියළු අංශ වලින් පරිපූර්ණ වූ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් ඇති අතර එමඟින් අභ්‍යන්තර විගණන කටයුතු පරීක්ෂාවට ලක්විය. බැංකුවේ බාහිර විගණක ලෙස විගණකාධිපති කටයුතු කරයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
ඇ.3	**විගණන කමිටුව**
	සමාලෝචිත වසර තුළ බැංකුවේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත විය. එම වසර තුළ විගණන කමිටුවේ සභාපතිධූරය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් හෙබවීය. විගණන කමිටුවේ සභාපති ඇතුළු සාමාජිකයන් මූල්‍ය වාර්තාකරණය හා මූල්‍ය තත්ත්ව පාලනය පිළිබඳ මනා දැනුමකින් හා අත්දැකීම් වලින් පරිපූර්ණ අය වේ. අධීක්ෂණ වගකීම් ඉටුකිරීමේදී විගණන කමිටුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.
	විගණන කමිටුව විසින් අවදානම් කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරිත්වය හා කාර්යක්ෂමතාවයන් පිළිබඳ සමාලෝචන පැවැත්වීම, අභ්‍යන්තර විගණනය හා විගණන වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුවේ කාර්යභාරය හා වගකීම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 131 සහ 132 දක්වා ඇති විගණන කමිටු වාර්තාවේ හෙළිදරව් කර ඇත.
	විගණන කමිටුව සඳහා ලිඛිත නියමයන් නියම කර ඇති අතර එහි භූමිකාව සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කරයි. එමෙන්ම එය වර්ෂය තුළ සමාලෝචනය කරන ලදී. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කමිටුව විසින් සිදු කරන ලද කාර්යයන් මෙම වාර්තාවේ පිටු අංක 131 සහ 132 හි සඳහන් කර ඇත.
ඇ.4	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**
	සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අරමුණ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් තීරණ ගැනීමේදී අනවශ්‍ය ලෙස බලපෑම් කිරීමට ඇති බැඳියාව වලක්වාලීමයි.
	ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම් හා ඔවුන්ගේ ආසන්න පවුලේ සාමාජිකයන් විසින් සිදුකළ ගනුදෙනු පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් ප්‍රකාශයේ පිටු අංක 320 සහ 322 තුළ ඇතුළත් වේ.
ඇ.5	**ව්‍යාපාර හැසිරවීම හා ආචාරධර්ම සංග්‍රහය**
	අදාළ නියාමනයන් හා ප්‍රතිපත්ති වලට අනුකූල වීම සඳහා බැංකුව විසින් එහි සේවකයන්ට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන වෙනම ආචාරධර්ම සංග්‍රහයන් පවත්වා ගෙන යන අතර ඒවා පිළිගැනීම සඳහා ප්‍රතිඥා ලබාදේ. නීතිවිරෝධී සහ වංචා වාර්තාවීම් කඩිනම් වාර්තා කිරීමට හැකිවන පරිදි විසිල් බ්ලෝවර් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ.
ඇ.6	**ආයතනික යහපාලන අනාවරණය**
	හොඳ ආයතනික යහපාලන පුරුදු සමඟ අනුගත වීමට අදාළ තොරතුරු මෙම වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවේ පිටු අංක 120 සිට 156 දක්වා ඇතුලත් වේ.
ඉ	**කොටස් හිමිකාරිත්වය**
ඉ.1, ඉ.2	බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජයයි.
ඊ	**අන්තර්ජාලය හා සයිබර් අවකාශයේ සුරක්ෂිතතාව**
	බැංකුවේ ව්‍යාපාර ක්‍රමවේදය පවත්වා ගැනීමට භාවිතා වන තොරතුරු තාක්ෂණික මෙවලම් හරහා බැංකු පරිසරය තුළ හා ඉන් පිටත හුවමාරුවීම හේතු කොටගෙන බැංකුවට බලපෑ හැකි සයිබර් අවකාශ අවදානම හඳුනා ගැනීමේ ක්‍රියාපිලිවෙලක් බැංකුව සතුවේ.
	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් තොරතුරු සුරක්ෂණ ප්‍රතිපත්තිය, කළමනාකාරිත්වයට බැංකුවේ තොරතුරු සුරක්ෂිතභාවය තහවුරු කරලීමට අවශ්‍ය දිශානතිය සපයයි.
	මීට අමතරව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් බැංකුව, සයිබර් අවකාශ අවදානම් වලින් මිදීමට නිර්දේශිත පිළිවෙත් අනුගමනය කරන බවට සහතික වේ. සයිබර් අවකාශ අවදානම් වලින් ආරක්ෂා වීමට හා තත්ත්වය සමනය කිරීමට බැංකුව භාවිතා කරන ක්‍රියා පිලිවෙත් මෙම වාර්ෂික වාර්තාවේ අවදානම් කළමනාකරණ වාර්තාවේ පිටු අංක 140 සිට 156 තෙක් දක්වා ඇත.
	සයිබර් අවකාශීය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම උදෙසා බැංකුව විසින් ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු පත්කර ඇත.
	අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව අධ්‍යක්ෂවරුන් හට බැංකුවට අදාළව තොරතුරු තාක්ෂණය සම්බන්ධ කාර්යයන්ට අදාළ තීරණ ගැනීමේදී හා අධීක්ෂණ කටයුතු වලදී මනා පිටුවහලක් වේ.
උ	**පරිසරය, සමාජීය සහ යහපාලනය (ESG)**
	මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 55 සිට 59 දක්වා පරිසරය, සමාජීය සහ පාලනයට අදාල අනාවරණය කිරීම ඇතුළත් වේ.

9 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්		
3. (1) (I)	පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම තුළින් බැංකුවේ ආරක්ෂාව හා අඛණ්ඩතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශක්තිමත් කර ඇත.	
	(අ) බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීමත් ඒවා බැංකුව තුළ සන්නිවේදනය කිරීම.	අනුකූල වී ඇත. උපායමාර්ගික අරමුණු සකස් කිරීම සහ ආයතනික වටිනාකම් සමාලෝචනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඉහළ කළමනාකාරිත්වයේ සහභාගිත්වය ඇතුව සිදු කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සැලැස්ම සහ ආයතනික වටිනාකම් පිළිබඳව ශාඛා කළමනාකරුවන් දක්වා වූ සියලු කාර්ය මණ්ඩලයට සන්නිවේදනය කිරීම සිදු කරන ලදී. නිරන්තරයෙන් පවත්වන ලද සාකච්ඡා සැසි සහ රැස්වීම් හරහා අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල මේ පිළිබඳව දැනුවත් කරන ලදී. 2023-2025 සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ආයතනික සැලැස්ම ද පිළියෙල කර ඇත. තවද, ආයතනික වටිනාකම් අභ්‍යන්තර ජාලයට ඇතුළත් කර ඇත.
	(ආ) අඩුම වශයෙන් ඊළඟ වසර තුන සඳහා සමස්ථ අවදානම් ප්‍රතිපත්තිය හා අවදානම් කළමනාකරණ පටිපාටීන් සහ මැනිය හැකි අරමුණු සහිත යාන්ත්‍රණයන් ඇතුළත් බැංකුවේ සමස්ථ වෙළඳ කටයුතු පිළිබඳව උපායමාර්ග අනුමත කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, වසරක් පාසා සංශෝධනය වන, වසර තුනක කාලයක් සඳහා වූ ආයතනික සැලැස්ම හා ඊට සමගාමී ක්‍රියාකාරී සැලැස්ම තුළ බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ග ඇතුලත් වේ. උපායමාර්ගික සැලසුම සමඟ යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් අභිරුචිය, ප්‍රතිපත්තිය, කළමනාකරණ රාමුව සහ යාන්ත්‍රණය අනුමත කර ඇත. සමස්ථ බැංකුවට මැනිය හැකි ඉලක්ක පිහිටුවා ඇති අතර, එම ඉලක්කයන් පදනම්ව කාර්යඵලයන් ඇගයීම සිදු කරයි.
	(ඇ) ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම හා විචක්ෂණ ලෙස අවදානම් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ අවදානම් ප්‍රතිපත්තිය අනුමත කිරීම, අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම, ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම, පාලන ව්‍යුහයක් ඇති කිරීම, ප්‍රධාන අවදානම් මැනීම, අධීක්ෂණය හා පාලන සහ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම ආදිය අරමුණු කරගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් විසින් නව උපායමාර්ග හා ඒමගින් පැන නඟින අවදානම් තවදුරටත් අවම කිරීමේ ක්‍රම හා උපක්‍රම සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කරන ක්‍රියාවලියක් බැංකුව ආරම්භ කර ඇත. අවදානම් සම්බන්ධ සියළුම පැතිකඩ ආවරණය කරන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංශෝධිත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. පහත වාර්තා මඟින් මේ පිළිබඳ වැඩි දුර තොරතුරු සපයනු ලැබේ: • පිටු 140 සිට 156 දක්වා අවදානම් කළමනාකරණ වාර්තාව • පිටු 132 සහ පිටු 133 දක්වා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වාර්තාව
	(ඈ) තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස්කරුවන් සහ ණයගැතියන් ඇතුළු උනන්දුවක් දක්වන සියළුම පාර්ශ්වයන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම.	අනුකූල වී ඇත. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ උනන්දුවක් දක්වන සෑම පාර්ශ්වයක්ම ආවරණය වන පරිදි සන්නිවේදන ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ක්‍රියාත්මක කර ඇත.
	(ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණාත්මකභාවය සහ විශ්වසනීයත්වය විමර්ශනය කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමාණාත්මකභාවය හා අඛණ්ඩභාවය සමාලෝචනය කිරීම විගණන කමිටුවට පැවරී ඇත. මෙම කටයුතු සිදු කිරීමට විගණන කමිටුව ඔවුන්ට සෘජුව වාර්තා කරන අභ්‍යන්තර විගණන දෙපාර්තුමේන්තුවෙන් වාර්තා ලබා ගන්නා අතර, බාහිර විගණකයින්ගෙන්ද වාර්තා ලබා ගනී. විගණන කමිටුව විසින් තවදුරටත් අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා වන මෙවලමක් වශයෙන් නියාමකයින්ගේ සොයාගැනීම් නිවැරදි කිරීම් නිති පතා පසු විපරම් කරයි. කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායිත්වය ඇගයීම, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වගකීමක් වන අතර ඔවුන් විසින් ඒ සඳහා තොරතුරු පද්ධති විගණනය සිදු කරන ලදී. අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඊ) ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් හඳුනා ගැනීම හා නම් කිරීම.	අනුකූල වී ඇත. සහකාර මහා කළමනාකරුවන් සහ ඊට ඉහළ ශ්‍රේණිවලට අයත් නිලධාරීන් හා සමාන ශ්‍රේණිවලට අයත් නිලධාරීන් බැංකුවේ ආයතනික යහපාලන අරමුණු යටතේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්/නිලධාරීන් (KMP) ලෙස බැංකුව හඳුනාගෙන තිබේ.
	(උ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අයත් අධිකාරී බල ක්ෂේත්‍රය හා ප්‍රධාන වගකීම් නිර්වචනය කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරී බලතල හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි ද ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ අධිකාරී බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි ද පිළිවෙලින් අර්ථ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන අතර එය මෙම වර්ෂය තුළ සමාලෝචනය කර ඇත.
	(ඌ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් බැංකුවේ කටයුතු යෝග්‍ය ආකාරයෙන් අධීක්ෂණය කරනු ලබන බවට සහතික කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ ආයතනික සැලැස්මට එරෙහිව කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලැබේ. ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් තමන්ගේ විෂය පථයට අදාළ කරුණු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් සිදු කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ විෂය පථයට අදාළව කරුණු පැහැදිලි කිරීම් වලටද කැඳවනු ලැබේ.
	(එ) පහත සඳහන් දේ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ යහපාලන පරිචයන්හි ඵලදායීතාවය කලින් කලට දැන ගැනීම: I. බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීම සහ II. දුර්වලතාවයන් නිශ්චය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී වෙනස්කම් කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳ ස්වයං ඇගයීමක් වසරක් පාසා එහි පාලන භාවිතයන් තක්සේරු කිරීම සිදු කරනු ලැබේ. 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනතේ විධිවිධාන සහ එහි සංශෝධන අනුව බැංකුවට අයත් අමාත්‍යවරයා හරහා කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම සිදු කරනු ලබයි. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත බැඳියාව මත ගැටුම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතිපත්ති දෙකම වර්ෂය තුළදී සමාලෝචනය කරන ලදී.
	(ඒ) ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා යෝග්‍ය වූ අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතු බව සහතික කිරීම.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (නියෝජ්‍ය හා සහකාර මහා කළමනාකරුවන්) සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලසුමක් බැංකුව සතුව ඇත. නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව විසින් මෙය සමාලෝචනය සහ සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. අනුප්‍රාප්තික සැලසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක වේ.
	(ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග පිහිටුවීම සහ ආයතනික අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම යනාදිය සඳහා අවශ්‍යතාවය අනුව නිරන්තරයෙන් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ රැස්වීම් පැවැත්වීම.	අනුකූල වී ඇත. තමන්ගේ විෂය පථයට අදාළව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් ක්‍රමානුකූල පදනමින් සිදු කරන අතර, අවශ්‍ය නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට හා උපකමිටු වලට කැඳවනු ලැබේ. ආයතනික සැලැස්ම මත පදනම්ව ආයතනික පරමාර්ථ වල ප්‍රගතිය අධීක්ෂණය කරනු ලැබේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඕ) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ නියාමකයින් සමඟ බැංකුව ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගන්නා බවට සහතික කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරයකු ලෙස පත් වීමේදී විද්‍යුත් ආකෘතියෙන් පවතින "අධ්‍යක්ෂ මණ්ඩල අත්පොත" සමඟ බැංකුවට අදාළ සියළුම නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ ලිපිගොනුවක් ඔහුට ලබා දේ. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් හරිහැටි ඉටු කිරීම සඳහා ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට නියාමන පරිසරයේ සිදුවන වෙනස්වීම් පිළිබඳ අධ්‍යක්ෂවරුන් කලින් කලට දැනුවත් කරනු ලැබේ. නියාමක ආයතන වලින් ලැබෙන වැදගත් තොරතුරු එසැනින්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරයි. නියාමකවරුනට ලබා දෙන ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදෙන අනුකූලතා වාර්තා ඇතුළු නියාමන ආයතනයන්ට ලබා දෙන සියලුම වාර්තා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඕනෑකමින් අධීක්ෂණය කරනු ලැබේ. බැංකුවේ චෙන්නායි, මාලේ සහ සීෂෙල්ස් මෙහෙයුම් කටයුතු වලට අදාල වන නියාමන අවශ්‍යතා පිළිබඳව ද එම ශාඛා පිළිබඳ කාර්යසාධන වාර්තාව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලැබේ.
	(ක) බාහිර විගණකයින්ගේ සේවය ලබාගැනීමේදී සහ අධීක්ෂණයේදී නිසි ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කටයුතු කිරීම.	අනුකූල වී ඇත. බැංකුව රජය සතු ව්‍යාපාරයක් වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.
3 (1) (II)	මෙම නියමයන්ගේ 3 (5) නියමයේ දක්වා ඇති ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමත් ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් නිශ්චය කර අනුමත කිරීමත් කළයුතු වන්නේය.	දිශානති අංක 3(9)(1) සමඟ එක්ව කියවන විට අනුකූල වේ. සභාපතිවරයා පත් කරනු ලබන්නේ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත සහ එහි සංශෝධන ප්‍රකාරව බැංකුව අයත් වන අමාත්‍යවරයා විසිනි. එම අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස සඳහන්වන ප්‍රධාන විධායක නිලධාරිවරයා පත්කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. කේ ඊ ඩී සුමනසිරි මහතා 2022 වර්ෂයේ තුළදී මහා කළමනාකරු ලෙස කටයුතු කරන ලදී. ඩබ්ලිව් පී ආර් පී එච් ෆොන්සේකා මහතා කේ ඊ ඩී සුමනසිරි මහතා විශ්‍රාම යාමෙන් පසුව 2023 ජනවාරි 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස පත් කරන ලදී. ලංකා බැංකුවේ මහා කළමනාකරු තෝරා ගැනීමේ නිර්නායක ලබා දෙමින් අභ්‍යන්තරව සකස් කරන ලද ලේඛනයක් ක්‍රියාත්මක වන අතර වර්ෂය තුළදී සමාලෝචනයට භාජනය කරන ලදී.
3 (1) (III)	අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව රැස්විය යුතු අතර ආසන්න වශයෙන් මාසික පරතරයක් සහිතව අවම වශයෙන් වසරකට දොළොස් වතාවක්වත් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතුය. එවැනි රැස්වීම්වලට පැමිණීමට අයිතිය ඇත්තා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයකගේ පුද්ගලික ක්‍රියාශීලි සහභාගිත්වය තිබිය යුතුය. ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය සංසරනය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම හැකිතාක් දුරට වැලැක්විය යුතුවේ.	අනුකූල වී ඇත. අඛණ්ඩ අර්ධ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන අතර විශේෂ රැස්වීම් අවශ්‍යතාව පැන නඟින ආකාරයට සැලසුම් කරනු ලැබේ. සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය 24 වතාවක් රැස්වී තිබේ. චක්‍රලේඛ යෝජනා මඟින් අනුමැතිය ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම කර තිබෙන අතර එය විශේෂිත පදනමක් මත පමණක් කරනු ලබන අතර එවැනි යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊළඟ රැස්වීමේදී සම්මත කෙරේ. 2022 වසර තුළ යෝජනා 13 ක් චක්‍රලේඛ මඟින් සම්මත කර ඇත.
3 (1) (IV)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍රයට වැදගත් කරුණු හා යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලැබෙන අයුරින් නිසි පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුත්තේය. ඒවා බැංකු ව්‍යාපාරික කටයුතු හා අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීමට අදාළ වූ විෂයයන් හා යෝජනා විය යුතුය.	අනුකූල වී ඇත. ක්‍රමානුකූලව පැවැත්වෙන රැස්වීම් සඳහා සකස් කළ න්‍යාය පත්‍රය යෝජනා ඇතුළත් කළ හැකි වන පරිදි සෑම වර්ෂයක්ම ආරම්භයේදී රැස්වීම් නියම කර අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වනු ලැබේ.
3 (1) (V)	සියළුම අධ්‍යක්ෂවරුන්ට සහභාගි වීමට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින හතකට පෙර දැනුම්දීමක් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටියක් මඟින් සහතික කළ යුත්තේය. අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කළ හැකිය.	අනුකූල වී ඇත. වර්ෂය ආරම්භයේදී වාර්ෂික දින දර්ශනය මඟින් රැස්වීම් පිළිබඳ දැනුම් දීම සිදු කෙරේ. රැස්වීම් වලට දින හතකට පෙර නැවත දැනුම් දීම සිදු කෙරේ. අනෙකුත් විශේෂ රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කරනු ලබන අතර විශේෂිත රැස්වීමක් යොදා ගැනීමට පෙර සියලුම අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත ද ලබා ගනු ලැබේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (VI)	පසුගිය මාස 12 ක කාලය තුළ පැවැත්වූ රැස්වීම් වාර අඩුම වශයෙන් 2/3 කට සහභාගි නොවුණ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ පසුගිය රැස්වීම් වාර තුනකට අඛණ්ඩව සහභාගි නොවුණු අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂධූරය අහිමි වන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටිය මඟින් සහතික කළ යුතුය. විකල්ප අධ්‍යක්ෂවරයෙකු මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීම, නිසි පැමිණීමක් ලෙස පිළිගත හැකිය.	අනුකූල වී ඇත. ආයතනික යහපාලන සංග්‍රහයට අනුව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ දැනුවත් කර ඇත. අධ්‍යක්ෂවරුන් රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ පිටු අංක 127 හි දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම මෙම නියමයන්ට අනුකූලව තිබේ.
3 (1) (VII)	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ දැක්වෙන විධිවිධාන සපුරන්නා වූ සමාගම් ලේකම්වරයකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුත්තේය. එම තැනැත්තාගේ මූලික වගකීම් විය යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් සේවා ලබාදීම සහ අණ පනත්වල හා වෙනත් නියාමනයන් මඟින් දක්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් නීතිඥවරියක වන අතර 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන ඇය විසින් සපුරාලනු ලබයි.
3 (1) (VIII)	අධ්‍යක්ෂ මණ්ඩලයේ පටිපාටීන් සහ අදාළ රීති හා නියාමනයන් පිළිපදින බව සහතික කරනු පිණිස සියළුම අධ්‍යක්ෂවරුන්ට සමානව ලේකම්ගෙන් උපදෙස් හා සේවා ලබාගැනීම සඳහා අවකාශය තිබිය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගෙන් උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය නීතිඥවරියක වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සඳහා ඇය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ.
3 (1) (IX)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ලේකම්වරිය විසින් පවත්වා ගතයුතු අතර ඕනෑම සාධාරණ වේලාවක දී සාධාරණ දැනුම්දීමකින් පසු ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට එවැනි වාර්තා පරීක්ෂා කිරීම සඳහා විවෘතව පැවතිය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ලේකම්වරිය විසින් පවත්වාගෙන යන අතර, ඒවා ආරක්ෂිත මෘදුකාංගය තුළ තැන්පත් කරන අතර ඒවා සෑම අධ්‍යක්ෂවරයකුටම ලැබීමට සලස්වා ඇත. රැස්වීම් වාර්තා ඊට පසුව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කරනු ඇත. අධ්‍යක්ෂවරුන්ට ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික් සම්බන්ධතාවයක් හරහා පැරණි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවලට ප්‍රවේශ වීමට හැකියාව ඇත.
3 (1) (X)	අධ්‍යක්ෂ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විවක්ෂණශීලී බවකින් කටයුතු කළා ද යන්න අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා මඟින් තොරතුරු ලබාගත හැකිවන ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් අයුරින් විස්තරාත්මක විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇති වන සාකච්ඡාවන්ගේ ගැඹුරු බව පිළිබඳ තක්සේරු කිරීමට මෙම වාර්තා නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට උපකාරී විය යුතය. එම නිසා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තුළ පහත දෑ පැහැදිලිව ඇතුළත් විය යුතුය: (අ) අධ්‍යක්ෂ මණ්ඩලය තම සාකච්ඡා සඳහා භාවිතා කරනු ලැබූ තොරතුරු හා දත්ත පිළිබඳ සාරාංශයක් (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමට යෙදුන විෂය කරුණු (ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම යුතුකම් නිසි සැලකිල්ලෙන් හා ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කරගෙන යන්නේ ද යන්න පිළිබඳ තොරතුරු, රැස්වීමේ සාකච්ඡා සහ මතභේදයට හෝ විරෝධයට බඳුන් වූ විෂය කරුණු (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්ති සහ අදාළ නීති හා නියාමනයන් වලට අනුකූල වන බව විදහාපාන්නා වූ, අදාළ විධායකයින් විසින් කරනු ලබන සාක්ෂිදීම් සහ සනාථ කිරීම් (ඉ) බැංකුව විවෘත වන අවදානම් වලට සම්බන්ධ කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ තේරුම් ගැනීම් හා අවදානම් කළමනාකරණය පිළිබඳ අනුගමනය කල ක්‍රමෝපාය පිළිබඳ විශ්ලේෂණය (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා	අනුකූල වී ඇත. විස්තරාත්මක අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා මඟින් මෙම නිර්ණායකයන්ට අදාළ කරුණු ආවරණය වේ.
3 (1) (XI)	යෝග්‍ය අවස්ථාවන්හි දී සාධාරණ ඉල්ලීම් මත බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීයමය උපදෙස් පැතීම සඳහා අධ්‍යක්ෂවරුන්ට අවස්ථා ලබාදෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ පටිපාටියක් තිබිය යුත්තේය. අදාළ අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරුන්ට ඔහුගෙන්/ඇයගෙන්/ඔවුන්ගෙන් බැංකුවට ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීම සඳහා ආධාර වීම පිණිස වෙනම ස්වාධීන වෘත්තීයමය උපදෙස් ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. අවශ්‍ය අවස්ථා වලදී අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන වෘත්තීය උපදෙස් පැතීම සඳහා වන වර්ෂය තුළ සමාලෝචනය කරන ලද ප්‍රඥප්තියක් බැංකුව සතු වන අතර අවශ්‍ය අවස්ථාවලදී ඉහත ප්‍රඥප්තිය පදනම් කොටගෙන අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි උපදෙස් කරා යොමුවෙයි.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (XII)	අනෙකුත් සංවිධාන හෝ සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ කටයුතු කිරීමේදී සහ ඒවාට ඇති බැඳීම්වල දී, බැඳියාවන් අතර ගැටුම් ඇතිවීම හෝ එවැනි ගැටුම් ඇති බව පෙන්නුම් කිරීම අධ්‍යක්ෂවරුන් විසින් වළක්වා ගත යුත්තේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිය යුතු වැදගත්කමකින් යුතු ඇති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිය යුතු වැදගත්කමකින් යුතු විෂය කරුණක් බව නිශ්චය කර ඇති විෂය කරුණක් සම්බන්ධයෙන් යම් අධ්‍යක්ෂවරයෙකුට අරමුණු අතර ගැටුමක් තිබේ නම් එවැනි විෂය කරුණු සාකච්ඡාවට බඳුන් කළ යුත්තේ අදාළ විෂය කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු හිමිකමක් නොමැති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් (මෙම නියමයන්ගේ 3(2)(IV) නියමය බලන්න) සහභාගි වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දීය. තවද, ඔහුට/ඇයට හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු හිමිකමක් ඇත්තා වූ ව්‍යාපාරයකට සම්බන්ධතාවයක් ඇති කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක දී අධ්‍යක්ෂවරයෙකු විසින් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය. එසේම එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නඩය පත්‍රයේ අදාළ අධීක්ෂණය සඳහා ගණපූරණය ගණන් බැලීමේ දී ඔහු/ඇය ඊට ඇතුළත් නොකළ යුතු ය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ අරමුණු අතර ගැටුමක් ඇති වන තත්ත්වයක් තුළ අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමට ඔවුන්ගේ වගකීම් පිළිබඳව අධ්‍යක්ෂවරු දැනුවත්ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැඳියාවන් අතර ගැටුම් සඳහා වූ ප්‍රතිපත්තීන් යොදාගෙන ඇති අතර වර්ෂය තුළදී සමාලෝචනය කරන ලදී. පරිචයක් ලෙස අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාවන් හෝ වෙනත් ආයතනයන් හි අධ්‍යක්ෂවරු ලෙස ලැබූ නව පත් වීම් වේනම් ඒ බව පවත්වන සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී හෙළිදරව් කළ යුතුය. බැඳියාවන් අතර ගැටුමක් පවතිනා අවස්ථාවක අධ්‍යක්ෂවරුන් තීරණ ගැනීමට සහභාගී වීමෙන්, ඡන්දය දීමෙන් හෝ සම්මත කිරීමෙන් වැළකී සිටී.
3 (1) (XIII)	බැංකුවේ මෙහෙයවීම හා පාලනය ස්ථිරසාර ලෙස තම අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම පිණිස තම තීරණ ගැනීම සඳහා තමන්ට විශේෂයෙන් වෙන් කරන ලද්දා වූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තබාගත යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ ඇතුළත් කර ඇත.
3 (1) (XIV)	බැංකුවට තම වගකීම් ගෙවීමට නොහැකි යැයි හෝ නොහැකි වීමට ඉඩ ඇතැයි හෝ බැංකුව බුන්වත් වීමට ආසන්න යැයි හෝ තැන්පතුකරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට නියමිත ගෙවීම් අත්හිටුවීමට ආසන්න යැයි හෝ බැංකුව සළකන්නේ නම් වෙනත් කිසිම තීරණයක් හෝ ක්‍රියාවක් ගැනීමට පෙර වහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු වේ.	අනුකූල වී ඇත. 2021 වර්ෂය තුළ මෙවැනි තත්ත්වයක් මතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද මාසික මූල්‍ය වාර්තා මඟින් බැංකුවේ නුබුන්වත් බව සහතික වනු ඇත.
3 (1) (XV)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ අනෙකුත් විවක්ෂණශීලී පදනම් අනුව මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති මට්ටම්වලට අනුකූල වන මට්ටමක බැංකුවේ ප්‍රාග්ධනය පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුව මුදල් මණ්ඩලයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයන්ට පූර්ණ අනුකූලතාවයක් දක්වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරුවක් ලබා දෙයි. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත වල තත්ත්වය බැංකුවේ මාසික මූල්‍ය ප්‍රකාශනය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.
3 (1) (XVI)	මෙම නියමයන්ගේ 3 වැනි නියමයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් වූ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවක්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාව තුළින් ප්‍රසිද්ධ කළ යුතු ය.	අනුකූල වී ඇත. මෙම අනාවරණයන් බැංකුවේ වාර්ෂික වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවට අඩංගු කොටසක් වේ.
3 (1) (XVII)	වාර්ෂිකව සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම ස්වයං ඇගයීමක් කිරීම සඳහා වූ ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කළයුතු අතර එවැනි ඇගයීම්වල වාර්තා තබාගතයුතු වන්නේය.	අනුකූල වී ඇත. ස්වයං ඇගයීමේ යාන්ත්‍රණයක් බැංකුව විසින් භාවිතයට ගන්නා අතර එය වසර අවසානයේ සිදුකරයි. ලංකා බැංකුවේ ලේකම්තුමිය/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය විසින් ස්වයං ඇගයීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වාගෙන යනු ලැබේ.
3 (2) අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය		
3 (2) (I)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතකට වඩා අඩු නොවිය යුතු අතර, 13 ට වඩා වැඩි නොවිය යුතුය.	1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව හයක් වේ. 2022 වසර තුළ සිටි අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය අනුකූලතා වාර්තාවේ නියාමන අංක 3(2)(VIII) යටතේ දක්වා ඇත. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 123 දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම ද ඇතුළත්ව මෙම විධිවිධානයන්හි අවශ්‍යතා සපුරාලීමට ලංකා බැංකු ආඥා පනතට යෝජනා කරන ලද සංශෝධන අනුමත කර ගැනීමේ ක්‍රියාවලියේ පවතී.
3 (2) (II)	ප්‍රධාන විධායක නිලධාරී තනතුරෙහි සිටින අධ්‍යක්ෂවරයා හැර, අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නවයක් නොඉක්මවිය යුතු අතර එම සේවා කාලයට 2008 ජනවාරි 01 දින දක්වා එවැනි අධ්‍යක්ෂවරයෙකු එම ධුරයේ සේවය කරන ලද මුළු කාලයද ඇතුළත් විය යුත්තේය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ වත්මන් අධ්‍යක්ෂවරුන් වසර නවයකට වඩා අඩු සේවා කාලයක් එම තනතුරෙහි සේවය කර ඇත. වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (2) (III)	විධායක අධ්‍යක්ෂවරුන් ගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් තුනෙන් එකක ප්‍රමාණය නොඉක්ම වන පරිදි බැංකු සේවකයකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස (මින් මතු විධායක අධ්‍යක්ෂවරුන් ලෙස හඳුන්වන) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එවැනි අවස්ථාවකදී එක් විධායක අධ්‍යක්ෂවරයකු ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකු ආඥා පනතට අනුව ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂවරුන් සිටීමට නොහැකිය.
3 (2) (IV)	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් එක යන දෙකෙන් වැඩි ගණනකින් සමන්විත විය යුතු ය. මෙම අනු විධානය අදාළ වන්නේ 2010 ජනවාරි 01 දිනෙන් පසුවය. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු පහත සඳහන් දෑට යටත් වන්නේ නම් ඔහු/ඇය ස්වාධීන අයෙකු ලෙස නොසැලකේ; (අ) බැංකුවේ කොටස් හිමිකාරත්වයෙන් 1% කට වඩා සෘජු ලෙස හෝ වක්‍ර ලෙස අත්කර ගෙන සිටීම. (ආ) දැනට හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාල සීමාවක් තුළ මෙහි 3(7) වන වගන්තියෙන් දක්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන කිසිදු ව්‍යාපාරික ගනුදෙනුවක වර්තමානයේ යෙදී සිටීම/යෙදී සිට තිබීම. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාලයක් තුළ බැංකුවේ සේවා නියුක්ත වී සිට තිබීම. (ඈ) සමීප ඥාතීත්වයක් ඇති අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ ජ්‍යෙෂ්ඨ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයෙක් හෝ වෙනත් සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු බැංකුවේ හෝ වෙනත් බැංකුවක සිටීම. මෙහි අරමුණ සඳහා, සමීප ඥාතියකු, යන්නෙන් අදහස් වන්නේ කාලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන්නා වූ ළමයෙකි. (ඉ) බැංකුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් නියෝජනය කිරීම. (ඊ) පහත දැක්වෙන සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වීම: I. පහත 3(7) විධානයේ දැක්වෙන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක බැංකුව සමඟ වර්තමානයේ සිටින හෝ II. බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරුන් සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරයෙක් වන හෝ සැලකිය යුතු කොටස් හිමියකු වී සිටින හෝ III. මෙම විධානයන්ගේ 3(7) වන විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක යෙදී සිටින.	අනුකූල වී ඇත. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා ස්වාධීන නොවන අතර, ඔහු විසින් බැංකුවේ එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජය නියෝජනය කරයි. ඒවා අධ්‍යක්ෂවරුන්ගේ පැතිකඩ යටතේ සහ අංක 3 (2)(VIII) යටතේ හඳුනා ගෙන ඇත.
3 (2) (V)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති විටක එසේ පත් කරන ලද පුද්ගලයා ද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන මිනුම් දඬු සම්පූර්ණ කළ යුතුය.	අනුකූල වී ඇත. ස්වාධීන අධ්‍යක්ෂවරුන් සඳහා විකල්ප අධ්‍යක්ෂවරුන් පත්කර නොමැත.
3 (2) (VI)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් තරමේ විශ්වාසනීය පෙර වාර්තා සහිත ඉහළ හැකියාවකින් යුතු පුද්ගලයන් වියයුතු අතර, ක්‍රමෝපාය, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳව මතුවන ගැටළුවලට ස්වාධීන වූ තීරණ ගැනීමේ පළපුරුද්ද සහ හැකියාවන්ගෙන් ද යුක්ත විය යුතුය.	අනුකූල වී ඇත. අවශ්‍ය තොරතුරු නිර්ණය කිරීම සඳහා වර්තමාන අධ්‍යක්ෂවරුන්ගේ පැතිකඩ තොරතුරු පිටු අංක 27 සිට 29 දක්වා ඇත.
3 (2) (VII)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ ගණපූර්ණය සම්පූර්ණ වුවද, එම රැස්වීමට සහභාගී වන අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් භාගයකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටිය යුතු අතර, එසේ නොවේ නම් එවැනි රැස්වීමක් නිසි පරිදි පවත්වන ලද්දක් නොවනු ඇත. මෙම අනුවිධානය බල පැවැත්වෙනුයේ 2010 ජනවාරි 01 දින සිටය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (2) (VIII)	සියළුම ආයතනික සන්නිවේදන කටයුතු වලදී බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළි කිරීමේ දී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නිශ්චිතව හඳුනාගත යුතුය. සභාපති, විධායක අධ්‍යක්ෂ, විධායක නොවන අධ්‍යක්ෂ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයක් බැංකුව විසින් තම වාර්ෂික යහපාලන වාර්තා මඟින් අනාවරණය කළ යුතුය.	අනුකූල වී ඇත. 2022 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය: • **කාංචන රත්වත්තේ මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ/සභාපති (2020 ජනවාරි 02 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2023 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) • **ආර් එම් ප්‍රියන්ත රත්නායක මහතා** විධායක නොවන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ (2020 අප්‍රේල් 28 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) • **පී හර්ෂ විජයවර්ධන මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2020 ජනවාරි 14 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2023 ජනවාරි 13 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) • **ඒ සී මනිල්ක ප්‍රනාන්දු මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2020 අප්‍රේල් 21 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2023 අප්‍රේල් 21 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) • **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි විඑස්වී** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2021 ජනවාරි 08 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය) • **ජයම්පති මොල්ලිගොඩ මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2021 පෙබරවාරි 18 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් වූ අතර 2022 ජනවාරි 31 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය) • **මහාචාර්ය කිත්සිරි ලියනගේ මහතා** ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ (2023 මාර්තු 31 සිට බල පැවැත්වෙන පරිදි ධූරයට පත් විය)
3 (2) (IX)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වූ විධිමත්, නිසි තක්සේරුවකින් පසු සකස් කරන ලද විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය. එසේම අධ්‍යක්ෂ මණ්ඩලයට අනුප්‍රාප්තිකයන් පත් කිරීම සිදු කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ද තිබිය යුතු ය.	ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් කරනු ලැබේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට සහ පත්කිරීමේ ක්‍රියාවලියට සලකා බැලීමට අවශ්‍ය වන නිපුණතා, පළපුරුද්ද සහ දැනුම පිළිබඳ විස්තරාත්මකව ඇතුළත් වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද අදාළ අමාත්‍යාංශය සමඟ එකඟ වූ ප්‍රතිපත්තියක් ද සකස් කර ඇත.
3 (2) (X)	තාවකාලික ඇබෑර්තු පිරවීම සඳහා පත් කරනු ලැබූ සියළුම අධ්‍යක්ෂවරුන් එම පත් කිරීම් වලින් පසුව එළඹෙන පළවෙනි මහා සභා රැස්වීමේදී කොටස්කරුවන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමට යටත් විය යුතු ය.	අදාළ ඇමතිවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරන නිසා මෙය පැන නොනඟී.
3 (2) (XI)	අධ්‍යක්ෂවරයෙකු සිය ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් හෝ ඉල්ලා අස්වූයේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, (අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීමේ හෝ ඉවත් කිරීමේ හේතූන් එම අධ්‍යක්ෂවරයා බැංකුව සමඟ එකඟ නොවීමට අදාළ තොරතුරු තිබේ නම් එම තොරතුරු ද සමඟ ප්‍රසිද්ධ කළයුතුය; සහ (ආ) කොටස්කරුවන්ගේ අවධානයට ලක්විය යුතු කිසියම් කරුණක් ඇත්නම් ඒ බව ද නොමැතිනම් ඒ බව ද සහතික කරමින් ප්‍රකාශනයක් නිකුත් කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පත්කිරීම් හා ඉවත් කිරීම් සිදුකරයි. ඉල්ලා අස්වීමක් වේ නම් එයද එම අමාත්‍යවරයාට යොමු කරයි. ඉල්ලා අස්වීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට හා කොළඹ කොටස් හුවමාරුවට දැනුම් දෙනු ලැබේ. බැංකුවේ කොටස් හිමියා රජය වන අතර අධ්‍යක්ෂධූරයන්හි සිදු කරන වෙනස්වීම් අදාළ අමාත්‍යවරයා හරහා ශ්‍රී ලංකා රජය විසින් සිදු කරනු ලැබේ.
3 (2) (XII)	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම නොකළ යුතුය.	2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මහා කළමනාකරුවකු පත් කිරීම හැර ලංකා බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයකු ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු නොකරයි. මේ බව සහතික කරමින් ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට පෙර 2019 දෙසැම්බර් 19 වන දින නිකුත් කරන ලද 2019 අංක 8 දරණ බැංකු පනතේ 42(1) සහ 76 (ඌ) කොටසට අනුකූලව දිවුරුම් ප්‍රකාශයක් ලබා ගනු ලැබේ.

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (3) අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය ඇගයීමේ නිර්ණායක		
3 (3) (I)	අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරන පුද්ගලයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු ය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන සාමාන්‍ය නිදහස් කිරීම් අදාළ වන්නේය: 2008 ජනවාරි 01 දිනට වයස අවුරුදු 70 සපුරන හෝ 2008 දෙසැම්බර් 3 දිනට පෙර වයස අවුරුදු 70 සපුරන අධ්‍යක්ෂවරයෙකුට 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන උපරිම වසර 3 ක කාලසීමාවක තවදුරටත් රාජකාරියේ යෙදිය හැක.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කිසිම අයෙකු වයස අවුරුදු 70 ට වඩා වැඩි නොවේ.
3 (3) (II)	පුද්ගලයකු විසින් බැංකුවේ පරිපාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළත්ව සමාගම්/ඒකකයන්/ආයතන 20 කට වඩා වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂ තනතුර නොදැරිය යුත්තේය.	අනුකූල වී ඇත. සමාගම්/ආයතන 20 කට වඩා අධ්‍යක්ෂධුර හොබවන අධ්‍යක්ෂවරුන් නොමැත.
3 (3) (III)	ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුවන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුට හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකුට තම ධූරයෙන් ඉවත් වූ දින සිට මාස හයක් ඉකුත් වීමට පෙර ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් සිදුවන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස පත්වීමට නොහැක. ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වන බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පිහිටුමේදී විශ්‍රාමික බැංකුකරුවන්ගේ විශේෂ දැනුම අවශ්‍ය වීම වැනි සුවිශේෂී අවස්ථාවන්හි දී සිදුවන වෙනස්කම් මූල්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත් විය යුතුය. මේ සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීමේදී අත්හිටුවීමේ සහන කාලය අවශ්‍ය බව සහතික කළ යුතුය. පත් කිරීමේ අධිකාරියක් විසින් බලපත්‍රලාභී බැංකුවකට අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමේදී මෙම විධිවිධාන කඩකරන්නේ නම්, බලපත්‍රලාභී බැංකුව විසින් එවැනි පත්වීම්ලාභියෙකු බලය හෝ ප්‍රතිලාභ භුක්තිවිඳීමෙන් වැලැක්වීමට පියවර ගත යුතුය.	අනුකූල වී ඇත. සමාලෝචනය කරන ලද වසර තුළදී මෙවැනි තත්ත්වයක් පැන නැඟී නොමැත.
3 (4) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති කළමනාකරණ කාර්යයන්		
3 (4) (I)	බලතල පවරා දීම සඳහා පවතින ක්‍රියාවලිය අධ්‍යක්ෂවරුන් විසින් සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීම හා නිරවුල්ව අවබෝධ කර ගැනීම කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය බලය පවරා දීමේ කටයුතු කාලෝචිතව අධීක්ෂණය හා අනුමත කිරීම කරන අතර, බලය බෙදීමේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීමට ඉඩ තබමින් බැංකුවේ කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට ප්‍රමාණවත් බව තහවුරු කර ගනී. මෙම ක්‍රියාවලියේදී දැනට පවතින පාලන ආඥා පනතේ සඳහන් නියමයන් සලකා බලනු ලැබේ.
3 (4) (II)	අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්තයක් ලෙස තම කාර්යයන් ඉටු කිරීම සඳහා සැලකිය යුතු ලෙස අවහිරවන්නා වූ හෝ ඉටුකිරීමේ හැකියාව අඩු කරන්නාවූ ආකාරයේ ප්‍රමාණයකට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලීය කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියාට කිසිම කාර්යයක් පවරා දීම නොකළ යුත්තේය.	
3 (4) (III)	බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ වන ආකාරයෙන් තිබෙන බව සහතික කර ගැනීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවතින බලතල පවරාදීමේ ක්‍රියාවලිය කාලීනව විමර්ශනය කළයුතු වේ.	
3 (5) සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී		
3 (5) (I)	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරයන් වෙන් කළ යුතු අතර, මෙම කාර්යයන් තනි පුද්ගලයෙකු විසින් සිදු නොකළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.
3 (5) (II)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයකු වන්නේ නම් මැනවි. සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන විට, ස්වාධීනත්වය සහතික කිරීම පිණිස ලිඛිත කාර්යභාරයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කළ යුතුය. මෙම ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි පළ කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු හෙයින් ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟී.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (5) (III)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික වාර්තාවේ අනිවාර්ය කොටසක් විය යුතු ආයතනික යහපාලන වාර්තාවේ, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ අනන්‍යතාවය ද, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර කිසියම් සම්බන්ධතාවයක් ඇත්නම්, (මූල්‍ය, ව්‍යාපාරික, පවුලේ හෝ අනෙකුත් සැලකිය යුතු/අදාළ සම්බන්ධතාවයන් ඇතුළුව) එයද පළ කළ යුතුයි.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.
3 (5) (IV)	සභාපතිතුමා විසින් (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම, (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බව හා සිය වගකීම් නිසි ලෙස ඉටුකරන බව සහතික කිරීම (ඇ) ප්‍රධාන ගැටළු කාලීන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡා කරන බව සහතික කිරීම කළයුතු වේ.	අනුකූල වී ඇත.
3 (5) (V)	අනිකුත් අධ්‍යක්ෂවරුන් විසින් රැස්වීම්වල දී සාකච්ඡා කිරීමට යෝජනා කරනු ලබන කාරණා සැලකිල්ලට ගනිමින් රැස්වීම්වල න්‍යාය පත්‍රය සැකසීමේ වගකීම සභාපතිතුමා සතුවන අතර, සමාගම් ලේකම්ට අදාළ කාර්යය පැවරිය හැකිය.	අනුකූල වී ඇත. සභාපති විසින් බලය පවරාදීම හා අනුමත කිරීම යටතේ, ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් මහා කළමනාකරු හරහා ඉදිරිපත් කරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මත න්‍යාය පත්‍රය පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර බෙදා හරින අතර කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන වෙනත් අදාළ කරුණු ද පදනම්ව රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය පිළියෙල කරයි.
3 (5) (VI)	සභාපති විසින් සියළුම අධ්‍යක්ෂවරුන් රැස්වීමේ පැන නඟින කරුණු පිළිබඳව නිසි ලෙස දැනුවත්ව සිටින බවට සහතික විය යුතු අතර, ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට ද සහතික විය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇතිවන කරුණු පිළිබඳව දැනුවත්ය යන්න සභාපති විසින් සොයා බලා තහවුරු කරගත යුතුය. මෙම කටයුත්ත තහවුරු කිරීම සඳහා පහත ක්‍රියාපටිපාටි ඇති කර ඇත: • අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රැස්වීමට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. හදිසි පත්‍රිකා සඳහා මෙය අදාල නොවේ. • අවශ්‍ය වූ විට පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වේ කළමනාකරණ කණ්ඩායමේ අදාල සාමාජිකයින් ඕනෑම පැහැදිලි කිරීමක් සඳහා සුදානමින් සිටී. • බැංකුවේ කාර්යාලය හා ස්ථායිතාවය ඇගයීම සඳහා අවශ්‍ය කළමනාකරණ තොරතුරු එකඟ වූ ආකෘතියකට නියමිත කාලවකවානු අනුව අධ්‍යක්ෂවරුන්ට සපයනු ලැබේ. • අධ්‍යක්ෂවරුන්ට අවශ්‍යතාවය පරිදි බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීමය උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත.
3 (5) (VII)	සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා සම්පූර්ණ හා සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා සියළුම අධ්‍යක්ෂවරුන් දෛර්යමත් කළ යුතු අතර, බැංකුවේ උපරිම වාසිය සඳහා ක්‍රියාකරන බව සහතික කිරීමට මූලිකත්වය ගත යුතුය.	අනුකූල වී ඇත.
3 (5) (VIII)	සභාපතිතුමා විසින් විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය ලබාගැනීමට පහසුකම් සැපයිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර හිතකර සබඳතාවයන් පවත්වා ගැනීම ද සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (5) (IX)	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හෝ වෙනත් කිසිම විධායක කාර්යයක් සෘජුවම අධීක්ෂණය සඳහා සභාපති සම්බන්ධ නොවිය යුතුය.	අනුකූල වී ඇත. සභාපතිතුමන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ.
3 (5) (X)	කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය වන බවට සභාපති විසින් සහතික විය යුතුය.	අනුකූල වී ඇත. මුළුමනින්ම කොටස් හිමිකාරිත්වය දරණ ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගනී. නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමිකාරිත්වය අතර සම්බන්ධිත මඟක් ලෙස ක්‍රියා කරයි.
3 (5) (XI)	ප්‍රධාන විධායක නිලධාරිවරයා බැංකුවේ දෛනික මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතු භාර ඉහළම විධායකයා වශයෙන් ක්‍රියා කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ විදිනෙදා මෙහෙයුම් ඉටු කිරීම මහා කළමනාකාරතුමාගේ වගකීමයි. මහා කළමනාකරුගේ බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ විශේෂයෙන් සඳහන් වේ.

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (6) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ කමිටු		
3 (6) (I)	මෙම විධානයන්ගේ 3(6)(II), 3(6)(III), 3(6)(IV) සහ 3(6)(V) යන විධානවල දක්වා ඇති ආකාරය අනුව සෑම බැංකුවකම අඩුම තරමේ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක්වත් තිබිය යුතු ය. සෑම කමිටුවක්ම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම හා රැස්වීම් වාර්තා පවත්වා ගැනීම යනාදිය සඳහා සෑම කමිටුවක් විසින්ම ලේකම්වරයෙකු පත්කර ගත යුතුය. සෑම කමිටුවකම යුතුකම් හා කාර්යයන් ඇතුළත් කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම විධිවිධානය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලීය උපකමිටු හතරක් (විගණන, මානව සම්පත් හා පාරිශ්‍රමික, නාමයෝජනා හා ආයතනික යහපාලන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ) ස්ථාපිත කර ඇති අතර, රැස්වීම් වාර්තා සමඟ නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. මීට අමතරව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කමිටුව නමින් උපකමිටුවක් ද පිහිටවනු ලැබීය. සෑම උපකමිටුවක් සඳහා පවතින විෂය ක්ෂේත්‍රය වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ලංකා බැංකුවේ ලේකම් සියළුම උපකමිටුවල ලේකම් ලෙස පත්කර ඇති අතර, උපකමිටුවේ සභාපතිගේ අධීක්ෂණය යටතේ රැස්වීම් වාර්තා පවත්වා ගනී. උපකමිටු වල වාර්තා වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත. එකම කොටස්කරුවා රජය වන නිසා, බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට හා බැංකුව අදාළ අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරේ.
3 (6) (II)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත රීති අදාළ වේ:	අනුකූල වී ඇත.
	(අ) ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපතිවරයා විය යුතුය.	විගණන කමිටුවේ සභාපතිත්වය දරනු ලබන්නේද අවශ්‍ය සුදුසුකම් හා අත්දැකීම් ඇති ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.
	(ආ) කමිටුවේ සෑම සාමාජිකයෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු ය.	අනුකූල වී ඇත. කමිටුවේ සියළුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
	(ඇ) කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය: I. අදාළ නීති ප්‍රකාරව විගණන සේවා සඳහා බාහිර විගණක පත් කිරීම. II. මහ බැංකුව විසින් විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද උපදෙස් මාලාවන් ක්‍රියාත්මක කිරීම. III. අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීම. IV. විගණකවරුන්ගේ සේවා කාලය, ගාස්තු සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීමක් හෝ ඉවත් කිරීම; මෙහි දී විගණක හවුල්කරුවකුගේ සේවය ලබා ගැනීම වසර පහක් නොඉක්මවිය යුතු අතර, එම කාලය සපිරූ හවුල්කරුවකු නැවත පත්කළ හැකි වන්නේ මුල් වාරය සම්පූර්ණකර වසර තුනක් ඉක්මවූ පසුවය.	අනුකූල වී ඇත. විෂය ක්ෂේත්‍රය අනුව, විගණන කමිටුවේ අනිකුත් කරුණුවලට අමතරව පහත නිර්දේශ කර ඇත: • විගණකවරුන්ට කලින් කල නිකුත් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම. • අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතය විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන නිසා, බාහිර විගණකගේ කටයුතු සම්බන්ධයෙන් කමිටුවට ඉටු කළ හැකි භූමිකාවක් නැත.
	(ඈ) බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියේ සඵලදායකත්වය, අදාළ ප්‍රමිතීන් සහ මනා පරිචයන් අනුව සමාලෝචනය කිරීම කමිටුවේ කාර්යයකි.	විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන නිසා ඔහුගේ ස්වාධීනත්වය හා සඵලතාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සහතික කර ඇත.
	(ඉ) අදාළ නීති නියමයන්, අවශ්‍යතාවයන් සහ මාර්ගෝපදේශ මඟින් අවසර දෙන ලද විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකයින් යොදා ගැනීම පිළිබඳව ප්‍රතිපත්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම විගණන කමිටුවේ වගකීමකි. බාහිර විගණකවරයා විසින් සපයනු ලබන එවැනි විගණන නොවන සේවා ඔහුගේ ස්වාධීනත්වය සහ විෂය මූලිකභාවයට හානි නොවන බවට කමිටුව වගබලා ගත යුතුය. විගණන නොවන සේවා සැපයීමේ දී විගණකවරයාගේ ස්වාධීනත්වය හෝ විෂය මූලිකභාවය තක්සේරු කිරීමේදී කමිටුව විසින් පහත කරුණු සළකා බැලිය යුතුය: I. විගණන සමාගමේ නිපුණතා සහ පළපුරුද්ද විගණන නොවන සේවා සැපයීම සඳහා යෝග්‍ය වන්නේ ද නැද්ද යන්න II. බාහිර විගණකවරයා විසින් එවැනි සේවා සැපයීමේදී විගණනයේ ස්වාධීනත්වය හා/හෝ විෂය මූලිකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇද්දැයි යන්න සහ III. විගණන නොවන සේවාවල ස්වභාවය, අදාළ ගාස්තු මට්ටම්, විගණන සමාගමට සාපේක්ෂව එක් එක් ගාස්තු මට්ටම් හා සමුච්චිත ගාස්තු මට්ටම් යනාදිය බාහිර විගණකවරයාගේ විෂය මූලිකභාවයට හෝ ස්වාධීනත්වයට කිසියම් බලපෑමක් කරන්නේ ද යන වග.	විගණකාධිපති, බැංකුවේ විගණක නිසා මෙය පැන නොනඟී. බැංකුවේ විගණන නොවන කටයුතු සඳහා යොදා ගන්නා බාහිර විගණක ආයතනය (විගණකාධිපති විසින් ඔහුගේ සහයට පත් කරන ලද) කරන විගණන නොවන සේවා මඟින් ගාස්තු හේතු කොට ගෙන එම බාහිර විගණකවරයාගේ විගණන සම්බන්ධයෙන් වන ස්වාධීනත්වයට හෝ විෂය මූලිකභාවයට බලපෑමක් නොකරන බවට කමිටුව සහතික කරයි. සමලෝචිත වසරේදී එවැනි විගණන ආයතනයක් පත් කර නැත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඊ) විගණනය ආරම්භ කිරීමට පෙර කමිටුව විසින් පහත සඳහන් දේ ඇතුළත් විගණනයේ ස්වභාවය සහ විෂය පථය පිළිබඳව බාහිර විගණකවරයා සමඟ සාකච්ඡා කර අවසන් කළ යුතුය: I. අදාළ ආයතනික නීති සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකරණයේ අභ්‍යන්තර පාලන විධිවිධානවලට බැංකුවේ අනුකූලවීම පිළිබඳ ඇගැයීමක්. II. අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් අනුව බාහිර අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම. III. එක් විගණන සමාගමකට වඩා වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ වන විට ඒවා අතර සම්බන්ධීකරණය යනාදියයි.	විගණනයේ විෂය පථය හා පරාසය පිළිබඳව විගණකාධිපති විසින් තීරණය කරනු ලබයි.
	(උ) තොරතුරු අනාවරණය කිරීම සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල සත්‍යතාවය සහ ඒවායේ අඩංගු මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් පරීක්ෂා කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර කමිටුව විසින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු වන්නේ I. ප්‍රධාන විනිශ්චයන් සහිත ක්ෂේත්‍ර, II. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්ගේ සඳහා වූ වෙනස්කම්, III. විගණනය තුළින් ඇති වූ ප්‍රධාන ගැලපීම්, IV. අඛණ්ඩ පැවැත්මේ උපකල්පනයන් සහ V. අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම ආදියයි.	අනුකූලවී ඇත. මෙය කමිටුව විසින් මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික මූල්‍ය තොරතුරු සමාලෝචනය කරමින් සිදුකරන අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.
	(ඌ) කමිටුව විසින් අතුරු සහ වාර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කළයුතු අතර, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සහභාගිත්වය නොමැතිව විගණකවරයාට සාකච්ඡා කිරීමට අවශ්‍ය දෑ වේ නම් ඒවාද ඇතුළු අනෙකුත් කරුණු ද අවශ්‍ය විට සාකච්ඡා කළ යුතුය.	අනුකූල වී ඇත. කමිටුව විසින් අතුරු සහ වසර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කරයි. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන අතර, ඔහුගේ නියෝජිතයෙකු විගණන කමිටුව සමඟ සංවෘත සාකච්ඡා වලට ඉදිරිපත් වෙයි. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සංවෘත සාකච්ඡා දෙකක් පැවැත්වුන අතර, ඒ සඳහා නිතිපතා පවත්වන විගණන කමිටු න්‍යාය හා අයිතම ඇතුලත් මඟින් පහසුකම් සපයනු ලැබී.
	(එ) කමිටුව බාහිර විගණනයේ කළමනාකරණ ලිපිය හා එයට කළමනාකාර්ත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළ යුතුය.	අනුකූල වී ඇත.
	(ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳව කමිටුව විසින් පහත දැක්වෙන පියවර ගත යුතුය: I. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් ප්‍රමාණවත්ද යන්න සමාලෝචනය හා සිය කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය බලය තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත් වීම.	අනුකූල වී ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත්හි ප්‍රමාණාත්මකභාවය සම්බන්ධයෙන් විගණන කමිටුව සමාලෝචනය කර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ පවතින/අවශ්‍ය කාර්ය මණ්ඩල පිහිටීම ඇතුළත් වූ කාල සීමාවක් සහිත විගණන සැලැස්මක්, කමිටුව විසින් සලකා බලන ලදී.
	II. අභ්‍යන්තර විගණන වැඩසටහන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය සහ අදාළ වන පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත උචිත ක්‍රියාමාර්ග ගෙන තිබේදැයි සහතික කිරීම.	අනුකූල වී ඇත. කමිටුව මඟින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කරයි. වැඩි දියුණු කිරීම් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන තිබෙන බවට එහිදී සහතික කරනු ලැබේ.
	III. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හා ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය කිරීම.	අනුකූල වී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය හා අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියාපටිපාටිය හා ප්‍රතිඵල විගණන කමිටුව විසින් 2022 වසරදී අගයන ලදී. ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ඇගයුම් ක්‍රියාපටිපාටිය අනුව යමින්, ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් 2022 වර්ෂය සඳහා ඉටු කරන ලදී.
	IV. අංශ ප්‍රධානී, ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා අභ්‍යන්තර විගණන කාර්යය සඳහා බාහිර සේවා සපයන්නන් බඳවා ගැනීම හා සේවය හමාර කිරීම පිළිබඳ නිර්දේශ කිරීම.	අභ්‍යන්තර විගණන කාර්යය සඳහා අභ්‍යන්තර විගණන ප්‍රධානියා සහ බාහිරින් ලබා ගත් සේවා සපයන්නන් සම්බන්ධයෙන් අනුකූල වේ. අනෙකුත් ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලය පත් කරනු ලබන්නේ බැංකු කාර්ය මණ්ඩලය අතරින් ය.

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	V. ප්‍රධාන අභ්‍යන්තර විගණක ද ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ හා බාහිර සේවා සම්පාදකයන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කම්ටුව දැනුවත් කරන බවට ද ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයට හා බාහිර සේවා සම්පාදකයන්ට තමන් ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් සලසා දී ඇති බවට සහතික වීම.	අනුකූල වී ඇත. මෙබඳු අවස්ථාවක් වසර තුළ පැන නැඟුනේ නැත.
	VI. අභ්‍යන්තර විගණනය, එහි විගණනයට බඳුන්වන කටයුතු වලින් ස්වාධීන වන බවට හා අපක්ෂපාතීව, ප්‍රවීණතාවයෙන් යුක්තව හා නිසි වෘත්තීය සැලකිල්ල සහිතව ඉටු කෙරෙන බවට සහතික වීම.	අනුකූල වී ඇත. බැංකුවේ සංවිධාන ව්‍යුහය අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක, විගණන කම්ටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරන අතර, ඔහු බැංකුවේ මෙහෙයුම් කටයුතු වලින් ස්වාධීනව කටයුතු කරයි.
	(ඔ) කම්ටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සලකා බැලිය යුතුය.	අනුකූල වී ඇත. විගණක කම්ටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළේය.
	(ඕ)ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක හා බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙක් සාමාන්‍යයෙන් රැස්වීම් සඳහා සහභාගි වනු ඇත. සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා ප්‍රධාන විධායක නිලධාරීන්ට, කම්ටුවේ ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි වීමට ඉඩ ඇත. කෙසේ වුවත් කම්ටුව යටත් පිරිසෙයින් වසරකට දෙවරක් විධායක අධ්‍යක්ෂවරුන් රහිතව බාහිර විගණකවරුන් හමුවිය යුතුය.	අනුකූල වී ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අතිරේක මහා කළමනාකරු, අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරී, අනුකූලතා නිලධාරී හා විගණකාධිපතිවරයාගේ නියෝජිතවරයා කම්ටු රැස්වීම් වලට සහභාගි විය. මහා කළමනාකාරතුමාද කම්ටුවේ ආරාධනය මත රැස්වීම් වලට සහභාගි විය. කළමනාකාරිත්වයේ සාමාජිකයන් අවශ්‍යතාවය මත, කරුණු පැහැදිලි කිරීම සඳහා කැඳවනු ලබති. සංවෘත දොරටු රැස්වීම් රැස්වීම්වල න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති අතර විගණකාධිපතිවරයාගේ නියෝජිතයා අවශ්‍යතාවය තීරණය කරයි. ඉහත "ඌ" යටතේ දක්වා ඇති පරිදි විධායක නිලධාරීන් නොමැතිව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සමඟ සංවෘත දොරටු රැස්වීම් දෙකක් වර්ෂය තුළ පවත්වන ලදී.
	(ක)කම්ටුවට පහත කියැවෙන දෑ සතුව තිබිය යුතුය: I. විෂය පථයට අයත් වන කරුණක් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ප්‍රකාශිත අධිකාරිය II. එසේ කටයුතු කරන්නට අවශ්‍ය සම්පත්, III. තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය, IV. අවශ්‍ය නම්, බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමට හා අදාළ පළපුරුද්ද සහිත බාහිර පාර්ශ්වයන්ට රැස්වීම් සඳහා ආරාධනා කිරීම උදෙසා අධිකාරිය.	අනුකූල වී ඇත.
	(ග) කම්ටුව, සාකච්ඡාවට නියමිත කරුණු පිළිබඳ නිසි දැනුම්දීමක් සහිතව ක්‍රමිකව රැස්විය යුතු අතර, සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමෙහි දී එළඹි නිගමනයන් වාර්තාගත කළ යුතුය.	අනුකූල වී ඇත. විගණන කම්ටුව ක්‍රමිකව රැස්වීම් පැවත්වීය. අවශ්‍ය කරන පරිදි අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ. ඒ අනුව මෙම වසර තුළදී නව වතාවක් කම්ටුව රැස්වන ලදී. කම්ටුවේ සාමාජිකයන් වෙත සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳ කල් ඇතිව දැනුම් දී ඇති අතර, එහි බලතල හා වගකීම් ඉටු කිරීමේදී එළඹෙන නිගමනයන් නිසි පරිදි වාර්තා කර ඇත.
	(ඡ) අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් කරුණු පිළිබඳ සවිස්තරාත්මක හෙළිදරව්වක් කළ යුතුය: I. විගණන කම්ටුවේ කටයුතු පිළිබඳ සවිස්තර තොරතුරු, II. වසර තුළ පැවැත්වූ විගණන කම්ටු රැස්වීම් සංඛ්‍යාව, හා III. එම රැස්වීම් තුළ ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම.	අනුකූල වී ඇත. කම්ටුවේ කටයුතු වාර්ෂික වාර්තාවේ පිටු අංක 130 හි විගණන කම්ටු වාර්තාවේ දක්වා ඇත. කම්ටුව සහභාගිවීම් විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 127 හි දක්වා ඇත.
	(ට) කම්ටුවේ ලේකම් (සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්ය ප්‍රධානී විය හැක) කම්ටු රැස්වීම්වල වාර්තා සවිස්තරව වාර්තා ගත කර පවත්වාගෙන යා යුතුය.	අනුකූල වී ඇත. කම්ටුවේ ලේකම් ලෙස කටයුතු කරන ලංකා බැංකුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් රැස්වීම්වල වාර්තා පවත්වා ගනු ලබයි.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඩ) බැංකු කාර්ය මණ්ඩලයට, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන විධි හෝ වෙනත් දෑ පිළිබඳ විය හැකි අයථා ක්‍රියාවන් සම්බන්ධ සිය සැලකිලිමත් වීම්, රහස්‍යභාවයෙන් යුතුව මතු කිරීමට පවත්නා විධිවිධාන කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය. ඒ අනුව කමිටුව මෙකී කරුණු මත සාධාරණ හා ස්වාධීන විමර්ශනය සඳහා නිසි විධිවිධාන ස්ථාපිත කර ඇති බවට හා උචිත පසු විපරම් කාර්යයන් පිළිබඳව සහතික විය යුතු අතර, බාහිර විගණනකවරුන් හා බැංකුවේ සම්බන්ධතා සුපරීක්ෂුම සඳහා වන ප්‍රධානතම නියෝජන මණ්ඩලය ලෙසද කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම කරුණු ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් 'විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තියක්' ස්ථාපිත කර ඇති අතර, සැලකිය යුතු මට්ටමේ සොයා ගැනීම්, උචිත පසු විපරම් කටයුතු සඳහා විගණන කමිටුවට වාර්තා කරන ලදී. විගණන කමිටුව, බාහිර විගණකවරු සමඟ බැංකුවේ සම්බන්ධතා නිරීක්ෂණයේ ප්‍රධානතම නියෝජිතයා වන අතර බැංකුවේ බාහිර විගණක වන විගණකාධිපති සමඟ සම්බන්ධීකරණ කටයුතු කරයි.
3 (6) (III)	පහත දැක්වෙන ඊති මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් බල පවත්වනු ඇත: (අ) කමිටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ගේ පාරිශ්‍රමික (වැටුප්, දීමනා හා සෙසු මූල්‍යමය ගෙවීම්) ප්‍රතිපත්තිය නිශ්චය කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික අදාළ අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ/ලිපි හා 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන වලට අනුරූප වන අතර, තවද බැංකුව ඉහත සඳහන් කළ චක්‍රලේඛ/ලිපි සහ ලංකා බැංකු ආඥා පනත මත පදනම් ව පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සම්මත කොට ඇති අතර එය 2021 වසරේදී යහපාලන ප්‍රතිපත්තිය අනුමත කිරීමෙදී සමාලෝචනය කරන ලදී. ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ස්ථාපිතය. කමිටුව විසින් වසර තුනකට වරක් මහා කළමනාකාරතුමාගේ සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ගේ පාරිශ්‍රමික පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරයි.
	(ආ) කමිටුව, අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් සඳහා අරමුණු හා ඉලක්ක ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට අදාලව සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගීත්වයෙන් යුතුව ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් සඳහා අරමුණු හා ඉලක්ක බැංකුවේ ආයතනික සැලැස්ම පදනම් කොට සැකසූ ක්‍රියාකාරී සැලැස්ම තුළ විස්තරාත්මකව වාර්තා ගතකර ඇත. ප්‍රධාන කළමනාකාරිත්ව කණ්ඩායම තුළින් ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කරලීමේ වගකීම මහා කළමනාකරුට පැවරේ. ඉහත සැලසුම් මත පදනම්ව, කමිටුව විසින් 2022 වර්ෂය සඳහා මහා කළමනාකරුගේ සහ ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින් සඳහා පිහිටුවා ඇති ඉලක්ක සහ ඉලක්ක නිර්දේශ කරන ලදී. සියළුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරුන් නිසා අධ්‍යක්ෂවරුන් සඳහා ඉලක්ක පනවා නැත.
	(ඇ) කමිටුව ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් ගේ කාර්යසාධනය, ඔවුන්ට ලබාදුන් ඉලක්ක හා අරමුණු සමඟ කලින් කලට ඇගයීමට ලක්කෙරුණු ලබන අතර, පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත පදනම් අනෙකුත් ගෙවීම් සමාලෝචනය කිරීමේ පදනම නිශ්චය කළ යුතුය.	මහා කළමනාකරුගේ සහ ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින්ගේ වර්ෂ අවසාන කාර්යසාධන ඇගයීම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පවත්වන ලද අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ, ප්‍රධාන අවධානම් නිලධාරීගේ සහ නියෝජ්‍ය මහා කළමනාකාර (අනුකූලතා) ගේ කාර්යසාධන ඇගයීම් ඔවුන් වාර්තාකරන අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු හරහා ඇගයීමට ලක් වේ.
	(ඈ) ප්‍රධාන විධායක නිලධාරී පිළිබඳ කරුණු සාකච්ඡා වන අවස්ථාවන්හි හැර සෙසු සියළුම කමිටු රැස්වීම් වල දී ප්‍රධාන විධායක නිලධාරීගේ පෙනී සිටීම අවශ්‍යය.	අනුකූල වී ඇත.
3 (6) (IV)	නාමයෝජනා කමිටුව සම්බන්ධව පහත දැක්වෙන ඊති බලපානු ඇත:	බැංකුව නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවක් ස්ථාපනය කර ඇත. මෙම නිර්දේශයේ දක්වා ඇති වැඩකටයුතු වලට අමතරව අදාළ ආයතනික යහපාලන මූලධර්ම පවත්වාගෙන යාම හා බැඳුණු අනෙකුත් නිශ්චිත වැඩ කටයුතුද කමිටුවේ විෂය ක්ෂේත්‍රය තුළ අන්තර්ගත කර ඇත. කමිටුව සඳහා වන ප්‍රඥප්තිය 2022 වර්ෂය තුළ සමාලෝචනය කරන ලදී.
	(අ) කමිටුව, නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් තෝරා පත් කර ගැනීම සඳහා පටිපාටියක් ක්‍රියාත්මක කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුව අයත් වන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබයි. අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් ද අදාල අමාත්‍යාංශය සමඟ හුවමාරු කර ගෙන ඇත. ලංකා බැංකු ආඥා පනත දක්වා ඇති පරිදි ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත කී අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව මහා කළමනාකරු පත් කරයි. මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් පත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පොදු පටිපාටියක්/යෝජනා ක්‍රමයක් පවතී.

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් අදාළ අධ්‍යක්ෂවරයාගේ කාර්යසාධනය හා දායකත්වය සැලකිල්ලට ගනිමින් වර්තමාන අධ්‍යක්ෂවරුන් යළි පත් කිරීම නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම) සලකා බැලිය යුතුය.	අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන්නේ අදාළ අමාත්‍යවරයා විසින් බැවින් මෙය පැන නොනගී.
	(ඇ) ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් යන තනතුරු සඳහා තෝරා පත් කිරීමට/උසස් කිරීමට සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද හා විශේෂිත ගුණාංග වැනි නිර්ණායකයන් කම්ටුව විසින් ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. මහා කළමනාකරු පත් කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්ණායක, සුදුසුකම් සහ අනෙකුත් ප්‍රධාන ගුණාංග සහ නිපුණතා සලකා බැලේ. සෙසු ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරී තනතුරු සඳහා තෝරා ගැනීම හෝ උසස් කිරීමට යෝග්‍යතාවය ලැබීමට අවශ්‍ය කරුණු, අවශ්‍ය සුදුසුකම්ද සඳහන් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උසස් කිරීමේ ක්‍රියාවලියක් ඇත.
	(ඈ) කම්ටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් නියෝග අංක 3 (3) ආඥා පනත්වල දක්වා ඇති නිර්ණායක පරිදි අදාළ තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. තමන්, අංක 3 (3) නියෝගය හා ආඥා පනත් වල දක්වා ඇති නිර්ණායක තුළින් විශේෂිතව පෙන්වා ඇති පරිදි සිය තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කරමින් අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ප්‍රකාශ ලබා ගන්නා අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කෙරේ. තවද ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් එම තනතුරු වලට පත් කරන හෝ උසස් කෙරෙන අවස්ථාවන්හි දී ඔවුන් එකී තනතුර දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බව කම්ටුව තහවුරු කරයි.
	(ඉ) කම්ටුව, අතිරේක/නව නිපුණතාවයන් පිළිබඳව අවශ්‍යතා හා විශ්‍රාම ගන්නා අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීගේ අනුප්‍රාප්තික සැලසුම් පිළිබඳව සළකා බලා, විටින් විට නිර්දේශ කරනු ලැබේ.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් උදෙසා අනුප්‍රාප්තික සැලැස්ම ස්ථාපිත කර ඇත. අවශ්‍ය අතිරේක හෝ නව නිපුණතා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු විසින් හෝ නැතහොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කෙරේ.
	(ඊ) කම්ටුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුගේ සභාපතිත්වය සහිත විය යුතු අතර, වඩා යෝග්‍ය ලෙස බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරියාට, ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි විය හැකිය.	අනුකූල වී ඇත.
3 (6) (V)	වි්කාබද්ධ අවදානම් කළමනාකරණ කම්ටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන රීති බලපවත්වනු ඇත: (අ) කම්ටුව, යටත් පිරිසෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී සහ ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් කාණ්ඩ සුපරීක්ෂණය කරන ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය. කම්ටුව, ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් හා සමීපව කටයුතු කළ යුතු අතර, කම්ටුවට අනුයුක්ත වගකීම් හා අධිකාරිත්ව රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.	අනුකූල වී ඇත. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ කම්ටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මහා කළමනාකරු සහ ණය, වෙළඳපොළ, මෙහෙයුම්, කීර්තිනාම හා උපායමාර්ගික අවදානම් සුපරීක්ෂණය කරන ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන මූල්‍ය නිලධාරී හා අනුකූලතා නිලධාරී කම්ටුවේ ආරාධනාව මත සෑම කම්ටු රැස්වීමකටම සහභාගි වෙති. සෙසු ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් හා සෙසු කාර්ය මණ්ඩලය කම්ටුවට ඔවුන්ගේ පැමිණීම අවශ්‍ය අවස්ථා වලදී ආරාධනය කරනු ලැබේ. කම්ටුව, එහි අධිකාරිත්ව රාමුව හා ඊට අනුයුක්ත වගකීම් තුළ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් හා සමීපව කටයුතු කරයි.
	(ආ) කම්ටුව බැංකුවට ඇති සියළුම අවදානම් උදාහරණ ලෙස ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම්, සුදුසු අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු තුළින් මාසිකව තක්සේරු කල යුතුය. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණය බැංකුව පදනම්න් හා සමූහ පදනම්න් යන දෙයාකාරයෙන්ම සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ ස්වාධීන වි්කාබද්ධ අවදානම් කළමනාකරණ අංශය, බැංකුවේ ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, උපායමාර්ගික හා කීර්තිනාම අවදානම් කම්ටුව විසින් නිර්දේශ කොට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති ලේඛණ මත පදනම්ව, මාසික පදනමකින් තක්සේරු කරන අතර, සාරාංශ ගත වාර්තා කම්ටු රැස්වීම් වලටද ඉන් පසු එළෙඹෙන ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමටද ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් අවදානම් පිළිබඳව කටයුතු කිරීම සඳහා අවදානම් කළමනාකරණ දර්ශන පුවරුවක් සකස් කොට ඇති අතර කම්ටුවට වාර්තා ද සපයයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සාමූහික අවදානම් ප්‍රතිපත්තියක් ද ස්ථාපිතය.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(අ) කමිටුව, විශේෂිත අවදානම් කෙරේ පියවර ගන්නට හා කමිටුව විසින් පැහැදිලිව පනවා ඇති ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් සීමා තුළ හිදිමින් මෙකී අවදානම් කළමනාකරණය කරන්නට, ණය කමිටුව හා වත්කම් හා වගකීම් කමිටු බඳු කළමනාකාරිත්ව මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මකතාව හා සඵලතාවයන් සමාලෝචනය කළ යුතුය.	අනුකූල වී ඇත.
	(ආ) බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමක හා සුපරීක්ෂණ අවශ්‍යතා පදනම මත කමිටුව විසින් තීරණය කළ විවක්ෂණශීලීතාවයන්ට ඔබ්බෙන් වන මට්ටමේ විශේෂිත අවදානම් පවත්නා අවස්ථාවන් හීදී කමිටුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.	අනුකූල වී ඇත. සීමාවන් ඉක්මවා ගිය විශේෂිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම්, ප්‍රධාන අවදානම් නිලධාරී විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධ ගැටළුවල තීව්‍රතාවය මත කමිටුවට සෘජුවම වාර්තා කෙරේ.
	(ඇ) මෙම කමිටුව, යාවත්කාලීන කළ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්ද ඇතුළුව අවදානම් කළමනාකාරිත්වයේ සියළු පැතිකඩ තක්සේරු කිරීම සඳහා යටත් පිරිසෙන් ත්‍රෛමාසිකව හමුවිය යුතුය.	අනුකූල වී ඇත. වසර තුළදී කමිටුව අට වතාවක් රැස්විය. රැස්වීම් තොරතුරු හා සහභාගිත්වය පිටු අංක 127 හි දැක්වේ.
	(ඈ) විශේෂිත අවදානම් හඳුනා ගැනීමට අසමත් වීමට වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කමිටුව උචිත ක්‍රියාමාර්ග ගත යුතු අතර, කමිටුව විසින් නිර්දේශ කළ පරිදි හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් නිර්දේශ කළ පරිදි, කඩිනම් ප්‍රතිකර්ම ක්‍රියාත්මක යුතුය.	මෙම විධානයට අනුකූල වීම සඳහා විධිමත් ලේඛනගත විනය ක්‍රියා පටිපාටියක් බැංකුව තුළ ක්‍රියාත්මක වේ.
	(ඉ) කමිටුව, සෑම රැස්වීමක්ම පවත්වා සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර, එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය හා/හෝ විශේෂිත නියෝග ඉල්ලා සිටිය යුතුය.	අනුකූල වී ඇත. සෑම රැස්වීමකටම පසු එලඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට, විස්තරාත්මක කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කරන අතර, ඒ හා සමඟ අවදානම් කළමනාකරණ වාර්තා සහ නිර්දේශ ද යොමු කෙරේ.
	(ඊ)කමිටුව, නීති, රෙගුලාසි, නියාමන මඟ පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා ව්‍යාපාරික මෙහෙයුම් තුළ සෑම අංශයකම අනුමත ප්‍රතිපත්ති හා බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම උදෙසා අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කළ යුතුය. ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරී කාර්ය මණ්ඩලය තුළින් තෝරා ගැනුණු කැපවූ අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කෘත්‍යය ඉටුකළ යුතු අතර, කලින් කලට කමිටුවට වාර්තා කළ යුතුය.	අනුකූල වී ඇත. සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍රවල අදාළ නීති, නියාමන, නියාමන මඟ පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා අනුමත ප්‍රතිපත්ති හා සමඟ බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා බැංකුව විශේෂ අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කර ඇත. මෙම කෘත්‍යය සඳහාම කැපවූ අනුකූලතා නිලධාරියකු විසින් එය මෙහෙයවන අතර, ඔහු ත්‍රෛමාසික අනුකූලතා වාර්තා කමිටුවට ද මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ද ඉදිරිපත් කරයි. අභ්‍යන්තර පාලන විධි හා බැංකුවේ සෑම ව්‍යාපාරික අංශයක් තුළම අනුමත ප්‍රතිපත්ති හා සමඟ බැංකුවේ අනුකූලතාවය ද තක්සේරු කරයි.
3 (7) සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු		
3 (7) (I)	කිසියම් පුද්ගලයෙකු සහ විශේෂයෙන් මෙම නිර්දේශයට අනුව සම්බන්ධිත පාර්ශ්ව සේ සැලකෙන පහත දැක්වෙන පුද්ගල කාණ්ඩ හා බැංකුවේ කිසියම් ගනුදෙනුවකින් මතු විය හැකි අරමුණු අතර, ගැටුම් ඇතිවීම වළකාලන්නට අවශ්‍ය පියවර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගත යුතුය:	අනුකූල වී ඇත. සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම් සීමා කිරීම ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අරමුණ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර අරමුණු සඳහා ගැටුම් ඇතිවීම වළකාලීමය.
	(අ) බැංකුවේ පරිපාලිත සමාගම් අතරින් කිසිවක්. (ආ) බැංකුවේ ආශ්‍රිත සමාගම් අතරින් කිසිවක්. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරුන් අතරින් කිසිවෙක්. (ඈ) බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් අතරින් කිසිවෙක්. (ඉ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධානතම කළමනාකාරිත්ව නිලධාරියෙකුගේ ආසන්නතම පවුලේ සාමාජිකයෙක්. (ඊ) බැංකුවේ සැලකිය යුතු බැඳියාවක් සහිත කොටස් හිමියෙක්. (උ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක්, බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් ආසන්න පවුලේ සාමාජිකයෙක් හෝ කිසියම් සැලකිය යුතු කොටස් හිමියන් සැලකිය යුතු බැඳියාවක් දරණ ව්‍යාපාරයකි.	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහිත අධ්‍යක්ෂවරුන්ගෙන් සිය ගනුදෙනු හෙළිදරව් කරන ලෙස පුද්ගලිකව ඉල්ලා සිටිනු ලැබේ. එම ගනුදෙනු ස්වයංක්‍රීය පද්ධතියක් හරහා අධීක්ෂණය කෙරේ.

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7) (II)	මෙම නියෝගය මඟින් ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව හා ගනුදෙනු වර්ග තුළ පහත දැක්වෙන දෑ ඇතුළත්විය යුතුය: (අ) උපරිම ණය පහසුකම් පිළිබඳ මුදල් මණ්ඩලයේ නියෝග තුළ නිර්වචනය කර ඇති කිසියම් ආකාරයක ණය පහසුකමක් පිරිනැමීම. (ආ) තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන යන ආකාරයෙන් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම. (ඇ) බැංකුවට සැපයූ හෝ බැංකුවෙන් ලබාගත් කිසියම් මූල්‍යමය හෝ මූල්‍යමය නොවන සේවා සම්පාදනය. (ඈ) බැංකුව හා කිසියම් සම්බන්ධිත පාර්ශ්ව අතර, එබඳු සම්බන්ධිත පාර්ශ්වයන්ට ප්‍රතිලාභ අත්කර දිය හැකි, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනයම් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු හුවමාරු කිරීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හෝ තොරතුරු ප්‍රවාහ ගොඩනැගීම හා පවත්වා ගෙන යාම.	අනුකූල වී ඇත. මේ පිළිබඳ තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් යටතේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇත.
3 (7) (III)	බැංකුව ඉහත සඳහන් විධාන අංක 3 (7) (I) තුළ නිර්වචනය කර ඇති අන්දමට සම්බන්ධිත පාර්ශ්ව හා සමඟ, සමාන ව්‍යාපාරික කටයුතු වල නිරත බැංකුවේ සෙසු ගනුදෙනුකරුවන්ට සපයනවාට වඩා වැඩි වාසිදායක සැලකීමක් එබදු පාර්ශ්වයන්ට පිරිනැමෙන අන්දමේ ගනුදෙනුවල නිරත නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය. මේ සම්බන්ධයන් වැඩි වාසිදායක සැලකීම් යන්නට, පහත දැක්වෙන දෑ ඇතුළත් වෙයි. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කළ පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණශීලි ප්‍රතිශතය ඉක්මවමින් සමස්ථ ශුද්ධ ණය පහසුකම්, සම්බන්ධිත පාර්ශ්වයන්ට සැපයීම. මෙම උප විධානය අනුව, I. 2007 අංක 7 දරණ බැංකු ආඥා පනත අනුව පහසුකම් යනුවෙන් නිර්වචනය කරනුයේ උපරිම ප්‍රමාණයේ පහසුකමයි. II. සමස්ත ශුද්ධ ණය පහසුකම සමස්ථ ණය පහසුකමෙන්, මුදල්මය සුරැකුම් හා මෙබඳු සම්බන්ධිත පාර්ශ්ව විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තුළ හා වසර 5 කට හා එයට වැඩි කල්පිරීමේ කාලසීමාවක් සහිත ණය උපකරණයන් හි ආයෝජනය අඩු කිරීමෙන් ගණනය කළ යුතුය. (ආ)අසම්බන්ධිත සංසන්දනාත්මක ප්‍රතිපාර්ශ්වයක් සමඟ සංසන්දනාත්මක ගනුදෙනුවකදී බැංකුවේ ප්‍රශස්තම ණය පොළී අනුපාතයට වඩා අඩු පොළියක් අය කිරීම හෝ බැංකුවේ තැන්පතු පොළියට වඩා වැඩි පොළියක් ගෙවීම. (ඇ)අසම්බන්ධිත පාර්ශ්ව හා සාමාන්‍ය ව්‍යාපාරික ගනුදෙනු කරගෙන යාමේදී පිරිනමන කොන්දේසි ඉක්මවන, වාසිදායක කොන්දේසි, වෙළඳ අලාභ ආවරණය හෝ ගාස්තු/කොමිස් කපා හැරීම වැනි පක්ෂපාති සැලකිල්ල දැක්වීම. (ඈ)ඇගයීම් පටිපාටියක් රහිතව සම්බන්ධිත පාර්ශ්වයකට සේවා සැපයීම හෝ සේවා ලබා ගැනීම. (ඉ) නිත්‍යානුකූල වැඩ කටයුතු හා කාර්යාවලි සාධනය සඳහා අවශ්‍ය ප්‍රමාණ හැර, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනත් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හා බෙදාගැනීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හා තොරතුරු ප්‍රවාහ පවත්වාගෙන යාම.	අනුකූල වී ඇත. බැංකුව, අනුකූලතා අංශය විසින් අධීක්ෂණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීමේ පටිපාටියක් ක්‍රියාත්මක කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව ඉදිරිපත් කරනු ලබන අනුකූලතා වාර්තාවෙහි අනුකූලතා තත්ත්වය සඳහන් කර ඇත. තවදුරත් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කාර්තුමය පදනමින් විගණන කමිටුව වෙත වාර්තා කරයි. අනුකූල නොවූ අවස්ථා වලදී එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරනු ලැබේ.
3 (7) (IV)	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී, අදාළ අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන් අතරින් තුනෙන් දෙකක්, එබඳු ණය පහසුකමක් පිරිනැමීම සඳහා කැමැත්තෙන් ඡන්දය පාවිච්චි කොට එකී පහසුකම අනුමත කළ අවස්ථාවේ හැර, බැංකුව කිසිඳු අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරයාගේ සමීප ඥාතියෙකුට කිසිදු ණය පහසුකමක් පිරි නොනැමිය යුතුය. මෙබඳු ණය පහසුකමක්, මුදල් මණ්ඩලය මඟින් වරින් වර නිශ්චය කරනු හැකි කිසියම් සුරැකුමකින් ආවරණය කළ යුතුය. මෙබඳු ණය පහසුකමක්, මුදල් මණ්ඩලය මඟින් වරින් වර නිශ්චය කරනු හැකි කිසියම් සුරැකුමකින් ආවරණය කළ යුතුය.	අනුකූල වී ඇත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7) (V)	(අ) බැංකුවක් කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ පුද්ගලයා විසින් සැලකිය යුතු බැඳියාවක් දරණ කිසියම් ව්‍යාපාරයකට කිසියම් ණය පහසුකමක් පිරිනමනු ලැබූ අවස්ථාවක එකී පුද්ගලයා පසු කාලීනව බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත්කර ඇත්නම්, බැංකුව විසින් එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කළ දිනයේ සිට වසරක් ඇතුළත, මුදල් මණ්ඩලය විසින් මෙබදු කරුණක් සඳහා වරින් වර අනුමත කරනු ලැබිය හැකි අවශ්‍ය සුරැකුම් ලබාගැනීමට බැංකුව විසින් පියවර ගැනිය යුතුය. (ආ)ඉහත කී 3(7) (V) (අ) විධානය මඟින් සලසා ඇති පරිදි එකී කාලසීමාව තුළ එබඳු සුරැකුමක් සම්පාදනය නොකළ අවස්ථාවකදී බැංකුව එකී පහසුකම සම්බන්ධයෙන් ගෙවීමට නියමිත මුදල පොළිය සමඟ, ණය මුදල පිරිනමන අවස්ථාවේදී නියාමනය කළ කාල සීමාව ඇතුළත හෝ එකී අධ්‍යක්ෂවරයෙකු ලෙසින් පත් කළ දිනයේ සිට මාස දහඅටක් ඉකුත්වූ පසු යන මේ දෙකින් මුලින් එළඹෙන දිනයේදී ආපසු අය කරගත යුතුය. (ඇ)මෙකී උප නියෝග අනුව කටයුතු කරන්නට අපොහොසත් වන කිසියම් අධ්‍යක්ෂවරයෙකු වේ නම් ඔහු එකී අධ්‍යක්ෂධුරය හැර ගියා සේ සැලකෙන අතර, බැංකුව ඒ බව පොදු මහජනතාව වෙත හෙළිදරව් කළ යුතුය. (ඈ)කෙසේ වුවද, පහසුකම පිරිනමන අවස්ථාවේදී එකී අධ්‍යක්ෂවරයා බැංකුවේ සේවකයකුව සිටීමින් හා එකී පහසුකම බැංකුවේ සියළුම සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් යටතේ ලබා දුන් අවස්ථාවකදී මෙම උප විධානය අදාළ නොවිය යුතුය.	අනුකූල වී ඇත.
3 (7) (VI)	බැංකුවක්, බැංකුවේ සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් මත වන පදනමින් හෝ ඉහත 3(7)(V) විධානය ප්‍රකාර පහසුකම් පිරිනැමීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කළ හැකි සුරැකුමකින් ආවරණය කළ අවස්ථාවකදී හැර කිසියම් සේවකයෙකුට හෝ සේවකයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ එකී සේවකයා හෝ ආසන්න පවුලේ සාමාජිකයකු සැලකිය යුතු බැඳියාවක් දරණ කිසියම් ව්‍යාපාරයකට හෝ ගාස්තු හෝ කොමිස් කපා හැරීම හා බැඳුණු කිසිඳු පහසුකමක් හෝ වඩා වාසිදායක සැලකීමක් පිරි නොනැමිය යුතුය.	අනුකූල වී ඇත. බැංකුව සියළුම සේවකයන්ට අදාළ වන සාමාන්‍ය සේවක ණය යෝජනා ක්‍රම යටතේ හැර බැංකුවේ කිසිම සේවකයෙකුට වඩා වාසිදායක සැලකීමත්/ණය පහසුකම් සපයා නැත. මේ පිළිබඳව චක්‍රලේඛන උපදෙස් නිකුත් කර ඇත. බැංකු සේවකයන්ගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට කිසිදු වාසිදායක සැලකීමක්/පහසුකමක් සපයන්නේ ද නැත.
3 (7) (VII)	බැංකුවක් විසින් ඉහත 3(7)(V), 3(7)(VI) විධාන මත ලබා දුන් කිසිදු පහසුකමක් හෝ එකී පහසුකමක කිසියම් කොටසක් හෝ ඒ සඳහා ලැබිය යුතු කිසියම් පොළියක්, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය රහිතව ප්‍රේෂණය නොකළ යුතු අතර, කිසියම් ප්‍රේෂණයක් සිදු කරයි නම් එය වලංගු රහිත හා බලනොපාන එකක් විය යුතුය.	අනුකූල වී ඇත. 2022 වසර තුළ මෙබඳු තත්ත්වයක් උද්ගත නොවීය.
3 (8) හෙළිදරව් කිරීම		
3 (8) (I)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දෑ තහවුරු කල යුතුය. (අ) වාර්ෂිකව විගණනය කළ මූල්‍ය ප්‍රකාශ හා ත්‍රෛයිමාසික මූල්‍ය ප්‍රකාශ, සුපරීක්ෂණය හා නියාමන බලධාරීන් විසින් නියම කර ඇති ආකෘතිය හා බල පවත්වනා ගිණුම්කරණ ප්‍රමිති හා සමඟ අනුරූපව සකස් කොට ප්‍රකාශයට පත් කර ඇති බව ද, (ආ) එකී ප්‍රකාශයන් හි සංක්ෂිප්තයක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පුවත්පත් වල ප්‍රසිද්ධ කරන බව ද,	අනුකූල වී ඇත.
3 (8) (II)	පහත දැක්වෙන අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවේ තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය: (අ) වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, විශේෂිත හෙළිදරව් කිරීම් ද ඇතුළත්ව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවය අනුව යමින් සකස් කොට ඇති බවට ප්‍රකාශයක්.	අනුකූල වී ඇත. වාර්තා පිටු අංක 158 සිට 162 දක්වා බැංකුවේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව යටතේ ද, පිටු අංක 168 හි මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් යටතේ ද හෙළිදරව් කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ආ) මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇති බවට හා බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සැකසීම අදාළ මූල්‍යකරණ හා නියාමන අවශ්‍යතා හා අනුරූපවෙමින් ඉටු කළ බවට ද, බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුකූල වී ඇත. වාර්ෂික වාර්තාවේ පිටු අංක 165 සහ 166 හි මූල්‍ය වාර්තාකරණයේ 'අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය' හා පිටු අංක 168 හි 'මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම' තුළ හෙළිදරව් කර ඇත.
	(ඇ) ශ්‍රී ලංකා සහතික කිරීමේ කාර්යභාර ප්‍රඥප්ති 3050 යටතේ අභ්‍යන්තර පාලනය මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ පිළිබඳව බැංකු සඳහා සහතික වාර්තා යටතේ විගණනකරුවන් විසින් නිකුත් කළ සහතික වාර්තා.	අනුකූල වී ඇත. බැංකුව මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලන විධින් හි සඵලතාවය පිළිබඳව විගණනකාධිපතිවරයාගෙන් සහතිකයක් ලබාගෙන ඇති අතර එය මෙම වාර්තාවේ පිටු අංක 168 සිට 172 යටතේ දැක්වේ.
	ඈ) නාමයන්, යෝග්‍යතාවය, බැංකුව සමඟ ඇති ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවූ මුළු ගාස්තු/පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තරාත්මක තොරතුරු.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු පිටු අංක 26 සිට 29 හි දක්වා ඇත. බැංකුව සමඟ වන ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත පිටු අංක 163 සහ 164 හි දක්වා ඇත. බැංකුව විසින් ගෙවූ පාරිශ්‍රමික පිළිබඳ විස්තර, පිටු අංක 208 හි 17 වන සටහන යටතේ දක්වා ඇත.
	(ඉ) 3 (7) (III) හි නිර්වචනය කර ඇති පරිදි එක් එක් අදාළ පාර්ශ්ව සඳහා ලබා දී ඇති සම්පූර්ණ ශුද්ධ ණය පහසුකම් අදාළ පාර්ශ්වවල එක් එක් කාණ්ඩයට ලබා දී ඇති ශුද්ධ ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස ද හෙළි කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස 2022 වර්ෂය තුළ එක් එක් අදාළ පාර්ශ්වයන් සඳහා ප්‍රදානය කරන ලද සම්පූර්ණ ශුද්ධ ණය පහසුකම් පහත දැක්වේ

	රු. '000	%
ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්	844,483	0.32
පරිපාලිතයන්	1,906,278	0.72
ආශ්‍රිත සමාගම්	645,386	0.24
රජය හා රජයට සම්බන්ධිත ආයතන (මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක 61 හි සඳහන් නිර්වචනය බලන්න.)	1,860,545,557	703.44

(ඊ) බැංකුව ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට ගෙවූ පාරිශ්‍රමික වල මුළු එකතුව හා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන් සමඟ බැංකුවේ මුළු ගනුදෙනු එකතුව, ගෙවූ පාරිශ්‍රමික, සැපයූ ණය පහසුකම්, තැන්පතු හා ආයෝජන ආදී වශයෙන් පුළුල් වර්ග යටතේ වෙන්ව දැක්වීම.	අනුකූල වී ඇත. 2022 වර්ෂය සඳහා ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට ගෙවූ පාරිශ්‍රමික හා බැංකුව හා ඔවුන් අතර වූ ගනුදෙනු පහත දැක්වේ:

	රු. '000
කෙටි කාලීන රැකියා ප්‍රතිලාභ	1,209,616
පශ්චාත් රැකියා ප්‍රතිලාභ	148,897

මෙයට අමතරව බැංකුව විහි අනුමත ප්‍රතිලාභ සැලසුම යටතේ, ප්‍රධාන කළමනාකාරිත්ව නිලධාරීන්ට වාහන පරිහරණය වැනි මුදල්මය නොවන ප්‍රතිලාභ ද සපයා ඇත.

	රු. '000
ණය	742,536
බැංකු අයිරා	23,042
ණය කාඩ්පත්	14,363
තැන්පතු	1,352,751
ණයකර	41
භාවිතා නොකළ පහසුකම්	74,753

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2022 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(උ) "ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පරිච ප්‍රකාශය 4750" යටතේ නිකුත් කළ විගණකවරුන්ගේ "සත්‍ය සොයා ගැනීම් වාර්තාවන්" හි සියළුම සොයා ගැනීම්, වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව තුළට අන්තර්ගත කර ඇති බවට සහ විගණකවරුන් විසින් ඒ පිළිබඳව බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ වෙත දැනුවත් කර ඇති බව අධ්‍යක්ෂවරුන් විසින් සිය වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවේ සහතික කල යුතුය.	අනුකූල වී ඇත. බැංකුව 2007 අංක 11 දරණ ආයතනික යහපාලන විධානය පිළිබඳව විගණකාධිපතිවරයා ගෙන් සහතිකයක් ලබා ගෙන ඇත. විගණකවරුන්ගේ සියළුම සොයාගැනීම් මෙම ආයතනික යහපාලන වාර්තාව තුළ අන්තර්ගත කර ඇති බවට ද, කිසියම් නිර්දේශයක් වේ නම් ඒ පිළිබඳව අදාල වර්ෂය තුළ කටයුතු කරන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත
	(ඌ) විවක්ෂණශීලී අවශ්‍යතා, නියාමන නීති රීති හා අභ්‍යන්තර පාලන විධි හා කිසියම් සැලකිය යුතු අනුකූල නොවීම් නිවැරදි කරන්නට ගත් ක්‍රියාමාර්ග සමඟ අනුකූලතා විස්තර විදහා පෙන්වන වාර්තාවක්.	අනුකූල වී ඇත.
	(එ) බැංකුවේ අවදානම් කළමනාකරණයේ ප්‍රමාදදෝෂ හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දී ඇති පරිදි මෙකී විධානයන් හා අනුකූල නොවීම් පිළිබඳ නියාමන හා සුපරීක්ෂණ සැලකිලිමත් වීම පිළිබඳ ප්‍රකාශයක් හා එවැන්නක් පොදු මහජනතාවට හෙළිදරව් කළ යුතු යැයි මුදල් මණ්ඩලය විසින් නියෝග කළ අවස්ථාවක, එකී සැලකිලිමත් වීම් පිළිබඳව බැංකුව විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග පිළිබඳවද ඇතුලත් කල යුතුය.	අනුකූල වී ඇත.
3 (9) (I)	තාවකාලික හා වෙනත් පොදු ප්‍රතිපාදන අනුකූලතාවයට අදාල මෙම විධානය හා අනුකූලත්වය 2008 ජනවාරි 01 දා සිට ඉදිරියට ආරම්භ කෙරෙන අතර, මෙම විධානය තුළ සපයා ඇති අනුකූලතා දිනයන් විශේෂයෙන් සම්පාදනය කර ඇති විටෙක හැර සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු 2009 ජනවාරි 01 දා හෝ ඊට ප්‍රථම මෙම විධානයේ විධිවිධානයට පූර්ණ ලෙසින් අනුකූල විය යුතුය.	අනුකූල වී ඇත.
3 (9) (II)	ශ්‍රී ලංකාව තුළ විශේෂිත ව්‍යවස්ථාපිත පනත් මඟින් සංස්ථාපනය කරන ලද බැංකු සම්බන්ධයෙන් එකී ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන සමඟ පටහැනි නොවන මෙම විධානයේ සියළුම ප්‍රතිපාදන හා අනුකූල වන්නට පියවර ගත යුතු අතර එකී පනත් තුළින් විශේෂිතව දක්වා ඇති ප්‍රතිපාදන අනුව යමින් දිගටම කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුව 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන මඟින් පැන නැඟෙන ප්‍රතිපාදන හා පටහැනි නොවන ලෙස මෙම විධානයේ අදාළ හැම ප්‍රතිපාදනයක්ම හා අනුකූල වන්නට ගත හැකි හැම ක්‍රියාමාර්ගයක්ම ගනිමින්, එහි පැනවුම බලාත්මක කර ඇත. කිසියම් අනුකූල අවස්ථා හා එකඟ නොවන අවස්ථාවන්හි බැංකුව ඊට අදාළ ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන අනුව යමින් කටයුතු කරගෙන යන අවස්ථාවන්හිදී, ඒ බැව් ඉහත අදාළ පරිච්ඡේදයන්හි විශේෂිතව සඳහන් කර ඇත.
3 (9) (III)	මෙම විධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විදේශ බැංකු ශාඛාවකට අදාළ විය යුත්තේ, එය එකී බැංකුවේ සංස්ථාපිත රට තුළ බලාත්මක නීති හා රෙගුලාසි සමඟ පටහැනි නොවන වපසරිය තුළය විදේශීය බැංකු ශාඛාව, එහි වාර්ෂික වාර්තාව හා ගිණුම් හා ශ්‍රී ලංකා ශාඛා මෙහෙයුම් හා බැඳුණු ගිණුම් සමඟ මව් බැංකුවේ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව ද ප්‍රකාශයට පත් කළ යුතුය.	අදාළ නොවේ.
3 (9) (IV)	මෙම විධානයේ ප්‍රතිපාදන සහ කිසියම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය (හෝ අභ්‍යන්තර රීති) අතර ගැටුමක් මතු වූ කිසියම් අවස්ථාවක මෙම විධානයේ ප්‍රතිපාදන බලපවත්වනු ඇත. කෙසේ වූවත්, එක් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන, මෙම විධානයේ දක්වා ඇති ප්‍රතිපාදනවලට වඩා දැඩි වේ නම් සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ හැකිය.	අදාළ නොවේ.
3 (9) (V)	යම් හෙයකින් අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ බැංකු පනතේ විධි විධාන සලසා ඇති පරිදි විධාන අංක 3 (2) (II) (ආ), 3 (3) (I) (අ) හා 3 (3) (II) (අ) හා යොමුවෙන මුදා හැරීම් ලබා නොගත යුතු යැයි මුදල් මණ්ඩලය අදහස් කරන්නේ නම්, එකී පදනම මුදල් මණ්ඩලය විසින් එම තැනැත්තාට දැනුම් දිය හැකි අතර, විභාගයකට පසු මුදල් මණ්ඩලයට මුදා හැරීමේ කාලසීමාව සීමා කළ හැකිය.	අදාළ නොවේ.

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

9

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය හා බැඳුණු ලැයිස්තුගත රීති හා අනුකූලවීම් පහත පරිදි සාරාංශ කළ හැකිය.

රීති අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේදය	ඉදිරිපත් කළ දිනය
7.4.අ.(I)	කාර්තුමය පදනම මත සකස් කළ අතුරු මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර, කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, පළමු කාර්තු තුන සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තු නිමවී දින 45 ක් තුළ දී ද අවසන් කාර්තුව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තුව අවසන් වූ දින සිට මාස දෙකක් තුළ ද ඉදිරිපත් කළ යුතුය.	2022 මාර්තු 31 න් අවසන් පළමු කාර්තුව	2022 මැයි 13
		2022 ජුනි 30 න් අවසන් දෙවන කාර්තුව	2022 අගෝස්තු 15
		2022 සැප්තැම්බර් 30 න් අවසන් තෙවන කාර්තුව	2022 නොවැම්බර් 15
		2022 දෙසැම්බර් 31 න් අවසන් සිව්වන කාර්තුව	2023 පෙබරවාරි 28

රීති අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේදය
7.4.ආ.(I)	ශ්‍රී ලං.හි.ප්‍ර. 34 ට අනුකූලවීම සහ බැංකුව හා සමූහය වෙන් වෙන්ව හෙළිදරව් කිරීම.	අනුකූල වී ඇත.
7.4.ආ.(II)	ලැයිස්තුගත රීති වලට අනුව අතිරේක සටහන් සහ අනුපාත හෙළිදරව් කිරීම.	අනුකූල වී ඇත.
7.4.ආ.(III)	අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කිරීම.	අනුකූල වී ඇත.
7.4.ආ.(IV)	මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇති ද යන්න සඳහන් කිරීම.	අනුකූල වී ඇත.
7.5.අ.	අදාළ මූල්‍ය වර්ෂය අවසන් වන දින සිට මාස 5 ක් තුළ වාර්ෂික වාර්තාව කොළඹ කොටස් හුවමාරුවට ඉදිරිපත් කළ යුතුය.	2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර ඇත. 2022 වසර සඳහා වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර ඉදිරිපත් කෙරෙනු ඇත.

රීති අංකය	අනාවරණ අවශ්‍යතාවය	පරිශීලනය/අදහස්	පිටු අංකය
7.6.(I)	අදාළ මූල්‍ය වර්ෂය තුළ ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව	161
7.6.(II)	අදාළ මූල්‍ය වර්ෂය තුළ දී ආයතනයෙහි සහ එහි පරිපාලිතයන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ එම ක්‍රියාකාරකම්හි ස්වභාවයේ සිදුවූ වෙනස්කම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව	158
		මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්	184
7.6.(III)	ඡන්ද හිමි හා අහිමි කොටස් හිමිකාරිත්වය මත, ඉහළම ප්‍රමුඛත්වය ලැබූ ප්‍රථම කොටස් හිමියන් විසිදෙනාගේ නම්, හිමිකම් කියනු ලබන කොටස් ප්‍රමාණය සහ අදාළ හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	ශ්‍රී ලංකා රජය ලංකා බැංකුවෙහි එකම කොටස්හිමියා වේ.	415
7.6.(IV)	පොදු හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	අදාළ නොවේ.	
7.6.(V)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රකාශය	අදාළ නොවේ.	
7.6.(VI)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රකාශය	අවදානම් කළමනාකරණ වාර්තාව	140-156
7.6.(VII)	ආයතනයෙහි සේවක සහ කේෂ්ත්‍ර සබඳතාවයන්ට අදාළ ප්‍රමාණාත්මක ගැටළු පිළිබඳ තොරතුරු	සලකා බලනු ලබන වර්ෂය තුළ දී ප්‍රමාණාත්මක ගැටළු කිසිවක් පැන නොනැඟිණි.	
7.6.(VIII)	ආයතනය සතු ඉඩම් සහ ආයෝජිත දේපළවල ප්‍රමාණ, පිහිටීම්, තක්සේරු වටිනාකම සහ ඒවායේ ඇති ගොඩනැඟිලි සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 33 සහ 34	261-283
7.6.(IX)	ආයතනයෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් නියෝජනය වන කොටස් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 50.1	308

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

රීති අංකය	අනාවරණ අවශ්‍යතාවය	පරිශීලනය/අදහස්	පිටු අංකය
7.6.(X)	එක් එක් වර්ගයේ ස්කන්ධ සුරැකුම් හිමිකරුවන් ගණන සහ එම හිමිකාරිත්වය සහ එම හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස දක්වන ලද ව්‍යාප්ති සටහන	ශ්‍රී ලංකා රජය ලංකා බැංකුවෙහි එකම කොටස්හිමියා වේ.	415
7.6.(XI)	අනුපාතයන් සහ වෙළඳපළ මිල පිළිබඳ තොරතුරු		
	1. කොටසක ලාභාංශය, කොටසක ශුද්ධ වත්කම්, සංසන්දනීය රාජ්‍ය සුරැකුම්පත්වල පොළී අනුපාතිකය, ණය/ප්‍රාග්ධන අනුපාතිකය, පොළී ආවරණය සහ ද්‍රවශීල වත්කම් අනුපාතය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 20 සහ 50.2 අතිරේක තොරතුරු	211, 308 403
	2. ලැයිස්තුගත ණයකර වලට අදාළ වෙළඳපළ තොරතුරු	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 49 අතිරේක තොරතුරු	305 403
	3. ණය ශ්‍රේණිගත කිරීමෙහි සිදුවූ වෙනස්වීම්	සංස්ථාපිත තොරතුරු	432
7.6.(XII)	ආයතනයේ සහ එහි පරිපාලිතයන්ගේ ස්ථාවර වත්කම්වල සහ ඉඩම්වල වෙළඳපළ වටිනාකම, පොත් අගයත් අතර සැලකිය යුතු වෙනස්වීම්	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 34	263-283
7.6.(XIII)	ආයතනය වර්ෂය තුළදී ප්‍රසිද්ධ නිකුතුවකින්, හිමිකම් නිකුතුවකින් හෝ පුද්ගලික නිකුතුවකින් අරමුදල් සම්පාදනය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 44, 49 සහ 50	291, 305 සහ 308
7.6.(XIV)	සේවකයින් සතු කොටස් හිමිකාරිත්වය හෝ කොටස් යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු	අදාළ නොවේ.	
7.6.(XV)	7 වන කොටසෙහි 7.10.3, 7.10.5 (අ), 7.10.6 (අ) යන රීතීන් වලට අදාළව ආයතනික යහපාලනය පිළිබඳ අනාවරණයන්	ආයතනික යහපාලනය සම්බන්ධයෙන් 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධාන වලට අනුකූලව බැංකුව කටයුතු කරන බැවින් ලැයිස්තුගත කිරීමේ 7.10 විධානය යටතේ නිදහස් කර ඇත.	
7.6.(XVI)	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇති ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම් වලින් 5% යන දෙකෙන් අඩු අගය ඉක්මවන සම්බන්ධිත පාර්ශ්වයන් හා සිදුකළ ගනුදෙනු	අතිරේක තොරතුරු	417

චක්‍ර ලේඛ අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේද	සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් වල පලකළ දිනය
2019 අංක02 2019 ජනවාරි 18	6.1 සෑම කාර්තුවකම අවසාන දිනෙන් මාස දෙකක් ඇතුළත සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පතක අවම වශයෙන් එක් වරක්වත් පළකළ යුතුය.	2022 මාර්තු 31 න් අවසන් පළමු කාර්තුව	2022 මැයි 27
		2022 ජුනි 30 න් අවසන් දෙවන කාර්තුව	2022 අගෝස්තු 26
	6.2 වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශනය මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස පහක් ඇතුළත සිදු කළ යුතුය.	2022 සැප්තැම්බර් 30 න් අවසන් තෙවන කාර්තුව	2022 නොවැම්බර් 25
	6.3 මූල්‍ය වර්ෂය අවසාන වී මාස 3 ක් ඇතුළත බැංකුව විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කළ හොත්, 4 වෙනි කාර්තුව සඳහා වන මූල්‍ය ප්‍රකාශන පල කිරීම සම්බන්ධයෙන් ඉහත 6.1 ට අනුව කටයුතු කිරීම අනිවාර්ය නොවේ.	2022 දෙසැම්බර් 31 න් අවසන් සිවි වන කාර්තුව (විගණනය කරන ලද)	2023 මාර්තු 24

බලපත්‍රලාභී වාණිජ බැංකු වල මූල්‍ය ප්‍රකාශන වලට අදාළ අනෙකුත් හෙළිදරව් කිරීම් වලට අනුකූල වීම් පහත පරිදි සාරාංශ කළ හැකිය:

1.	මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය සඳහා මූල්‍ය උපකරණ වල වැදගත්කම පිළිබඳ තොරතුරු	
1.1	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	
1.1.1	මූල්‍ය වත්කම් හා වගකීම් වර්ග හෙළිදරව් කිරීම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 21
1.1.2	අනෙකුත් හෙළිදරව් කිරීම්	
	(I) ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට ගණනය කිරීම සඳහා නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම් පිළිබඳ විශේෂ හෙළිදරව් කිරීම්. ණය අවදානම හා වෙළඳපොළ අවදානම, මෙම අවදානම් සඳහා ආරෝපිත සාධාරණ අගයෙහි වෙනස්වීම් සහ ඇගයීම් ක්‍රම යනාදිය ද මෙයට ඇතුළත් වේ.	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 4.4, 27 සහ 64
	(II) මූල්‍ය උපකරණ එක් කාණ්ඩයකින් තවත් වර්ගයකට නැවත වර්ගීකරණය කිරීම.	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.4
	(III) සුරැකුම් ලෙස අඩපණය කළ මූල්‍ය වත්කම් පිළිබඳ තොරතුරු සහ සුරැකුම් වශයෙන් තබා ඇති මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 58
	(IV) මූල්‍ය වත්කම් වර්ග වල ණය අලාභය සඳහා ප්‍රතිපාදන ගිණුම සංසන්දන කිරීම.	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 28.1 සහ 28.2
	(V) බහුවිධ ව්‍යුත්පන්න උපකරණ වලින් සමන්විත සංයුක්ත මූල්‍ය උපකරණ පිළිබඳ තොරතුරු	නැත.
	(VI) ණය ගිවිසුම් කොන්දේසි කඩකිරීම් පිළිබඳ	නැත.
1.2	විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	
